බුද්ධජයන්තී ත්‍රිපිටකග්‍රන්ථමාලා: 31

සූත්‍රාන්තපිටකයෙහි

22-23 වන ග්‍රන්ථය

# ථෙරගාථාපාළි

## ඛුද්දකනිකාය

පඤ්චම භාගය

---

ලංකා බෞද්ධමණ්ඩලයේ ආරාධනයෙන්

මාකඩවර විහාරාධිවාසී
පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන්
වහන්සේ විසින් කරන ලද

සිංහල පරිවර්තනයෙන් යුක්ත යි.

---

බු. ව 2557
ක්‍රි. ව. 2013

Buddha Jayanti Tripitaka Series, Volume 31

The Twenty-second and Twenty-Third Book in the

**Suttanta-Pitaka**

**Khuddaka- Nikāya (5) (6)**

**22-23**

# THERAGĀTHĀ PĀLI

# &

# THERIGĀTHĀ PĀLI

With the Sinhala translation by

**The Venerable Pandita**

**Karahampitigoda Sumanasāra Thera**

at the Mākadawara Vihāra, Hingula

**Published by**

**Dharma Chakkra Child Foundation**

Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka

Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /

**Co-published, printed and donated by**

**The Corporate Body of the Buddha Educational Foundation**

11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.

Tel: +886 2 23951198, Fax: +886 2 23913415

Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/

**B.E. 2557**

**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. දම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කූඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රැ මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතෙ කෙරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ෂුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්ධකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චරියාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගීති, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපීතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමඟ කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා ඵලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

**තෙරුවන් සරණයි.**

**බෝදාගම චන්දිම නායක ස්ථවිර**

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**
**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
වීදාගම,
බණ්ඩාරගම.

2557
\- ——— -
2013

බුද්ධ ජයන්ති ත්‍රිපිඨක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ

බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක
වි.ජ.මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි
තායිවානයේ ප්‍රධාන සංඝනායක

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි

## තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මඟින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදි.

**මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉතා සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.**

- පූජ්‍ය අත්තුඩාවේ ඤාණානන්ද නාහිමි
- පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමි
- දර්ශනපති පූජ්‍ය කරගහැල්පත සුගතනන්ද හිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- පූජ්‍ය බබරැන්දේ ධම්මසිරි හිමි
- පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- මිලිනා සුමතිපාල මැතිණිය
- ජගත් සුමතිපාල මැතිතුමා
- ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මා
- දොස්තර අරුණ රබෙල් මහත්මා
- සුජිත් මොහොට්ටි මහත්මා
- රංජිත් අමරසිංහ මහත්මා
- ගාමිණී කාරියවසම් මහත්මා
- අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- සිරිසේන හේරත් මැතිතුමා
- විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ධර්මාවබෝධය පහලවේවායි ප්‍රාර්ථනා කරමු.*

# බුද්ධජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලා: 31-1

සූත්‍රාන්තපිටකයෙහි

22 වන ග්‍රන්ථය

# ථෙරගාථාපාළි

## ඛුද්දකනිකාය

පළමුවම භාගය

---

ලංකා බෞද්ධමණ්ඩලයේ ආරාධනයෙන්

මාකඩවර විහාරාධිවාසී
පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන්
වහන්සේ විසින් කරන ලද

සිංහල පරිවර්තනයෙන් යුක්ත යි.

---

බු. ව 2557
ක්‍රි. ව. 2013

# සුත්තන්තපිටකෙ

# ථෙරගාථාපාළි

# සූත්‍රාන්තපිටකයෙහි

# ථෙරගාථා

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො"

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුනේ නො බබලයි."

(අඞ්ගුත්තරනිකාය - තිකනිපාතය - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය.)

# පටුන

## CONTENTS


| | |
|---|---|
| සංස්කාරක නිවේදනය ... ... ... | XXIII |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය ... ... ... | XXIV |
| සංඥාපනය ... ... ... ... | XXV |
| පාළිහෝඩිය — PĀLI ALPHABET ... ... ... | XXXIX |
| සඞ්කේත නිරූපණය — ABBREVIATIONS ... ... | XLI |
| විෂයසූචි ... ... ... ... ... | XLIII |
| පෙළ හා පරිවර්තනය .. ... ... ... | 2-287 |
| ගාථාදිපාදානුක්කමණිකා ... ... ... | 291 |
| සඤ්ඤානාමානුක්කමණිකා ... ... ... | 306 |
| විසෙසපදානුක්කමණිකා ... ... ... | 310 |

# සංස්කාරක නිවේදනය

ත්‍රිපිටක පාළියෙහි සූත්‍රාන්තපිටකයට අයත් ඛුද්දගත් මහසඟීයේ ක්ෂුද්‍රග්‍රන්ථයන් කෙරෙහි අටවැන්න වූ ථෙරගාථා පාළිය බුද්ධජයන්ති ත්‍රිපිටකග්‍රන්ථමාලායෙහි අටවිසි (28) වැන්නට පැමිණෙයි, ලඞ්කාබෞද්ධ-මණ්ඩලය මගින් ප්‍රාරබ්ධ වූ සත්කාර්‍ය්‍යයන් අතුරෙහි අතිශයින් ප්‍රශස්‍ය වූත් දුර්ඝට වූත් කර්‍තව්‍යය වූයේ ත්‍රිපිටකග්‍රන්ථ සිය බසින් අරවා ප්‍රකාශ කිරීම ය. ලඞ්කාබෞද්ධමණ්ඩලයේ ඇරැඹුම් පරිදි ථෙරගාථාපාළිය ද පරිවර්‍තිත වැ තුබූ නමුදු එය විධිමත් පරිවර්‍තනයක් නො වූයෙන් ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලය විසින් එය සපුරා පරිවර්‍තන කරන ලෙස පණ්ඩිත කරගම්පිටි-ගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේට පවරාදෙන ලද්දේ ය.

බොහෝසෙයින් බුදුරදුන්ගේ සම්මුඛශ්‍රාවක වූ මහරහතුන් විසින් තමන් තමන් වහන්සේගේ අධිගත ගුණ ප්‍රකාශ කිරීම් වශයෙන් ද උදාන වශයෙන් ද ඒ ඒ අවස්ථායෙහි ප්‍රකාශ කළ ගාථා යථා විධින් ථෙරගාථා-යෙහි සංගෘහීත වැ ඇත. බුද්ධකාලීන මගධදේශීය ව්‍යවහාරය ද බැස-ගෙන සිටි ධර්‍මාර්ත්‍ථ විසිනුදු ගැඹුරු වූ ථෙරගාථාපරිවර්‍තනය සුකර නො වේ

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන්හි ආචාර්‍ය්‍යවරයකු ව සිටි සිංහල පාළි සංස්කෘත හින්දි ද්‍රාවිඩාදි භාෂාන්තරයෙහි ද ව්‍යාකරණ තර්‍කන්‍යාය ඉතිහාස පුරාවිද්‍යාදි ශාස්ත්‍රාන්තරයෙහි ද, ධර්‍ම විනය විෂයෙහි ද අකුපිල-ඥාන ඇති කරගම්පිටිගොඩ සුමනසාර පණ්ඩිත ස්ථවිරයන් වහන්සේ පරිවර්‍තනකාර්‍ය්‍යය නිසිසේ සිදුකළ අතර ත්‍රිපිටක ග්‍රන්ථයන් පිළිබඳ වැ විවිධ දුර්මත පහළ කරනුවනට පිළිතුරු සපයන සාරගර්භ සංඥාපනය ද ග්‍රන්ථය පරිශීලනය කරනුවන් ගේ පහසුව සඳහා වෙන වෙන මැ ගාථාදි-පාද සංඥානාම හා විශෙෂ පදයන් ගේ අනුක්‍රමණිකා සූචි ද මහත් පරිශ්‍රම-යෙන් සපයනලද වෙයි.

මේ කාර්‍ය්‍යය සපුරාලීම සඳහා ත්‍රිපිටකසම්පාදක මණ්ඩලයේ උපදේශක ඒකාබද්ධ අමරපුරමහානිකායේ සභාපති බළන්ගොඩ මහානායක ස්ථවිර-පාදයන් වහන්සේ ද ත්‍රිපිටකසම්පාදක මණ්ඩලයේ සභාපති අහංගම විද්‍යාචන්ද්‍ර පරිවෙණාධිපති දක්ෂිණලඞ්කායේ ප්‍රධාන සඞ්ඝනායක-ස්ථවිර පාදයන් වහන්සේ ද සහාය වූහ.

ශාසනායුවර්ධනයෙහි හේතු වූ මේ මැ කාර්‍ය්‍යයට පුරෝගාමී ව සිටි ලඞ්කාබෞද්ධමණ්ඩලයේ භවත්හු ද මුද්‍රණයෙන් ප්‍රචාරය කිරීමෙහි උත්සුක වූ සාංස්කෘතික අමාත්‍යාංශයේ සුධීහු ද මුද්‍රණශිල්පීහු ද මෙයින් ජනිත කුසල- ඵලයෙන් සුඛිත වෙත්වායි ආශංසනය කරම්හ.

**ලබුගම ලඞ්කානන්ද ස්ථවිර**
ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලයේ
ප්‍රධාන සම්පාදක.

1972 ජනවාරි 22 වැනි දින
ත්‍රිපිටක කාර්‍යාලයේ දී ය.
කොළඹ මහා නායක චාරිකාරාමය.

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

---

**උපදේශක:**

එක්සත් අමරපුරමහානිකායේ සභාපති අග්ගමහාපණ්ඩිත බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති:**

අහංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති පණ්ඩිත කෝදගොඩ ශ්‍රී ඤාණාලෝක - දක්ෂිණලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක:**

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය පණ්ඩිත ලබුගම ලඞ්කානන්ද - කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභාවේ අනුනායක ස්ථවිරයන් වහන්සේ.

දෙමටගොඩ ධර්මදූතාශ්‍රම විද්‍යාලයාධිපති පණ්ඩිත පරවාහැර පඤ්ඤානන්ද (බී. ඒ. ලන්ඩන්) කොළඹ නවකෝරළයේ ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ-මාකඩවර විහාරාධිවාසී පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

**ලේඛකාධිකාරී:**

බෞද්ධාලෝක මාවතේ බෞද්ධාලෝක විහාරාධිපති පණ්ඩිත දෙරගමුවේ ධම්මපාල කොළඹ පළාතේ ප්‍රධාන නායක ස්ථවිරයන් වහන්සේ.

# සංඥාපනය

ශ්‍රී සුගත තථාගත සම්මා සම්බුද්ධරදුන් විසින් කලියුගවර්ෂ 2513 වැන්නෙහි ඇසළ පුරපසළොස්වක් දවස් දඹදිව, බරණැස, ඉසිපතන නම් වූ මුවලැව්හි දී කොණ්ඩඤ්ඤ තෙරණුවන් ප්‍රමුඛ පස්වග මහණුනට දම්සක් පැවැතුම් සුතත් දෙසා කොණ්ඩඤ්ඤ තෙරණුවන් සෝවන්පෙලෙහි පිහිටුවා නික්මීන්‍යා, අවපෑළවිය දවස් 'භද්දිය' තෙරණුවන් ද දියවක් දවස් 'වප්ප' තෙරණුවන් ද තියවක් දවස් 'මහානාම' තෙරණුවන් ද ජලවක් දවස් 'අස්සජි' තෙරණුවන් ද සෝවන් පෙලෙහි පිහිටුවා විසේනි දවස් අනාත්මලක්ෂණ සූත්‍රදේශනායෙන් පස් දෙනා වහන්සේ මැ රහත්පෙලෙහි පිහිටුවා, එහිභික්ෂු භාවයෙන් පැවිදි උපසපත් කිරීමෙන් පිහිටුවා, වදාළ සම්බුද්ධ සසුන් හෙබ වූ 'සුභූති' ආදි දෙසිය සිව්සැටක් පමණ වූ කෘතකෘත්‍ය ස්ථවිරවරේණ්‍යයන් විසින් නිරාමිෂ ප්‍රීතිසෞමනස්‍යයෙන් උදනාදි විසින් භාෂිත වූ ගම්භීරාර්ථ ඇති ශූන්‍යතා ප්‍රතිසංයුක්ත ආධ්‍යාත්මී ප්‍රකාශක ගාථා ථේර ගාථා නම් වෙයි.

එහි ඇතැම් ගාථා ඒ ඒ තෙරවරුන් විසින් තමන් තමන් අධිගම කළ මගපලසුව ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් උපන් ප්‍රීතිසෞමනස්‍යයෙන් කියූ උදන වශයෙනුදු ඇතැම් ගාථා තමන් තමන්ගේ සමාපත්තිවිහාර ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙනුදු ඇතැම් ගාථා පෘච්ඡා වශයෙනුදු ඇතැම් ගාථා පිරිනිවන් සමයෙහි ශාසනයාගේ නෛර්‍යාණික භාවය ප්‍රකාශ කිරීම් වශයෙනුදු එළවා ඇත. එහිදු ස්වයම්ප්‍රතිභානයෙන් ප්‍රකාශිත ගාථා ද බුදුරදුන් වෙත අසා උගත් ගාථා ද ඇත. එ හැම ගාථා එක්රැස් කොට සඞ්ගීති-කාලයෙහි 'මහාකාශ්‍යප' මහරහත් තෙරණුවන් ප්‍රමුඛ සඞ්ගීතිකාරක ක්ෂීණාස්‍රව මහතෙරවරුන් විසින් සූත්‍රාදි නවාඞ්ග ශාස්තෘශාසනයෙහි ගාථාඞ්ග යෙහි ලා සඞ්ගෘහීත යැ. ග්‍රහණධාරණයෙහි පහසුව තකා නිපාත වර්ග වශයෙන් විභාග කොට උද්දානසඞ්ග්‍රහ ද කරනලද්දේ යැ. තුන්පිටකයෙහි දක්නාලැබෙන නානාවිධ සඞ්ග්‍රහ ප්‍රභේදයෝ සඞ්ගීතිකාරක තෙරවරුන් විසින් මැ කරනලද වෙති. එය කීහ විනයට්ඨකථායෙහි. "බුද්ධවචනං සඞ්ගායන්තෙන මහාකස්සපපමුඛෙන වසිගණෙන අයං ධම්මො, අයං විනයො, ඉදං පඨමබුද්ධවචනං, ඉදං මජ්ඣිමබුද්ධවචනං, ඉදං පච්ඡිමබුද්ධ-වචනං, ඉදං විනයපිටකං, ඉදං සුත්තන්තපිටකං, ඉදං අභිධම්මපිටකං අයං දීඝනිකායො -පෙ- අයං ඛුද්දකනිකායො ඉමානි සුත්තාදීනි නවඞ්ගානි, ඉමානි චතුරාසීති ධම්මක්ඛන්ධසහස්සානීති ඉමං පභෙදං ववත්ථපෙත්වාව සඞ්ගීතං. න කෙවලං එත්තකමෙව අඤ්ඤම්පි උද්දානසඞ්ගහ, වග්ගසඞ්ගහ, පෙය්‍යාලසඞ්ගහ, එකකනිපාත දුකනිපාත ආදි නිපාතසඞ්ගහ, සංයුත්ත-සඞ්ගහ, පණ්ණාසක සඞ්ගහාදිමනෙකවිධං තීසු පිටකෙසු සන්දිස්සමානං සඞ්ගහප්පභෙදං ववත්ථපෙත්වා එවං සත්තහි මාසෙහි සඞ්ගීතං"[1]යි.

ථේරගාථා නිපාත විසින් ඒකකනිපාතය පටන් චුද්දස නිපාතය හිම් කොට එකිනෙක වැඩී ගිය නිපාත තුදුසෙක් ද ඉක්බිති සොළස නිපාත යැ වීසතිනිපාත යැ තිංසතිනිපාත යැ චත්තාලීසනිපාත යැ පඤ්ඤාසනිපාත යැ සට්ඨිනිපාත යැ සත්තතිනිපාත යැ යන සත් නිපාතයෙක්දූ යි එක්විසි නිපාතයෙකින් සමන්විත වෙයි.

1. සමන්තපාසාදිකා - හෙම්මූ 16, 17 පිටු

එකකනිපාතයෙහි වග්ග දෙළොසෙක, එක් වග්ගයෙකැ තෙරවරු දස-දෙනා බැවින් දොළොස්වගෙහි තෙරවරු එක්සියවිසි දෙනෙක, ගාථා එක්සිය විස්සෙකි. දුකනිපාතයෙහි වග්ග පසෙකි, තෙරහු එකුන්පනසෙක. ගාථා අටානූවෙකි. තිකනිපාතයෙහි තෙරහු සොළොස් දෙනෙක, ගාථා අටසාලීසෙකි. චතුක්කනිපාතයෙහි තෙරහු තෙළෙස් දෙනෙක, ගාථා දෙපනසෙකි.* පඤ්චකනිපාතයෙහි තෙරහු දොළොස් දෙනෙක, ගාථා සැටෙකි. ඡක්කනිපාතයෙහි තෙරහු තුදුස් දෙනෙක, ගාථා සුවාසූවෙකි. සත්තකනිපාතයෙහි තෙරහු පස් දෙනෙක, ගාථා පන්තිසෙකි. අට්ඨක-නිපාතයෙහි තෙරහු තිදෙනෙක, ගාථා සූවිස්සෙකි. නවකනිපාතයෙහි එක් තෙර කෙනෙක, ගාථා නවයෙකි. දසකනිපාතයෙහි තෙරහු සත්-දෙනෙක, ගාථා සැත්තෑවෙකි. එකාදසනිපාතයෙහි එක් තෙර කෙනෙක, ගාථා එකොළොසෙකි. ද්වාදසනිපාතයෙහි තෙරහු දෙදෙනෙක, ගාථා සූවිස්සෙකි. තෙරසනිපාතයෙහි එක් තෙර කෙනෙක, ගාථා තෙළසෙකි. චුද්දස නිපාතයෙහි තෙරහු දෙදෙනෙක, ගාථා අටවිස්සෙකි. සොළසනිපාත-යෙහි තෙරහු දෙදෙනෙකි, ගාථා දෙතිසෙකි. වීසතිනිපාතයෙහි තෙරහු දසදෙනෙක, ගාථා දෙසියපන්සාලිසෙකි. තිංසතිනිපාතයෙහි තෙරහු තිදෙනෙක, ගාථා එක්සියපසෙකි. චත්තාලීස නිපාතයෙහි එක් තෙර කෙනෙක, ගාථා දෙසාලිසෙකි පඤ්ඤාසනිපාතයෙහි එක් තෙර කෙනෙක, ගාථා පස්පනසෙකි. සට්ඨිනිපාතයෙහි එක් තෙර කෙනෙක, ගාථා අට-සැටෙකි සත්තතිනිපාතයෙහි එක් තෙර කෙනෙක, ගාථා එක් සැත්තෑවෙකි. හැම තෙරහු දෙසිය සූසැට දෙනෙක, ගාථා එක්දහස් දෙසිය එකානූවෙකි.

සමානනාමික තෙරවරු: එක් බඳු නම් ඇති නොයෙක් තෙරවරු ථෙරගාථායෙහි හමු වෙති. එහි 'අධිමුත්ත' නමින් තෙරවරු දෙදෙනෙක: පළමු තෙරණුවෝ සැවැත්නුවර බමුණුකුලයෙකැ වෙදපාරප්‍රාප්ත වැ සිට දෙව්රම් වෙහෙර මහ උළෙලෙහි බුද්ධානුභාව දැකැ පහන් සිතින් පැවිදි වැ රහත් වූහ, දෙවැනි තෙරණුවෝ සඞ්කිච්ච තෙරණුවන්ගේ නැගැණියන්ගේ පුත්‍ර වෙති, ඔබ ද සැවැත්නුවර බමුණුමහසල් කුලයෙකැ උපන් කෙනෙකි. 'අභය' නමින් දෙදෙනෙක: පළමු තෙරණුවෝ මගධේශ්වර බිම්බිසාර රජහුගේ පුතණු කෙනෙක, දෙවැනි තෙරණුවෝ සැවැත්නුවර බ්‍රාහ්මණ-වංශික වෙති. 'උත්තර' නමින් හෙරණ කෙනෙක් ද තෙරණු කෙනෙක් ද වෙති. හෙරණෝ රජගහනුවර බමුණු මහසල් කුලයෙකැ උපන්නෝ යැ, තෙරණුවෝ සාකෙත නුවර බමුණු කුලයෙකැ උපන්නෝ යි. 'උත්තිය' නමින් තෙරවරු තිදෙනෙක: පළමු තෙරණුවෝ සැවැත්නුවර බමුණු කුලයෙකැ උපන් කෙනෙක, දෙවන තෙරණුවෝ මල්‍යරාජකුමාරයෙක, තුන්වන තෙරණුවෝ කිඹුල්වත්පුර ශාක්‍යරාජකුලයෙහි උපන් කෙනෙකි. 'උසභ' නමින් තෙරවරු දෙදෙනෙක: එක් කෙනෙක් කොසොල්රටැ ආඪ්‍යකුලයෙකින් නික්මැ පැවිදි වූහ, අනෙක් තෙරණුවෝ කිඹුල්වත්පුර ශාක්‍යකුලයෙන් නික්මැ පැවිදි වූහ. 'තිස්ස' නමින් තෙරවරු දෙදෙනෙක: පළමු තෙරණුවෝ සැවැත්නුවර බ්‍රාහ්මණවංශික වෙති, මහමුගලන් තෙරණුවන් කෙරෙහි පැහැද පැවිදි වූහ, දෙවැනි තෙරණුවෝ කොසොල්-රටැ බමුණු කුලයෙකින් නික්මැ බුදුරදුන් වෙතැ පැවිදි වූහ. 'ගෝතම' නමින් තෙරවරු දෙදෙනෙක: රජගහනුවර බ්‍රාහ්මණ කුලයෙකින් නික්මැ පැවිදි වූ එක් තෙර කෙනෙක, කිඹුල්වත්හි ශාක්‍යරාජකුලයෙන් නික්මැ පැවිදි වූ එක් තෙර කෙනෙකි. 'ජේන්ත' නමින් තෙරවරු දෙදෙනෙක:

* මෙකල ඇත්තේ දෙළොස් තෙර කෙනෙකි, ගාථා අටසාළිසෙකි.

එක් තෙර කෙනෙක් මගධරටැ 'ජේන්ත' නම් ගමැ මාණ්ඩලික රජකුගේ පුතණුවෝ යැ, අනෙක් තෙරණුවෝ සැවැත්නුවර කොසොල් රජහුගේ පුරොහිතයන්ගේ පුතණුවෝ යි. 'තිස්ස' නමින් තිදෙනෙක: පළමු තෙරණුවෝ බුදුරදුන්ගේ නැන්දණියන්ගේ පුතණුවෝ යැ, දෙවැනි තෙරණුවෝ රෝරුව රටැ රජ ව සිට අවුත් පැවිදි වූවෝ යැ, තුන්වන තෙරණුවෝ රජගහනුවර වේදපාරප්‍රාප්ත බ්‍රාහ්මණ කෙනෙකි. 'දෙවසභ' නමින් දෙදෙනෙක: පළමු තෙරණුවෝ ගිහි කලැ මාණ්ඩලික රජකෙනෙක, දෙවැනි තෙරණුවෝ කිඹුල්වත්හි ශාක්‍යරාජකුලයෙන් පැමිණියෝ යි. 'නන්දක' නමින් දෙදෙනෙක: චම්පානුවර සිටු කුලයෙකින් නික්මැ පැවිදි වූ එක් තෙර කෙනෙක, සැවැත්නුවර කුලගෙයෙකින් නික්මැ පැවිදි වූ එක් තෙර කෙනෙකි. 'පාරාසරිය' නමින් දෙදෙනෙක: පළමු තෙරණුවෝ රජගහනුවර බ්‍රාහ්මණවංශික කෙනෙක, ත්‍රිවේදයෙහි පාරප්‍රාප්තයෝ යැ, පරාසරගොත්‍ර ඇත්තෝ යැ. දෙවැනි තෙරණුවෝ සැවැත්නුවර බමුණුමහසල් කුලයෙකින් නික්මැ සසුන්ගත වූවෝ යැ, ත්‍රිවේදයෙහි පාරප්‍රාප්තයෝ යැ, පරාසරගොත්‍රයෙහි උපන්නෝ යි. 'වජ්ජිපුත්ත' නමින් දෙදෙනෙක: පළමු වැන්නා විශාලානුවර අමාත්‍ය පුත්‍රයෙක, දෙවැන්නා විශාලානුවර ලිච්ඡවිරාජපුත්‍රයෙකි. 'වනවච්ඡ' නමින් දෙදෙනෙක: එක් තෙර කෙනෙක් කිඹුල්වත්හි 'වච්ඡගොත්ත' බ්‍රාහ්මණයන්ගේ පුත්‍ර වෙති, අනෙක් තෙරණුවෝ රජගහනුවර ආඪ්‍යකුලයෙකැ බ්‍රාහ්මණ කෙනෙකි. 'විමල නමින් දෙදෙනෙක: පළමු තෙරණුවෝ රජගහනුවර ආඪ්‍යකුලයෙකැ උපන් කෙනෙක, දෙවැනි තෙරණුවෝ බරණැස්හි බ්‍රාහ්මණ කුලයෙකැ උපන් කෙනෙකි. 'සුමන' නමින් දෙදෙනෙක: පළමු වැන්නා කොසොල් රටැ බ්‍රාහ්මණයෙක, දෙවැන්නා අනුරුද්ධ තෙරණුවන්ගේ උපාසක කුලයෙකැ උපන් කෙනෙකි. සොපාක' නමින් දෙදෙනෙක: සැවැත්නුවර දුගී කුලයෙකින් නික්මැ පැවිදි වූ එක් තෙර කෙනෙක, රජගහනුවර සොපාක කුලයෙකින් නික්මැ පැවිදි වූ එක් තෙර කෙනෙකි. 'හාරිත' නමින් දෙදෙනෙකි: දෙදෙන මැ සැවැත්නුවර බ්‍රාහ්මණවංශිකයෝ යැ, පළමු තෙරණුවෝ ගිහි කලැ පොළඟකු විසින් දෂ්ට කරනු ලැබැ බිරිය මරණ පත් වීම නිසා සංවේගයෙන් පැවිදි වූහ, දෙවන තෙරණුවෝ දහමෙහි පැහැද පැවිදි වූ කෙනෙකි.

**දෙතැනෙකැ එක තෙරණුවෝ**: එක් මැ තෙරණුවන්ගේ ගාථා දෙතැනෙකැ සඞ්ග්‍රහ කළ තැන් ද ථෙරගාථායෙහි වෙයි. කිඹුල්වත්හි ශාක්‍යවංශික තෙර කෙනකු වූ කිම්බිල (කැමිල) තෙරණුවන්ගේ ගාථා ඒකකනිපාතයෙහි දෙළොස් වන වර්ගයෙහිත් දුකනිපාතයෙහි දෙවන වර්ගයෙහිත් ඇත. එකකනිපාතයෙහි ගාථායෙන් තමන්ගේ සංවේගයත් පැවිද්දත් ප්‍රකාශ වෙයි. දුකනිපාත ගාථායෙන් ආයුෂ්මත් 'නන්දිය' තෙරණුවන් හා 'සමග්ගවාසය' ප්‍රකාශ වෙයි. සැවැත්-නුවර බ්‍රාහ්මණවංශික පාරාසරිය තෙරණුවන්ගේ ගාථා වීසතිනිපාතයෙහි දෙතැනෙක දක්නා ලැබේ. පළමු ගාථා බුදුරදුන් ධරමානකාලයෙහි උන්වහන්සේගෙන් ඉන්ද්‍රියභාවනා සූත්‍රාන්තදේශනා අසා උගෙන ඉන්ද්‍රිය නිග්‍රහ වශයෙන් වදරනලද යැ, දෙවන ගාථා බුදුන් පිරිනිවි කල්හි තමන්ගේ ද පිරිනිවන ආසන්න කල්හි මත්තෙහි භික්ෂූන්ගේ උපිළිවෙත් ප්‍රකාශ කරන්නට වදරනලදි. පුණ්ණමාසථෙරගාථා ද දෙතැනෙකැ වෙයි. එකක නිපාතයෙහි පළමුවන වගැ දස වන ගාථාවත් දුක නිපාතයෙහි තුන් වන වගැ සවන ගාථාත් පුණ්ණමාස තෙරණුවන්ගේ යැ. එකක නිපාතයෙහි

පුණ්ණමාස තෙරණුවන් සැවැත්නුවර 'සමිද්ධි' නම් බමුණුහුගේ පුතණුවන් බව අට්ඨකථායෙහි සඳහන් වෙයි. දුකනිපාතයෙහි පුණ්ණමාස තෙරණුවන් සැවැත්නුවර කෙළෙඹි කුලයෙහි උපන් බව අට්ඨකථායෙහි දැක්වෙයි. මේ හැර වස්තු විසින් දෙක මැ එක් බඳු වෙයි. 'මාලුඞ්ක්‍යපුත්ත' තෙරණුවන්ගේ ගාථා ඡක්කනිපාතයෙහිත් වීසතිනිපාතයෙහිත් ඇත. ඡක්කනිපාත ගාථා නෑයන්ට ධර්මදෙශනා වශයෙන් වදාරනලද යැ. වීසතිනිපාතගාථා පෘථග්ජන කාලයෙහි තමන්ගේ ආරාධනායෙන් බුදුරදුන් සැකෙවින් දෙසූ දහම් මැනැවින් උගත් බව ප්‍රකාශ කරනුවට වදාරනලදි.

**ගාථා සඞ්ග්‍රහ:** ථෙරගාථාවෙහි ඇතැම් ගාථාසඞ්ග්‍රහ එක් මැ කරුණෙහි එක් මැ සම්බන්ධය ඇත ද, ඇතැම් ගාථාසඞ්ග්‍රහ නානාකාරණයෙහි නානාසම්බන්ධ ඇත්තේ යි. එහි දු ඒ ඒ තෙරවරුන් විසින් ස්වයම්ප්‍රතිභානයෙන් ප්‍රකාශිත ගාථා මෙන් මැ පළමු බුදුරදුන් වෙත අසා උගෙනැ පසු වැ ඒ ඒ කරුණෙහි ලා අත්තූපනායිකා කොට ප්‍රකාශ කරනලද ගාථා ද වෙයි. ධම්මපද, උදානගාථා, ඉතිවුත්තකගාථා ආදිය ථෙරගාථායෙහි වැදගත්තේ මෙ අයුරිනි. ඒ ඒ තෙරුන් ප්‍රතිපත්තිමාර්ගයට යොමු කරවනු පිණිස අවවාද විසින් බුදුරදුන් වදාළ ගාථා මැ යළි පිළිවෙත් සඵල වූ කල්හි උදාන වශයෙන් ප්‍රකාශ කරනලද අවස්ථා ද ඇත. එක් මැ ගාථා නොයෙක් තෙරවරුන් විසින් වදාරනලද අවස්ථා ද වෙයි. වාචනාමාර්ගයෙහි ආ ගාථා මැ අත්තූපනායිකා කොටගත් සේ යැ.

**බුද්ධකාලීන වාචනා මාර්ගය:** පන්සාළිස් වසක් පමණ වූ බුදුරදුන් ධරමාන කාලයෙහි මැ විධිමත් සඞ්ඝසංවිධානයෙක් ද ක්‍රමවත් භික්ෂු අධ්‍යාපනයෙක් ද වී. යම් යම් ධර්ම කොටස් මුඛපාඨ වශයෙන් අතැවැසියනට හදරවනලදී. එකල ධර්මගණ විනයගණ විසින් ගණ දෙකෙක් විය. කොසඹෑ නුවර ඝොෂිතාරාමයෙහි දු අතැවැසියන් පන්සිය බැගින් වූ ධර්මගණයෙක් ද විනයගණයෙක් ද වී. "**ඉධ භික්ඛවෙ එකච්චෙ පුග්ගලා ධම්මං පරියාපුණන්ති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං**[1]" ආදි තන්හි දැක්වෙන පරිදි පෙළදහම සුත්ත යැ ගෙය්‍ය යැ වෙය්‍යාකරණ යැ ගාථා යැ උදාන යැ ඉතිවුත්තක යැ ජාතක යැ අබ්භුතධම්ම යැ වෙදල්ල යැ යි ශාසනාඞ්ග නවයෙකැ ලා සඞ්ග්‍රහ කොට හදරනලද බව පෙනෙයි. ඛුද්දකනිකායෙහි ඇතුළු වැ සිටුනා **අභිධර්මපිටකයත්** සූත්‍රාන්තපිටකයෙහි **නිද්දේසයත් පටිසම්භිදාමග්ගයත්** අගසවු **දම්සෙනෙවි** සැරියුත් මහරහතුන් වහන්සේ විසින් මැ වාචනාමාර්ගයට නගා අතැවැසියනට හදරවනලද යැ. විනයෙහි ප්‍රාතිමොක්ෂශික්ෂා, වාචනාමාර්ගයට නැගී අඩමසක් පාසා උද්දෙසයට පත් වැ තිබිණ. **ධම්මපදය** ද වාචනාමාර්ගයට නැගී තුබූ බව **පස්වැනි කසුප්** මහරජහු ධම්පියා අටුවා ගැටපදයෙහි ලා "**බුදුන් සඳහු මෙනියර දෙශනා 'ධම්මපද' නම් සී වෙන් කොට හජාරන බැවින්**" යනුවෙන් කියති. '**ඛුද්දකපාඨ**" සැකැසී ඇති අයුරින් මැ එය ගණවාචනා සඳහා උපයෝගී කරගත් මෞලික පාඨ්‍ය ග්‍රන්ථයක් බව පෙනෙයි. මහාකච්චායන තෙරණුවන්ගේ අතැවැසි **සොණකුටිකණ්ණ** තෙරණුවෝ **සුත්තනිපාතයෙහි** අට්ඨකවග්ගිය ගාථා බුදුරදුන් හමුයේ වාක්කරණසම්පන්න වැ කියා කල්‍යාණවාක්කරණ ඇති භික්ෂූන් අතුරෙහි අගතැන් ලදහ. **සාඬ්ඪි** සතුපයෙන් නගාගත් ධාතුකරඬුයෙකැ "**සප්පුරිසස මහකච්චනස්ස අවසිනො සොනස**" යනුවෙන් උත් වහන්සේගේ

---

1. චතුක්කඞ්ගුත්තර - දුතියවලාහකසුත්ත

නම් දක්නාලැබේ. එකල සුත්තනිපාතය ද වාචනාමාර්ගයට නැඟී තුබූ බව එයින් පෙනෙයි. ඛුද්දකනිකායෙහි ඇතුළු වැ සිටුනා සෙසු ග්‍රන්ථ ගැන ද කිව-යුත්තේ මෙය මැ යි. ප්‍රථමසඞ්ගීතියෙහි සඞ්ගීත වූ අභිධම්මපිටකයත් සුත්තන්තපිටකයෙහි ඛුද්දකනිකායත් පුද්ගලයන්ට නො පැවරීමේ එක් හේතුවක් නම් එය බුදුරදුන් ධරමානකාලයෙහි මැ වාචනාමාර්ගයට නැඟී ගණවාචනාමාර්ගයෙහි පැවතීම යි. වෙනත් නොයෙක් තන්හි ඇති ගාථා ථෙරගාථායෙහි ඇතුළු වීමටත් නොයෙක් තෙරවරුන් එක්මැ ගාථා ප්‍රකාශ කිරීමටත් හේතු මින් සිතාගත හැකි යැ.

**ථේරගාථා යෙදුණු වෙනත් තැන්**: යට දැක්වූ පරිදි නොයෙක් හේතු නිසා බොහෝ ථේරගාථා සූත්‍රාන්තපිටකයෙහි ථෙරගාථායෙන් පිටත් නොයෙක් තන්හි දක්නාලැබේ. ආධුනිකයන්ට ප්‍රයොජන පිණිස ඒ තැන් ථෙරගාථාඞ්ක පිළිවෙළින් මෙහි දක්වා ලම්හ:

**කුණ්ඩධානථෙරගාථා** 15, ධම්මපද භික්ඛුවග්ග, **දාසකථෙරගාථා** 17, ධම්මපද නාගවග්ග, **කුණ්ඩලථෙරගාථා** 19, ධම්මපද දණ්ඩවග්ග **තිස්සථෙරගාථා** 39, දේවතා සංයුත්ත, **සානුථෙරගාථා** 44, යක්ඛ-සංයුත්ත - සානුසුත්ත, **සමිද්ධිථෙරගාථා** 46, මාරසංයුත්ත - සමිද්ධිසුත්ත, **වජ්ජිපුත්තථෙරගාථා** 62, වනසංයුත්ත - වජ්ජිපුත්තසුත්ත, **එකුදානිය-ථෙරගාථා** 68, උදානපාළි - සාරිපුත්තසුත්ත, **සුයාමථෙරගාථා** 74, දසකඞ්ගුත්තර නාථවග්ග, **හත්ථාරෝහපුත්තථෙරගාථා** 77, ධම්මපද නාගවග්ග, **රාධථෙරගාථා** 133, 134, ධම්මපද යමකවග්ග, **මහාචුන්දථෙර-ගාථා** 142, බ්‍රහ්මසංයුත්ත - අන්ධකවින්දසුත්ත, **හෙරඤ්ඤකානිථෙරගාථා** 145, මාරසංයුත්ත - දුතිය ආයුසුත්ත, **සොමමිත්තථෙරගාථා** 147, 148, අභිසමයසංයුත්ත - සගාථසුත්ත, **උපවාණථෙරගාථා** 185, 186, බ්‍රාහ්මණ සංයුත්ත - දේවහිතසුත්ත, **ධම්මපාලථෙරගාථා** 204, චතුක්කඞ්ගුත්තර - පුඤ්ඤාභිසන්දසුත්ත, සක්කසංයුත්ත - දලිද්දසුත්ත, පඤ්චකඞ්ගුත්තර - පඤ්චධනසුත්ත, **අභිභූතථෙරගාථා** 256, 257, බ්‍රහ්මස යුත්ත - අරුණවතී සුත්ත, **සභියථෙරගාථා** 275, ධම්මපද යමකවග්ග, **බ්‍රහ්මදත්තථෙරගාථා** 442 - 445, බ්‍රාහ්මණසංයුත්ත - අක්කොසක සුත්ත, **සිරිමන්දථෙරගාථා** 447, උදාන පාළි සොණවග්ග - උපොසථ සුත්ත, **ලකුණ්ටකභද්දියථෙර** ගාථා 470 - 473, චතුක්කඞ්ගුත්තර - රූපප්පමාණ සුත්ත, **මහාකච්චායන-ථෙරගාථා** 498, ධම්මපද යමකවග්ග, **සිරිමිත්තථෙරගාථා** 507 - 509, චතුක්කඞ්ගුත්තර - පුඤ්ඤාභිසන්ද සුත්ත, පඤ්චකඞ්ගුත්තර - පඤ්චධන සුත්ත, සක්කසංයුත්ත - දලිද්ද සුත්ත, සොතාපත්ති සංයුත්ත - පඨම අනාථපිණ්ඩික සුත්ත හා සගාථක සුත්ත, **කාළුදායිථෙරගාථා** 531, 532, බ්‍රාහ්මණ සංයුත්ත - උදයසුත්ත, **සොණථෙරගාථා** 640 - 644, අඞ්ගුත්තර ඡක්ක-නිපාත - සොණසුත්ත, **උදායිථෙරගාථා** සියල්ල 689 - 704 ඡක්කඞ්ගුත්තර - නාගසුත්ත, (690, 697 ගාථා දෙක්හි මඳ වෙනසෙකි.) **රට්ඨපාලථෙරගාථා** 769 - 788, මජ්ඣිමනිකාය - රට්ඨපාලසුත්ත (775 ගාථාව මජ්ඣිමනිකායෙහි නැත) **මාලුඞ්ක්‍යපුත්තථෙරගාථා** සියල්ල 794-817, සළායතන සංයුත්ත - මාලුඞ්ක්‍යපුත්ත සුත්ත, **සෙලථෙරගාථා** සියල්ල 818 - 841, මජ්ඣිමනිකාය - සෙලසුත්ත, **අඞ්ගුලිමාලථෙරගාථා** 866 - 886 මජ්ඣිමනිකාය - අඞ්ගුලිමාල සුත්ත, **අනුරුද්ධථෙරගාථා** 902 - 904, අට්ඨකඞ්ගුත්තර - ගහපතිවග්ග, 905, 906, බ්‍රහ්මසංයුත්ත - පරිනිබ්බානසුත්ත, දීඝනිකාය - පරිනිබ්බානසුත්ත, **සාරිපුත්තථෙරගාථා** 991, 992, ධම්මපද අරහන්තවග්ග, 993, 994, ධම්මපද පණ්ඩිතවග්ග, 999, උදානපාළි නන්දවග්ග - සාරිපුත්ත සුත්ත, 1000,

වනසංයුත්ත - පදුමපුප්ඵසුත්ත, 1010, 1011, අභිසමය සංයුත්ත - සගාථ-සුත්ත, ඉතිවුත්තකපාළි - සක්කාරසුත්ත, ආනන්දථේරගාථා 1019 - 1025, මජ්ඣිමනිකාය රට්ඨපාලසුත්ත, 1030, ධම්මපද ජරාවග්ග, 1051 දීඝනිකාය - පරිනිබ්බානසුත්ත, මහාකස්සපථේරගාථා 1084,. ඉතිවුත්තකපාළි - සුක්කධම්මසුත්ත, මොග්ගල්ලානථේරගාථා 1170, 1171, භික්ඛුසංයුත්ත - නවකභික්ඛුසුත්ත, 1187 දෙවතා සංයුත්ත - ජේතවනසුත්ත, දෙවපුත්ත සංයුත්ත - අනාථපිණ්ඩිකසුත්ත, භික්ඛුසංයුත්ත - මහානාග සුත්ත, 1192 - 1213, මජ්ඣිමනිකාය මූලපණ්ණාස - මාරතජ්ජනීයසුත්ත, වංගීසථේරගාථා 1214 - 1218, වංගීස සංයුත්ත - නික්ඛන්ත සුත්ත, 1219 - 1223, අරතිසුත්ත, 1224 1227, පෙසල අතිමඤ්ඤසුත්ත, 1228 1132, ආනන්ද සුත්ත, 1233 - 1336, සුභාසිත සුත්ත, 1237-1239, සාරිපුත්තසුත්ත, 1240 1243, පවාරණසුත්ත, 1244-1251, පරොසහස්ස සුත්ත, 1252 - 1254, කොණ්ඩඤ්ඤසුත්ත, 1255 - 1257, මොග්ගල්ලානසුත්ත, 1258 ගග්ගරාසුත්ත, 1259 - 1268 වංගීසසුත්ත (මෙහි මද වෙනසෙකි).

**පශ්චාත්කාලීන තෙරවරු.**

ප්‍රථම සඞ්ගීතියෙන් බොහෝ කලකට පසු වාස කළ තෙරවරුන් තිදෙනකුන්ගේ ගාථා සඞ්ග්‍රහ තුනක් ථෙරගාථායෙහි දක්නාලැබේ. දුකනිපාතයෙහි වීතසොකථේරගාථා යැ ඡක්කනිපාතයෙහි තෙකිච්ඡකානි-ථේරගාථා යැ දසකනිපාතයෙහි එකවිහාරිකථේරගාථා යැ යන තුන යි.

**තෙකිච්ඡකානි**: මූන් වහන්සේ චන්ද්‍රගුප්ත (බු. ව. 162 - 186) රාජ-සභායෙහි සිටි 'සුබන්ධු' නම් බ්‍රාහ්මණයකුගේ පුතණුවෝ යි. සුබන්ධුහුගේ ප්‍රඥාපාටවයත් උපාය කෞශල්‍යයත් කෙරෙහි ඊර්ෂ්‍යා පරවශ වූ චාණක්‍ය බමුණු උපක්‍රමයෙන් රජු ලවා සුබන්ධු දඟගෙහි ලැවී. එපවත් ඇසූ තෙකිච්ඡකානි පලාගොස් වනවාසී තෙරුන් වෙත පැවිදි වැ රහත් වී.[1]

**වීතසොක**: මූන් වහන්සේ ධර්මාශෝක රජුගේ කනිටුබෑයා බව අට්ඨ-කථායෙහි සඳහන් වෙයි. එහි සඳහන් පරිදි වීතසොක කුමර ක්ෂත්‍රිය ශිල්පය සපුරා උගත්තේ යැ ගෘහජීවිතයෙහි දී මැ 'ගිරිදත්ත' තෙරණුවන් ඇසුරෙහි සූත්‍රාන්තපිටකයත් අභිධර්මපිටකයත් හදුරා එහි විශාරද වී. දිනක් මස්වලු කම්හි කපුවා අතින් කැටපත ගෙන බලා සිය සිරැරෙහි වලිත පලිතාදීන් දක සංවේගයට පැමිණ විදර්ශනා වඩා හුනස්නෙහි මැ සෝවන් වැ ගිහිසැප හැරපියා ගොස් 'ගිරිදත්ත' තෙරුන් වෙතැ පැවිදී වැ නො බෝ දවසෙකින් රහත් වී.[2]

**එකවිහාරික**: ථෙරගාථායෙහි 'එකවිහාරික' නමින් හැඳින්වෙනුයේ ධර්මාශෝක (බු ව. 218 - 255) මහරජුගේ කනිටු සොහොවුරු 'තිස්ස' තෙරණුවෝ යි. උන් වහන්සේගේ චරිතකථාව ථෙරගාථාට්ඨකථායෙහිත් විනයට්ඨකථායෙහිත් දක්නා ලැබේ. පළමු මිසදිටු ගෙන සිටි 'තිස්ස' කුමරු සසුන්හි පහන් අයුරු ථෙරගාථට්ඨකථායෙහි නො දක්වෙයි. එය ''කෙනචි උපායෙන - කිසි උපායෙකින්'' යනුවෙන් සඳහන් වෙයි. විනයට්ඨකථායෙහි සඳහන් පරිදි තිස්ස තෙරවන සැකෙවින් මෙසේ යැ: **තිස්ස** තෙරණුවෝ නම් අශෝක රජහුගේ එකමාතෘක බෑයා වන 'තිස්ස' කුමර වෙයි. රජ අභි-ෂේකයට පැමිණ ඔහු යුවරජ තන්හි තැබී. දිනක් හෙතෙම වනයට ගියේ

1. ථෙරගාථට්ඨකථා - හෙවිමූ. 440 පිටුව
2. ථෙරගාථට්ඨකථා - හෙවිමූ. 295 පිටුව

මුවහමුව රැළක් කෙළිදෙලෙන් කල් යවනු දැක මෙසේ සිතී: "තණබුදින මුවතුදු මෙසේ නම් රජගෙයි ප්‍රණීත අහර වළඳා මොළොක් යහන්හි හොවනා මේ ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ කෙතෙක් නම් මනාප ක්‍රීඩා නො කෙරෙත් ද?" කියා යි. රජහට ද එ බව දැන්වී. රජ උපායෙකින් ඔහුට කරුණු වටහනු පිණිස සත් දවසකට රජය පවරා සියලු රාජපරිහාර ද දෙවා සත් වන දවස ඔහු ඝාතනය කරන බවට ද තර්ජනය කෙළේ යැ. මරණයෙන් බියපත් කුමර සිත්සේ සනාන නො කෙළේ යැ, අහර නො වැළඳී යැ, ශයනය නො කෙළේ යි. ඔහුගේ සිරුර වැහැරී ගියේ යැ. රජ සත්වන දවස් කුමරු කරා පැමිණ සිරුර වැහැරී යැමට කරුණු විචාළේ යැ. මරණ බියෙනැ'යි පිළිවදත් දින. එබස් ඇසූ රජ 'තෙපි පරිවර්ජිත මරණ දක්මින් සිත්සේ ක්‍රීඩා නො කළහු යැ. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ ආශ්වාස ප්‍රශ්වාසෝපනිබද්ධ මරණය දක්මින් කෙසේ නම් ක්‍රීඩා කෙරෙත් ද'යි කී. කුමර මිථ්‍යාදෘෂ්ටි හැරපියා සසුන්හි පහන් වී. දිනක් මුවදඩ ගිය කුමර තෙම අරණෙහි වැඩහුන් යෝනකමහාධම්මරක්ඛිත තෙරුන්ට වලැතකු සල්අත්තෙකින් පවන් සලන්නා දැක පැවිද්දෙහි සිත් බැඳී එයට රජුගෙන් අවසර යැදී. රජ නොයෙක් අයුරින් කරුණු කියාත් නවතනු නොහී කුමරු පෙරහරින් අශෝකාරාමයට වඩාගෙන ගියේ යැ. එහි පධානඝරයෙහි මහාධම්මරක්ඛිත තෙරුන් වෙත පැවිදි වූ "තිස්ස' විදර්ශනා වඩා රහත් වී.[1]

**දිව්‍යාවදානයෙහි වීතශෝක:** සර්වාස්තිවාදී බෞද්ධග්‍රන්ථයක් වූ දිව්‍යාවදානයෙහි ද වීතශෝක චරිතයෙක් වෙයි. එය සමහර කරුණු අතින් අසමාන වුවද වස්තු විසින් 'තිස්ස' චරිතය හා සැසැඳෙයි. එහි දැක්වෙන පරිදි 'වීතශෝක' අශෝක රජහුගේ කනිටු සොහොවුරු ද යුවරජ ද වෙයි. තීර්ථක සමය ගෙන සිටි හෙතෙම අශෝක රජුගේ නොයෙක් අවවාදයෙනුදු බුදු සමයට නො නැමී. දිනක් මුවදඩයමට වනයාත්‍රා කළ වීතශෝකහට වනයෙහි දොළොස් හවුරුද්දක් මුළුල්ලෙහි පඤ්චතාපයෙන් තැවෙමින් කෂ්ටතපස් කරන, වනමූලඵලාහාරයෙන් යැපෙන, වල්කල හඳනා, තණ ඇතිරියෙහි හොවනා තවුසෙක් හමු විය. සුවදුක් විචාළ කල්හි හෙ මෙසේ කී: "සෘතුකාලයෙහි වල්මුවන් කෙළිදෙලෙහි යෙදෙනු දකුත් මැ රාගයෙන් දැවෙමි. ඒ මිස අන් කිසි දුකෙක් නැත" කියා යි. එබස් ඇසූ වීතශෝකහට මෙ සිතවී:" "මොහට මෙතෙක් කල් මෙවන් කෂ්ටතපසිනුදු රාගය ප්‍රහීණ නො වී නම් ප්‍රණීත සිවුපසය වළඳන ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ කෙසේ නම් රාග ප්‍රහාණ කෙරෙත් ද, රජ ඔවුන් කෙරෙහි මුළා වැ සත්කාර කෙරෙයි" කියා යි. මෙ පවත් රජහට ද දැන් වී. රජ තෙම උපායෙකින් ඔහට කරුණු වටහනු පිණිස ඇමැතියන් කැඳවා මන්ත්‍රණය කොට තමා සනානාගාරයට පිවිසි කල්හි වීතශෝක කුමරු රාජාභරණයෙන් සරසා සිහසුන් අරවන්නට නියෝග කෙළේ යැ. ඔහු එසේ කළහ. රජ 'තමා ජීවත් වැ සිටිය දී සිහසුන අත්කරගැනීම ගැන වීතශෝක වධයට නියම කෙළේ යැ. ඇමැත්තෝ ඔහුට අභයදාන ඉල්වූහ. රජ ඝාතනය සත්දවසකට කල් තබා එතෙක් රාජ්‍යය පවරා සියලු රාජපරිහාර ද දෙවී. දවස්පතා වධයට පමුණුවන දිනයත් ඉකුත් දින ගණනත් ඔහු හමුයේ කියැ වී. සත් වන දවස් ඔහු වෙත පැමිණී රජ කිම නැටුම් ගැයුම් වැයුම් ආදි රාජෝපහාර නිසි ලෙස පැවැත්වී ද? යි වීතශෝකගෙන් විමසී. 'මරණය මැ සිහි කෙරෙමින් සිටී තමා ඒ කිසිවක් නුදුටු නො ඇසූ විරු යැ'යි වීතශෝක පිළිවදත් දින. එබස් ඇසූ රජ තෙම නොයෙක් ජාතිශතයෙහි මරණ භයින් භය පත් වැ 'මරණසති'

1, සමන්තපාසාදිකා - හෙවිමු. 31 පිටුව, ථෙරගාථට්ඨකථා - හෙවිමු. 504 පිටුව

වඩන ශ්‍රමණශාක්‍යපුත්‍රයන්ට ක්ලෙශ සමුද්‍රචාර නො වන පරිදි වටහන පිණිස මේ උපාය කළ බව පැවැසී. 'වීතශෝක' බුදු සමයෙහි පහන් වැ කුර්කුටාරාමයට ගොස් අභිඥප්‍රාප්ත යශ තෙරුන්ගෙන් බණ අසා රජුගෙන් අවසර ගෙනැ පැවිදි වැ රහත් වී.[1]

පළමු දක්වූ 'තිස්සථෙර' චරිතයත් මෙහි දක්වූ 'වීතශෝක' චරිතයත් වස්තු විසින් එකක් මැ බව පෙනෙයි. දිව්‍යාවදානයෙහි 'වීතශෝක' නමට 'තිස්ස' ථෙර වස්තුව එක් වූ සැටියෙකි. ථෙරගාථාත් එහි අටුවාත් අනුව 'වීතශෝක' පැවිද්දට යත්තේ මහලු වියේ දී යැ. ඔහු පළමු මිසදිටු ගෙනැ සිටි බවෙක් ද නො පැනේ. 'වීතසෝක' ගෘහජීවිතයෙහි මැ සූත්‍රාභිධර්ම දෙක්හි විශාරද වැ සිටියේ යැ. ගිහිබිම්හි මැ සෝවන් වැ පැවිදි වූයේ 'ගිරිදත්ත' තෙරණුවන් වෙත යැ. දිව්‍යාවදානයෙහි 'වීතශෝක' පැවිදි වූයේ 'යශ' නම් තෙර කෙනකුන් වෙත යැ. මිසදිටු ගෙනැ සිටියේ 'තිස්ස' කුමර යැ. එහෙත් එ කුමරු පැවිදි වූයේ මහළු වියෙහි නො වැ තුරුණු වියෙහි මැ යැ. අශෝක අභිෂේකයෙන් සතර වැන්න වූ බුදුන් පිරිනිවි දෙසිය දෙවිසි වැන්නෙහි යැ. එසින් ථෙරගාථායෙහි සඳහන් 'වීතසෝක' යනු තිස්ස තෙරුන්ගේ අපරනාමයක් ලෙස ද ගත නො හෙයි. තිස්ස කුමරු පැවිදි වූයේ අශෝකාරාමයෙහි පධානඝර වැසි යෝනක මහා ධම්මරක්ඛිත තෙරණුවන් වෙත යැ. දිව්‍යාවදානයෙහි 'වීතශෝක' පැවිදි වූයේ කුර්කුටාරාමයෙහි යශ තෙරණුවන් වෙත යැ. මෙසේ සලකත් මැ දිව්‍යාවදානයෙහි වීතශෝක චරිතය ථෙරගාථායෙහි වීතසෝක ථෙර චරිත තිස්සථෙර චරිත යන දෙකින් එක ද චරිතයක් හා සමග සැසැඳිය නො හේ.

**සංඛ්‍යා විසංවාදතා:**

චතුක්කනිපාතයෙහි තෙරවරු තෙළෙස් දෙනෙක් ද ගාථා දෙපනසෙක් ද ඇතැ'යි උද්දානයෙහි සඳහන් වෙයි. එහෙත් එහි දුන් තෙරවරු දොළොස් දෙනෙකි. ගාථා අටසාළිසෙකි. එක් තෙර කෙනකුන් ගිලිහීගිය සේ යැ. විසති නිපාතයෙහි ගාථා දෙසිය පන්සාළිසෙක් ඇතැ'යි උද්දානයෙහි සඳහන් වෙයි. දුන් එහි ගාථා දෙසිය සිවිසාළිසෙකි. සියලු ථෙරගාථා එක්දහස් එක්සිය තෙසැටෙකැ'යි ද තෙරවරු දෙසිය සියුසැටෙකැ'යි ද ග්‍රන්ථාවසාන උද්දානයෙහි සඳහන් වෙයි. දුන් ගාථා සංඛ්‍යාව එක්දහස් දෙසිය අනූඑකෙකි. උද්දානසංඛ්‍යාවට වඩා ග්‍රන්ථයෙහි සංඛ්‍යාව එක්සිය අටවිස්සෙකින් වැඩි වෙයි. තෙරවරුන්ගේ සංඛ්‍යාව ද නිපාත උද්දානසංඛ්‍යා අනුව ගතහොත් දෙසිය හැටපහක් වියයුතු යැ. චතුක්කනිපාතයෙන් ගිලිහුණු ථෙරනාමය හළ විට දෙසිය සූසැට හා සැසැඳෙයි. එසින් පෙනෙනුයේ ග්‍රන්ථාවසාන උද්දානය අවසාන මහාසංගායනාව වූ තුන්වන සංගීතිකාලයට පළමු මැ චතුක්ක නිපාතයෙහි තෙළෙස් වැනි තෙරුන්ගේ නම ගිලිහී තුබූ බවෙකි. උද්දානයෙහි ගාථාසංඛ්‍යාවත් ග්‍රන්ථයෙහි විද්‍යමාන ගාථාසංඛ්‍යාවත් අතර වෙනස විමසුව මනා යැ. නිපාතාවසාන උද්දානයන්හි නිර්දිෂ්ට සංඛ්‍යා එක් කොට ගත් කලැ එය දුන් පවත්නා ගාථාසංඛ්‍යාව හා සමග මැනැවින් සැසැඳෙයි. වෙනස ඇත්තේ ග්‍රන්ථාවසාන උද්දානයෙහි සඳහන් ගාථාසංඛ්‍යාවෙහි යැ. මේ වෙනසට හේතුව අනෙකක් නො වැ ප්‍රථමසංගායනායෙහි සංගීත වූ ථෙරගාථා සංඛ්‍යාව නො වෙනස් කොට පවත්වාගෙන ඊම යයි සැලකුව මනා යැ. ථෙරසංඛ්‍යා ගිණීමේ දී චතුෂ්කනිපාතයෙන් ගිලිහුණු තෙරුන් බැහැර කොට ඇති නමුදු ගාථාසංඛ්‍යා දක්වීමේ දී ඒ තෙරුන්ගේ ගාථා චතුෂ්කය

---

1 දිව්‍යාවදාන - 272 - 278 පිටු, මිථිලා විද්‍යාපීඨප්‍රකාශන 1959.

බැහැරැ කොට නැත. එය බැහැර කල විට ඉතිරි වනුයේ ගාථා එක්දහස් එක්සිය පනස් නවයෙකි. මේ අනුව ප්‍රථමසඞ්ගීතියෙන් පසු ථෙරගාථායෙහි සඞ්ග්‍රහ කරනලද ගාථා සඞ්ඛ්‍යාව එක්සිය දෙතිසෙකි. (132) එ ද විමසම්හ:

**අනුරුද්ධථෙරගාථා**: වීසතිනිපාතයෙහි අනුරුද්ධ තෙරණුවන් වදල ගාථා අටවිස්සෙක් (28) ඇත. එහි උන් වහන්සේ පරිනිර්‍වාණයට ආසන්න කාලයෙහි වදල ගාථා ද වෙයි. එයින් ඒ ගාථා උන් වහන්සේ ද සහභාගී වූ ප්‍රථම සඞ්ගීතියෙහි ඇතුළු වියැ නො හෙයි. ද්විතීයසඞ්ගීතියෙහි දී මැ ඇතුළු විය යුතු යැ.

**පාරාසරියථෙරගාථා**: පාරාසරිය තෙරණුවන් වදල ගාථා සඞ්ග්‍රහ දෙකක් ථෙරගාථායෙයි ඇත. එහි පලමු ගාථාසඞ්ග්‍රහය බුදුරදුන් ධරමාන කාලයෙහි, තමන් පෘථග්ජන කාලයෙහි ඉන්ද්‍රිය නිග්‍රහ පිණිස වදල බවත් දෙවැනි ගාථා සඞ්ග්‍රහය බුදුන් පිරිනිවි කල්හි තමන්ගේ ද පිරිනිවන එළැඹැ සිටි කල්හි අායති භික්‍ෂූන්ගේ උපිළිවෙත් ප්‍රකාශ කරන පිණිස වදල බවත් අට්ඨකථායෙහි මැ සඳහන් වෙයි. එයින් එ ද ප්‍රථම සඞ්ගීතියෙහි ඇතුළු වියැ නො හෙයි. එහි ගාථා සඞ්ඛ්‍යාව එකුන්තිසෙකි (29).

**ආනන්දථෙරගාථා**: තිංසතිනිපාතයෙහි අනඳ තෙරණුවන් වදල ගාථා එකුන්සාලිසෙක් (39) ඇත එහි උන් වහන්සේ පරිනිර්‍වාණයට ආසන්න කාලයෙහි වදල ගාථාත් පරිනිර්‍වාණය ගැන ධර්‍මසඞ්ග්‍රාහක තෙරවරුන් වදල ගාථාත් ඇත. ප්‍රථමසඞ්ගායනාවෙහි ධර්‍මය පිළිබඳ ප්‍රමුඛත්‍වය දැරුවෝ අනඳ තෙරණුවෝ යි. උන් වහන්සේගේ අර්හත්‍වප්‍රාප්තිය සිදු වූයේත් සඞ්ගායනාව ආරම්භ කළ දිනයෙහි මැ යැ. එයින් එය ද්විතීය සඞ්ගීතියෙහි මිස ප්‍රථමසඞ්ගීතියෙහි ඇතුළු වියැ නො හෙයි.

**සම්භූතථෙරගාථා**: චතුක්කනිපාතයෙහි සම්භූත තෙරණුවෝ ධර්‍ම භාණ්ඩාගාරික අනඳ තෙරණුවන්ගේ අතැවැසියෙකි. උන්වහන්සේ සම්බුද්ධ පරිනිර්‍වාණයෙන් පසු පැවිදි වූහ. ද්විතීය සඞ්ගායනායෙහි දශවස්තු විනිශ්චය සඳහා පත් කරනලද තෙරවරුන් අටදෙනා අතුරෙහි කෙනෙකි. උන් වහන්සේ වදල ගාථා චතුෂ්කයෙහි පලමු ගාථා දෙක දශවස්තු නිසා සස්නෙන් බැහැරැ කරනලද වජ්ජිපුත්තක භික්‍ෂූන් අරභයා වදරනලද වෙයි. එයින් සම්භූතථෙරගාථා ද ප්‍රථම සඞ්ගීතියට නො වැටෙයි.

**ගොදත්තථෙරගාථා**: චුද්දසනිපාතයෙහි ගොදත්ත තෙරණුවන්ගේ ජීවනසමය නිශ්චය කිරීමට කරුණු අටුවායෙහි නො පැනෙයි. එහි සඳහන් වනුයේ උන් වහන්සේ එක්තරා තෙර කෙනකුන් වෙතැ පැවිදි වැ විදර්ශනා වඩා රහත් වූ බව පමණි. බුදුන් දක්නට පැමිණි බවෙක් හෝ බුද්ධකාලීන තෙර කෙනකුන් හමු වූ බවෙක් හෝ උන් වහන්සේගේ චරිතකථායෙහි නො පෙනේ. එයින් උන් වහන්සේ ද ප්‍රථම සඞ්ගීතියෙන් පසු කලෙකැ වූහ යි ද ගොදත්තථෙරගාථා ප්‍රථමසඞ්ගීතියෙන් පසු ථෙරගාථායෙහි සඞ්ගෘහිත වී යයි ද සැලැකිය යුතු යැ.

**තෙකිච්ඡකානිථෙරගාථා**: ඡක්කනිපාතයෙහි තෙකිච්ඡකානි තෙරණුවන්ගේ ජීවනසමය චන්‍ද්‍රගුප්තරාජසමය යි. එයින් උන් වහන්සේ වදල ගාථා තෘතීයසඞ්ගීතියෙහි දී ථෙරගාථායෙහි සඞ්ග්‍රහ වියැයුතු යැ.

**වීතසෝක-ඒකවිහාරිකථෙරගාථා:** දුකනිපාතයෙහි 'වීතසෝක' තෙරණුවෝත් දසකනිපාතයෙහි 'ඒකවිහාරික' තෙරණුවෝත් ධර්මාශෝක මහරජහුගේ කනිටු සොහොවුරෝ වෙති. එයින් උන් වහන්සේ වදාළ ගාථාත් තෘතීයසඞ්ගීතියෙහි දී ථෙරගාථාවට ඇතුළු විය යුතු යැ. මෙ කරුණු අනුව සලකන කල්හි ප්‍රථමසඞ්ගීතියෙන් පසු ථෙරගාථායෙහි සඞ්ග්‍රහ කරන ලද ගාථා මෙසේ දක්විය හැකි යැ:

| | |
|---|---|
| අනුරුද්ධථෙරගාථා | 28 |
| පාරාසරියථෙරගාථා | 29 |
| ආනන්දථෙරගාථා | 39 |
| සම්භූතථෙරගාථා | 4 |
| ගොදත්තථෙරගාථා | 14 |
| තෙකිච්ඡකානිථෙරගාථා | 6 |
| වීතසෝකථෙරගාථා | 2 |
| ඒකවිහාරිකථෙරගාථා | 10 |
| එකතුව | 132 |

ගාථා සඞ්ඛ්‍යා සැසැඳී ඇති අයුරු ආශ්චර්යජනක යැ. මෙහි දී නැගෙන කුතුහලයෙක් වෙයි: ද්විතීයසඞ්ගීතියෙහි දීත් තෘතීයසඞ්ගීතියෙහි දීත් ධර්මසඞ්ග්‍රාහක තෙරවරු නිපාතඋද්දානයන්හි ස්ථවිරසඞ්ඛ්‍යාවත් ගාථාසඞ්ඛ්‍යාවත් සංස්කරණය කොට ග්‍රන්ථාවසාන උද්දානයෙහි පූර්වාර්ධය ද සංස්කරණය කොට එහි අපරාර්ධය කවර හෙයින් සංස්කරණ නො කළෝ ද යනු යි. ඒ වූ කලි ප්‍රථමසඞ්ගීතියෙහි ථෙරගාථා වෙන් කොට හැඳින ගනු පිණිස ධර්මසඞ්ග්‍රාහක තෙරවරුන් සිතාමතා මැ උද්දානය තුබූ සැටියෙන් මැ සුරක්ෂිත කළ සැටි වෙයි. උද්දානයෙහි වෙනස මැ අප මේ විමර්ශනයෙහි මෙහෙයාලී.

**ථෙරගාථා පශ්චාත්කාලීන කාව්‍යරචනා ද?**

ථෙරගාථා 'ප්‍රථමසඞ්ගීතියෙහි සඞ්ගීත නො වී යැ'යි ද 'පශ්චාත් කාලීන කාව්‍යරචනා යැ'යි ද විමති පළ කරත්තෝ ඇත. චන්ද්‍රගුප්ත රාජසමයෙහි ද ධර්මාශෝක රාජසමයෙහි ද ජීවත් වූ තෙරවරුන්ගේ ගාථා මෙහි ඇතුළු වැ තිබීම මේ විමතියට හෙතු වනු වියැ හැකි යැ. ථෙරගාථාවසාන උද්දානයෙහි සඳහන් ගාථා එක්දහස් එක්සිය තෙසැට (1163) ප්‍රථමසඞ්ගීතියෙහි සඞ්ගීත වූ බවත් තවත් ගාථා එක්සිය තිස්දෙකක් එයට පසු වැ එක් වී ඇති සැටිත් පළමු පැහැදිලි කළම්හ. එයින් ථෙරගාථාව ප්‍රථමසඞ්ගීතියෙහි සඞ්ගීත නො වී යන මතය අනාථ වෙයි.

'කාව්‍යරචනා' යනුදු ථෙරගාථා සඳහා නො යෙදෙයි. 'කාව්‍ය' නම් රසාත්මක වාක්‍ය යි. ''වාක්‍යං රසාත්මකං කාව්‍යම්' යනු සාහිත්‍යදර්පණයෙහි ශ්‍රී විශ්වනාථාචාර්ය යි. කාව්‍යයෙහි 'රස' නම් නවනාට්‍යරස යි. කාව්‍ය කරනුයේ රසාස්වාද සඳහා යි, විෂයරසානුභව සඳහා යි. 'සියලු ආස්‍රවයන් ක්ෂය කොට අනුපාද විමුක්තියට පැමිණි, එහෙයින් මැ කිසිදු අරමුණෙකැ නො බැඳෙන රහතුන් වහන්සේ රසාස්වාද පිණිස කවි කීහ'යි කීම උන් වහන්සේගේ ක්ෂීණාස්‍රවභාවයට කරන අවමනෙකි. ථෙරගාථා කාව්‍ය ස්වරූපයෙන් ගන්නෝ 'කාව්‍ය යනු කිමෙකැ'යි නො හඳුනත්තෝ යැ. ථෙරගාථා වදාළ තෙරවරුන් ලොව බාලුයේ කවියන් ලොව බලන අයුරින් නො වේ නිදසුන් විසින් 'චූළක' ථෙරගාථාත් 'සප්පක' ථෙරගාථාත් දක්විය හැකි යැ:

(i) මයූරයෝ, උන්ගේ නාද, නිල්තණ බිම්, ගලායන දියදහර, අහස පැතිරැසිටි වැසිවලාකුළු යන මේ සුන්දර වස්තූන් එක්තැන් වීම කවිසිත්හි රතිය දල්වන උද්දීපනවිභාවයෝ යි. එහෙත් එය චූලක තෙරුන් දුටුයේ භාවනාවට යොග්‍ය සෘතුසත්ප්‍රාය එලැඹැසිටි සැටියෙනි. (78 පිටුව)

(ii) අහස පැතිරැසිටි වැසිවලා ඉගිලයන කොක්පෙළ ගලායන ගිරිනදිය, ගංඉවුරෙහි පලබර දඹරුක්වදුළු, මැඩියන්ගේ ගම්භීරනාදය, ගිරිකඳුරු යන මෙ කරුණු කවියකුගේ නෙත් පිනවන කන් පිනවන කය පිනවන දිව පිනවන සුන්දර වස්තු යැ, රතිභාව උද්දීපන කරන විභාවයෝ යි. අජකරණී නදී සමීපයෙහි ගිරිගුහාවකැ වාස කළ 'සප්පක' තෙරණුවන් යට කී සුන්දර වස්තූන්ගේ එක්තැන් වීම දුටුයේ විවේකවාසයට යොග්‍ය ජනශූන්‍ය තපොභූමියකැ සෘතුසත්ප්‍රාය එලැඹැසිටි අයුරිනි. (100 පිටුව)

කාමී පුරුෂයාත් යොගියාත් එක් මැ කාමිනිය දක්නේ දෙඅයුරෙකිනි. කාමීපුරුෂයාහට කාමිනිය කාම්‍යවස්තුවකි, ශුභාලම්බනයෙකි. හෙ එහි ඇලෙයි, ලැගෙයි. එහෙත් යොගියාහට ඕ අශුභාලම්බනයකි. හෙ එහි නො ඇලෙයි, නො ලැගෙයි, කලකිරෙයි, විරක්ත වෙයි. මෙසේ මැ කවියාත් ක්ෂීණාස්‍රවයන් වහන්සේත් එක් මැ ලොව දක්නේ වෙන් වෙන් අයුරිනි. කරුණු මෙසේ හෙයින් ථෙරගාථා කාව්‍යරචනා ලෙසත් තෙරවරු කවියන් ලෙසත් ගැනීම 'හැම පද්‍යයක් මැ කාව්‍යයෙකැ'යි මුළායෙන් කරන වරදෙකි.

**විශෙෂ ප්‍රයෝග**:– පාළියෙහි සුලභ නො වූ ශබ්දප්‍රයොග ද ථෙරගාථායෙහි දක්නාලැබේ. පහත පළ වන්නේ එවැනි ශබ්දප්‍රයොග යි.

**'වඤ්චිතාසෙ' 'සඞ්කිලිස්සමානාසෙ'**: 'වඤ්චිතා' 'සඞ්කිලිස්සමානා' යනු ථෙරගාථායෙහි 'වඤ්චිතාසෙ' 'සඞ්කිලිස්සමානාසෙ' (ගා. 102) යනුවෙන් දක්නාලැබේ. ''යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ' ආදී ශ්‍රී මූඛපාළියෙහි දු විරල වැ පෙනෙන මේ ප්‍රයොගය වෙදභාෂාවට මැ විශෙෂ වූ ''දෙවාසඃ' 'බ්‍රාහ්මණාසඃ' යනාදී ප්‍රථමා බහුවචනස්වරූප වෙයි. 'වඤ්චිතාසඃ' 'ගතාසඃ' ආදි වෛදික ව්‍යවහාරය 'වඤ්චිතාසෙ' 'ගතාසෙ' ආදි විසින් සිටී.

**'වන්දිසං'**: 'වන්දිං' යන අජ්ජතනී උත්තමපුරුෂ එකවචනාඛ්‍යාතය 'වන්දිසං' කියා ථෙරගාථායෙහි (621) යොදනලද්දේ යැ. ''කරස්ස කාසත්තමජ්ජතනිම්හි'' යන සූත්‍රයෙහි 'සත්තමජ්ජතනිම්හි' යන යොගවිභාගයෙන් අජ්ජතනී ආඛ්‍යාතයෙහි 'ස' කාරාගමයට ව්‍යාකරණයෙහි අවකාශ තබන ලදි. එහෙත් එවන් රූප පාළියෙහි සුලභ නො වේ. ථෙරගාථායෙහි 'අනුසුඤ්ජිසං' (157), 'පච්චවෙක්ඛිසං' (169, 347, 765), 'පරිවත්තිසං' (215), 'අගච්ඡිසං' (258) 'උදික්ඛිසං' (268), 'මඤ්ඤිසං' (342, 424), 'අච්ඡිසං' (487), 'අභුඤ්ජිසං' (1061) ආදීන් මේ ප්‍රයොගය බහුල වැ දක්නාලැබේ.

**'කුද්දාලාසු'**: 'කුද්දාල' ශබ්දයෙහි පඤ්චමී එකවචනය 'කුද්දාලාසු'යි ථෙරගාථායෙහි (43) දක්නා ලැබේ. මෙසේ මැ 'නඞ්ගල' 'අසිත' ශබ්දයන්ගේ පඤ්චමී එකවචනය ද 'නඞ්ගලාසු' 'අසිතාසු' යයි යොදනලද වෙයි. මෙද ප්‍රාකෘත ගතියි.

'ඣියායති': 'ඣායති' යන ආඛ්‍යාතරූපය 'ඣියායති' යනුවෙන් ථෙරගාථායෙහි (446) සඳහන් වෙයි. සංස්කෘතයෙහි 'ධ්‍යායති' යන්නෙහි ප්‍රාකෘතස්වරූපය යි. මෙසේ මැ 'පලවති' යනු 'පිලවති' (104) කියා ද 'ව්‍යඤ්ජනා' යනු 'වියඤ්ජනා' (819) කියා ද යොදනලද්දේ යි.

'පාමිංසු': 'ප' පූර්ව 'මා-පමාණෙ' ධාතුයෙහි අජ්ජතනී ප්‍රථමපුරුෂ බහුවචනාඛ්‍යාතය 'පමිනිංසු' යනු වෙයි. එය 'පාමිංසු' යනුවෙන් ථෙරගාථායෙහි (469) යොදනලද්දේ යැ. මෙසේ මැ 'කාසිස්සං' යනු 'කාසං' (381) කියා ද 'විගරිස්සං' යනු 'විගස්සං' (1096, 1097, 1098) කියා ද යොදන ලද්දේ යි.

## සිංහල පරිවර්තනය

බෞද්ධමණ්ඩලයේ ආරාධනය පරිදි කරනලද මෙහි පළමු පරිවර්තනය ත්‍රිපිටකපරිවර්තන සංස්කාරක මණ්ඩලය තෘප්ත කරලීමෙහි නොසමත් විය. එයින් එය නැවත පරිවර්තනය කිරීමේ භාරය අපට පැවරිණ. මේ කාර්‍ය්‍යයෙහි අප මෙහෙය දිරිමත් කිරීමෙන් අනුග්‍රහ කළාහු ත්‍රිපිටක පරිවර්තන සංස්කාරක මණ්ඩලයේ සම්පාදක තන්හි සිට අපවත් වී වදාළ මහොපාධ්‍යාය දර්ශනවිශාරද පරවාහැර ශ්‍රී වජිරඤාණාභිධාන කොළඹ නවකෝරළේ ප්‍රධාන සඞ්ඝනායක ස්වාමීන්ද්‍රයෝ යි. අප විසින් පෙළ ද සකස් කොට පරිවර්තනය නිමවා 1957 දී භාරදෙනලදි. මුද්‍රණකාර්‍ය්‍ය සංවිධානය ක්‍රමවත් නොවීම ප්‍රකාශය මෙතෙක් පමා වීමට හෙතු විය.

පරිවර්තනයේ දී ඡායානුවාද ස්වරූපයෙන් පෙළට ලංවනසේ අනුවාද කිරීම අප අනුගමනය කළ පිළිවෙත යි. දුර්බොධ විය හැකි යයි සිතුණු සමහර තැනෙකැ භාවානුවාදය ද කළම්හ. අර්ථව්‍යාඛ්‍යාන පිණිස පෙළට බැහැරින් ගන්නාලද වචන වෙන් කොට වරහන් තුළ යෙදුම්හ. ශොධනයේ දී මැනැවැයි හැඟුණු පාඨ ගෙන ග්‍රන්ථාන්තරයෙහි දක්නා පාඨාන්තර අධො ලිපි වශයෙන් ඒ ඒ තන්හි දක්වාලූම්හ. අට්ඨකථාව ගුරු කොට ගතුම්හ.

මේ කාර්‍ය්‍යයෙහි අපට යම් බඳු සාමර්ථ්‍යයෙක් වී නම්, ඒ ත්‍රිපිටකසම්පාදක මණ්ඩලයෙහි ප්‍රධාන සම්පාදක, මොල්ලිගොඩ ප්‍රවචනොදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්‍ය්‍ය පණ්ඩිත ලබුගම ලඞ්කානන්දාභිධාන කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්මමහාසඞ්ඝසභායෙහි අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් අප ධර්මවිනය ශබ්දශාස්ත්‍රයෙහි ශික්ෂණය කිරීමෙන් කරනලද අනුග්‍රහය මැ වෙයි. උන් වහන්සේත් ත්‍රිපිටකසම්පාදක මණ්ඩලයෙහි සභාපති, අහංගම විද්‍යාචන්ද්‍ර පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වර පණ්ඩිත කෝදාගොඩ ඤාණාලොකාභිධාන දක්ෂිණ ලඞ්කාවේ ප්‍රධාන සඞ්ඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේත් මෙය මුද්‍රණ අවස්ථායෙහි දුෂ්ටස්ථානයන් සකසා ශොධනයෙන් අනුග්‍රහ කළහ. ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයෙහි උපදෙශක, අග්ගමහාපණ්ඩිත බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙයාභිධාන එකාබද්ධ අමරපුරනිකායේ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ද සදුපදෙශයෙන් අනුග්‍රහ කළහ. දෙමටගොඩ ධර්මදූතාශ්‍රම විද්‍යාලයාධිපති, ත්‍රිපිටක සම්පාදක පණ්ඩිත පරවාහැර පඤ්ඤානන්ද (බී ඒ) කොළඹ නවකෝරළේ ප්‍රධාන සඞ්ඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේත් කොළඹ බෞද්ධාලොක විහාරාධිපති ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ ලෙඛකාධිකාරී පණ්ඩිත දෙරගමුවේ ධම්මපාල කොළඹ පළාතේ ප්‍රධාන සඞ්ඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේත් කෘතඥතා පූර්වක වැ සඳහන් කරම්හ.

තවද අපගේ ගුරුභූමි වූ වාද්දුවේ මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන්හි අධිපති විමලකීර්ති ශ්‍රී ඉන්දජෝති අරියවංසාභිධාන කොට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ද උස්සාපිටියේ ශ්‍රී සුධර්මාලඞ්කාර පරිවෙණාධිපති අලුපත ශ්‍රී සුමනතිස්සාභිධාන සතරකෝරළ මහදිසාවේ ප්‍රධාන සඞ්ඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ද අපගේ ප්‍රව්‍රජ්‍යාචාර්ය මාකඩවර විහාරාධිපති වැ සිට අපවත්වීවදළ දෙහිදෙණියේ පෙමානන්දාභිධාන මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ ද හිඟුලේ බෝදිමළු විහාරාධිපති මූවපිටියේ ශ්‍රී ජිනරතනාභිධාන සතර-කෝරළ මහදිසාවේ උපප්‍රධාන සඞ්ඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ද කෘතවේදීභාවයෙන් සිහි කරම්හ. ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණය කරවීමෙහි නියුක්ත ශ්‍රී ලඞ්කාණ්ඩුවත් එහි සාංස්කෘතික දෙපාර්තමේන්තුවේ නිලධාරිමණ්ඩලයත් පුරෝගාමී වැ ක්‍රියා කළ ලඞ්කා බෞද්ධමණ්ඩලයත් මෙහි මුද්‍රණ කාර්ය්‍ය මැනැවින් කළ ස්වදේශී මුද්‍රණාලයෙහි කාර්ය්‍යමණ්ඩලයත් බෞද්ධමහාජනයාගේ ප්‍රශංසාවට ලක්විය යුත්තාහ. හැමට සගමොක් සුව පතම්හ.

කරහම්පිටිගොඩ සුමනසාර.

බු. ව. 2514 / ක්‍රි. ව. 1972 ජනවාරි 21 දින

මාකඩවර විහාරස්ථානයේ දී ය,

හිඟුල.

# THE PALI ALPHABET

### IN SINHALA CHARACTERS.

## VOWELS

අ a  ආ ā  ඉ i  ඊ ī  උ u  ඌ ū  එ e  ඔ o

## CONSONANTS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa | | |
| | ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña | | |
| | ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa | | |
| | ත ta | ථ tha | ද da | ධ dha | න na | | |
| | ප pa | ඵ pha | බ ba | භ bha | ම ma | | |
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං aṃ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ ke | කො ko |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khe | ඛො khō |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ gē | ගො go |

## Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ණ්හ ṇha | ද්ද dda | ම්බ, ම්බ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ, ඤ්ඡ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ, ඤ්ජ ñja | ද්ව, ද්ව dva | ම්හ mha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය, ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ට්ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna | ව්හ wha |
| ඞ්ඛ ṅkh | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ණ්ඩ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ණ්හ ṇha | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ත tta | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ථ ttha | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | ත්ව tva | ම්ප mpa | |

ා ā  ි i  ී i  ු u  ූ u  ෙ e  ො ō

# සඞ්කෙතනිරූපණය

## ABBREVIATIONS

| | | |
|---|---|---|
| මු 1. | — | ථෙරගාථා, ධම්සෙන මුද්‍රණය, 1930. |
| සීමු. 2. | — | ථෙරගාථා, හේවාවිතාරණ මුද්‍රණය. |
| මඡසං | — | මරම්මඡට්ඨසඞ්ගීතියෙහි සොධිත ථෙරගාථා. |
| ස්‍යා. | — | ස්‍යාම - තාය්‍යක්ෂරමුද්‍රිත ථෙරගාථාපාළි. |
| PTS. | — | Pali Text Society - THERA GATHA, 1883. |
| ප | — | පරමත්ථදීපනී, ථෙරගාථට්ඨකථා. |
| පු | — | අට්ඨකථාගතානි - පුරාතනපාඨන්තරානි. |

# ඛුද්දකනිකායෙ ථෙරගාථාපාළි

## විසයසූචි


| විසයං | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|
| **එකකනිපාතො** | | | **2-50** |
| **පඨමො වග්ගො** | | | **2- 6** |
| 1. සුභූතිත්ථෙරගාථා | ... | ... | 2 |
| 2. මහාකොට්ඨිතත්ථෙරගාථා | ... | ... | 2 |
| 3. කඞ්ඛාරෙවතත්ථෙරගාථා | ... | ... | 4 |
| 4. පුණ්ණත්ථෙරගාථා | ... | ... | 4 |
| 5. දබ්බත්ථෙරගාථා | ... | ... | 4 |
| 6. සීතවනිය සම්භූතත්ථෙරගාථා | ... | ... | 4 |
| 7. භල්ලියත්ථෙරගාථා | ... | ... | 4 |
| 8. වීරත්ථෙරගාථා | ... | ... | 6 |
| 9. පිලින්දවච්ඡත්ථෙරගාථා | ... | ... | 6 |
| 10. පුණ්ණමාසත්ථෙරගාථා | ... | ... | 6 |
| **පඨමො වග්ගො නිට්ඨිතො.** | | | |
| **දුතියො වග්ගො** | | | **8 10** |
| 11 චූළවච්ඡත්ථෙරගාථා | ... | ... | 8 |
| 12. මහාවච්ඡත්ථෙරගාථා | ... | ... | 8 |
| 13. වනවච්ඡත්ථෙරගාථා | ... | ... | 8 |
| 14. වනවච්ඡත්ථෙරසාමණෙරගාථා | ... | .. | 8 |
| 15. කුණ්ඩධානත්ථෙරගාථා | ... | ... | 8 |
| 16. බෙලට්ඨසීසත්ථෙරගාථා | ... | ... | 8 |
| 17. දාසකත්ථෙරගාථා | ... | ... | 10 |
| 18. සිඟාලපිතුත්ථෙරගාථා | ... | ... | 10 |
| 19. කුණ්ඩලත්ථෙරගාථා | ... | .. | 10 |
| 20. අජිතත්ථෙරගාථා | ... | ... | 10 |
| **දුතියො වග්ගො නිට්ඨිතො.** | | | |
| **තතියො වග්ගො** | | | **12-14** |
| 21. නිග්‍රොධත්ථෙරගාථා | ... | .. | 12 |
| 22. චිත්තකත්ථෙරගාථා | ... | ... | 12 |
| 23. ගොසාලත්ථෙරගාථා | ... | ... | 12 |
| 24. සුගන්ධත්ථෙරගාථා | ... | ... | 12 |
| 25. නන්දියත්ථෙරගාථා | ... | ... | 12 |
| 26. අභයත්ථෙරගාථා | ... | ... | 14 |
| 27. ලොමසකඞ්ගියත්ථෙරගාථා | ... | ... | 14 |
| 28 ජම්බුගාමිකත්ථෙරගාථා | ... | ... | 14 |
| 29 හාරිතත්ථෙරගාථා | ... | ... | 14 |
| 30 උත්තියත්ථෙරගාථා | ... | ... | 14 |
| **තතියො වග්ගො නිට්ඨිතො.** | | | |

| විසයං | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|
| | **චතුත්ථො වග්ගො** | | **16-18** |
| 31. | ගබ්භරතීරියථෙරගාථා | ... ... | 16 |
| 32. | සුප්පියථෙරගාථා | ... ... | 16 |
| 33. | සොපාකථෙරගාථා | ... .. | 16 |
| 34. | පොසියථෙරගාථා | ... ... | 16 |
| 35. | සාමඤ්ඤකානිථෙරගාථා | ... ... | 16 |
| 36. | කුමාපුත්තථෙරගාථා | ... . | 16 |
| 37. | කුමාපුත්තසහායකථෙරගාථා | ... ... | 18 |
| 38. | ගවම්පතිථෙරගාථා | ... ... | 18 |
| 39 | තිස්සථෙරගාථා | ... ... | 18 |
| 40. | වඩ්ඪමානථෙරගාථා | ... ... | 18 |
| | චතුත්ථො වග්ගො නිට්ඨිතො. | | |
| | **පඤ්චමො වග්ගො** | | **20-22** |
| 41. | සිරිවඩ්ඪථෙරගාථා | ... ... | 20 |
| 42. | ඛදිරවනියරෙවතථෙරගාථා | ... ... | 20 |
| 43 | සුමඞ්ගලථෙරගාථා | .. ... | 20 |
| 44. | සානුථෙරගාථා | ... ... | 20 |
| 45. | රමණීයවිහාරිථෙරගාථා | ... ... | 20 |
| 46. | සමිද්ධිථෙරගාථා | ... ... | 22 |
| 47. | උජ්ජයථෙරගාථා | ... ... | 22 |
| 48. | සඤ්ජයථෙරගාථා | ... ... | 22 |
| 49. | රාමණෙය්‍යකථෙරගාථා | ... ... | 22 |
| 50. | විමලථෙරගාථා | ... ... | 22 |
| | පඤ්චමො වග්ගො නිට්ඨිතො. | | |
| | **ඡට්ඨො වග්ගො** | | **24-26** |
| 51. | ගොධිකථෙරගාථා | ... ... | 24 |
| 52. | සුබාහුථෙරගාථා | ... ... | 24 |
| 53. | වල්ලියථෙරගාථා | ... ... | 24 |
| 54. | උත්තියථෙරගාථා | ... ... | 24 |
| 55. | අඤ්ජනවනියථෙරගාථා | ... ... | 24 |
| 56. | කුටිවිහාරිථෙරගාථා | ... ... | 24 |
| 57. | දුතියකුටිවිහාරිථෙරගාථා | ... ... | 26 |
| 58. | රමණීයකුටිකථෙරගාථා | ... ... | 26 |
| 59. | කොසලවිහාරිථෙරගාථා | ... ... | 26 |
| 60. | සීවලිථෙරගාථා | .. ... | 26 |
| | ඡට්ඨො වග්ගො නිට්ඨිතො. | | |

| විසයං | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|


| | | | |
|---|---|---|---|
| **සත්තමො වග්ගො** | | | **28-30** |
| 61. වප්පත්ථෙරගාථා | ... | ... | 28 |
| 62. වජ්ජිපුත්තත්ථෙරගාථා | ... | ... | 28 |
| 63 පක්ඛත්ථෙරගාථා | ... | ... | 28 |
| 64 විමලකොණ්ඩඤ්ඤත්ථෙරගාථා | ... | ... | 28 |
| 65. උක්ඛෙපකතවච්ඡත්ථෙරගාථා | ... | ... | 28 |
| 66. මෙඝියත්ථෙරගාථා | ... | ... | 30 |
| 67. එකධම්මසවනීයත්ථෙරගාථා | ... | ... | 30 |
| 68. එකුදානියත්ථෙරගාථා | .. | .. | 30 |
| 69. ඡන්නත්ථෙරගාථා | ... | ... | 30 |
| 70. පුණ්ණත්ථෙරගාථා | ... | .. | 30 |

**සත්තමො වග්ගො නිට්ඨිතො.**

| | | | |
|---|---|---|---|
| **අට්ඨමො වග්ගො** | | | **32-34** |
| 71. වච්ඡපාලත්ථෙරගාථා | ... | ... | 32 |
| 72 ආතුමත්ථෙරගාථා | ... | ... | 32 |
| 73. මාණවත්ථෙරගාථා | ... | ... | 32 |
| 74. සුයාමත්ථෙරගාථා | ... | .. | 32 |
| 75 සුසාරදත්ථෙරගාථා | .. | ... | 32 |
| 76. පියඤ්ජහත්ථෙරගාථා | ... | ... | 32 |
| 77. හත්ථාරොහපුත්තත්ථෙරගාථා | .. | ... | 34 |
| 78. මෙණ්ඩසිරත්ථෙරගාථා | ... | ... | 34 |
| 79. රක්ඛිතත්ථෙරගාථා | ... | ... | 34 |
| 80. උග්ගත්ථෙරගාථා | ... | ... | 34 |

**අට්ඨමො වග්ගො නිට්ඨිතො.**

| | | | |
|---|---|---|---|
| **නවමො වග්ගො** | | | **36-38** |
| 81. සමිතිගුත්තත්ථෙරගාථා | ... | ... | 36 |
| 82 කස්සපත්ථෙරගාථා | ... | ... | 36 |
| 83. සීහත්ථෙරගාථා | ... | ... | 36 |
| 84. නීතත්ථෙරගාථා | .... | ... | 36 |
| 85. සුනාගත්ථෙරගාථා | ... | ... | 36 |
| 86. නාගිතත්ථෙරගාථා | ... | ... | 36 |
| 87. පවිට්ඨත්ථෙරගාථා | ... | ... | 38 |
| 88. අජ්ජුනත්ථෙරගාථා | ... | ... | 38 |
| 89. පඨමදෙවසභත්ථෙරගාථා | ... | ... | 38 |
| 90. සාමිදත්තත්ථෙරගාථා | ... | ... | 38 |

**නවමො වග්ගො නිට්ඨිතො**

| විසයං | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|
| | **දසමො වග්ගො** | | | **40 42** |
| 91. | පරිපුණ්ණකත්ථෙරගාථා | ... | ... | 40 |
| 92. | විජයත්ථෙරගාථා | ... | ... | 40 |
| 93. | එරකත්ථෙරගාථා | ... | ... | 40 |
| 94. | මෙත්තජිත්ථෙරගාථා | ... | ... | 40 |
| 95. | චක්ඛුපාලත්ථෙරගාථා | .. | ... | 40 |
| 96. | ඛණ්ඩසුමනත්ථෙරගාථා | ... | ... | 40 |
| 97. | තිස්සත්ථෙරගාථා | ... | .. | 42 |
| 98. | අභයත්ථෙරගාථා | .. | ... | 42 |
| 99. | උත්තියත්ථෙරගාථා | ... | ... | 42 |
| 100. | දෙවසභත්ථෙරගාථා | ... | ... | 42 |
| | **දසමො වග්ගො නිට්ඨිතො.** | | | |
| | **එකාදසමො වග්ගො** | | | **44-46** |
| 101. | බෙලට්ඨානිකත්ථෙරගාථා | ... | ... | 44 |
| 102. | සෙතුච්ඡත්ථෙරගාථා | ... | ... | 44 |
| 103. | බන්ධුරත්ථෙරගාථා | ... | ... | 44 |
| 104. | ඛිතකත්ථෙරගාථා | ... | ... | 44 |
| 105. | මලිතවම්භත්ථෙරගාථා | ... | ... | 44 |
| 106. | සුහෙමන්තත්ථෙරගාථා | ... | ... | 44 |
| 107. | ධම්මසවත්ථෙරගාථා | ... | .. | 46 |
| 108. | ධම්මසවපිතුත්ථෙරගාථා | ... | ... | 46 |
| 109. | සඞ්ඝරක්ඛිතත්ථෙරගාථා | ... | ... | 46 |
| 110. | උසභත්ථෙරගාථා | ... | ... | 46 |
| | **එකාදසමො වග්ගො නිට්ඨිතො.** | | | |
| | **ද්වාදසමො වග්ගො** | | | **48-50** |
| 111. | ජෙන්තත්ථෙරගාථා | ... | ... | 48 |
| 112 | වච්ඡගොත්තත්ථෙරගාථා | ... | ... | 48 |
| 113. | වනවච්ඡත්ථෙරගාථා | ... | ... | 48 |
| 114. | අධිමුත්තත්ථෙරගාථා | ... | ... | 48 |
| 115. | මහානාමත්ථෙරගාථා | ... | ... | 48 |
| 116 | පාරාසරියත්ථෙරගාථා | ... | ... | 48 |
| 117. | යසත්ථෙරගාථා | ... | ... | 50 |
| 118. | කිම්බිලත්ථෙරගාථා | ... | ... | 50 |
| 119. | වජ්ජිපුත්තත්ථෙරගාථා | ... | ... | 50 |
| 120. | ඉසිදත්තත්ථෙරගාථා | ... | ... | 50 |
| | **ද්වාදසමො වග්ගො නිට්ඨිතො.** | | | |
| | **එකකනිපාතො නිට්ඨිතො.** | | | |

| විසයා | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|
| | **දුකනිපාතො** | | | **52-80** |
| | **පඨමො වග්ගො** | | | **52-56** |


| | | | | |
|---|---|---|---|---|
| 121. | උත්තරත්ථෙරගාථා | ... | ... | 52 |
| 122 | පිණ්ඩොලභාරද්වාජත්ථෙරගාථා | ... | ... | 52 |
| 123. | වල්ලියත්ථෙරගාථා | ... | ... | 52 |
| 124. | ගඞ්ගාතීරියත්ථෙරගාථා | ... | ... | 54 |
| 125 | අජිතත්ථෙරගාථා | ... | ... | 54 |
| 126. | මෙළජිනත්ථෙරගාථා | ... | ... | 54 |
| 127. | රාධත්ථෙරගාථා | ... | ... | 54 |
| 128. | සුරාධත්ථෙරගාථා | ... | ... | 56 |
| 129. | ගොතමත්ථෙරගාථා | ... | ... | 56 |
| 130. | වසභත්ථෙරගාථා | ... | ... | 56 |


**පඨමො වග්ගො නිට්ඨිතො.**

| | | | | |
|---|---|---|---|---|
| | **දුතියො වග්ගො** | | | **58-62** |


| | | | | |
|---|---|---|---|---|
| 131. | මහාචුන්දත්ථෙරගාථා | ... | ... | 58 |
| 132. | ජොතිදාසත්ථෙරගාථා | .. | ... | 58 |
| 133. | හෙරඤ්ඤකානිත්ථෙරගාථා | ... | ... | 58 |
| 134. | සොමමිත්තත්ථෙරගාථා | ... | ... | 58 |
| 135. | සබ්බමිත්තත්ථෙරගාථා | ... | ... | 60 |
| 136. | මහාකාළත්ථෙරගාථා | ... | ... | 60 |
| 137. | තිස්සත්ථෙරගාථා | ... | ... | 60 |
| 138. | කිම්බිලත්ථෙරගාථා | ... | ... | 60 |
| 139. | නන්දත්ථෙරගාථා | ... | ... | 62 |
| 140 | සිරිමාත්ථෙරගාථා | ... | ... | 62 |


**දුතියො වග්ගො නිට්ඨිතො.**

| | | | | |
|---|---|---|---|---|
| | **තතියො වග්ගො** | | | **64 68** |


| | | | | |
|---|---|---|---|---|
| 141. | උත්තරත්ථෙරගාථා | ... | ... | 64 |
| 142. | භද්දජිත්ථෙරගාථා | ... | ... | 64 |
| 143. | සොභිතත්ථෙරගාථා | ... | ... | 64 |
| 144. | වල්ලියත්ථෙරගාථා | ... | ... | 64 |
| 145. | වීතසොකත්ථෙරගාථා | ... | ... | 66 |
| 146 | පුණ්ණමාසත්ථෙරගාථා | ... | ... | 66 |
| 147. | නන්දකත්ථෙරගාථා | ... | ... | 66 |
| 148. | භරතත්ථෙරගාථා | ... | ... | 66 |
| 149 | භාරද්වාජත්ථෙරගාථා | . | ... | 68 |
| 150. | කණ්හදින්නත්ථෙරගාථා | | ... | 68 |


**තතියො වග්ගො නිට්ඨිතො.**

| විසය | | පිට්ඨඞ්කා |
|---|---|---|

## චතුත්ථො වග්ගො 70-74


| | | |
|---|---|---|
| 151. | මිගසිරත්ථෙරගාථා | 70 |
| 152. | සිවකත්ථෙරගාථා | 70 |
| 153. | උපවානත්ථෙරගාථා | 70 |
| 154. | ඉසිදින්නත්ථෙරගාථා | 70 |
| 155 | සම්බුලකච්චානත්ථෙරගාථා | 72 |
| 156. | ඛිතකත්ථෙරගාථා | 72 |
| 157. | සෙලිස්සරියපුත්තත්ථෙරගාථා | 72 |
| 158 | නිසභත්ථෙරගාථා | 72 |
| 159 | උසභත්ථෙරගාථා | 74 |
| 160. | කප්පටකුරත්ථෙරගාථා | 74 |


චතුත්ථො වග්ගො නිට්ඨිතො.

## පඤ්චමො වග්ගො 76-80


| | | |
|---|---|---|
| 161. | කුමාරකස්සපත්ථෙරගාථා | 76 |
| 162. | ධම්මපාලත්ථෙරගාථා | 76 |
| 163. | බ්‍රහ්මාලිත්ථෙරගාථා | 76 |
| 164. | මොඝරාජත්ථෙරගාථා | 78 |
| 165 | විසාඛපඤ්චාලපුත්තත්ථෙරගාථා | 78 |
| 166. | චූළකත්ථෙරගාථා | 78 |
| 167. | අනූපමත්ථෙරගාථා | 80 |
| 168 | වජ්ජිතත්ථෙරගාථා | 80 |
| 169. | සන්ධිතත්ථෙරගාථා | 80 |


පඤ්චමො වග්ගො නිට්ඨිතො.

දුකනිපාතො නිට්ඨිතො.

## තිකනිපාතො 82-92


| | | |
|---|---|---|
| 170. | අඞ්ගණිකභාරද්වාජත්ථෙරගාථා | 82 |
| 171. | පච්චයත්ථෙරගාථා | 82 |
| 172. | බක්කුලත්ථෙරගාථා | 82 |
| 173. | ධනියත්ථෙරගාථා | 84 |
| 174 | මාතඞ්ගපුත්තත්ථෙරගාථා | 84 |
| 175. | ඛුජ්ජසොභිතත්ථෙරගාථා | 84 |
| 176. | වාරණත්ථෙරගාථා | 86 |
| 177. | පස්සිකත්ථෙරගාථා | 86 |
| 178 | යසොජත්ථෙරගාථා | 86 |
| 179. | සාටිමත්තියත්ථෙරගාථා | 88 |
| 180. | උපාලිත්ථෙරගාථා | 88 |
| 181 | උත්තරපාලත්ථෙරගාථා | 88 |
| 182. | අභිභූතත්ථෙරගාථා | 90 |
| 183. | ගොතමත්ථෙරගාථා | 90 |
| 184. | හාරිතත්ථෙරගාථා | 90 |
| 185. | විමලත්ථෙරගාථා | 92 |


තිකනිපාතො නිට්ඨිතො.

| විසයං | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|
| | **චතුක්කනිපාතො** | | | **94 102** |
| 186. | නාගසමාලථෙරගාථා | ... | ... | 94 |
| 187 | භගුථෙරගාථා | ... | ... | 94 |
| 188 | සභියථෙරගාථා | ... | ... | 94 |
| 189 | නන්දකථෙරගාථා | ... | ... | 96 |
| 190. | ජම්බුකථෙරගාථා | ... | ... | 96 |
| 191 | සේනකථෙරගාථා | ... | ... | 96 |
| 192. | සම්භූතථෙරගාථා | ... | ... | 98 |
| 193. | රාහුලථෙරගාථා | ... | ... | 98 |
| 194 | චන්දනථෙරගාථා | ... | ... | 98 |
| 195. | ධම්මිකථෙරගාථා | ... | ... | 100 |
| 196 | සප්පකථෙරගාථා | ... | .. | 100 |
| 197. | මුදිතථෙරගාථා | ... | ... | 102 |
| | **චතුක්කනිපාතො නිට්ඨිතො.** | | | |
| | **පඤ්චකනිපාතො** | | | **104 114** |
| 198 | රාජදත්තථෙරගාථා | ... | ... | 104 |
| 199. | සුභූතථෙරගාථා | ... | ... | 104 |
| 200. | ගිරිමානන්දථෙරගාථා | ... | . | 106 |
| 201. | සුමනථෙරගාථා | ... | .. | 106 |
| 202. | වඩ්ඪථෙරගාථා | ... | ... | 108 |
| 203 | නදීකස්සපථෙරගාථා | ... | .. | 108 |
| 204 | ගයාකස්සපථෙරගාථා | ... | .. | 110 |
| 205 | වක්කලිථෙරගාථා | ... | .. | 110 |
| 206 | විජිතසේනථෙරගාථා | ... | ... | 112 |
| 207. | යසදත්තථෙරගාථා | ... | ... | 112 |
| 208. | සෝණකුටිකණ්ණථෙරගාථා | ... | ... | 114 |
| 209. | කෝසියථෙරගාථා | ... | ... | 114 |
| | **පඤ්චකනිපාතො නිට්ඨිතො.** | | | |
| | **ඡක්කනිපාතො** | | | **118-132** |
| 210. | උරුවෙල කස්සපථෙරගාථා | ... | ... | 118 |
| 211. | තෙකිච්ඡකානිථෙරගාථා | ... | ... | 118 |
| 212. | මහානාගථෙරගාථා | ... | ... | 120 |
| 213. | කුල්ලථෙරගාථා | ... | ... | 120 |
| 214 | මාලුඞ්ක්‍යපුත්තථෙරගාථා | ... | ... | 122 |
| 215. | සප්පදාසථෙරගාථා | ... | ... | 122 |
| 216. | කාතියානථෙරගාථා | ... | ... | 124 |
| 217. | මිගජාලථෙරගාථා | ... | ... | 124 |
| 218 | ජෙන්තථෙරගාථා | ... | ... | 126 |
| 219. | සුමනථෙරගාථා | ... | ... | 126 |
| 220. | නහාතකමුනිථෙරගාථා | ... | ... | 128 |
| 221. | බ්‍රහ්මදත්තථෙරගාථා | ... | ... | 128 |
| 222. | සිරිමන්දථෙරගාථා | ... | ... | 130 |
| 223. | සබ්බකාමිථෙරගාථා | ... | ... | 132 |
| | **ඡක්කනිපාතො නිට්ඨිතො.** | | | |

| විසයං | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|
| **සත්තකනිපාතො** | | | **134·138** |
| 224. සුන්දරසමුද්දත්ථෙරගාථා | ... | ... | 134 |
| 225. ලකුණ්ටකභද්දියත්ථෙරගාථා | ... | ... | 134 |
| 226. භද්දත්ථෙරගාථා | ... | ... | 136 |
| 227. සොපාකත්ථෙරගාථා | ... | ... | 138 |
| 228. සරභඞ්ගත්ථෙරගාථා | ... | ... | 138 |
| **සත්තකනිපාතො නිට්ඨිතො.** | | | |
| **අට්ඨකනිපාතො** | | | **142-146** |
| 229. මහාකච්චායනත්ථෙරගාථා | ... | ... | 142 |
| 230. සිරිමිත්තත්ථෙරගාථා | ... | ... | 144 |
| 231. මහාපන්ථකත්ථෙරගාථා | ... | ... | 146 |
| **අට්ඨකනිපාතො නිට්ඨිතො.** | | | |
| **නවකනිපාතො** | | | **148** |
| 232. භූතත්ථෙරගාථා | ... | ... | 148 |
| **නවකනිපාතො නිට්ඨිතො.** | | | |
| **දසකනිපාතො** | | | **152 162** |
| 233. කාළුදායිත්ථෙරගාථා | ... | ... | 152 |
| 234. එකවිහාරියත්ථෙරගාථා | ... | ... | 154 |
| 235. මහාකප්පිනත්ථෙරගාථා | ... | ... | 154 |
| 236. චුල්ලපන්ථකත්ථෙරගාථා | ... | ... | 156 |
| 237. කප්පත්ථෙරගාථා | ... | ... | 158 |
| 238. උපසෙනත්ථෙරගාථා | ... | ... | 160 |
| 239. අපරගොතමත්ථෙරගාථා | ... | ... | 162 |
| **දසකනිපාතො නිට්ඨිතො.** | | | |
| **එකාදසනිපාතො** | | | **161** |
| 240. සඞ්කිච්චත්ථෙරගාථා | ... | ... | 164 |
| **එකාදසනිපාතො නිට්ඨිතො.** | | | |
| **ද්වාදසනිපාතො** | | | **166-168** |
| 241. සීලවත්ථෙරගාථා | ... | ... | 166 |
| 242. සුනීතත්ථෙරගාථා | ... | .. | 168 |
| **ද්වාදසනිපාතො නිට්ඨිතො.** | | | |
| **තෙරසනිපාතො** | | | **172** |
| 243. සොණකොළිවිසත්ථෙරගාථා | ... | ... | 172 |
| **තෙරසනිපාතො නිට්ඨිතො** | | | |

| විසයං | | පිට්ඨඞ්කා |
|---|---|---|
| | **චුද්දසනිපාතො** | **174-176** |
| 244. | ඛදිරවනියරෙවතත්ථෙරගාථා ... ... | 174 |
| 245. | ගොදත්තත්ථෙරගාථා ... ... | 176 |
| | **චුද්දසනිපාතො නිට්ඨිතො.** | |
| | **සොළසනිපාතො** | **180-182** |
| 246. | අඤ්ඤාකොණ්ඩඤ්ඤත්ථෙරගාථා ... ... | 180 |
| 247. | උදායිත්ථෙරගාථා ... ... | 182 |
| | **සොළසනිපාතො නිට්ඨිතො.** | |
| | **වීසතිනිපාතො** | **186-218** |
| 248. | අධිමුත්තත්ථෙරගාථා ... ... | 186 |
| 249. | පාරාසරියත්ථෙරගාථා ... ... | 188 |
| 250. | තෙලකානිත්ථෙරගාථා ... ... | 192 |
| 251. | රට්ඨපාලත්ථෙරගාථා ... ... | 196 |
| 252. | මාලුඞ්ක්‍යපුත්තත්ථෙරගාථා ... ... | 200 |
| 253. | සෙලත්ථෙරගාථා ... ... | 204 |
| 254. | භද්දියත්ථෙරගාථා ... ... | 208 |
| 255. | අඞ්ගුලිමාලත්ථෙරගාථා ... ... | 210 |
| 256. | අනුරුද්ධත්ථෙරගාථා ... ... | 214 |
| 257. | පාරාසරියත්ථෙරගාථා ... ... | 218 |
| | **වීසතිනිපාතො නිට්ඨිතො.** | |
| | **තිංසතිනිපාතො** | **224-234** |
| 258. | ඵුස්සත්ථෙරගාථා ... ... | 224 |
| 259. | සාරිපුත්තත්ථෙරගාථා ... ... | 228 |
| 260. | ආනන්දත්ථෙරගාථා ... ... | 234 |
| | **තිංසතිනිපාතො නිට්ඨිතො.** | |
| | **චත්තාලීසනිපාතො** | **242** |
| 261. | මහාකස්සපත්ථෙරගාථා ... ... | 242 |
| | **චත්තාලීසනිපාතො නිට්ඨිතො.** | |
| | **පඤ්ඤාසනිපාතො** | **250** |
| 262. | තාලපුටත්ථෙරගාථා ... ... | 250 |
| | **පඤ්ඤාසනිපාතො නිට්ඨිතො.** | |
| | **සට්ඨිනිපාතො** | **211** |
| 263. | මහාමොග්ගල්ලානත්ථෙරගාථා ... ... | 211 |
| | **සට්ඨිනිපාතො නිට්ඨිතො.** | |
| | **සත්තතිනිපාතො** | **211** |
| 264. | වඞ්ගීසත්ථෙරගාථා ... ... | 211 |
| | **සත්තතිනිපාතො නිට්ඨිතො.** | |

සුත්තන්තපිටකෙ

# ථෙරගාථාපාළි

සූත්‍රාන්තපිටකයෙහි

# ථෙරගාථා

# සුත්තන්තපිටකෙ

# ථෙරගාථාපාළි

---

## නිදානගාථා

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස

සීහානං'ව නදන්තානං දාඨීනං ගිරිගබ්භරෙ
සුණාථ භාවිතත්තානං ගාථා අත්තූපනායිකා.

යථානාමා යථාගොත්තා යථාධම්මවිහාරිනො
යථාධිමුත්තා සප්පඤ්ඤා විහරිංසු අතන්දිතා.

තත්ථ තත්ථ විපස්සිත්වා ඵුසිත්වා අච්චුතං පදං
කතන්තං පච්චවෙක්ඛන්තා ඉමමත්ථමභාසිසුං.

## එකකනිපාතො

1. 1. 1

1. ඡන්නා මෙ කුටිකා සුඛා නිවාතා වස්ස දෙව යථාසුඛං
චිත්තං මෙ සුසමාහිතං විමුත්තං ආතාපී විහරාමි වස්ස දෙවා'ති.

ඉත්ථං සුදං ආයස්මා සුභූතිත්ථෙරො ගාථං අභාසිත්ථා'ති.

සුභූතිත්ථෙරගාථා.

1. 1. 2

2. උපසන්තො උපරතො මන්තභාණී[1] අනුද්ධතො
ධුනාති පාපකෙ ධම්මෙ දුමපත්තං ව මාලුතො'ති.

ඉත්ථං සුදං ආයස්මා මහාකොට්ඨිතො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

මහාකොට්ඨිතත්ථෙරගාථා.

---

1 මන්තභාණී-සිමු 2.

# සූත්‍රාන්තපිටකයෙහි

# ථෙරගාථා

---

## නිදානගාථා

### ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා !

1. ගිරිගුහායෙහි නද දෙන, දළ ඇති සිංහයන් වැනි වැඩූ සිත් ඇති ආර්‍ය්‍යයන් තමන් පිළිබඳ වැ ගෙනහැර දැක්වූ ගාථාවන් අසවු.

2. (සුභූති ආදී) යම් යම් නම් ඇති (ගෞතම ආදී) යම් යම් ගොත්‍ර ඇති යම් බඳු සමාපත්තිවිහරණ ඇති, ශ්‍රද්ධා අධිමුක්ති ඇති, ත්‍රිහෙතුක කර්මජ ප්‍රඥාවෙන් ප්‍රඥා ඇත්තෝ අනලස් වැ වාසය කළාහු ද,

3. ඔහු ඒ ඒ තන්හි විවසුන් වඩා නිවන්සුව ලැබ කෘතාන්ත සඞ්ඛ්‍යාත අග්‍රඵලය නුවණින් සලකා බලනුවෝ මේ (අත්තූපනායිකගාථා) අර්ථය වදාළහ.

## ඒකකනිපාතය

### 1 1. 1

1. මා ගේ කුටිය සොයන ලද, (එහෙයින් මැ) සුව එලවයි, වාතපීඩා රහිත යැ, මෙඝය, රිසියේ වසිනු මැනා. මා ගේ සිත මොනොවට සමාහිත වූයේ යැ, (කෙලෙසුන් කෙරෙන්) වෙසෙසින් මිදුණේ යි, ආරබ්ධවීර්‍ය්‍ය ඇති වැ වෙසෙමි. මෙඝය, (එහෙයින්) වසිනු මැනා.

නොහොත් මා ගේ ආත්මභාවය සංවෘත යැ, එහෙයින් මැ සුඛප්‍රාප්ත යැ, නිහතමාන යැ, මෙඝය, රිසියේ වසිනු මැනා, මා ගේ සිත මොනවට සමාහිත වූයේ යැ, විමුක්ත යැ, (මම) ආරබ්ධවීර්‍ය්‍ය ඇති වැ වෙසෙමි, මෙඝය, (එහෙයින්) වසිනු මැනා.

මෙසේ ආයුෂ්මත් සුභූති ස්ථවිරයන් වහන්සේ මේ ගාථාව වදාළහ.

**සුභූති ස්ථවිරගාථා යි.**

### 1. 1. 2

2. සත්හුන් ඉඳුරන් ඇති පවින් වැළැකුණු නුවණින් පිරික්සා බණනසුලු උඩඟු නො වූ (කොට්ඨිත මහණ) පවන රුක්පතක් මෙන් පාපධර්මයන් දුරු කෙරේ.

මෙසේ මේ ගාථාව ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ වදාළහ.

**මහාකොට්ඨිත ස්ථවිරගාථා යි.**

### 1. 1. 3

3. පඤ්ඤං ඉමං පස්ස තථාගතානං
අග්ගි යථා පජ්ජලිතො[1] නිසීථෙ
ආලොකදා චක්ඛුදදා භවන්ති
යෙ ආගතානං විනයන්ති කඞ්ඛං’ති.

ඉත්ථං සුදං ආයස්මා කඞ්ඛාරෙවතො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**කඞ්ඛාරෙවතත්ථෙරගාථා.**

### 1. 1. 4

4. සබ්භිරෙව සමාසෙථ පණ්ඩිතෙහත්ථදස්සිහි[2]
අත්ථං මහන්තං ගම්භීරං දුද්දසං නිපුණං අණුං
ධීරා සමධිගච්ඡන්ති අප්පමත්තා විචක්ඛණා’ති.

ඉත්ථං සුදං ආයස්මා පුණ්ණො මන්තාණිපුත්තො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**පුණ්ණත්ථෙරගාථා.**

### 1. 1. 5

5. යො දුද්දමියො[3] දමෙන දන්තො දබ්බො සන්තුසිතො විතිණ්ණකඞ්ඛො
විජිතාවී අපෙතභෙරවො හි දබ්බො සො පරිනිබ්බුතො ඨිතත්තො’ති.

ඉත්ථං සුදං ආයස්මා දබ්බො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**දබ්බත්ථෙරගාථා.**

### 1. 1. 6

6. යො සීතවනං උපාග[4] භික්ඛු එකො සන්තුසිතො සමාහිතත්තො
විජිතාවී අපෙතලොමහංසො රක්ඛං කායගතාසතිං ධිතිමා’ති.[5]

ඉත්ථං සුදං ආයස්මා සීතවනියො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**සීතවනියත්ථෙරගාථා.**

### 1. 1. 7

7. යොපානුදී මච්චුරාජස්ස සෙනං
නළසෙතුං ච සුදුබ්බලං මහොඝො
විජිතාවී අපෙතභෙරවො හි
දන්තො සො පරිනිබ්බුතො ඨිතත්තො’ති.

ඉත්ථං සුදං ආයස්මා භල්ලියො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**භල්ලියත්ථෙරගාථා.**

---

1 පජ්ජාලිතො-PTS, සීමු
2 හත්ථදස්සිහි - සීමු 1, 2
3 දුද්දමයො - PTS
4 උපගා - සීමු 1, 2 උපාගා -
5 ඨිතිමාති - සීමු 1, 2

### 1. 1. 3

3. යම් කෙනෙක් තමන් වෙත පැමිණියවුන් ගේ සැක දුරලත් ද, නුවණ එළිය දෙන්නාහු වෙත් ද, පැණැස දෙන්නාහු වෙත් ද, මධ්‍යමරාත්‍රියෙහි ඇවිළෙන ගින්නක් බඳු වූ ඒ තථාගතවරුන් ගේ මේ ප්‍රඥමහිමය බලනු මැනැවි.

මෙසේ මේ ගාථාව ආයුෂ්මත් කඞ්ඛාරේවත ස්ථවිරයන් වහන්සේ වදාළහ.

**කඞ්ඛාරේවත ස්ථවිරගාථා යි**

### 1. 1. 4

4. ප්‍රාඥ වූ යථාර්ථය දක්නාසුලු වූ සත්පුරුෂයන් සමග මැ එක්වවු, අප්‍රමාද වූ විචක්ෂණ වූ ප්‍රාඥයෝ මහත් වූ ගැඹුරු වූ දුකසේ දක්නයුතු වූ නිපුණ වූ සියුම් වූ අර්ථය (සිව්සස්) අවබොධ කෙරෙත්.

මෙසේ මේ ගාථාව ආයුෂ්මත් මන්තානිපුත්‍ර පුණ්ණ ස්ථවිරයන් වහන්සේ වදාළහ.

**පුණ්ණ ස්ථවිරගාථා යි.**

### 1. 1. 5

5 දමනයට දුෂ්කර වූ යමෙක් ආර්‍යමාර්ගයෙන් දෝහෝ නොහොත් පුරුෂදම්‍යසාරථිහු විසින් දමනය කරන ලද්දේ ද, භව්‍ය වූ සන්තුෂ්ට වූ දුරු කළ සැක ඇති දිනතලද කෙලෙස් ඇති, පහ වූ බිය ඇති අචලස්වභාවයට පැමිණි ඒ 'දබ්බ' මහණ කෙලශපරිනිර්වාණයෙන් පිරිනිවියේ යි.

මෙසේ මේ ගාථාව ආයුෂ්මත් දබ්බස්ථවිරයන් වහන්සේ ...

**දබ්බ ස්ථවිරගාථා යි.**

### 1. 1 6

6. යම් මහණෙක් (විවේක සුව පතා) සීතවනයට පැමිණියේ ද ධෘතිමත් වූ ඒ මහණ හුදෙකලා වූයේ සතුටු වූයේ එකඟසිතැත්තේ කාගියාසී රක්නේ දිනනලද කෙලෙසුන් ඇත්තේ පහ වූ ලොමුදහ ඇත්තේ යි.

මෙසේ ... සීතවනවැසි සම්භූත ස්ථවිරයන් වහන්සේ ...

**සම්භූත ස්ථවිරගාථා යි.**

### 1. 1. 7

7. මහත් වූ ඕඝය ඉතා දුබුල් වූ නළහෙයක් මෙන් යමෙක් (කාමාදි) මරසෙන් (අග්‍රමාර්ගයෙන්) දුරු කෙළේ ද, කෙලෙසුන් දිනූ පහ වූ බිය ඇති දැමුණා වූ (කෙලශපරිනිර්වාණයෙන්) පිරිනිවි හෙතෙම අකම්ප්‍ය වූ සිත් ඇත්තේ යි.

මෙසේ .. හල්ලිය ස්ථවිරයන් වහන්සේ ...

**හල්ලිය ස්ථවිරගාථා යි.**

## 1. 1. 8

8. යො දුද්දමියො[1] දමෙන දන්තො වීරො සන්තුසිතො විතිණ්ණකඞ්ඛො
විජිතාවී අපෙතලොමහංසො වීරො සො පරිනිබ්බුතො ඨිතත්තො’ති.

ඉත්ථං සුදං ආයස්මා වීරො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**වීරත්ථෙරගාථා.**

## 1. 1. 9

9. ස්වාගතං න දුරාගතං නයිදං දුම්මන්තිතං මම
සංවිභත්තෙසු ධම්මෙසු යං සෙට්ඨං තදුපාගමින්ති.

ඉත්ථං සුදං ආයස්මා පිළින්දවච්ඡො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**පිළින්දවච්ඡත්ථෙරගාථා.**

## 1. 1. 10

10. විහරි අපෙක්ඛං ඉධ වා හුරං වා
යො වෙදගූ සමිතො යතත්තො
සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො
ලොකස්ස අඤ්ඤාය උදයබ්බයඤ්ච’ති.

ඉත්ථං සුදං ආයස්මා පුණ්ණමාසො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**පුණ්ණමාසත්ථෙරගාථා.**

## පඨමො වග්ගො.

**තස්සුද්දානං:**

සුභූති කොට්ඨිතො ථෙරො කඞ්ඛාරෙවතසම්මතො[2]
මන්තාණිපුත්තො දබ්බො ච සීතවනියො ච භල්ලියො
වීරො පිළින්දවච්ඡො ච පුණ්ණමාසො තමොනුදො’ති.

---

1 දුද්දමයො - PTS
2 සුඛිතො - PTS

**1. 1. 8**

8. දුකයේ දමනය කළයුතු යමෙක් ආයසීමාගීයෙන් දෝහෝ නොහොත් පුරුෂදම්‍යසාරථිහු විසින් දමනය කරනලද්දේ ද, වීර වූ සන්තුෂ්ට වූ දුරු කළ සැක ඇති කෙලෙසුන් දිනූ පහ වූ ලොමුදහ ඇති ඒ වීර මහණ පිරිනිවියේ (එහෙයින් මැ) අචලස්වභාව ඇත්තේ යි.

මෙසේ ... ආයුෂ්මත් වීර ස්ථවිරයන් වහන්සේ ...

**වීර ස්ථවිරගාථා යි.**

**1. 1. 9**

9. මේ මාගේ ස්වාගතයෙකි, (එහෙයින් මැ) දුරාගතයෙක් නො වෙයි, මේ මා විසින් වරදවාගත් සිතිවිල්ලෙක් ද නො වෙයි, කවර හෙයින යත්: (දුඃඛාදි) ප්‍රකාරයෙන් බෙදනලද ධර්මයෙහි ශ්‍රේෂ්ඨ වූ යම් සිව්සස්දහමෙක් වේ නම් එය ලදිම් ද එහෙයිනි.

මෙසේ ... ආයුෂ්මත් පිළින්දවච්ඡ ස්ථවිරයන් වහන්සේ ...

**පිළින්දවච්ඡ ස්ථවිරගාථා යි.**

**1. 1. 10**

10. යමෙක් මෙ අත්බැව්හි හෝ පරඅත්බැව්හි නොහොත් ආධ්‍යාත්මික බාහිර ආයතනයන්හි තෘෂ්ණාව වෙසෙසින් දුරු කෙළේ ද මඟනුවණින් (නිවනට) ගිය සත්හුන් වූ (මාගීසංවරයෙන්) සංයත වූ සිතැති හෙතෙම (උපාදානස්කන්ධ) ලෝකයා ගේ උදය ව්‍යය ද දැන සියලු ආලම්බනධර්මයන්හි නො ඇලුණේ වේ.

මෙසේ පුණ්ණමාස ස්ථවිරයන් වහන්සේ ...

**පුණ්ණමාස ස්ථවිරගාථා යි.**

## ප්‍රථම වර්ගය යි.

**උද්දානය:**

සුභූති ස්ථවිර ද කොට්ඨිත ස්ථවිර ද කඞ්ඛාරේවත ස්ථවිර ද මන්තානිපුත්‍ර (පුණ්ණ) ස්ථවිර ද දබ්බ ස්ථවිර ද සීතවන වැසි (සම්භූත) ස්ථවිර ද භල්ලිය ස්ථවිර ද වීර ස්ථවිර ද පිළින්දවච්ඡ ස්ථවිර ද දුවිදු අඳුරු දුරු කරන පුණ්ණමාස ස්ථවිර දැ යි (ප්‍රථමවර්ගයෙහි තෙරවරු දස දෙනෙකි.)

### 1. 2. 1

11. පාමොජ්ජබහුලො[1] භික්ඛු ධම්මෙ බුද්ධප්පවෙදිතෙ
අධිගච්ඡෙ පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛන්ති.

ඉත්ථං සුදං ආයස්මා චූළවච්ඡො[2] ථෙරො ගාථං අභාසිත්ථා'ති.

චූළවච්ඡත්ථෙරගාථා.

### 1. 2. 2

12. පඤ්ඤාබලී සීලවතූපපන්නො
සමාහිතො ඣානරතො සතීමා
යදත්ථියං භොජනං භුඤ්ජමානො
කඞ්ඛෙථ කාලං ඉධ වීතරාගො'ති.

ඉත්ථං සුදං ආයස්මා මහාවච්ඡො[3] ථෙරො ගාථං අභාසිත්ථා'ති.

මහාවච්ඡත්ථෙරගාථා.

### 1. 2. 3

13. නීලබ්භවණ්ණා රුචිරා සීතවාරී සුචින්ධරා
ඉන්දගොපකසඤ්ඡන්නා තෙ සෙලා රමයන්ති ම'න්ති.

ඉත්ථං සුදං ආයස්මා වනවච්ඡො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

වනවච්ඡත්ථෙරගාථා.

### 1. 2. 4

14. උපජ්ඣායො මං අවච[4] ඉතො ගච්ඡාම[5] සීවක
ගාමෙ මෙ වසති කායො අරඤ්ඤං මෙ ගතො මනො
සෙමානකො පි ගච්ඡාමි නත්ථි සඞ්ගො විජානත'න්ති.

ඉත්ථං සුදං ආයස්මතො වනවච්ඡස්ස ථෙරස්ස සාමණෙරො ගාථං අභාසිත්ථා'ති.

වනවච්ඡත්ථෙරසාමණෙරගාථා.

### 1. 2. 5

15. පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ පඤ්ච චුත්තරි භාවයෙ
පඤ්චසඞ්ගාතිගො භික්ඛු ඔඝතිණ්ණො'ති වුච්චතී'ති.

ඉත්ථං සුදං ආයස්මා කුණ්ඩධානො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

කුණ්ඩධානත්ථෙරගාථා.

### 1. 2. 6

16. යථා පි භද්දො ආජඤ්ඤො නඞ්ගලාවත්තනී සිඛී
ගච්ඡති අප්පකසිරෙන එවං රත්තින්දිවා මම
ගච්ඡති අප්පකසිරෙන සුඛෙ ලද්ධෙ නිරාමිසෙ'ති.

ඉත්ථං සුදං ආයස්මා බෙල්ලට්ඨිසීසො ථෙරො ගාථං අභාසිත්ථා'ති

බෙල්ලට්ඨිසීසත්ථෙරගාථා.

---

1 පාමුජ්ජබහුලො - PTS 2 චූළගවච්ඡො - සීමු 1, 2 3 මහාගවච්ඡො - සීමු 1, 2
4 අවචසි - 5 ගච්ඡාමි - PTS

**1. 2. 1**

11. බුදුරදුන් වදාළ (නවලොවුතුරු) දහම්හි ප්‍රමොද බහුල වූ මහණ තෙම ශාන්තපද වූ සංස්කාරයන් ගේ ව්‍යුපශම සඞ්ඛ්‍යාත (නිවන්) සුවය විදිනේ යි.

මෙසේ ... චූලවච්ඡ ස්ථවිරයන් වහන්සේ ...

**චූලවච්ඡ ස්ථවිරගාථා යි.**

**1. 2. 2**

12. (පාරිහාරිය විපස්සනා වශයෙන්) ප්‍රඥාබල ඇති (සිව්පිරිසිදු) සීල-යෙන් හා (ධුතධම්ම සඞ්ඛාත) ව්‍රතයෙන් සමන්නාගත වූ එකඟසිත් ඇති ධ්‍යානයෙහි ඇලුණු මනාසිහි ඇති (කායසක්ඛි ආදි අර්ථයෙන්) නො වෙත් වැ අහර වළඳනා මෙ සසුන්හි රහතන් වහන්සේ (අනුපාද පරිනිර්වාණ) කාලය අපේක්ෂා කරන්නාහු යි.

මෙසේ මහාවච්ඡ ස්ථවිරයන් වහන්සේ ...

**මහාවච්ඡ ස්ථවිරගාථා යි.**

**1. 2. 3**

13. නිල්වලා බඳු වූ පැහැපත් සිහිල්දිය ඇති, සුවිශුද්ධභූමිභාග ඇති, රතිඳුගොව්වන් විසින් වැසුණු ඒ පර්වතයෝ මා සිත් අලවත්.

මෙසේ ... වනවච්ඡ ස්ථවිරයන් වහන්සේ ...

**වනවච්ඡ ස්ථවිරගාථා යි.**

**1. 2. 4**

14. "සීවකය, මෙයින් වනයට යම්හ" යි උපාධ්‍යායයන් වහන්සේ මට කීහ, මා ගේ කය ගම්හි වෙසෙසි, (එහෙත්) මා ගේ සිත අරණ්‍යයට ගියේ යි, හෝනෙම් නමුදු යෙමි, (කාමයෙහි ආදීනව හා නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස්) දන්නවුන් ගේ (කිසිවක) ඇලීමෙක් නැති.

මෙසේ ආයුෂ්මත් වනවච්ඡ තෙරුන් ගේ හෙරණුන්දෑ ...

**වනවච්ඡථේර සාමණේරගාථා යි.**

**1. 2. 5**

15. (ඔරම්භාගිය සංයොජන) පස සිඳින්නේ යැ, (උද්ධම්භාගිය සං-යොජන) පස දුරලන්නේ යැ, මත්තෙහි (ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්) පස ද, වඩන්නේ යැ, (රාගාදි) පඤ්ච සඞ්ගයන් ඉක්ම ගිය මහණ තෙම ඔඝතිණ්ණ (කාමාදිචතුරෞඝයන් තරණය කෙළේ) යයි කියනු ලැබේ.

මෙසේ ආයුෂ්මත් කුණ්ඩධාන ස්ථවිරයන් වහන්සේ ...

**කුණ්ඩධාන ස්ථවිරගාථා යි.**

**1. 2. 6**

16. අං ඇති සොඳුරු ආජානීයවෘෂභයෙක් නඞ්ගලපථයෙහි (හී-විටෙහි) යම්සේ නිදුකින් යේ ද, එ සෙයින් මට දවරු නිදුකින් ඉක්මෙයි. (මා විසින්) නිරාමිස (ඵලසමවත්) සුවය ලබන ලද්දේ යි.

මෙසේ ... බෙල්ලට්ඨිසීස ස්ථවිරයන් වහන්සේ ...

**බෙල්ලට්ඨිසීස ස්ථවිරගාථා යි.**

**1. 2. 7**

17. මිද්ධී යදා හොති මහග්ඝසො ච
නිද්දායිතා සම්පරිවත්තසායී
මහාවරාහො'ව නිවාපපුට්ඨො
පුනප්පුනං ගබ්භමුපෙති මන්දො'ති.

ඉත්ථං සුදං ආයස්මා දාසකො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**දාසකත්ථෙරගාථා.**

**1. 2. 8**

18 අහු බුද්ධස්ස දායාදො භික්ඛු භෙසකළාවනෙ
කෙවලං අට්ඨිකසඤ්ඤාය[1] අඵරී පඨවිං ඉමං
මඤ්ඤෙ'හං කාමරාගං සො ඛිප්පමෙව පහිස්සතීති.

ඉත්ථ සුදං ආයස්මා සිගාලපිතා[2] ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**සිගාලපිතුත්ථෙරගාථා.**

**1. 2. 9**

19 උදකං හි නයන්ති නෙත්තිකා උසුකාරා නමයන්ති තෙජනං
දාරුං නමයන්ති තච්ඡකා අත්තානං දමයන්ති සුබ්බතා'ති.

ඉත්ථං සුදං ආයස්මා කුණ්ඩලො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**කුණ්ඩලත්ථෙරගාථා.**

**1. 2. 10**

20. මරණෙ මෙ භයං නත්ථි නිකන්ති නත්ථි ජීවිතෙ
සන්දෙහං නික්ඛිපිස්සාමි සම්පජානො පතිස්සතො'ති.

ඉත්ථං සුදං ආයස්මා අජිතො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**අජිතත්ථෙරගාථා.**

## දුතියො වග්ගො.

**තස්සුද්දානං:**

චූළවච්ඡො මහාවච්ඡො වනවච්ඡො ච සිවකො
කුණ්ඩධානො ච බෙලට්ඨි දාසකො ච තතොපරි
සිගාලපිතිකො ථෙරො කුණ්ඩලො ච අජිතො දසා'ති.

---

1 අට්ඨිසඤ්ඤාය -PTS    2 සිඞ්ගාලපිතා - PST.

1. 2. 7

17. යම් කලෙක, මඳ නුවණැත්තේ ථිනමිද්ධයෙන් මඩනා ලද්දේ බොහෝ කොට අහර බුදින්නේත් වේ ද නිදනසුලු වූයේ පෙරළි පෙරළී නිදන්නේත් වේ ද හෙතෙම හූරුබතින් පුෂ්නාලද මහහූරකු සෙයින් පුනපුනා ගැබට වදී. (සසර උපදී යි සේ යි)

මෙසේ .. දාසක ස්ථවිරයන් වහන්සේ

**දාසක ස්ථවිරගාථා යි.**

1. 2. 8

18. බුදුන් ගේ (නවලොවුතුරුදහම්) දායාද ඇති මහණෙක් භේසකලාවනයෙහි වෙයි. (හෙතෙම) මේ සියලු (ආත්මභාව සඞ්ඛ්‍යාත) පෘථිවිය **'අට්ඨික'** සංඥයෙන් පතුළේ ය, හෙතෙම වහාමැ කාමරාගය ප්‍රහීණ කෙරේ යයි මම හඟිමි.

මෙසේ ... සිගාලපිතෘ ස්ථවිරයන් වහන්සේ ...

**සිගාලපිතෘ ස්ථවිරගාථා යි.**

1. 2. 9

19. දියාළුවෝ දිය (රිසි රිසි තැනට) ගෙනයෙති, හීවඩුවෝ හීය (රිසිසේ) නමති, (රිජු කෙරෙති යි සේ යි). දැව වඩුවෝ දැවය නමති එසේම ශීලාදි මනා පැවැතුම් ඇත්තාහු තමා (සිත) දමනය කෙරෙත්,

මෙසේ ... කුණ්ඩල ස්ථවිරයන් වහන්සේ ...

**කුණ්ඩල ස්ථවිරගාථා යි.**

1. 2. 10

20 මට මරණයෙහි බියෙක් නැත, ජීවිතයෙහි අපේක්ෂාවක් නැති, සම්‍යග්ඥාන ඇත්තෙම් එළඹැසිටිසිහි ඇත්තෙම් සිය සිරුර බහාතබන්නෙමි.

මෙසේ .. අජිත ස්ථවිරයන් වහන්සේ ...

**අජිත ස්ථවිරගාථා යි.**

## ද්විතීය වර්ගය යි.

**උද්දානය:**

චූලවච්ඡ ස්ථවිර යැ, මහාවච්ඡ ස්ථවිර යැ, වනවච්ඡ ස්ථවිර යැ, සිවක ස්ථවිර යැ, කුණ්ඩධාන ස්ථවිර යැ, බෙලට්ඨසීස ස්ථවිර යැ, දාසක ස්ථවිර යැ, ඉක් මතුයෙහි සිගාලපිතෘ ස්ථවිර යැ, කුණ්ඩල ස්ථවිර යැ, අජිත ස්ථවිර යැ යි දෙවැනි වගැ තෙරවරු දස දෙනෙකි.

**1. 3. 1**

21 නාහං භයස්ස භායාමි සත්ථා නො අමතස්ස කොවිදො
යත්ථ භයං නාවතිට්ඨති තෙන මග්ගෙන වජන්ති භික්ඛවො'ති.

ඉත්ථං සුදං ආයස්මා නිග්‍රොධො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**නිග්‍රොධත්ථෙරගාථා.**

**1. 3. 2**

22 නීලා සුගීමා සිඛිනො මොරා කාරංවියං අභිනදන්ති.
තෙ සීතවාතකද්දිතකලිතා[1] සුත්තං ඣායං නිබොධෙන්තී'ති.

ඉත්ථං සුදං ආයස්මා චිත්තකො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**චිත්තකත්ථෙරගාථා.**

**1. 3. 3**

23. අහං ඛො වෙළුගුම්බස්මිං භුත්වාන මධුපායසං
පදක්ඛිණං සම්මසන්තො ඛන්ධානං උදයබ්බයං
සානුං පටිගමිස්සාමි විවෙකමනුබ්‍රූහයන්ති.

ඉත්ථං සුදං ආයස්මා ගොසාලො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**ගොසාලත්ථෙරගාථා**

**1. 3. 4**

24. අනුවස්සිකො පබ්බජිතො පස්ස ධම්මසුධම්මතං
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසන'න්ති.

ඉත්ථං සුදං ආයස්මා සුගන්ධො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**සුගන්ධත්ථෙරගාථා.**

**1. 3. 5**

25. ඔභාසජාතං ඵලගං චිත්තං යස්ස අභිණ්හසො
තාදිසං භික්ඛුමාසජ්ජ කණ්හ දුක්ඛං නිගච්ඡසී'ති.

ඉත්ථං සුදං ආයස්මා නන්දියො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**නන්දියත්ථෙරගාථා.**

---

1 සීතවාතකලිතා - PTS.

1. 3. 1

21. මම භය (ජාතිජරාමරණාදි) හෙතුයෙන් නො බමි, අප ගේ ශාස්තෘහු අමෘතයෙහි නිපුණයහ. යම් නිවනෙකැ බිය නො බැසැගෙන සිටි නම් භික්ෂුහු ඒ ආර්‍යමාර්ගයෙන් එහි යෙත්.

මෙසේ ... නිග්‍රොධ ස්ථවිරයන් වහන්සේ ...

**නිග්‍රොධ ස්ථවිරගාථා යි.**

1. 3. 2

22. නිල්වන් මනා ගෙල ඇති සිළු ඇති මොනරු ''කාරංවි' වෙනෙහි වෙසෙසින් නදදෙති, ඔහු (මෙඝකාලයෙහි) ශීතවාතයෙන් හටගත් ''කලි' යන මිහිරි හඬ ඇත්තාහු නිදා සිටියහු ධ්‍යාන කරන්නහු ප්‍රබොධ කෙරෙත්:

මෙසේ ... චිත්තක ස්ථවිරයන් වහන්සේ ...

**චිත්තක ස්ථවිරගාථා යි.**

1. 3. 3

23. මම හුණගොමුයෙහි මිහිමුසු කිරිබත වළඳ (ශාස්තෘන් වහන්සේ ගේ) අවවාදය මොනොවට පිළිගන්නෙම් ස්කන්ධයන් ගේ උදයව්‍යය විදර්ශනා කෙරෙමින් විවෙකය වඩමින් (පෙර විසූ) සානුවට (පර්වත-පාර්‍ශ්වයෙහි සමභූමියට) වටාලා යන්නෙමි.

මෙසේ ... ගොසාල ස්ථවිරයන් වහන්සේ ...

**ගොසාල ස්ථවිරගාථා යි.**

1. 3. 4

24. පැවිදි එක්වස් ඇතියෙහි, ධර්මයා ගේ (ස්වාක්ඛාතතාදි) සුධර්මත්වය බලව, (තොප විසින්) ත්‍රිවිද්‍යාව ලබනලද යැ, සම්බුදුන් ගේ අවවාදය කරනලදි.

මෙසේ .. සුගන්ධ ස්ථවිරයන් වහන්සේ ...

**සුගන්ධ ස්ථවිරගාථා යි.**

1. 3. 5

25. යම් මහණක්හු ගේ සිත එක්වන් හටගත් ඥානාවභාස ඇත්තේ අග්‍රඵලයට පැමිණියේ වේ ද, මාරය, එබඳු මහණහු ගටා තෝ දුකට පැමිණෙන්නෙහි

මෙසේ ... නන්දිය ස්ථවිරයන් වහන්සේ ..

**නන්දිය ස්ථවිරගාථා යි.**

**1. 3. 6**

26. සුත්වා සුභාසිතං වාචං බුද්ධස්සාදිච්චබන්ධුනො
පච්චබ්‍යධිං හි නිපුණං වාලග්ගං උසුනා යථා'ති.

ඉත්ථං සුදං ආයස්මා උභයො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**උභයත්ථෙරගාථා.**

**1. 3. 7**

27. දබ්බං කුසං පොටකිලං උසීරං මුඤ්ජබබ්බජං[1]
උරසා පනුදිස්සාමි[2] විවෙකමනුබ්‍රූහය'න්ති.

ඉත්ථං සුදං ආයස්මා ලොමසකඞ්ගියො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**ලොමසකඞ්ගියත්ථෙරගාථා.**

**1. 3. 8**

28. කච්චි නො වත්ථපසුතො කච්චි නො භූසනාරතො
කච්චි සීලමයං ගන්ධං කිං ත්වං වායසි[3] නෙතරා පජා'ති.

ඉත්ථං සුදං ආයස්මා ජම්බුගාමිකපුත්තො ථෙරො ගාථං
අභාසිත්ථා'ති

**ජම්බුගාමිකත්ථෙරගාථා.**

**1. 3. 9**

29. සමුන්නාමයමත්තානං උසුකාරො'ව තෙජනං
චිත්තං උජුං කරිත්වාන අවිජ්ජං භින්ද[4] හාරිතා'ති.

ඉත්ථං සුදං ආයස්මා හාරිතො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**හාරිතත්ථෙරගාථා.**

**1. 3. 10**

30 ආබාධෙ මෙ සමුප්පන්නෙ සති මෙ උපපජ්ජථ
ආබාධො මෙ සමුප්පන්නො කාලො මෙ නප්පමජ්ජිතුන්ති.

ඉත්ථ සුදං ආයස්මා උත්තියො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**උත්තියත්ථෙරගාථා.**

## තතියො වග්ගො

**තස්සුද්දානං**

නිග්‍රොධො චිත්තකො ථෙරො ගොසාලථෙරො සුගන්ධො
නන්දියො උභයො ථෙරො ථෙරො ලොමසකඞ්ගියො
ජම්බුගාමිකපුත්තො ච හාරිතො උත්තියො ඉසීති

1. මුඤ්ජපබ්බජං - PTS. 2. පනුදහිස්සාමි - PTS. 3. වාසි - PTS.
4 ජින්ද - PTS.

1. 3 6

26. සුයජීබන්ධු වූ බුදුරජාණන් වහන්සේගේ සුභාෂිතය අසා (දක්‍ෂ දුනුවායකු) වලග හියෙන් විදිනාක් මෙන් සියම් වූ නිරොධසත්‍යය අවබොධ කෙළෙමි.

මෙසේ ... අභය ස්ථවිරයන් වහන්සේ ...

අභයස්ථවිරගාථා යි.

1. 3. 7

27. විවේකසුව වඩනුයෙමි හිතණ කුසතණ වැලූක් සුවදහොට මුදුතණ බබුස්තණ උරයෙනුදු බැහැර කරන්නෙමි. (පයින් ඇක්මෙනු කියනු කිම.)

මෙසේ ලොමසකඩ්ගිය ස්ථවිරයන් වහන්සේ

ලොමසකඩ්ගිය ස්ථවිරගාථා යි.

1. 3. 8

28 කිම (චීවරමණ්ඩනාදීන්) වස්ත්‍රයෙහි නිරත නො වූවහු ද, කිම ශරීරමණ්ඩනයෙහි නො ඇලුණහු ද, කිම තෙපි සිල්සුවඳ හමවූ ද, සෙසු දුශශීලප්‍රජාව සිල්සුවඳ නො හමා

මෙසේ .. ජම්බුගාමිය ස්ථවිරයන් වහන්සේ ...

ජම්බුගාමිය ස්ථවිරගාථා යි.

1 3. 9

29. එම්බා හාරිත, සිත (කුසිතයෙන්) නගාලව, හීවඩුවෙක් හිය මෙන් සිත ඍජු කොට ගෙන අවිද්‍යාව පලවා.

මෙසේ ... හාරිත ස්ථවිරයන් වහන්සේ ..

හාරිත ස්ථවිරගාථා යි.

1. 3. 10

30. මට ආබාධය උපන් කල්හි "මට ආබාධයෙක් උපන, මා විසින් නො පමාවත්නට කලැ" යි මට සිහි උපනි.

මෙසේ ... උත්තිය ස්ථවිරයන් වහන්සේ ...

උත්තිය ස්ථවිරගාථා යි.

## තෘතීය වර්ගය යි

උද්දානය:

නිග්‍රොධ ස්ථවිර යැ, චිත්තක ස්ථවිර යැ, ගොසාල ස්ථවිර යැ, සුගන්ධ ස්ථවිර යැ, නන්දිය ස්ථවිර යැ, අභය ස්ථවිර යැ, ලොමසකඩ්ගිය ස්ථවිර යැ, ජම්බුගාමියපුත්ත ස්ථවිර යැ, හාරිත ස්ථවිර යැ, උත්තිය ස්ථවිර යැ යි තෘතීය වර්ගයෙහි තෙරවරු දස දෙනෙකි.

### 1. 4. 1

31\. ඵුට්ඨො ඩංසෙහි මකසෙහි අරඤ්ඤස්මිං බ්‍රහාවනෙ
නාගො සඞ්ගාමසීසෙව සතො තත්‍රාධිවාසයෙ’ති.

ඉත්ථං සුදං ආයස්මා ගබ්භරතීරියො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**ගබ්භරතීරියත්ථෙරගාථා.**

### 1. 4. 2

32\. අජරං ජීරමානෙන තප්පමානෙන නිබ්බුතිං
නිමිස්සං පරමං සන්තිං යොගක්ඛෙමං අනුත්තර’න්ති.

ඉත්ථං සුදං ආයස්මා සුප්පියො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**සුප්පියත්ථෙරගාථා.**

### 1. 4. 3

33\. යථාපි එකපුත්තස්මිං පියස්මිං කුසලී සියා
එවං සබ්බෙසු පාණෙසු සබ්බත්ථ කුසලො සියා’ති.

ඉත්ථං සුදං ආයස්මා සොපාකො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**සොපාකත්ථෙරගාථා.**

### 1. 4. 4

34\. අනාසන්නවරා එතා නිච්චමෙව විජානතා
ගාමා අරඤ්ඤමාගම්ම තතො ගෙහං උපාවිසිං
තතො උට්ඨාය පක්කාමිං අනාමන්තිය[1] පොසියො’ති.

ඉත්ථං සුදං ආයස්මා පොසියො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**පොසියත්ථෙරගාථා.**

### 1. 4. 5

35 සුඛං සුඛත්ථො ලභතෙ තදාචරං
කිත්තිං ච පප්පොති යසස්ස වඩ්ඪති
යො අරියමට්ඨඞ්ගිකමඤ්ජසං උජුං
භාවෙති මග්ගං අමතස්ස පත්තියා’ති.

ඉත්ථං සුදං ආයස්මා සාමඤ්ඤකානිත්ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**සාමඤ්ඤකානිත්ථෙරගාථා.**

### 1. 4. 6

36\. සාධු සුතං සාධු චරිතකං
සාධු සදා අනිකෙතවිහාරො
අත්ථපුච්ඡනං පදක්ඛිණකම්මං
එතං සාමඤ්ඤමකිඤ්චනස්සා’ති.

ඉත්ථං සුදං ආයස්මා කුමාපුත්තො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**කුමාපුත්තත්ථෙරගාථා.**

---

1 අනාමන්තෙත්වා - PTS.

### 1. 4. 1

31. අරණ්‍යයෙහි වූ මහවනයෙහි මැසිමදුරු ආදීන් විසින් පහස්නා ලද්දේ රණබිම්හි ඇතකු සෙයින් සිහි ඇති වැ එහි ඉවසා වෙසෙත්තේ යි.

මෙසේ .. ගබ්භරතීරිය ස්ථවිරයන් වහන්සේ ...

**ගබ්භරතීරිය ස්ථවිරගාථා යි.**

### 1. 4. 2

32. දිරායන ආත්මභාවයෙන් අජරය (නිවන), තැවෙන ආත්මභාවයෙන් පරමශාන්ති වූ යොගක්ෂෙම වූ නිරුත්තර වූ නිවන පිරිවටන්නෙමි. (ගනුදෙනු කරන්නෙමි යි යේ යි)

මෙසේ .. සුප්පිය ස්ථවිරයන් වහන්සේ ...

**සුප්පිය ස්ථවිරගාථා යි.**

### 1. 4. 3

33. යම්සේ ප්‍රිය වූ එක් මැ පුතු කෙරෙහි හිතෛෂී වන්නේ නම් එසේ සියලු සතුන් කෙරෙහි හැම තැන්හි හිතෛෂී වන්නේ ය.

මෙසේ ... සොපාක ස්ථවිරයන් වහන්සේ ...

**සොපාක ස්ථවිරගාථා යි.**

### 1. 4. 4

34. දන්නහු විසින් හැම කල්හි මැ තෙල මාගම්හු නො එළඹෙන ලද්දහු උතුම් වෙති, 'පොසිය' නම් වූ මම අරණ්‍යයෙන් ගමට අවුත් ඉක්බිති ගෙට පිවිසියෙමි, ඒ යහනින් නැඟී බසකුදු නො බැණ පිටත්වූයෙමි.

මෙසේ ... පොසිය ස්ථවිරයන් වහන්සේ ...

**පොසිය ස්ථවිරගාථා යි.**

### 1. 4. 5

35. යමෙක් නිවනට පැමිණෙනු සඳහා ඍජුමාර්ගී වූ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගමාර්ගීය වඩා ද ඒ පිළිවෙත් පුරන සුව කැමැත්තේ (නිරාමිස) සුවය ද ලැබෙයි, කීර්තියට ද පැමිණෙයි, ඔහු ගේ යසස ද වැඩේ.

මෙසේ ... සාමඤ්ඤකානි ස්ථවිරයන් වහන්සේ ...

**සාමඤ්ඤකානි ස්ථවිරගාථා යි.**

### 1. 4. 6

36. (දශකථාවස්තු) ශ්‍රවණය මැනැවි, ඒ අනුව හැසිරීම ද, මැනැවි, හැමැ කල්හි (නෛලශනිවාස වූ) පඤ්චකාමගුණයෙන් වෙන් වැ විසීම මැනැවි, අරුත් පිළිවිසීම මැනැවි, එය ගෞරවයෙන් පිළිගැනීම මැනැවි. තෙල කිඤ්චන (පළිබොධ) රහිත වූවහු ගේ මහණදම වේ යයි.

මෙසේ ... කුමාපුත්ත ස්ථවිරයන් වහන්සේ ...

**කුමාපුත්ත ස්ථවිරගාථා යි.**

## 1. 4. 7

37. නානාජනපදං යන්ති විචරන්තා අසඤ්ඤතා
සමාධිං ච විරාධෙන්ති කිංසු රට්ඨචරියා කරිස්සති
තස්මා විනෙය්‍ය සාරම්භං ඣායෙය්‍ය අපුරක්ඛතො’ති.

ඉත්ථං සුදං ආයස්මතො කුමාපුත්තත්ථෙරස්ස සහායකො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**කුමාපුත්තසහායකත්ථෙරගාථා**

## 1. 4. 8

38. යො ඉද්ධියා සරභුං[1] අට්ඨපෙසි
සො ගවම්පති අසිතො අනෙජො
තං සබ්බසඞ්ගාතිගතං මහාමුනිං
දෙවා නමස්සන්ති භවස්ස පාරගූ’න්ති.

ඉත්ථං සුදං ආයස්මා ගවම්පතිත්ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**ගවම්පතිත්ථෙරගාථා.**

## 1. 4. 9

39. සත්තියා විය ඔමට්ඨො ඩය්හමානො’ව මත්ථකෙ
කාමරාගප්පහානාය සතො භික්ඛු පරිබ්බජෙ’ති

ඉත්ථං සුදං ආයස්මා තිස්සො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**තිස්සත්ථෙරගාථා.**

## 1. 4. 10

40. සත්තියා විය ඔමට්ඨො ඩය්හමානො’ව මත්ථකෙ
භවරාගප්පහානාය සතො භික්ඛු පරිබ්බජෙ’ති.

ඉත්ථං සුදං ආයස්මා වඩ්ඪමානො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**වඩ්ඪමානත්ථෙරගාථා.**

## චතුත්ථො වග්ගො.

**තස්සුද්දානං:**

ගබ්භරතීරියො සුප්පියො සොපාකො චෙව පොසියො
සාමඤ්ඤකානි කුමාපුත්තො කුමාපුත්තසහායකො
ගවම්පති තිස්සත්ථෙරො වඩ්ඪමානො මහායසො’ති.

---

1 සරබුං - සීමු 1

### 1. 4. 7

37. අසංයත වැ හැසිරෙන්නාහු නොයෙක් ජනපදයට යෙති, චිත්ත-සමාධිය ද වරද්දාගනිති, ජනපදචාරිකාව කවර අර්ථයක් කරන්නේ ද එහෙයින්, (අරති වශයෙන් උපන්) සාරම්භය දුරලා (තෘෂ්ණාදෘෂ්ටි විසින්) නො පෙරටු කරන ලදුයේ ධ්‍යාන කරන්නේ යයි.

මෙසේ ... 'කුමාපුත්ත' තෙරුන් ගේ සහායක ස්ථවිරයන් වහන්සේ ...

**කුමාපුත්ත ස්ථවිර සහායකථේරගාථා යි.**

### 1. 4. 8

38. යමෙක් සෘද්ධිබලයෙන් 'සරභූ' නම් ගඟ නැවැත්වී ද, ඒ ගවම්පති තෙම (තෘෂ්ණාදෘෂ්ටි) නිශ්‍රය රහිත වූයේ (එහෙයින් මැ) නිකෙලෙසී වෙයි, සියලු (රාගාදිකෙලශ) සඞ්ගයන් ඉක්ම ගිය භවපාරයට පැමිණි ඒ මහමුනිහු දෙවියෝ නමදිත් යයි.

මෙසේ ... ගවම්පති ස්ථවිරයන් වහන්සේ ...

**ගවම්පති ස්ථවිරගාථා යි.**

### 1. 4. 9

39. අඩයටියෙන් පහර ලද්දකු සෙයින් ද හිස ගිනි ඇවිළ ගත් කල්හි සෙයින් ද මහණ තෙම සිහි ඇති වැ කාමරාගයන් දුරලීම පිණිස වැර වඩන්නේ යයි.

මෙසේ ... තිස්ස ස්ථවිරයන් වහන්සේ ...

**තිස්ස ස්ථවිරගාථා යි**

### 1. 4. 10

40. අඩයටියෙන් පහර ලද්දකු සෙයින් ද හිස ගිනිඇවිළගත් කල්හි සෙයින් ද මහණ තෙම සිහි ඇති වැ භවරාගය දුරලීම පිණිස වැර වඩන්නේ යයි.

මෙසේ .. වඩ්ඪමාන ස්ථවිරයන් වහන්සේ ...

**වඩ්ඪමාන ස්ථවිරගාථා යි.**

## චතුර්ථ වර්ගය යි.

**උද්දානය:**

ගහ්වරතීය ස්ථවිර යැ, සුප්පිය ස්ථවිර යැ, සොපාක ස්ථවිර යැ, පොසිය ස්ථවිර යැ, සාමඤ්ඤකානි ස්ථවිර යැ, කුමාපුත්‍ර ස්ථවිර යැ, කුමාපුත්‍ර සහායක ස්ථවිර යැ, ගවම්පති ස්ථවිර යැ, තිස්ස ස්ථවිර යැ, මහයසස් ඇති වඩ්ඪමාන ස්ථවිර යැ යි චතුර්ථවර්ගයෙහි තෙරවරු දස දෙනෙකි.

## 1. 5. 1

41. විවරමනුපතන්ති විජ්ජුතා වෙභාරස්ස ච පණ්ඩවස්ස ච
නගවිවරගතො ච ඣායති පුත්තො අප්පටිමස්ස තාදිනො'ති.

ඉත්ථං සුදං ආයස්මා සිරිවඩ්ඪො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**සිරිවඩ්ඪත්ථෙරගාථා.**

## 1. 5. 2

42. චාලෙ උපචාලෙ සීසූපචාලෙ
පතිස්සතා නු ඛො විහරථ
ආගතො වො වාලං විය වෙධී'ති.

ඉත්ථං සුදං ආයස්මා ඛදිරවනියො රෙවතො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**ඛදිරවනියරෙවතත්ථෙර ගාථා.**

## 1. 5. 3

43. සුමුත්තිකො සුමුත්තිකො සාහු සුමුත්තිකොම්හි තීහි ඛුජ්ජකෙහි
අසිතාසු මයා නඞ්ගලාසු මයා කුද්දාලාසු[1] මයා
යදිපි ඉධමෙව ඉධමෙව අථවා පි අලමෙව අලමෙව
ඣාය සුමඞ්ගල ඣාය සුමඞ්ගල අප්පමත්තො විහර සුමඞ්ගලා'ති.

ඉත්ථං සුදං ආයස්මා සුමඞ්ගලො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**සුමඞ්ගලත්ථෙරගාථා.**

## 1. 5. 4

44. මතං වා අම්ම රොදන්ති යො වා ජීවං න දිස්සති
ජීවන්තං මං අම්ම පස්සන්තී කස්මා මං අම්ම රොදසී'ති.

ඉත්ථං සුදං ආයස්මා සානුත්ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**සානුත්ථෙරගාථා.**

## 1. 5. 5

45. යථාපි භද්දො ආජඤ්ඤො ඛලිත්වා පතිතිට්ඨති
එවං දස්සනසම්පන්නං සම්මාසම්බුද්ධසාවකන්ති.

ඉත්ථං සුදං ආයස්මා රමණීයවිහාරිත්ථෙරො ගාථං අභාසිත්ථා'ති

**රමණීයවිහාරිත්ථෙරගාථා**

---

1 ඛුද්දලාසු - සිමු 1. කුද්දලෙසු - සිමු 2. ඛුද්දකුද්දලාසු - PTS.

1. 5. 1

41. විදුලිහු වෙභාරපර්‍වතයා ගේ ද පාණ්ඩවපර්‍වතයා ගේ ද විවරයෙහි (අතර) වැටෙති. අනුපම වූ තාදීහු (භාග්‍යවතුන් වහන්සේ) ගේ පුත්‍ර තෙම පර්‍වතගුහාගත වැ ධ්‍යාන කෙරේ යයි.

මෙසේ සිරිවඩ්ඪ ස්ථවිරයන් වහන්සේ ...

**සිරිවඩ්ඪ ස්ථවිර ගාථා යි.**

1. 5. 2

42. චාලා උපචාලා සීසූපචාලා හෙරණුනි, (තෙපි) සිහි ඇති වැ වෙසෙවු ද? (තියුණු නුවණ ඇති බැවින්) වාලවෙධී ස්වරූප වූ තොප ගේ මසිල් (සැරියුත්) තෙරණුවෝ ආහ යි.

මෙසේ ... ඛදිරවනියරෙවත ස්ථවිරයන් වහන්සේ ...

**ඛදිරවනියරෙවත ස්ථවිරගාථා යි.**

1. 5. 3

43. මොනවට මිදුණෙමි, මොනවට මිදුණෙමි, තුන්කුදුයෙන් (මම) මැනැවින් මිදුණෙම් වෙමි, මා දෑකැත්තෙන් මිදීම යැ, මා නඟුලින් මිදීම යැ, මා හුදැල්ලෙන් මිදීම යි ඉදින් (ඒ අසිතාදිය) මෙහි මැ වුව ද මෙහි මැ වුව ද එතෙකුදුවත් (එයින්) කම් නැත, කම් නැත, සුමඞ්ගලයෙනි, ධ්‍යාන වඩව, සුමඞ්ගලයෙනි, ධ්‍යාන වඩව, අප්‍රමත්ත වැ වාසය කරව සුමඞ්ගලයෙනි යි.

මෙසේ ... සුමඞ්ගල ස්ථවිරයන් වහන්සේ ...

**සුමඞ්ගල ස්ථවිරගාථා යි.**

1. 5. 4

44. මෑණියනි, මළහුට හෝ දිවිවැටෙන යමෙක් නො පැනේ නම් (ඔහුට) හෝ හඩති. මෑණියනි, දිවිවැටෙන මා දක්මින් මෑණියනි, කවර හෙයකින් මට හඬවු දැ? යි.

මෙසේ ... සානු ස්ථවිරයන් වහන්සේ ...

**සානු ස්ථවිරගාථා යි.**

1. 5. 5

45. යම්සේ සොඳුරු වූ ආජානීයවෘෂභයා පැකිලැ වහා නැඟී සිටුනේ ද, එසෙයින් දර්‍ශනසම්පන්න වූ සම්‍යක්සම්බුද්ධශ්‍රාවක වූ මා සලකව යි.

මෙසේ ... රමණීයවිහාරී ස්ථවිරයන් වහන්සේ ...

**රමණීයවිහාරී ස්ථවිරගාථා යි.**

### 1. 5. 6

46. සද්ධායාහං පබ්බජිතො අගාරස්මානගාරියං
සති පඤ්ඤා ච මෙ වුද්ධා චිත්තං ච සුසමාහිතං
කාමං කරස්සු රූපානි නෙව මං බාධයිස්සසී'ති.[1]

ඉත්ථං සුදං ආයස්මා සමිද්ධිත්ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**සමිද්ධිත්ථෙරගාථා.**

### 1. 5. 7

47. නමො තෙ බුද්ධවීරත්ථු විප්පමුත්තොසි සබ්බධි
තුය්හාපදානෙ විහරං විහරාමි අනාසවො'ති.

ඉත්ථං සුදං ආයස්මා උජ්ජයො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**උජ්ජයත්ථෙරගාථා.**

### 1. 5. 8

48. යතො අහං පබ්බජිතො අගාරස්මානගාරියං
නාභිජානාමි සඞ්කප්පං අනරියං දොසසංහිත'න්ති.

ඉත්ථං සුදං ආයස්මා සඤ්ජයො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**සඤ්ජයත්ථෙරගාථා**

### 1. 5. 9

49. විහවිහාභිනදිතෙ සිප්පිකාභිරුතෙහි ච
න මෙ තං ඵන්දති චිත්තං එකත්තනිරතං හි මෙ'ති.

ඉත්ථං සුදං ආයස්මා රාමණෙය්‍යකො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**රාමණෙය්‍යකත්ථෙරගාථා.**

### 1. 5. 10

50. ධරණී ච සිඤ්චති[2] වාති මාලුතො විජ්ජුතා චරති නභෙ
උපසමන්ති[3] විතක්කා චිත්තං සුසමාහිතං මමා'ති.

ඉත්ථං සුදං විමලො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**විමලත්ථෙරගාථා.**

## පඤ්චමො වග්ගො.

**තස්සුද්දානං:**

සිරිවඩ්ඪො රෙවතො ථෙරො සුමඞ්ගලො සානුසව්හයො
රමණීයවිහාරී ච සමිද්ධිඋජ්ජයසඤ්ජයා
රාමණෙය්‍යො ච සො ථෙරො විමලො ච රණඤ්ජහො'ති.

---

1 බාධයිස්සසීති - PTS 2 සිච්චති - PTS 3 උපසම්මන්ති - PTS

**1. 5. 6**

46. මම සැදැහැයෙන් ගිහිගෙන් (නික්මැ) සසුනට පැමිණියෙමි. මා ගේ සමෘතියත් ප්‍රඥාවත් (අභිවෘද්ධිය කරා) වැඩුණහ, සිතත් මොනොවට සමාහිත වෙයි, (මාරය) කැමැති සේ විප්‍රකාර කරව, (තෝ එයින්) මා නො පෙළන්නෙහි මැ යි.

මෙසේ ... සමිද්ධි ස්ථවිරයන් වහන්සේ ...

**සමිද්ධි ස්ථවිරගාථා යි.**

**1. 5. 7**

47. බුද්ධවීරයන් වහන්ස, මුඹ වහන්සේට නමස්කාර වේවා! (මුඹ වහන්සේ) සියලු සංස්කාරගතයෙහි මොනවට මිදුණහු යැ, (මම) මුඹ වහන්සේ ගේ ප්‍රතිපත්තිචර්‍ය්‍යායෙහි වෙසෙන්නෙම් ආශ්‍රව රහිත වැ වෙසෙමි යි.

මෙසේ ... උජ්ජය ස්ථවිරයන් වහන්සේ ...

**උජ්ජය ස්ථවිරගාථා යි.**

**1. 5. 8**

48. යම් තැනෙකැ පටන්ගෙන මම ගිහිගෙන් (නික්මැ) පැවිද්දට පැමිණියෙම් ද, එතැන් සිට දෝෂයෙන් යුක්ත වූ (එහෙයින් මැ) අනාර්‍ය්‍ය වූ සංකල්පයක් (ඉපැදුවුවා) නො දනිමි.

මෙසේ ... සඤ්ජය ස්ථවිරයන් වහන්සේ ...

**සඤ්ජය ස්ථවිරගාථා යි.**

**1. 5. 9**

49 වටුවන් ගේ හඬට (හැඬීම නිසා) ද හුනපුපුළුවන් ගේ නොහොත් දඹුලෙහෙනුන් ගේ හඬට (හඬින්) ද මා ගේ ඒ සිත නො සැලෙයි. යම් හෙයකින් මා සිත නිවන් අරමුණු කොට පවතී ද එහෙයිනැ යි.

මෙසේ ... රාමණෙය්‍ය ස්ථවිරයන් වහන්සේ ...

**රාමණෙය්‍ය ස්ථවිරගාථා යි.**

**1. 5. 10**

50. දෙරණ ද තෙමෙයි, සිහිල්සුළං හමයි, අහසැ විදුලි කොටයි, මා ගේ විතර්කයෝ සන්හිදෙති, (එහෙයින්) මැ සිත ද සමාහිත වී යයි.

මෙසේ ... විමල ස්ථවිරයන් වහන්සේ ...

**විමල ස්ථවිරගාථා යි.**

## පඤ්චම වර්ගය යි.

**උද්දානය:**

සිරිවඩ්ඪ ස්ථවිර යැ, ඛදිරවනියරේවත ස්ථවිර යැ, සුමඞ්ගල ස්ථවිර යැ, සානු ස්ථවිර යැ, රමණීයවිහාරී ස්ථවිර යැ, සමිද්ධි ස්ථවිර යැ, උජ්ජය ස්ථවිර යැ, සඤ්ජය ස්ථවිර යැ, රාමණෙය්‍ය ස්ථවිර යැ, විමල ස්ථවිර යැ යි පස් වැනි වර්ගයෙහි තෙරවරු දස දෙනෙකි.

**1. 6. 1**

51. වස්සති දෙවො යථා සුගීතං
ඡන්නා මෙ කුටිකා සුඛා නිවාතා
චිත්තං සුසමාහිතං ච මය්හං
අථ චෙ පත්ථයසි පවස්ස දෙවා'ති.

ඉත්ථං සුදං ආයස්මා ගොධිකො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**ගොධිකත්ථෙරගාථා.**

**1. 6. 2**

52. වස්සති දෙවො යථා සුගීතං
ඡන්නා මෙ කුටිකා සුඛා නිවාතා
චිත්තං සුසමාහිතං ච කායෙ
අථ චෙ පත්ථයසි පවස්ස දෙවා'ති.

ඉත්ථං සුදං ආයස්මා සුබාහුත්ථෙරො ගාථං අභාසිත්ථා'ති

**සුබාහුත්ථෙරගාථා.**

**1. 6. 3**

53. වස්සති දෙවො යථා සුගීතං
ඡන්නා මෙ කුටිකා සුඛා නිවාතා
තස්සං විහරාමි අප්පමත්තො
අථ චෙ පත්ථයසි පවස්ස දෙවා'ති

ඉත්ථං සුදං ආයස්මා වල්ලියො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**වල්ලියත්ථෙරගාථා.**

**1. 6. 4**

54. වස්සති දෙවො යථා සුගීතං
ඡන්නා මෙ කුටිකා සුඛා නිවාතා
තස්සං විහරාමි අදුතියො
අථ චෙ පත්ථයසි පවස්ස දෙවා'ති.

ඉත්ථං සුදං ආයස්මා උත්තියො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**උත්තියත්ථෙරගාථා.**

**1. 6. 5**

55. ආසන්දිං කුටිකං කත්වා ඔගය්හ අඤ්ජනං වනං
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසන'න්ති

ඉත්ථං සුදං අඤ්ජනවනියො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**අඤ්ජනවනියත්ථෙරගාථා.**

**1. 6. 6**

56 කො කුටිකායං භික්ඛු කුටිකායං
වීතරාගො සුසමාහිත චිත්තො
එවං ජානාහි ආවුසො
අමොඝා තෙ කුටිකා කතා'ති.

ඉත්ථං සුදං ආයස්මා කුටිවිහාරිත්ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**කුටිවිහාරිත්ථෙරගාථා.**

## 1. 6. 1

51. සොඳුරු ගැයුමක් සෙයින් වැසි වසී, මා ගේ කිලිය සොයනලද, පරිභොගසුඛ හා පියූ වාකවුළු ඇත. මා ගේ සිත ද (නිවන් අරමුණෙහි) මොනොවට එකඟ විය. මෙසය දූත් රිසියෙයි නම් වස්ව යි.

මෙසේ ... ගොධික ස්ථවිරයන් වහන්සේ ...

**ගොධික ස්ථවිරගාථා යි.**

## 1. 6. 2

52. සොඳුරු ගැයුමක් සෙයින් වැසි වසී, මා ගේ කිලිය සොයනලද, පරිභොගසුඛ හා පියූ වාකවුළු ඇත. (මා ගේ සිත ද කායගතාසති අරමුණෙහි ලා) මොනොවට එකඟ විය. මෙසය දූත් රිසියෙයි නම් වස්ව යි.

මෙසේ ... සුබාහු ස්ථවිරයන් වහන්සේ ...

**සුබාහු ස්ථවිරගාථා යි.**

## 1. 6. 3

53. සොඳුරු ගැයුමක් සෙයින් වැසි වසී. මා ගේ කිලිය සොයනලද. පරිභොගසුඛ හා පියූ වාකවුළු ඇත. ඒ කිලියෙහි නො පමා ව වෙසෙමි. මෙසය, දූත් රිසියෙයි නම් වස්ව යි.

මෙසේ ... වල්ලිය ස්ථවිරයන් වහන්සේ ...

**වල්ලිය ස්ථවිරගාථා යි.**

## 1. 6. 4

54 සොඳුරු ගැයුමක් සෙයින් වැසි වසී, මා ගේ කිලිය සොයනලද, පරිභෝගසුඛ හා පියූ වාකවුළු ඇත, එහි එකලා ව වෙසෙමි. මෙසය, දූත් රිසියෙයි නම් වස්ව යි.

මෙසේ ... උත්තිය ස්ථවිරයන් වහන්සේ ...

**උත්තිය ස්ථවිරගාථා යි.**

## 1. 6. 5

55. අඳුන්වනයට වැද දික්හගලාපුටුව කුටිය කොට ගෙන (වෙසෙමින් මා විසින්) ත්‍රිවිද්‍යා ලබනලද. බුදුසසුන් කරනලද යි.

මෙසේ . අඤ්ජනවනිය ස්ථවිරයන් වහන්සේ . .

**අඤ්ජනවනිය ස්ථවිරගාථා යි.**

## 1. 6. 6

56. කුටියෙහි කවරෙක් ද? කුටියෙහි වීතරාග වූ මොනොවට සන්හුන් සිතැති මහණෙක්මි. 'තා ගේ කුටිය සඵල කරනලද' යි මෙසේ දනැ යි.

මෙසේ ... කුටිවිහාරිය ස්ථවිරයන් වහන්සේ ...

**කුටිවිහාරිය ස්ථවිරගාථා යි.**

### 1. 6. 7

57. අයමාහු පුරාණියා කුටි අඤ්ඤං පත්ථයසෙ නවං කුටිං
ආසං කුටියා විරාජය දුක්ඛා භික්ඛු පුන නවා කුටී’ති.

ඉත්ථං සුදං ආයස්මා දුතියකුටිවිහාරිත්ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**දුතියකුටිවිහාරිත්ථෙරගාථා.**

### 1. 6. 8

58. රමණීයො මෙ කුටිකා සද්ධාදෙය්‍යා මනොරමා
න මෙ අත්ථො කුමාරීහි යෙසං අත්ථො තහිං ගච්ඡථ නාරියො’ති.

ඉත්ථං සුදං ආයස්මා රමණීයකුටිකො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**රමණීයකුටිකත්ථෙරගාථා.**

### 1. 6. 9

59. සද්ධායාහං පබ්බජිතො අරඤ්ඤෙ මෙ කුටිකා කතා
අප්පමත්තො ච ආතාපී සම්පජානො පතිස්සතො’ති.

ඉත්ථං සුදං ආයස්මා කොසලවිහාරිත්ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**කොසලවිහාරිත්ථෙරගාථා.**

### 1. 6. 10

60. තෙ මෙ ඉජ්ඣිංසු සඞ්කප්පා යදත්ථො පවිසිං කුටිං
විජ්ජාවිමුත්තිං පච්චෙස්සං මානානුසයමුජ්ජහ’න්ති.

ඉත්ථං සුදං ආයස්මා සීවලිත්ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**සීවලිත්ථෙරගාථා.**

## ඡට්ඨො වග්ගො.

**තස්සුද්දානං:**

ගොධිකො ච සුබාහු ච වල්ලියො උත්තියො ඉසි
අඤ්ජනවනියො ථෙරො දුවෙ කුටිවිහාරිනො
රමණීයකුටිකො ච කොසලව්හයසීවලී’ති.

**1. 6. 7**

57. මේ පැරැණි කුටියක් විය, අන් නවකිලියක් පතන්නෙහි, මහණ, කිලියෙහි ආශාව හරුව, නවකුටිය දුක් එලවා යි.

මෙසේ ... දෙ වැනි කුටිවිහාරිය ස්ථවිරයන් වහන්සේ ...

**දුතියකුටිවිහාරිය ස්ථවිරගාථා යි.**

**1. 6. 8**

58. සද්ධාදෙය්‍යධනයෙන් නිමවනලද මා ගේ මේ කුටිය සිත්කලු යෑ, මට කුමරියන් ගෙන් කම් නැත. කුමරියෙනි, යම් කෙනකුන්ට (තොප ගෙන්) වැඩෙක් වේ නම් එහි යව යි.

මෙසේ .. රමණීයකුටික ස්ථවිරයන් වහන්සේ ...

**රමණීයකුටික ස්ථවිරගාථා යි.**

**1. 6. 9**

59. මම සැදැහැයෙන් පැවිදි වීමි, මට වෙනෙහි කුටියක් කරනලදී. අප්‍රමත්ත වූයෙම් කෙලෙසුන් තවන වැර ඇත්තෙම් සම්‍යක්ප්‍රඥ ඇත්තෙම් එලඹැ සිටි සිහි ඇත්තෙම් වෙමි යි.

මෙසේ ... කොසලවිහාරිය ස්ථවිරයන් වහන්සේ ...

**කෝසලවිහාරිය ස්ථවිරගාථා යි.**

**1. 6. 10**

60. යමක් ප්‍රයෝජන කොට ඇත්තෙම් කිලියට පිවිසියෙම් ද, මා ගේ ඒ සංකල්පයෝ සමෘද්ධ වූහ, ත්‍රිවිද්‍යා අභිත්එලවිමුක්ති නොයන්නෙම් මානානුශයයන් හළිමි.

මෙසේ ... සිවලි ස්ථවිරයන් වහන්සේ ...

**සිවලි ස්ථවිරගාථා යි.**

## ෂෂ්ට වර්ගය යි.

**උද්දානය:**

ගොධික ස්ථවිර යෑ, සුබාහු ස්ථවිර යෑ, වල්ලිය ස්ථවිර යෑ, උත්තිය ස්ථවිර යෑ, අඤ්ජනවනිය ස්ථවිර යෑ, කුටිවිහාරී ස්ථවිර දෙනම යෑ, රමණීය-කුටික ස්ථවිර යෑ, කොසල ස්ථවිර යෑ, සිවලි ස්ථවිර යෑ යි ස වැනි වර්ගයෙහි තෙරවරු දස දෙනෙකි.

### 1. 7. 1

61. පස්සති පස්සො පස්සන්තං අපස්සන්තං ච පස්සති
අපස්සන්තො අපස්සන්තං පස්සන්තං ච න පස්සතී'ති.

ඉත්ථං සුදං ආයස්මා වප්පො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**වප්පත්ථෙරගාථා.**

### 1. 7. 2

62. එකකා මයං අරඤ්ඤෙ විහරාම
අපවිද්ධං ච වනස්මිං දාරුකං
තස්ස මෙ බහුකා පිහයන්ති
නෙරයිකා විය සග්ගගාමිනන්ති.

ඉත්ථං සුදං ආයස්මා වජ්ජිපුත්තො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**වජ්ජිපුත්තත්ථෙරගාථා.**

### 1. 7. 3

63 චුතා පතන්ති පතිතා ගිද්ධා ච පුනරාගතා
කතං කිච්චං රතං රම්මං සුඛෙනන්වාගතං සුඛන්ති.

ඉත්ථං සුදං ආයස්මා පක්ඛො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**පක්ඛත්ථෙරගාථා.**

### 1. 7. 4

64. දුමව්හයාය උප්පන්නො ජාතො පණ්ඩරකෙතුනා
කෙතුහා කෙතුනායෙව මහාකෙතුං පධංසයීති.

ඉත්ථං සුදං ආයස්මා විමලො කොණ්ඩඤ්ඤො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

### 1. 7. 5

65. උක්ඛෙපකටවච්ඡස්ස සඞ්කලිතං බහූහි වස්සෙහි
තං භාසති ගහට්ඨානං සුනිසින්නො උළාරපාමොජ්ජො'ති.[1]

ඉත්ථං සුදං ආයස්මා උක්ඛෙපකටවච්ඡො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**උක්ඛෙපකටවච්ඡත්ථෙරගාථා.**

---

1 උළාරපාමුජ්ජො - T

### 1. 7. 1

61. දර්ශනසම්පන්න වූ ආර්‍ය්‍ය තෙමේ අවිපරීත කොට දක්නා ආර්‍ය්‍යයා දකී, අවිපරීත කොට නො දක්නා පෘථග්ජනයා ද දකී. අවිපරීතඥාන-යෙන් තොර වූ අන්ධබාලපෘථග්ජන තෙමේ ආර්‍ය්‍යයාත් අනාර්‍ය්‍යයාත් නො දක්නේ ය යි.

මෙසේ ... වප්ප ස්ථවිරයන් වහන්සේ ...

**වප්ප ස්ථවිරගාථා යි.**

### 1. 7. 2

62. වනයෙහි හැරදමනලද දරකඩක් සෙයින් අපි හුදෙකලාවමෝ වෙනෙහි වසම්හ, ස්වර්ගගාමීන් (කැමැති වන) තිරිසනුන් සෙයින් බොහෝ දෙනා මට කැමැති වෙත්.

මෙසේ ... වජ්ජිපුත්ත ස්ථවිරයන් වහන්සේ ...

**වජ්ජිපුත්ත ස්ථවිරගාථා යි.**

### 1. 7. 3

63. මාංශපේශිය මුවින් ගිලිහුණු අනුක්‍රමයෙන් වැටෙමින් (බිමැ) පතිත වූ යැ, එනෙකුදුවත් (උකුස්සෝ) ගිජු වූවාහු වටාලා ආහ. ච්‍යුත වූවාහු නිරයාදියෙහි හෙති, හුණුවාහු ද කාමාදිභවයෙහි ගිජු වූවාහු වටාලා ආවාහු මැයි, මා විසින් (පරිශුද්ධ සොළසවිධ) කෘත්‍යය කරනලද යැ, රමණීය කළ යුත්ත (නිවන) රමණය කරන ලද යැ (විදර්ශනා-මාර්ග) සුවයෙන් (ඵල-නිර්වාණ) සුවය ලබන ලදැ යි.

මෙසේ ... පක්ඛ ස්ථවිරයන් වහන්සේ ...

**පක්ඛ ස්ථවිරගාථා යි.**

### 1. 7. 4

64. හෙළ කෙහෙලි ඇතියහු (බිම්සර රජහු) නිසා අම්බපාලිය කෙරෙහි උපන්නේ (මාන) ධ්වජය නැසුයේ ප්‍රඥ (කෙතුයෙන්) මැ කෙලෙස් මරහු අභිභවනය කෙළේ යි.

මෙසේ ... විමලකොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේ ...

**විමලකොණ්ඩඤ්ඤ ස්ථවිරගාථා යි.**

### 1. 7. 5

65. උක්ඛෙපකටවච්ඡ මහණහු විසින් හවුරුදු බොහෝ ගණනකින් සිත්හි ලා රැස් කරනලද යම් දහමෙක් වේ ද, හෙ විමුක්තායතන-ශීර්ෂයෙහි සිටියේ උදාර වූ ප්‍රමෝදය ඇති වැ ඒ දහම ගිහියනට දෙශනා කෙරේ යයි.

මෙසේ .. උක්ඛෙපකටවච්ඡ ස්ථවිරයන් වහන්සේ ...

**උක්ඛෙපකටවච්ඡ ස්ථවිරගාථා යි.**

### 1. 7. 6

66. අනුසාසි මහාවීරො සබ්බධම්මාන පාරගූ
තස්සාහං ධම්මං සුත්වාන විහාසිං සන්තිකෙ සතො[1]
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනන්ති.

ඉත්ථං සුදං ආයස්මා මෙඝියො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

මෙඝියත්ථෙරගාථා.

### 1. 7. 7

67. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා
වික්ඛීණො ජාතිසංසාරො නත්ථි දානි පුනබ්භවො'ති.

ඉත්ථං සුදං ආයස්මා එකධම්මසවනීයො ථෙරො ගාථං අභාසිත්ථා'ති

එකධම්මසවනීයත්ථෙරගාථා

### 1. 7. 8

68. අධිචෙතසො අප්පමජ්ජතො මුනිනො මොනපථෙසු සික්ඛතො
සොකා න භවන්ති තාදිනො උපසන්තස්ස සදා සතීමතො'ති.

ඉත්ථං සුදං ආයස්මා එකුදානියො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

එකුදානියත්ථෙරගාථා

### 1. 7. 9

69. සුත්වාන ධම්මං මහතො මහාරසං
සබ්බඤ්ඤුතඤ්ඤාණවරෙන දෙසිතං
මග්ගං පපජ්ජිං අමතස්ස පත්තියා
සො යොගක්ඛෙමස්ස පථස්ස කොවිදො'ති.

ඉත්ථං සුදං ආයස්මා ඡන්නො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

ඡන්නත්ථෙරගාථා

### 1. 7. 10

70. සීලමෙව ඉධ අග්ගං පඤ්ඤවා පන උත්තමො
මනුස්සෙසු ච දෙවෙසු සීලපඤ්ඤාණතො ජය'න්ති.

ඉත්ථං සුදං ආයස්මා පුණ්ණො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

පුණ්ණත්ථෙරගාථා.

## සත්තමො වග්ගො

තස්සුද්දානං:

වප්පො ච වජ්ජිපුත්තො ච පක්ඛො විමලකොණ්ඩඤ්ඤො
උක්ඛෙපකතවච්ඡො ච මෙඝියො එකධම්මිකො
එකුදානියඡන්නා ච පුණ්ණත්ථෙරො මහබ්බලො'ති.

---

1 රතො - PTS

1. 7. 6

66. සියලු ධර්මයන් ගේ පරතෙරට ගිය මහාවීර වූ සර්වඥයන් වහන්සේ (මට) අවවාද කළහ, මම උන් වහන්සේ ගේ දහම් අසා සිහි ඇති වැ උන්වහන්සේ කෙරෙහි විසීමි. (ඒ මා විසින්) ත්‍රිවිද්‍යා ලබන ලදු. බුදුසසුන් කරනලද්දී සි.

මෙසේ ... මෙසිය ස්ථවිරයන් වහන්සේ ...

මෙසිය ස්ථවිරගාථා සි.

1. 7. 7

67. මා විසින් කෙලශයෝ දවනලදහ. සියලු (කාමාදි) භවයෝ නසන ලදහ, ජාතිසංසාරය වෙසෙසින් ක්‍ෂය විය. දැන් පුනර්භවයෙක් නැතැ සි,

මෙසේ ... එකධම්මසවනීය ස්ථවිරයන් වහන්සේ ...

ඒකධම්මසවනීය ස්ථවිරගාථා සි.

1. 7. 8

68. අධිචිත්ත සඞ්ඛ්‍යාත රහත්පලසිතැති (අනවද්‍යධර්මයෙහි සාතත්‍යක්‍රියා විසින්) අප්‍රමාදවිහරණ ඇති මොනපථ (සත්තිස්බොධිපාක්‍ෂිකධර්ම) යෙහි හික්මෙන තාදීගුණ ඇති උපශාන්ත වූ හැම කල්හි සමෘතිමත් වූ මුනිවරයාහට ශොකයෝ නොවෙත් යයි.

මෙසේ ... එකුදානිය ස්ථවිරයන් වහන්සේ ...

ඒකුදානිය ස්ථවිරගාථා සි

1. 7. 9

69. උතුම් වූ සර්වඥතාඥානයෙන් දෙසනලද උදාර වූ (විමුක්ති) රස ඇති (සිව්සස්) දහම් භාග්‍යවතුන් කෙරෙන් අසා නිර්වාණාධිගමය පිණිස මඟට පිළිපන්මි. ඒ භාග්‍යවතුන් වහන්සේ යොගක්‍ෂෙම (නිර්වාණ) මාර්ගයෙහි නිපුණහ සි.

මෙසේ ... ජන්න ස්ථවිරයන් වහන්සේ ...

ඡන්න ස්ථවිරගාථා සි.

1. 7. 10

70. මෙහි ශීලය මැ අග්‍ර යැ, එතෙකුදුවත් නුවණැත්තේ මැ උතුම් මිනිසුන් කෙරෙහි දු දෙවියන් කෙරෙහි දු ශීල ප්‍රඥා හෙයින් ජය (කෙලෙසුන් දිනීම) වේ යයි.

මෙසේ ... පුණ්ණ ස්ථවිරයන් වහන්සේ ...

පුණ්ණ ස්ථවිරගාථා සි.

## සප්තම වර්ගය සි.

උද්දානය:

වප්ප ස්ථවිර යැ, වජ්ජිපුත්‍ර ස්ථවිර යැ, පක්ඛ ස්ථවිර යැ, විමල ස්ථවිර යැ, කොණ්ඩඤ්ඤ ස්ථවිර යැ, උක්ඛෙපකටවච්ඡ ස්ථවිර යැ, මෙසිය ස්ථවිර යැ, එකධම්මසවණීය ස්ථවිර යැ, එකුදානිය ස්ථවිර යැ, ඡන්න ස්ථවිර යැ, පුණ්ණ ස්ථවිර යැ සි සත් වැනි වර්ගයෙහි තෙරවරු දස දෙනෙකි.

1. 8. 1

71. සුසුඛුමනිපුණත්ථදස්සිනා මතිකුසලෙන නිවාතවුත්තිනා
සංසෙවිත වුද්ධසීලිනා[1] නිබ්බානං න හි තෙන දුල්ලභ’න්ති.

ඉත්ථං සුදං ආයස්මා වච්ඡපාලො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**වච්ඡපාලත්ථෙරගාථා.**

1. 8 2.

72. යථා කළීරො සුසු වඩ්ඪිතග්ගො
දුන්නික්ඛමො හොති පසාඛජාතො
එවං අහං හරියායානීතාය
අනුමඤ්ඤ මං පබ්බජිතොම්හි දානී’ති.

ඉත්ථං සුදං ආයස්මා ආතුමො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**ආතුමත්ථෙරගාථා.**

1. 8. 3

73. ජිණ්ණං ච දිස්වා දුඛිතං ච[2] බ්‍යාධිතං
මතං ච දිස්වා ගතමායුසඞ්ඛයං
තතො අහං නික්ඛමිතූන පබ්බජිං
පහාය කාමානි මනොරමානී’ති.

ඉත්ථං සුදං ආයස්මා මාණවො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**මාණවත්ථෙරගාථා**

1. 8. 4

74. කාමච්ඡන්දො ච බ්‍යාපාදො ථීනමිද්ධං ච භික්ඛුනො
උද්ධච්චං විචිකිච්ඡා ච සබ්බසො’ව න විජ්ජතී’ති.

ඉත්ථං සුදං ආයස්මා සුයාමො[3] ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**සුයාමත්ථෙරගාථා.**

1. 8. 5

75. සාධු සුවිහිතාන දස්සනං කඞ්ඛා ඡිජ්ජති බුද්ධි වඩ්ඪති
බාලම්පි කරොන්ති පණ්ඩිතං තස්මා සාධු සතං සමාගමො’ති.

ඉත්ථං සුදං ආයස්මා සුසාරදො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**සුසාරදත්ථෙරගාථා**

1. 8. 6

76. උප්පතන්තෙසු නිපතෙ නිපතන්තෙසු උප්පතෙ
වසෙ අවසමානෙසු රමමානෙසු නො රමෙ’ති.

ඉත්ථං සුදං ආයස්මා පියඤ්ජහො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**පියඤ්ජහත්ථෙරගාථා.**

---

1 සංසෙවිතවුද්ධසීලිනා - PTS. 2 දුක්ඛිතඤ්ච - PTS.
3. සුයාමනො - සිමු 1, 2, PTS

**1. 8. 1**

71. ඉතා සියුම් වූ (සත්‍යප්‍රතීත්‍යසමුත්පාදාදි) නිපුණ වූ අර්ථයන් දක්නා සුළු ප්‍රඥායෙන් දක්‍ෂ වූ යටත් පැවැතුම් ඇති මොනොවට සෙවුනාලද වෘද්ධශීලීන් ඇති ඔහු විසින් නිර්වාණය දුර්ලභ්‍ය නො වේ මැ යි.

මෙසේ ... වජ්ජපාල ස්ථවිරයන් වහන්සේ ...

**වජ්ජපාල ස්ථවිරගාථා යි.**

**1. 8. 2**

72. යම්සේ හුණකිළිලක් වැඩුණු සාඛා ඇත්තේ හටගත් ප්‍රසාඛා ඇත්තේ (පඳුරින්) බැහැර කළ නො හැකි වේ ද, එසෙයින් මම ගෙන එනලද බිරිඳගෙන් බැහැර නො කළ හැක්කෙම් වෙමි, මම දැන් පැවිදි වූයෙමි, මැණියෙනි, එය අනුදත මැනැවැ යි.

මෙසේ ... ආතුම ස්ථවිරයන් වහන්සේ ...

**ආතුම ස්ථවිරගාථා යි.**

**1. 8. 3**

73. ජරපත් වූවකු ද දැක දුක්පත් වූ ගිලනකු ද ගිලිහුණු ආයු ඇති මළ එකකු ද දැක එහෙයින් මම සිත්කලු වූ පස්කම්සුව හැරපියා ගිහිගෙන් නික්ම පැවිදි වීමි.

මෙසේ ... මාණව ස්ථවිරයන් වහන්සේ ...

**මාණව ස්ථවිරගාථා යි.**

**1. 8. 4**

74. බාහිතපාපී මහණහුට කාමච්ඡන්දය ද ව්‍යාපාදය ද ථීනමිද්ධය ද උද්ධච්චකුක්කුච්චය ද විචිකිච්ඡාව ද සර්වප්‍රකාරයෙන් මැ නැත්තේ ය යි.

මෙසේ ... සුයාම ස්ථවිරයන් වහන්සේ ...

**සුයාම ස්ථවිරගාථා යි.**

**1. 8. 5**

75. (ශීලාදි ගුණයෙන්) මොනොවට පිහිටුවනලද සිත් ඇතියන් ගේ දර්ශනය මැනැවි. යම් හෙයකින් සැක සිඳේ ද නුවණ වැඩේ ද බාලයකු පවා පණ්ඩිතයකු කෙරේ ද එහෙයින් සත්පුරුෂයන් ගේ සමාගමය උතුම් වේ යයි.

මෙසේ .. සුසාරද ස්ථවිරයන් වහන්සේ ...

**සුසාරද ස්ථවිරගාථා යි.**

**1. 8. 6**

76. (සත්ත්වයන් මානාදීන්) නැඟී සිටුනා කල්හි (තෙමේ) බැසැ සිටුනේ යැ, (සත්ත්වයන් ගුණයෙන් හෝ සමථවිදර්ශනාධර්මයෙන්) බැසැ සිටුනා කල්හි තෙමේ නැඟී සිටුනේ යැ, නොහොත් (කෙලෙසුන්) නැඟී සිටුනා කල්හි (අනුරූප ප්‍රත්‍යවේක්‍ෂණයෙකින්) විෂ්කම්භණය කරන්නේ යැ, (සමථවිදර්ශනාධර්මයන්) බැසැ සිටුනා කල්හි නඟාලන්නේ යැ, (සත්ත්වයන්) බඹසර නො වස්නා කල්හි (තෙමේ) වස්නේ යැ, (සත්ත්වයන් පස්කම්ගුණයෙහි ඇලෙන කල්හි (තෙමේ) නො ඇලෙන්නේ ය යි.

මෙසේ ... පියඤ්ජහ ස්ථවිරයන් වහන්සේ ...

**පියඤ්ජහ ස්ථවිරගාථා යි.**

## 1. 8. 7

77. ඉදං පුරෙ චිත්තමචාරි චාරිකං
යෙනිච්ඡකං යත්ථකාමං යථාසුඛං
තදජ්ජහං නිග්ගහෙස්සාමි[1] යොනිසො
හත්ථිප්පභින්නං විය අඞ්කුසග්ගහො’ති.

ඉත්ථං සුදං ආයස්මා හත්ථාරොහපුත්තො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**හත්ථාරොහපුත්තත්ථෙරගාථා.**

## 1. 8. 8

78. අනෙකජාතිසංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං
තස්ස මෙ දුක්ඛජාතස්ස දුක්ඛක්ඛන්ධො අපරද්ධො’ති.

ඉත්ථං සුදං ආයස්මා මෙණ්ඩසිරො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**මෙණ්ඩසිරත්ථෙරගාථා.**

## 1. 8. 9

79. සබ්බො රාගො පහීනො මෙ සබ්බො දොසො සමූහතො
සබ්බො මෙ විගතො මොහො සීතිභූතොස්මි නිබ්බුතො’ති.

ඉත්ථං සුදං ආයස්මා රක්ඛිතො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**රක්ඛිතත්ථෙරගාථා.**

## 1. 8. 10

80. යං මයා පකතං කම්මං අප්පං වා යදි වා බහුං[2]
සබ්බමෙතං පරික්ඛීණං නත්ථි දානි පුනබ්භවො’ති.

ඉත්ථං සුදං ආයස්මා උග්ගො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**උග්ගත්ථෙරගාථා**

## අට්ඨමො වග්ගො

**තස්සුද්දානං:**

වච්ඡපාලො ච යො ථෙරො ආතුමො මාණවො ඉසි
සුයාමො ච සුසාරදො ථෙරො යො ච පියඤ්ජහො
ආරොහපුත්තො මෙණ්ඩසිරො රක්ඛිතො උග්ගසව්හයො’ති

---

1 නිග්ගහිස්සාමි - PTS.
2. බහු -PTS.

1. 8. 7

77. පෙර මා ගේ මේ සිත රිසි‍සෙයින් රිසි තැනෙක‍ා සුවසේ හැසුරුණේ යැ, අද මම් ඒ සිත අකුසු ගත්තකු මතැතක්හු සෙයින් නුවණින් නිගත්නෙම් යි.

මෙසේ ... හත්ථාරොහකපුත්ත ස්ථවිරයන් වහන්සේ ...

හත්ථාරොහකපුත්ත ස්ථවිරගාථා යි.

1. 8. 8

78. (සසරවට) නවත්නා නුවණ නො ලබත්නෙම් නොයෙක් ද සියදහස් ගණන් කල් ඇවිද්දෙමි, භවගත දුක් ඇති ඒ මා ගේ දුක්රැස (රහත්මගින්) නටුයේ වේ ය යි.

මෙසේ ... මෙණ්ඩසිර ස්ථවිරයන් වහන්සේ ...

මෙණ්ඩසිර ස්ථවිරගාථා යි.

1. 8. 9

79. මා ගේ සියලු රාගය ප්‍රහීණ යැ සියලු ද්වේෂය නටුයේ යැ, මා ගේ සියලු මොහය පහ වැ ගියේ යැ, නිවුණෙම් සිහිල් බවට පැමිණියෙම් වෙමි.

මෙසේ ... රක්ඛිත ස්ථවිරයන් වහන්සේ ...

රක්ඛිත ස්ථවිරගාථා යි.

1. 8. 10

80. මා විසින් මඳ වූ හෝ බොහෝ වූ හෝ යම් කර්මයක් කරනලද නම් තෙල සියල්ල ක්‍ෂය වූයේ යැ, දැන් යළි පුනර්භවයෙක් නැතැ යි.

මෙසේ .. උග්ග ස්ථවිරයන් වහන්සේ ...

උග්ග ස්ථවිරගාථා යි.

## අෂ්ටම වර්ගය යි.

උද්දානය:

වච්ඡපාල ස්ථවිර යැ, ආතුම ස්ථවිර යැ, මාණව ස්ථවිර යැ, සුයාම ස්ථවිර යැ, සුසාරද ස්ථවිර යැ, පියඤ්ජහ ස්ථවිර යැ, ආරොහපුත්ත ස්ථවිර යැ, මෙණ්ඩසිර ස්ථවිර යැ, රක්ඛිත ස්ථවිර යැ, උග්ග ස්ථවිර යැ යි අට වැනි වගැ තෙරවරු දස දෙනෙකි.

### 1. 9. 1

81. යං මයා පකතං පාපං පුබ්බෙ අඤ්ඤාසු ජාතිසු
ඉධෙව තං වෙදනීයං වත්ථු අඤ්ඤං න විජ්ජතී'ති.

ඉත්ථං සුදං ආයස්මා සමිතිගුත්තො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**සමිතිගුත්තත්ථෙරගාථා**

### 1. 9. 2

82. යෙන යෙන සුභික්ඛානි සිවානි අභයානි ච
තෙන පුත්තක ගච්ඡස්සු මා සොකාපහතො භවා'ති.

ඉත්ථං සුදං ආයස්මා කස්සපො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**කස්සපත්ථෙරගාථා.**

### 1. 9. 3

83. සීහප්පමත්තො විහර රත්තින්දිවමතන්දිතො
භාවෙහි කුසලං ධම්මං ජහ සීඝං සමුස්සයන්ති.

ඉත්ථං සුදං ආයස්මා සීහො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**සීහත්ථෙරගාථා.**

### 1. 9. 4

84. සබ්බරත්තිං සුපිත්වාන දිවා සඞ්ගණිකෙ රතො,
කුදස්සු[1] නාම දුම්මෙධො දුක්ඛස්සන්තං කරිස්සති'ති.

ඉත්ථං සුදං ආයස්මා නීතො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**නීතත්ථෙරගාථා.**

### 1. 9. 5

85. චිත්තනිමිත්තස්ස කොවිදො පවිවෙකරසං විජානිය,
ඣායං නිපකො පතිස්සතො අධිගච්ඡෙය්‍ය සුඛං නිරාමිසන්ති.

ඉත්ථං සුදං ආයස්මා සුනාගො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**සුනාගත්ථෙරගාථා.**

### 1. 9. 6

86. ඉතො බහිද්ධා පුථු අඤ්ඤවාදිනං
මග්ගො න නිබ්බානගමො යථා අයං,
ඉතිස්සු සඞ්ඝං භගවානුසාසති
සත්ථා සයං පාණිතලෙව දස්සය'න්ති.

ඉත්ථං සුදං ආයස්මා නාගිතො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**නාගිතත්ථෙරගාථා**

---

1. කුදූස්සු - සං

## 1. 9. 1

81. පෙර අන් ජාතිවල මා විසින් යම් පව්කමෙක් කරනලද නම් ඒ කම්විපාකය මේ අත්බැව්හි මැ වින්දයුතු වෙයි, අන් කඳපබඳෙක් නැති (එහෙයිනි) යි.

මෙසේ ... සමිතිගුත්ත ස්ථවිරයන් වහන්සේ ...

### සමිතිගුත්ත ස්ථවිරගාථා යි

## 1 9. 2

82. යම් යම් දිශාභාගයෙක්හි රට සුභික්‍ෂ ද ක්‍ෂෙම ද නිර්භය ද පුහුණුවෙති, එතැන්හි යව, (අන් තැන්හි නොයව්) නාගමක් නොමින් පෙළෙව යි.

මෙසේ ... කස්සප ස්ථවිරයන් වහන්සේ ..

### කස්සප ස්ථවිරගාථා යි.

## 1. 9. 3

83. එම්බා සීහය, අප්‍රමත්ත (සතිසම්පජඤ්ඤ ඇති) වැ වාස කරා දවරැය නො කුසීත වැ කුසල්දහම් වඩව, ආත්මභාවය වහ, දුරුකරව යි.

මෙසේ ... සීහ ස්ථවිරයන් වහන්සේ ...

### සීහ ස්ථවිරගාථා යි.

## 1. 9. 4

84. මුළුරැ නිදසිට දහවල් ගණසඞ්ගණිකායෙහි ඇලුණු දුෂ්ප්‍රාඥ කවරදු නම් සසරදුක් කෙළවර කරන්නේ දැයි.

මෙසේ ... නිත ස්ථවිරයන් වහන්සේ ...

### නිත ස්ථවිරගාථා යි

## 1. 9. 5

85. භාවනා චිත්තයා ගේ නිමිත්තග්‍රහණයෙහි දක්‍ෂ වූ ප්‍රවිවේකරසය වෙසෙසින් දන ධ්‍යාන කරන පාරිහාරික නුවණ ඇති එළඹැ සිටි සිහි ඇති මහණ නිරාමිසසුඛය ලබන්නේ ය යි.

මෙසේ .. සුනාග ස්ථවිරයන් වහන්සේ ...

### සුනාග ස්ථවිරගාථා යි.

## 1. 9. 6

86. මේ නිර්වාණගාමීමාර්ගය යම්සේ වේ ද එබඳු මාර්ගයෙක් මෙයින් බැහැර වෙන් වෙන් රහත් බැව් කියන සුල්ලන් (නානාතීර්ථකයන්) ට නැතැ යි භාග්‍යවත් ශාස්තෘන් වහන්සේ තමන් වහන්සේ අත්ලෙහි තුබූවක් සෙයින් දක්වමින් භික්‍ෂුසඞ්ඝයාට අනුශාසනා කරන සේකැයි

මෙසේ .. නාගිත ස්ථවිරයන් වහන්සේ ...

### නාගිත ස්ථවිරගාථා යි.

### 1. 9. 7

87. ඛන්ධා දිට්ඨා යථාභූතං භවා සබ්බෙ පදාලිතා
වික්ඛීණො ජාතිසංසාරො නත්ථි දානි පුනබ්භවො'ති.

ඉත්ථං සුදං ආයස්මා පවිට්ඨො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**පවිට්ඨත්ථෙරගාථා**

### 1. 9. 8

88. අසක්ඛිං වත අත්තානං උද්ධාතුං උදකා ජලං
වුය්හමානො මහොඝෙව සච්චානි පටිවිජ්ඣහ'න්ති.

ඉත්ථං සුදං ආයස්මා අජ්ජුනො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**අජ්ජුනත්ථෙරගාථා**

### 1 9. 9

89. උත්තිණ්ණා පඞ්කපලිපා පාතාලා පරිවජ්ජිතා,
මුත්තා ඔඝා ච ගන්ථා ච සබ්බෙ මානා විසංහතා'ති.

ඉත්ථං සුදං ආයස්මා දෙවසභො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**පඨමදෙවසභත්ථෙරගාථා**

### 1. 9. 10

90. පඤ්චක්ඛන්ධා පරිඤ්ඤාතා තිට්ඨන්ති ඡින්නමූලකා,
වික්ඛීණො ජාතිසංසාරො නත්ථි දානි පුනබ්භවො'ති.

ඉත්ථං සුදං ආයස්මා සාමිදත්තො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**සාමිදත්තත්ථෙරගාථා**

## නවමො වග්ගො

**තස්සුද්දානං:**

ථෙරො සම්භූතගුත්තො ච කස්සපො සීහසව්හයො.
නීතො සුනාගො නාගිතො පවිට්ඨො අජ්ජුනො ඉසි,
දෙවසභො ච යො ථෙරො සාමිදත්තො මහබ්බලො'ති.

1. 9. 7

87. පඤ්චස්කන්ධයෝ තත්වූ පරිද්දෙන් දක්නාලදහ, සියලු භවයෝ (මාර්ගඥානයෙන්) පලනලදහ, ජාති සඞ්ඛ්‍යාත සංසාරය වෙසෙසින් ක්‍ෂය කරනලද යෑ, දැන් පුනර්භවයෙක් නැතැ යි.

මෙසේ .. පවිට්ඨ ස්ථවිරයන් වහන්සේ ...

පවිට්ඨ ස්ථවිරගාථා යි.

1. 9. 8

88. මහවතුරෙහි ඉල්පීයනුවකු සෙයින් තමා සසර නමැති දිය-පහරින් තිවන් නමැති ගොඩබිමැ නගාසිටුවන්නට ඒකාන්තයෙන් පොහොසත් වීමි. (කුමක් හෙයින යත් ) මම සිව්සස් පිළිවිදැ දැකීම් ද (එහෙයිනි) යි,

මෙසේ .. අජ්ජුන ස්ථවිරයන් වහන්සේ ...

අජ්ජුන ස්ථවිරගාථා යි

1 9. 9

89. පඞ්ක (මඩ) පලිප (මහමඩ) සඞ්ඛ්‍යාත කාමරාගච්ඡන්දරාගයෝ, තරණය කරනලදහ, පාතාල සඞ්ඛ්‍යාත මිථ්‍යාදෘෂ්ටීහු දුරු කරන ලදහ, (කාමාදි ඔඝයෙන් ද (අභිධ්‍යාදි) කායග්‍රන්ථයෙන් ද මිදුණෙමි වෙමි, සියලු මානයෝ මුලුපුත් කරනලදහ යි.

මෙසේ .. දෙවසභ ස්ථවිරයන් වහන්සේ ..

දෙවසභ ස්ථවිරගාථා යි

1 9. 10

90 (මා විසින්) පඤ්චස්කන්ධයෝ පිරිසිඳැ දන්නාලද්දහු මුල්සුන් වැ සිටිති, ජාති සඞ්ඛ්‍යාත සංසාරය වෙසෙසින් ක්‍ෂය කරනලද, දැන් පුනර්භවයෙක් නැතැ යි.

මෙසේ ... සාමිදත්ත ස්ථවිරයන් වහන්සේ ...

සාමිදත්ත ස්ථවිරගාථා යි.

## නවම වර්ගය යි.

උද්දානය:

සමිතිගුත්ත ස්ථවිර යෑ, කස්සප ස්ථවිර යෑ, සීහ ස්ථවිර යෑ, නීත ස්ථවිර යෑ, සුනාග ස්ථවිර යෑ, නාගිත ස්ථවිර ය., පවිට්ඨ ස්ථවිර යෑ, අජ්ජුන ස්ථවිර යෑ, දෙවසභ ස්ථවිර යෑ, මහබලැති සාමිදත්තස්ථවිර යෑ යි නව වැනි වර්ගයෙහි තෙරවරු දස දෙනෙකි.

## 1. 10. 1

91. න තථා’ මතං සතරසං සුධන්නං යං මයජ්ජ පරිභුත්තං,
අපරිමිත දස්සිනා ගොතමෙන බුද්ධෙන දෙසිතො ධම්මො’ති.

ඉත්ථං සුදං ආයස්මා පරිපුණ්ණකො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**පරිපුණ්ණකථෙරගාථා.**

## 1. 10. 2

92. යස්සාසවා පරික්ඛීණා ආහාරෙ ච අනිස්සිතො,
සුඤ්ඤතා අනිමිත්තො ච විමොක්ඛො යස්ස ගොචරො,
ආකාසෙව සකුන්තානං පදං තස්ස දුරන්නයන්ති.

ඉත්ථං සුදං ආයස්මා විජයො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**විජයථෙරගාථා.**

## 1. 10. 3

93. දුක්ඛා කාමා එරක න සුඛා කාමා එරක,
යො කාමෙ කාමයති දුක්ඛං සො කාමයති එරක,
යො කාමෙ න කාමයති එරක දුක්ඛං සො න කාමයති එරකා’ති.

ඉත්ථං සුදං ආයස්මා එරකො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**එරකථෙරගාථා**

## 1. 10. 4

94. නමො හි තස්ස භගවතො සක්‍යපුත්තස්ස සිරීමතො,
තෙනායං අග්ගප්පත්තෙන අග්ගො ධම්මො සුදෙසිතො’ති.

ඉත්ථං සුදං ආයස්මා මෙත්තජි ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**මෙත්තජිථෙරගාථා**

## 1 10. 5

95. අන්ධොහං හතනෙත්තොස්මි කන්තාරද්ධානපක්කන්තො,[1]
සයමානො’ පි ගච්ඡිස්සං න සහායෙන පාපෙනා’ති.

ඉත්ථං සුදං ආයස්මා චක්ඛුපාලො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**චක්ඛුපාලථෙරගාථා.**

## 1. 10. 6

96. එකපුප්ඵං චජිත්වාන අසීතිං වස්සකොටියො,
සග්ගෙසු පරිචාරෙත්වා සෙසකෙනම්හි නිබ්බුතො’ති.

ඉත්ථං සුදං ආයස්මා ඛණ්ඩසුමනො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**ඛණ්ඩසුමණථෙරගාථා.**

---

1. පක්ඛන්දො - මජසං පක්ඛන්තො - සීමු 1, 2, PTS.

1. 10. 1

91. මා විසින් දුත් යම් අමෘතයෙක් වළඳනාලද ද, එසෙයින් සතරස මනුෂ්‍යභෝජනය ද සුධා දිව්‍යභෝජනය ද අභිමත නො වෙයි, අපරිමිත වූ ඥෙය දක්නාසුලු ගොයුම්ගොත් බුදුන් විසින් නිර්‍වාණධර්‍මය දෙසනලද්ද සි.

මෙසේ ... පරිපුණ්ණක සථවිරයන් වහන්සේ ...

පරිපුණ්ණක සථවිරගාථා සි.

1. 10. 2

92. යමක්හට (කාමාදි) ' ආස්‍රවයෝ ක්‍ෂය වූවාහු ද, යමෙකුත් ආහාරයෙහි (තෘෂ්ණාදෘෂ්ටිනිඃශ්‍රය විසින්) නො බැඳුණේ ද, යමක්හට ශූන්‍යත අනිමිත්ත (අප්‍රණිහිත) (යන ත්‍රිවිධ) විමෝක්‍ෂය ගෝචර වේ ද ඒ රහත්හු ගේ පියසටහන අහසැ සියොතුන් මග මෙන් නො දතහෙත්තේ යයි.

මෙසේ ... විජය.සථවිරයන් වහන්සෙ ...

විජය සථවිරගාථා සි.

1. 10. 3

93. ඒරකයෙනි, කාමයෝ දුඃඛයහ, ඒරකයෙනි, කාමයෝ සුඛයෝ නොවෙති, ඒරකයෙනි, යමෙක් කාමයන් කැමැති වේ නම් හෙතෙම දුක් කැමැති වෙයි, ඒරකයෙනි, යමෙක් කාමයන් නො කැමැති වේ නම් හෙතෙම දුක් නො කැමැති වේ යයි.

මෙසේ ... ඒරක සථවිරයන් වහන්සේ ...

ඒරක සථවිරගාථා සි.

1. 10. 4

94. ශ්‍රීමත් වූ ශාක්‍යපුත්‍ර වූ ඒ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර වේවා, (සියලු ගුණයෙන්) අගතැන් පැමිණි උන් වහන්සේ විසින් මේ උතුම් වූ (නව ලොවුතුරු) දහම අවිපරීත කොට දෙසනලද්දේ වේ යයි.

මෙසේ ... මෙත්තජි සථවිරයන් වහන්සේ ...

මෙත්තජි සථවිරගාථා සි.

1. 10. 5

95. මම නටනෙත් ඇත්තෙම් අන්ධ වෙමි, කතරඅදත් මඟට පැමිණි- යෙම් වෙමි, හෝනෙම් නමුදු පාපමිත්‍රයකු සමග නො යමි.

මෙසේ ... චක්ඛුපාල සථවිරයන් වහන්සේ ...

චක්ඛුපාල සථවිරගාථා සි.

1. 10. 6

96. එක් (සමන්) මලක් පුදා අසූ කෙළක් හවුරුදු සගසුව විඳැ ඒ පුණ්‍යකර්‍මයා ගේ ශේෂයෙන් පිරිනිවියෙම් වෙමි.

මෙසේ ... ඛණ්ඩසුමන සථවිරයන් වහන්සේ ...

ඛණ්ඩසුමන සථවිරගාථා සි.

### 1. 10. 7

97. හිත්වා සතපලං කංසං සොවණ්ණං සතරාජිකං,
අග්ගහිං මත්තිකාපත්තං ඉදං දුතියාභිසෙචන'න්ති.

ඉත්ථං සුදං ආයස්මා තිස්සො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

තිස්සත්ථෙරගාථා.

### 1. 10. 8

98. රූපං දිස්වා සති මුට්ඨා පියනිමිත්තං මනසිකරොතො,
සාරත්තචිත්තො වෙදෙති තං ච අජ්ඣොස තිට්ඨති,
තස්ස වඩ්ඪන්ති ආසවා භවමූලා භවගාමිනො'ති.[1]

ඉත්ථං සුදං ආයස්මා අභයො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

අභයත්ථෙරගාථා.

### 1. 10. 9

99. සද්දං සුත්වා සති මුට්ඨා පියනිමිත්තං මනසිකරොතො,
සාරත්තචිත්තො වෙදෙති තං ච අජ්ඣොස තිට්ඨති,
තස්ස වඩ්ඪන්ති ආසවා සංසාරමූපගාමිනො'ති.[2]

ඉත්ථං සුදං ආයස්මා උත්තියො ථෙරො ගාථං අභාසිත්ථා'ති

උත්තියත්ථෙරගාථා.

### 1 10. 10.

100. සම්මප්පධානසම්පන්නො සතිපට්ඨානගොචරො,
විමුත්තිකුසුමසඤ්ඡන්නො පරිනිබ්බිස්සත්‍යනාසවො'ති.

ඉත්ථං සුදං ආයස්මා දෙවසභො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

දෙවසභත්ථෙරගාථා.

## දසමො වග්ගො.

තස්සුද්දානං

පරිපුණ්ණකො ච විජයො එරකො මෙත්තජී මුනි,
චක්ඛුපාලො ඛණ්ඩසුමනො තිස්සො ච අභයො[3] තථා,
උත්තියො ච මහාපඤ්ඤො ථෙරො දෙවසභො පි චා'ති.

---

1. භවමූලොපගාමිනො - සීමු.
2. සංසාරං උපගාමිනො - සීමු. 1, 2. 3. තිස්සො අභයො ච - PTS.

## 1. 10. 7

97. සියක් පලමක් අගනා නොයෙක් රූපලේඛා ඇති රත්මුවා තලිය හැරදමා මැටිමුවා පයක් ගතිමි, මේ මා ගේ දෙ වැනි අභිෂේකය යි.

**මෙසේ ... තිස්ස ස්ථවිරයන් වහන්සේ ...**

**තිස්ස ස්ථවිරගාථා යි.**

## 1. 10. 8

98. ප්‍රියනිමිත්ත මෙනෙහි කරනුවක්හට රූ අරමුණ දක සිහි මුළා වී ද, ඇලුණු සිතැති හෙතෙම ඒ රූපාලම්බනය විඳගන්නේ වේ ද, එහි බැසගෙන සිටුනේ ත් වේ ද, ඔහුට භවයට මුල් වූ භවගාමී වූ ආස්‍රවයෝ වැඩෙත් යයි.

**මෙසේ ... අභය ස්ථවිරයන් වහන්සේ ...**

**අභය ස්ථවිරගාථා යි.**

## 1. 10. 9

99. ප්‍රියනිමිත්ත මෙනෙහි කරනුවක්හට ශබ්දාලම්බනයක් අසා සිහි මුළා වී ද, ඇලුණු සිතැති හෙතෙම ඒ ශබ්දාලම්බනය විඳගන්නේ වේ ද, එහි බැසගෙන සිටුනේ ත් වේ ද, ඔහුට සසරට පමුණුවන ආස්‍රවයෝ වැඩෙත් යයි.

**මෙසේ ... උත්තිය ස්ථවිරයන් වහන්සේ ...**

**උත්තිය ස්ථවිරගාථා යි.**

## 1 10. 10.

100 සම්‍යක් ප්‍රධන් වීර්‍යයෙන් යුක්ත වූ සිවටන් අරමුණු කොට ඇති විමුක්ති නමැති මලින් සැදුණු මහණ ආස්‍රව රහිත ව පිරිනිවෙන්නේ යි.

**මෙසේ ... දේවසභ ස්ථවිරයන් වහන්සේ ...**

**දේවසභ ස්ථවිරගාථා යි.**

# දස වැනි වග යි.

**උද්දානය:**

පරිපුණ්ණක ස්ථවිර ය, විජය ස්ථවිර ය, එරක ස්ථවිර ය, මෙත්තජි ස්ථවිර ය, චක්ඛුපාල ස්ථවිර ය, ඛණ්ඩසුමන ස්ථවිර ය, තිස්ස ස්ථවිර ය, අභය ස්ථවිර ය, මහාප්‍රාඥ වූ උත්තිය ස්ථවිර ය, දෙවසභ ස්ථවිර ය යි දස වැනි වගෙහි තෙරවරු දස දෙනෙකි.

### 1. 11. 1

101. හිත්වා ගිහිත්තං අනවොසිතත්තො
මුඛනඞ්ගලී ඔදරිකො කුසීතො,
මහාවරාහො’ව නිවාපපුට්ඨො
පුනප්පුනං ගබ්භමුපෙති මන්දො.

ඉත්ථං සුදං ආයස්මා බෙලට්ඨානිකො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**බෙලට්ඨානිකත්ථෙරගාථා**

### 1. 11. 2

102. මානෙන වඤ්චිතාසෙ සඞ්ඛාරෙසු සඞ්කිලිස්සමානාසෙ,[1]
ලාභාලාභෙන මථිතා සමාධිං නාධිගච්ඡන්තී’ති.

ඉත්ථං සුදං ආයස්මා සෙතුච්ඡො ථෙරො ගාථං අභාසිත්ථා’ති

**සෙතුච්ඡත්ථෙරගාථා.**

### 1. 11. 3

103. නාහං එතෙන අත්ථිකො සුඛිතො ධම්මරසෙන තප්පිතො,
පිත්වාන[2] රසග්ගමුත්තමං න ච කාහාමි විසෙන සන්ථව’න්ති.

ඉත්ථං සුදං ආයස්මා බන්ධුරො[3] ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**බන්ධුරත්ථෙරගාථා.**

### 1. 11. 4

104. ලහුකො වත මෙ කායො ඵුට්ඨො ච පීතිසුඛෙන විපුලෙන.
තූලමිව එරිතං මාලුතෙන පිලවතීව මෙ කායො’ති.

ඉත්ථං සුදං ආයස්මා ඛිතකො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**ඛිතකත්ථෙරගාථා.**

### 1. 11. 5

105. උක්කණ්ඨිතොපි න වසෙ රමමානොපි පක්කමෙ,
නත්වෙවානත්ථසංහිතං වසෙ වාසං විචක්ඛණො’ති.

ඉත්ථං සුදං ආයස්මා මලිතවම්භො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**මලිතවම්භත්ථෙරගාථා.**

### 1. 11. 6.

106. සතලිඞ්ගස්ස අත්ථස්ස සතලක්ඛණධාරිනො,
එකඞ්ගදස්සී දුම්මෙධො සතදස්සී ච පණ්ඩිතො’ති.

ඉත්ථං සුදං ආයස්මා සුහෙමන්තො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**සුහෙමන්තත්ථෙරගාථා.**

---

1. සඞ්කිලිස්සමානසෙ - මජසං. 2. පිත්වා - සත්චි, 3 බන්ධනො - මජසං.

## 1. 11. 1

101. ගිහි බව හැරපියා වැසෑ නිම කල ආයජීවාස නැති (ආත්ම ධර්‍මයෙහි) මුව මැ නගුල කොට ඇති උදරපූරණයෙහි තියැලුණු කුසීත වූ අඥාන තෙමේ (කුඩු ආදි) හුරුබකින් පුස්නාලද මහහූරකු මෙන් පුනපුනා ගර්භවාසයට පැමිණේ යයි.

මෙසේ ... බෙලට්ඨානික ස්ථවිරයන් වහන්සේ ...

**බෙලට්ඨානික ස්ථවිර ගාථා යි.**

## 1. 11. 2

102. (නවවිධ) මානයෙන් නුළුවාහු සඞ්ඛතධර්‍මයන් විෂයෙහි (තෘෂ්ණාදි) විසින් කෙලෙසෙන්නාහු ලාභාලාභ හෙයින් මඩනාලද්දාහු චිත්තසමාධිය නො ලබත් යයි.

මෙසේ ... සෙතුච්ඡ ස්ථවිරයන් වහන්සේ ...

**සෙතුච්ඡ ස්ථවිර ගාථා යි**

## 1. 11. 3

103. මම තෙල ආමිසරසයෙන් ප්‍රයෝජන ඇත්තෙම් නො වෙමි, ධර්‍ම-රසයෙන් සුඛිතයෙමි, සුහිතයෙමි, උතුම් වූ අග්‍ර (දහම්) රසය පානය කොට (පස්කම්සුව) විෂය සමග සන්ථවය නො කරන්නෙමි

මෙසේ ...බන්ධුර ස්ථවිරයන් වහන්සේ ...

**බන්ධුර ස්ථවිරගාථා යි**

## 1. 11. 4

104. මා ගේ සිරුර එකන්තෙන් ලුහු වූයේ වෙයි, මහත් වූ ප්‍රීති-සුඛයෙන් පහස්නාලද්දේත් වෙයි, මා ගේ සිරුර පුළුගින් නගන ලද පුළුන්රොදක් සෙයින් (අහස්හි) පාවේ යයි.

මෙසේ ... ඛිතක ස්ථවිරයන් වහන්සේ ...

**ඛිතක ස්ථවිර ගාථා යි.**

## 1. 11. 5

105. මම උක්කටලියෙම් හමුදු වෙසෙමි, බැහැර නො යෙමි, ඇලෙනුයෙම් නමුදු පියායෙමි, නො වෙසෙමි, තුවණැති මහණ අනර්‍ථ එළවන වාසය නො කරන්නේ මැ යි.

මෙසේ ... මලිතවම්භ ස්ථවිරයන් වහන්සේ ...

**මලිතවම්භ ස්ථවිරගාථා යි.**

## 1. 11. 6

106. නො එක් ලිඞ්ග ඇති නො එක් ලක්ෂණ ධරන අර්‍ථයා ගේ එක් අඞ්ගයක් දක්නාසුලු වූයේ දුෂ්ප්‍රාඥ වෙයි. නො එක් අඞ්ග (සියල්ල) දක්නාසුලු වූයේ මැ ප්‍රාඥ වේ යයි

මෙසේ ... සුහෙමන්ත ස්ථවිරයන් වහන්සේ ...

**සුහෙමන්ත ස්ථවිර ගාථා යි:**

## 1. 11. 7

107. පබ්බජිං තුලසිත්වාන අගාරස්මානගාරියං,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසන'න්ති.

ඉත්ථං සුදං ආයස්මා ධම්මසවො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**ධම්මසවත්ථෙරගාථා.**

## 1. 11. 8

108. ස වීසංවස්සසතිකො[1] පබ්බජිං අනගාරියං,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසන'න්ති.

ඉත්ථං සුදං ආයස්මා ධම්මසවපිතුත්ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**ධම්මසව පිතුත්ථෙරගාථා**

## 1. 11. 9

109. න නූනායං පරමහිතානුකම්පිනො
රහොගතො අනුවිගණෙති සාසනං,
තථාහයං විහරති පාකතින්ද්‍රියො
මිගී යථා තරුණජාතිකා වනෙ'ති.

ඉත්ථං සුදං ආයස්මා සඞ්ඝරක්ඛිතො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**සඞ්ඝරක්ඛිතත්ථෙරගාථා.**

## 1. 11. 10

110. නගා නගග්ගෙසු සුසංවිරූළ්හා
උදග්ගමෙඝෙන නවෙන සිත්තා
විවෙකකාමස්ස අරඤ්ඤසඤ්ඤිනො
ජනෙති භිය්‍යො උසභස්ස කල්‍යත'න්ති.

ඉත්ථං සුදං ආයස්මා උසභො ථෙරො ගාථං අභාසිත්ථා'ති.

**උසභත්ථෙරගාථා.**

## එකාදසමො වග්ගො

**තස්සුද්දානං:**

බෙලට්ඨානිකසෙතුච්ඡා බන්ධුරො ඛිතකො ඉසි,
මලිතවම්භො සුහෙමන්තො ධම්මසවො ධම්මසවපිතා,
සඞ්ඝරක්ඛිතත්ථෙරො ච උසභො ච මහාමුනී'ති.

## 1. 11. 7

107. (කාමයෙහි ආදීනව හා නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස්) තුලනය කොට ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වීමි, (ඒ මා විසින්) ත්‍රිවිද්‍යා ලබනලදී. බුදුසසුන් කරන ලද යි.

මෙසේ ... ධම්මසව ස්ථවිරයන් වහන්සේ ...

**ධම්මසව ස්ථවිරගාථා යි.**

## 1. 11. 8

108. ඒ මම (ජාතියෙන්) එක්සියවිසිවස් ඇත්තෙම සස්නෙහි පැවිදි වීමි. (මා විසින්) ත්‍රිවිද්‍යා ලබනලදී, බුදුසසුන් කරනලද යි.

මෙසේ ... ධම්මසවපිතු ස්ථවිරයන් වහන්සේ ...

**ධම්මසවපිතු ස්ථවිරගාථා යි.**

## 1. 11. 9

109. මේ මහණ රහසිගත වූ (කායවිවේකයුක්ත වූ) පරමහිතානුකම්පී භාග්‍යවත්හු ගේ පිළිවෙත් සසුන් නො තකා යි හැඟිමි. ඒ එසේ මැ යි. මේ තෙමේ වනයෙහි තරුණ සවභාව ඇති මුවගනක සේ පියවි ඉඳුරන් ඇති වූ වෙසේ යයි.

මෙසේ .. සඞ්ඝරක්ඛිත ස්ථවිරයන් වහන්සේ ...

**සඞ්ඝරක්ඛිත ස්ථවිරගාථා යි.**

## 1. 11. 10

110: කඳුමුදුන්හි මොනොවට වැඩුණු, වැසිකල්හි මහත් වූ අභිනව මේඝය විසින් තෙමනලද වෘක්ෂයෝ අරණ්‍යයෙහි ගිය සංඥා ඇති විවේකය කැමැති උසභහට මතුමත්තෙහි (භාවනාවට) සුදුසුබව උපදවත් යයි.

මෙසේ ... උසභ ස්ථවිරයන් වහන්සේ ...

**උසභ ස්ථවිරගාථා යි**

## එකොළොස් වැනි වග යි.

**උද්දානය:**

බෙලට්ඨානික ස්ථවිර යෑ, සෙතුච්ඡ ස්ථවිර යෑ, බන්ධුර ස්ථවිර යෑ, ඛිතක ස්ථවිර යෑ, මලිතවම්භ ස්ථවිර යෑ, සුහෙමන්ත ස්ථවිර යෑ, ධම්මසව ස්ථවිර යෑ, ධම්මසවපිතු ස්ථවිර යෑ, සඞ්ඝරක්ඛිත ස්ථවිර යෑ, උසභ ස්ථවිර යෑ යි එකොළොස් වැනි වගෙහි මහතරවරු දස දෙනෙකි.

### 1. 12. 1

111. දුප්පබ්බජ්ජං වෙ දුරධිවාසා ගෙහා
ධම්මො ගම්භීරො දුරධිගමා භොගා,
කිච්ඡා වුත්ති නො ඉතරීතරෙනෙව
යුත්තං චින්තෙතුං සතතමනිච්චත’න්ති.

ඉත්ථං සුදං ආයස්මා ජෙන්තො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**ජෙන්තත්ථෙරගාථා.**

### 1. 12. 2

112. තෙවිජ්ජොහං මහාඣායී චෙතොසමථකොවිදො
සදත්ථො මෙ අනුප්පත්තො කතං බුද්ධස්ස සාසන’න්ති

ඉත්ථං සුදං ආයස්මා වච්ඡගොත්තො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**වච්ඡගොත්තත්ථෙරගාථා.**

### 1. 12. 3

113. අච්ඡොදිකා පුථුසිලා ගොනඞ්ගුලමිගායුතා,
අම්බුසෙවාලසඤ්ඡන්නා තෙ සෙලා රමයන්ති ම’න්ති.

ඉත්ථං සුදං ආයස්මා වනවච්ඡො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**වනවච්ඡත්ථෙරගාථා.**

### 1. 12. 4

114. කායදුට්ඨුල්ලගරුනො හියමානම්හි[1] ජීවිතෙ,
සරීරසුඛගිද්ධස්ස කුතො සමණසාධුතා’ති.

ඉත්ථං සුදං ආයස්මා අධිමුත්තො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**අධිමුත්තත්ථෙරගාථා.**

### 1. 12. 5

115. එසාවහිය්‍යසෙ පබ්බතෙන බහුකුටජසල්ලකිකෙන,[2]
නෙසාදකෙන ගිරිනා යසස්සිනා පරිච්ඡදෙනා’ති.

ඉත්ථං සුදං ආයස්මා මහානාමො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**මහානාමත්ථෙරගාථා.**

### 1. 12. 6

116. ඡ ඵස්සායතනෙ හිත්වා ගුත්තද්වාරො සුසංවුතො,
අඝමූලං වමිත්වාන පත්තො මෙ ආසවක්ඛයො’ති.

ඉත්ථං සුදං ආයස්මා පාරාසරියත්ථෙරො[3] ගාථං අභාසිත්ථා’ති.

**පාරාසරියත්ථෙරගාථා.**

---

1. හිය්‍යමානම්හි - PTS. 2 සල්ලකිතෙන - ම,
3. පාරාපරිය - මජසං PTS.

### 1. 12. 1

111. ඒකාන්තයෙන් පැවිද්ද දුෂ්කර යැ, ගෘහයෝ දුෂ්කරවාස ඇත්තාහු යැ, දහම් ගැඹුරු වෙයි, භෝගයෝ දුකසේ ලැබිය-යුත්තාහ. යථාලාභ ප්‍රත්‍යයෙන් මැ අප ගේ දිවිවැටුම දුක් වෙයි, එහෙයින් නිතර අනිත්‍යය මෙනෙහි කිරීම යුතුය යි.

මෙසේ ... ජේන්ත ස්ථවිරයන් වහන්සේ ...

**ජේන්ත ස්ථවිරගාථා යි.**

### 1. 12. 2

112. මම ත්‍රිවිද්‍යා ඇත්තෙම් මහත් ධ්‍යාන ඇත්තෙම් චිත්තශමථයෙහි දක්ෂ වූයෙම් වෙමි, මා විසින් ස්වාර්ථය (අර්හත්ත්වය) ලබනලද්දේ ය, බුදුන් ගේ අවවාදය කරනලදු යි.

මෙසේ ... වච්ඡගොත්ත ස්ථවිරයන් වහන්සේ ...

**වච්ඡගොත්ත ස්ථවිරගාථා යි.**

### 1. 12. 3

113. පහන්දිය ඇති පුළුල් ගලතල ඇති ගොනඟුලන් (වඳුරන්) හා සියුපාසතුන් ගෙන් යුත් දියසෙවෙලින් ගැවැසීගත් ඒ පර්වතයෝ මා සිත් අලවත් යයි.

මෙසේ .. වනවච්ඡ ස්ථවිරයන් වහන්සේ ...

**වනවච්ඡ ස්ථවිරගාථා යි.**

### 11. 2. 4

114. දිවි ගෙවීයන කල්හි කායපොෂණයෙහි නියැලුණු ශරීරසුඛයෙහි ගිජු වූවහුට ශ්‍රමණ භාවයෙන් ලැබිය හැකි සාධුත්වය කොයින් ලැබේ ද යි.

මෙසේ ... අධිමුත්ත ස්ථවිරයන් වහන්සේ ...

**අධිමුත්ත ස්ථවිරගාථා යි.**

### 1. 12. 5

115. (එම්බා මහානාමයෙනි, කමටහන් මෙනෙහි නොකරන) තෙල තෝ බොහෝ කෙළිඳ හා ඉඳුසල්ගස් ඇති (නොඑක් රුක්ලියෙන්) හාත්පසින් වැසුණු ප්‍රසිද්ධ වූ මේ ‘නෙසාද’ නම් පර්වතයෙන් පිරිහෙන්නෙහි යයි,

මෙසේ ... මහානාම ස්ථවිරයන් වහන්සේ ...

**මහානාම ස්ථවිරගාථා යි.**

### 1. 12. 6

116. ආධ්‍යාත්මික ෂඩායතනය (එය පිළිබඳ කෙලෙස් නැසීම් විසින්) හැරපියා පියූ සදොර ඇතියෙම් මොනොවට සංවර වූයෙමි. මා විසින් සසරදුකට මුල (අවිද්‍යාව හා භවතෘෂ්ණාව) වමාරාදමා ආස්‍රවක්ෂය (අර්හත්වය) ලබනලද්දේය යයි.

මෙසේ ... පාරාසරිය ස්ථවිරයන් වහන්සේ ...

**පාරාසරිය ස්ථවිරගාථා යි.**

### 1. 12. 7

117. සුවිලිත්තො සුවසනො සබ්බාභරණභූසිතො,
තිස්සො විජ්ජා අජ්ඣගමිං කතං බුද්ධස්ස සාසන’න්ති.

ඉත්ථං සුදං ආයස්මා යසො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**යසත්ථෙරගාථා.**

### 1. 12. 8

118. අභිසත්තොව නිපතති
වයො රූපං අඤ්ඤමිව තථෙව සන්තං,
තස්සෙව සතො අවිප්පවසතො
අඤ්ඤස්සෙව සරාමි අත්තාන’න්ති.

ඉත්ථං සුදං ආයස්මා කිම්බිලො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**කිම්බිලත්ථෙරගාථා.**

### 1.. 12. 9

119. රුක්ඛමූලගහනං පසක්කිය
නිබ්බානං හදයස්මිං ඔපිය[1]
ඣාය ගොතම මා ච පමාදො[2]
කිං තෙ බිලිබිලිකා කරිස්සතී’ති.

ඉත්ථං සුදං ආයස්මා වජ්ජිපුත්තො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**වජ්ජිපුත්තත්ථෙරගාථා.**

### 1. 12. 10

120. පඤ්චක්ඛන්ධා පරිඤ්ඤාතා තිට්ඨන්ති ඡින්නමූලකා,
දුක්ඛක්ඛයො අනුප්පත්තො පත්තො මෙ ආසවක්ඛයො’ති.

ඉත්ථං සුදං ආයස්මා ඉසිදත්තො ථෙරො ගාථං අභාසිත්ථා’ති.

**ඉසිදත්තත්ථෙරගාථා.**

## වග්ගො ද්වාදසමො

**තස්සුද්දානං:**

ජෙන්තො ච වච්ඡගොත්තො ච වච්ඡො ච වනසව්හයො,[3]
අධිමුත්තො මහානාමො පාරාසරියො[4] යසො පි ච,
කිම්බිලො වජ්ජිපුත්තො ච ඉසිදත්තො මහායසො’ති.

**තත්‍රුද්දානං.**

වීසුත්තරසතං ථෙරා කතකිච්චා අනාසවා,
එකකෙව නිපාතම්හි සුසඞ්ගීතා මහෙසිහී’ති.

## එකකනිපාතො නිට්ඨිතො

1. ඔසිය - PTS. 2 පමාදෙ-බහුසු 3. වනවච්ඡකො- PTS. 4 පාරාපරියො- PTS.

### 1. 12. 7

117. මම මනා සුවඳින් අලෙව් දෙනලද්දෙමි. මහඇගි කසීසළු ඇත්දෙමි සියලු අබරණින් සැරසුණෙම් ත්‍රිවිද්‍යාව ලදිමි. (මා විසින්) බුදුන් ගේ ශාසනය කරනලද්ද යි.

මෙසේ ... යස ස්ථවිරයන් වහන්සේ ...

**යස ස්ථවිරගාථා යි.**

### 1. 12. 8

118. වයස (යෞවනය) ඇණවන ලද්දකු සෙයින් (වහා) ඇදුවැටෙයි. එසේ මැ විද්‍යමාන වූ රූපය ද අනෙකකු මෙනි. විප්‍රවාසයෙක් නැති ඒ මා ගේ මැ ආත්මය අනෙකක්හු ගේ මෙන් සිහි කෙරෙමි යයි.

මෙසේ ... කිම්බිල ස්ථවිරයන් වහන්සේ ...

**කිම්බිල ස්ථවිරගාථා යි.**

### 1. 12. 9

119. රුක්මුල්වදුලට පිවිසැ නිවන ළෙහි තබාගෙන ගෞතමයෙනි ධ්‍යාන කරව, නහමක් ප්‍රමාද වව, බිලිබිලිකා (බිලිබිලිහඬ) තට කවර අර්ථයක් සාධත්තේ ද යි.

මෙසේ ... වජ්ජිපුත්ත ස්ථවිරයන් වහන්සේ ...

**වජ්ජිපුත්ත ස්ථවිරගාථා යි.**

### 1. 12. 10

120. පඤ්චස්කන්ධයෝ (මා විසින්) පරිඥාතයහ, ඔහු මුල්සුන් වැ සිටිති, මා විසින් දුඃඛක්ෂය සඞ්ඛ්‍යාත නිවන ලබනලද, ආස්‍රවක්ෂය (අර්හත්ත්වය) ලබනලද්ද යි.

මෙසේ ... ඉසිදත්ත ස්ථවිරයන් වහන්සේ ...

**ඉසිදත්ත ස්ථවිරගාථා යි.**

## දොළොස් වැනි වග යි.

**උද්දානය:**

ජෙන්ත ස්ථවිර යැ, වච්ඡගොත්ත ස්ථවිර යැ, වනවච්ඡ ස්ථවිර යැ, අධිමුත්ත ස්ථවිර යැ, මහානාම ස්ථවිර යැ, පාරාසරිය ස්ථවිර යැ, යස ස්ථවිර යැ, කිම්බිල ස්ථවිර යැ, වජ්ජිපුත්ත ස්ථවිර යැ, ඉසිදත්ත ස්ථවිර යැ යි දොළොස් වැනි වගැ තෙරවරු දස දෙනෙකි.

කොට නිමැවූ බඹසර කිස ඇති අනාස්‍රව වූ මහර්ෂි වූ තෙරවරු එක්-සියවිසි දෙනෙක් එකක නිපාතයෙහි මැ ගාථා වදාළහ යි.

## එකකනිපාතය නිමි.

# 2. දුකනිපාතො

### 2. 1. 1

121. නත්ථි කොචි භවො නිච්චො සඞ්ඛාරා වා පි සස්සතා,
උප්පජ්ජන්ති ච තෙ ඛන්ධා චවන්ති අපරාපරං.

122. එතමාදීනවං ඤත්වා භවෙනම්හි අනත්ථිකො,
නිස්සටො සබ්බකාමෙහි පත්තො මෙ ආසවක්ඛයො'ති.

ඉත්ථං සුදං ආයස්මා උත්තරො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**උත්තරත්ථෙරගාථා.**

### 2. 1. 2

123. නයිදං අනයෙන ජීවිතං නාහාරො හදයස්ස සන්තිකො,
ආහාරට්ඨිතිකො සමුස්සයො ඉති දිස්වාන චරාමි එසනං.

124. පඞ්කොති හි නං පවෙදයුං යායං වන්දනපූජනා කුලෙසු,
සුඛුමං සබ්බං දුරුල්ලහං සක්කාරො කාපුරිසෙන දුජ්ජහො'ති.

ඉත්ථං සුදං ආයස්මා පිණ්ඩොලභාරද්වාජො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**පිණ්ඩොලභාරද්වාජත්ථෙරගාථා.**

### 2. 1. 3

125. මක්කටො පඤ්චද්වාරායං කුටිකායං පසක්කිය,
ද්වාරෙන අනුපරියෙති ඝට්ටයන්තො මුහුං මුහුං.

126. තිට්ඨ මක්කට මා ධාවි නහි තෙ තං යථා පුරෙ,
නිග්ගහීතොසි පඤ්ඤාය නෙව[1] දූරං ගමිස්සසී'ති.

ඉත්ථං සුදං ආයස්මා වල්ලියො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**වල්ලියත්ථෙරගාථා.**

---

1. නෙතො - PTS.

# 2. දුකනිපාතය

### 2. 1. 1

121. නිත්‍ය වූ කිසිදු භවයෙක් නැත, ශාශ්වත වූ සංස්කාර කෙනෙක් ද නැත. තා ගේ ස්කන්ධයෝ මතුමත්තෙහි උපදනාහු ද වෙති. ච්‍යුත වන්නාහු ද වෙත්.

122. තෙල ආදීනවය දැනැ භවයෙන් ප්‍රයෝජන නැතියෙකිම් වෙමි. සියලු වස්තුකාමක්ලේශකාමයන් කෙරෙන් දුරු වූයෙම් වෙමි. මා විසින් ආස්‍රවක්ෂය ලබනලදැ'යි.

මෙසේ ආයුෂ්මත් උත්තර ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළ සේක.

**උත්තර ස්ථවිර ගාථා යි.**

### 2. 1. 2

123. මේ ජීවිතය අන්‍යායයෙන් නො වෙයි. ආහාරය සිතට ශාන්තිය එළවන්නේ නො වෙයි. සිරුර අහර නිසා සිටුනේ වෙයි. මෙසේ දැකැ අහර සෙවීමෙහි හැසිරෙමි.

124. කුලයන්හි යම් වන්දනපූජාවක් ඇද්ද, එය බුද්ධාදීහු පඞ්කයෙක් මැ යයි දත්හ. උදුරාලිය නොහෙන සියුම් හුලෙකැයි දත්හ. (කුමක්හෙයින යත්:) සත්කාරය කුපුරුෂයා විසින් දුරලිය නො හැක්කේ යයි.

මෙසේ ආයුෂ්මත් පිණ්ඩෝලභාරද්වාජ ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළ සේක.

**පිණ්ඩෝලභාරද්වාජ ස්ථවිර ගාථා යි.**

### 2. 1. 3

125. සිත් නමැති වඳුරා එළැඹැසිට පස්දොරක් ඇති කුටියෙහි ඒ ඒ දොරින් වරින් වර (අරමුණු ගැනීම් විසින්) සටමින් ඔබිනොබ හැසිරෙයි.

126. වඳුර, සිටුව නහමක් දුවව, තා ගේ ඒ කිළිය පෙර ලෙසින් නැත. (පියු දොර අගුළු ඇති හෙයිනි.) මාර්ගප්‍රඥයෙන් නිගත්නාලදැයෙහි, එහෙයින් නහමක් දුර (ප්‍රතිසන්ධි වශයෙන්) යන්නෙහි යයි.

මෙසේ ආයුෂ්මත් වල්ලිය ස්ථවිරයන් වහන්සේ ...

**වල්ලිය ස්ථවිර ගාථා යි.**

## 2. 2. 4

127. තිණ්ණං මෙ තාලපත්තානං ගඞ්ගාතීරෙ කුටී කතා,
ඡවසිත්තොව මෙ පත්තො පංසුකූලං ච චීවරං.

128. ද්වින්නං අන්තරවස්සානං එකා වාචා මෙ භාසිතා,
තතියෙ අන්තරවස්සම්හි තමොක්ඛන්ධො පදාලිතො.

ඉත්ථං සුදං ආයස්මා ගඞ්ගාතීරියො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

ගඞ්ගාතීරියත්ථෙරගාථා.

## 2. 1. 5

129. අපි චෙ හොති තෙවිජ්ජො මච්චුහායී අනාසවො,
අප්පඤ්ඤාතොති නං බාලා අවජානන්ති අජානතා.

130. යො ච ඛො අන්නපානස්ස ලාභී හොතීධ පුග්ගලො,
පාපධම්මොපි චෙ හොති සො නෙසං හොති සක්කතො'ති.

ඉත්ථං සුදං ආයස්මා අජිනො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

අජිනත්ථෙරගාථා.

## 2. 1. 6

131. යදාහං ධම්මමස්සොසිං භාසමානස්ස සත්ථුනො,
න කඞ්ඛමභිජානාමි සබ්බඤ්ඤූ අපරාජිතෙ.

132. සත්ථවාහෙ මහාවීරෙ සාරථීනං වරුත්තමෙ,
මග්ගෙ පටිපදායං වා කඞ්ඛා මය්හං න විජ්ජතී'ති.

ඉත්ථං සුදං ආයස්මා මෙලජිනො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

මෙලජිනත්ථෙරගාථා.

## 2. 1. 7

133. යථා අගාරං දුච්ඡන්නං වුට්ඨී සමතිවිජ්ඣති,
එවං අභාවිතං චිත්තං රාගො සමතිවිජ්ඣති.

134. යථා අගාරං සුච්ඡන්නං වුට්ඨී න සමතිවිජ්ඣති,
එවං සුභාවිතං චිත්තං රාගො න සමතිවිජ්ඣතී'ති.

ඉත්ථං සුදං ආයස්මා රාධො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

රාධත්ථෙරගාථා.

2. 1. 4

127. ගඞ්ගානදීතීරයෙහි තල්පත් තුනෙකින් මට කිලියක් කරනලද, මා ගේ පාත්‍රය මළසිරුරට කිරි ඉස්නා බඳුනක් වැන්න. සිවුර ද පාංශුකූලයෙකි.

128. අතුරුවස් දෙකක් තුළ මා විසින් එක් මෑ බසක් කියනලදි, තෙවන අතුරුවසෙහි ලා මොහඳුරුකඳ පලනලද'යි.

මෙසේ ආයුෂ්මත් ගඞ්ගාතීරිය ස්ථවිරයන් වහන්සේ ...

ගඞ්ගාතීරිය ස්ථවිරගාථා යි.

2. 1. 5

129. ඉදින් පුනර්භවයක් නැතියෙන් මරණය නවතාලූ කාමාදි ආස්‍රව නැති ත්‍රිවිද්‍යාධරයෙක් වන්නේ නමුදු අඥානයෝ ඔහු 'අප්‍රකටයහ'යි නො දැනීමෙන් අවඥා කෙරෙත්.

130. මෙලොව යම් පුඟුලෙක් වනාහි ආහාරපාන ලබන්නේ වේ ද, හේ පාපධර්මී ඇත්තේ නමුදු තෙල බාලයන් විසින් සලකන ලද්දේ වන්නේ යයි.

මෙසේ ආයුෂ්මත් අජින ස්ථවිරයන් වහන්සේ ...

අජින ස්ථවිරගාථා යි.

2. 1. 6

131. මම යම් දවසෙක සිවුසස්දහම් ඇසීම් ද ඒ බණනා බුදුන් පිළිබඳ වැ සැක කළ බවක් නො දනිමි. සර්වඥ වූ අපරාජිත වූ –

132. සාර්ථවාහ වූ මහාවීර වූ සාරථින් කෙරෙණි අත්‍යුත්තම සාරථි වූ බුදුන් කෙරෙහි ද, මාර්ගයෙහි හෝ ප්‍රතිපත්තියෙහි ද මා ගේ සැකයෙක් නැතැ' යි.

මෙසේ ආයුෂ්මත් මෙලජිනස්ථවිරයන් වහන්සේ ...

මෙල ස්ථවිරගාථා යි.
ජින

2. 1. 7

133. මොනොවට සෙවෙණි නො කළ ගෙයක් යම් සේ වැස්ස විනිවිද යන්නේ වේ ද, එපරිද්දෙන් රාගය තෙම අභාවිත වූ සිත විනිවිද යන්නේ යැ.

134. මොනොවට සෙවෙණි කළ ගෙයක් යම් සේ වැස්ස විනිවිද නො යන්නේ වේ ද, එපරිද්දෙන් රාගය තෙම සුභාවිත වූ සිත විනිවිද නො යන්නේ ය යි.

මෙසේ ආයුෂ්මත් රාධ ස්ථවිරයන් වහන්සේ ...

රාධ ස්ථවිරගාථා යි.

### 2. 1. 8

135. ඛීණා හි මය්හං ජාති වුසිතං ජිනසාසනං,
පහීනො ජාලසඞ්ඛාතො භවනෙත්ති සමූහතා.

136. යස්සත්ථාය පබ්බජිතො අගාරස්මානගාරියං,
සො මෙ අත්ථො අනුප්පත්තො සබ්බසංයොජනක්ඛයො'ති.

ඉත්ථං සුදං ආයස්මා සුරාධො ථෙරො ගාථායො අහසිත්ථා'ති.

**සුරාධත්ථෙරගාථා.**

### 2. 1. 9

137. සුඛං සුපන්ති මුනයො යෙ ඉත්ථීසු න බජ්ඣරෙ;
සදා වෙ රක්ඛිතබ්බාසු යාසු සච්චං සුදුල්ලභං.

138. වධං චරිම්හ තෙ කාම අනණා දානි තෙ මයං
ගච්ඡාම දානි නිබ්බානං යත්ථ ගන්ත්වා න සොචතී'ති.

ඉත්ථං සුදං ආයස්මා ගොතමො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**ගොතමත්ථෙරගාථා.**

### 2. 1. 10

139. පුබ්බෙ හනති අත්තානං පච්ඡා හනති සො පරෙ,
සුහතං හන්ති අත්තානං වීතසෙනෙව පක්ඛිමා.

140. න බ්‍රාහ්මණො බහිවණ්ණො අන්තො වණ්ණො හි බ්‍රාහ්මණො,
යස්මිං පාපානි කම්මානි ස වෙ කණ්හො සුජම්පතී'ති.

ඉත්ථං සුදං ආයස්මා වසභො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**වසභත්ථෙරගාථා.**

## වග්ගො පඨමො.

**තස්සුද්දානං:**

උත්තරො චෙව පිණ්ඩොලො වල්ලියො තීරියො ඉසි,
අජිතො ච මෙළජිනො රාධො සුරාධො ගොතමො,
වසභෙන ඉමෙ හොන්ති දස ථෙරා මහිද්ධිකා'ති.

## 2. 1. 8

135. මා ගේ ජාති සඞ්ඛ්‍යාත පුනර්භවය ක්‍ෂය වූයේ මැ වෙයි මහබඹ-සරවස් වැස නිමවනලද, ජංල සඞ්ඛ්‍යාත වූ දෘෂ්ටි අවිද්‍යා දෙක ප්‍රහීණ යැ, භවතෘෂ්ණා නසනලද්‍ද.

136. ගිහිගෙන් නික්ම ශාසනයෙහි යමක් සඳහා පැවිදි වීම් ද, මා විසින් සර්‍වසංයොජනක්‍ෂය සඞ්ඛ්‍යාත ඒ අර්‍ථය (නිවන) ලබනලද්‍ද'යි.

මෙසේ ආයුෂ්මත් සුරාධ ස්ථවිරයන් වහන්සේ ...

**සුරාධ ස්ථවිරගාථා යි.**

## 2. 1. 9

137. හැම කල්හි ඒකාන්තයෙන් රැකියැයුතු යම් ස්ත්‍රී කෙනකුන් කෙරෙහි සත්‍යය අත්‍යර්‍ථයෙන් නො ලැබියැ හැක්කේ ද, එබඳු ස්ත්‍රීන් කෙරෙහි යම් මුනි කෙනෙක් නො බැඳෙත් ද, ඒ මුනිහු සුවසේ වෙසෙත්.

138. කාමය, තා ගේ නැස්ම කළම්හ. ඒ අපි දැන් ණය නැතියම්හ. යම් තැනෙක ගොස් නො සොස්නේ ද, දැන් ඒ නිවන කරා යම්හ'යි.

මෙසේ ආයුෂ්මත් ගොතම ස්ථවිරයන් වහන්සේ ...

**ගොතම ස්ථවිරගාථා යි.**

## 2. 1. 10

139. කුහක තෙමේ පළමු මැ තමා නසන්නේ යැ, හෙතෙම පසුවැලා මෙරමා ද නසන්නේ යැ, ලිහිණිවැදි විතංසයෙන් (ලිහිණියන් මුළා-කරන වැස්මෙන්) ලිහිණින් නසන්නාක් මෙන් තමා සුහත කොට නසන්නේ යැ.

140. බැහැර ඊර්‍ය්‍යාපථසම්පත්ති ඇත්තේ බ්‍රාහ්මණ නො වෙයි. ඇතුළත ශීලාදි සම්පත් ඇත්තේ මැ බ්‍රාහ්මණ වෙයි. ශක්‍රය, යමකු කෙරෙහි පාපකර්‍මයෝ ඇත් ද, හේ ඒකාන්තයෙන් නිහීන පුද්ගලයෙක් වන්නේ ය යි.

මෙසේ ආයුෂ්මත් වසභ ස්ථවිරයන් වහන්සේ ...

**වසභ ස්ථවිරගාථා යි.**

# ප්‍රථම වර්‍ගය යි.

**උද්දානය:**

උත්තර යැ, පිණ්ඩොල යැ, වල්ලිය යැ, තීරිය යැ, අජින යැ, මෙළජින යැ, රාධ යැ, සුරාධ යැ, ගොතම යැ, වසභ යැ යන රහතුන් වහන්සේලා වදාළ ගාථා යි.

## 2. 2. 1

141. සුස්සූසා සුතවඩ්ඪනී සුතං පඤ්ඤාය වඩ්ඪනං,
පඤ්ඤාය අත්ථං ජානාති ඤාතො අත්ථො සුඛාවහො.

142. සෙවෙථ පන්තානි සෙනාසනානි
චරෙය්‍ය සංයොජන විප්පමොක්ඛං,
සචෙ රතිං නාධිගච්ඡෙය්‍ය තත්ථ
සඞ්ඝෙ වසෙ රක්ඛිතත්තො සතීමා'ති.

ඉත්ථං සුදං ආයස්මා මහාචුන්දො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**මහාචුන්දත්ථෙරගාථා.**

## 2. 2. 2

143. යෙ ඛො තෙ වෙඝමිස්සෙන[1] නානත්ථෙන[2] ච කම්මුනා
මනුස්සෙ උපරුන්ධන්ති ඵරුසූපක්කමා ජනා,
තෙපි තත්ථෙව[3] කීරන්ති න හි කම්මං පනස්සති.

144. යං කරොති නරො කම්මං කල්‍යාණං යදි පාපකං,
තස්ස තස්සෙව දායාදො යං යං කම්මං පකුබ්බතී'ති.

ඉත්ථං සුදං ආයස්මා ජොතිදාසො ථෙරො ගාථායො අභාසිත්ථා,ති

**ජොතිදාසත්ථෙරගාථා.**

## 2. 2. 3

145. අච්චයන්ති අහොරත්තා ජීවිතං උපරුජ්ඣති,
ආයු ඛීයති මච්චානං කුන්නදීනං ච ඔදකං.

146. අථ පාපානි කම්මානි කරං බාලො න බුජ්ඣති,
පච්ඡාස්ස කටුකං හොති විපාකො හිස්ස පාපකො'ති.

ඉත්ථං සුදං ආයස්මා හෙරඤ්ඤකානිත්ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**හෙරඤ්ඤකානිත්ථෙරගාථා.**

## 2. 2. 4

147. පරිත්තං දාරුමාරුය්හ යථා සීදෙ මහණ්ණවෙ,
එවං කුසීතමාගම්ම සාධුජීවී පි සීදති,[4]
තස්මා තං පරිවජ්ජෙය්‍ය කුසීතං හීනවීරියං.

148. පවිවිත්තෙහි අරියෙහි පහිතත්තෙහි ඣායිහි,
නිච්චං ආරද්ධවිරියෙහි පණ්ඩිතෙහි සහාවසෙ'ති.

ඉත්ථං සුදං ආයස්මා සොමමිත්තො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**සොමමිත්තත්ථෙරගාථා.**

---

1. වෙඝම්හිස්සෙන - ප   වෙඨම්හිස්සෙන - පු   2. නානත්තෙන - සීමු 1, 2. PTS
3. තථෙව - පු.   4. සාධුජීවීපිසීදති - පු

**2. 2. 1**

141. අසනු කැමැත්ත බහුශ්‍රුතභාවය වඩයි. ශ්‍රුතය ප්‍රඥව වර්ධනය කෙරෙයි. ප්‍රඥයෙන් අර්ථය දැනගනී. දැනගන්නාලද අර්ථය තෙමේ සුව එළවයි.

142. වෙනෙහි ඉතා දුරුසෙනසුන් සෙවුනේ යැ. සංයෝජනයන්ගෙන් මිදීම වූ විදර්ශනාමාර්ගභාවනාව කරන්නේ යැ. ඉඳින් එහි රතිය නො ලබන්නේ නම් සඞ්ඝයා වෙත (කමටහන් පිරිසිඳගැන්මෙන්) රක්නා-ලද සිත් ඇති වැ සිහි ඇති වැ වසන්නේ යි.

මෙසේ ආයුෂ්මත් මහාචුන්ද ස්ථවිරයන් වහන්සේ ...

**මහාචුන්ද ස්ථවිරගාථා යි.**

**2. 2. 2**

143. යම් කෙනෙක් (වරපට ආදියෙන්) හිස වෙළීමෙන් ද හන්වැදූරුම් වූ කර්මයෙන් ද මිනිසුන් පෙළන් නම් දරුණු වූ ප්‍රයොග ඇති ඒ ජනයෝ ද ඒ කර්මකටොලුවල තුමූ මැ හෙළනු ලැබෙත්. යම් හෙයකින් කර්මය තෙමේ (විපාක නො දී) නො නැසේ ද එහෙයිනි.

144. සත්ත්ව තෙම කුසල් වූ හෝ අකුසල් වූ හෝ යම් කර්මයක් කෙරේ ද යම් යම් කර්මයක් රැස් කෙරේ ද, ඒ ඒ කර්මය දායාද කොට ඇත්තේ වේ යයි.

මෙසේ ආයුෂ්මත් ජෝතිදාස ස්ථවිරයන් වහන්සේ ...

**ජෝතිදාස ස්ථවිරගාථා යි.**

**2. 2. 3**

145 රුදුවල්හු ඉක්මයෙති. ජීවිතින්ද්‍රිය (කෙණෙහි කෙණෙහි) නිරුද්ධ වෙයි. සත්ත්වයන් ගේ ආයුෂ කුඩා නදීන් ගේ දිය මෙන් ක්ෂය වේ.

146. එතෙකුදුවත් පව්කම් කරන්නා වූ බාල තෙම (එය) නො දනියි. පසු වැ ඔහුට කටුක වූ දුක් වෙයි. යම් හෙයකින් ඒ පාපකර්මයා ගේ විපාකය ලාමක වේ ද එහෙයිනි.

මෙසේ ආයුෂ්මත් හේරඤ්ඤකානි ස්ථවිරයන් වහන්සේ ...

**හෙරඤ්ඤකානි ස්ථවිරගාථා යි.**

**2. 2. 4**

147. කුඩා දරකඩෙකැ නැඟැ යම්සේ මහසයුරෙහි ගැලේ ද, එසේ මැ අලසයා නිසා මනා දිවිපැවතුම් ඇත්තේ ද සසරෙහි ගැලේ.

148. එහෙයින් වීර්‍ය්‍ය රහිත වූ ඒ අලසයා දුරුලන්නේ යැ. කායවිවේක ඇති කෙලෙසුන් කෙරෙන් දුරු වූ නිවනට යැවූ සිත් ඇති ධ්‍යාන කරනසුලු වූ නිතොර පටන්ගත් වීර්‍ය්‍ය ඇති පණ්ඩිතයන් සමග වසන්නේ යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් සෝමමිත්ත ස්ථවිරයන් වහන්සේ ...

**සොමමිත්ත ස්ථවිරගාථා යි.**

2. 2. 5

149. ජනො ජනම්හි සම්බද්ධො, ජනමෙවස්සිතො ජනො,
ජනො ජනෙන හෙඨීයති හෙඨෙති ච ජනො ජනං.

150. කො හි තස්ස ජනෙනත්ථො ජනෙන ජනිතෙන වා,
ජනං ඔහාය ගච්ඡං තං හෙඨයිත්වා බහුං ජනන්ති.

ඉත්ථං සුදං ආයස්මා සබ්බමිත්තො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

සබ්බමිත්තථෙරගාථා.

2. 2. 6

151. කාළී ඉත්ථී බ්‍රහතී ධඞ්කරූපා
සත්ථිං ච භෙත්වා අපරං ච සත්ථිං,
බාහං[1] ච භෙත්වා අපරං ච බාහුං
සීසං ච භෙත්වා දධිථාලකං' ව
එසා නිසින්නා අභිසන්දහිත්වා.

152. යො වෙ අවිද්වා උපධිං කරොති
පුනප්පුනං දුක්ඛමුපෙති මන්දො,
තස්මා පජානං[2] උපධිං න කයිරා
මාහං පුන භින්නසිරො සයිස්සන්ති

ඉත්ථං සුදං ආයස්මා මහාකාලො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

මහාකාලථෙරගාථා.

2. 2. 7

153. බහූ සපත්තෙ ලභති මුණ්ඩො සඞ්ඝාටිපාරුතො,
ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස සයනස්ස ච.

154. එතමාදීනවං ඤත්වා සක්කාරෙසු මහබ්භයං,
අප්පලාභො 'නවස්සුතො සතො භික්ඛු පරිබ්බජෙ'ති.

ඉත්ථං සුදං ආයස්මා තිස්සො ථෙරො ගාථායො අභාසිත්ථා'ති

තිස්සථෙරගාථා.

2. 2. 8

155. පාචීනවංසදායම්හි සක්‍යපුත්තා සහායකා,
පහායානප්පකෙ භොගෙ උඤ්ඡාපත්තාගතෙ රතා.

156. ආරද්ධවිරියා පහිතත්තා නිච්චං දළ්හපරක්කමා,
රමන්ති ධම්මරතියා හිත්වාන ලොකියං රතින්ති,

ඉත්ථං සුදං ආයස්මා කිම්බිලො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

කිම්බිලථෙරගාථා.

---

1 බාහුඤ්ච - සීමු, 1, 2    2. පජං - සීමු, 1, 2.

**2. 2. 5**

149-150. (අඥබාල) ජන තෙම (අන්‍ය) ජනයා කෙරෙහි (තෘෂ්ණායෙන්) බැඳුණේ වෙයි. ජන තෙම ජනයා මැ ඇසුරු කොට සිටියේ යැ. ජන තෙම ජනයා විසින් පෙළනුලැබෙයි. යළි ජන තෙම ජනයා පෙළයි, ඒ ජනක වූ ද ජනිත වූ ද ජනයාගෙන් ඔහුට කවර අර්ථයෙක් ද (මම) ජනයා ද බොහෝදෙනා පෙළාසිටුනා ඒ (තෘෂ්ණා දෘෂ්ටි දෙක) ද සර්වප්‍රකාරයෙන් හැර යන්නෙමැ යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් සබ්බමිත්ත ස්ථවිරයන් වහන්සේ ...

**සබ්බමිත්ත ස්ථවිරගාථා යි.**

**2. 2. 6**

151. කවුඩකුට බඳු පැහැ ඇති මහත් වූ සිරුරක් ඇති තෙල 'කාලී' නම් වූ ස්ත්‍රී තොමෝ (මළ සිරුරෙහි) දෙ කලවය ද දෙ අත් ද බිඳ දීතලියක්මෙන් හිස ද බිඳ (ඒ අවයව) සුදුසු සේ ගලපා තබා හුන්නී යැ.

152. මුඪ වූ යමෙක් කෙලශොපධිය උපදවා ද, ඒ මූඪ තෙම එකාන්තයෙන් පුනපුනා දුකට පැමිණෙයි. එහෙයින් නුවණැත්තේ කෙලශොපධිය නූපදවන්නේ යැ. කුමක් හෙයින යත්: මම යළි බිඳුණුහිස් ඇති වැ නහමක් ශයනය කෙරෙම්වා යි.

මෙසේ මේ ගාථා ආයුෂමත් මහාකාල ස්ථවිරයන් වහන්සේ ...

**මහාකාල ස්ථවිරගාථා යි.**

**2. 2. 7**

153. මුඩු වූ සඟලසිවුර පෙරෙවියා වූ මහණ තෙම ආහාර ද පාන ද වස්ත්‍ර ද ශයන ද ලබනසුලු වූයේ බොහෝ සතුරන් ලබයි.

154. මහණ තෙම සත්කාර විෂයෙහි මහත් බිය ද තෙල ආදීනවය ද දැන මඳ වූ ලාභ ඇත්තේ තෘෂ්ණා වැගිරීම් නැත්තේ සිහි ඇති වැ හැසිරෙන්නේ යි.

මෙසේ මේ ගාථා ආයුෂමත් තිස්ස ස්ථවිරයන් වහන්සේ ...

**තිස්ස ස්ථවිරගාථා යි.**

**2. 2 8**

155. පාචීනවංස නම් වූ වනයෙහි, යහළු වූ ශාක්‍යපුත්‍රයෝ අනල්ප වූ සම්පත් හැරදමා පිඬුසිඟීමෙන් පාත්‍රයට ලැබුණු දෑයෙහි ඇලුණාහු.

156. ආරබ්ධවීර්‍ය්‍ය ඇත්තාහු නිවන කරා යැවූ සිත් ඇත්තාහු සතතයෙන් දෘඪවීර්‍ය්‍ය ඇත්තාහු ලෞකික ආලම්බනයෙහි ඇල්ම හැර ධර්මරතියෙහි සිත් අලවත් යයි.

මෙසේ මේ ගාථා ආයුෂමත් කිම්බිල ස්ථවිරයන් වහන්සේ ...

**කිම්බිල ස්ථවිරගාථා යි.**

2. 2. 9

157. අයොනිසො මනසිකාරා මණ්ඩනං අනුයුඤ්ජිසං,
උද්ධතො චපලො චාසිං කාමරාගෙන අට්ටිතො.

158. උපායකුසලෙනාහං බුද්ධෙනාදිච්චබන්ධුනා,
යොනිසො පටිපජ්ජිත්වා භවෙ චිත්තං උදබ්බහින්ති.

ඉත්ථං සුදං ආයස්මා නන්දො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

නන්දත්ථෙරගාථා.

2. 2. 10

159. පරෙ ච නං පසංසන්ති අත්තා චෙ අසමාහිතො,
මොඝං පරෙ පසංසන්ති අත්තා හි අසමාහිතො.

160. පරෙ ච නං ගරහන්ති අත්තා චෙ සුසමාහිතො,
මොඝං පරෙ ගරහන්ති අත්තා හි සුසමාහිතො'ති.

ඉත්ථං සුදං ආයස්මා සිරිමා ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

සිරිමත්ථෙරගාථා.

## වග්ගො දුතියො

**තස්සුද්දානං:**

චූළෙකො ච ජොතිදාසො ච ථෙරො හෙරඤ්ඤකානි ච,
සොමමිත්තො සබ්බමිත්තො කාලො තිස්සො ච කිම්බිලො.
නන්දො ච සිරිමා චෙව දස ථෙරා මහිද්ධිකා'ති.

2. 2. 9

157. අයෝනිසො මනසිකාරයෙන් ශරීරමණ්ඩනයෙහි යෙදුණෙමි. කාමරාගය විසින් පෙළුණෙම් නො සන්හුන් සිත් ඇත්තෙම් චපල ද වීමි.

158. උපායෙහි දක්‍ෂ වූ සූර්‍ය්‍යබන්ධු වූ බුදුරදුන් කරණකොටගෙන නුවණින් පිළිපැද සසරෙහි ගිලුණු සිත නඟාලීමි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් නන්ද ස්ථවිරයන් වහන්සේ ...

නන්ද ස්ථවිරගාථා යි.

2. 2. 10

159. ඉදින් තෙමේ සමාධි රහිත වේ නම් එතෙකුදුවත් අන්‍යයෝ ඔහු පසසත් නම්, ඔහු සිස් කොට පසසත්. (තමා සමාහිත නො වන හෙයිනි.)

160. ඉදින් තෙමේ සමාහිත සිත් ඇත්තේ නම්, එතෙකුදුවත් අන්‍යයෝ ඔහු ගරහත් නම්, ඔහු සිස් කොට ගරහත්. (තමා සමාහිත හෙයිනි.)

මෙසේ මේ ගාථා ආයුෂ්මත් සිරිමන්න ස්ථවිරයන් වහන්සේ ...

සිරිමන්න ස්ථවිරගාථා යි.

## දෙවැනි වර්ගය යි.

උද්දානය:

චුන්ද ස්ථවිර යෑ, ජෝතිදාස ස්ථවිර යෑ, හෙරඤ්ඤකානි ස්ථවිර යෑ, සොමමිත්ත ස්ථවිර යෑ, සබ්බමිත්ත ස්ථවිර යෑ, කාල ස්ථවිර යෑ, තිස්ස ස්ථවිර යෑ, කිම්බිල ස්ථවිර යෑ, නන්ද ස්ථවිර යෑ, සිරිමන්න ස්ථවිර යෑ යි දෙවැනි වර්ගයෙහි මහත් සෘද්ධි ඇති තෙරවරු දස දෙනෙකි.

2. 3. 1

161. ඛන්ධා මයා පරිඤ්ඤාතා තණ්හා මෙ සුසමූහතා,
භාවිතා මම බොජ්ඣඞ්ගා පත්තො මෙ ආසවක්ඛයො.

162. සොහං ඛන්ධෙ පරිඤ්ඤාය අබ්බුහිත්වාන[1] ජාලිනිං,
භාවයිත්වාන බොජ්ඣඞ්ගෙ නිබ්බායිස්සං අනාසවො'ති.

ඉත්ථං සුදං ආයස්මා උත්තරො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

උත්තරත්ථෙරගාථා.

2. 3. 2

163. පනාදො නාම සො රාජා යස්ස යූපො සුවණ්ණයො,
තිරියං සොළසපබ්බෙධො[2] උද්ධමාහු[3] සහස්සධා.

164. සහස්සකණ්ඩො[4] සතගෙණ්ඩු[5] ධජාලු හරිතාමයො,
අනච්චුං තත්ථ ගන්ධබ්බා ඡසහස්සානි සත්තධා'ති.

ඉත්ථං සුදං ආයස්මා භද්දජී ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

භද්දජිත්ථෙරගාථා.

2. 3. 3

165. සතිමා පඤ්ඤවා භික්ඛු ආරද්ධබලවීරියො,
පඤ්චකප්පසතානාහං එකරත්තිං අනුස්සරිං.

166. චත්තාරො සතිපට්ඨානෙ සත්ත අට්ඨ ච භාවයං,
පඤ්චකප්පසතානාහං එකරත්තිං අනුස්සරින්ති.

ඉත්ථං සුදං ආයස්මා සොභිතො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

සොභිතත්ථෙරගාථා

2. 3. 4

167. යං කිච්චං දළ්හවිරියෙන යං කිච්චං බොද්ධුමිච්ඡතා,
කරිස්සං නාවරුජ්ඣිස්සං පස්ස විරියං පරක්කමං.[6]

168. ත්වං ච මෙ මග්ගමක්ඛාහි අඤ්ජසං අමතොගධං,
අහං මොනෙන මොනිස්සං ගඞ්ගාසොතො'ව සාගරන්ති.

ඉත්ථං සුදං ආයස්මා වල්ලියො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

වල්ලියත්ථෙරගාථා.

---

1. අබ්බයිත්වාන - සීමු. 1, 2 අ බ්බුයිත්වාන - මජසං 2. සොළසුබ්බෙධො - සීමු. 1, 2,
3. උබ්භමාහු - මජසං PTS. 4. සහස්සතණ්ඩො - මජසං සහස්සකණ්ඩු - PTS.
5. සතගෙණ්ඩු - සීමු. 6. විරියපරක්කමං - PTS.

### 2. 3. 1

161. පඤ්චස්කන්ධයෝ මා විසින් පිරිසිඳ දන්නාලදහ. තෘෂ්ණාව මා විසින් මොනොවට උපුරනලද යැ. බොධ්‍යඞ්ගයෝ මා විසින් වඩනලදහ. නිර්වාණය මා විසින් ලබනලදී.

162. ඒ මම ස්කන්ධයන් පිරිසිඳ දැන තෘෂ්ණාව උපුටාදමා බොධ්‍යඞ්ගයන් වඩා ආස්‍රව රහිත වැ පිරිනිවෙන්නෙමි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් උත්තර ස්ථවිරයන් වහන්සේ ...

**උත්තර ස්ථවිරගාථා යි.**

### 2. 3. 2

163. (යටගිය දවසැ) 'පනාද' නම් වූ ප්‍රසිද්ධ රජෙක් වී යැ. යම් රජක්හුගේ ප්‍රාසාදය රන්මුවා වූයේ සරස සරපතන සොළසක් ඇත්තේ උස සරපතන දහසක් ඇත්තේ වී ද,

164. සහස්බුමු වූයේ (නගාලූ) ධවජබහුල වූ චාමීකරසවර්ණමය සිය ගණන් නිර්ව්‍යූහ ඇත්තේ ද, එහි සත් තැනෙකැ සදහසක් නළුවෝ නැටූහු ද, ඒ රජ තෙමේ යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් භද්දජි ස්ථවිරයන් වහන්සේ ...

**භද්දජි ස්ථවිරගාථා යි.**

### 2. 3. 3

165. සිහි ඇති (අභිඥා) නුවණ ඇති පටන්ගත්නාලද බල හා වීර්‍ය්‍ය ඇති මහණකු වූ මම පන්සියක් කප් එක්රැය මෙන් සිහි කෙළෙමි.

166 සතර සිවටන් ද සප්තබොධ්‍යඞ්ගයන් ද අෂ්ටමාර්ගාඞ්ගයන් ද වඩනුයෙම් පන්සියක් කප් එක්රැය මෙන් සිහි කෙළෙමි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් සොභිත ස්ථවිරයන් වහන්සේ ...

**සොභිත ස්ථවිරගාථා යි**

### 2. 3. 4

167. දැඩවීර්‍ය්‍ය ඇතියහු විසින් යමක් කටයුතු නම් සිව්සස් දැනගනු රිසියහු විසින් යමක් කටයුතු නම්, (එය) කරන්නෙමි, නො වළහන්නෙමි. වීර්‍ය්‍ය සඞ්ඛ්‍යාත සම්‍යග්ව්‍යායාමය බලව.

168. නුඹවහන්සේ වැළිත් මට නිර්වාණය පිහිට කොට ඇති ඍජු වූ (ආර්‍ය්‍ය) මාර්ගය වදහළ මැනැවි, මම (නො වළහා) සයුර කරා යන ගඞ්ගාශ්‍රොතසක් සෙයින් ආර්‍ය්‍යමාර්ගයෙන් (නිර්වාණය) ප්‍රතිවෙධ කරන්නෙමි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් වල්ලිය ස්ථවිරයන් වහන්සේ ...

**වල්ලිය ස්ථවිරගාථා යි.**

**2. 3. 5**

169. කෙසෙ මෙ ඔලිඛිස්සන්ති කප්පකො උපසඞ්කමි,
තතො ආදාසමාදාය සරීරං පච්චවෙක්ඛිසං.

170. තුච්ඡො කායො අදිස්සිත්ථ අන්ධකාරො[1] තමො බ්‍යගා,
සබ්බෙ චොළා සමුච්ඡින්නා නත්ථි දානි පුනබ්භවො'ති.

ඉත්ථං සුදං ආයස්මා වීතසොකො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**වීතසොකත්ථෙරගාථා.**

**2. 3. 6**

171. පඤ්චනීවරණෙ හිත්වා යොගක්ඛෙමස්ස පත්තියා,
ධම්මාදාසං ගහෙත්වාන ඤාණදස්සනමත්තනො.

172 පච්චවෙක්ඛිං ඉමං කායං සබ්බං සන්තරබාහිරං,
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච තුච්ඡො කායො අදිස්සථා'ති.

ඉත්ථං සුදං ආයස්මා පුණ්ණමාසො ථෙරො ගාථායො අභාසිත්ථා'ති

**පුණ්ණමාසත්ථෙරගාථා**

**2. 3. 7**

173 යථාපි භද්දො ආජඤ්ඤො ඛලිත්වා පතිතිට්ඨති,
භිය්‍යො ලද්ධාන සංවෙගං අදීනො වහතෙ ධුරං.

174. එවං දස්සනසම්පන්නං සම්මාසම්බුද්ධසාවකං,
ආජානීයං[2] මං ධාරෙථ පුත්තං බුද්ධස්ස ඔරසන්ති.

ඉත්ථං සුදං ආයස්මා නන්දකො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**නන්දකත්ථෙරගාථා**

**2. 3. 8**

175. එහි නන්දක ගච්ඡාම උපජ්ඣායස්ස සන්තිකං,
සීහනාදං නදිස්සාම බුද්ධසෙට්ඨස්ස සම්මුඛා.

176. යාය නො අනුකම්පාය අම්හෙ පබ්බාජයී මුනි,
සො නො අත්ථො අනුප්පත්තො සබ්බසංයොජනක්ඛයො'ති.

ඉත්ථං සුදං ආයස්මා භරතො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**භරතත්ථෙරගාථා.**

---

1. අන්ධකාරෙ - PTS  2. අජානියං - PTS

2. 3. 5

169. නැහැමි 'මා ගේ කෙස් කපමි' යි මා කරා එළැඹියේ යැ. ඉක්බිති මම කැටපත ගෙන (මාගේ) සිරුර බැලීමි.

170. මට සිරුර තුච්ඡ වැ පැතිණ අවිද්‍යා නැමැති අන්ධකාරය පහ විය, සියලු කෙලෙස් නැමැති කඩමාලු නොහොත් සොරු නසනලදහ. දැන් පුනර්භවයෙක් නැතැ යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් විතසොක ස්ථවිරයන් වහන්සේ ...

විතසොක ස්ථවිරගාථා යි.

2. 3 6

171. පඤ්චනිවරණයන් හැරපියා නිවනට පැමිණෙනු පිණිස තමා ගේ ඥානදර්ශනය වූ විදර්ශනාඥාන සඞ්ඛ්‍යාත ධර්මාදර්ශය (දහම් කැටපත)ගෙන,

172. ඇතුළත පිටත (ආධ්‍යාත්මික බාහිරායතන) සහිත වූ මේ සියලු ශරීරය නුවණැසින් බැලීමි. ස්වසන්තානයෙහි ද පරසන්තානයෙහි ද තුච්ඡ වූ කය (පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත ආත්මභාවය) දක්නාලද්දේ යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් පූර්ණමාස ස්ථවිරයන් වහන්සේ ...

පූර්ණමාස ස්ථවිරගාථා යි.

2. 3. 7

173. යම්සේ භද්‍ර වූ ආජානීයවෘෂභ තෙම පැකිලැ යළි නැගිසිටී ද, බෙහෙවින් සංවේගය ලැබැ අදීන වැ ධුරය උසුලා ද,

174. එසෙයින් දර්ශනසම්පන්න වූ සම්‍යක්සම්බුද්ධශ්‍රාවක වූ බුදුරදුන්ගේ ඖරසපුත්‍ර වූ මා පුරුෂාජානීයයකු කොට සලකනසේක්වා යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් නන්දක ස්ථවිරයන් වහන්සේ ...

නන්දක ස්ථවිරගාථා යි

2. 3 8

175. එව නන්දකයෙනි, උපාධ්‍යායයන් වහන්සේ (සම්බුදුරදුන්) වෙත යම්හ, බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ හමුයෙහි සිංහනාද පවත්වම්හ

176. යම් අර්ථයක් සඳහා අපට අනුකම්පායෙන් භාග්‍යවතුන් වහන්සේ අප පැවිදි කළසේක් නම් සියලු සංයෝජනයන් ක්‍ෂය කිරීම වූ ඒ අර්ථය (අර්හත්ඵලය) අප විසින් ලබනලද්දු යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් භරත ස්ථවිරයන් වහන්සේ ...

භරත ස්ථවිරගාථා යි.

**2. 3. 9**

177. නදන්ති එවං සප්පඤ්ඤා සීහාව ගිරිගබ්භරෙ
වීරා විජිතසඞ්ගාමා ජෙත්වා මාරං සවාහිනිං[1].

178. සත්ථා ච පරිචිණ්ණො මෙ ධම්මො සඞ්ඝො ච පූජිතො,
අහං ච විත්තො සුමනො පුත්තං දිස්වා අනාසවන්ති.

ඉත්ථං සුදං ආයස්මා භාරද්වාජො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**භාරද්වාජත්ථෙරගාථා.**

**2. 3. 10**

179. උපාසිතා සප්පුරිසා සුතා ධම්මා අභිණ්හසො,
සුත්වාන පටිපජ්ජිස්සං අඤ්ජසං අමතොගධං.

180. භවරාගහතස්ස මෙ සතො භවරාගො පුන මෙ න විජ්ජති,
න චාහු න ච මෙ[2] භවිස්සති න ච මෙ එතරහිපි[3] විජ්ජතී'ති.

ඉත්ථං සුදං ආයස්මා කණ්හදින්නො ථෙරො ගාථායො
අභාසිත්ථා'ති.

**කණ්හදින්නත්ථෙරගාථා**

## වග්ගො තතියො.

**තස්සුද්දානං:**

උත්තරො භද්දජිත්ථෙරො සොභිතො වල්ලියො ඉසි,
වීතසොකො ච යො ථෙරො පුණ්ණමාසො ච නන්දකො,
භරතො භාරද්වාජො ච කණ්හදින්නො මහාමුනී'ති.

---

1. සවාහනං - සීමු. 1; 2. 2. නමෙ - සීමු. 1, 2.
3. එතරහි - සීමු 1, 2.

2. 2. 9

177. මෙසේ සෙන් සහිත මරු දිනා දිනනලද සඞ්ග්‍රාම ඇති, අග්‍රමාර්ගප්‍රඥ සහිත වූ වීරයෝ (ශ්‍රාවකයෝ) ගිරිගුහායෙහි සිංහයන් සෙයින් නද දෙත් (අභීතනාද කෙරෙත්.)

178. මා විසින් ශාස්තෲන් වහන්සේ ඇසුරු කරනලදහ. ධර්මය ද සඞ්ඝයා ද පුදනලද යෑ, ක්ෂීණාස්‍රව වූ පුතණුවන් දැක (නිරාමිස ප්‍රීතියෙන්) තුටු වූයෙම් සොම්නස් විමි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් භාරද්වාජ ස්ථවිරයන් වහන්සේ...

භාරද්වාජ ස්ථවිරගාථා යි.

2. 2. 10

179. (මා විසින් ශාරිපුත්‍රාදි) සත්පුරුෂයෝ සෙවුනාලදහ. එක්වන් (නිතර) දහම් අසනලද යෑ, අසා නිර්වාණය පිහිට් කොට ඇති මඟට පිළිපන්මි.

180. නැසූ භවරාගය ඇති මට ඒ භවරාගය යළි නො පැනේ. (අග්‍රමාර්ගාධිගමයෙහි පටන්) නො වී යෑ, (මත්තෙහි) මට නො ද වන්නේ යෑ, දැනුදු මට නැති.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් කණ්හදින්න ස්ථවිරයන් වහන්සේ ...

කණ්හදින්න ස්ථවිරගාථා යි.

## දෙවන වර්ගය යි.

උද්දානය:

උත්තර යෑ, භද්දජි යෑ, සොභිත යෑ, වල්ලිය යෑ, වීතසොක යෑ, පුණ්ණමාස යෑ, නන්දක යෑ, භරත යෑ, භාරද්වාජ යෑ, කණ්හදින්න යෑ, යන තෙරවරුන් වදළ ගාථා යි.

2. 4. 1

181. යතො අහං පබ්බජිතො සම්මාසම්බුද්ධසාසනෙ,
විමුච්චමානො උග්ගච්ඡිං කාමධාතුං උපච්චගං.

182. බ්‍රහ්මුනො පෙක්ඛමානස්ස තතො චිත්තං විමුච්චි මෙ,
අකුප්පා මෙ විමුත්තීති සබ්බසංයොජනක්ඛයා'ති.

ඉත්ථං සුදං ආයස්මා මිගසිරො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

මිගසිරත්ථෙරගාථා.

2. 4. 2

183. අනිච්චානි ගහකානි තත්ථ තත්ථ පුනප්පුනං,
ගහකාරං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං.

184. ගහකාරක දිට්ඨොසි පුන ගෙහං න කාහසි,
සබ්බා තෙ ඵාසුකා භග්ගා ථූණිකා[1] ච විදාලිතා,[2]
විමරියාදීකතං[3] චිත්තං ඉධෙව විධමිස්සතී'ති.

ඉත්ථං සුදං ආයස්මා සිවකො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

සිවකත්ථෙරගාථා.

2. 4. 3

185. අරහං සුගතො ලොකෙ වාතෙහාබාධිතො මුනි,
සචෙ උණ්හොදකං අත්ථි මුනිනො දෙහි බ්‍රාහ්මණ,

186. පූජිතො පූජනීයානං[4] සක්කරෙය්‍යාන සක්කතො,
අපචිතොපචනීයානං[5] තස්ස ඉච්ඡාමි හාතවෙ'ති.

ඉත්ථං සුදං ආයස්මා උපවානො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

උපවානත්ථෙරගාථා.

2. 4. 4

187. දිට්ඨා මයා ධම්මධරා උපාසකා
කාමා අනිච්චා ඉති භාසමානා,
සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු
පුත්තෙසු දාරෙසු ච තෙ අපෙක්ඛා

188. අද්ධා න ජානන්ති යථාව[6] ධම්මං
කාමා අනිච්චා ඉති චාපි ආහු,[7]
රාගං ච තෙසං න බලත්ථි ඡෙත්තුං
තස්මා සිතා පුත්තදාරං ධනඤ්චා'ති.

ඉත්ථං සුදං ආයස්මා ඉසිදින්නො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

ඉසිදින්නත්ථෙරගාථා.

1 ථූණිරා - PTS 2 පදාලිතා - සීමු 1, 2 3 විපරියාදිකතං - සීමු 1, 2, PTS
4 පූජනෙය්‍යානං - මජසං, PTS 5 අපචිතොපචෙය්‍යානං - මජසං, අපචිතො අපචිතෙය්‍යානං - PTS 6 යථොධ - සීමු 1, 2 7 අහු - ප

## 2. 4. 1

181. යම් කලෙක මම සම්මාසම්බුදුසසුන්හි පැවිදි වූයෙම් ද, (එතැන් පටන්) සංක්ලේශයන්ගෙන් මිදෙමින් නැගිසිටියෙමි. (නැගිසිටුනෙම් මැ අනාගාමි මඟින්) කාමධාතුව ඉක්මැ ගියෙමි.

182. ඉක්බිති සම්බුදුරදුන් බලාසිටිය දී මා ගේ සිත (කෙලෙසුන් කෙරෙන්) මිදුණේ යැ, සියලු සංයෝජනයන් ක්ෂය වීමෙන් මා ගේ විමුක්තිය අකොප්‍ය වී යයි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් මිගසිර ස්ථවිරයන් වහන්සේ ...

මිගසිර ස්ථවිරගාථා යි.

## 2. 4. 2

183 ඒ ඒ භවයෙහි පුනපුනා උපදනා (ආත්මභාව) ගෘහයෝ අනිත්‍යයෝ යැ, ගෘහකාරකයා (තෘෂ්ණාව) සොයන්නෙම් (මෙතෙක් හැසුරුණෙම්) පුනපුනා ඉපැත්ම දුකෙකි.

184. එම්බා ගෘහකාරකය, (මා විසින් තෝ) දක්නාලද්දෙහි. යළි ගෙය නො කරන්නෙහි. තා ගේ සියලු ගොනැත්හු බිඳිනාලදහ· කැණිමඩල ද පලනලද යැ, (මා ගේ) සිත විගතාන්ත කරනලද්දේ මෙ අත්බැව්හි මැ නිරුද්ධ වන්නේ යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් සිවක ස්ථවිරයන් වහන්සේ ...

සිවක ස්ථවිරගාථා යි.

## 2. 4. 3

185. ලෝකයෙහි අතීත් වූ සුගත් මුනිහු වාතහේතුයෙන් හටගත් ආබාධ ඇතියාහු යැ, බ්‍රාහ්මණයෙනි, ඉදින් උණුදිය ඇත් නම් මුනිරදුට දෙනු මැනැවි.

186. (ඒ බුදුරජහු) පූජ්‍යයන් විසින් පුදනලදහ, සත්කාර කටයුත්තන් විසින් සත්කෘතයහ, වැන්ද යුත්තන් විසින් වදනා ලදහ

මෙසේ මේ ගාථා ආයුෂ්මත් උපවාන ස්ථවිරයන් වහන්සේ ...

උපවාන ස්ථවිරගාථා යි.

## 2. 4. 4

187. 'කාමයෝ අනිත්‍යහ'යි කියන්නා වූ ධම්ධරඋපාසකයෝ මා විසින් දක්නාලදහ. ඔහු මිණිකොඩොල් කෙරෙහි බහලරාගයෙන් ඇලුණාහු දරුවන් කෙරෙහි දු අඹුවන් කෙරෙහි දු අපේක්ෂා ඇත්තාහු ය.

188. ඔහු එකාන්තෙන් දහම් ඇති සැටියෙන් නො දනිති. එතෙකුදු-වුවත් කාමයෝ අනිත්‍යහ'යි කිහු. ඔවුනට රාගය සිඳිනට (ඥාන) බලයෙක් නැත. එහෙයින් අඹුදරුවන් ද ධනය ද ඇසුරු කළාහු යි·

මෙසේ මේ ගාථා ආයුෂ්මත් ඉසිදින්න ස්ථවිරයන් වහන්සේ ..

ඉසිදින්න ස්ථවිරගාථා යි.

2. 4. 5

189. දෙවො ච වස්සති දෙවො ච ගළගළායති
එකකො චාහං භෙරවෙ බිලෙ විහරාමි,
තස්ස මය්හං එකකස්ස භෙරවෙ බිලෙ විහරතො
නත්ථි භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා.

190. ධම්මතා මම සා යස්ස මෙ
එකකස්ස භෙරවෙ බිලෙ
විහරතො නත්ථි භයං වා
ඡම්භිතත්තං වා ලොමහංසො වා'ති.

ඉත්ථං සුදං ආයස්මා සම්බුලකච්චානො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

සම්බුලකච්චානත්ථෙරගාථා.

2. 4. 6

191. කස්ස සෙලූපමං චිත්තං ඨිතං නානුපකම්පති,
විරත්තං රජනීයෙසු කුප්පනීයෙ න කුප්පති,
යස්සෙවං භාවිතං චිත්තං කුතො තං දුක්ඛමෙස්සති.

192. මම සෙලූපමං චිත්තං ඨිතං නානුපකම්පති,
විරත්තං රජනීයෙසු කුප්පනීයෙ න කුප්පති,
මමෙවං භාවිතං චිත්තං කුතො මං දුක්ඛමෙස්සතී'ති.

ඉත්ථං සුදං ආයස්මා ඛිතකො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

ඛිතකත්ථෙරගාථා.

2. 4. 7

193. න තාව සුපිතුං හොති රත්ති නක්ඛත්තමාලිනී,
පටිජග්ගිතුමෙවෙසා රත්ති හොති විජානතා.

194 හත්ථික්ඛන්ධාවපතිතං කුඤ්ජරො චෙ අනුක්කමෙ,
සඞ්ගාමෙ මෙ මතං සෙය්‍යො යං චෙ ජීවෙ පරාජිතො'ති.

ඉත්ථං සුදං ආයස්මා සොණො සෙලිස්සරිය[1]පුත්තත්ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

සෙලිස්සරියත්ථෙරගාථා.

2. 4. 8.

195. පඤ්චකාමගුණෙ හිත්වා පියරූපෙ මනොරමෙ,
සද්ධාය අභිනික්ඛම්ම දුක්ඛස්සන්තකරො[2] භව.

196. නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං,
කාලං ච පටිකඞ්ඛාමි සම්පජානො පතිස්සතො'ති.

ඉත්ථං සුදං ආයස්මා නිසභො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

නිසභත්ථෙරගාථා.

---

1 සොණො පොටිරියපුත්තො - සයා, PTS. 2 දුක්ඛස්සන්තං කරො - සිමු 1, 2

### 2. 4. 5

189. වැසි දු වසී. ශෙලි දු වැස්ස 'ගලගල' හඬින් ගලායෙයි. මම ද, එකලා වැ භයජනක ගුහායෙහි වෙසෙමි. මා එකලා වැ භය-ජනක ගුහායෙහි වසන්නහුට බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුදහගැන්මෙක් හෝ නැති.

190. එකලා වැ භයජනක ගුහායෙහි වසන්නා වූ යම් බඳු මට බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුදහගැන්මෙක් හෝ නැත් ද තෙල මා ගේ ධර්මස්වභාව යි.

මෙසේ මේ ගාථා සම්බුලකච්චායන ස්ථවිරයන් වහන්සේ ...

**සම්බුලකච්චායන ස්ථවිර ගාථා යි.**

### 2. 4. 6

191. කවරක්හු ගේ සිත පර්වතයක් මෙන් සිටියේ (ලෝදහමින්) නො සැලේ ද, ඇලුම් කටයුතු වස්තූන්හි නො ඇලේ ද, කිපියයුතු (ආඝාත) වස්තුයෙහි නො කිපේ ද, යම් (ආර්ය) පුද්ගලයකුගේ සිත මෙසෙයින් වඩනාලද වි නම්, ඔහුකරා කොයින් දුක පැමිණෙන්නේ ද?

192. මා ගේ සිත පර්වතයක් සෙයින් සිටියේ (ලෝදහමින්) නො සැලෙයි,ඇලුම් කටයුතු වස්තූන්හි නො ඇලෙයි, කිපියයුත්තෙහි නො කිපෙයි, මා ගේ සිත මෙසෙයින් වඩනා ලද යැ, කොයින් මා කරා දුක එන්නේ ද? යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් ඛිතක ස්ථවිරයන් වහන්සේ ...

**ඛිතක ස්ථවිරගාථා යි.**

### 2. 4. 7

193. තරුවැල ඇති රාත්‍රිය තව (සුදුසු කල් ලද යොගීහු රහත් වන තෙක්) නිදන්නට කල් නො වෙයි. මේ රාත්‍රිය නුවණැත්තහු විසින් පිළිවෙත් රක්නට මැ (කැමැති වන ලද්දී) වේ.

194. ඉදින් (එදා) සංග්‍රාමයෙහි ඇත්කඳින් යටිකුරු වැ හුණු මා ඇත් තෙමේ ඇක්මී නම් (ඒ) මා ගේ මරණය උතුම්. යම්හෙයකින් (දූත් කෙලෙස් මරුන් විසින්) පැරදුණෙම් ජීවත් වන්නෙම් ද, එහෙයිනි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් සෙලිස්සරිය ස්ථවිරයන් වහන්සේ ...

**සෙලිස්සරිය ස්ථවිරගාථා යි.**

### 2. 4. 8

195. ප්‍රිය ස්වභාව ඇති මනරම් වූ පස්කම්ගුණ හැරපියා සැදැහැයෙන් ගිහිගෙන් නික්මැ දුක් කෙළවර කරන්නෙක් වන්නේ යැ.

196. මරණය නො පතමි, ජීවිතය නො කැමැත්තෙමි. මහනුවණැති වැ සිහි ඇති වැ හුදෙක් (පරිනිර්වාණ ) කාලය අපේක්‍ෂා කෙරෙමි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් නිසභ ස්ථවිරයන් වහන්සේ ...

**ණිසභ ස්ථවිරගාථා යි.**

## 2. 4. 9

197. අම්බපල්ලව සඞ්කාසං අංසෙ කත්වාන චීවරං,
නිසින්නො හත්ථි ගීවාය ගාමං පිණ්ඩාය පාවිසිං.

198. හත්ථික්ඛන්ධතො ඔරුය්හ සංවෙගං අලභිං තදා,
සොහං දිත්තො තදා සන්තො පත්තො මෙ ආසවක්ඛයො'ති.

ඉත්ථං සුදං ආයස්මා උසභො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

උසභත්ථෙරගාථා.

## 2. 4. 10

199. අයමිති කප්පටො කප්පටකුරො අච්ඡාය අතිභරිතාය[1]
අමතඝටිකායං ධම්මකතමත්තො කතපදං ඣානානි ඔචෙතුං.

200. මා ඛො ත්වං කප්පට පචාලෙසි
මා තං උපකණ්ණකම්හි[2] තාලෙස්සං,
නහ[3] ත්වං කප්පට මත්තමඤ්ඤාසි
සඞ්ඝමජ්ඣම්හි පචලායමානො'ති.

ඉත්ථං සුදං ආයස්මා කප්පටකුරො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

කප්පටකුරත්ථෙරගාථා.

## වග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

මිගසිරො සීවකො ච උපවානො ච පණ්ඩිතො
ඉසිදින්නො ච කච්චානො නිතකො ච මහාවසි
සෙලිස්සරියො නිසභො ච උසභො කප්පටකුරො'ති.

1 අතිහරියාය - සිමු 1, 2 2 උපකණ්ණම්හි - සිමු 1, 2 3 නහි - සිමු 1, 2

2. 4. 9

197. (මම සිඟීමෙන්) අඹදලු බඳු පැහැ ඇති සිවුරක් දසරැයෙහි ලාගෙන ඇත්කඳෙහි හුන්නෙම් ගමට පිඬු පිණිස පිවිසියෙමි.

198. (මහාජන දර්ශනයෙන් ලජ්ජිත වැ) ඇත්කඳින් බැස (පිළිදියෙම්) එකල්හි සංවේගපත් වීමි. මම එකල්හි ජාතිමදාදියෙන් දුරුණෙමි. දුන් මා විසින් අර්හත්ඵලය ලබනලදී.

මෙසේ මේ ගාථා ආයුෂමත් උසභ ස්ථවිරයන් වහන්සේ ..

උසභ ස්ථවිරගාථා යි.

2. 4. 10

199. 'කප්පටකුර' නම් මහණ තෙම 'මේ මාගේ ජීර්ණවස්ත්‍රය' යි (උපන් මිථ්‍යාවිතර්ක ඇත්තේ) පවිත්‍ර වූ පරිපූර්ණ වූ අමෘතඝටය ඇති කල්හි කෘතමාත්‍ර පැමිදි ඇත්තේ යැ, (මාගේ ශාසනය) ධ්‍යානයන් රැස් කරන්නට කරනලද (භාවනා) මාර්ග ඇත්තේ යි.

200. එම්බා කප්පටය, තෝ නො නිදව, (දේශනාහස්තයෙන්) තට කන්මුලැ පහර නො දෙන්නෙමි. කප්පටය, සඟමැද නිදන තෝ පමණ නො දන්නෙහි යයි.

මෙසේ මේ ගාථා කප්පටකුර ස්ථවිරයන් වහන්සේ ...

කප්පටකුර ස්ථවිරගාථා යි.

## සතරවැනි වර්ගය යි.

උද්දානය:

මිගසිර යැ, සිවක යැ, පණ්ඩිත වූ උපවාන යැ, ඉසිදින්නයා, සම්බුල-කච්චාන යැ, ඛිතක යැ, සෙලිස්සරිය යැ, නිසභ යැ, උසභ යැ, කප්පටකුර යැ යන දසතෙරුන්ගේ ගාථා යි.

### 2. 5. 1

201. අහො බුද්ධා අහො ධම්මා අහො නො සත්ථු සම්පදා,
යත්ථ එතාදිසං ධම්මං සාවකො සච්ඡිකාහිසි.

202. අසඞ්ඛෙය්‍යෙසු කප්පෙසු සක්කායාධිගතා අහු[1]
තෙසමයං පච්ඡිමකො චරිමොʼ යං සමුස්සයො,
ජාතිමරණසංසාරො නත්ථි දානි පුනබ්භවොʼති.

ඉත්ථං සුදං ආයස්මා කුමාරකස්සපො ථෙරො ගාථායො අභාසිත්ථාʼති.

කුමාරකස්සපත්ථෙරගාථා.

### 2. 5. 2

203. යො හවෙ දහරො භික්ඛු යුඤ්ජති බුද්ධසාසනෙ,
ජාගරො පතිසුත්තෙසු[2] අමොඝං තස්ස ජීවිතං.

204. තස්මා සද්ධඤ්ච සීලඤ්ච පසාදං ධම්මදස්සනං,
අනුයුඤ්ජෙථ මෙධාවී සරං බුද්ධාන සාසනʼන්ති.

ඉත්ථං සුදං ආයස්මා ධම්මපාලො ථෙරො ගාථායො අභාසිත්ථාʼති.

ධම්මපාලත්ථෙරගාථා.

### 2. 5. 3

205 කස්සින්ද්‍රියානි සමථඞ්ගතානි
අස්සා යථා සාරථිනා සුදන්තා
පහීනමානස්ස අනාසවස්ස
දෙවාපි තස්ස පිහයන්ති තාදිනොʼති.

206. මය්හින්ද්‍රියානි සමථඞ්ගතානි
අස්සා යථා සාරථිනා සුදන්තා
පහීනමානස්ස අනාසවස්ස
දෙවාපි මය්හං පිහයන්ති තාදිනොʼති.

ඉත්ථං සුදං ආයස්මා බ්‍රහ්මාලි ථෙරො ගාථායො අභාසිත්ථාʼති.

බ්‍රහ්මාලිත්ථෙරගාථා.

---

1. අහුං - PTS 2. ස හි සුත්තෙසු - මජසං

2. 5. 1

201. යම් ශාස්තෘ කෙනකුන් වෙත මේ බඳු ශ්‍රාවක තෙම ලොව්තුරු-දහමක් සාක්‍ෂාත් කරන්නේ ද, ඒ බුදුහු අසිරිමත්හ, දහම්හු අසිරිමත්හ, අපගේ ශාස්තෘන් වහන්සේගේ (දශබලාදි) සම්පත්හු ආශ්චර්‍ය්‍යයෝ යි.

202. ගණන් නැති මහාකල්පයන්හි පඤ්චෝපාදානස්කන්ධයෝ මා විසින් ලබනලද්දාහු ය. ඔවුනතුරෙහි මේ පශ්චිම වූ පඤ්චස්කන්ධය යි. මේ අන්තිමශරීරය යි. ජාතිමරණ සහිත සංසාර සඞ්ඛ්‍යාත වූ පුනර්භවයෙක් දැන් නැතැ යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ...

**කුමාරකස්සප ස්ථවිරගාථා යි.**

2. 5. 2

203. එකත්නෙත් යම් තරුණමහණෙක් බුදුසසුන්හි (අප්‍රමාද වැ) වෑයම් කෙරේ ද, (අවිද්‍යානිද්‍රායෙන්) නිදන්නන් අතුරෙහි (ශ්‍රද්ධාදීන්) නිදි වරන්නේ වේ ද, ඔහු ගේ ජීවිතය නො සිස් වෙයි.

204. එහෙයින් නුවණැති මහණ තෙම බුදුන්ගේ අවවාදය සිහි කරන්නේ ශ්‍රද්ධා යැ ශීල යැ තුනුරුවන්හි ප්‍රසාද යැ සියුනස්දහම් දැකුම යැ යන මෙහි ව්‍යායාම කරන්නේ යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් ධම්මපාල ස්ථවිරයන් වහන්සේ ..

**ධම්මපාල ස්ථවිරගාථා යි.**

2. 5. 3

205. කවරක්හු ගේ ඉන්ද්‍රියයෝ අස්දම්සැරිහු විසින් මොනොවට දමනය කරනලද අසුන් මෙන් සන්හුන් බවට ගියාහු ද, ප්‍රහීණ වූ මානය ඇති අනාස්‍රව වූ තාදී (අකම්ප්‍ය) වූ කවරක්හට දෙවියෝ පවා කැමැති වෙත් ද,

206. මා ගේ ඉන්ද්‍රියයෝ අස්දම්සැරිහු විසින් මොනොවට දමනය කරනලද අසුන් මෙන් සන්හුන් බවට ගියාහු යැ, ප්‍රහීණ වූ මානය ඇති අනාස්‍රව වූ තාදී වූ මට දෙවියෝ පවා කැමැති වෙත් යයි.

මෙසේ මේ ගාථා බ්‍රහ්මාලි ස්ථවිරයන් වහන්සේ ...

**බ්‍රහ්මාලි ස්ථවිරගාථා යි.**

2. 5. 4

207. ඡවිපාපක චිත්තභද්දක
මොඝරාජ සතතං සමාහිතො,
හෙමන්තිකසීතකාලරත්තියො
භික්ඛු ත්වංසි කථං කරිස්සසි.

208. සම්පන්නසස්සා මගධා කෙවලා ඉති මෙ සුතං,
පලාලච්ඡන්නකො සෙය්‍යං යථඤ්ඤෙ සුඛජීවිනො'ති.

ඉත්ථං සුදං ආයස්මා මොඝරාජත්ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

මොඝරාජත්ථෙරගාථා

2. 5. 5

209. න උක්ඛිපෙ නො ච පරික්ඛිපෙ පරෙ
න ඔක්ඛිපෙ පාරගතං න එරයෙ,
න චත්තවණ්ණං පරිසාසු බ්‍යාහරෙ
අනුද්ධතො සම්මිතභාණී සුබ්බතො.

210. සුසුඛුමනිපුණත්ථදස්සිනා
මතිකුසලෙන නිවාතවුත්තිනා,
සංසෙවිතවුද්ධසීලිනා
නිබ්බානං න හි තෙන දුල්ලභන්ති.

ඉත්ථං සුදං ආයස්මා විසාඛො පඤ්චාලපුත්තො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

විසාඛපඤ්චාලපුත්තත්ථෙරගාථා.

2. 5. 6

211. නදන්ති මොරා සුසිඛා සුපෙඛුණා
සුනීලගීවා සුමුඛා සුගජ්ජිනො,
සුසද්දලා චාපි මහාමහී අයං
සුබ්‍යාපිතම්බු[1] සුවලාහකං නභං.

212. සුකල්ලරූපො සුමනස්ස ඣායතං[2]
සුනික්ඛමො[3] සාධු සුබුද්ධසාසනෙ,
සුසුක්කසුක්කං නිපුණං සුදුද්දසං
ඵුසාහි තං උත්තමමච්චුතං පදන්ති.

ඉත්ථං සුදං ආයස්මා චූළකො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

චූළකත්ථෙරගාථා.

---

සුසුද්ධතම්බු - පු, සීමු. 2.  2. ඣායිතං -  3. සුනික්ඛමො - සීමු. 1, 2

## 2. 5. 4

207. (රොවින් නට බැවින්) නපුරුසිවි ඇති හද්‍ර වූ සිත් ඇති එම්බා මොඝරාජය, තෙපි එක්වත් සමාහිත සිත් ඇත්තාව, තෙපි පැවිදි වූවාහු (අනුන් සෙනසුන් නො දෙන කල්හි සඟසතු සෙනසුනට ද නො පිවිසැ) හිමපාතසමයෙහි සීත වූ රෑමුළුල්ල කෙසෙයින් දිවි පැවැත් වූහු ද?

208 සියලු මගධ රට පැසුණුගොයම් ඇත්තේ යයි මා විසින් අසනලද පිදුරින් සොයනලද සිරුරු ඇත්තෙම් සුඛජීවී සෙස්සන් සෙයින් ශයනය කෙළෙම් යයි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් මෝඝරාජ ස්ථවිරයන් වහන්සේ ...

**මෝඝරාජ ස්ථවිරගාථා යි.**

## 2. 5. 5

209. තමා නොද හුවාදක්නේ යැ, මෙරමා නොද හෙළාදක්නේ යැ, පහත් කොට නො බලවන්නේ යැ, රහතුන් වහන්සේ නො ගටන්නේ යැ, තමාගුණ පිරිස් මැද නො කියන්නේ යැ, සන්හුන්-නෙක්, පමණ දැන බණන්නෙක්, මනා පැවැතුම් ඇත්තෙක් වන්නේ යි.

210. ඉතා සියුම් තියුණු (සත්‍යප්‍රතීත්‍යසමුත්පාදාදි) අර්ථ දක්නාසුලු වූ ප්‍රඥයෙහි දක්‍ෂ වූ යටත් පැවැතුම් ඇත්තා වූ වෘද්ධයන් සෙවුනාසුලු වූ ඒ මහණහු විසින් යම් හෙයකින් නිර්වාණය දුර්ලභ්‍ය නො වේ ද, එහෙයිනි යි.

මෙසේ මේ ගාථා විසාඛපඤ්චාලිපුත්ත ස්ථවිරයන් වහන්සේ ...

**විසාඛපඤ්චාලිපුත්ත ස්ථවිරගාථා යි.**

## 2. 5. 6

211. මනා සිළු ඇති මනා පිල්කලඹ ඇති මනා නිල්ගෙල ඇති මනා මුවතුඩු ඇති මනහර නාද ඇති මොනරු නද දෙති. මේ මහ-පොළොව ද මනා නිල්තණ ඇත්තී යැ, මොනොවට පැතිරගිය දිය ඇත්තී යැ, අහස සොඳුරු වලාකුළ ඇත්තේ යි.

212. මනාසිත් ඇත්තහුට (ඍතුසප්‍රායාදීන්) අතිශයින් මනොඥ-ස්වභාව ඇත්තේ යැ, එහෙයින් ධ්‍යාන කරව, සම්‍යක්සම්බුද්ධශාසන-යෙහි මනා වීර්‍ය්‍ය ඇති වැ ඒ උතුම් වූ අතිශයින් දැකීමට දුෂ්කර වූ තියුණු වූ සුදෝසුදු අච්‍යුතපදය (නිවන) ස්පර්‍ශ කරව යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් චූළක ස්ථවිරයන් වහන්සේ ...

**චූළක ස්ථවිරගාථා යි.**

2. 5. 7

213. නන්දමානාගතං චිත්තං සූලමාරොපමානකං,
තෙන තෙනෙව වජසි යෙන සූලං කලිඞ්ගරං.

214. තාහං චිත්තකලිං බ්‍රෑමි තං බ්‍රෑමි චිත්තදුබ්භකං,
සත්ථා තෙ දුල්ලභො ලද්ධො මානත්ථෙ මං නියොජයීති.

ඉත්ථං සුදං ආයස්මා අනූපමො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

අනූපමත්ථෙරගාථා.

2. 5. 8

215 සංසරං දීඝමද්ධානං ගතීසු පරිවත්තිසං,
අපස්සං අරියසච්චානි අන්ධභූතො පුථුජ්ජනො.

216. තස්ස මෙ අප්පමත්තස්ස සංසාරා විනළීකතා,
ගති[1] සබ්බා සමුච්ඡින්නා නත්ථි දානි පුනබ්භවො'ති.

ඉත්ථං සුදං ආයස්මා වජ්ජිතො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

වජ්ජිතත්ථෙරගාථා.

2. 5. 9

217. අස්සත්ථෙ හරිතොභාසෙ සංවිරූළ්හම්හි පාදපෙ,
එකං බුද්ධගතං සඤ්ඤං අලභිත්ථං පතිස්සතො.

218. එකතිංසෙ ඉතො කප්පෙ යං සඤ්ඤමලභිං තදා,
තස්සා සඤ්ඤාය වාහසා පත්තො මෙ ආසවක්ඛයො'ති.

ඉත්ථං සුදං ආයස්මා සන්ධිතො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

සන්ධිතත්ථෙරගාථා.

## වග්ගො පඤ්චමො.

තස්සුද්දානං:

කුමාරකස්සපො ථෙරො ධම්මපාලො ච බ්‍රහ්මාලි,
මොඝරාජා විසාඛො ච චූළකො ච අනූපමො,
වජ්ජිතො සන්ධිතො ථෙරො කිලෙසරජවාහනො'ති.

ගාථා දුකනිපාතම්හි නවුති චෙව අට්ඨ ච
ථෙරා එකූනපඤ්ඤාසං භාසිතා නයකොවිදා'ති.

## දුකනිපාතො නිට්ඨිතො.

1. සබ්බාගති - සීමු 1, 2 PTS

2. 5. 7

213. (ඒ ඒ භවයෙහි තෘෂ්ණා විසින්) සතුටු වෙමින් ආ සිත භව සඞ්ඛ්‍යාත සූලයට (දිවස්හුලට) නඟනුයේ භව සඞ්ඛ්‍යාත සූලය, කාමගුණ සඞ්ඛ්‍යාත දම්ගෙඩිය යම් යම් තැනෙකැ ද ඒ ඒ තැන්හි මැ යෙහි.

214. එහෙයින් එම්බා චිත්තය, මම තා කාලකණ්ණිය යි කියමි. තා චිත්තද්‍රෝහී යයි කියමි. තා විසින් දුලීභ වූ ශාස්තෘන් වහන්සේ ලබනලදහ. මා අවැඩෙහි නහමක් යොදව යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් අනුපම ස්ථවිරයන් වහන්සේ ...

අනුපම ස්ථවිරගාථා යි.

2. 5. 8

215. පෘථග්ජන වූ (අවිද්‍යායෙන්) අන්ධ වූ මම ආර්‍ය්‍යසත්‍යයන් නො දක්නෙම් දිගුකලක් මුළුල්ලෙහි (භවයෙහි) සැරිසරමින් සුගතිදුර්ගතීන්හි පෙරළුණෙමි.

216. අප්‍රමාද වූ ඒ මා විසින් සංසාර සඞ්ඛ්‍යාත කර්මක්ලෙශයෝ මුලුසුන් කරනලදහ. සියලු ගති මැනැවින් නසනලදහ. මින් මතු පුනර්භවයෙක් නැතැ යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් වජ්ජිත ස්ථවිරයන් වහන්සේ ...

වජ්ජිත ස්ථවිරගාථා යි.

2. 5. 9

217. පලාවන් පැහැ ඇති මොනොවට වැඩුණු ඇසතු බෝරුක පිහිටි තැන්හි (සිඛී සම්බුදුනට පැනනැගුණු ඇටඹබෝරුක්මුල දී) එළැඹැසිටි සිහි ඇත්තෙම් එක් බුද්ධානුස්මෘති සංඥාවක් ලදිමි.

218. මෙයින් එක්තිස් වන කපෙහි එදා මා විසින් යම් බුද්ධානුස්මෘති සංඥාවක් ලැබුයෙම් ද, ඒ සංඥාව උපනිශ්‍රය කොට ගෙන මා විසින් ආශ්‍රවක්ෂය සඞ්ඛ්‍යාත නිරෝධය ලබනලදැ යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් සණ්ඨිත ස්ථවිරයන් වහන්සේ ...

සණ්ඨිත ස්ථවිරගාථා යි.

## පස් වැනි වර්ගය යි.

උද්දානය:

කුමාරකස්සප යැ, ධම්මපාල යැ, බ්‍රහ්මාලි යැ, මොඝරාජ යැ, විසාඛ යැ, චූලක යැ, අනූපම යැ, වජ්ජිත යැ, සණ්ඨිත යැ, යන තෙරවරුන් වදාළගාථා යි.

දුකනිපාතයෙහි ගාථා අට අනූවක් ද, නයෙහි නිපුණ එකුන්පනස් තෙර කෙනෙක් ද කියනලදහ.

## දුකනිපාතය නිමි.

# 3. තිකනිපාතො

## 3. 1. 1

219. අයොනි සුද්ධිමන්වෙසං අග්ගිං පරිචරිං වනෙ,
සුද්ධිමග්ගං අජානන්තො අකාසිං අමරං තපං.

220. තං සුඛෙන සුඛං ලද්ධං පස්ස ධම්මසුධම්මතං,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

221. බ්‍රහ්මබන්ධු පුරෙ ආසිං ඉදානි ඛොම්හි බ්‍රාහ්මණො,
තෙවිජ්ජො නහාතකො[1] චම්හි සොත්තියො චම්හි වෙදගූ’ති.

ඉත්ථං සුදං ආයස්මා අග්ගිකභාරද්වාජො ථෙරො ගාථායො අභාසිත්ථා’ති.

**අග්ගිකභාරද්වාජත්ථෙරගාථා.**

## 3. 1. 2

222. පඤ්චාහාහං පබ්බජිතො සෙඛො අප්පත්තමානසො,
විහාරං මෙ පවිට්ඨස්ස චෙතසො පණිධී අහු.

223. නාසිස්සං[2] න පිවිස්සාමි විහාරතො න නික්ඛමෙ,
නපි පස්සං නිපාතෙස්සං[3] තණ්හාසල්ලෙ අනූහතෙ.

224. තස්ස මෙවං විහරතො පස්ස විරියපරක්කමං,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසන’න්ති.

ඉත්ථං සුදං ආයස්මා පච්චයො ථෙරො ගාථායො අභාසිත්ථා’ති.

**පච්චයත්ථෙරගාථා.**

## 3. 1. 3

225. යො පුබ්බෙ කරණීයානි පච්ඡා සො කාතුමිච්ඡති,
සුඛා සො ධංසතෙ ඨානා පච්ඡා ච මනුතප්පති.

226. යං හි කයිරා තං හි වදෙ යං න කයිරා න තං වදෙ,
අකරොන්තං භාසමානං[4] පරිජානන්ති පණ්ඩිතා.

227. සුසුඛං වත නිබ්බානං සම්මාසම්බුද්ධදෙසිතං,
අසොකං විරජං ඛෙමං යත්ථ දුක්ඛං නිරුජ්ඣතී’ති.

ඉත්ථං සුදං ආයස්මා බක්කුලො ථෙරො ගාථායො අභාසිත්ථා’ති.

**බක්කුලත්ථෙරගාථා.**

---

1 න්හාතකො - සිමු 1. PTS   2 නාසෙස්සං - ට.   3. න නිපාතෙස්සං - ට.
4 භාසමානං නං - ට.

# 3. තිකනිපාතය

### 3. 1. 1

219. අනුපායයෙන් (නොමඟින්) සංසාරශුද්ධිය සොයන්නෙම් වෙනෙහි ගිනි පිදුයෙමි. ශුද්ධියට මාර්ගය නො දන්නෙම් (පඤ්චතාපනාදි) අමරතපස් කෙළෙමි.

220. ඒ නිවන් සුවය සුවසේ (සුඛප්‍රතිපදායෙන්) ලබනලදී. ශාසනධර්මයා ගේ සුධර්මතාව (නෛර්‍යාණිකභාවය) බලව. මා විසින් ත්‍රිවිද්‍යාව ලබනලද. බුදුරදුන්ගේ අවවාදය කරනලදී.

221. පෙර (ජාතිමාත්‍රයෙන් ප්‍රඥප්ති විසින්) බ්‍රාහ්මණ වීමි. දැන් (බාහිතපාපී වන බැවින් පරමාර්ථ විසින්) බ්‍රාහ්මණ වෙමි. ත්‍රිවිද්‍යා ඇත්තෙම් වෙමි. (සෝදාහල කෙලෙස්මල ඇති බැවින්) ස්නාතක ද වෙමි. ශ්‍රොත්‍රිය ද වෙමි. වේද සඞ්ඛ්‍යාත මාර්ගඥානයෙන් සංසාරමහෞඝයාගේ නොහොත් චතුස්සත්‍යයාගේ පාරයට ගිය බැවින් වේදගූ ද වෙමි යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් අඞ්ගණිකභාරද්වාජ ස්ථවිරයන්වහන්සේ ...

**අඞ්ගණිකභාරද්වාජ ස්ථවිරගාථා යි.**

### 3. 1. 2

222. මම පැවිදි වැ පස්දිනක් ඇතියෙමි. නො පත් අග්‍රමාර්ගී ඇතියෙම් ශෛක්‍ෂ වීමි. විහාරයට (ඔවරකයට) පිවිසි මට චේතොපණිධියක් (ප්‍රාර්ථනාවක්) වූ යැ:

223. 'තෘෂ්ණාශල්‍යය නුපුළ කල්හි නො වළඳන්නෙමි, නො බොන්නෙමි, ඔවරකයෙන් නො නික්මෙන්නෙමි, දැළයෙන් එක් ඇළයකුදු නො හොවන්නෙමි'යි.

224. මෙසෙයින් වසන මා ගේ වීර්‍යපරාක්‍රමය බලව, (මා විසින්) ත්‍රිවිද්‍යාව ලබනලද, බුදුරදුන්ගේ අවවාදය කරනලද්ද යි

මෙසේ මේ ගාථා ආයුෂ්මත් පච්චය ස්ථවිරයන් වහන්සේ ...

**පච්චය ස්ථවිරගාථා යි.**

### 3. 1. 3

225. යමෙක් පළමු කටයුතු දැය (නො කොට) පසුව කරනු කැමැති වේ ද, හෙතෙම සුඛස්ථානයෙන් (ස්වර්ගයෙන් හා මෝක්‍ෂයෙන්) පිරිහෙයි, පසුතැවෙන්නේ ද වේ.

226. යමක් මැ කරන්නේ නම් එය මැ කියන්නේ යැ. යමක් නො කරන්නේ නම් එය නො කියන්නේ යැ. ඒ කියමින් නො කරන්නහුට නුවණැත්තෝ බුහුමන් නො කෙරෙත්.

227. යම් තැනෙකැ සසරදුක නිරුද්ධ වේ නම් සම්බුදුන් විසින් දෙසන ලද ඒ ශෝක රහිත වූ රාගාදිරජස් රහිත වූ නිරුපද්‍රැත වූ නිවන එකන්නෙන් මහා සුවය වේ යයි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන් වහන්සේ ...

**බක්කුල ස්ථවිරගාථා යි.**

## 3. 1. 4

228. සුඛඤ්චෙ ජීවිතුං ඉච්ඡෙ සාමඤ්ඤස්මිං අපෙක්ඛවා,
සඞ්ඝිකං නාතිමඤ්ඤෙය්‍ය චීවරං පානභොජනං.

229. සුඛඤ්චෙ ජීවිතුං ඉච්ඡෙ සාමඤ්ඤස්මිං අපෙක්ඛවා,
අහි මූසිකසොබ්භං ච සෙවෙථ සයනාසනං.

230. සුඛඤ්චෙ ජීවිතුං ඉච්ඡෙ සාමඤ්ඤස්මිං අපෙක්ඛවා,
ඉතරීතරෙන තුස්සෙය්‍ය එකධම්මඤ්ච භාවයෙති.

ඉත්ථං සුදං ආයස්මා ධනියො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**ධනියත්ථෙරගාථං.**

## 3. 1. 5

231. අතිසීතං අතිඋණ්හං අතිසායමිදං අහු,
ඉති විස්සට්ඨකම්මන්තෙ ඛණා අච්චෙන්ති මාණවෙ.

232. යො ච[1] සීතඤ්ච උණ්හඤ්ච තිණා භිය්‍යො න මඤ්ඤති,
කරං පුරිසකිච්චානි සො සුඛා න විහායති.

233. දබ්බං කුසං පොටකිලං උසීරං මුඤ්ජබබ්බජං[2]
උරසා පනුදිස්සාමි[3] විවෙකමනුබ්‍රූහයන්ති.

ඉත්ථං සුදං ආයස්මා මාතඞ්ගපුත්තො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**මාතඞ්ගපුත්තත්ථෙරගාථා.**

## 3. 1. 6

234. යෙ චිත්තකථී බහුස්සුතා
සමණා පාටලිපුත්තවාසිනො,
තෙසඤ්ඤතරොයමායුමා[4]
ද්වාරෙ තිට්ඨති ඛුජ්ජසොභිතො.

235. යෙ චිත්තකථී බහුස්සුතා
සමණා පාටලිපුත්තවාසිනො
තෙසඤ්ඤතරොයමායුවා
ද්වාරෙ තිට්ඨති මාලුතෙරිතො.

236. සුයුද්ධෙන සුයිට්ඨෙන සඞ්ගාමවිජයෙන ච,
බ්‍රහ්මචරියානුචිණ්ණෙන එවායං සුඛමෙධතී'ති.

ඉත්ථං සුදං ආයස්මා ඛුජ්ජසොභිතො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**ඛුජ්ජසොභිතත්ථෙරගාථං.**

---

1. යො'ධ - සිමු 1, 2 PTS. 2. මුඤ්ජපබ්බජං - මජසං 3. පනුදහිස්සාමි - ට, PTS.
4. තෙසඤ්ඤතරොයමායුවා - බහුසු

3. 1. 4

228. ශ්‍රමණභාවයෙහි අපේක්‍ෂා ඇත්තේ ඉදින් සුවසේ ජීවත්වන්නට කැමැත්තේ නම් සඟසතු සිවුරු පැන් - බොජුන් අවමන් නො කරන්නේ යැ.

229. ශ්‍රමණභාවයෙහි අපේක්‍ෂා ඇත්තේ ඉදින් සුවසේ ජීවත්වනු කැමැත්තේ නම් මීයකු විසින් කණිනලද බිලය සෙවුනා සර්පයකු සෙයින් සෙනසුන සෙවුනේ යැ.

230. ශ්‍රමණභාවයෙහි අපේක්‍ෂා ඇත්තේ ඉදින් සුවසේ ජීවත්වනු කැමැත්තේ නම් යථාලබ්ධප්‍රත්‍යයෙන් තුටු වන්නේ යැ. එක් මැ අප්‍රමාදධර්මය වඩන්නේ යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් ධනිය ස්ථවිරයන් වහන්සේ ...

ධනිය ස්ථවිරගාථා යි.

3. 1. 5

231. ක්‍ෂණයෝ 'මෙකල ඉතා සිහිලැ මෙකල ඉතා උණුයැ මෙකල ඉතා සවසැ' යි හරනාලද කර්මාන්ත ඇති මිනිසුන් ඉක්මැ යෙත්.

232. යමෙකුත් සිහිල් කලත් උණුකලත් තණපතින් වැඩියක්කොට නො තකා ද, පුරුෂකෘත්‍යයන් කරන්නා වූ හෙතෙම සුවයෙන් නො පිරිහේ.

233. විවේකසුව වඩනුයෙම් හිතණ කුසතණ කටුපඳුරු (වැලුක්?) සුවඳහොට මුදුතණ බබුස්තණ උරයෙනුදු නෙරැපියන්නෙමි. (පයින් ඇක්මෙනු කියනු කිම?)

මෙසේ මේ ගාථා ආයුෂ්මත් මාතඞ්ගපුත්ත ස්ථවිරයන් වහන්සේ ...

මාතඞ්ගපුත්ත ස්ථවිරගාථා යි.

3. 1. 6

234. පැලලුප්නුවරවැසි විත්‍රකථා ඇති බහුශ්‍රැත වූ යම් ශ්‍රමණ කෙනෙක් වෙද්ද, ඔවුනතුරෙහි අන්‍යතර වූ මේ ආයුෂ්මත් ඛුජ්ජසොභිත තෙර දෙරටුවෙහි සිටී.

235. පැලලුප්නුවරවැසි විත්‍රකථා ඇති බහුශ්‍රැතවූ යම් ශ්‍රමණ කෙනෙක් වෙත් නම් ඔවුනතුරෙහි අන්‍යතර වූ මේ ආයුෂ්මත් තෙමේ (ඍද්ධි-විත්තයෙන් උපන්) පවනින් ආයේ දෙරටුවෙහි සිටී.

236. (තදඞ්ගවිෂ්කම්භණ විසින්) මනා වූ කෙලෙශයුද්ධයෙන් ද සත්ප්‍රාය වූ ධර්මදානයෙන් ද (සමුච්ඡේදප්‍රහාණ විසින්) ලබනලද කෙලශසඞ්ග්‍රාම-විජයයෙන් ද පුහුණු කළ මගබඹසරින් ද මෙසේ මේ තෙමේ (ඵලසමවත්) සුවවිඳී.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් ඛුජ්ජසොභිත ස්ථවිරයන් වහන්සේ...

ඛුජ්ජසොභිත ස්ථවිරගාථා යි.

### 3. 1. 7

237. යොධ කොචි මනුස්සෙසු පරපාණානි හිංසති,
අස්මා ලොකා පරම්හා ච උභයා ධංසතෙ නරො.

238. යො ච මෙත්තෙන චිත්තෙන සබ්බපාණානුකම්පති,
බහුං[1] සො පසවති පුඤ්ඤං තෙන තාදිසකො[2] නරො.

239. සුභාසිතස්ස සික්ඛෙථ සමණූපාසනස්ස ච
එකාසනස්ස රහො චිත්තවූපසමස්ස චාති.

ඉත්ථං සුදං ආයස්මා වාරණො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

වාරණත්ථෙරගාථා.

### 3. 1. 8

240. එකොපි සද්ධො මෙධාවී අස්සද්ධානීධ ඤාතිනං,
ධම්මට්ඨො සීලසම්පන්නො හොති අත්ථාය බන්ධුනං,

241. නිග්ගය්හ අනුකම්පාය චොදිතො ඤාතයො මයා,
ඤාතිබන්ධවපෙමෙන කාරං කත්වාන භික්ඛුසු.

242. තෙ අබ්භතීතා කාලංකතා පත්තා තෙ තිදිවං සුඛං,
භාතරො මය්හං මාතා ච මොදන්ති කාමකාමිනො'ති.

ඉත්ථං සුදං ආයස්මා පස්සිකො[3] ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

පස්සිකත්ථෙරගාථා.

### 3. 1. 9

243. කාලපබ්බඞ්ගසඞ්කාසො[4] කිසො ධමනිසන්ථතො,
මත්තඤ්ඤූ අන්නපානම්හි අදීනමනසො නරො.

244. ඵුට්ඨො ඩංසෙහි මකසෙහි අරඤ්ඤස්මිං බ්‍රහාවනෙ,
නාගො සඞ්ගාමසීසෙව සතො තත්‍රාධිවාසයෙ.

245 යථා බ්‍රහ්මා තථා එකො යථා දෙවො තථා දුවෙ,
යථා ගාමො තථා තයො කොලාහලං තතුත්තරින්ති.

ඉත්ථං සුදං ආයස්මා යසොජො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

යසොජත්ථෙරගාථා.

---

1. බහුංහි - PTS 2. පුඤ්ඤංතාදිසකො - PTS. 3. වස්සිකො - මජසං
4. කාලපබ්බඞ්ගසඞ්කාසො - සිමු, 1, 2.

### 3. 1. 7.

237. මෙලොවැ මිනිසුන් අතුරෙහි යම් කිසිවෙක් පරපණ නසා ද, ඒ මිනිස් තෙම මෙලොවින් ද පරලොවින් ද යන දෙලොවින් මැ පිරිහෙයි.

238. තවද යමෙක් මෙත්සිතින් යුතු වැ සියලු සතුන් කෙරෙහි අනුකම්පා කෙරේ ද, එහෙයින් ඒ එබඳු පුරිස් තෙමේ බොහෝ පින් රැස් කෙරෙයි.

239. සුභාෂිත සඞ්ඛ්‍යාත පර්‍යාප්තිධර්මය උගන්නේ යැ, (ශමිතපාපී) ශ්‍රමණයන් ඇසුරු කිරීම ද එකලා වැ (කම්මට්ඨානානුයොග විසින්) එක් මැ නිෂද්‍යාව ද, (ක්ලේශප්‍රහාණ විසින්) චිත්තයා ගේ ව්‍යුපශමය ද හික්මෙන්නේ යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් වාරණ ස්ථවිරයන් වහන්සේ ...

වාරණ ස්ථවිරගාථා යි.

### 3. 1. 8

240. සැදැහැ ඇති, නුවණ ඇති ලොව්තුරුදහම්හි සිටි සීලසම්පන්න වූ එක් පුද්ගලයා පවා මෙලොවැ සැදැහැ නැති බන්ධු සඞ්ඛ්‍යාත ඥාතීන්ට වැඩ පිණිස වෙයි.

241. මා විසින් අනුකම්පායෙන් නිග්‍රහ කොට චූදිත වූ ඥාතිහු ඥාතිබන්ධුප්‍රේමයෙන් (අවවාදයෙහි සිට) භික්ෂූන් විෂයයෙහි සත්කාර කොට,

242. මාගේ සොහොයුරෝ ද මෑණියෝ ද කලුරිය කළාහු මෙලොව ඉක්මගියාහු දෙව්ලොවැ සුව ලැබ කැමැති සැපත් ඇතියාහු සතුටු වෙත්.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් පස්සික ස්ථවිරයන් වහන්සේ ...

පස්සික ස්ථවිරගාථා යි.

### 3. 1. 9

243. කළුවැල්පුරුක් බඳු අවයව ඇති කෘශ වූ ඉපිලගිය නහර ඇති ආහාරපානයෙහි පමණ දන්නා වූ අදීන වූ සිත් ඇති පුරුෂ තෙම,

244. අරනෙහි මහවෙනෙහි මැස්සන් විසින් ද මදුරුවන් විසින් ද උපද්‍රැත වූයේ සඞ්ග්‍රාමභූමියෙහි හස්තිරාජයකු සෙයින් සිහි ඇති වැ ඉවසන්නේ යැ.

245. හුදෙකලා වූයේ බ්‍රහ්මයා බඳු යැ දෙදෙන දෙවියකු බඳු යැ, තිදෙන ගමක් බඳු යැ ඉන් මතු කෝලහලයක් බඳු යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් යසොජ ස්ථවිරයන් වහන්සේ ...

යසොජ ස්ථවිරගාථා යි.

## 3. 1. 10

246. අහු තුය්හං පුරෙ සද්ධා සා තෙ අජ්ජ න විජ්ජති,
යං තුය්හං තුය්හමෙවෙතං නත්ථි දුච්චරිතං මම.

247. අනිච්චා හි චලා සද්ධා එවං දිට්ඨා හි සා මයා,
රජ්ජන්තිපි විරජ්ජන්ති තත්ථ කිං ජීය්‍යතෙ මුනි.

248. පච්චති මුනිනො භත්තං ථොක ථොකං කුලෙ කුලෙ,
පිණ්ඩිකාය චරිස්සාමි අත්ථි ජඞ්ඝාබලං මමා’ති.

ඉත්ථං සුදං ආයස්මා සාවිමිත්තියො ථෙරො ගාථායො අභාසිත්ථා’ති

**සාවිමිත්තියථෙරගාථා.**

## 3. 1. 11

249. සද්ධාය අභිනික්ඛම්ම නවපබ්බජිතො නවො,
මිත්තෙ භජෙය්‍ය කල්‍යාණෙ සුද්ධාජීවෙ අතන්දිතෙ.

250. සද්ධාය අභිනික්ඛම්ම නවපබ්බජිතො නවො,
සඞ්ඝස්මිං විහරං භික්ඛු සික්ඛෙථ විනයං බුධො.

251. සද්ධාය අභිනික්ඛම්ම නවපබ්බජිතො නවො.
කප්පාකප්පෙසු කුසලො විහරෙය්‍ය[1] අපුරක්ඛතො.

ඉත්ථං සුදං ආයස්මා උපාලිත්ථෙරො ගාථායො අභාසිත්ථා’ති

**උපාලිත්ථෙරගාථා.**

## 3. 1. 12

252. පණ්ඩිතං වත මං සන්තං අලමත්ථවිචින්තකං,
පඤ්චකාමගුණා ලොකෙ සම්මොහා පාතයිංසු මං.

253. පක්ඛන්තො[2] මාරවිසයෙ දළ්හසල්ලසමප්පිතො,
අසක්ඛිං මච්චුරාජස්ස අහං පාසා පමුච්චිතුං.

254. සබ්බෙ කාමා පහීනා මෙ භවා සබ්බෙ විදළිතා,[3]
වික්ඛීණො ජාතිසංසාරො නත්ථි දානි පුනබ්භවො’ති.

ඉත්ථං සුදං ආයස්මා උත්තරපාලත්ථෙරො ගාථායො අභාසිත්ථා’ති.

**උත්තරපාලත්ථෙරගාථා**

---

1. චරෙය්‍ය - සිමු. 1, PTS. 2. පක්ඛන්නො - සිමු. 1, 9. 3 පදාලිතා - සිමු 2 PTS.

## 3. 1. 10

246. පෙර තට (මා කෙරෙහි) ශ්‍රද්ධා විය. එය දැන් තට නැත. යමක් තාගේ නම් තෙල දැය තට මැ වේවා මාගේ දුශ්චරිතයෙක් නැත.

247 යම් හෙයකින් (පෘථග්ජන) ශ්‍රද්ධාව අනිත්‍ය ද එහෙයින් චල වෙයි. මා විසින් ඒ මෙසේ දක්නා ලද යැ, රක්ත ද වෙති විරක්ත ද වෙති, කිම එහි මුනි තෙම පිරිහේ ද?

248. මුනිහුට කුලයක් පාසා බත් ටික ටික පැසෙයි, පිඬු පිණිස හැසිරෙන්නෙමි, මාගේ ජඞ්ඝාබල ඇති.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් සාටිමත්තිය ස්ථවිරයන් වහන්සේ ...

සාටිමත්තිය ස්ථවිරගාථා යි.

## 3. 1. 11

249. සැදැහැයෙන් ගිහිගෙන් නික්මැ අලුතැ පැවිදි වූ නවක තෙම සම්‍යගාජීව ඇති ආරබ්ධවීර්‍ය්‍ය ඇති කල්‍යාණමිත්‍රයන් භජනය කරන්නේ යැ.

250. සැදැහැයෙන් ගිහිගෙන් නික්මැ අලුතැ පැවිදි වූ නුවණැති නවක මහණ තෙම සඞ්ඝයා කෙරෙහි වෙසෙමින් විනය උගන්නේ යැ.

251 සැදැහැයෙන් නික්මැ අලුතැ පැවිදි වූ නවක තෙම කැප අකැප දැයෙහි නිපුණ වැ තෘෂ්ණාදීන් පුරස්කෘත නො වැ වසන්නේ යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේ ...

උපාලි ස්ථවිරගාථා යි.

## 3. 1. 12

252. ලොවැ සම්මෝහයට හේතු වූ පස්කම්ගුණයෝ එකත්හෙන් නුවණැති වූ ආත්මාර්පරාර්ථචින්තනයෙහි සමර්ථ වූ මා හෙළාලූහ.

253. කෙලෙස් මරහුගේ ගෝචරයෙහි පිවිසියෙම් දැඩි වූ (රාග) ශල්‍යයෙන් විදුනා ලද්දෙම් මම මාරයාගේ පාශයෙන් මිදෙන්නට හැකි වීමි.

254. මා විසින් සියලු කාමයෝ ප්‍රහීණ කරනලදහ. සියලු භවයෝ නසනලදහ. ජාති සංසාරය ක්‍ෂය කරනලද්දේ යැ. මින් මතු පුනර්භවයෙක් නැති.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් උත්තරපාල ස්ථවිරයන් වහන්සේ ...

උත්තරපාල ස්ථවිරගාථා යි.

### 3. 1. 13

255. සුණාථ ඤාතයො සබ්බෙ යාවන්තෙත්ථ සමාගතා.
ධම්මං වො දෙසයිස්සාමි දුක්ඛා ජාති පුනප්පුනං.

256. ආරභථ නික්කමථ යුඤ්ජථ බුද්ධසාසනෙ,
ධුනාථ මච්චුනො සෙනං නළාගාරං ව කුඤ්ජරො.

257 යො ඉමස්මිං ධම්මවිනයෙ අප්පමත්තො විහෙස්සති[1]
පහාය ජාතිසංසාරං දුක්ඛස්සන්තං කරිස්සතී'ති.

ඉත්ථං සුදං ආයස්මා අභිභූතො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

අභිභූතත්ථෙරගාථා.

### 3. 1. 14

258. සංසරං හි නිරයං අගච්ඡිසං[2]
පෙතලොකමගමං පුනප්පුනං,
දුක්ඛමම්හි පි තිරච්ඡානයොනියං[3]
නෙකධා හි වුසිතං චිරං මයා.

259. මානුසො පි ච භවොභිරාධිතො
සග්ගකායමගමං සකිං සකිං,
රූපධාතුසු අරූපධාතුසු
නෙවසඤ්ඤිසු අසඤ්ඤිසුට්ඨිතං.

260. සම්භවා සුවිදිතා අසාරකා
සඞ්ඛතා පචලිතා සදෙරිතා,
තං විදිත්ව[4] මහමත්තසම්භවං,
සන්තිමෙව සතිමා සමජ්ඣග'න්ති.

ඉත්ථං සුදං ආයස්මා ගොතමො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

ගොතමත්ථෙරගාථා.

### 3. 1. 15

261. යො පුබ්බෙ කරණීයානි පච්ඡා සො කාතුමිච්ඡති,
සුඛා සො ධංසතෙ ඨානා පච්ඡා ච මනුතප්පති.

262. යඤ්හි කයිරා තඤ්හි වදෙ යං න කයිරා න තං වදෙ,
අකරොන්තං භාසමානං[5] පරිජානන්ති පණ්ඩිතා.

263. සුසුඛං වත නිබ්බානං සම්මාසම්බුද්ධදෙසිතං,
අසොකං විරජං ඛෙමං යත්ථ දුක්ඛං නිරුජ්ඣතී'ති.

ඉත්ථං සුදං ආයස්මා හාරිතො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

හාරිතත්ථෙරගාථා.

---

1 විහස්සති - සීමු 1, 2, PTS. 2 අගච්ඡිස්සං - බහුසු, අගමිස්සං - ප
3 තිරච්ඡානයොනියා - PTS. 4 විදිත්වා - බහුසු 5 භාසමානං තං - ප

### 3. 1. 13

255. මෙහි රැස්වූ තාක් නෑ වූ තෙපි සියල්ලෝ (මා ගේ වචනය) අසවු, තොපට මම දහම් දෙසන්නෙමි, පුනපුනා ඉපැද්ම දුකෙකි.

256. වීර්‍ය්‍යය කරවු, කුසීත බැවින් නික්මෙවු, බුදුසසුන්හි යුක්තප්‍රයුක්ත වවු, නළාගාරයක් (බටගසින් කළ ගෙයක්) වනසන ඇත්රජකු සෙයින් මරහුගේ සෙනඟ (කෙලෙස්) විධ්වංසනය කරවු.

257. යමෙක් මේ ධම්මවිනයයෙහි අප්‍රමාද වැ වාසය කරන්නේ ද (හෙතෙම) ජාතිසංසාරය හැරදමා දුක් කෙළවර කරන්නේ යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් අභිභූත ස්ථවිරයන් වහන්සේ ...

අභිභූත ස්ථවිරගාථා යි.

### 3. 1. 14

258 සසරැ සැරිසරන්නෙම් පුනපුනා නිරයට ගියෙමි, ප්‍රේතලෝකයට ගියෙමි, ඉවසිය නො හෙන්නා වූ තිරිසන් යොන්හි දු මා නොයෙක් අයුරින් බොහෝ කල් විසූමිරු යැ.

259. (මා විසින්) මිනිසත් බව ද ලබනලද (මම) කාමාවචරදිව්‍ය-කායට ද වරින් වරැ ගියෙමි, (මා) රූපභවයෙහි අරූපභවයෙහි නෙවසංඥනාසංඥභවයෙහි අසංඥභවයෙහි සිටිමිරු යැ.

260. (මා විසින්) අසාර වූ සංඛත (ප්‍රත්‍යයසමවාය විසින් කරන ලද) වූ අස්ථිර වූ හැම කල්හි කම්පිත (භඞ්ගුර) වූ කාමභවාදි සම්භවයෝ මොනොවට දන්නාලදහ. මම අධ්‍යාත්මයෙහි උපන් ඒ සඞ්ඛතයාගේ ස්වභාවය දැනගෙන (මාර්ගප්‍රඥසමෘතියෙන්) සිහි ඇතියෙම් නිවනට මැ පැමිණියෙමි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් ගොතම ස්ථවිරයන් වහන්සේ ...

ගොතම ස්ථවිරගාථා යි.

### 3 1. 15

261. යමෙක් පළමු කටයුතු දැය පසුව කරනු කැමැති වේ ද, හෙතෙම සුඛස්ථානයෙන් (ස්වර්ගයෙන් හා මොක්‍ෂයෙන්) පිරිහෙයි, පසුතැවෙන්-නේ ද වේ.

262. යමක් මැ කරන්නේ නම් එය මැ කියන්නේ යැ, යමක් නො කරන්නේ නම් එය නො කියන්නේ යැ, ඒ කියමින් නො කරන්නහුට නුවණැතියෝ බුහුමන් නො කෙරෙත්.

263. යම් තැනෙකැ සසරදුක් නිරුද්ධ වේ නම් සම්බුදුන් විසින් දෙශිත වූ ඒ ශොක රහිත වූ රාගාදිරජස් රහිත වූ නිරුපද්‍රැත වූ නිවන එකාන්තෙන් මනා සුවය වේ යයි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත්, හාරිතස්ථවිරයන් වහන්සේ ...

හාරිත ස්ථවිරගාථා යි.

### 3. 1. 16

264. පාපමිත්තෙ විවජ්ජෙත්වා භජෙය්‍යුත්තමපුග්ගලෙ
ඔවාදෙ චස්ස තිට්ඨෙය්‍ය පත්ථෙන්තො අචලං සුඛං.

265. පරිත්තං දාරුමාරුය්හ යථා සීදෙ මහණ්ණවෙ,
එවං කුසීතමාගම්ම සාධුජීවීපි සීදති,
තස්මා තං පරිවජ්ජෙය්‍ය කුසීතං හීනවීරියං.

266. පවිවිත්තෙහි අරියෙහි පහිතත්තෙහි ඣායිහි
නිච්චං ආරද්ධවිරියෙහි[1] පණ්ඩිතෙහි සහාවසෙ'ති.

ඉත්ථං සුදං ආයස්මා විමලො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

විමලත්ථෙරගාථා.

තස්සුද්දානං:

අඞ්ගණිකො භාරද්වාජො පච්චයො බාකුලො ඉසි
ධනියො මාතඞ්ගපුත්තො සොභිතො වාරණො ඉසි

වස්සිකො ච යසොජො ච සාටිමත්තියුපාලි ච
උත්තරපාලො අභිභූතො ගොතමො හාරිතො'පි ච

ථෙරො තිකනිපාතම්හි නිබ්බානෙ විමලො කතො
අට්ඨතාලීස ගාථායො ථෙරා සොළස කිත්තිතා'ති.

## තිකනිපාතො නිට්ඨිතො.

1 නිච්චාරද්ධ විරියෙහි - සිමු 1, 2, PTS

## 3. 1. 16

264. නිවන්සුව පතනුයේ පාපමිත්‍රයන් හැරදමා උත්තමපුද්ගලයන් සෙවුනේ යැ. ඔහුගේ අවවාදයෙහි ද සිටුනේ යැ.

265. කුඩා දඬුකඩකට නැඟැ යම්සේ මහසයුරෙහි ගිලෙන්නේ ද, එසෙයින් කුසීතයා කරා පැමිණැ මනාදිවිපෙවෙත් ඇත්තේ ද ගිලෙයි (පිරිහෙයි.)

266. එහෙයින් ඒ කුසීත වූ හීනවීර්‍ය්‍ය ඇත්තහු දුරලන්නේ යැ, කායවිවෙකය ඇති ආර්‍ය්‍ය වූ නිවනට යැවූ සිත් ඇති ධ්‍යාන කරනසුලු වූ නිරතුරු රැකුළු වැර ඇති නුවණැතියන් හා එක් වැ වසන්නේ යි.

මෙසේ මේ ගාථා ආයුෂ්මත් විමල ස්ථවිරයන් වහන්සේ ...

**විමල ස්ථවිරගාථා යි.**

උද්දානය:

තිකනිපාතයෙහි ගාථා ප්‍රකාශ කළ අඞ්ගණික, භාරද්වාජය, පච්චයය, බක්කුලය, ධනියය, මාතඞ්ගපුත්තය, (ඛුජ්ජ) සොභිතය, වාරණය, වස්සිකය, යසොජය, සාටිමත්තියය, උපාලිය, උත්තරපාලය, අභිභූතය, ගොතමය, හාරිතය, විමලස්ථවිරය යයි සොළොස් තෙර කෙනෙක් වෙති, ගාථා අටසාළිසෙකි.

## තිකනිපාතය නිමි.

# 4. චතුක්කනිපාතො

### 4. 1. 1

267. අලඞ්කතා සුවසනා මාලිනී චන්දනුස්සදා,
මජ්ඣෙ මහාපථෙ නාරී තුරියෙ නච්චති නාටකී.

268. පිණ්ඩිකාය පවිට්ඨාහං ගච්ඡන්තො නං උදික්ඛිසං,[1]
අලඞ්කතං සුවසනං මච්චුපාසංව ඔඩ්ඩිතං.

269. තතො මෙ මනසීකාරො යොනිසො උදපජ්ජථ,
ආදීනවො පාතුරහු නිබ්බිදා සමතිට්ඨථ.

270. තතො චිත්තං විමුච්චි මෙ පස්ස ධම්මසුධම්මතං,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසන'න්ති.

ඉත්ථං සුදං ආයස්මා නාගසමාලො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**නාගසමාලත්ථෙරගාථා.**

### 4. 1. 2

271. අහං මිද්ධෙන පකතො විහාරා උපනික්ඛමිං,
චඞ්කමං අභිරූහන්තො තත්ථෙව පපතිං[2] ඡමා.

272. ගත්තානි පරිමජ්ජිත්වා පුනපාරුය්හ චඞ්කමං,
චඞ්කමෙ චඞ්කමිං සොහං අජ්ඣත්තා සුසමාහිතො.

273. තතො මෙ මනසීකාරො යොනිසො උදපජ්ජථ,
ආදීනවො පාතුරහු නිබ්බිදා සමතිට්ඨථ.

274. තතො චිත්තං විමුච්චි මෙ පස්ස ධම්මසුධම්මතං,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසන'න්ති.

ඉත්ථං සුදං ආයස්මා භගුථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**භගුත්ථෙරගාථා.**

### 4. 1. 3

275. පරෙ ච න විජානන්ති මයමෙත්ථ යමාමසෙ,
යෙ ච තත්ථ විජානන්ති තතො සම්මන්ති මෙධගා.

276. යදා ච අවිජානන්තා ඉරියන්ත්‍යමරා[3] විය,
විජානන්ති ච යෙ ධම්මං ආතුරෙසු අනාතුරා.

277. යං කිඤ්චි සිථිලං කම්මං සඞ්කිලිට්ඨං ච යං වතං,
සඞ්කස්සරං බ්‍රහ්මචරියං න තං හොති මහප්ඵලං.

278. යස්ස සබ්‍රහ්මචාරිසු ගාරවො නූපලබ්භති,
ආරකා හොති සද්ධම්මා නභං පුථුවියා යථා'ති.

ඉත්ථං සුදං ආයස්මා සභියො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**සභියත්ථෙරගාථා.**

---

1 උදක්ඛිසං - ප    2 පපතෙ - මජසං    3 ඉරියන්තමරා - මජසං

# 4. චතුක්කනිපාතය

## 4. 1. 1

267. අබරණින් සැදුණු (හත්) මනා වස්ත්‍ර ඇති (පලන්) මල්දම් ඇති සඳුන් අලෙව් දුන් සිරුරු ඇති නලඟනක් මාවත මැද තූර්‍ය්‍යවාදනය කරන කල්හි නටයි.

268. පිඩු පිණිස පිවිසි මම යන්නෙම් අබරණින් සැදුණු මනා වස්ත්‍ර ඇති ඇය බහාලූ මාරපාශයක් මෙන් දිටිමි.

269. එයින් මට යෝනිසෝමනසිකාරය උපන. ආදීනව පහල විය. නිබ්බිදක්‍ෂණය එළැඹි සිටියේ යැ.

270. එයින් මාගේ සිත (කෙලෙසුන්ගෙන්) මිදිණ. ධර්මයාගේ සුධර්මත්වය බල. (මා විසින්) ත්‍රිවිද්‍යාවෝ ලබනලදහ, බුදුසසුන කරනලදූයි.

මෙසෙයින් නාගසමාල ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

නාගසමාල ස්ථවිරගාථා යි.

## 4. 1. 2

271. මම මිද්ධයෙන් මඩනාලද්දෙම් විහාරයෙන් සක්මනට නික්මුණෙමි. සක්මනට නැගෙනුයෙම් එහි මැ බිම වැටිණිමි.

272. ඒ මම අවයවයන් පිරිමැදගෙන යළිදු සක්මනට නැගැ සක්මන්-මළුයෙහි සක්මන් කෙළෙමි, ගොචර සඞ්ඛ්‍යාත අධ්‍යාත්මයෙහි මොනොවට සමාහිත වූයෙම් ද වෙමි.

273. එයින් මට යෝනිසෝමනසිකාරය උපන. ආදීනව පහල වී. නිර්වේදඥානය එළැඹි සිටියේ යැ.

274. එයින් මාගේ සිත (කෙලෙසුන් කෙරෙන්) මිදිණ. ධර්මයාගේ සුධර්මත්වය බල, (මා විසින්) ත්‍රිවිද්‍යාවෝ ලබනලදහ. බුදුසසුන කරන ලදූ යි.

මෙසෙයින් භගුස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

භගුස්ථවිරගාථා යි.

## 4. 1. 3

275. 'අපි මේ විවාදයෙහි නැසෙම්හ'යි අඥබාල වූ අන්‍යයෝ නො දනිති. යම් පණ්ඩිත කෙනෙක් එහිලා (ආදීනව) දනිත් නම් එයින් කලහයෝ සන්හිඳෙත්.

276. යම් කලෙකැ ආදිනව නො දන්නාහු වෙත් ද ඔහු ජරාමරණ නැතියවුන් මෙන් වෙසෙති. යම් කෙනෙක් ධර්මය දනිත් නම් ඔහු (කෙලෙසුන්ගෙන්) ආතුර වූවත් කෙරෙහි අනාතුර වෙත්.

277. යම්කිසි ලිහිල් වූ කුශලකර්මයෙක් වේ ද, කිලිටි වූ යම්කිසි ව්‍රතසමාදානයෙකුත් වේ ද සැකයෙන් සිහි කළයුතු බඹසරෙකුත් වේ ද ඒ මහත්ඵල නො වේ.

278. යමක්හු ගේ සබඹසරුන් කෙරෙහි ගෞරවයෙක් නැද්ද හෙතෙම පොළොවට අහස මෙන් සද්ධර්මයෙන් දුරු වේ යයි.

මෙසෙයින් ආයුෂ්මත් සභියස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

සභියස්ථවිරගාථා යි.

## 4. 1. 4

279. ධිරත්ථු පූරෙ දුග්ගන්ධෙ මාරපක්ඛෙ අවස්සුතෙ,
නවසොතානි තෙ කායෙ යානි සන්දන්ති සබ්බදා.

280. මා පුරාණං අමඤ්ඤිත්ථො මාසාදෙසි තථාගතෙ,
සග්ගෙ'පි තෙ න රජ්ජන්ති කිමඞ්ග පන මානුසෙ.

281. යෙ ච ඛො බාලා දුම්මෙධා දුම්මන්තී මොහපාරුතා,
තාදිසා තත්ථ රජ්ජන්ති මාරඛිත්තම්හි බන්ධනෙ.

282. යෙසං රාගො ච දොසො ච අවිජ්ජා ච විරාජිතා,
තාදී තත්ථ න රජ්ජන්ති[1] ඡින්නසුත්තා අබන්ධනා'ති.

ඉත්ථං සුදං ආයස්මා නන්දකො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

නන්දකත්ථෙරගාථා

## 4 1. 5

283. පඤ්චපඤ්ඤාසවස්සානි රජොජල්ලමධාරයිං,
භුඤ්ජන්තො මාසිකං භත්තං කෙසමස්සුං අලොචයිං.

284. එකපාදෙන අට්ඨාසිං ආසනං පරිවජ්ජයිං,
සුක්ඛගූථානි ච ඛාදිං උද්දෙසං ච න සාදියිං.

285. එතාදිසං කරිත්වාන බහුං දුග්ගතිගාමිනං,
වුය්හමානො මහොඝෙන බුද්ධං සරණමාගමං.

286. සරණාගමනං පස්ස පස්ස ධම්මසුධම්මතං,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසන'න්ති.

ඉත්ථං සුදං ආයස්මා ජම්බුකො ථෙරො ගාථායො අභාසිත්ථා'ති

ජම්බුකත්ථෙරගාථා.

## 4. 1. 6

287. ස්වාගතං වත මෙ ආසි ගයායං ගයාඵග්ගුයා,[2]
යං අද්දසාසිං සම්බුද්ධං දෙසෙන්තං ධම්මමුත්තමං.

288. මහප්පභං ගණාචරියං අග්ගප්පත්තං විනායකං,
සදෙවකස්ස ලොකස්ස ජිනං අතුලදස්සනං.

289. මහානාගං මහාවීරං මහාජුතිමනාසවං,
සබ්බාසවපරික්ඛීණං සත්ථාරමකුතොභයං.

290. චිරසඞ්කිලිට්ඨං වත මං දිට්ඨිසන්දානසන්දිතං,[3]
විමොචයී සො භගවා සබ්බගන්ථෙහි සෙනක'න්ති.

ඉත්ථං සුදං ආයස්මා සෙනකො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

සෙනකත්ථෙරගාථා.

---

1 තාදිසා තත්ථ රජ්ජන්ති - මජසං
2 ගයඵග්ගුයා - මජසං 3 දිට්ඨිසන්දමසන්ධිතං-සීමු, දිට්ඨිසන්තානබන්ධිතං-මජසං

### 4. 1. 4

279. අසුචියෙන් පිරුණු දුගඳ වැහෙන මාරපාක්ෂික වූ රාගයෙන් තෙත් වූ තැනැත්තිය, (කිට) තීඝ්‍ර වේවා, යම් ද්වාර කෙනෙක් හැමඳ වැගිරෙත් ද තීගේ කයෙහි එබඳු නව ශ්‍රොතස්හු වෙත්.

280. පැරණි කෙලිඹිනා නහමක් සිතව, තථාගතශ්‍රාවකයන් නගමක් ගටව. ඔවුහු ස්වර්ගයෙහි දු නො ඇලෙති. මානුෂසුඛයෙහි කියනු මැ කිම්?

281. දුෂ්ප්‍රාඥ වූ වරදවා සිතනසුලු මෝහයෙන් වැසුණු යම් බාල කෙනෙක් ඇත් ද එබඳු වූ ඔහු මරහු විසින් බහාලූ ඒ පාශයෙහි රැඳෙත්.

282· යම් කෙනකුන් විසින් රාගයත් ද්වේෂයත් අවිද්‍යාවත් ප්‍රහීණ කරන ලද්දාහු ද තාදී වූ සිඳිනලද තෘෂ්ණාසූත්‍ර ඇති කෙලශබන්ධන රහිත වූ ඔහු එහි නො රැඳෙත් යයි.

මෙසෙයින් ආයුෂ්මත් නන්‍දකස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

නන්‍දක ස්ථවිරගාථා යි.

### 4. 1. 5

283. පස්පනස්වසක් මූළුල්ලෙහි රජස්දූලි දැරීම්, මසකට වරක් (දිවග තැබීමෙන්) බත් බුදිනු වීම්, කෙහෙරවුළු උදුරාලීම්.

284. එක් පයින් සිටියෙමි, අසුන් හැරපීමි, වියළි අසුචි ද කැයෙමි, නිමන්ත්‍රණ ද නො පිළිගතිමි.

285. මෙ බඳු බොහෝ වූ දුගතිගාමී පව්කම් කොට මහත් වූ ඝාමාදි චතුරෞඝයෙන් උල්පවනු ලබනුයෙම් බුදුන් සරණ කොට ගියෙමි.

286 (මාගේ) සරණගමනය බල, ශාසනධර්මයාගේ සුධර්මත්වය බල, ත්‍රිවිද්‍යාවෝ ලබනලදහ. බුදුන්ගේ ශාසනය කරන ලද යි.

මෙසෙයින් ආයුෂ්මත් ජම්බුකස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

ජම්බුක ස්ථවිරගාථා යි.

### 4. 1 6

287 ගයාතීර්ථසමීපයෙහි ගයඑල්ගු සඞ්ඛ්‍යාත උතුරුපල්නකත්හි මාගේ පැමිණීම ඒකාන්තයෙන් යහපත් වී, යම් හෙයෙකින් උතුම් වූ දහම් දෙසනා-

288. මහත් වූ ශරීරප්‍රභා හා ඥානප්‍රභා ඇති ගණාචාර්‍ය්‍ය වූ දෙවියන් සහිත ලොකයාට අග්‍රප්‍රාප්ත වූ විනායක වූ පස්මරුන් දිනූ අසදෘශ-දර්ශන ඇති-

289. මහානාග වූ මහාවීර වූ මහත් ප්‍රතාප ඇති අනාශ්‍රව වූ සියලු ආශ්‍රවයන් ක්‍ෂය කළ කොයිනුන් භය නැති ශාස්තෘ වූ සම්‍යක්-සම්බුද්ධයන් දිටිම් ද එහෙයිනි.

290. ඒ භාග්‍යවත්හු එකාන්තයෙන් බොහෝ කලෙකසිට කිලිටි වූ දෘෂ්ටිබන්ධනයෙන් බැඳුණු සෙනක නම් වූ මා සියලු ග්‍රන්ථයන්ගෙන් මුදාලූහ යි.

මෙසෙයින් ආයුෂ්මත් සෙනකස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

සේනක ස්ථවිරගාථා යි.

## 4. 1. 7

291. යො දන්ධකාලෙ තරති තරණීයෙ ච දන්ධයෙ
අයොනි[1] සංවිධානෙන බාලො දුක්ඛං නිගච්ඡති.

292. තස්සත්ථා පරිහායන්ති කාළපක්ඛෙව චන්දිමා
ආයසස්‍යඤ්ච[2] පප්පොති මිත්තෙහි ච විරුජ්ඣති.

293. යො දන්ධකාලෙ දන්ධෙති තරණීයෙ ච තාරයෙ
යොනිසො සංවිධානෙන සුඛං පප්පොති පණ්ඩිතො.

294. තස්සත්ථා පරිපූරෙන්ති සුක්කපක්ඛෙව චන්දිමා
යසො කිත්තිඤ්ච පප්පොති මිත්තෙහි න විරුජ්ඣතී'ති.

ඉත්ථං සුදං ආයස්මා සම්භූතො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

සම්භූතත්ථෙරගාථා.

## 4. 1. 8

295. උභයෙනෙව සම්පන්නො රාහුලභද්දො'ති මං විදූ
යඤ්චම්හි පුත්තො බුද්ධස්ස යං ච ධම්මෙසු චක්ඛුමා.

296. යං ච ආසවා ඛීණා යං ච නත්ථි පුනබ්භවො
අරහා දක්ඛිණෙය්‍යොම්හි තෙවිජ්ජො අමතද්දසො.

297. කාමන්ධා ජාලපච්ඡන්නා[3] තණ්හාඡදනඡාදිතා
පමත්තබන්ධුනා බද්ධා මච්ඡාව කුමිනාමුඛෙ.

298. තං කාමං අහමුජ්ඣිත්වා ඡෙත්වා මාරස්ස බන්ධනං
සමූලං තණ්හමබ්බුය්හ සීතිභූතොස්මි නිබ්බුතො'ති.

ඉත්ථං සුදං ආයස්මා රාහුලො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

රාහුලත්ථෙරගාථා.

## 4. 1. 9

299. ජාතරූපෙන පච්ඡන්නා[4] දාසිගණපුරක්ඛතා
අඞ්කෙන පුත්තමාදාය භරියා මං උපාගමි.

300. තං ච දිස්වාන ආයන්තිං සකපුත්තස්ස මාතරං
අලඞ්කතං සුවසනං මච්චුපාසං'ව ඔඩ්ඩිතං.

301. තතො මෙ මනසීකාරො යොනිසො උදපජ්ජථ
ආදීනවො පාතුරහු නිබ්බිදා සමතිට්ඨථ.[5]

302. තතො චිත්තං විමුච්චි මෙ පස්ස ධම්මසුධම්මතං
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනන්ති.

ඉත්ථං සුදං ආයස්මා චන්දනො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

චන්දනත්ථෙරගාථා.

1 අයොනිසො - මජසං, PTS 2 ආයසක්‍යඤ්ච - PTS 3 ජාලසඤ්ඡන්නා - PTS
4 සඤ්ඡන්නා - මජසං 5 සමතිට්ඨථ - මජසං

## 4. 1. 7

291 යමෙක් විනයකුකුසින් ලැසි වැ සිවියුතු කල්හි ලාහෙලා (තුරිත වැ) ක්‍රියා කෙරේ ද යළි තුරිත වැ ක්‍රියා කළ යුතු කල්හි ලැයි වේ ද අනුපායසංවිධානය හෙතු කොටගෙන ඒ බාල තෙම දුකට පැමිණෙයි.

292. ඒ බාලයාගේ දෘෂ්ටධාර්මිකාදි අර්ථයෝ අවපක්‍ෂ සඳ සෙයින් පිරිහෙති. (හේ)අපකීර්ති ඇතිබවට ද පැමිණෙයි. මිත්‍රයන් හා සමග ද විරුද්ධ වේ.

293. යමෙක් ලැසි වියයුතු කල්හි ලැසි වේ ද යළි තුරිත වියයුතු කල්හි තුරිත වේ ද නුවණින් උපායසංවිධානය හෙතු කොටගෙන ඒ පණ්ඩිත තෙම සැපයට පැමිණෙයි.

294 ඔහුගේ අර්ථයෝ පුරපක්‍ෂ සඳ සෙයින් පිරෙති. හෙතෙම යශසට හා කීර්තියට ද පැමිණෙයි. මිත්‍රයන් හා සමග ද විරුද්ධ නො වේ යයි.

මෙසෙයින් ආයුෂ්මත් සම්භූතස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

සම්භූත ස්ථවිරගාථා යි.

## 4. 1. 8

295, 296. යම් හෙයෙකින් (මම) බුදුන්ගේ පුත්‍රයෙම් ද යම් හෙයෙකින් සිව්සස් දහම්හි මගනුවණැස් ඇතියෙම් ද යම් හෙයෙකින් මාගේ ආස්‍රවයෝ ක්‍ෂය වූහු ද යම් හෙයෙකින් පුනර්භවයක් නැතියෙම් ද අග්‍රීන් දක්ෂිණාර්හ වෙම් ද ත්‍රිවිද්‍යා ඇතියෙම් අමෘතාධිගම කෙළෙම් ජාතිසම්පත් ප්‍රතිපත්තිසම්පත් යන දෙකින් මැ යුක්ත වූ මා ‘රාහුලභද්‍ර යයි විද්‍යෙයෝ දනිත්.

297. තෘෂ්ණාජාලයෙන් සම්ප්‍රකාරයෙන් වැසුණු එහෙයින් මැ තෘෂ්ණා-ච්ඡදනයෙන් ඡාදනලද කාමයෙහි අන්ධ වූවාහු මරහු විසින් කෙමින්මුවෙහි මසුන් මෙන් බඳනාලදහ.

298 මම ඒ කාමය හැරපියා මාරබන්ධන සිඳ මුල් සහිත තෘෂ්ණාව උදුරාපියා සිහිල් වූයෙම්, නිවුණෙම් යි.

මෙසෙයින් ආයුෂ්මත් රාහුලභද්‍රස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

රාහුලභද්‍ර ස්ථවිරගාථා යි.

## 1. 4. 9

299. රන්මුවා අබරණින් සැදුණු සිරුර ඇති දසිගණයා විසින් පෙරටු කරනලද භාර්‍යා තොමෝ ඇකයෙන් පුතු වඩාගෙන මා වෙත එළඹියා යැ.

300. සැරසුණු ගන්පෙරෙව් මනා වස්ත්‍ර ඇති බහාලූ මාරපාශයක් වැනි එන්නා වූ සියපුතුගේ මෑණියන් වූ ඇය දැක-

301. එයින් මට යෝනිසොමනසිකාර උපන, ආදීනව පහළ වී, නිර්වේදය උදාවී.

302. එයින් මාගේ සිත කෙලෙසුන් කෙරෙන් මිදුණ. ධර්මයාගේ සුධර්මතාව බලව, ත්‍රිවිද්‍යාවෝ ලබනලදහ, බුදුන්ගේ අනුශාසනය කරනලද්’යි.

මෙසෙයින් ආයුෂ්මත් චන්දනස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

චන්දන ස්ථවිරගාථා යි.

## 4. 1. 10

303. ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති,
එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී.

304. න හි ධම්මො අධම්මො ච උභො සමවිපාකිනො,
අධම්මො නිරයං නෙති ධම්මො පාපෙති සුග්ගතිං.

305. තස්මා හි ධම්මෙසු කරෙය්‍ය ඡන්දං
ඉති මොදමානො සුගතෙන තාදිනා,
ධම්මෙ ඨිතා සුගතවරස්ස සාවකා
නීයන්ති ධීරා සරණවරග්ගගාමිනො.

306. විප්ඵොටිතො ගණ්ඩමූලො[1]
තණ්හාජාලො සමූහතො,
සො ඛීණසංසාරො න චත්ථි කිඤ්චනං
චන්දො යථා දොසිනා පුණ්ණමාසියාති.[2]

ඉත්ථං සුදං ආයස්මා ධම්මිකො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

ධම්මිකත්ථෙරගාථා.

## 4. 1. 11

307. යදා බලාකා සුචිපණ්ඩරච්ඡදා
කාලස්ස මෙඝස්ස භයෙන තජ්ජිතා,
පලෙහිති ආලයමාලයෙසිනී
තදා නදී අජකරණී රමෙති මං

308. යදා බලාකා සුවිසුද්ධපණ්ඩරා
කාලස්ස මෙඝස්ස භයෙන තජ්ජිතා,
පරියෙසති ලෙණමලෙණදස්සිනී
තදා නදී අජකරණී රමෙති මං.

309. කං නු තත්ථ න රමෙන්ති ජම්බුයො උභතො තහිං,
සොභෙන්ති ආපගාකූලං මම ලෙණස්ස පච්ඡතො.

310. තා මතමදසඞ්ඛසුප්පගීතා
භෙකා මන්දවතී පනාදයන්ති,
නාජ්ජ ගිරිනදීහි විප්පවාසසමයො
ඛෙමා අජකරණී සිවා සුරම්මා'ති.

ඉත්ථං සුදං ආයස්මා සප්පකො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

සප්පකත්ථෙරගාථා.

1 ගණ්ඩමූලො - සිමු 1, PTS ගණ්ඩමූලො - සීමු 2.   2 පුණ්ණමාසියන්ති - සිමු 1, 2

## 4. 1. 10

303. සුචරිතධර්ම තෙම එකාන්තයෙන් එදහම් පිළිපදින්නවුන් රක්නේ යැ. මොනොවට රැස් කළ එදහම් සුව එළවයි. ධර්මය මොනොවට රැස් කළ කල්හි මෙල අනුසස් ඇත: ධර්මචාරී තෙම දුගතියට නො යන්නේ යැ.

304. ධර්මය අධර්මය යන දෙදෙන සමවිපාක ඇත්තාහු නො වෙති. අධර්මය නිරය කරා පමුණුවයි. ධර්මය සුගතියට පමුණුවයි.

305. එහෙයින් ධර්මයෙහි සිටි බුද්ධශ්‍රාවක වූ ධීරයෝ උතුම් සරණ ගියාහු නිවනට ගෙනයනු ලැබෙති. තාදීගුණ ඇති සුගතයන් හෙතු-කොටගෙන මෙසේ සතුටු වනුයේ ධර්මයෙහි ඡන්දය කරන්නේ යැ.

306. පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත ගණ්ඩයාගේ මූලය නසනලද, තෘෂ්ණා-ජාලය උපුටනලද. ඒ මම ගෙවනලද සසර ඇත්තෙමි. මට රාගාදි කිඤ්චනයෙක් නැත. (මලිකාදි) දෝෂ රහිත බැවින් පුණ්‍යරැසි සඳ මෙන් සි.

මෙසෙයින් ආයුෂ්මත් ධම්මික ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

ධම්මික ස්ථවිරගාථා සි.

## 4. 1. 11

307. යම් කලෙක පිළිතුරු සුදුපියාපත් ඇති කොකිති කළුමේකුළට බියෙන් තැතිගත්තාලද්දී සැඟවෙන තැන් සොයන්නී වාසස්ථානය කරා පලායන්නී ද එකල්හි අජකරණී නදිය මා සතුටු කෙරෙයි.

308. යම් කලෙක පිළිතුරු පඬුරවන් වූ කොකිති කළුමේකුළට බියෙන් තැතිගත්තාලද්දී නිලීයනස්ථාන නො දක්නී සැඟවෙන තැන් සොයන්නී ද එකල්හි අජකරණී නදිය මා සතුටු කෙරෙයි.

309. එහි මාගේ ලෙන පිටිපස ජම්බුවෘක්ෂයෝ දෙපස ගංඉවුරු හොබවති ඒ වෘක්ෂයෝ එහි කවරක්හු නො පිනවත් ද,

310. සර්පසමූහයාගෙන් මොනොවට මිදුණු ගම්භීරනාද ඇති ඒ මැඩියෝ නද දෙති. දැන් ගිරිනදින්ගෙන් වෙන් වැ විසියයුතු කාලය නො වෙයි. නිර්භය වූ අජකරණී නදිය භද්‍ර වූවා අතිශයින් සිත්කලු වූ යයි.

මෙසෙයින් ආයුෂ්මත් සප්පක ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

සප්පක ස්ථවිරගාථා සි.

## 4. 1. 12

311 පබ්බජිං ජීවිකත්ථො'හං ලද්ධාන උපසම්පදං,
තතො සද්ධං පටිලභිං දළ්හවිරියො පරක්කමිං.

312. කාමං භිජ්ජතු'යං කායො මංසපෙසී විසීයරුං,
උභො ජණ්ණුකසන්ධීහි ජඞ්ඝායො පපතන්තු මෙ.

313. නාසිස්සං න පිවිස්සාමි විහාරා ච න නික්ඛමෙ,
න'පි පස්සං නිපාතෙස්සං තණ්හාසල්ලෙ අනූහතෙ.

314 තස්ස මෙවං විහරතො පස්ස විරියපරක්කමං,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසන'න්ති

ඉත්ථං සුදං ආයස්මා මුදිතො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

මුදිතත්ථෙරගාථා.

තස්සුද්දානං:

නාගසමාලො භගු ච සභියො නන්දකො'පි ච
ජම්බුකො සෙනකො ථෙරො සම්භුතො රාහුලො'පි ච.
භවති චන්දනො ථෙරො දසෙතෙ බුද්ධසාවකා
ධම්මිකො සප්පකො ථෙරො මුදිතො චා'පි තෙ තයො
ගාථායො ද්වෙ ච පඤ්ඤාස ථෙරා සබ්බෙ'පි තෙරසා'ති.

## චතුක්කනිපාතො නිට්ඨිතො.

## 4. 1. 12

311. මම ජීවිකාර්ථී වැ පැවිදි වීමි, උපසපුව ලැබ එයින් සැදැහැ ලදිමි, දැඩි වෙර ඇති වැ උත්සාහ කෙළෙමි.

312. එකත්නෙත් මේ කය බිඳී යේවා, මාංශපෙශීහු විසිරී යෙත්වා, මාගේ දෙදණ සන්ධියෙන් දෙකෙණ්ඩයෝ ගිලිහෙත්වා.

313. තෘෂ්ණා නමැති හුල නුදුලු කල්හි නො කමි, නො බොමි, වෙහෙරින් නො නික්මෙමි, ඇලය (බිම) නො තබමි.

314. මෙසේ වාසය කරන්නා වූ මාගේ වීර්‍ය්‍ය සඞ්ඛ්‍යාත පරාක්‍රමය බලව, (මා විසින්,) ත්‍රිවිද්‍යාවෝ ලබනලදහ. බුදුන්ගේ අනුශාසනය කරනලදු යි.

මෙසේයින් ආයුෂ්මත් මුදිත ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

මුදිත ස්ථවිරගාථා යි.

උද්දානය:

නාගසමාල යැ, භගු යැ, සභිය යැ, නන්දක යැ, ජම්බුක යැ, සෝනක යැ, සම්භූත යැ, රාහුල යැ, යන බුදුසවුවෝ ද ධම්මික යැ, සප්පක යැ, මුදිත යැ යන තෙරවරු ද වෙති. ගාථා දෙපනසක් හා තෙළෙස් තෙර කෙනෙක් ද වෙත්.*

## චතුක්කනිපාතය නිමි.

* විමසියයුතු: මේ උද්දානයෙහි ගාථා දෙපනසක් හා තෙළෙස් තෙර කෙනෙක් වෙතැයි දක්වෙයි. පෙළෙහි හා අටුවායෙහි ඇත්තේ ගාථා 48 ක් හා දොළොස් තෙර කෙනෙකි.

# 5. පඤ්චකනිපාතො.

### 5. 1. 1

315. භික්ඛු සිවථිකං ගන්ත්වා අද්දසං ඉත්ථිමුජ්ඣිතං,
අපවිද්ධං සුසානස්මිං ඛජ්ජන්තිං කිමිහී ඵුටං.

316. යං හි එකෙ ජිගුච්ඡන්ති මතං දිස්වාන පාපකං,
කාමරාගො පාතුරහු අන්ධො'ව වසතී අහුං.

317. ඔරං ඔදනපාකම්හා තම්හා ඨානා අපක්කමිං,
සතිමා සම්පජානොහං එකමන්තං උපාවිසිං.

318. තතො මෙ මනසීකාරො යොනිසො උදපජ්ජථ,
ආදීනවො පාතුරහු නිබ්බිදා සමතිට්ඨථ.

319. තතො චිත්තං විමුච්චි මෙ පස්ස ධම්මසුධම්මතං,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසන'න්ති.

ඉත්ථං සුදං ආයස්මා රාජදත්තො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

රාජදත්තත්ථෙරගාථා.

### 5. 1. 2

320 අයොගෙ යුඤ්ජමත්තානං පුරිසො කිච්චමිච්ඡතො,
චරං චෙ නාධිගච්ඡෙය්‍ය තං මෙ දුබ්භගලක්ඛණං.

321. අබ්බූළ්හං[1] අඝගතං විජිතං
එකං චෙ ඔස්සජෙය්‍ය[2] කලීව සියා,
සබ්බානිපි චෙ ඔස්සජෙය්‍ය අන්ධොව සියා
සමවිසමස්ස අදස්සනතො.

322. යං හි කයිරා තං හි වදෙ යං න කයිරා න තං වදෙ,
අකරොන්තං භාසමානං පරිජානන්ති පණ්ඩිතා.

323. යථා'පි රුචිරං පුප්ඵං වණ්ණවන්තං අගන්ධකං,
එවං සුභාසිතා වාචා අඵලා හොති අකුබ්බතො.

324. යථා'පි රුචිරං පුප්ඵං වණ්ණවන්තං සගන්ධකං,
එවං සුභාසිතා වාචා සඵලා හොති පකුබ්බතො'ති.[3]

ඉත්ථං සුදං ආයස්මා සුභූතො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

සුභූතත්ථෙරගාථා.

---

1. අබ්බුළ්හං - සිමු 1, 2   2 ඔස්සජ්ජෙය්‍ය - සිමු 1, 2
3. සුකුබ්බතො - සයා, සකුබ්බතො - සිමු 1

# 5. පඤ්චකනිපාතය

## 5. 1. 1

315. භික්ෂුවක් වූ මම අමුසොහොනට ගොස් සොහොනෙහි හැරපියන ලද පණුවන් විසින් පැතිරූ කනලද (මළ) ස්ත්‍රියක දිටිමි.

316. ඇතැම් කෙනෙක් ලාමක වූ යම් මළ සිරුරක් දැක පිළිකුල් කෙරෙත් ද, මට එහිලා කාමරාගය පහළ විය. (යම් සිරුරක්) නවදොරින් අසුචි වැගේ නම් එහි අන්ධයකු මෙන් වීමි.

317. බතක් පැසීමෙන් මෙපිට එතැනින් බැහැර ගියෙමි. මම සිහි ඇත්තෙම් නුවණ ඇත්තෙම් එක් පසෙකැ හුන්මි.

318. එයින් මට යොනිසොමනසිකාරය උපන. ආදීනව පහළ විය. නිර්වේදය එළැඹ සිටියේ.

319. එයින් මාගේ සිත (කෙලෙසුන් කෙරෙන්) මිදුණ. ධර්මයාගේ සුධර්මතාව බලව, ත්‍රිවිද්‍යාවෝ ලබනලදහ. බුදුන්ගේ අනුශාසනය කරනලදැයි.

මෙසෙයින් ආයුෂ්මත් රාජදත්ත ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

රාජදත්ත ස්ථවිරගාථා යි

## 5. 1. 2

320. කටයුතු කැමැති වන පුරුෂ තෙම නො යෙදියයුතු අත්තකිලමථානුයෝගයෙහි තමා යොදන්නේ වේ ද, ඉදින් එහි හැසිරෙනුයේ අභිමතාර්ථය නො ලබන්නේ වේ ද, එය මාගේ දුර්භීග ලක්ෂණය යි.

321. ඉදින් කෙලශවිජය නො කොට එක මැ අප්‍රමාදය හරනේ නම් දුර්භීගයෙක් මැ වන්නේ යැ, ඉදින් සියලු වීර්‍ය්‍යාදි ධර්මය හරනේ නම් සමවිෂම නො දක්නා හෙයින් අන්ධයෙක් මැ වෙයි.

322. යමක් මැ කරන්නේ නම් එය මැ කියන්නේ යැ. යමක් නො කරන්නේ නම් එය නො කියන්නේ යැ. නො කරන දැය කියනුවන්ට පඬිවරු පරිහව කෙරෙති.

323. යම්සේ සිත්කලු වූ වර්ණවත් වූ සුවඳ නැති මලෙක් වේ ද, එපරිද්දෙන් සුභාෂිත වචනය ද නො කරනුවහුට නිෂ්ඵල වෙයි.

324. යම්සේ සිත්කලු වූ වර්ණවත් වූ සුවඳ සහිත මලෙක් වේ ද, එපරිද්දෙන් සුභාෂිත වචනය කරනුවහුට සඵල වේ යයි.

මෙසෙයින් ආයුෂ්මත් සුභූත ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

සුභූත ස්ථවිරගාථා යි.

## 5. 1. 3

325. වස්සති දෙවො යථා සුගීතං
ඡන්නා මෙ කුටිකා සුඛා නිවාතා,
තස්සං විහරාමි වූපසන්තො
අථ චෙ පත්ථයසී පවස්ස දෙව.

326. වස්සති දෙවො යථා සුගීතං
ඡන්නා මෙ කුටිකා සුඛා නිවාතා,
තස්සං විහරාමි සන්තචිත්තො
අථ චෙ පත්ථයසී පවස්ස දෙව.

327. වස්සති දෙවො යථා සුගීතං
ඡන්නා මෙ කුටිකා සුඛා නිවාතා,
තස්සං විහරාමි වීතරාගො
අථ චෙ පත්ථයසී පවස්ස දෙව.

328. වස්සති දෙවො යථා සුගීතං
ඡන්නා මෙ කුටිකා සුඛා නිවාතා,
තස්සං විහරාමි වීතදොසො
අථ චෙ පත්ථයසී පවස්ස දෙව.

329. වස්සති දෙවො යථා සුගීතං
ඡන්නා මෙ කුටිකා සුඛා නිවාතා,
තස්සං විහරාමි වීතමොහො
අථ චෙ පත්ථයසී පවස්ස දෙවා'ති.

ඉත්ථං සුදං ආයස්මා ගිරිමානන්දො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**ගිරිමානන්දත්ථෙරගාථා.**

## 5. 1. 4

330 යං පත්ථයානො ධම්මෙසු උපජ්ඣායො අනුග්ගහි,
අමතං අභිකඞ්ඛන්තං කතං කත්තබ්බකං මයා.

331. අනුප්පත්තො සච්ඡිකතො සයං ධම්මො අනීතිහො,
විසුද්ධඤාණො නික්කඞ්ඛො ව්‍යාකරොමි තවන්තිකෙ.

332. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං,
සදත්ථො මෙ අනුප්පත්තො කතං බුද්ධස්ස සාසනං.

333 අප්පමත්තස්ස මෙ සික්ඛා සුස්සුතා තව සාසනෙ,
සබ්බෙ මෙ ආසවා ඛීණා නත්ථි දානි පුනබ්භවො.

334. අනුසාසි මං අරියවතා අනුකම්පි අනුග්ගහි,
අමොඝො තුය්හමොවාදො අන්තෙවාසිම්හි සික්ඛිතො'ති.

ඉත්ථං සුදං ආයස්මා සුමනො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**සුමනත්ථෙරගාථං.**

## 5. 1. 3

325. මනා ගැයුමක් මෙන් වැසි වසී. මාගේ කුටිය සොයනලද, සුව එලවත්නී යැ, (පියූ දෙරකවුළු ඇති බැවින්) වාතපීඩා රහිත යැ, එහි සන්හිඳුනෙම් වාස කෙරෙමි. මෙඝය ඉදින් රිසියෙයි නම් වෂී කර.

326. මනා ගැයුමක් මෙන් වැසි වසී. මාගේ කුටිය සොයනලද, සුව එලවත්නී යැ, වාතපීඩා රහිත යැ. එහි සන්හුන් සිත් ඇත්තෙම් වාස කෙරෙමි. මෙඝය ඉදින් රිසියෙයි නම් වෂී කර.

327. වැසි වසී ... පහවැගිය රාග ඇත්තෙම් එහි වෙසෙමි. ... මෙඝය ඉදින් රිසියෙයි නම් වෂී කර.

328. වැසි වසී ... පහවැගිය ද්වෙෂ ඇත්තෙම් එහි වෙසෙමි. ... මෙඝය ඉදින් රිසියෙයි නම් වෂී කර.

329. වැසි වසී ... පහවැගිය මොහ ඇත්තෙම් එහි වෙසෙමි ... මෙඝය ඉදින් රිසියෙයි නම් වෂී කර.

මෙසේයින් ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

**ගිරිමානන්ද ස්ථවිරගාථා යි.**

## 5. 1. 4

330. උපාධ්‍යායන් වහන්සේ (ශමථවිදර්ශනාදි) ධර්මයන් කෙරෙහි යම් දහමක් පතන්නාහු අමා කැමැති මට (ඔවා දීමෙන්) අනුග්‍රහ කළසේක් ද (එය ලබනුවට) මා විසින් කරණී කරනලද.

331 තමා විසින් (භවලොවුතුරු) දහම ලබනලද, පසක් කරනලද, නිසැක (ඉතිකිරා රහිත) කරනලද. (මම) විශුද්ධඥාන ඇතියෙම් නිසැක වැ තොප වෙත ප්‍රකාශ කෙරෙමි.

332. පෙරවිසූ කඳපිළිවෙල දනිමි. දිවැස පිරිසුදු කරනලද, මා විසින් ස්වාර්ථය (රහත්බව) ලබනලද, බුදුන්ගේ අනුසසුන් කරනලද.

333. අප්‍රමාද වූ මා විසින් තොපගේ ශාසනයෙහි ශික්ෂාවෝ මොනොවට නික්මෙනලද. මාගේ සියලු ආස්‍රවයෝ ක්ෂය වූහ. දැන් පුනර්භවයෙක් නැත.

334. ආර්‍යව්‍රතයෙන් මට අනුශාසනා කළහ, අනුකම්පා කළහ, අනුග්‍රහ කළහ. තොපගේ අවවාදය නො සිස් විය. හික්මුණු අතැවැසියෙක් වීමි.

මෙසේයින් ආයුෂ්මත් සුමන ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

**සුමන ස්ථවිරගාථා යි.**

## 5. 1. 5

335. සාධූ හි කිර මෙ මාතා පතොදං උපදංසයි,
යස්සාහං වචනං සුත්වා අනුසිට්ඨො ජනෙත්තියා,
ආරද්ධවිරියො පහිතත්තො පත්තො සම්බොධිමුත්තමං.

336. අරහා දක්ඛිණෙය්‍යොම්හි තෙවිජ්ජො අමතද්දසො,
ජෙත්වා[1] නමුචිනො සෙනං විහරාමි අනාසවො.

337. අජ්ඣත්තං ච බහිද්ධා ච යෙ මෙ විජ්ජිංසු ආසවා,
සබ්බෙ අසෙසා උච්ඡින්නා න ච උප්පජ්ජරෙ පුන.

338. විසාරදා ඛො භගිනී එතමත්ථං අභාසයි,
අපිහා නූන මයි'පි වනථො තෙ න විජ්ජති.

331 පරියන්තකතං දුක්ඛං අන්තිමො'යං සමුස්සයො,
ජාතිමරණසංසාරො නත්ථි දානි පුනබ්භවො'ති.

ඉත්ථං සුදං ආයස්මා වඩ්ඪො ථෙරො ගාථායො අභාසිත්ථා'ති..

වඩ්ඪත්ථෙරගාථා.

## 5. 1. 6

340. අත්ථාය වත මෙ බුද්ධො නදිං නෙරඤ්ජරං අගා,
යස්සාහං ධම්මං සුත්වාන මිච්ඡාදිට්ඨිං විවජ්ජයිං.

341. යජිං උච්චාවචෙ යඤ්ඤෙ අග්ගිහුත්තං ජුහිං අහං,
එසා සුද්ධීති මඤ්ඤන්තො අන්ධභූතො පුථුජ්ජනො.

342. දිට්ඨිගහනපක්ඛන්තො[2] පරාමාසෙන මොහිතො,
අසුද්ධිං මඤ්ඤිසං සුද්ධිං අන්ධභූතො අවිද්දසු.

343. මිච්ඡාදිට්ඨි පහීනා මෙ භවා සබ්බෙ විදාලිතා,
ජුහාමි දක්ඛිණෙය්‍යග්ගිං නමස්සාමි තථාගතං.

344. මොහා සබ්බෙ පහීනා මෙ භවතණ්හා පදාලිතා
වික්ඛීණො ජාතිසංසාරො නත්ථි දානි පුනබ්භවො'ති.

ඉත්ථං සුදං ආයස්මා නදීකස්සපො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

නදීකස්සපත්ථෙරගාථා.

---
1 ජිත්වාන - PIS  2 දිට්ඨිගහනපක්ඛන්නො - සීමු, දිට්ඨිගහණ පක්ඛන්නො - PTS

## 5. 1. 5

335. මනා මැ යැ, මාගේ මවු තොමෝ අවවාද නමැති කෙවිට මට දුක් වූ, යම් මවක විසින් අනුශාසිත වූයෙම් ඇයගේ බස් අසා රැකුළු වැර ඇත්තෙම්- නිවනට මෙහෙයූ සිත් ඇත්තෙම් උතුම් වූ අර්හත්ත්වයට පැමිණියෙම්.

336. රහත් වූයෙම් දක්ෂිණාවට නිසිවීමි. ත්‍රිවිද්‍යා ඇත්තෙම් දුටු නිවන් ඇත්තෙමි. මරහුගේ (කෙලෙස්) සෙන් දිනා ආස්‍රව රහිත වැ වෙසෙමි.

337. ආධ්‍යාත්මික වූ ද බාහිර වූ ද මාගේ යම් ආස්‍රව කෙනෙක් විද්‍යමාන වූහු ද, නිරවශෙෂ වූ සියලු ආස්‍රවයෝ සිඳින ලද්දාහු යැ, ඔහු යළි නොද උපදිත්.

338. විශාරද වූ බුහුනැණි මෙකරුණ කිවු (මවත් තමාත් රහත් බැවින් බුදුන් උරදාපුත් බව ගෙන කියයි.) ඒකාන්තයෙන් මා කෙරෙහි දු අභිලාශා නැත. තොපට තෘෂ්ණාවක් නැත.

339. දුක් කෙළවර කරනලද. මේ අන්තිමශරීරය යි. ජාතිමරණ සංසාර සඞ්ඛ්‍යාත පුනර්භවයෙක් දැන් නැතැ යි.

මෙසෙයින් ආයුෂ්මත් වඩ්ඪ ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

**වඩ්ඪ ස්ථවිරගාථා යි.**

## 5. 1. 6

340. මම යම් බුදු කෙනකුන්ගේ දහම් අසා මිසදිටු හළෙම් ද, ඒකාන්තයෙන් මට වැඩ සඳහා ඒ බුදුහු නෙරඤ්ජරානදිය වෙත වැඩියහ.

341. නුවණැසින් අන්ධ වූ පුහුදුන් වූ මම ශුද්ධි නම් මේ යයි හඟිමින් කුදුමහත් යාගයන් කෙළෙමි. අග්නිහෝම කෙළෙමි.

342. නුවණැස් නැති අපණ්ඩිත වූ දෘෂ්ටිගහනයට වැදුණු දෘෂ්ටිපරාමශීයෙන් මුළා වූ මම අශුද්ධිය ශුද්ධි යයි සැලැකීමි.

343. මාගේ මිසදිටු ප්‍රහීණ යැ. හැම භවයෝ නසනලදහ. දක්ෂිණීය වහ්නිය පුදමි. තථාගතයන් නමස්කාර කෙරෙමි.

344. මාගේ හැම මෝහයෝ ප්‍රහීණයහ. භවතෘෂ්ණාව නසනලදි. ජාතිසංසාරය ක්ෂීණ විය. දැන් පුනර්භවයෙක් නැතැ’යි.

මෙසෙයින් ආයුෂ්මත් නදීකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

**නදීකාශ්‍යප ස්ථවිරගාථා යි.**

### 5. 1. 7

345. පාතො මජ්ඣන්තිකං සායං තික්ඛත්තුං දිවසස්සහං,
ඔතරිං උදකං සො'හං[1] ගයාය ගයඵග්ගුයා.

346. යං මයා පකතං පාපං පුබ්බෙ අඤ්ඤාසු ජාතිසු,
තං දානීධ පවාහෙමි[2] එවංදිට්ඨි පුරෙ අහුං.

347. සුත්වා සුභාසිතං වාචං ධම්මත්ථසහිතං පදං
තථං යාථාවකං[3] අත්ථං යොනිසො'පච්චවෙක්ඛිසං.

348. නින්හාතසබ්බපාපොම්හි නිම්මලො පයතො සුචි,
සුද්ධො සුද්ධස්ස දායාදො පුත්තො බුද්ධස්ස ඔරසො.

349 ඔගය්හට්ඨඞ්ගිකං සොතං සබ්බපාපං පවාහයිං,
තිස්සො විජ්ජා අජ්ඣගමිං කතං බුද්ධස්ස සාසන'න්ති.

ඉත්ථං සුදං ආයස්මා ගයාකස්සපො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**ගයාකස්සපත්ථෙරගාථා.**

### 5. 1. 8

350. වාතරොගාභිනීතො ත්වං විහරං කානනෙ වනෙ,
පවිද්ධගොචරෙ[4] ලූඛෙ කථං භික්ඛු කරිස්සසි.

351. පීතිසුඛෙන විපුලෙන ඵරමානො සමුස්සයං,
ලූඛම්පි අභිසම්භොන්තො විහරිස්සාමි කානනෙ.

352. භාවෙන්තො සතිපට්ඨානෙ ඉන්ද්‍රියානි බලානි ච,
බොජ්ඣඞ්ගානි ච භාවෙන්තො විහරිස්සාමි කානනෙ.

353. ආරද්ධවිරියො පහිතත්තො නිච්චං දළ්හපරක්කමො,[5]
සමග්ගෙ සහිතෙ දිස්වා විහරිස්සාමි කානනෙ.

354. අනුස්සරන්තො සම්බුද්ධං අග්ගං දන්තං[6] සමාහිතං,
අතන්දිතො රත්තින්දිවං විහරිස්සාමි කානනෙ'ති.

ඉත්ථං සුදං ආයස්මා වක්කලිත්ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**වක්කලිත්ථෙරගාථා.**

---

1 සොතං PTS, 2 ඔපවාහෙමි - ප 3 යථාවකං ත, PTS
4 පවිට්ඨගොචරෙ - සීමු, 1, 2 ප 5 ආරද්ධවිරියෙ, පහිතත්තෙ නිච්චං දළ්හපරක්කමෙ - PTS 6 අග්ගදන්තං - PTS

## 5. 1. 7

345. මම ගයාවෙහි ‘ගයාඵල්ගු’ නම් තොටැ ජලස්‍රොතසට උදය දවල සවසැ’යි දවසට තුන් වරක් බටිමි.

346. ‘පෙර අන්‍යජාතියෙහි මා විසින් යම් පාපයෙක් කරනලද නම් ඒ පව් දූන් ගයාඵල්ගුයෙහි දී උල්පවා හරිමි’යි පෙර මෙවන් දෘෂ්ටි ඇත්තෙම් වීමි.

347. ධර්මාර්ථ සංහිත වූ පද ඇති සුභාෂිත වචන අසා තථ්‍ය වූ තත් වූ පරිදි සිටුනා දුඃඛාදි අර්ථය නුවණින් ප්‍රත්‍යවේක්ෂා කෙළෙමි.

348. සෝදා හළ සියලු පව් ඇති නිර්මල වූ ප්‍රයත වූ පවිත්‍ර වූ ශුද්ධ වූ මම පරිශුද්ධ වූ බුදුන්ගේ දායාද වූ ඖරසපුත්‍රයෙමි.

349. ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගී නමැති ස්‍රොතසට බැසගෙන සියලු පව් උල්පවා හළිමි, ත්‍රිවිද්‍යා ලදිමි, බුදුසසුන් කෙළෙමි.

මෙසෙයින් ආයුෂ්මත් ගයාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

**ගයාකාශ්‍යප ස්ථවිරගාථා යි.**

## 5. 1. 8

350. මහණ ගොචර රහිත රූක්ෂ වූ මහවෙනෙහි වසන තෝ වාත-රොගයෙන් අවසග බවට පමුණුවනලද්දෙහි කෙසේ වසන්නෙහි ද?

351 මහත් වූ ප්‍රීතිසුඛයෙන් ශරීරය පතුරුවමින් ප්‍රත්‍යයරූක්ෂය පවා මැඩලමින් මහවෙනෙහි වෙසෙමි.

352 සතරසීවටන් ද පඤ්චෙන්ද්‍රියයන් ද පඤ්චබලයන් ද වඩමින් සප්තබොධ්‍යඞ්ගයන් ද වඩමින් වෙනෙහි වෙසෙමි.

353. පටන්ගන්නාලද වීර්‍ය්‍ය ඇත්තෙම් නිවනට මෙහෙයූ සිතැත්තෙම් නිරතුරු දෘඪපරාක්‍රම ඇත්තෙම් එක් වැ වසන සමග වූ සබ්‍රම්සරුන් දක (කල්‍යාණමිත්‍රසම්පත්තින්) වෙනෙහි වෙසෙමි.

354. අග්‍ර වූ දාන්ත වූ සමාහිත වූ සම්බුද්ධයන් සිහි කෙරෙමින් රෑදවල් නො මැලි වූයෙම් වෙනෙහි වෙසෙමි.

මෙසෙයින් ආයුෂ්මත් වක්කලි ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

**වක්කලි ස්ථවිරගාථා යි.**

### 5. 1. 9

355. ඔලග්ගෙස්සාමි තෙ චිත්ත ආණිද්වාරෙව හත්ථිනං,
න තං පාපෙ නියොජෙස්සං කාමජාල සරිරජ.

356. ත්වං ඔලග්ගො න ගච්ඡසි ද්වාරවිවරං ගජො’ව අලභන්තො,
න ච චිත්තකලි පුනප්පුනං පසහං පාපරතො චරිස්සසි.

357. යථා කුඤ්ජරං අදන්තං නවග්ගහමඞ්කුසග්ගහො,
බලවා ආවත්තෙති අකාමං එවං ආවත්තයිස්සං තං.

358. යථා වරහයදමකුසලො සාරථි පවරො දමෙති ආජඤ්ඤං,
එවං දමයිස්සං තං පතිට්ඨිතො පඤ්චසු බලෙසු.

359. සතියා තං නිබන්ධිස්සං පයතත්තො වොදපෙස්සාමි,
විරියධුරනිග්ගහිතො න නියතො දූරං ගමිස්සසෙ චිත්තා’ති.

ඉත්ථං සුදං ආයස්මා විජිතසෙනො ථෙරො ගාථායො අභාසිත්ථා’ති.

**විජිතසෙනත්ථෙරගාථා.**

### 5. 1. 10

360. උපාරම්භචිත්තො දුම්මෙධො සුණාති ජිනසාසනං,
ආරකා හොති සද්ධම්මා නභසො පඨවී යථා.

361. උපාරම්භචිත්තො දුම්මෙධො සුණාති ජිනසාසනං,
පරිහායති සද්ධම්මා කාළපක්ඛෙව චන්දිමා.

362 උපාරම්භචිත්තො දුම්මෙධො සුණාති ජිනසාසනං,
පරිසුස්සති සද්ධම්මෙ මච්ඡො අප්පොදකෙ යථා.

363. උපාරම්භචිත්තො දුම්මෙධො සුණාති ජිනසාසනං,
න විරූහති සද්ධම්මෙ ඛෙත්තෙ බීජංව පූතිකං.

364. යො ච තුට්ඨෙන චිත්තෙන සුණාති ජිනසාසනං,
ඛෙපෙත්වා ආසවෙ සබ්බෙ සච්ඡිකත්වා අකුප්පතං,
පප්පුය්‍ය පරමං සන්තිං පරිනිබ්බාති අනාසවො’ති.[1]

ඉත්ථං සුදං ආයස්මා යසදත්තො ථෙරො ගාථායො අභාසිත්ථා’ති.

**යසදත්තත්ථෙරගාථා.**

---

1 පරිනිබ්බායිස්සති අනාසවො - ප

## 5. 1. 9

355. චිත්තය, තා නුවර කුරුබිලයෙහි ඇතකු සෙයින් (බැහැර නො යාදී) වළහන්නෙමි. කාමජාලයක් වූ (රූපප්‍රතිබද්ධ වෘත්ති ඇති බැවින්) ශරීරජ නම් වූ චිත්තය, තා පාපයෙහි නො යොදන්නෙමි.

356. ද්වාරවිවරය නො ලබන ඇතකු සෙයින් වළහනලද තෝ නො යෙහි. චිත්තකාලකණ්ණිය, පුනපුනා සැහැසි වැ පව්කම්හි ඇලී නො ද හැසිරෙන්නෙහි.

357. යම්සේ බලවත් වූ ඇතරුවෙක් අලුත අල්වාගන්නාලද නො දැමුණු ඇතකු නො කැමැති සේ වළහා ද, එපරිද්දෙන් තා වළහන්-නෙමි.

358 යම්සේ උත්තම අශ්වයන් දමනය කිරීමෙහි නිපුණ වූ උත්තම-සාරථියෙක් ආජානීය අශ්වයකු දමනය කෙරේ ද, එපරිද්දෙන් පඤ්චබලයෙහි පිහිටි මම තා දමනය කරන්නෙමි.

359. චිත්තය, තා සිහි නමැති යොතින් බඳනෙමි. පවිත්‍ර වූ සිත් ඇත්තෙම් (කෙලෙස්මලයෙන් තා) පිරිසුදු කරන්නෙමි. වීර්‍ය්‍යධුර-යෙන් වළහනලද්දෙහි මෙයින් දුරට නො යන්නෙහි.

මෙසෙයින් ආයුෂ්මත් විජිතසෙන ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

**විජිතසේන ස්ථවිරගාථා යි.**

## 5. 1. 10

360. දේහාරෝපණය කරන සිත් ඇති දුෂ්ප්‍රාඥ තෙම බුදුන්ගේ අනුශාසනය අසා නමුදු අහසට පොළොව මෙන් පිළිවෙත් සදහමින් දුරු වෙයි.

361. දෙහාරෝපණය කරන සිත් ඇති දුෂ්ප්‍රාඥ තෙම බුදුන්ගේ අනුශාසනය අසා නමුදු අවපසැ සඳ සෙයින් නවලොවුතුරු දහමින් පිරිහෙයි.

362. දෙහාරෝපණය කරන සිත් ඇති දුෂ්ප්‍රාඥ තෙම බුදුන්ගේ අනුශාසනය අසා නමුදු දියත්තක මසකු සෙයින් ලොවුතුරුදහම්හි වියැළෙයි.

363. දෙහාරෝපණය කරන සිත් ඇති දුෂ්ප්‍රාඥ තෙම ජිනශාසනය අසා නමුදු කෙතෙහි වපුල කුණු වූ බිජුවට සෙයින් නවලොවුතුරු දහම්හි නො වැඩෙයි.

364. යමෙකුත් තුටුසිතින් ජිනශාසනය අසා නම්, (හේ) සියලු (කාමාදි) ආස්‍රවයන් ගෙවා අභිඥාවය ප්‍රත්‍යක්ෂ කොට පරමශාන්තියට පැමිණ ආශ්‍රව රහිත වූයේ පිරිනිවේ යයි.

මෙසෙයින් ආයුෂ්මත් යසදත්ත ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ

**යසදත්ත ස්ථවිරගාථා යි.**

### 5. 1. 11

365. උපසම්පදා ච මෙ ලද්ධා විමුත්තො චම්හි අනාසවො,
සො ච මෙ භගවා දිට්ඨො විහාරෙ ච සහාවසිං.

366 බහුදෙව රත්තිං භගවා අබ්භොකාසෙතිනාමයි,
විහාරකුසලො සත්ථා විහාරං පාවිසී තදා.

367. සන්ථරිත්වාන සඞ්ඝාටිං සෙය්‍යං කප්පෙසි ගොතමො,
සීහො සෙලගුහායං'ව පහීනභයභෙරවො.

368. තතො කල්‍යාණවාක්කරණො සම්මාසම්බුද්ධසාවකො,
සොණො අභාසි සද්ධම්මං බුද්ධසෙට්ඨස්ස සම්මුඛා.

369. පඤ්චක්ඛන්ධෙ පරිඤ්ඤාය භාවයිත්වාන අඤ්ජසං
පප්පුය්‍ය පරමං සන්තිං පරිනිබ්බිස්සත්‍යනාසවො'ති.

ඉත්ථං සුදං ආයස්මා සොණො කුටිකණ්ණත්ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

සොණකුටිකණ්ණත්ථෙරගාථා.

### 5. 1. 12

370. යො වෙ ගරූනං වචනඤ්ඤු ධීරො
වසෙ ච තම්හි ජනයෙ ච පෙමං,
සො භත්තිමා නාම ච හොති පණ්ඩිතො
ඤත්වා ච ධම්මෙසු විසෙසි අස්ස.

371. යං ආපදා උප්පතිතා උළාරා
නක්ඛම්භයන්තෙ පටිසඞ්ඛයන්තං,
සො ථාමවා නාම ච හොති පණ්ඩිතො
ඤත්වා ච ධම්මෙසු විසෙසි අස්ස.

372 යො වෙ සමුද්දො'ව ඨිතො අනෙජො
ගම්භීරපඤ්ඤො නිපුණත්ථදස්සී,
අසංහාරියො නාම ච හොති පණ්ඩිතො
ඤත්වා ච ධම්මෙසු විසෙසි අස්ස.

## 5. 1. 11

365. මා විසින් (දූතයේ දසවග්ගික තබ්සයා රැස් කොට ලත්) උපසම්පදාව ද (වරදාන විසින් පසල් දනව්වෙහි විනයධරයා පස්වනු කොට ඇති ගණඋපසම්පදාව ද) ලද්දු ආස්‍රව රහිත වැ කෙලෙසුන් කෙරෙන් මිදුණෙම් ද වෙමි. මා විසින් ඒ බුදුහු ද දක්නාලදහ. විහාරයෙහිදු (බුදුන්) සමග විසීමි.

366 බුදුහු රැ බොහෝවේලාවක් අභ්‍යවකාශයෙහි විසූහ. සිවුවිහරණයෙහි දක්‍ෂ වූ ශාස්තෘහු එකල්හි ගඳකිළියට පිවිසියහ.

367. ගොයුම්ගොත් බුදුහු සඟලසිවුර අතුරා ප්‍රහීණ වූ භය හා භය අරමුණු ඇති වැ සිංහයකු ශෛලගුහාවකැ සෙයින් ශයනය කළහ.

368 ඉක්බිති කල්‍යාණවාක්කරණ ඇති සම්‍යක්සම්බුද්ධ ශ්‍රාවක වූ සොණකුටිකණ්ණ තෙම බුද්ධශ්‍රෙෂ්ඨයන් හමියෙහි සදහම් දෙසී.

369. පඤ්චස්කන්ධයන් පිරිසිඳ දැන අරිඅටඟමග වඩා පරමශාන්තියට පැමිණ ආස්‍රව රහිත වැ පිරිනිවෙන්නේ යයි.

මෙසෙයින් ආයුෂ්මත් සොණ ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

ශෝණ ස්ථවිරගාථා යි.

## 5. 1. 12

370. යමෙක් එකාන්තයෙන් ගුරුන්ගේ වදන් දන්නේ ධීර වූයේ ඒ ගුරුන්ගේ අවවාදයෙහි වසන්නුයේ එහි ප්‍රෙම උපදවන්නේත් වේ ද, හෙතෙම භක්ති ඇත්තේ නමුදු පණ්ඩිත වූයේ නමුදු වෙයි. (සිව්සස්දහම්) දැන (ලොවිලොව්තුරා) දහම්හි විශිෂ්ට ද වන්නේ යැ.

371. උපන්(ශීතොෂ්ණාදි ප්‍රකට වූත් රාගාදි ප්‍රතිච්ඡන්න වූත්)ආපදාවෝ බලවත් වූවාහු නමුදු පටිසංඛානබලයෙහි සිටි යම් පුද්ගලයකු නො පෙළත් ද ඒ පුද්ගල තෙම පරාක්‍රම ඇත්තේ නමුදු පණ්ඩිත වූයේ නමුදු වෙයි (සිවුසස්දහම්) දැන දහම්හි විශිෂ්ට වූයේ ද වන්නේ යැ.

372. යමෙක් එකාන්තයෙන් සමුද්‍රය මෙන් අකම්පිත වූයේ ස්ථිර වැ සිටියේ ද ගැඹුරු නුවණැත්තේ සියුම් අරුත් දක්නාසුලු වේ ද හෙතෙම (කෙලෙසුන් විසින්) පැහැරගත නො හැක්කේ නමුදු පණ්ඩිත වූයේ නමුදු වෙයි. සිවුසස් දහම් දැන දහම්හි විශිෂ්ට වූයේ ද වන්නේ යැ.

373. බහුස්සුතො ධම්මධරො ච හොති
ධම්මස්ස හොති අනුධම්මචාරී,
සො තාදිසො නාම ච හොති පණ්ඩිතො
ඤත්වා ච ධම්මෙසු විසෙසි අස්ස.

374. අත්ථං ච යො ජානාති භාසිතස්ස
අත්ථං ච ඤත්වාන තථා කරොති,
අත්ථන්තරො නාම ස හොති පණ්ඩිතො
ඤත්වා ච ධම්මෙසු විසෙසි අස්සා'ති.

ඉත්ථං සුදං ආයස්මා කොසියො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

කොසියත්ථෙරගාථා.

තස්සුද්දානං:

රාජදත්තො සුභූතො ච ගිරිමානන්දසුමනා
වඩ්ඪො ච කස්සපො ථෙරො ගයාකස්සපවක්කලී
විජිතො යසදත්තො ච සොණො කොසියසව්හයො
සට්ඨි ච පඤ්ච ගාථායො ථෙරා ච එත්ථ ද්වාදසා'ති.

## පඤ්චකනිපාතො නිට්ඨිතො.

373 යමෙක් බහුශ්‍රැත වූයේ ධර්මධර වූයේත් වේ ද, නවලොවුතුරුදහමට අනුධර්ම වූ පූර්වභාගප්‍රතිපදායෙහි හැසිරෙන්නේත් වේ ද හෙතෙම ගුරුන් හා සදෘශ වූයේ නමුදු පණ්ඩිත වූයේ නමුදු වෙයි. සියුසස්-දහම් දැන දහම්හි විශිෂ්ට වූයේ ද වන්නේ යැ.

374. යමෙක් (සම්බුද්ධ) භාෂිතයාගේ අර්ථයත් දනී ද අර්ථය දැන ඒ දහම්හි වූ පරිදි පිළිපදනේත් වේ ද, හෙතෙම අර්ථාන්තර ඇත්තේ නමුදු පණ්ඩිත වූයේ නමුදු වෙයි. සියුසස් දහම් දැන දහම්හි විශිෂ්ට වූයේ ද වන්නේ යි.

මෙසෙයින් ආයුෂ්මත් කොසිය ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

කොසිය ස්ථවිරගාථා යි.

උද්දානය:

රාජදත්ත යැ, සුභූත යැ, ගිරිමානන්ද යැ, සුමන යැ, වඩ්ඪ යැ, නදී-කස්සප යැ, ගයාකස්සප යැ, වක්කලි යැ, විජිතසේන යැ යසදත්ත යැ, සොණ යැ යන තෙරවරු දෙළොස් දෙනෙක් ද ගාථා සැටක් ද පඤ්චක-නිපාතයෙහි වෙත්.

## පඤ්චකනිපාතය නිමි.

# 6. ඡක්කනිපාතො.

### 6. 1. 1

375. දිස්වාන පාටිහීරානි ගොතමස්ස යසස්සිනො,
න තාවාහං පණිපතිං ඉස්සාමානෙන වඤ්චිතො.

376. මම සඞ්කප්පමඤ්ඤාය චොදෙසි නරසාරථි,
තතො මෙ ආසි සංවෙගො අබ්භුතො ලොමහංසනො.

377. පුබ්බෙ ජටිලභූතස්ස යා මෙ සිද්ධි[1] පරිත්තිකා,
තාහං තදා නිරංකත්වා පබ්බජිං ජිනසාසනෙ.

378. පුබ්බෙ යඤ්ඤෙන සන්තුට්ඨො කාමධාතුපුරක්ඛතො,
පච්ඡා රාගං ච දොසං ච මොහං චාපි සමූහනිං.

379. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං,
ඉද්ධිමා පරචිත්තඤ්ඤූ දිබ්බසොතඤ්ච පාපුණිං.

380. යස්ස චත්ථාය පබ්බජිතො අගාරස්මානගාරියං,[2]
සො මෙ අත්ථො අනුප්පත්තො සබ්බසංයොජනක්ඛයො'ති.

ඉත්ථං සුදං ආයස්මා උරුවෙලකස්සපො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**උරුවෙලකස්සපත්ථෙරගාථා.**

### 6. 1. 2

381. අතිහිතා වීහි ඛලගතා සාලී,
න ච ලභෙ පිණ්ඩං කථමහං කස්සං.

382. බුද්ධමප්පමෙය්‍යං අනුස්සර[3] පසන්නො,
පීතියා ඵුටසරීරො හොහිසි[4] සතතමුදග්ගො.

383. ධම්මමප්පමෙය්‍යං අනුස්සර[3] පසන්නො,
පීතියා ඵුටසරීරො හොහිසි[4] සතතමුදග්ගො.

384. සඞ්ඝමප්පමෙය්‍යං අනුස්සර[3] පසන්නො,
පීතියා ඵුටසරීරො හොහිසි[4] සතතමුදග්ගො.

385. අබ්භොකාසෙ විහරසි සීතා හෙමන්තිකා ඉමා රත්තියො,
මා සීතෙන පරෙතො විහඤ්ඤිත්ථො පවිස ත්වං විහාරං ඵුසිතග්ගළං

386. ඵුසිස්සං චතස්සො අප්පමඤ්ඤායො
තාහි ච සුඛිතො විහරිස්සං,
නාහං සීතෙන විහඤ්ඤිස්සං
අනිඤ්ජිතො විහරන්තො'ති.

ඉත්ථං සුදං ආයස්මා තෙකිච්ඡකානි ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**තෙකිච්ඡකානිත්ථෙරගාථා.**

---

1 ඉද්ධි - ට  2 අගාරස්මා අනගාරියං - PTS  3 අනුස්සරං - සිමු 1,2
4 හොසි - සිමු 1, 2 PTS

# 6. ඡක්කනිපාතය

## 6. 1. 1.

375. පතල කීර්තිශබ්ද ඇති ගොයුම්ගොත් බුදුරදුන්ගේ (තුන්දහස්-පන්සියක්) පෙළහර දැක ඊර්ෂ්‍යායෙන් හා මානයෙන් තුළුයෙම් (කස්බ තෝ නො රහත්හි රහත්මගට හෝ නො පිළිපන්හි' තා කෙරෙහි එවන් ප්‍රතිපදා හෝ නැතැ'යි යම්තාක් තර්ජන නො කළ සේක් ද) එතෙක් මම ප්‍රණිපාත නො කෙළෙමි.

376. පුරුෂදම්‍යසාරථි වූ බුදුහු මාගේ සංකල්පය දැන (මට) නිග්‍රහ කළහ, එහෙයින් මට අද්භුත වූ ලොමුදහ ගන්වන සංවෙගයෙක් වී.

377. පෙර ජටිල වූ මට අල්ප වූ ලාභසත්කාරමය වූ යම් ඉද්ධියෙක් වී ද එය මම එදා නිග්‍රහ කළ කල්හි හැරපියා බුදුසස්නෙහි පැවිදි වීමි.

378. පෙර කාමලොකය පෙරටු කොට සිටියෙම් යාගයෙන් සතුටු වූයෙම් පසුවැ (සුගත්සස්නෙහි සිට) රාගයත් ද්වෙෂයත් මොහයත් (නිරවශෙෂ කොට) නසාලීමි.

379. (දැන්) පෙරවිසූ කඳපිළිවෙළ දන්මි (මා විසින්) දිවැස් පිරිසුදු කරන ලද. (මම) ඉද්ධි ඇතියෙම් පරසිත් දන්නෙම් දිව්‍යශ්‍රොත්‍රඥානය ද ලත්මි.

380. මම් යම් අර්ථයක් පිණිස ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වීම් ද සියලු සංයොජනයන්ගේ ක්‍ෂය වූ ඒ අර්ථය මා විසින් ලබනලද්දැ'යි.

මෙසෙයින් ආයුෂ්මත් උරුවෙලකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

උරුවෙලකාශ්‍යප ස්ථවිරගාථා යි.

## 6. 1. 2

381. වී කොටුගුලෙහි තබනලද, හැල් කලවිටෙහි රැස් කොට තබන ලද, පිඬු නො ලබමි. මම් කෙසේ සානෙම් ද? (දිවි රක්නෙම් දැ?යි පාපී මාර කියයි.)

382. පහන්සිත් ඇති වැ ප්‍රමාණාතීත නො වූ බුදුන් සිහි කරව, (ඵරණ-ලක්‍ෂණ) ප්‍රීතියෙන් පතළ සිරිරින් යුතු වැ හැම කල්හි නැඟීසිටි සිත් ඇති වව.

383. පහන් සිත් ඇති වැ ප්‍රමාණාතීත නො වූ දහම සිහි කරව, ප්‍රීතියෙන් පතළ සිරිරින් යුතු වැ හැම කල් නිරතුරු නැඟිසිටි සිත් ඇති වව.

384 පහන්සිත් ඇති වැ ප්‍රමාණාතීත නො වූ සඟුන් සිහි කරව. ප්‍රීතියෙන් පතළ සිරිරින් යුතු වැ හැම කල්හි නැඟීසිටි සිත් ඇති වව. (තෙරණුවෝ තමනට ඔවා දෙති.)

385. (තෙපි) අබවස්හි වාස කරන්නවු යැ. මේ හේමන්තික රාත්‍රීහු සීතයහ සීතයෙන් මඩනාලද්දු වැ නහමක් නැසෙව. තෙපි වසනලද කවුළු ඇති වෙහෙරට පිවිසෙව. (පාපීමාර කියයි.)

386. සතර අප්‍රාමාණ්‍යයන් (බ්‍රහ්මවිහාරයන්) පහස්නෙමි. (කලින් කල සමවදනෙමි.) එයින් (උපන්) සුව ඇති වැ වාස කරන්නෙමි. මම් ආණෙඤ්ජ සමාපත්ති ඇති වැ වාස කරන්නෙම් සීතයෙන් නො නස්නෙමි'යි.

මෙසෙයින් ආයුෂ්මත් තෙකිච්ඡකානි ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

තෙකිච්ඡකානිස්ථවිරගාථා යි.

## 6. 1. 3

387. යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවො නූපලබ්භති,
පරිහායති සද්ධම්මා මච්ඡො අප්පොදකෙ යථා.

388. යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවො නූපලබ්භති,
න විරූහති සද්ධම්මෙ ඛෙත්තෙ බීජංව පූතිකං.

389. යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවො නූපලබ්භති,
ආරකා හොති නිබ්බානා, ධම්මරාජස්ස සාසනෙ.

390. යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවො උපලබ්භති,
න විහායති සද්ධම්මා මච්ඡො බව්හොදකෙ යථා.

391. යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවො උපලබ්භති,
සො විරූහති සද්ධම්මෙ ඛෙත්තෙ බීජංව භද්දකං.

392. යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවො උපලබ්භති,
සන්තිකෙ හොති නිබ්බානං ධම්මරාජස්ස සාසනෙ'ති.

ඉත්ථං සුදං ආයස්මා මහානාගො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

මහානාගත්ථෙරගාථා.

## 6. 1. 4

393. කුල්ලො සිවථිකං ගන්ත්වා අද්දස ඉත්ථිමුජ්ඣිතං,
අපවිද්ධං සුසානස්මිං ඛජ්ජන්තිං කිමිහී ඵුටං.

394. ආතුරං අසුචිං පූතිං පස්ස කුල්ල සමුස්සයං,
උග්ඝරන්තං පග්ඝරන්තං බාලානං අභිනන්දිතං.

395. ධම්මාදාසං ගහෙත්වාන ඤාණදස්සනපත්තියා,
පච්චවෙක්ඛිං ඉමං කායං තුච්ඡං සන්තරබාහිරං.

396. යථා ඉදං තථා එතං, යථා එතං තථා ඉදං,
යථා අධො තථා උද්ධං යථා උද්ධං තථා අධො.

397. යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා,
යථා පුරෙ තථා පච්ඡා යථා පච්ඡා තථා පුරෙ.

398. පඤ්චඞ්ගිකෙන තුරියෙන න රතී හොති තාදිසී,
යථා එකග්ගචිත්තස්ස සම්මා ධම්මං විපස්සතො'ති.

ඉත්ථං සුදං ආයස්මා කුල්ලො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

කුල්ලත්ථෙරගාථා.

### 6. 1. 3

387 යමක්හට සබ්‍රම්සරුන් කෙරෙහි ගෞරවයෙක් විද්‍යමාන නො වේ ද, (හෙතෙම) දියත්තෙකෑ මසකු සෙයින් සදහමින් පිරිහෙයි.

388. යමක්හට සබ්‍රම්සරුන් කෙරෙහි ගෞරවයෙක් නැද්ද, හේ කෙතෙහි කුණුවූ බිජුවට සෙයින් සදහම්හි නො වැඩේ.

389. යමක්හට සබ්‍රම්සරුන් කෙරෙහි ගෞරවයෙක් නැද්ද, හේ ධර්මරාජයන් ගේ සස්නෙහි නිවනින් දුරු වෙයි.

390. යමක්හට සබ්‍රම්සරුන් කෙරෙහි ගෞරවයෙක් විද්‍යමාන වේ ද, හේ දියබෙහි මසකු සෙයින් සදහමින් නො පිරිහෙයි.

391. යමක්හට සබ්‍රම්සරුන් කෙරෙහි ගෞරවයෙක් ඇද්ද, හේ කෙත්හි සොඳුරු බිජුවට සෙයින් සදහම්හි වැඩෙයි.

392. යමක්හට සබ්‍රම්සරුන් කෙරෙහි ගෞරවයෙක් ඇද්ද, හේ ධර්මරාජයන්ගේ සස්නෙහි නිවන් ළඟ මැ වේ යයි.

මෙසෙයින් ආයුෂ්මත් මහානාග ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

**මහනාග ස්ථවිරගාථා සි**

### 6. 1. 4

393. කුල්ල තෙරණු වූ මම් අමුසොහොනට ගොස් සොහොන්හි හැරපියනලද කෑමින් විසින් පැතිරගෙන කනුලබන ස්ත්‍රියක දිටිමි.

394. කුල්ල තෙරණුවනි, දුකින් පෙළනලද අපවිත්‍ර වූ කුණු වූ (උඩු වණමුවින් අසුචි) ඉතිරෙන (යටි වණමුවින් අසුචි) වැගිරෙන (අඳ-පුහුදුන්) බාලයන් විසින් (තෘෂ්ණාමානදෘෂ්ටීන්) අභිනිවේශ කොට සතුටු වනලද සිරුර බලව.

395. විදර්ශනාඥාන සඞ්ඛ්‍යාත ධර්මාදර්ශය ගෙන මාර්ගඥාන සඞ්ඛ්‍යාත ඥානදර්ශනයාගේ අධිගමය පිණිස සිස්වූ ඇතුළු බැහැරි සහිත මේකාය ප්‍රත්‍යවේක්ෂා කෙළෙමි

396. මේ කය යම්සේ ද තෙල කය එසේ යැ, තෙල කය යම්සේ ද මේ කය එසේ යැ, (නාභියෙන් යට) අධඃකාය යම්සේ ද (නාභියෙන් මතු) ඌර්ධ්වකාය එසේ යැ උඩුකය යම්සේ ද යටිකය එසේ සි.

397. මේ කය දවහල්හි (අසුචි වගුරනුයේ) යම්සේ ද රාත්‍රියෙහි එසේ යැ, රාත්‍රියෙහි යම්සේ ද දහවල්හි එසේ යැ පෙර (තරුණකාලයෙහි අසුචි වගුරනුයේ) යම්සේ ද පසු (මහලු කල්හි) එසේ යැ. පසුකල්හි යම්සේ ද පෙරකල්හි එසේ සි.

398. යම්සේ එකඟසිත් ඇති මැනැවින් සකන්ධයන්ගේ උදයව්‍යය දක්නාහට යම් බඳු ධර්මරතියක් වේ ද එවන් රතියක් පසඟතුරු-ගොසිනුදු නො වේ යයි.

මෙසෙයින් ආයුෂ්මත් කුල්ල ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

**කුල්ල ස්ථවිරගාථා සි.**

## 6. 1. 5

399. මනුජස්ස පමත්තචාරිනො තණ්හා වඩ්ඪති මාලුවා විය,
සො පලවති හුරා හුරං ඵලමිච්ඡං ව වනස්මිං වානරො.

400. යං එසා සහතෙ[1] ජම්මී තණ්හා ලොකෙ විසත්තිකා,
සොකා තස්ස පවඩ්ඪන්ති අභිවට්ඨං ව බීරණං.

401. යො චෙතං[2] සහතෙ ජම්මිං තණ්හං ලොකෙ දුරච්චයං,
සොකා තම්හා පපතන්ති උදබින්දුව පොක්ඛරා.

402. තං වො වදාමි භද්දං වො යාවන්තෙත්ථ සමාගතා,
තණ්හාය මූලං ඛණථ උසීරත්ථොව බීරණං,
මා වො නළං ව සොතොව මාරො භඤ්ජි පුනප්පුනං.

403. කරොථ බුද්ධවචනං ඛණො වො[3] මා උපච්චගා,
ඛණාතීතා හි සොචන්ති නිරයම්හි සමප්පිතා.

404. පමාදො රජො සබ්බදා[4] පමාදානුපතිතො රජො,
අප්පමාදෙන විජ්ජාය අබ්බහෙ සල්ලමත්තනො'ති.

ඉත්ථං සුදං ආයස්මා මාලුඞ්ක්‍යපුත්තො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**මාලුඞ්ක්‍යපුත්තථෙරගාථා**

## 6. 1. 6

405 පණ්ණවීසති වස්සානි යතො පබ්බජිතො අහං,
අච්ඡරාසඞ්ඝාතමත්තම්පි චෙතොසන්තිමනජ්ඣගං.

406. අලද්ධා චිත්තස්සෙකග්ගං කාමරාගෙන අද්දිතො,[5]
බාහා පග්ගය්හ කන්දන්තො විහාරා උපනික්ඛමිං.

407. සත්ථං වා ආහරිස්සාමි කො අත්ථො ජීවිතෙන මෙ,
කථං හි සික්ඛං පච්චක්ඛං කාලං කුබ්බෙථ මාදිසො.

408. තදාහං ඛුරමාදාය මඤ්චකම්හි උපාවිසිං,
පරිනීතො ඛුරො ආසි ධමනිං ඡෙත්තුමත්තනො.

409. තතො මෙ මනසීකාරො යොනිසො උදපජ්ජථ,
ආදීනවො පාතුරහු නිබ්බිදා සමතිට්ඨථ.

410. තතො චිත්තං විමුච්චි මෙ පස්ස ධම්මසුධම්මතං,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසන'න්ති.

ඉත්ථං සුදං ආයස්මා සප්පදාසො ථෙරො ගාථායො අභාසිත්ථා,ති.

**සප්පදාසත්ථෙරගාථා.**

---

1 සහති - PTS  2 යො චෙතං - ප  3 වෙ - PTS
4 පමාදො රජො - ප, PTS  5 අට්ටිතො - සිමු 1, 2

6. 1. 5

399 ප්‍රමාදචර්‍ය්‍යා ඇති සත්ත්වයාගේ තෘෂ්ණාව මාලුවාලතාවක් සෙයින් වැඩෙයි. හෙතෙම වනයෙහි ඵල කැමැති වඳුරකු මෙන් භවයෙන් භවයට දිව යෙයි.

400. ලෝකයෙහි විසත්තිකා යයි කියනලද තෙල ලාමක වූ (ඝඩ්ඩාරික) තෘෂ්ණා තොමෝ යම් පුද්ගලයකු මැඩලා ද ඔහට ශෝකයෝ වැසි වට බෙරු තණ (සැවැන්න) සෙයින් වැඩෙති.

401. ලොවැ යමෙක් ඒකාන්තයෙන් ඉක්මවාලිය නොහැකි තෙල ලාමක තෘෂ්ණාව මැඩලා ද, ඔහු කෙරෙන් ශෝකයෝ පොකුරැ-පතින් දියබිදු සෙයින් ගිලිහෙති.

402. මෙහි යම් පමණ රැස්වූහු ද ඒ තොපට කියමි. තොපට යහපතෙක් මැ වේවා. (තෙපි) සුවඳහොට කැමැතියකු බෙරුතණ සෙයින් තෘෂ්ණාවගේ මුල් සිඳිවු.

403. මාර තෙම තොප නදීශ්‍රෝතස (ගංඉවුරෙහි නැගි) හුණ-පඳුරක් සෙයින් පුනපුනා නහමක් නසාවා. බුද්ධවචනය කරවු. (බුද්ධොත්පාදක්ෂණාදි) ක්ෂණය තොප නහමක් ඉක්මයා. යම් හෙය-කින් ක්ෂණය ඉක්මවූවාහු නිරැහි උපන්නාහු සෝචිත්ද එහෙයිනි.

404. (රූපාදි අරමුණෙහි සිහිමුලාව යයි කියනලද) ප්‍රමාදය රජසෙකි. (රාගාදි) රජස් ප්‍රමාද විසින් වැටුණේ වෙයි. අප්‍රමාදයෙන් (සම්‍යක්-ස්මෘතියෙන්) අභීන්මාගීවිද්‍යායෙන් තමාගේ (හෘදයනිඃශ්‍රිත රාගාදි) ශල්‍යය උදුරන්නේ සි.

මෙසෙයින් ආයුෂමත් මාලුඞක්‍යපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ගාථා කීහ.

මාලුඞක්‍යපුත්‍ර ස්ථවිරගාථා සි.

6. 1. 6

405. මම යම් දවසෙක පටන් පැවිදි වීම් ද (ඒ මේ) පස්විසි වස මුළුල්-ලෙහි අසුරුසනක් පමණ කාලයකුදු චිත්තසමාධානයක් නො ලත්මි.

406. කාමරාගයෙන් මඩනාලද්දෙම් සිත්හි එකඟබවක් නො ලැබ දෙඅත් (මුදුනෙහි) බැඳගෙන හඬමින් (නිවස්නා) වෙහෙරින් බැහැර නික්මියෙමි.

407. (දිවි හරනට) ශස්ත්‍රයක් හෝ ගන්නෙමි (සැතින් පැහැරපියමි.) මාගේ ජීවිතයෙන් කවර අර්ථයෙක් ද, මා වැන්නෙක් කෙසේ නම් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කෙරෙමින් (ගිහි වැ) කලුරිය කරන්නේ ද?

408. එදවසැ (ජීවිතයෙහි කලකිරුණු) මම් කරය ගෙන යහනෙහි හිඳගතිමි. (මා විසින්) තමාගේ ගලනහර සිඳින්නට කරය ගලයෙහි එලවාතබනලද්දේ විය.

409. ඉක්බිති මට යෝනිසො මනසිකාරය උපන, ආදීනව පහළ වි, නිර්වේදඥානය (සිත්හි) පිහිටියේ යැ.

410. ඉක්බිති (විදර්ශනාඥානයට අනතුරු වැ) මාගේ සිත් කෙලෙසුන් කෙරෙන් මිදිණ. ධර්මයාගේ සුධර්මතාව බලව (මා විසින්) ත්‍රිවිද්‍යා ලබනලද යැ. බුදුන්ගේ අනුශාසනය කරනලදැ සි.

මෙසෙයින් ආයුෂමත් සප්පදාස ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

සප්පදාස ස්ථවිරගාථා සි.

### 6. 1. 7

411. උට්ඨෙහි[1] නිසීද කාතියාන
මා නිද්දාබහුලො අහු ජාගරස්සු,
මා තං අලසං පමත්තබන්ධු
කූටෙනෙව ජිනාතු මච්චුරාජා.

412. සයථාපි[2] මහාසමුද්දවෙගො
එවං ජාතිජරාතිවත්තතෙ තං,
සො කරොහි සුදීපමත්තනො ත්වං
න හි තාණං තව විජ්ජතෙව අඤ්ඤං.

413. සත්ථා හි විජෙසි මග්ගමෙතං
සඞ්ගා ජාතිජරාභයා අතීතං,[3]
පුබ්බාපරරත්තමප්පමත්තො
අනුයුඤ්ජස්සු දළ්හං කරොහි යොගං.

414. පුරිමානි පමුඤ්ච බන්ධනානි
සඞ්ඝාටි ඛුරමුණ්ඩභික්ඛභොජී,
මා ඛිඩ්ඩාරතිඤ්ච නිද්දං[4]
අනුයුඤ්ජිත්ථ ඣාය කාතියාන.[5]

415. ඣායාහි ජිනාහි කාතියාන
යොගක්ඛෙමපථෙසු කොවිදොසි,
පප්පුය්‍ය අනුත්තරං විසුද්ධිං
පරිනිබ්බාහිසි වාරිනාව ජොති.

416. පජ්ජොතකරො පරිත්තරංසො
වාතෙන විනම්‍යතෙ ලතාව,
එවම්පි තුවං අනාදියානො
මාරං ඉන්දසගොත්ත නිද්ධුනාහි,
සො වෙදයිතාසු වීතරාගො
කාලං කඞ්ඛ ඉධෙව සීතිභූතො’ති.

ඉත්ථං සුදං ආයස්මා කාතියානො ථෙරො ගාථායො අභාසිත්ථා’ති.

**කාතියානත්ථෙරගාථා.**

### 6. 1. 8

417. සුදෙසිතො චක්ඛුමතා බුද්ධෙනාදිච්චබන්ධුනා,
සබ්බසංයොජනාතීතො සබ්බවට්ටවිනාසනො.

418. නිය්‍යානිකො උත්තරණො තණ්හාමූලවිසොසනො,
විසමූලං ආඝාතනං ඡෙත්වා පාපෙති නිබ්බුතිං.

419. අඤ්ඤාණමූලභෙදාය කම්මයන්තවිඝාටනො,
විඤ්ඤාණානං පරිග්ගහෙ ඤාණවජිරනිපාතනො.

---

1 උට්ඨාහි - PTS 2 සෙය්‍යථාපි - මජසං 3 අතීතා - සීමු 1, 2
4 මා ඛිඩ්ඩාරතිං ච මා නිද්දං - මජසං, PTS 5 අනුයුඤ්ජිත්ථ කාතියාන - ප
අනුයුඤ්ජත්ථ ඣායාය කාතියාන - PTS.

### 6. 1. 7

411. කාතියානයෙනි, (සයනයෙන්) නැඟී සිටුව, (පලක් බැඳ) හිඳුව, නිද්‍රා බහුල නොවව, ජාගර්‍යානුයෝගයෙහි යෙදෙව, මූලාසී ඇතියනට නෑ වූ මාර තෙම අලස වූ තොප වඤ්චනායෙන් මෙන් නො දිනාවා.

412. මහාසමුද්‍රයාගේ තරඞ්ගවේගය යම්සේ ද එසෙයින් මැ ජාතියත් ජරාවත් (කුසීදභාවයෙන් මඩනාලද) තොප මැඩගෙන යයි. ඒ තෙපි තමනට (අර්හත්ඵල සඞ්ඛ්‍යාත) මනා ප්‍රතිෂ්ඨාව කරව. යම් හෙයකින් අනෙක් පිහිටෙක් තොපට නැත්තේ මැ වේ ද එහෙයිනි.

413 යම් හෙයෙකින් ශාස්තෘන් වහන්සේ (රාගාදි) සඞ්ගයෙන් ද ජාතිජරාභයින් ද ඉක්මගිය තෙල ආර්‍යමාර්ගය දිනූ සේක් ද එහෙයින් (මාර්ගාධිගමය පිණිස) පූර්වපශ්චිම යාමයෙහි අප්‍රමාද වැ අනුයෝග කරව. දැඩි වැ යෝගභාවනා කරව.

414. කාතියානයෙනි, පළමු (කාමගුණ) බන්ධනයන් මුදව, සඟල සිවුරු දරනුයේ කරයෙන් මුඩු කළ හිස් ඇති වැ භික්ෂාහාර වළඳනුයේ ක්‍රීඩාරතියෙහිත් නිද්‍රායෙහිත් නො යෙදෙව, ධ්‍යාන කරව.

415. කාතියානයෙනි, ධ්‍යාන කරව, (කෙලෙසුන්) දිනව, නිවන්-මඟෙහි (බෝධපාක්ෂිකධර්මයෙහි) නිපුණ වව, අනුත්තර විශුද්ධියට (අර්හත්ත්වයට) පැමිණ ජලයෙන් ගිනි සෙයින් පිරිනිවෙව.

416. මඳ වූ ගිනිසිළු ඇති පහන ලතාවක් මෙන් වායුව විසින් විධ්වංසන කරනුලැබෙයි. එසෙයින් මැ තෙපි උපාදාන නො කරනුයේ ඉන්ද්‍රයාට බඳු ගොත්‍ර ඇති මරහු විධ්වංසන කරව. එ තෙපි වේදනායෙහි පහ වූ ඡන්දරාග ඇති වැ මෙ අත්බැව්හි මැ නිවියේ පරිනිර්වාණකාලය බලව යි.

මෙසෙයින් ආයුෂ්මත් කාතියාන ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

**කාතියාන ස්ථවිරගාථා යි.**

### 6. 1. 8

417. පසැස් ඇති සූර්‍යබන්ධු වූ බුදුරදුන් විසින් හැම සංයෝජනයන් ඉක්මගිය හැම (කර්ම, ක්ලේශ, විපාක) වර්ත්ම නසනසුළු (ආර්‍යමාර්ගය) මොනොවට දෙසනලදි.

418. නෛර්‍යාණික වූ, (සංසාරමහෞඝයෙන්) තරවන, තෘෂ්ණාවගේ මුල් වියළවන ආර්‍යමාර්ගය දුකට මුල් වූ ආඝාතන සඞ්ඛ්‍යාත කර්මක්ලේශය සිඳ නිවනට පමුණුවයි.

419. අඥානයාගේ මුල් සිඳුනා පිණිස (දෙසනලද) කර්ම (ආත්මභාව) යන්ත්‍රය නසාලන, (කාමභවාදියෙහි) විඥානයන්ගේ ග්‍රහණය එළඹසිටි කල්හි මාර්ගඥාන නමැති වජ්‍රය හෙළනා–

420. වෙදනානං විඤ්ඤාපනො[1] උපාදානප්පමොචනො,
භවං අඞ්ගාරකාසුං ව ඤාණෙන අනුපස්සකො

421. මහාරසො සුගම්භීරො ජරාමච්චුනිවාරණො,
අරියො අට්ඨඞ්ගිකො මග්ගො දුක්ඛූපසමනො සිවො.

422. කම්මං කම්මන්ති ඤත්වාන විපාකං ච විපාකතො,
පටිච්චුප්පන්නධම්මානං යථා වා ලොකදස්සනො
මහාඛෙමඞ්ගමො සන්තො පරියොසානභද්දකො'ති.

ඉත්ථං සුදං ආයස්මා මිගජාලො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**මිගජාලත්ථෙරගාථා.**

## 6. 1. 9

423. ජාතිමදෙන මත්තොහං භොගඉස්සරියෙන ච,
සණ්ඨානවණ්ණරූපෙන මදමත්තො අචාරිහං.

424. නාත්තනො සමකං කඤ්චි අතිරෙකං ච මඤ්ඤිසං,
අතිමානහතො බාලො පත්ථද්ධො උස්සිතද්ධජො.

425. මාතරං පිතරඤ්චාපි අඤ්ඤෙපි ගරුසම්මතෙ,
න කඤ්චි අභිවාදෙසිං මානත්ථද්ධො අනාදරො.

426. දිස්වා විනායකං අග්ගං සාරථීනං වරුත්තමං,
තපන්තමිව ආදිච්චං භික්ඛුසඞ්ඝපුරක්ඛතං.

427. මානං මදං ච ඡඩ්ඩෙත්වා විප්පසන්නෙන චෙතසා,
සිරසා අභිවාදෙසිං සබ්බසත්තානමුත්තමං.

428. අතිමානො ච ඔමානො පහීනා සුසමූහතා,
අස්මිමානො සමුච්ඡින්නො සබ්බෙ මානවිධා හතා'ති.

ඉත්ථං සුදං ආයස්මා ජෙන්තො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**ජෙන්තත්ථෙරගාථා.**

## 6. 1. 10

429. යදා නවො පබ්බජිතො ජාතියා සත්තවස්සිකො,
ඉද්ධියා අභිභොත්වාන පන්නගින්දං මහිද්ධිකං.

430. උපජ්ඣායස්ස උදකං අනොතත්තා මහාසරා,
ආහරාමි තතො දිස්වා මං සත්ථා එතදබ්‍රවි.

431. සාරිපුත්ත ඉමං පස්ස ආගච්ඡන්තං කුමාරකං,
උදකුම්භකමාදාය අජ්ඣත්තං සුසමාහිතං.

---

1. විඤ්ඤපනො - PTS

420. වේදනාවන් (දුඃඛාදිවශයෙන් ඇති සැටි) හඟවන, (කාමාදි) උපාදානයන්ගෙන් (චිත්තසන්තානය) මුදාලන, භවය අඞ්ගාර-කර්ෂුවක් (අඟුරුවළක්) සෙයින් මාර්ගඥානයෙන් දක්වන-

427. (ශාන්තප්‍රණීත බැවින් හෝ පරිශුද්ධි කෘත්‍යභාවයෙන් සාමඤ්ඤඵල සම්පත්තින් හෝ) මහාරස ඇති ඉතා ගැඹුරු වූ, ජරාමරණ වළහන (සසර) දුක් සන්හිඳුවන ක්ෂේම වූ ආර්ය අෂ්ටාඞ්ගමාර්ගය (දෙසනලදි.)

422. ප්‍රතීත්‍යසමුත්පන්නධර්මයන් කෙරෙහි කර්මය 'කර්ම යැ' යි දැන විපාක ද විපාක විසින් දැන ඇති සැටියෙන් ඥානාලෝකය දක්වන, (සත්ත්වයන්) මහත් වූ (නිර්වාණ) ක්ෂේමයට පමුණුවන (ක්ලේශ දරථ සන්හිඳුවන හෙයින්) ශාන්ත වූ පර්යවසාන කල්‍යාණ වූ (ආර්ය අෂ්ටාඞ්ගමාර්ගය දෙසනලදි.)

මෙසෙයින් ආයුෂ්මත් මිගජාල ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

**මිගජාල ස්ථවිරගාථා යි.**

## 6. 1. 9

423. මම් ජාතිමදයෙනුදු භෝගසම්පත්තියෙනුදු ඓශ්වර්යසම්පත්තියෙනුදු මත් වූයෙම් පැහැසටහන් රුවිනුදු තදන්‍ය මදයෙනුදු මත් වැ හැසුරුණෙමි.

424. තමා හා සම වූ හෝ වැඩිසිටි හෝ කිසිවකු නො සිතීමි. බාල වූයෙම් අතිමානයෙන් හටූයෙම් ඉතා තදමත් ඇතියෙම් නගනලද මානධ්වජ ඇතියෙම්-

425. මව හෝ පියා හෝ 'ගරු කටයුතු යැ'යි සම්මත වූ අන්‍ය වූ හෝ කිසිවකු තදමත් ඇතියෙම් ආදර රහිත වූයෙම් අභිවාදන නො කෙළෙමි.

426. (වෛනෙය ජනයන්) විනයන කරන අග්‍ර වූ පුරුෂදම්‍යසාරථීන් අතුරෙහි ඉතා උතුම් වූ දිලියෙන හිරු බඳු, මහණගණා විසින් පෙරටු කරනලද ශාස්තෘන් වහන්සේ දැක-

427. මානයත් මදයත් හැරපියා පහන්සිතින් යුතු වැ හැම සත්නට උතුම් වූ ශාස්තෘන් වහන්සේ සිරසින් අභිවාදන කෙළෙමි.

428. (මාගේ) සෙය්‍යමානය ද හීනමානය ද ප්‍රහීණ වූහ. මොනොවට උපුරාපියනලදහ. අස්මිමානය මොනොවට සිඳුනාලද යැ. සියලු මානකොට්ඨාසයෝ නසනලදහ'යි.

මෙසේ පුරෝහිතපුත්‍ර ආයුෂ්මත් ජේන්ත ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

**ජේන්ත ස්ථවිරගාථා යි.**

## 6. 1. 10

429. යම් දවසෙක අලුත පැවිදි වූයෙම් උපතින් සත් හැවිරිදි වූයෙම් මහත් සෘද්ධි ඇති නාරජහු ඉද්ධියෙන් අභිභවන කොට (මැඩලා)-

430. තුතත් දහතලායෙන් උපාධ්‍යායන් වහන්සේට දිය ගෙන එම් ද එසඳ භාග්‍යවතුන් වහන්සේ මා දැක තෙල කරුණ වදාළහ:

431. ශාරිපුත්‍රයෙනි, මෙ කුමරහු දියකළය ගෙන සත්හුන් සිතැති වැ එන්නා බලව.

432. පාසාදිකෙන වත්තෙන කල්‍යාණඉරියාපථො,
සාමණෙරොනුරුද්ධස්ස ඉද්ධියා ච විසාරදො.

433. ආජානීයෙන ආජඤ්ඤො සාධුනා සාධුකාරිතො,
විනීතො අනුරුද්ධෙන කතකිච්චෙන සික්ඛිතො.

434. සො පත්වා පරමං සන්තිං සච්ඡිකත්වා අකුප්පතං,
සාමණෙරො ස සුමනො මා මං ජඤ්ඤාති ඉච්ඡතී'ති.

ඉත්ථං සුදං ආයස්මා සුමනො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**සුමනත්ථෙරගාථා**

## 6. 1. 11

435. වාතරොගාභිනීතො ත්වං විහරං කානනෙ වනෙ,
පවිද්ධගොචරෙ ලූඛෙ කථං භික්ඛු කරිස්සසි.

436. පීතිසුඛෙන විපුලෙන ඵරිත්වාන සමුස්සයං,
ලූඛම්පි අභිසම්භොන්තො විහරිස්සාමි කානනෙ.

437. භාවෙන්තො සත්තබොජ්ඣඞ්ගෙ ඉන්ද්‍රියානි බලානි ච,
ඣානසොඛුම්මසම්පන්නො විහරිස්සං අනාසවො.

438. විප්පමුත්තං කිලෙසෙහි සුද්ධචිත්තං අනාවිලං,
අභිණ්හං පච්චවෙක්ඛන්තො විහරිස්සං අනාසවො.

439. අජ්ඣත්තං ච බහිද්ධා ච යෙ මෙ විජ්ජිංසු ආසවා,
සබ්බෙ අසෙසා උච්ඡින්නා න ච උප්පජ්ජරෙ පුන.

440. පඤ්චක්ඛන්ධා පරිඤ්ඤාතා තිට්ඨන්ති ඡින්නමූලකා,
දුක්ඛක්ඛයො අනුප්පත්තො නත්ථි දානි පුනබ්භවො'ති.

ඉත්ථං සුදං ආයස්මා න්හාතකමුනිත්ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**න්හාතකමුනිත්ථෙරගාථා.**

## 6. 1. 12

441. අක්කොධස්ස කුතො කොධො දන්තස්ස සමජීවිනො,
සම්මදඤ්ඤා විමුත්තස්ස උපසන්තස්ස තාදිනො.

442. තස්සෙව තෙන පාපියො යො කුද්ධං පටිකුජ්ඣති,
කුද්ධං අප්පටිකුජ්ඣන්තො සඞ්ගාමං ජෙති දුජ්ජයං.

443. උභින්නමත්ථං චරති අත්තනො ච පරස්ස ච,
පරං සඞ්කුපිතං ඤත්වා යො සතො උපසම්මති.

444. උභින්නං තිකිච්ඡන්තානං අත්තනො ච පරස්ස ච,
ජනා මඤ්ඤන්ති බාලොති යෙ ධම්මස්ස අකොවිදා.

432. ප්‍රසාද එළවන ආචාර වතින් සපත් ඉරියව් ඇති, අනුරුද්ධයන්ගේ හෙරණ තෙම සෘද්ධියෙහි ද විශාරද වෙයි.

433. පුරුෂශ්‍රෙෂ්ඨ වූ (ආත්මහිත පරහිත සාධනයෙන්) සාධු වූ, කල (සියුම්ග) කිස ඇති අනුරුද්ධයන් විසින් විනයන කරනලද හික්ම-වනලද (එහෙයින් ම) පුරුෂශ්‍රෙෂ්ඨ වූ යහපත් කරවනලද-

434. ඒ සුමන සාමණේර පරම ශාන්තියට පැමිණ අභීත්ඵලය සාක්ෂාත් කොට 'මා (ක්ෂීණාස්‍රව යැ'යි අනෙකෙක්) නො දනීව'යි කැමැති වේ යයි (බුදුහු වදාළහ'යි.)

මෙසෙයින් ආයුෂ්මත් සුමන ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

සුමන ස්ථවිරගාථා යි.

## 6. 1. 11

435 මහණ, දුර්ලභප්‍රත්‍යය ඇති රූක්ෂ වූ මහවෙනෙහි වසන තෝ වාතරොගයෙන් අවසභාවයට පමුණුවනලද්දෙහි කෙසේ වාස කරන්නෙහි ද?

436. මහත් වූ ප්‍රීතිසුඛයෙන් ශරීරය පතුරුවාගෙන ප්‍රත්‍යය රූක්ෂය පවා මැඩලමින් වනයෙහි වාස කරන්නෙමි.

437. සප්තබොධ්‍යඞ්ගයන් ද (ශ්‍රද්ධාදි) පඤ්චෙන්ද්‍රියයන් ද (ශ්‍රද්ධාදි) පඤ්චබලධර්මයන් ද වඩමින් ධ්‍යානසූක්ෂමභාව සඞ්ඛ්‍යාත අරූපධ්‍යාන සමපන්න වූයෙම් ආස්‍රව රහිත වැ වාස කරන්නෙමි.

438. කෙලෙසුන් කෙරෙන් මිදුණු නො කැලඹුණු ශුද්ධචිත්තය එක්වත් ප්‍රත්‍යවෙක්ෂා කෙරෙමින් ආස්‍රව රහිත වැ වාස කරන්නෙමි.

439. මාගේ අධ්‍යාත්ම වූත් බාහ්‍ය වූත් යම් ආස්‍රව කෙනෙක් විද්‍යමාන වූහු ද එ හැම ශෙෂ රහිත වැ සිඳුනාලද්දහු යළි නූපදනාහ.

440. පඤ්චස්කන්ධයෝ පිරිසිඳ දත්නාලද්දහු සිඳුනාලද මුල් ඇති වැ සිටිති. දුඃඛක්ෂයට පැමිණියෙමි. මින් මතු පුනර්භවයෙක් නැතැ යි.

මෙසේ ආයුෂ්මත් නහාතකමුනි ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

නහාතකමුනි ස්ථවිරගාථා යි.

## 6. 1. 12

441. ක්‍රෝධ රහිත වූ (රහත් මඟින් ඉඳුරන් දමනය කිරීමෙන්) දාන්ත වූ සම වූ දිවිපැවැතුම් ඇති මැනැවින් දතයුතු දහම් දැනැ (ආස්‍රවයෙන්) විමුක්ත වූ උපශාන්ත වූ (ඉට්ඨ අනිට්ඨ අරමුණෙහි නො සැලෙන) තාදී ගුණ ඇතියාහට ක්‍රෝධයෙක් කොයින් ද?

442. යමෙක් තමා කෙරෙහි කිපියහුට පෙරළා කිපේ ද එයින් ඔහට මැ ඉතා අයහපතෙක් වෙයි. කිපියහුට පෙරළා නො කිපෙන්නේ දුර්ජය (කෙලශ) සඞ්ග්‍රාම දිනයි.

443. යමෙක් මෙරමා කිපියා දැනැ සිහි ඇති වැ (උපෙක්ෂායෙන්) ඉවසා ද හෙතෙම තමහට ද මෙරමාහට ද යන දෙදෙනාට හිතයක් කරයි.

444. යම් කෙනෙක් (ආර්‍ය්‍ය ආචාර) ධර්මයෙහි නො නිපුණ වෙත් ද ඒ බාලජනයෝ තමහට ද මෙරමාහට ද යන දෙදෙනාට (ක්‍රොධව්‍යාධි හරනට) පිළියම් කරන එ පුද්ගල 'බාලයෙකැ'යි හඟිති.

445. උප්පජ්ජෙ තෙ[1] සචෙ කොධො ආවජ්ජ කකචූපමං,
උප්පජ්ජෙ චෙ රසෙ තණ්හා පුත්තමංසූපමං සර.

446. සචෙ ධාවති චිත්තං තෙ කාමෙසු ච භවෙසු ච,
ඛිප්පං නිග්ගණ්හ සතියා කිට්ඨාදං විය දුප්පසු'න්ති.

ඉත්ථං සුදං ආයස්මා බ්‍රහ්මදත්තො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

බ්‍රහ්මදත්තත්ථෙරගාථා.

## 6. 1. 13

447. ඡන්නමතිවස්සති විවටං නාතිවස්සති,
තස්මා ඡන්නං විවරෙථ එවං තං නාතිවස්සති.

448. මච්චුනාබ්භාහතො ලොකො ජරාය පරිවාරිතො,
තණ්හාසල්ලෙන ඔතිණ්ණො ඉච්ඡාධූපායිතො[2] සදා.

449. මච්චුනාබ්භාහතො ලොකො පරික්ඛිත්තො ජරාය ච,
හඤ්ඤති නිච්චමත්තාණො[3] පත්තදණ්ඩො'ව තක්කරො.

450. ආගච්ඡන්තග්ගිඛන්ධා'ව මච්චු ව්‍යාධි ජරා තයො,
පච්චුග්ගන්තුං බලං නත්ථි ජවො නත්ථි පලායිතුං.

451. අමොඝං දිවසං කයිරා අප්පෙන බහුකෙන වා
යං යං විජහතෙ[4] රත්තිං තදූනං තස්ස ජීවිතං.

452. චරතො තිට්ඨතො වා පි ආසීනසයනස්ස වා,
උපෙති චරිමා රත්ති න තෙ කාලො පමජ්ජිතු'න්ති.

ඉත්ථං සුදං ආයස්මා සිරිමණ්ඩො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

සිරිමණ්ඩත්ථෙරගාථා.

1. උප්පජ්ජතෙ - සීමු 1, 2 සයා, PTS 2. ඉච්ඡාධූමායිතො - සීමු 1, 2.
3 නිච්චමත්තාණතො - සීමු 1, 2. 4. විරහතො - සීමු 1, 2. විහරතෙ - ප

445 ඉදින් (කමටහන්හි යෙදෙන තොපට) ක්‍රෝධය උපදී නම් (බුදුන් වදාළ) කකචූපම අවවාද මෙනෙහි කරව. ඉදින් රසයෙහි තෘෂ්ණා උපදී නම් පුත්‍රමාංශෝපමාව සිහි කරව

446. ඉදින් තොපගේ සිත පස්කම් ගුණයෙහි ද (කාමාදි) භවයෙහි ද දිවේ නම් (එසඳ) වහා සිහියෙන් ගොයම් කන නපුරු ගොනකු සෙයින් නිගනුව'යි.

මෙසෙයින් ආයුෂ්මත් බ්‍රහ්මදත්ත ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

බ්‍රහ්මදත්ත ස්ථවිරගාථා යි.

## 6. 1. 13

447. (ආපත්ති අනාරෝචන විසින්) ප්‍රතිච්ඡන්න වූයේ අතිශයින් (ආපත්ති - කෙලශ) වර්ෂා කෙරෙයි (තෙමාලයි). විවෘත වූයේ නො වසී. එහෙයින් ප්‍රතිච්ඡන්නය විවෘත කරන්නේ යෑ. මෙසේ ඒ ප්‍රතිච්ඡන්නය (ඇවැත්වැසි - කෙලෙස්වැසි) නො වසී.

448. හැම කල්හි සත්ත්වලෝකය මරහු විසින් පහරනලද්දේ යෑ. ජරාව විසින් පිරිවරනලද්දේ යෑ. තෘෂ්ණාශල්‍ය විසින් බැසගන්නා ලද්දේ යෑ. (අරමුණු පතන) ඊර්ෂ්‍යාව විසින් තවනලද්දේ යි.

449. සත්ත්වලෝකය මරහු විසින් පහරනලද්දේ යෑ. ජරාව විසින් පිරිකෙව් ද කරනලද්දේ යෑ. පැමිණි දඬුවම් ඇති සොරකු සෙයින් අසරණ වැ නිරතුරු පෙළෙයි.

450. මරණ යෑ ව්‍යාධි යෑ ජරා යෑ යන තිදෙන ගිනිකඳු සෙයින් එති. ප්‍රතිමල්ල වැ පෙරට යන්නට බලයෙක් නැත. (පිටුපෑ) පලායන්නට ජවයෙක් නැති

451. මඳින් හෝ බෙහෙවින් හෝ (කරනලද විදර්ශනා මනසිකාරයෙන්) දවස නො සිස් කරන්නේ යෑ. යම් යම් රාත්‍රියක් ඉක්මවා ද එයින් ඔහුගේ ජීවිතය ඌන වෙයි.

452. යන්නාහට වේවයි සිටුනාහට වේවයි හිඳුනාහට වේවයි ශයනය කරන්නාහට වේවයි පශ්චිමරාත්‍රිය එළැඹෙයි. තොපට පමාවන්නට මේ කල් නො වේ යයි.

මෙසෙයින් ආයුෂ්මත් සිරිමණ්ඩ ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

සිරිමණ්ඩ ස්ථවිරගාථා යි.

## 6. 1. 14

453. දිපාදකොයං අසුචි දුග්ගන්ධො පරිගීරති,
නානාකුණපපරිපූරෙ විස්සවන්තො තතො තතො.

454. මිගං නිලීනං කූටෙන බළිසෙනෙව අම්බුජං,
වානරං විය ලෙපෙන බාධයන්ති පුථුජ්ජනං.

455. රූපා සද්දා රසා ගන්ධා ඵොට්ඨබ්බා ච මනොරමා,
පඤ්චකාමගුණා එතෙ ඉත්ථිරූපස්මිං දිස්සරෙ.

456. යෙ එතා උපසෙවන්ති රත්තචිත්තා පුථුජ්ජනා,
වඩ්ඪෙන්ති කටසිං ඝොරං ආචිනන්ති පුනබ්භවං.

457. යො චෙතා[1] පරිවජ්ජෙති සප්පස්සෙව පදා සිරො,
සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තති.

458. කාමෙස්වාදීනවං දිස්වා නෙක්ඛම්මං දට්ඨු ඛෙමතො,
නිස්සටො සබ්බකාමෙහි පත්තො මෙ ආසවක්ඛයො'ති.

ඉත්ථං සුදං ආයස්මා සබ්බකාමී ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

සබ්බකාමිත්ථෙරගාථා.

තස්සුද්දානං:

උරුවෙලකස්සපො ච ථෙරො තෙකිච්ඡකාරි ච
මහානාගො ච කුල්ලො ච මාලුඞ්ක්‍යො[2] සප්පදාසකො,
කාතියානො මිගජාලො ජෙන්තො සුමනසව්හයො,
නහාතමුනි බ්‍රහ්මදත්තො සිරිමණ්ඩො[3] සබ්බකාමී ච[4]
ගාථායො චතුරාසීති ථෙරා චෙත්ථ චතුද්දසා'ති.

## ඡක්කනිපාතො නිට්ඨිතො.

1 යො චෙතං - ප, PTS, යො චෙතං - සීමු.1, 2. 2 මාලුතො - සීමු 1.
3 සිරිමණ්ඩො - සීමු 1 4 සබ්බකාමිකො - PTS

## 6. 1. 14

453. දෙපා ඇති මේ කය නොයෙක් කුණපයෙන් පිරුණේ ඒ ඒ ද්වාරයෙන් අසුචි වැගිරෙනුයේ අශුද්ධ වූයේ දුගඳ වූයේ (මල්ගඳ-විලෙවුන් ආදියෙන් සකසා) පරිහරණ කරනුලැබේ.

454. (දැල් මලපුඬු ආදී) කූටෝපක්‍රමයෙන් සැඟවුණු මුවකු සෙයින් බිලියෙන් මසකු සෙයින් වඳුරුමලයෙන් වඳුරකු සෙයින් (පස්කම්හු) පෘථග්ජනයා පෙළති.

455. මනරම් රූප යැ ශබ්ද යැ රස යැ ගන්ධ යැ ස්ප්‍රෂ්ටව්‍ය යැ යන මෙ පස්කම්ගුණයෝ ස්ත්‍රීරූපයෙහි දක්නාලැබෙත්.

456. රාගයෙන් ඇලුණු සිත් ඇති යම් පෘථග්ජන කෙනෙක් තෙල ස්ත්‍රීන් සෙවන කෙරෙත් ද, ඔහු ඝෝර වූ (සංසාර සඞ්ඛ්‍යාත) සුසානය වඩති. පුනර්භවය රැස් කෙරෙති.

457. යමෙක් තුලුන් (ස්ත්‍රීන්) පාදයෙන් සර්පශීර්ෂයක් මෙන් දුරු කෙරේ ද හෙතෙම ලොවැ මෙ විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව සිහි ඇති වැ ඉක්මවයි.

458. කාමයෙහි ආදීනව දැකැ නෛෂ්ක්‍රම්‍යය නිර්භය වශයෙන් දැකැ සියලු (ත්‍රෛභූමක) කාමයෙන් නික්මගියෙමි. මා විසින් ආශ්‍රවක්ෂය (නිර්වාණය) ලබනලද්දේ යි.

මෙසෙයින් ආයුෂ්මත් සබ්බකාමී ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

**සබ්බකාමී ස්ථවිරගාථා යි.**

උද්දානය:

උරුවෙලකාශ්‍යප ස්ථවිර යැ, තෙකිච්චකාරි ස්ථවිර යැ, මහානාග ස්ථවිර යැ, කුල්ල ස්ථවිර යැ, මාලුඞ්ක්‍ය ස්ථවිර යැ, සප්පදාසක ස්ථවිර යැ, කාතියාන ස්ථවිර යැ, මිගජාල ස්ථවිර යැ, ජේන්ත ස්ථවිර යැ, සුමන ස්ථවිර යැ, නහාතමුනි ස්ථවිර යැ, බ්‍රහ්මදත්ත ස්ථවිර යැ, සිරිමණ්ඩ ස්ථවිර යැ, සබ්බකාමී ස්ථවිර යැ යි මෙහි තෙරහු තුදුස් දෙනෙකි, ගාථා සුවාසූයෙකි.

**ඡක්කනිපාතය නිමි.**

# 7. සත්තකනිපාතො

### 7. 1. 1

459. අලඞ්කතා සුවසනා මාලභාරී[1] විභූසිතා,
අලත්තකකතාපාදා පාදුකාරුය්හ වෙසිකා.

460. පාදුකා ඔරුහිත්වාන පුරතො පඤ්ජලීකතා,
සා මං සණ්හෙන මුදුනා මිහිතපුබ්බං අභාසථ.

461. යුවාසි ත්වං පබ්බජිතො තිට්ඨාහි මම සාසනෙ,
භුඤ්ජ මානුසකෙ කාමෙ අහං විත්තං දදාමි තෙ.

462. සච්චං තෙ පටිජානාමි අග්ගිං වා තෙ හරාමහං,
යදා ජිණ්ණා භවිස්සාම උභො දණ්ඩපරායනා,
උභො පි පබ්බජිස්සාම උභයත්ථ කටග්ගහො.

463. තං ච දිස්වාන යාචන්තිං වෙසිකං පඤ්ජලීකතං,
අලඞ්කතං සුවසනං මච්චුපාසං ච ඔඩ්ඩිතං.

464. තතො මෙ මනසීකාරො යොනිසො උදපජ්ජථ,
ආදීනවො පාතුරහු නිබ්බිදා සමතිට්ඨථ.

465. තතො චිත්තං විමුච්චි මෙ පස්ස ධම්මසුධම්මතං,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසන'න්ති.

ඉත්ථං සුදං ආයස්මා සුන්දරසමුද්දො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**සුන්දරසමුද්දත්ථෙරගාථා.**

### 7. 1. 2

466. පරෙ අම්බාටකාරාමෙ වනසණ්ඩම්හි භද්දියො,
සමූලං තණ්හමබ්බුය්හ තත්ථ භද්දො ඣියායති[2]

467 රමන්තෙකෙ මුතිඞ්ගෙහි[3] වීණාහි පණවෙහි ච,
අහං ච රුක්ඛමූලස්මිං රතො බුද්ධස්ස සාසනෙ.

468. බුද්ධො චෙ[1] මෙ වරං දජ්ජා සො ච ලබ්භෙථ මෙ වරො,
ගණ්හෙහං සබ්බලොකස්ස නිච්චං කායගතං සතිං.

469. යෙ මං රූපෙන පාමිංසු යෙ ච ඝොසෙන අන්වගූ,
ඡන්දරාගවසූපෙතා න මං ජානන්ති තෙ ජනා.

---

1. මාලාභාරී - සීමු මාලධාරී - මජසං, PTS 2. භද්දෙධිඣායායති - සීමු 1 භද්දෙධිඣායාති - සීමු 2 3 මුදිඞ්ගෙහි - සීමු 1, 2
4 ච - සීමු 1, 2, ප, PTS.

# 7. සත්තකනිපාතය

## 7. 1. 1

459. (හස්තාභරණ පාදාභරණයෙන්) අලඞ්කෘත වූ (හඳනාලද) සුන්දර වස්ත්‍ර ඇති, (පැලැඳි) මල්දම් ඇති, (මල්ගඳවිලෙවුනින්) සැරසුණු ලාරසින් රතු පායුවල ඇති වෙසගනක් රත්මිරිවැඩි පයලා සිටියා යැ.

460. ඕ තොමෝ වහන්සගල මුඳු ඉදිරියෙහි ඇඳිලි බැඳ සිටියා මුදු මොළොක් මිහිරි තෙපුල් පෙරටු කොට තෙල වදන් කීවා යැ:

461. "පැවිදි වූ තෙපි යෞවන වවු, මාගේ වචනයෙහි සිටුව, මිනිස්කම්-සුව වළඳව, තොපට මම සම්පත් දෙමි.

462. තොපට සත්‍යය පිළින කෙරෙමි. (සපථ පිණිස) මම තොපට ගිනි හෝ ගෙනෙමි. යම් දවසෙකැ අපි දෙදෙන මහලු වැ දණ්ඩ-පරායන වමෝ ද, (එකල්හි) දෙදෙන මැ පැවිදි වම්හ. ඒ දෙලොවැ දිනීමෙක් වෙයි" කියා යි.

463. අලඞ්කෘත වූ හඳනාලද සුන්දරවස්ත්‍ර ඇති දමනලද මළපුඹුවක් වැනි වූ ඇඳිලි බැඳ අයදනා ඒ වෙසගන දුකැ-

464. එහෙයින් මට යෝනිසොමනසිකාර උපන, ආදීනව පහළ විය. නිර්වේදඥනය (මාගේ හෘදයෙහි) පිහිටියේ යි.

465. ඉක්බිති මාගේ සිත (කෙලෙසුන් කෙරෙන්) විමුක්ත විය. ධර්මයාගේ සුධර්මතාව බලව. (මා විසින්) ත්‍රිවිද්‍යා ලබනලද යැ. බුදු-සසුන් කරනලද යි"

මෙසේ ආයුෂ්මත් සුන්දරසමුද්‍ර ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

**සුන්දරසමුද්‍ද ස්ථවිරගාථා යි.**

## 7. 1. 2

466. භද්දිය තෙම ශ්‍රේෂ්ඨ වූ අම්බාටක අරම්හි වනලැහැබෙහි අවිද්‍යාව සහිත තෘෂ්ණාව උපුරා සුන්දර වූයේ එහි ධ්‍යාන කෙරෙයි.

467. ඇතැම් කෙනෙක් මිහිඟුබෙරයෙන් වීණායෙන් පණාබෙරයෙන් රමණය කෙරෙති. මම වූකලි බුදුසසුන්හි ඇලුණෙම් රුක්මුල්හි සිත් අලවා වෙසෙමි.

468. ඉදින් බුදුරජාණන් වහන්සේ මට වරයක් දෙනසේක් නම් ඒ වරයන් (මහාදෙළ සෙයින්) මා විසින් ලබනලද්දේ වී නම් මම මුළුලොවට නිති කායගතාසති භාවනාව ගනිමි.

469. යම් කෙනෙක් (ලකුණොක) රූප හෙතුයෙන් මට අවමන් කළාහු ද යම් කෙනෙකුත් මධුරස්වර හෙතුයෙන් අනුගත වූවාහු (බුහුමන් කළාහු) ද ඡන්දරාග වශයට පමිණි ඒ (අවිවිධ) ජනයෝ මා නො දනිති.

470. අජ්ඣත්තං ච න ජානාති බහිද්ධා ච න පස්සති,
සමන්තාවරණො බාලො ස වෙ සොසෙන වුය්හති.

471. අජ්ඣත්තං ච න ජානාති බහිද්ධා ච විපස්සති,
බහිද්ධා ඵලදස්සාවී සො'පි සොසෙන වුය්හති.

472. අජ්ඣත්තං ච පජානාති බහිද්ධා ච විපස්සති,
අනාවරණදස්සාවී න සො සොසෙන වුය්හතී'ති.

ඉත්ථං සුදං ආයස්මා ලකුණ්ටකභද්දියො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

ලකුණ්ටකභද්දියත්ථෙරගාථා.

7. 1. 3

473. එකපුත්තො අහං ආසිං පියො මාතු පියො පිතු.
බහූහි වතචරියාහි ලද්ධො ආයාචනාහි ච.

474. තෙ ච මං අනුකම්පාය අත්ථකාමා හිතෙසිනො,
උභො පිතා ච මාතා ච බුද්ධස්ස උපනාමයුං.

475. කිච්ඡා ලද්ධො අයං පුත්තො සුඛුමාලො සුඛෙධිතො,
ඉමං දදම තෙ නාථ ජිනස්ස පරිචාරකං.[1]

476. සත්ථා ච මං පටිග්ගය්හ ආනන්දං එතදබ්‍රවි,
පබ්බාජෙහි ඉමං ඛිප්පං හෙස්සත්‍යාජානියො අයං.

477. පබ්බාජෙත්වාන මං සත්ථා විහාරං පාවිසී ජිනො,
අනොග්ගතස්මිං සූරියස්මිං තතො චිත්තං විමුච්චි මෙ.

478 තතො සත්ථා නිරාකත්වා පටිසල්ලානවුට්ඨිතො,
එහි භද්‍ද'ති මං ආහ සා මෙ ආසූපසම්පදා.

479. ජාතියා සත්තවස්සෙන ලද්ධා මෙ උපසම්පදා,
තිස්සො විජ්ජා අනුප්පත්තා අහො ධම්මසුධම්මතා'ති.

ඉත්ථං සුදං ආයස්මා භද්දො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

භද්දත්ථෙරගාථා.

---

1 පරිචාරිකං - සිමු. 1, 2

470. ඇතුලතත් නො දනියි, පිටතත් නො දකියි. බාල තෙම හාත් පසින් ආවරණ ඇතියේ යැ හේ එකත්තෙන් සෝෂයෙන් අදනාලැබේ.

471. යමෙක් ඇතුලත නො දනී ද එතෙකුදුවත් පිටත (ශ්‍රැතියෙන් හෝ ආකල්ප සැලැකීමෙන්) දකී ද පිටත ඵල පමණක් දක්නා හෙ ද ඝොෂයෙන් අදනාලැබේ.

472. යමෙක් ඇතුලතත් (අශෛක්‍ෂශීලාදිගුණ) දනී ද පිටතත් (ආකල්පසම්පත්තිආදිය) දකී ද ආවරණ රහිත වැ දක්නා ඒ ආයර්‍ය පුද්ගල තෙම ඝොෂයෙන් නො අදනාලැබේ යයි.

මෙසේ ආයුෂ්මත් ලකුණ්ඨකභද්දිය ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

**ලකුණ්ඨකභද්දිය ස්ථවිරගාථා යි.**

**7. 1. 3**

473. මම බොහෝ ව්‍රතචර්‍යාවත්ගෙන් ද ආයාචනාවත්ගෙන් ද ලබනලද මවුහට ප්‍රිය වූ පියාහට ප්‍රිය වූ එක් මැ පුත්‍රයා වීමි.

474. එ මවුත් පියාත් දෙදෙන මට වැඩ කැමැත්තාහු හිත කැමැත්තාහු අනුකම්පා පිණිස මා බුදුරජාණන් වහන්සේ සමීපයට පැමිණවූහ.

475 "ස්වාමීනි, මෙ පුත්‍ර තෙම දුකසේ ලබනලද්දේ යැ, සියුමැලි යැ, සුවසේ වඩනලද්දේ යැ, මොහු අතැවැසි කොට ජින වූ නුඹ වහන්සේට දෙම්හ"යි.

476. ශාස්තෲන් වහන්සේත් මා පිළිගෙන අනඳ තෙරණුවන්ට තෙල කරුණ වදාළහ: "මොහු වහා පැවිදි කරව, මෙ දරු ශ්‍රෙෂ්ඨ පුරුෂයෙක් වන්නේ යැ" යි.

477. ශාස්තෲන් වහන්සේ මා පැවිදි කරවා විහාරයට වැඩ වදාළහ. හිරු අස්තයට නො යන තෙක් මැ ඒ විදර්‍ශනාරම්භයෙන් නො බෝ වෙලායෙහි මාගේ සිත (කෙලෙසුන් කෙරෙන්) විමුක්ත විය.

478. එක්බිති ශාස්තෲන් වහන්සේ සමවත් ඵලසමවත් හැරපියා පිළිසලතින් නැගීසිටි සේක් 'එව භද්‍රයෙනි'යි මට වදාළහ. ඒ මාගේ උපසම්පදා වී.

479. උපතින් සත්හැවිරිදි වූ මා විසින් උපසම්පත් ලබනලද යැ, ත්‍රිවිද්‍යා ලබනලද යැ. ධර්මයාගේ සුධර්මතාව ආශ්චර්‍ය යැ" යි.

මෙසෙයින් ආයුෂ්මත් භද්‍ර ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

**භද්‍ර ස්ථවිරගාථා යි.**

### 7. 1. 4

480 දිස්වා පාසාදඡායායං චඞ්කමන්තං නරුත්තමං,
තත්ථ නං උපසඞ්කම්ම වන්දිසං පුරිසුත්තමං.

481. එකංසං චීවරං කත්වා සංහරිත්වාන පාණයො,[1]
අනුචඞ්කමිස්සං විරජං සබ්බසත්තානමුත්තමං.

482 තතො පඤ්හෙ අපුච්ඡි මං පඤ්හානං කොවිදො විදූ,
අච්ඡම්භී ච අභීතො ච ව්‍යාකාසිං සත්ථුනො අහං.

483. විස්සජ්ජිතෙසු පඤ්හෙසු අනුමොදි තථාගතො,
භික්ඛුසඞ්ඝං විලොකෙත්වා ඉමමත්ථං අභාසථ.

484. ලාභා අඞ්ගානමගධානං යෙසායං පරිභුඤ්ජති,
චීවරං පිණ්ඩපාතං ච පච්චයං සයනාසනං,
පච්චුට්ඨානං ච සාමීචිං තෙසං ලාභාති චාබ්‍රවි.[2]

485 අජ්ජතග්ගෙ මං සොපාක දස්සනායූපසඞ්කම,[3]
එසා චෙව තෙ සොපාක භවතු උපසම්පදා.

486. ජාතියා සත්තවස්සොහං ලද්ධාන උපසම්පදං,
ධාරෙමි අන්තිමං දෙහං අහො ධම්මසුධම්මතා'ති.

ඉත්ථං සුදං ආයස්මා සොපාකො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**සොපාකත්ථෙරගාථා.**

### 7. 1. 5

487. සරෙ හත්ථෙහි භඤ්ජිත්වා කත්වාන කුටිමච්ඡිසං,
තෙන මෙ සරභඞ්ගොති නාමං සම්මුතියා අහු.

488. න මය්හං කප්පතෙ අජ්ජ සරෙ හත්ථෙහි භඤ්ජිතුං,
සික්ඛාපදා නො පඤ්ඤත්තා ගොතමෙන යසස්සිනා.

489. සකලං සමත්තං රොගං සරභඞ්ගො නාද්දසං[4] පුබ්බෙ,
සො'යං රොගො දිට්ඨො වචනකරෙනාතිදෙවස්ස.

490. යෙනෙව මග්ගෙන ගතො විපස්සී
යෙනෙව මග්ගෙන සිඛී ච වෙස්සභූ,
කකුසන්ධකොණාගමනා ච කස්සපො
තෙනඤ්ජසෙන අගමාසි ගොතමො.

1. පණියො - PTS 2 චබ්‍රවි - සීමු 1, 2 3. දස්සනායුපසඞ්කම - සීමු 1, 2 දස්සනායොපසඞ්කම - PTS 4. නාද්දස්සං - සීමු 1.

## 7. 1. 4

480. ගන්ධකුටිච්ඡායායෙහි සක්මන් කරන පුරුෂෝත්තමයන් වහන්සේ දැක, එහි උන් වහන්සේ කරා එළැඹ, පුරුෂොත්තමයන් වහන්සේ වැන්දෙමි.

481. සිවුර එකස් කොට පෙරෙවැ දෙ අත් එක් කොට (ඇඳිලිබැඳ-ගෙන) හැම සත්නට උතුම් වූ විගතරජස් ඇති භාග්‍යවතුන් වහන්සේ අනුව සක්මන් කෙළෙමි.

482. ඉක්බිති ප්‍රශ්නයෙහි නිපුණ වූ සර්‍වඥයන් වහන්සේ මාගෙන් කුමාරක ප්‍රශ්නයන් විචාළසේක. මම නො තැතිගත්තෙම් ද නො බිය වූයෙම් ද ශාස්තෲන් වහන්සේට ප්‍රශ්නව්‍යාකරණ (විසඳුන්) කෙළෙමි.

483. පැන විසඳූ කල්හි තථාගතයන් වහන්සේ අනුමෝදන් වූහ. භික්ෂුසඞ්ඝයා බලා මේ කරුණ වදාළහ:

484. "මේ සෝපාක යම් කෙනකුන්ගේ සිවුරු පිඬුවා ගිලන්පස සෙනසුන් වළඳා නම් ඒ අඟුමගධ දනවු වැසියනට ලාභයෙකි. දැක, හුනස්නෙන් නැඟීසිටිනු ද සාමීචිකම් ද ඔවුනට ලාභයෙකැ'යි වදාළහ.

485. සෝපාකයෙනි, අද පටන් දක්නා පිණිස මා කරා එළැඹෙව. සොපාකයෙනි, තෙල ප්‍රශ්නව්‍යාකරණය මැ තොපගේ උපසම්පදා වේවා"යි.

486. මම උපතින් සත්හැවිරිදි වූයෙම් උපසම්පත් ලැබැගෙන අන්තිම ශරීර ධරමි. ධර්‍මයාගේ සුධර්‍මතාව ආශ්චර්‍ය්‍ය නියා යැ'යි.

මෙසෙයින් ආයුෂ්මත් සොපාක ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

**සොපාක ස්ථවිරගාථා යි.**

## 7. 1. 5

487. (මම) හීතණ අතින් බිඳගෙන පත්සලක් කොටගෙන වාස කෙළෙමි. එයින් මට 'සරභඞ්ග' යයි නමෙක් සම්මුතියෙන් විය.

488. අද මට හීතණ අතින් බිඳිනට නො කැප වෙයි. යසස්වී වූ ගොයුම්ගොතුවන් විසින් අපට සිඛපද පනවනලදි.

489. සරභඞ්ග වූ මම් (ශාස්තෲන් වහන්සේගේ අවවාදලාභයට) පෙර සියලු (උපාදානස්කන්ධ සඞ්ඛ්‍යාත) රෝගය නිරවශෙෂ කොට නුදුටිමි. දේවාතිදේව බුදුන්ගේ වචනය කරන මා විසින් ඒ රෝගය දක්නාලද්දේ යැ.

490. යම් මැ මඟෙකින් විපස්සී බුදුහු වැඩිසේක් නම් යම් මැ මඟෙකින් සිඛී බුදුහු ද වෙස්සභූ බුදුහු ද කකුසඳ බුදුහු ද කොණාගමන බුදුහු ද කාශ්‍යප බුදුහු ද වැඩි සේක් නම් එමඟින් ගෞතම බුදුහු වැඩිසේක.

491. වීතතණ්හා අනාදානා සත්ත බුද්ධා ඛයොගධා,
යෙහයං[1] දෙසිතො ධම්මො, ධම්මභූතෙහි තාදිහි

492. චත්තාරි අරියසච්චානි අනුකම්පාය පාණිනං,
දුක්ඛං සමුදයො මග්ගො නිරොධො දුක්ඛසඞ්ඛයො.

493 යස්මිං නිවත්තතෙ දුක්ඛං සංසාරස්මිං අනන්තකං,
භෙදා ඉමස්ස කායස්ස ජීවිතස්ස ච සඞ්ඛයා,
අඤ්ඤො පුනබ්භවො නත්ථි සුවිමුත්තොම්හි සබ්බධී’ති.

ඉත්ථං සුදං ආයස්මා සරභඞ්ගො ථෙරො ගාථායො අභාසිත්ථා’ති.

**සරභඞ්ගත්ථෙරගාථා.**

**තස්සුද්දානං**

සුන්දරසමුද්දො ථෙරො ථෙරො ලකුණ්ටභද්දියො,
භද්දො ථෙරො ච සොපාකො සරභඞ්ගො මහාඉසි,
සත්තකෙ පඤ්චකා ථෙරා ගාථායො පඤ්චතිංසතී’ති.

## සත්තකනිපාතො නිට්ඨිතො.

491. දුරු කළ තෘෂ්ණා ඇති උපාදාන රහිත වූ නිවනෙහි පිහිටි (විපස්සී ආදී) සත් බුදු කෙනෙකි. (භවලොවුතුරු) දහමින් උපන් තාදීගුණ ඇති උත් වහන්සේ විසින් මේ දහම දෙසනලදි:

492. (උපාදානස්කන්ධපඤ්චක සඞ්ඛ්‍යාත) දුඃඛ යැ (දුකට කාරුණු වූ තෘෂ්ණා සඞ්ඛ්‍යාත) සමුදය යැ (දුඃඛනිරොධයට උපාය වූ ආර්‍ය-මාර්ගී යැ (අධිගත) යම් නිරොධයෙක්හි සසර අනන්ත වූ දුක නවතී ද ඒ දුඃඛක්ෂය වූ නිරොධ යැ යන සතර ආර්‍යසත්‍යයෝ සත්ත්වයනට අනුකම්පා පිණිස දෙසනලදහ.

493. මේ (පඤ්චස්කන්ධ) කායයාගේ භේදයෙනුදු ජීවිතෙන්ද්‍රියයාගේ ක්ෂය වීමෙනුදු මතු අන්‍ය පුනර්භවයෙක් නැත. හැම තැන්හි (කෙලෙසුන්ගෙන් ද භවයෙන් ද, මොනොවට මිදුණෙමි'යි

මෙසෙයින් ආයුෂ්මත් සරභඞ්ග ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

**සරභඞ්ග ස්ථවිරගාථා යි.**

**උද්දානය:**

සුන්දරසමුද්ද ස්ථවිර යැ, ලකුණ්ටකභද්දිය ස්ථවිර යැ, භද්ද ස්ථවිර යැ, සෝපාක ස්ථවිර යැ, මහර්ෂි සරභඞ්ග ස්ථවිර යැ යි සත්තකනිපාතයෙහි තෙරහු පස් දෙනෙකි. ගාථා පන්තිසෙකි.

## සත්තකනිපාතය නිමි.

# 8. අට්ඨකනිපාතො.

### 8. 1. 1

494 කම්මං බහුකං න කාරයෙ
පරිවජ්ජෙය්‍ය ජනං න උය්‍යමෙ,
සො උස්සුක්කො රසානුගිද්ධො
අත්ථං රිඤ්චති යො සුඛාධිවාහො.

495 පඞ්කො'ති හි නං අවෙදයුං[1]
යායං වන්දනපූජනා කුලෙසු,
සුඛුමං සල්ලං දුරුබ්බහං
සක්කාරො කාපුරිසෙන දුජ්ජහො.

496. න පරස්සුපනිධාය කම්මං මච්චස්ස පාපකං,
අත්තනා තං න සෙවෙය්‍ය කම්මබන්ධූහි මාතියා.

497. න පරෙ වචනා චොරො න පරෙ වචනා මුනි,
අත්තා ච නං[2] යථා වෙත්ති[3] දෙවා'පි නං තථා විදුං.[4]

498. පරෙ ච න විජානන්ති මයමෙත්ථ යමාමසෙ,
යෙ ච තත්ථ විජානන්ති තතො සම්මන්ති මෙධගා.

499. ජීවතෙ වා'පි සප්පඤ්ඤො අපි විත්තපරික්ඛයො,[5]
පඤ්ඤාය ච අලාභෙන විත්තවා'පි න ජීවති.

500. සබ්බං සුණාති සොතෙන සබ්බං පස්සති චක්ඛුනා,
න ච දිට්ඨං සුතං ධීරො සබ්බං උජ්ඣිතුමරහති.

501. චක්ඛුමාස්ස[6] යථා අන්ධො සොතවා බධිරො යථා,
පඤ්ඤවාස්ස යථා මූගො බලවා දුබ්බලොරිව,
අථ අත්ථෙ සමුප්පන්නෙ සයෙථ මතසායික'න්ති.

ඉත්ථං සුදං ආයස්මා මහාකච්චායනො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**මහාකච්චායනත්ථෙරගාථා.**

---

1 පවෙදයුං - සිමු 1, 2   2 අත්තා තං ච - ථ, PTS   3 යථාවෙත්ති - PTS
4 විදූ - PTS   5 විත්තපරික්ඛයො - සිමු 1   විත්තපරික්ඛයා - සිමු 2, PTS
6 චක්ඛුමස්ස - සිමු 1, 2, ථ, PTS.

# 8. අට්ඨකනිපාතය.

## 8. 1. 1

494. බොහෝ වූ නවහම් නො කරවන්නේ යැ. (ගණසඞ්ගණිකායෙන් වෙන් විම් විසින්) ජනයා හරනේ යැ. (සිවුපස පිණිස) උත්සාහ නො කරන්නේ යැ. ප්‍රත්‍යයෙහි උත්සුක වූ රසයෙහි ගිජු වූ ඒ මහණ සුව එළවන යම් අර්ථයෙක් වේ නම් ඒ අර්ථය හරනේ යැ.

495. කුලයෙහි යම් මේ වැඳුම් පිදුම් වේ ද එය පඞ්කයෙක් මැ යයි ද උගුළුවාලිය නොහෙන සියුම් හුලෙකැයි ද (ආයසීයෝ) දත්හ. සත්කාරය කාපුරුෂයා විසින් නො හල හැක්ක.

496. මෙරමා ලවා පව්කම් නො කරවන්නේ යැ. තෙමේ ඒ පව්කම් නො සෙවුනේ යැ. යම් හෙයෙකින් සත්‍වයෝ කර්මය බන්ධු කොට ඇත්තාහු ද එහෙයිනි.

497 මෙරමා බසින් සොරෙක් නො වෙයි, මෙරමා බසින් මුනිවරයෙක් ද නො වෙයි. තෙමේ යම්සේ ඔහු දනී නම් දෙවියෝ ද ඔහු එසේ දනිති.

498. බාල වූ අන්‍යයෝ "ඇපි මෙලොවැ මැරෙම්හ"යි නො දනිති. එහි ලා යම් පණ්ඩිත කෙනෙක් ('ඇපි මැරෙම්හ'යි) දනිත් ද, ඒ හේතුයෙන් පරහිංසාවෝ සන්හිඳෙත්.

499. සප්‍රාඥ තෙම ධනයෙන් පිරිහුණේ නමුදු ජීවත් වේ මැ යි. එතෙකුදු වත් ප්‍රඥව නො ලැබීමෙන් ධනය ඇත්තේ නමුදු ජීවත් නො වේ.

500. කනින් සියල්ල අසයි, ඇසින් සියල්ල දකියි, ප්‍රාඥ තෙම දුටු ඇසූ සියල්ල හරනට හෝ ගන්නට නිසි නො වෙයි.

501. ඇස් ඇත්තේ නමුදු (නො බැලියයුත්තෙහි) අන්ධයකු මෙන් වන්නේ යැ, කන් ඇත්තේ නමුදු (නො ඇසියැ යුත්තෙහි) බිහිරකු මෙන් වන්නේ යැ, නුවණැත්තේ නමුදු (නො දතයුත්තෙහි) මූඪයකු මෙන් වන්නේ යැ බල ඇත්තේ නමුදු (නො කටයුත්තෙහි) දුබලයකු මෙන් වන්නේ යැ, යළි නො කටයුතු දෑයක් එළැඹැසිටි කල්හි මරඇඳ හෝනකු සෙයින් හෝනේ යැ'යි.

මෙසෙයින් ආයුෂමත් මහාකච්චායන ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

**මහාකච්චායන ස්ථවිරගාථා යි.**

## 8. 1. 2

502. අක්කොධනොනුපනාහී අමායො රිත්තපෙසුණො,
ස වෙ තාදිසකො භික්ඛු එවං පෙච්ච න සොචති.

501. අක්කොධනොනුපනාහී අමායො රිත්තපෙසුණො,
ගුත්තද්වාරො සදා භික්ඛු එවං පෙච්ච න සොචති.

504. අක්කොධනොනුපනාහී අමායො රිත්තපෙසුණො,
කල්‍යාණසීලො සො[1] භික්ඛු එවං පෙච්ච න සොචති.

505 අක්කොධනොනුපනාහී අමායො රිත්තපෙසුණො,
කල්‍යාණමිත්තො සො[1] භික්ඛු එවං පෙච්ච න සොචති.

506. අක්කොධනොනුපනාහී අමායො රිත්තපෙසුණො.
කල්‍යාණපඤ්ඤො සො[1] භික්ඛු එවං පෙච්ච න සොචති.

507. යස්ස සද්ධා තථාගතෙ අචලා සුප්පතිට්ඨිතා
සීලං ච යස්ස කල්‍යාණං අරියකන්තං පසංසිතං.

508. සඞ්ඝෙ පසාදො යස්සත්ථි උජුභූතං ච දස්සනං,
අදළිද්දොති තං ආහු අමොඝං තස්ස ජීවිතං.

509. තස්මා සද්ධං ච සීලං ච පසාදං ධම්මදස්සනං,
අනුයුඤ්ජෙථ මෙධාවී සරං බුද්ධානසාසන'න්ති.

ඉත්ථං සුදං ආයස්මා සිරිමිත්තො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**සිරිමිත්තත්ථෙරගාථා.**

1 යො - PTS

## 8. 1. 2

502. නො කිපෙනසුලු වූ වෛර නො බඳනාසුලු වූ මායා රහිත වූ පිසුනුබස් නැති එබඳු වූ යම් මහණෙක් ඇද්ද, හේ යථොක්ත ප්‍රති-පත්තියෙන් ඒකාන්තයෙන් පරලොව්, ශෝක නො කරයි.

503. නො කිපෙනසුලු වූ වෛර නො බඳනාසුලු වූ මායා රහිත වූ පිසුනුබස් නැති පියු (කායාදි) දොර ඇති මහණ මෙසේ හැම කල්හි පරලොව්, නො සොස්නේ යැ.

504. නො කිපෙනසුලු වූ වෛර නො බඳනාසුලු වූ මායා රහිත වූ පිසුනුබස් නො කියන කලණසිල් ඇති එ මහණ මෙසේ පරලොව්, නො සොස්නේ යැ.

505. නො කිපෙනසුලු වූ වෛර නො බඳනාසුලු වූ මායා රහිත වූ පිසුනුබස් නො කියන කලණමිතුරන් ඇති එ මහණ මෙසේ පරලොව්, නො සොස්නේ යැ.

506. නො කිපෙනසුලු වූ වෛර නොබඳනාසුලු වූ මායා රහිත වූ පිසුනු-බස් නො කියන කලණපැන ඇති ඒ මහණ මෙසේ පරලොව නො සොස්නේ යැ.

507. යමක්හුගේ ශ්‍රද්ධාව තථාගතයන් කෙරෙහි අචල වැ මොනොවට පිහිටියා ද යමක්හුගේ ශීලය ද කල්‍යාණ වූයේ ආර්‍ය්‍යයනට ප්‍රිය වූයේ පසස්නාලද්දේ වේ ද-

508. සඞ්ඝයා කෙරෙහි ප්‍රසාදය යමක්හට ඇද්ද, (අචල වැ පිහිටියේ වේ ද) ඍජු වූ දර්‍ශනයත් යමක්හට ඇද්ද, (අචල වැ පිහිටියේවේ ද,) ඒ පුද්ගලයා 'නොදිළිඳු යැ'යි කීහු. ඔහුගේ ජීවිතය නො සිස් වෙයි.

509. එහෙයින් නුවණැත්තේ බුදුන්ගේ අනුසසුන් සිහි කෙරෙමින් ශ්‍රද්ධායෙහි ද ශීලයෙහි ද ප්‍රසාදයෙහි ද ධර්‍මදර්‍ශනයෙහි ද යෙදෙන්නේ යයි.

මෙසෙයින් ආයුෂ්මත් සිරිමිත්ත ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

**සිරිමිත්ත ස්ථවිරගාථා යි**

**8. 1 3**

510. යදා පඨමමද්දක්ඛිං සත්ථාරමකුතොභයං,
තතො මෙ අහු සංවෙගො පස්සිත්වා පුරිසුත්තමං.

511. සිරිං හත්ථෙහි පාදෙහි යො පණාමෙය්‍ය ආගතං,
එතාදිසං සො සත්ථාරං ආරාධෙත්වා විරාධයෙ.

512. තදාහං[1] පුත්තදාරං ච ධනධඤ්ඤං ච ඡඩ්ඩයිං,
කෙසමස්සූනි ඡෙදෙත්වා[2] පබ්බජිං අනගාරියං.

513. සික්ඛාසාජීවසම්පන්නො ඉන්ද්‍රියෙසු සුසංවුතො.
නමස්සමානො සම්බුද්ධං විහාසිං අපරාජිතො.

514. තතො මෙ පණිධී ආසි චෙතසො අභිපත්ථිතො,
න නිසීදෙ මුහුත්තම්පි තණ්හාසල්ලෙ අනූහතෙ.

515. තස්ස මෙවං විහරතො පස්ස විරියපරක්කමං,[3]
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

516. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛුං[4] විසොධිතං,
අරහා දක්ඛිණෙය්‍යොම්හි විප්පමුත්තො නිරූපධි.

517. තතො රත්‍යා විවසානෙ සුරියස්සුග්ගමනං පති,
සබ්බං තණ්හං විසොසෙත්වා පල්ලඞ්කෙන උපාවිසි'න්ති.

ඉත්ථං සුදං ආයස්මා මහාපන්ථකො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**මහාපන්ථකත්ථෙරගාථා.**

**තස්සුද්දානං:**

මහාකච්චායනො ථෙරො සිරිමිත්තො මහාපන්ථකො,
එතෙ අට්ඨනිපාතම්හි ගාථායො චතුවීසතී'ති.

## අට්ඨකනිපාතො නිට්ඨිතො.

1 යදාහං - මජසං. 2 කෙසමස්සුං නිච්ඡෙදෙත්වා - සීමු 1 2 වීරියපරක්කමං - මජසං
දිබ්බචක්ඛු - මජසං.

## 8. 1. 3

510. යම් දවසෙක කොසින්නුත් බිය නැති ශාස්තෲන් වහන්සේ පළමු කොට දිටිම් ද, ඉක්බිති ඒ පුරුෂෝත්තමයා දැක මට සංවේග උපන.

511. යමෙක් ගෙට ආ සිරිකත අතින් පයින් (පැහැර) පලවන්නේ ද හෙතෙම මෙබඳු ශාස්තෲන් ආරාධනය කොට (උන් වහන්සේගේ අවවාද නො කිරීමෙන් නවම ක්ෂණය) වරදන්නේ යැ.

512. එකල්හි මම අඹුදරුවන් ද ධනධාන්‍ය ද හළිමි. කෙහෙරවුළු බහා සසුන්හි පැවිදි වීමි.

513. අධිශීලශික්ෂායෙන් හා ප්‍රඥප්ත ශික්ෂාපද සඞ්ඛ්‍යාත සාජීවයෙන් යුක්ත වූයෙම් ඉන්ද්‍රියයන්හි මනා සංවර ඇතියෙම් අපරාජිත වූයෙම් සම්බුදුන් වඳිමින් විසීමි.

514. ඉක්බිති මට සිතින් පතනලද ප්‍රණිධියෙක් විය: ‘තෘෂ්ණා නමැති හුල නො උපුලු කල්හි මොහොතකුදු නො හිඳිනෙමි’ කියා යි.

515. මෙසේ වසන ඒ මාගේ වීර්‍ය්‍යපරාක්‍රමය බලව. (මා විසින්) ත්‍රිවිද්‍යාවෝ ලබනලදහ. බුදුන්ගේ අනුසසුන් කරනලදි.

516. පෙරවිසූ කඳ පිළිවෙළ දනිමි. දිව්‍යැස පිරිසුදු කරනලදි. කෙලෙසුන් කෙරෙන් මිදුණු, උපධි රහිත වූ, දක්ෂිණාර්හ වූ රහතෙක් වෙමි.

517. ඉක්බිති රැයිම්මෙ හිරු උදවන් මැ සියලු තෘෂ්ණාව වියළාපියා පලක් බැඳ හුන්නෙමි’යි.

මෙසෙයින් ආයුෂ්මත් මහාපන්ථක ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

**මහාපන්ථක ස්ථවිරගාථා යි.**

උද්දානය:

මහකසයින් තෙරණුවෝ යැ, සිරිමිත්ත තෙරණුවෝ යැ, මහාපන්ථක තෙරණුවෝ යැ, යන තෙරවරු අට්ඨකනිපාතයෙහි වෙති, ගාථා සූවිස්සෙකි.

## අට්ඨකනිපාතය නිමි.

# 9. නවකනිපාතො.

## 9. 1. 1

518. යදා දුක්ඛං ජරාමරණන්ති පණ්ඩිතො
අවිද්දසූ යත්ථ සිතා පුථුජ්ජනා,
දුක්ඛං පරිඤ්ඤාය සතොව ඣායති
තතො රතිං පරමතරං න වින්දති.

519. යදා දුක්ඛස්සාවහනිං විසත්තිකං
පපඤ්චසඞ්ඝාත දුඛාධිවාහිනිං,[1]
තණ්හං පහත්වාන[2] සතොව ඣායති
තතො රතිං පරමතරං න වින්දති.

520. යදා සිවං ද්වෙ චතුරඞ්ගගාමිනං
මග්ගුත්තමං සබ්බකිලෙසසොධනං,
පඤ්ඤාය පස්සිත්ව සතොව ඣායති
තතො රතිං පරමතරං න වින්දති.

521. යදා අසොකං විරජං අසඞ්ඛතං
සන්තං පදං සබ්බකිලෙසසොධනං,
භාවෙති සඤ්ඤොජනබන්ධනච්ඡිදං
තතො රතිං පරමතරං න වින්දති.

522. යදා නභෙ ගජ්ජති මෙඝදුන්දුභි
ධාරාකුලා විහගපථෙ[3] සමන්තතො,
භික්ඛූ ච පබ්භාරගතො'ව ඣායති
තතො රතිං පරමතරං න වින්දති

523. යදා නදීනං කුසුමාකුලානං
විචිත්තවානෙය්‍යවටංසකානං,
තීරෙ නිසින්නො සුමනො'ව ඣායති
තතො රතිං පරමතරං න වින්දති.

524 යදා නිසීථෙ රහිතම්හි කානනෙ
දෙවෙ ගළන්තම්හි නදන්ති දාඨිනො,
භික්ඛූ ච පබ්භාරගතො'ව ඣායති
තතො රතිං පරමතරං න වින්දති.

---

1 දුක්ඛාධිවාහිනිං - ථ, දුක්ඛාධිවාහනිං - PTS 2 පහන්ත්වාන - සීමු 1, 2
3 විහඞ්ගපථෙ - ස්‍යා, PTS

# 9. නවකනිපාතය

## 9. 1. 1

518 ‘ජරාමරණය දුකැ’ යි (යථාභූත කොට) නො දන්නා පෘථග්-ජනයෝ යම් පඤ්චුපාදානස්කන්ධයෙකැ බැඳුණාහු ද, ඒ දුක නුවණැති මහණ යම් කලෙකැ (මාර්ගඥානයෙන්) පිරිසිඳැ දැනැ සිහි ඇති වැ මැ (ලක්ෂණොපනිධ්‍යාන විසින්) ධ්‍යාන කෙරේ ද, ඒ (විදර්ශනාමාර්ග-ඵල) රතියට වඩා පරමතර රතියක් නො ලබයි.

519 යම් කලෙකැ (නුවණැති මහණ) දුක් එළවන විසත්තිකා නම් වූ (රාගාදි) ප්‍රපඤ්ච හා (ප්‍රවෘත්ති දුඃඛ) සටනාව හා දුක් දනවන තෘෂ්ණාව ප්‍රහාණ කොට සිහි ඇතිවැ ධ්‍යාන කෙරේ ද (එකලැ) එයට වැඩි පරමතර රතියක් නො ලබයි.

520. යම් කලෙකැ (නුවණැති මහණ) ක්ෂේම වූ මාර්ගයන් අතුරෙහි උත්තම වූ හැම කෙලෙස් සෝදහරින ආර්‍යඅෂ්ටාඞ්ග මාර්ග නුවණින් දැකැ සිහි ඇති වැ මැ ධ්‍යාන කෙරේ ද (එකලැ) එයට වැඩි පරමතර රතියක් නො ලබයි.

521. යම් කලෙකැ (නුවණැති මහණ) ශෝක රහිත වූ පහවූ (රාගාදි) රජස් ඇති (ප්‍රත්‍යයන් විසින් නො කරනලද හෙයින්) අසංස්කෘත වූ හැම කෙලෙස් සෝදහරින කාරණ වූ සංයෝජන සඞ්ඛ්‍යාත බන්ධන සිඳුනා ශාන්ත වූ (නිර්වාණ) පදය වඩා ද (එකලැ) එයට වැඩි පරමතර රතියක් නො ලබයි.

522. යම් කලෙකැ අහස්හි දිවබෙර ගුගුරා ද (මෙඝගජිනා කෙරේ ද) නුබකුසැ හාත්පසින් වැසිදහර ගැවසුණේ ද මහණ තෙමේත් පබ්භාරගත වැ මැ ධ්‍යාන කෙරේ ද එකල්හි එයට වැඩි පරමතර රතියක් නො ලබයි.

523 යම් කලෙකැ (නුවණැති මහණ) විසිතුරු වනකුසුම්කැන් ඇති ගිලිහුණු කුසුමින් ගැවැසිගත් නදීන්ගේ තීරයෙහි හුන්නේ (උතුරු-මිතිස්දමින්) සුන්දරසිත් ඇතිවැ මැ ධ්‍යාන කෙරේ ද (එකල්හි) එයට වැඩි පරමතර රතියක් නො විඳි යි.

524. යම් කලෙකැ රෑය ජනශූන්‍ය වනයෙහි වැසිදහර ගලනා කල්හි ව්‍යාලමෘගයෝ නද දෙත් ද මහණ තෙමේත් ගල්බෙයද වාසගත වැ මැ ධ්‍යාන කෙරේ ද (එකල්හි) එයට වැඩි පරමතර රතියක් නො විඳියි.

525. යදා විතක්කෙ උපරුන්ධියත්තනො
නගන්තරෙ නගවිවරං සමස්සිතො,
වීතද්දරො විගතඛිලො'ව[1] ඣායති
තතො රතිං පරමතරං න වින්දති.

526. යදා සුඛී මලඛිලසොකනාසනො
නිරග්ගළො නිබ්බනථො විසල්ලො,
සබ්බාසවෙ බ්‍යන්තිකතො'ව ඣායති
තතො රතිං පරමතරං න වින්දතී'ති.

ඉත්ථං සුදං ආයස්මා භූතො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

භූතත්ථෙරගාථා.

තස්සුද්දානං:

භූතො තථද්දසො ථෙරො එකො ඛග්ගවිසාණවා,
නවකම්හි නිපාතම්හි ගාථායො'පි ඉමා නවා'ති.

## නවකනිපාතො නිට්ඨිතො.

1 විගතඛිලොව - සීමු 2. විතඛිලොව - සීමු. 1

525. යම් කලෙකැ තමාගේ (සන්තානයෙහි කාමාදි) විතර්කයන් මලකා පර්වත අතුරෙහි ගල්ගුහා ඇසුරු කෙළේ පහවූ (කෙලශ) දරථ ඇති වැ ප්‍රහීණ වූ චෙතොඛිල ඇති වැ ධ්‍යාන කෙරේ ද (එකල්හි) එයට වැඩි පරමතර රතියක් නො විඳියි.

526. යම් කලෙකැ නුවණැති මහණ (ධ්‍යානසුඛයෙන්) සුඛිත වැ (රාගාදි) මල හා චෙතොඛිල හා ශෝක නසන (අවිද්‍යා සඞ්ඛ්‍යාත) අගුළු රහිත වැ තෘෂ්ණා රහිත වැ පහවූ (රාගාදි) හුල් ඇති වැ සියලු ආස්‍රවයන් විගතාන්ත කෙළේ මැ ධ්‍යාන කෙරේ ද (එකල්හි) එයට වැඩි පරමතර රතියක් නො විඳී යයි.

මෙසෙයින් ආයුෂ්මත් භූත ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

භූත ස්ථවිරගාථා යි.

**උද්දානය:**

නවකනිපාතයෙහි ඛ්‍යාතවිභාණවත් වූ සත්‍යය දක්නා භූත නම් වූ එක් තෙර කෙනෙකි, ගාථා ද මේ නවයයි.

# නවකනිපාතය නිමි.

# 10. දසකනිපාතො.

## 10. 1. 1

527. අඞ්ගාරිනො දානි දුමා භදන්තෙ
ඵලෙසිනො ඡදනං විප්පහාය,
තෙ අච්චිමන්තො’ව පභාසයන්ති
සමයො මහාවීර භගීරථානං.[1]

528. දුමානි ඵුල්ලානි මනොරමානි
සමන්තතො සබ්බදිසා පවන්ති,[2]
පත්තං පහාය ඵලමාසසානා
කාලො ඉතො පක්කමනාය වීර.

529. නෙවාතිසීතං න පනාතිඋණ්හං
සුඛා උතු අද්ධනියා භදන්තෙ,
පස්සන්තු තං සාකියා කොළියා ච
පච්ඡාමුඛං රොහිණිං තාරයන්තං.[3]

530. ආසාය කසතෙ[4] ඛෙත්තං බීජං ආසාය වප්පති,[5]
ආසාය වාණිජා යන්ති සමුද්දං ධනහාරකා,
යාය ආසාය තිට්ඨාමි සා මෙ ආසා සමිජ්ඣතු.

531. පුනප්පුනං චෙව වපන්ති බීජං
පුනප්පුනං වස්සති දෙවරාජා,
පුනප්පුනං ඛෙත්තං කසන්ති කස්සකා
පුනප්පුනං ධඤ්ඤමුපෙති රට්ඨං.

532. පුනප්පුනං යාචනකා චරන්ති
පුනප්පුනං දානපතී දදන්ති,
පුනප්පුනං දානපතී දදිත්වා
පුනප්පුනං සග්ගමුපෙන්ති ඨානං.

533. වීරො හවෙ සත්තයුගං පුනෙති
යස්මිං කුලෙ ජායති භූරිපඤ්ඤො,
මඤ්ඤාමහං සක්කති දෙවදෙවො
තයා හි[5] ජාතො[6] මුනි සච්චනාමො.

534. සුද්ධොදනො නාම පිතා මහෙසිනො
බුද්ධස්ස මාතා පන මායනාමා,
යා බොධිසත්තං පරිහරිය කුච්ඡිනා
කායස්ස භෙදා තිදිවම්හි මොදති.

535. සා ගොතමී කාලකතා ඉතො චුතා
දිබ්බෙහි කාමෙහි සමඞ්ගිභූතා,
සා මොදති කාමගුණෙහි පඤ්චහි
පරිවාරිතා දෙවගණෙහි තෙහි

536. බුද්ධස්ස පුත්තොම්හි අසය්හසාහිනො
අඞ්ගීරසස්සප්පටිමස්ස තාදිනො,
පිතුපිතා මය්හං තුවංසි සක්ක
ධම්මෙන මෙ ගොතම අය්‍යකොසී’ති.

ඉත්ථං සුදං ආයස්මා කාළුදායී ථෙරො ගාථායො අභාසිත්ථා’ති.

කාළුදායීථෙරගාථා.

1 භාගීරසානං - සීමු 1, 2, ට   භගීරසානං - පු, PTS   2 සබ්බදිසා සවන්ති - සීමු 1 සබ්බදිසං සවන්ති - සීමු 2   3 රොහිණියං තරන්තං - PTS   4 කස්සතෙ - PTS
5 වුප්පති - PTS   6 තයාභිජාතො - සීමු 1, 2, ට

# 10. දසකනිපාතය

## 10. 1. 1

527. වහන්ස, දැන් වෘක්ෂයෝ ගිලිහුණු පරණලා ඇත්තාහු ගිනි-අඟුරු වැනි මල්පලු ඇත්තාහු පලගැනීමට ලංවූවාහුය. ඒ වෘක්ෂයෝ පහන්සිළු මෙන් බබලති. මහාවීරයන් වහන්ස, ශාක්‍යයන්ට උපකාර පිණිස මේ කල් වෙයි.

528. සිත්කලු වූ වෘක්ෂයෝ පිපුණු මල් ඇත්තාහු හාත්පස සියලු දිශාවන්හි සුවඳ හමත්, පරණලා හැර පලගැනීමට ලංවූවාහු ය, වීරයන් වහන්ස, මෙයින් නික්මැයෑමට කල් වෙයි.

529. වහන්ස, ඉතා සිහිලස නො මැ වෙයි. ඉතා උණුසුම ද නො වෙයි, අදත් මහට සුදුසු වූ ඍතුව සැප වෙයි, ශාක්‍යයෝ ද කෝලියයෝ ද පැසුළුදිගට මුහුණ ලා රෝහිණීනදිය තරණය කරන නුඹ වහන්සේ දකින්වා.

530. (ගොවියා) එලාශාවෙන් කෙත සායි, ආශාවෙන් බිජුවට වපුර යි. ධනය සපයන වෙළෙන්දෝ ආශාවෙන් සයුරට වදිත්, මම යම් ආශාවකින් සිටිම් නම් මා ගේ ඒ ආශාව සමෘද්ධ වේවා.

531. ගොවියෝ පුනපුනා බිජුවට වපුරති, පුනපුනා වැසි වසී, ගොවියෝ පුනපුනා කෙත සාති, රටට පුනපුනා ධාන්‍යය ලැබෙයි.

532. යදියෝ පුනපුනා කුලයන් කරා එළැඹෙති, දනපතීහු පුනපුනා දෙති, දනපතීහු පුනපුනා දන් දී පුනපුනා සුගතියට පැමිණෙත්.

533. යම් කුලයෙක්හි මහා ප්‍රඥ ඇති වීරයෙක් උපදතේ නම් හෙතෙම ඒකාන්තයෙන් සත්පරපුරක් පවිත්‍ර කෙරෙයි, දෙවියනට දෙව් වූ භාග්‍යවත් තෙම (ඉන් වැඩියක් පවිත්‍ර කරන්නට) හැකිවේ යයි මම සිතමි, නුඹ වහන්සේ හේතු කොට ගෙන (ආර්‍ය්‍යජාතියෙහි උපන්) මුනි තෙම සත්‍ය වූ නම් ඇත්තේ විය.

534. මහර්ෂිහු ගේ පිය තෙම සුද්ධොදන නම් වෙයි, යළි යම් දේවී කෙනෙක් බෝසතුන් කුසින් උසුලා කාබුන් මරණින් මතු දෙව්ලොව සතුටු වෙත් ද, මායා නම් වූ ඕ තොමෝ බුදුන් ගේ මවු වෙ යි.

535. කළුරිය කළ ඒ ගෞතමී තොමෝ මෙයින් සැව දිව්‍යකාමයන් ගෙන් යුක්ත වූවා ය. ඕ තොමෝ ඒ දේවගණයා විසින් පිරිවරන ලද්දී පස් කම් ගුණයෙන් සතුටු වෙයි.

536. (ශුද්ධොදන) ශාක්‍යය, මම අසහ්‍යසාහී වූ අඞ්ගීරස වූ අප්‍රතිම වූ තාදී ගුණ ඇති බුදුන් ගේ පුත්‍ර වෙමි, තෙපි මා ගේ පියාගේ පිය වූවහු ය. ගෞතමය, සවභාවධර්මයෙන් මා ගේ මුත්තණු වූවහු ය.

මෙසෙයින් ආයුෂ්මත් කාළුදායි ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

කාළුදායි ස්ථවිරගාථා යි.

## 10. 1. 2

537. පුරතො පච්ඡතො වා පි අපරො චෙ න විජ්ජති,
අතීව ඵාසු භවති එකස්ස වසතො වනෙ.

538. හන්ද එකො ගමිස්සාමි අරඤ්ඤං බුද්ධවණ්ණිතං,
ඵාසු[1] එකවිහාරිස්ස පහිතත්තස්ස භික්ඛුනො.

539. යොගීපීතිකරං රම්මං මත්තකුඤ්ජරසෙවිතං,
එකො අත්තවසී ඛිප්පං පවිසිස්සාමි කානනං.

540. සුපුප්ඵිතෙ සීතවනෙ සීතලෙ ගිරිකන්දරෙ,
ගත්තානි පරිසිඤ්චිත්වා චඞ්කමිස්සාමි එකකො.

541. එකාකියො අදුතියො රමණීයෙ මහාවනෙ,
කදාහං විහරිස්සාමි කතකිච්චො අනාසවො.

542. එවං මෙ කත්තුකාමස්ස අධිප්පායො සමිජ්ඣතු,
සාධයිස්සාමහං[2] යෙව නාඤ්ඤො අඤ්ඤස්ස කාරකො.

543. එස බන්ධාමි සන්නාහං පවිසිස්සාමි කානනං,
න තතො නික්ඛමිස්සාමි අප්පත්තො ආසවක්ඛයං.

544. මාලුතෙ උපවායන්තෙ සීතෙ සුරභිගන්ධිකෙ,[3]
අවිජ්ජං දළසිස්සාමි නිසින්නො නගමුද්ධනි.

545. වනෙ කුසුමසඤ්ඡන්නෙ පබ්භාරෙ නූන සීතලෙ,
විමුත්තිසුඛෙන සුඛිතො රමිස්සාමි ගිරිබ්බජෙ.

546. සොහං පරිපුණ්ණසඞ්කප්පො චන්දො පන්නරසො යථා,
සබ්බාසවපරික්ඛීණො නත්ථි දානි පුනබ්භවො’ති.

ඉත්ථං සුදං ආයස්මා එකවිහාරියො ථෙරො ගාථායො අභාසිත්ථා’ති

එකවිහාරියත්ථෙරගාථා.

## 10. 1. 3

547. අනාගතං යො පටිගච්ච පස්සති
හිතං ච අත්ථං අහිතං ච තං ද්වයං,
විද්දෙසිනො තස්ස හිතෙසිනො වා
රන්ධං න පස්සන්ති සමෙක්ඛමානා.

548 ආනාපානසති යස්ස පරිපුණ්ණා සුභාවිතා,
අනුපුබ්බං පරිචිතා යථා බුද්ධෙන දෙසිතා,
සොමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමා.

549. ඔදාතං වත මෙ චිත්තං අප්පමාණං සුභාවිතං,
නිබ්බිද්ධං පග්ගහීතං ච සබ්බා ඔභාසතෙ දිසා.

1 ඵාසුං - ට PTS 2 සාධයිස්සාමහං - සිමු 1,2 3 සුරභිගන්ධකෙ - PTS

## 10. 1. 2

537. ඉදින් ඉදිරියෙහි හෝ පිටුපස අනෙකෙක්හු නැත් නම්, එකල්හි එකලා ව වෙනෙහි වසන්නහුට ඉතා මැ පහසු වෙයි.

538. ඒකාන්තයෙන් එකලා වූයෙම් බුදුන් විසින් වනනලද වන-සෙනසුනට යන්නෙමි, එකලා වැ හැසිරෙන නිවනට මෙහෙයූ සිත් ඇති මහණහට එය පහසුවෙකි.

539 යෝගීන්ට ප්‍රීතිකර වූ රම්‍ය වූ මතැතුන් විසින් සෙවුනාලද වනයට එකලා වූයෙම් ශ්‍රමණධර්ම සඞ්ඛ්‍යාත අර්ථයෙහි වසහයට ගියෙම් වහා පිවිසෙමි.

540. සුපිපි සිහිල් වෙනෙහි සිහිල් වූ 'ගිරිකඳුරෙහි සිරුරු සෝදා එකලා වැ සක්මන් කරමි.

541. මම එකලා වූයෙම් දෙවැන්නකු නැත්තෙම් කෘතකෘත්‍ය වූයෙම් ආශ්‍රව රහිත වූයෙම් සිත්කලු වූ මහවෙනෙහි කවර කලෙක වෙසෙම් ද?

542. මෙසේ කරනු කැමැති වූ මාගේ අදහස සමෘඬ වේවා, මම මැ මහණදම් සිදු කරගන්නෙමි. අනෙකෙක්හට අන්‍ය වූ කාරකයෙක් නැත.

543. තෙල මම් වීර්‍ය්‍ය සඞ්ඛ්‍යාත සන්නාහය බඳිමි, වනයට පිවිසෙන්-නෙමි, ආශ්‍රවක්ෂයට නො පැමිණියෙම් එයින් නො නික්මෙමි.

544. සිහිල් වූ මිහිරි සුවඳ ඇති සිහිල් පවන් හමන කල්හි කඳුමුදුන්හි හුන්නෙම් අවිද්‍යාව පලමි.

545. මලින් ගැවසුණු එකැතින් සිහිල් වූ බෑවුම් ඇති කඳුවලලු ඇති වෙනෙහි විමුක්ති සුඛයෙන් සුඛිත වූයෙම් සිත් අලවා වෙසෙමි.

546. ඒ මම පරිපූර්ණ වූ සංකල්ප ඇත්තෙම් පුණුරැසි සඳු සෙයින් සියලු ආශ්‍රවයන් ක්ෂය කෙළෙම් වෙමි, දැන් පුනර්භවයෙක් නැත.

මෙසෙයින් ආයුෂ්මත් ඒකවිහාරිය ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

ඒකවිහාරිය ස්ථවිරගාථා යි.

## 10. 1. 3

547. යමෙක් නො ලත් හිතාර්ථය හා අහිතාර්ථය ද යන ඒ දෙක කැල මැ දක්නේ ද, ඔහුගේ මිතුරෝ හෝ සතුරෝ සොයන්නාහු නම්හු සිදුරු නො දකිත්.

548. යමකු විසින් බුදුන් විසින් දෙසූ පරිදි ආනාපානසතිය සම්පූර්ණ කොට වඩනාලද ද, පිළිවෙළින් පුරුදු කරනලද ද, හෙතෙම වලායෙන් මුත් සඳු මෙන් මෙලොව බබුළුවයි.

549. ඒකාන්තයෙන් මා ගේ සිත විශුඬ විය, අප්‍රමාණ සඞ්ඛ්‍යාත නිවන මොනොවට ප්‍රත්‍යක්ෂ කරනලද්දේ ය. සිවුසස් පිළිවිදුනාලද, සියලු කෙලෙස් නිගන්නාලද, එහෙයින් සියලු පූර්වාන්තාදි දිසා බබලයි.

550. ජීවතෙ වා පි සප්පඤ්ඤො අපි විත්තපරික්ඛයො,[1]
පඤ්ඤාය ච අලාභෙන විත්තවා පි න ජීවති.

551. පඤ්ඤා සුතවිනිච්ඡිනී පඤ්ඤාකිත්තිසිලොකවඩ්ඪනී,
පඤ්ඤා සහිතො නරො ඉධ අපි දුක්ඛෙසු සුඛානි වින්දති.

552. නායං අජ්ජතනො ධම්මො නච්ඡෙරො න පි අබ්භුතො,
යත්ථ ජායෙථ මීයෙථ තත්ථ කිං විය අබ්භුතං.

553. අනන්තරං හි ජාතස්ස ජීවිතා[2] මරණං ධුවං,
ජාතා ජාතා මරන්තීධ එවං ධම්මා හි පාණිනො.

554. න හෙතදත්ථාය මතස්ස හොති
යං ජීවිතත්ථං පරපොරිසානං,
මතම්හි රුණ්ණං න යසො න ලොක්‍යං
න වණ්ණිතං සමණබ්‍රාහ්මණෙහි.

555. චක්ඛුං සරීරං උපහන්ති රුණ්ණං[3]
නිහීයති වණ්ණබලං මතී ච,
ආනන්දිනො තස්ස දිසා භවන්ති
හිතෙසිනො නාස්ස සුඛී භවන්ති.

556. තස්මා හි ඉච්ඡෙය්‍ය කුලෙ වසන්තෙ[4]
මෙධාවිනො චෙව බහුස්සුතෙ ච,
යෙසං හි පඤ්ඤාවිභවෙන කිච්චං
තරන්ති නාවාය නදිං ව පුණ්ණ'න්ති.

ඉත්ථං සුදං ආයස්මා මහාකප්පිනො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

මහාකප්පිනත්ථෙරගාථා.

10 1. 4

557. දන්ධා මය්හං ගතී ආසි පරිභූතො පුරෙ අහං,
භාතා ච මං පණාමෙසි ගච්ඡ දානි තුවං ඝරං.

558. සොහං පණාමිතො භාතා[5] සඞ්ඝාරාමස්ස කොට්ඨකෙ,
දුම්මනො තත්ථ අට්ඨාසිං සාසනස්මිං අපෙඛවා[6]

559. භගවා තත්ථ ආගඤ්ඡි සීසං මය්හං පරාමසි,
බාහාය මං ගහෙත්වාන සඞ්ඝාරාමං පවෙසයි.

560. අනුකම්පාය මෙ සත්ථා පාදාසි පාදපුඤ්ඡනිං
එතං සුද්ධං අධිට්ඨෙහි එකමන්තං ස්වධිට්ඨිතං.

561. තස්සාහං වචනං සුත්වා විහාසිං සාසනෙ රතො,
සමාධිං පටිපාදෙසිං උත්තමත්ථස්ස පත්තියා.

562. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛු[7] විසොධිතං,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

---

1 විත්තපරික්ඛයා - සීමු 1, 2  2 ජීවිතං - සීමු 1, 2  3 තෙන - මජසං
4 වසන්තා - සීමු 1, 2  5 සන්තො - සීමු 1, 2 PTS
6 අපෙක්ඛවා - සීමු 1, 2, PTS  7 දිබ්බචක්ඛුං - PTS

550. නුවණැත්තේ ධනක්ෂයට ගියේ නමුදු ජීවත්වන්නේ මැ වෙයි, නුවණ ධනවත් වූයේ නමුදු ප්‍රඥව නැතියෙන් ජීවත් නො වේ.

551. ප්‍රඥ තොමෝ ශ්‍රැතය විනිශ්චය කරන්නීය, ප්‍රඥ තොමෝ කීර්ති-ප්‍රශංසා වඩන්නී ය, මෙලොවැ ප්‍රඥ සහිත වූ පුරුෂ තෙමේ දුක් ඇති කල්හි දු සුව විඳී.

552. මේ ස්වභාවධර්මය තෙමේ අද වූයෙක් නො වෙයි, ආශ්චර්‍ය වූයේ නො වෙයි, අද්භූත වූයේ නො ද වෙයි, යම් තැනෙක උපදනේ නම්, මැරේ නම්, එහි කිනම් අද්භූතයෙක් ද-

553. උපන්නහු ගේ උපතට අනතුරු වැ මැ ජීවිතයට වඩා මරණය ඒකාන්ත වෙයි, මෙලොවැ උපනුපන්නාහු මැරෙති, සත්වයෝ මෙබඳු ස්වභාව ඇත්තාහු මැ යැ.

554. (මළහු ගේ) ජීවිතය සඳහා අන්‍ය පුරුෂයන්ගේ යම් හැඬීමෙක් වේ ද, එය මළහු ගේ ඒ ජීවිතය පිණිස නො වේ. මළහු නිමිති කොට හැඬීම යශස්ඵලවත්තේත් විශුද්ධිය ඵලවත්තේත් නො වෙයි, මහණබමුණන් විසිනුදු නො පසස්නාලදි.

555 හැඬීම ඇස ද සිරුර ද පෙළ යි. වර්‍ණය බලය නුවණ ද යන මේ පිරිහෙයි., ඔහුගේ සතුරෝ තුටු වෙති. ඔහුගේ හිතවත්හු සුඛිත නො වෙත්.

556. යම්හෙයකින් පිරුණු නදියක් නැවකින් මෙන් යම් කෙනකුන් ගේ ප්‍රඥසම්පත්තියෙන් කටයුතු තරණය කෙරෙත් ද, එහෙයින් මැ කුලයෙහි වසනුයේ එබඳු නුවණැතියන් ද බහුශ්‍රැතයන් ද කැමැති-වන්නේ ය යි.

මෙසෙයින් ආයුෂ්මත් මහාකප්පින ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

මහාකප්පින ස්ථවිරගාථා යි.

## 10. 1. 4

557. මා ගේ ඥාතිය දක්ඛ වූවා යැ, පෙර මම හෙළාදක්නාලදුයෙම් ජිම්, සොහොයුරු ද ''තෝ දුන් ගෙට යා''යි මා නෙරී යැ.

558. ඒ මම සොහොවුරු විසින් නෙරනාලදුයෙම් ඒ සඟරමැ දොරකොටුව වෙත ශාසනයෙහි අපේක්ෂා ඇති වැ නො සතුටුසිත් ඇති වැ සිටියෙමි.

559 බුදුහු එහි වැඩියහ. මා හිස පිරිමැදි සේක. මා අත ගෙන සඟරමට ඇතුළු කළ සේක.

560. බුදුහු මට අනුකම්පායෙන් පාපිස්නකඩක් දුන්හ, එක් පසෙක සිට තෙල සුදු කඩ මොනොවට අධිෂ්ඨාන කොට ඉටාගනුව'යි වදාළ සේක.

561. මම ඒ බුදුන් ගේ බස් අසා සසුන්හි ඇලුණෙම් විසීම් උත්තමාර්‍ථයට පැමිණීම සඳහා සමාධිය ඉපැදවීමි.

562. පෙරවිසූ කඳපිළිවෙළ දතිමි, දිවැස පිරිසුදු කරනලද, ත්‍රිවිද්‍යාවෝ ලබනලදහ. බුදුන් ගේ අනුසසුන් කරනලද.

563. සහස්සක්ඛත්තුමත්තානං නිම්මිනිත්වාන පන්ථකො,
නිසීදම්බවනෙ රම්මෙ යාව කාලප්පවෙදනා.[1]

564. තතො මෙ සත්ථා පාහෙසි දූතං කාලප්පවෙදකං,
පවෙදිතම්හි කාලම්හි වෙහාසාදුපසඞ්කමිං.[2]

565. වන්දිත්වා සත්ථුනො පාදෙ එකමන්තං නිසීදහං,
නිසින්නං මං විදිත්වාන අථ සත්ථා පටිග්ගහි.

566. ආයාගො සබ්බලොකස්ස ආහුතීනං පටිග්ගහො,
පුඤ්ඤක්ඛෙත්තං මනුස්සානං පටිගණ්හිත්ථ දක්ඛිණ’න්ති.

ඉත්ථං සුදං ආයස්මා චූළපන්ථකො ථෙරො ගාථායො අභාසිත්ථා’ති.

**චූළපන්ථකත්ථෙරගාථා.**

**10. 1. 5**

567. නානාකුණපසම්පුණ්ණො මහාඋක්කාරසම්භවො,
චන්දනිකං ච පරිපක්කං මහාගණ්ඩො මහාවණො.

568. පුබ්බරුහිරසම්පුණ්ණො ගූථකූපෙන ගාළ්හිතො[3]
ආපො පග්ඝරණො[4] කායො සදා සන්දති පූතිකං.

569. සට්ඨිකණ්ඩරසම්බන්ධො මංසලෙපනලෙපිතො,
චම්මකඤ්චුකසන්නද්ධො පූතිකායො නිරත්ථකො.

570. අට්ඨිසඞ්ඝාටඝටිතො නහාරු[5]සුත්තනිබන්ධනො,
නෙකෙසං සංගතිභාවා කප්පෙති ඉරියාපථං.

571. ධුවප්පයාතො මරණස්ස[6] මච්චුරාජස්ස සන්තිකෙ,
ඉධෙව ඡඩ්ඩයිත්වාන යෙන කාමඞ්ගමො නරො.

572. අවිජ්ජා[7] නිවුතො කායො චතුගන්ථෙන ගන්ථිතො,
ඔඝසංසීදනො කායො අනුසයජාලමොත්ථතො.

573. පඤ්චනීවරණෙ යුත්තො විතක්කෙන සමප්පිතො,
තණ්හාමූලෙනානුගතො මොහච්ඡාදනඡාදිතො.

574. එවායං වත්තතෙ කායො කම්මයන්තෙන යන්තිතො,
සම්පත්ති ච විපත්යන්තා නානාභාවො විපජ්ජති.

575. යෙමං කායං මමායන්ති අන්ධබාලා පුථුජ්ජනා,
වඩ්ඪෙන්ති කටසිං ඝොරං ආදියන්ති පුනබ්භවං.

576. යෙ’මං කායං විවජ්ජෙන්ති ගූථලිත්තං’ව පන්නගං,
භවමූලං වමිත්වාන පරිනිබ්බන්ත්‍යනාසවා.[8]

ඉත්ථං සුදං ආයස්මා කප්පො ථෙරො ගාථායො අභාසිත්ථා’ති.

**කප්පත්ථෙරගාථා.**

---

1 කාලප්පවෙදනං - PTS 2 වෙහාසානුපසඞ්කමිං - PTS 3 (එකූපෙනිගාළ්හිතො- සු, PTS, ‘ගූථකූපෙනිබාහිතො’ තිපි පාළි - සු, PTS 4 පග්ඝරණී - PTS.
5 නහාරු - PTS 6 මරණාය - සීමු 1, 2 7 අවිජ්ජාය - මජසං, ට, PTS
8 පරිනිබ්බිස්සන්ත්‍යනාසවා - PTS පරිනිබ්බායිස්සන්ත්‍යනාසවා - ට

563. පන්ථක තෙම කල් දන්වනතුරු රම්‍ය වූ අඹ වෙනෙහි තමා දහස්වර අත්බැව් මවාගෙන හුන්නේ යැ.

564. ඉක්බිති බුදුහු කල්දන්වන දූතයකු මා වෙත එවූහ. කල් දන්වූ කල්හි අහසින් එහි එළැඹියෙමි.

565. මම් බුදුන් පා වැඳ එකත්පසෙක හිනිමි. ඉක්බිති බුදුහු හුන් මා දැනැ (දක්ඛිණීදිය) පිළිගත්හ.

566. සියලු ලෝකයා විසින් ඇරැපිදියයුතු වූ දක්ෂිණාවන් පිළිගන්නාවූ මිනිසුන්ට පින්කෙත් වූ බුදුහු දක්ෂිණාව පිළිගත් සේක යි.

මෙසෙයින් ආයුෂ්මත් චූළපන්ථක ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

චූළපන්ථක ස්ථවිරගාථා යි.

## 10. 1. 5

567. නන්වැදෑරුම් මලයෙන් පිරුණු වැසිකිළියක් සේ පිළිකුල් මවුකුසැ උපන් පැරණි ගවරවළක් බඳුවූ මහගඩක් මහාව්‍රණයක් බඳු වූ –

568. ලේපූයාවෙන් පිරුණු වර්චසින් බර වූ වැගිරෙන අප්ධාතු ඇති මෙ කය හැමකල්හි කුණුව වැහෙයි.

569. සැටක් මහනහරින් බැඳුණු මාංසසඞ්ඛ්‍යාත ලේපයෙන් අනුලිප්ත වූ චර්මසඞ්ඛ්‍යාත කඤ්චුකයෙන් සන්නාඩ වූ මෙ කුණුකය නිෂ්ප්‍රයෝජන වේ.

570. ඇටසැකිල්ලෙන් ගටනලද නහර නමැති හූ බැඳුම් ඇති මෙ කය නොයෙක් චතුර්මහාභූතාදීන් ගේ සම්බන්ධයෙන් ඉරියව් පවත්වයි.

571. මරණය කරා නිරතුරු පැමිණෙන එයින් මැ මරහු ළඟ සිටි මෙ කය මෙහි මැ ලාපියා මිනිසා කැමැති සේ යන්නේ යැ.

572. කය අවිද්‍යානීවරණයෙන් වැසිණ, සතර කායග්‍රන්ථයෙන් ගෙතිණ, මෙ කය චතුරෝඝයෙහි ගැලෙන්නේ වෙයි, අනුසය නමැති දැලින් මඩනාලද.

573. පඤ්චනීවරණයෙන් යුක්ත වූ විතර්කයෙන් සමර්පිත වූ තෘෂ්ණාසඞ්ඛ්‍යාත භවමූලයෙන් අනුගත වූ මෝහසඞ්ඛ්‍යාත ඡදනයෙන් සොයනලද –

574. මෙසේ මෙ කය පවත්නේ ය, කර්මසඞ්ඛ්‍යාත යන්ත්‍රයෙන් සංඝටිතය, සම්පත්තිය ද විපත්තිය කෙළවර කොට ඇත, විනාභාවය ද වෙනස් ලෙස පැමිණෙයි.

575. අන්ධබාල වූ යම් පෘථග්ජන කෙනෙක් මේ කය මමායනා කෙරෙත් ද ඔහු ඝෝර වූ සසර වඩති, පුනර්භවය පුනපුනා ගනිත්.

576. යම් (ශ්‍රැතවත්) කෙනෙක් අසුචි වැකුණු සර්පයකු සෙයින් මේ කය හැරපියත් ද, ඔහු භවමූල වූ තෘෂ්ණාව නගාපියා ආස්‍රව නැත්තාහු පිරිනිවෙන්නාහ යි.

මෙසෙයින් ආයුෂ්මත් කප්ප ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

කප්ප ස්ථවිරගාථා යි.

## 10. 1. 6

577. විවිත්තං අප්පනිග්ඝොසං වාළමිගනිසෙවිතං,
සෙවෙ සෙනාසනං භික්ඛු පටිසල්ලානකාරණා.

578. සඞ්කාරපුඤ්ජා ආහත්වා සුසානා රථියාහි ච,
තතො සඞ්ඝාටිකං කත්වා ලූඛං ධාරෙය්‍ය චීවරං.

579. නීචං මනං කරිත්වාන සපදානං කුලා කුලං,
පිණ්ඩිකාය චරෙ භික්ඛු ගුත්තද්වාරො සුසංවුතො.

580. ලූඛෙන'පි ච සන්තුස්සෙ නාඤ්ඤං පත්ථෙ රසං බහුං,
රසෙසු අනුගිද්ධස්ස ඣානෙ න රමතී මනො.

581. අප්පිච්ඡො චෙව සන්තුට්ඨො පවිවිත්තො වසෙ මුනි,
අසංසට්ඨො ගහට්ඨෙහි අනාගාරෙහි චූභයං.

582. යථා ජළො'ව මූගො'ව අත්තානං දස්සයෙ තථා,
නාතිවෙලං පභාසෙය්‍ය සඞ්ඝමජ්ඣම්හි පණ්ඩිතො.

583. න සො උපවදෙ කඤ්චි උපඝාතං විවජ්ජයෙ,
සංවුතො පාතිමොක්ඛස්මිං මත්තඤ්ඤූ චස්ස භොජනෙ.

584. පග්ගහිතනිමිත්තස්ස[1] චිත්තස්සුප්පාදකොවිදො,
සමථං අනුයුඤ්ජෙය්‍ය කාලෙන ච විපස්සනං.

585. විරියසාතච්චසම්පන්නො යුත්තයොගො සදා සියා,
න ච අප්පත්වා දුක්ඛන්තං[2] විස්සාසං එය්‍ය පණ්ඩිතො.

586. එවං විහරමානස්ස සුද්ධිකාමස්ස භික්ඛුනො,
ඛීයන්ති ආසවා සබ්බෙ නිබ්බුතිඤ්චාධිගච්ඡතී'ති.

ඉත්ථං සුදං ආයස්මා උපසෙනො වඞ්ගන්තපුත්තො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

උපසෙනත්ථෙරගාථා.

## 10. 1. 7

587. විජානෙය්‍ය සකං අත්ථං අවලොකෙය්‍යාථ පාවචනං,
යඤ්චෙත්ථ අස්ස පතිරූපං සාමඤ්ඤං අජ්ඣුපගතස්ස.

588. මිත්තං ඉධ ච[3] කල්‍යාණං සික්ඛා විපුලං සමාදානං,
සුස්සූසා ච ගරූනං එතං සමණස්ස පතිරූපං.

589. බුද්ධෙසු ච සගාරවතා ධම්මෙ අපචිති යථාභූතං,
සඞ්ඝෙ ච චිත්තිකාරො එතං සමණස්ස පතිරූපං.

---

1 සුග්ගහිත නිමිත්තස්ස - සිමු 1, 2 PTS 'පග්ගහිත නිමිත්තො සො'' තිපි පාඨො.
2 දුක්ඛස්සන්තං - PTS 3 ඉධ - ට, PTS

## 10. 1. 6

577. මහණ තෙම ජනශූන්‍ය වූ නිශ්ශබ්ද වූ වණ්ඩමෘගයන් විසින් සෙවුනාලද වනසේනාසන පටිසල්ලාන හේතුයෙන් සෙවුනේ යැ.

578. සඞ්කාරකූටයෙන් ද සොහොනින් ද වීථියෙන් ද අහුලා ගෙනවුත් ඒ කඩින් රළු වූ සඟල සිවුරු කොටගෙන ධරන්නේ යැ.

579. ගෝපනය කළ (චක්ඛුරාදි) දොර ඇති (අත්කුකුස් ආදී නැතියෙන්) සුසංවෘත වූ එ මහණ මානය යට කොටගෙන පිඬු පිණිස කුලයෙන් කුලයට ගෙපිළිවෙළින් හැසිරෙන්නේ යැ.

580. රළුදූසිනුදු සතුටු වන්නේ යැ. අන්‍ය වූ බොහෝ රස නො පතන්නේ යැ. රසයෙහි ගිජු වූවහු ගේ සිත ධ්‍යානයෙහි නො ඇලේ ද එහෙයිනි.

581. මහණ තෙම අල්පේච්ඡ වූයේ ලද දැයින් සතුටු වැ කායවිවේක ඇති වැ අගාර - අනගාර දෙපසින් නො මුසු වැ වසන්නේ යැ.

582. පණ්ඩිත වූ මහණ තෙම සහමැද ජඩ වූවකු ත් ගොළු වූවකු ත් සෙයින් තමා දක්වන්නේ යැ. පමණ ඉක්මවා නො බණන්නේ යැ.

583. ඒ මහණ කිසිවකුට උපක්‍රෝශ නො කරන්නේ යැ. හිංසා හරනේ යැ. ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවර වූයේ භෝජනයෙහි මාත්‍රඥ වූයෙක් වන්නේ යැ

584. මොනොවට ගත් සමාධිනිමිත්ත ඇත්තෙක් වන්නේ යැ. (ලීනෝද්ධත) චිත්තයාගේ උත්පත්තිකාරණයෙහි නිපුණ වූයෙක් වන්නේ යැ. සුදුසු කාලයෙහි ශමථයෙහි ද විදර්ශනායෙහි ද යෙදෙන්නේ යැ.

585. පණ්ඩිත මහණ නිරතුරු වීර්‍ය්‍යයෙන් යුක්ත වූයේ හැමකල්හි භාවනාවෙහි යෙදුණෙක් වන්නේ යැ. නිවනට නො පැමිණ විශ්වාසයට නො ද පැමිණෙන්නේ යැ

586. මෙසේ වාසය කරන ශුද්ධිය කැමැති මහණහුගේ සියලු ආස්‍රවයෝ ගෙවී යෙති, ක්ලේශපරිනිර්වාණයට ද පැමිණෙන්නේ යයි.

මෙසෙයින් ආයුෂ්මත් උපසේන ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

**උපසේන ස්ථවිරගාථං යි.**

## 10. 1. 7

587 (නුවණැති පුරුෂ තෙම) ස්වාර්ථය විචාරා දන්නේ යැ. (සම්බුදුන් වදාළ) ප්‍රවචනය (නුවණැයින්) බලන්නේ යැ. මෙ සස්නෙහි ශ්‍රමණභාවයට එළැඹියහුට යමක් සාරූප්‍ය වේ ද එ ද බලන්නේ යි.

588. මෙ සස්නෙහි කල්‍යාණමිත්‍රයා යැ අධිශීලාදි ශික්ෂාසමාදාන යැ (ආචාර්‍ය්‍ය උපාධ්‍යාදි) ගුරුන්ගේ අවවාද අසනු කැමැත්ත යැ යන මේ කරුණු මහණහට සාරූප්‍ය වෙයි.

589. සම්බුදුරජුන් කෙරෙහි ගරු කරන බව යැ ආර්‍ය්‍යධර්මය කෙරෙහි යථාභූත කොට ආදරයෙන් පිදීම යැ ආර්‍ය්‍යසඞ්ඝයා කෙරෙහි සම්මානන යැ යන මෙ කරුණු මහණහට සාරූප්‍ය වෙයි.

590. ආචාරගොචරෙ යුත්තො ආජීවො සොධිතො අගාරය්හො,
චිත්තස්ස ච සණ්ඨපනං එතං සමණස්ස පතිරූපං.

591 චාරිත්තං අථ චාරිත්තං ඉරියාපථියං පසාදනියං,
අධිචිත්තෙ ච ආයොගො එතං සමණස්ස පතිරූපං.

592. ආරඤ්ඤකානි සෙනාසනානි පන්තානි අප්පසද්දානි,
භජිතබ්බානි මුනිනා එතං සමණස්ස පතිරූපං.

593. සීලං ච බාහුසච්චඤ්ච ධම්මානං පවිචයො යථාභූතං,
සච්චානං අභිසමයො එතං සමණස්ස පතිරූපං.

594. භාවයෙ ච[1] අනිච්චන්ති අනත්තසඤ්ඤං අසුභසඤ්ඤං ච,
ලොකම්හි ච අනභිරතිං එතං සමණස්ස පතිරූපං.

595. භාවෙය්‍ය ච බොජ්ඣඞ්ගෙ ඉද්ධිපාදානි ඉන්ද්‍රියානි බලානි,
අට්ඨඞ්ගමග්ගමරියං එතං සමණස්ස පතිරූපං.

596. තණ්හං පජහෙය්‍ය මුනි සමූලකෙ ආසවෙ පදාලෙය්‍ය,
විහරෙය්‍ය විප්පමුත්තො[2] එතං සමණස්ස පතිරූප'න්ති.

ඉත්ථං සුදං ආයස්මා ගොතමො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

අපරගොතමත්ථෙරගාථා.

තස්සුද්දානං:

කාළුදායී ච සො ථෙරො එකවිහාරී ච කප්පිනො
චූලපන්ථකො කප්පො ච උපසෙනො ච ගොතමො,
සත්තිමෙ දසකෙ ථෙරා ගාථායො චෙත්ථ සත්තති'ති.

## දසකනිපාතො නිට්ඨිතො

1 භාවයෙ - සිමු 1, 2, ප, PTS  2 විමුත්තො - PTS.

590. (කායිකවාචසික අව්‍යතික්‍රම සඞ්ඛ්‍යාත) ආචාරයෙනු ද (පිණ්ඩපාතාදිය පිණිස එළැඹෙනුවට යුක්තස්ථාන සඞ්ඛ්‍යාත) ගොචරයෙනු ද යුක්ත වූයේ යැ (විඥ පුරුෂයන්ගේ) ගර්හාවට නො නිසි සුවිශුද්ධ ආජීව යැ (ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාරතා සඞ්ඛ්‍යාත) චිත්තසංස්ථාපන යැ යන මේ කරුණු මහණහට සාරූප්‍ය වෙයි.

591. චාරිත්‍රශීල යැ වාරිත්‍රශීල යැ ප්‍රසාද එලවනුවට නිසි ඉරියව් ඇසිරි කල සම්‍යග් ප්‍රඥව යැ (ශමථවිදර්ශනා සඞ්ඛ්‍යාත) අධිචිත්තයෙහි භාවනා යැ යන මේ කරුණු මහණහට සාරූප්‍ය වෙයි.

592. මුනිහු විසින් සේවන කටයුතු නිහඬ වූ ජනශූන්‍ය වූ වනසෙනසුන් ඇද්ද, මේ මහණහට සාරූප්‍ය වෙයි.

593. චතුපාරිසුද්ධිසීල යැ බහුශ්‍රුතභාව යැ (රූපාරූප) ධර්මයන් ඇතිසැටියෙන් විමසීම යැ ආර්‍යසත්‍යයන් ප්‍රතිවෙධ කිරීම යැ යන මේ කරුණු මහණහට සාරූප්‍ය වෙයි.

594. ('හැම සංස්කාරයෝ අනිත්‍යයහ'යි) අනිත්‍යසංඥ වඩනේ යැ, ('හැම දහම් අනාත්මයහ'යි) අනාත්මසංඥ වඩනේ යැ, ('ත්‍රෛභූමක සංස්කාර අශුභයහ'යි) අශුභසංඥ වඩනේ යැ, හැම ලොව්හි අනභිරතිසංඥ ද වඩනේ යැ, මේ කරුණු මහණහට සාරූප්‍ය වෙයි.

595. (සත) බොධ්‍යඞ්ගයන් (සතර) ඍද්ධිපාදයන් (පස්ව) ඉන්ද්‍රියයන් (පස්ව) බලධර්මයන් ආර්‍යඅෂ්ටාඞ්ගමාර්ගය (සතර සතිපට්ඨානයන් සතර සම්‍යක්ප්‍රධානයන්) වඩනේ යැ. මේ කරුණු මහණහට සාරූප්‍ය වෙයි.

596. මුනි තෙම තෘෂ්ණාව හැරපියන්නේ යැ, මුල් සහිත ආශ්‍රවයන් උදුරාපියන්නේ යැ, (සියලු කෙලෙසුන් කෙරෙන්) විප්‍රමුක්ත වැ වාස කරන්නේ යැ. මේ කරුණු මහණහට සාරූප්‍ය වේ''යයි.

මෙසෙයින් ආයුෂ්මත් අපර ගෝතම ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළසේක.

අපරගෝතම ස්ථවිරගාථා යි.

**උද්දානය:**

කාළුදායි ස්ථවිර යැ, එකවිහාරි ස්ථවිර යැ, මහාකප්පින ස්ථවිර යැ, චූලපන්ථක ස්ථවිර යැ, කප්ප ස්ථවිර යැ, උපසේන ස්ථවිර යැ, ගෝතම ස්ථවිර යැ යි දසක නිපාතයෙහි තෙරහු සත්දෙනෙක. මෙහි ගාථා සැත්තෑවෙකි.

## දසකනිපාතය නිමි.

# 11. එකාදසනිපාතො.

### 11. 1. 1

597 කිං තවත්ථො වනෙ තාත උජ්ජුහානොව පාවුසෙ,
වෙරම්භා රමණීයා තෙ පවිවෙකො හි ඣායිනං.

598. යථා අබ්භානි වෙරම්භො වාතො නුදති පාවුසෙ,
සඤ්ඤා මෙ අභිකිරන්ති විවෙකපටිසඤ්ඤුතා.

599. අපණ්ඩරො අණ්ඩසම්භවො සීවථිකාය නිකෙතචාරිකො,
උප්පාදයතෙව මෙ සතිං සන්දෙහස්මිං[1] විරාගනිස්සිතං.

600. යං ච අඤ්ඤෙ න රක්ඛන්ති යො ච අඤ්ඤෙ න රක්ඛති,
ස වෙ භික්ඛු සුඛං සෙති කාමෙසු අනපෙක්ඛවා.

601 අච්ඡොදිකා පුථුසිලා ගොනඞ්ගුලමිගායුතා,
අම්බුසෙවාලසඤ්ඡන්නා තෙ සෙලා රමයන්ති මං.

602. වසිතං මෙ අරඤ්ඤෙසු කන්දරාසු ගුහාසු ච,
සෙනාසනෙසු පන්තෙසු වාළමිගනිසෙවිතෙ.

603. ඉමෙ හඤ්ඤන්තු වජ්ඣන්තු දුක්ඛං පප්පොන්තු පාණිනො.
සඞ්කප්පං නාභිජානාමි අනරියං දොසසංහිතං.

604. පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං,
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා.

605. යස්ස චත්ථාය පබ්බජිතො අගාරස්මානගාරියං,
සො මෙ අත්ථො අනුප්පත්තො සබ්බසඤ්ඤොජනක්ඛයො.

606. නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං,
කාලං ච පටිකඞ්ඛාමි නිබ්බිසං භතකො යථා.

607. නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං,
කාලං ච පටිකඞ්ඛාමි සම්පජානො පතිස්සතො'ති.

ඉත්ථං සුදං ආයස්මා සඞ්කිච්චො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**සඞ්කිච්චත්ථෙරගාථා**

තස්සුද්දානං:

සඞ්කිච්චත්ථෙරො එකොව කතකිච්චො අනාසවො,
එකාදසනිපාතම්හි ගාථා එකාදසෙව චා'ති.

## එකාදසනිපාතො නිට්ඨිතො.

1 සංදෙහස - PTS

# 11. එකාදසනිපාතය.

## 11. 1. 1

597. දරුව, වැසිකල්හි උජ්ජුහානපර්වතය වැනි (අසත්ප්‍රාය)වූ වනයෙහි ඔබට කවර ප්‍රයොජනයෙක් ද? කිම ඔබට වෙරම්බවාතයෝ රමණීය වෙත් ද? පවිවෙකය මැ ධ්‍යායීන්ට රමණීය යි.

598. යම්සේ වැසිකල්හි වෙරම්බවාතය වලාවන් බැහැර කෙරේ (ගෙනයා) ද, එසේ මැ විවෙකප්‍රතිසංයුක්ත වූ සංඥවෝ මා ගේ සිත (විවෙකස්ථානයට) අදිත් (ගෙන යත්).

599. සොහොනෙහි එ මැ නිවෙස් කොට හැසිරෙන කළුපැහැ ඇති පක්ෂි (කවුඩු) තෙම මට සිය සිරුරෙහි විරාගනිඃශ්‍රිත වූ සිහිය එලවා මැ යි.

600. අන්‍යයෝත් යමකු නො රකිත් නම් යමෙකුත් අන්‍යයන් නො රකී නම් කාමයෙහි අපෙක්ෂා නැති එ මහණ තෙම එකාන්තයෙන් සුවයේ හොවී.

601. පහන් දිය ඇති පුළුල්ගලතල යැ ගොනගුල් (වඳුරු) සිව්පා යැ යන මොවුන්ගෙන් යුත් දියසෙවෙලින් ගැවසීගත් ඒ පර්වතයෝ මා සිත් අලවත්.

602 අරණ්‍යයෙහි ද ගිරිකඳුරෙහි ද ගිරිගුහායෙහි ද වල්මුවන් විසින් සෙවුනාලද (වනයෙහි) දුරුසෙනසුන්හි ද මා විසුවිරු යැ.

603. (එ මම) මේ ප්‍රාණීහු නැසෙත්වා, පෙළෙත් වා, දුකට පැමිණෙත්වා යන ද්වෙෂයෙන් යුත් අනාර්‍යසංකල්පයක් නො දනිමි.

604. මා විසින් ශාස්තෘන් වහන්සේ ඇසුරු කරනලදහ, බුදුන් වහන්සේ ගේ අනුශාසනය (අවවාදය) කරනලදි, ගරු බර බහා තබනලදි, භවනෙත්තිය (තෘෂ්ණාව) මුලුසුන් කරනලදු.

605. තවද යම් අර්ථයක් සඳහා ගිහිගෙන් නික්ම පැවිදි වූයෙම් නම්, සියලු සංයොජනයන් ගේ ක්ෂයකිරීම වූ ඒ අර්ථය මා විසින් අනුක්‍රමයෙන් ලබනලද්දේ යි.

606. මරණය නො කැමැත්තෙමි, ජීවිතය නො කැමැත්තෙමි, මෙහෙ කරන කම්කරුවකු වේතනය අපෙක්ෂා කරන සේ හුදෙක් කාලය අපෙක්ෂා කරමි.

607. මරණය නො කැමැත්තෙමි, ජීවිතය නො කැමැත්තෙමි, සම්‍යක් ප්‍රඥ ඇති වැ සිහි ඇති වැ හුදෙක් කාලය අපෙක්ෂා කරමි.

මෙසේ ආයුෂ්මත් සඞ්කිච්ච ස්ථවිරයන් වහන්සේ ...

**සඞ්කිච්ච ස්ථවිරගාථා යි.**

**උද්දානය:**

එකොළොස් වැනි නිපාතයෙහි කළ (පැවිදි) කිස ඇති නිරාස්‍රව වූ එක් මැ සංකිච්ච ස්ථවිරයන් වහන්සේ යැ, ගථා ද එකොළොසෙක් මැ යි.

**එකාදසනිපාතය නිමි,**

# 12. ද්වාදසනිපාතො.

## 12. 1. 1

608. සීලමෙවිධ සික්ඛෙථ අස්මිං ලොකෙ සුසික්ඛිතං,
සීලං හි සබ්බසම්පත්තිං උපනාමෙති සෙවිතං.

609 සීලං රක්ඛෙය්‍ය මෙධාවී පත්ථයානො තයො සුඛෙ,
පසංසං විත්තිලාභං ච පෙච්ච සග්ගෙ ච මොදනං.

610. සීලවා හි බහූ මිත්තෙ සඤ්ඤමෙනාධිගච්ඡති,
දුස්සීලො පන මිත්තෙහි ධංසතෙ පාපමාචරං.

611. අවණ්ණං ච අකිත්තිං ච දුස්සීලො ලභතෙ නරො,
වණ්ණං කිත්තිං පසංසං ච සදා ලභති සීලවා.

612. ආදි සීලං පතිට්ඨා ච කල්‍යාණානං ච මාතුකං,
පමුඛං සබ්බධම්මානං තස්මා සීලං විසොධයෙ.

613. වෙලා ච සංවරො[1] සීලං චිත්තස්ස අභිහාසනං,
තිත්ථං ච සබ්බබුද්ධානං තස්මා සීලං විසොධයෙ.

614. සීලං බලං අප්පටිමං සීලං ආවුධමුත්තමං,
සීලමාභරණං සෙට්ඨං සීලං කවචමබ්භුතං.

615. සීලං සෙතු මහෙසක්ඛො සීලං ගන්ධො[2] අනුත්තරො,
සීලං විලෙපනං සෙට්ඨං යෙන වාති දිසොදිසං.

616. සීලං සම්බලමෙවග්ගං සීලං පාථෙය්‍යමුත්තමං,
සීලං සෙට්ඨො අතිවාහො යෙන යාති දිසොදිසං.

617. ඉධෙව නින්දං ලභති පෙච්චාපායෙ ච දුම්මනො,
සබ්බත්ථ දුම්මනො බාලො සීලෙසු අසමාහිතො.

618. ඉධෙව කිත්තිං ලභති පෙච්ච සග්ගෙ ච සුම්මනො,
සබ්බත්ථ සුමනො ධීරො සීලෙසු සුසමාහිතො.

619. සීලමෙව ඉධ අග්ගං පඤ්ඤවා පන උත්තමො,
මනුස්සෙසු ච දෙවෙසු සීලපඤ්ඤාණතො ජයං'ති.

ඉත්ථං සුදං ආයස්මා සීලවො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**සීලවත්ථෙරගාථා.**

---

1 සංවරං - PTS 2 සීලගන්ධො - සිමු 1, 2

# 12. ද්වාදසනිපාතය.

## 12. 1. 1

608. මෙ සසුන්හි ශීලය මැ පුහුණු කළ මැනවි, මෙලොව මොනවට පුහුණු කළ, සේවනය කළ ශීලය සියලු සම්පත් එළවා ද එහෙයිනි.

609. ප්‍රශංසාව ද සන්තොෂ ලාභය ද පරලෙව්හි ස්වර්ගයෙහි මෝදනය ද යන ත්‍රිවිධසුඛයන් කැමැති වන්නා වූ නුවණැත්තේ සිල් රක්ක මැනැවි

610. සිල් ඇත්තේ මැ සංවරය කරණ කොට ගෙන බොහෝ මිතුරන් ලබයි. දුශ්ශීල තෙමේ වැළින් ලාමක ක්‍රියා කරන්නේ මිතුරන් කෙරෙන් පහ වේ.

611. දුශ්ශීල පුරුෂ තෙම ගර්හාවත් අපකීර්තියත් ලබයි. සිල්වත් පුරුෂ තෙම හැම කල්හි ගුණකථනයත් කීර්තියත් ප්‍රශංසාවත් ලබයි.

612. ශීලය (කුශලධර්මයන්ට) මූලයත් ප්‍රතිෂ්ඨාත් වෙයි. කල්‍යාණධර්මයන්ට ද මවකි. සියලු ධර්මයන්ට ප්‍රමුඛ යැ. එහෙයින් සිල් පිරිසිදු කරන්නේ යි.

613. ශීලය චිත්තයා ගේ වෙරළ (සීමාව) ත් සංවරයත් සන්තොෂකාරණයත් සියලු බුදුවරුන් ගේ තීර්ථයත් වෙයි. එහෙයින් සිල් පිරිසුදු කරන්නේ යි.

614. ශීලය අසදෘශ බලයෙකි, ශීලය උතුම් ආයුධයෙකි, ශීලය ශ්‍රෙෂ්ඨ ආභරණයෙකි, ශීලය අද්භූත කවචයෙකි (සන්නාහයෙකි).

615. ශීලය මහබල ඇති සෙයකි. යමෙකින් දසනුදස හමා නම් එ ශීලය අනුත්තරගන්ධයෙකි. එ ශීලය ශ්‍රෙෂ්ඨ විලෙපනයෙකි.

616. යමෙකින් දසනුදසහි යේ නම් ඒ ශීලය අග්‍ර වූ බත්පලාවකි (බත්මුලෙකි) ඒ ශීලය උතුම් වූ මාගෝපකරණයෙකි. ඒ ශීලය ශ්‍රෙෂ්ඨ වූ යානයෙකි.

617. නපුරුසිත් ඇත්තේ මෙලෙව්හි මැ නින්දා ලබයි, පරලෙව්හි අපායෙහි ද නින්දා ලබයි, ශීලයෙහි නො පිහිටි බාල තෙමේ සියලු තැන්හි දෙම්නස් ඇත්තේ වේ.

618. මනාසිත් ඇත්තේ මෙලෙව්හි මැ කීර්තිය ලබයි. පරලෙව්හි ස්වර්ගයෙහි ද කීර්තිය ලබයි. ශීලයෙහි මොනවට පිහිටි නුවණැත්තේ හැමතැන්හි සොම්නස් වේ.

619. මෙ සසුන්හි ශීලය මැ අග්‍ර යැ, එතෙකුදු වුවත් නුවණැත්තේ උතුම්. මිනිසුන් අතුරෙහි දු දෙවියන් අතුරෙහි දු ශීල - ප්‍රඥා දෙකින් ජය වේ.

මෙසේ ආයුෂ්මත් සීලව ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

සීලව ස්ථවිරගාථා යි.

## 12. 1. 2

620. නීචෙ කුලම්හි ජාතො'හං දලිද්දො අප්පභොජනො,
හීනකම්මං මමං ආසි අහොසිං පුප්ඵඡඩ්ඩකො.

621. ජිගුච්ඡිතො මනුස්සානං පරිභූතො ච වම්භිතො,
නීචං මනං කරිත්වාන වන්දිසං[1] බහුකං ජනං.

622. අථද්දසාසිං සම්බුද්ධං භික්ඛුසඞ්ඝපුරක්ඛතං,
පවිසන්තං මහාවීරං මගධානං පුරුත්තමං.

623. නික්ඛිපිත්වාන ව්‍යාභඞ්ගිං වන්දිතුං උපසඞ්කමිං,
මමෙව අනුකම්පාය අට්ඨාසි පුරිසුත්තමො.

624. වන්දිත්වා සත්ථුනො පාදෙ එකමන්තං ඨිතො තදා,
පබ්බජ්ජං අහමායාචිං සබ්බසත්තානමුත්තමං.

625. තතො කාරුණිකො සත්ථා සබ්බලොකානුකම්පකො,
එහි භික්ඛූති මං ආහ සා මෙ ආසූපසම්පදා.

626 සො'හං එකො අරඤ්ඤස්මිං විහරන්තො අතන්දිතො,
අකාසිං සත්ථු වචනං යථා මං ඔවදී ජිනො.

627. රත්තියා පඨමං යාමං පුබ්බජාතිමනුස්සරිං,
රත්තියා මජ්ඣිමං යාමං දිබ්බචක්ඛුං විසොධයිං,[2]
රත්තියා පච්ඡිමෙ යාමෙ තමොඛන්ධං පදාලයිං.

628. තතො රත්‍යා විවසනෙ[3] සුරියස්සුග්ගමනං පති,
ඉන්දො බ්‍රහ්මා ච ආගන්ත්වා මං නමස්සිංසු පඤ්ජලී.

629. නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම,
යස්ස තෙ ආසවා ඛීණා දක්ඛිණෙය්‍යොසි මාරිස.

630. තතො දිස්වාන මං සත්ථා දෙවසඞ්ඝපුරක්ඛතං,
සිතං පාතුකරිත්වාන ඉමමත්ථං අභාසථ.

631. තපෙන බ්‍රහ්මචරියෙන සඤ්ඤමෙන දමෙන ච,
එතෙන බ්‍රාහ්මණො හොති එතං බ්‍රාහ්මණමුත්තම'න්ති.

ඉත්ථං සුදං ආයස්මා සුනීතො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**සුනීතත්ථෙරගාථා.**

තස්සුද්දානං:

සීලවා ච සුනීතො ච ථෙරා ද්වෙ තෙ මහිද්ධිකා
ද්වාදසම්හි නිපාතම්හි ගාථායො චතුවීසතී'ති.

## ද්වාදසනිපාතො නිට්ඨිතො.

---

1 වන්දියස්සං - සීමු 1, 2, ප. 2 විසොධිතං - PTS 3 විවසානෙ - සීමු 1, 2

### 12. 1. 2

620. මම පහත් කුලයෙහි උපන්මි, දිළින්දෙමි, අල්පභොජන ඇත්තෙමි, පහත් රැකියාවක් මට වී යැ, පුප්සඩු වීමි.

621. මිනිසුන් විසින් පිළිකුල් කරනලදු වැ යළි අවමන් කරන ලදු වැ ගරහනලදු වැ යටත්සිත් කොටගෙන බොහෝ දෙනා වැන්දෙමි.

622. භාග්‍යයෙකි! මගධ දනව්වෙහි අගනුවරට පිවිසෙන්නා වූ භික්ෂුසඞ්ඝයා විසින් පෙරටුකොට ඇති මහාවීර වූ සම්බුදුන් දිටිමි.

623. (මම) කද බහා තබා වඳින්නට එළැඹියෙමි. පුරුෂෝත්තම තෙමේ මට මැ අනුකම්පා පිණිස නැවැත්තේ යි.

624. එද ශාස්තෲන් ගේ පාසඟල වැඳ එකත්පසෙක සිටියෙමි සියලු සතුනට උතුම් වූ පැවිද්ද මම අයැදියෙමි.

625. ඉක්බිති කාරුණික වූ, සියලු ලෝකයාට අනුකම්පා ඇති ශාස්තෲන් වහන්සේ 'එව මහණැ'යි මට වදාළහ, ඒ මා ගේ උපසම්පදා වී යැ.

626. ඒ මම එකලා වැ අරණ්‍යයෙහි වසන්නෙම් නො මැලියෙමි, බුදුහු යම්සේ මට අවවාද කළෝ නම් එසේ ශාස්තෲවචනය කෙළෙමි.

627. රෑ පෙරයම්හි පූර්වජාතිය සිහි කෙළෙමි, රෑ මැදියම්හි දිවැස ශෝධනය කෙළෙමි.

628. රෑ පැසුළුයම්හි, එ රැය අවසන්හි හිරු උදාවන්නා හා මැ (අවිදු) අඳුරුකඳ පැළුයෙමි.

629. 'ඉන්ද්‍ර' ද 'බ්‍රහ්ම' ද අවුත් 'පුරුෂශ්‍රෙෂ්ඨය ඔබට නමස්කාර වේවා, පුරුෂෝත්තමය ඔබට නමස්කාර වේවා යම්හෙයෙකින් ඔබගේ ආශ්‍රවයෝ ක්ෂය වූවාහු ද (එහෙයින්) දක්ෂිණාර්හ වෙහි' යි ඇඳිලි බැන්දහු මට නමස්කාර කළහ.

630. ඉක්බිති ශාස්තෲන් වහන්සේ දිව්‍යසමූහයා විසින් පුරස්කෘත (සම්භාවිත) වූ මා දැක සිනා පාළ කොට මෙකරුණ වදාළහ.

631. තපසිනු දු බඹසරිනු දු ශීලයෙනු දු ප්‍රඥයෙනු දු යන මෙකරුණින් බ්‍රාහ්මණ වෙයි, මේ උතුම් බමුණු යැ යි (කීහු) යි.

මෙසේ ආයුෂ්මත් සුනීත ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

**සුනීත ස්ථවිර ගාථා යි.**

**උද්දානය:**

දෙලොස් වැනි නිපාතයෙහි සීලව ද, සුනීත ද යි තෙරවරු දෙදෙනෙකි. ඔහු මහත් සෘද්ධි ඇත්තාහු යැ, ගාථාවෝ සූවිස්සෙකි.

## ද්වාදසනිපාතය නිමි.

# 13. තෙරසනිපාතො.

### 13. 1. 1

632. යාහු රට්ඨෙ සමුක්කට්ඨො රඤ්ඤො අඞ්ගස්ස පද්ධගු,
ස්වාජ්ජ ධම්මෙසු උක්කට්ඨො සොණො දුක්ඛස්ස පාරගු

633 පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ පඤ්ච චුත්තරි භාවයෙ,
පඤ්ච සඞ්ගාතිගො භික්ඛු ඔඝතිණ්ණො'ති වුච්චති.

634. උන්නළස්ස පමත්තස්ස බාහිරාසස්ස භික්ඛුනො,
සීලං සමාධි පඤ්ඤා ච පාරිපූරිං න ගච්ඡති.

635. යං හි කිච්චං තදපවිද්ධං අකිච්චං පන කයිරති,
උන්නළානං පමත්තානං තෙසං වඩ්ඪන්ති ආසවා.

636. යෙසං ච සුසමාරද්ධා නිච්චං කායගතා සති,
අකිච්චං තෙ න සෙවන්ති කිච්චෙ සාතච්චකාරිනො,
සතානං සම්පජානානං අත්ථං ගච්ඡන්ති ආසවා

637 උජුමග්ගම්හි අක්ඛාතෙ ගච්ඡථ මා නිවත්තථ,
අත්තනා චොදයත්තානං නිබ්බානමභිහාරයෙ.

638 අච්චාරද්ධම්හි විරියම්හි සත්ථා ලොකෙ අනුත්තරො,
වීණොපමං කරිත්වා මෙ ධම්මං දෙසෙසි චක්ඛුමා.

639. තස්සාහං වචනං සුත්වා විහාසිං සාසනෙ රතො,
සමථං පටිපාදෙසිං උත්තමත්ථස්ස පත්තියා,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

640. නෙක්ඛම්මෙ අධිමුත්තස්ස පවිවෙකං ච චෙතසො,
අබ්‍යාපජ්ඣාධිමුත්තස්ස උපාදානක්ඛයස්ස ච.

# 13. තෙරසනිපාතය

### 13. 1. 1

632. අඟුරජහුගේ පිරිවරෙහි (රටවැසි) වූ යමෙක් අඟුරටෙහි අත්‍යුත්තෘෂට වූයේ නම් ඒ 'සොණ' තෙමේ අද ධර්මයෙහි උත්කෘෂට වැ දුඃඛයා ගේ පරතෙරට ගියේ යි.

633. (ඔරම්භාගිය සංයොජන) පස සිඳින්නේ යැ, (උද්ධම්භාගිය-සංයොජන) පස ප්‍රහාණය කරන්නේ යැ, මත්තෙහි (ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය) පස වඩන්නේ යැ, (රාග, ද්වෙෂ, මොහ, මාන, දිට්ඨි යන) පඤ්ච-සඞ්ගයන් ඉක්ම ගිය මහණ තෙම ඔඝතීර්ණ යැ යි කියනුලැබේ.

634. උස් වැ ගිය මාන ඇති, ප්‍රමාදයට පැමිණි, බාහිරායතනයන්හි ආශා ඇති මහණහුගේ ශීලයත් සමාධියත් ප්‍රඥාවත් පරිපූර්ණ බවට නො යේ.

635. උස්වගිය මානනල ඇති ප්‍රමත්තයන් විසින් කළයුතු යමක් ඇත්නම් එ හැරදමනලදී. නො කළයුත්ත වැලිත් කරනුලැබේ. ඔවුන් ගේ ආස්‍රවයෝ වැඩෙත්.

636. තවද යම් කෙනකුන් විසින් නිතොර වැ කායිගාසී දැඩි වැ ගන්නාලද ද කළයුත්තෙහි සාතත්‍යකාරී වූ ඔහු නො කළයුත්ත නො කරත්, සිහි ඇතියන්ගේ, සම්‍යක්ප්‍රඥ ඇතියන් ගේ ආස්‍රවයෝ අස්තයට යෙත් (ක්‍ෂය වෙත්).

637. ශාස්තෲන් වහන්සේ වදාළ ඍජුමාර්ගයෙහි යවු, නො නවතිවු, තමා තමාට චොදනා කළ මැනවි, (තමා) නිවනට පමුණුවන්නේ යි.

638. පමණ ඉක්ම පටන් ගත් වීර්‍ය්‍ය ඇති කල්හි ලෝකයෙහි නිරුත්තර වූ ඇස් ඇති ශාස්තෲන් වහන්සේ 'වීණොපමා' කොට මට දහම් දෙසූහ.

639. මම උන් වහන්සේගේ වචනය අසා සසුන්හි ඇලුණෙම් කල් යැවීමි. අර්හත්වයට පැමිණෙනු පිණිස (ඉන්ද්‍රිය සමතාව) සම්පාදනය කෙළෙම්. (මා විසින්) ත්‍රිවිද්‍යාව ලබනලද යැ, බුදුන්ගේ අවවාදය කරනලදී.

640. නෛෂ්ක්‍රම්‍යයෙහි නිමන (නැඹුරු) වූ චිත්තයා ගේ පවිවෙකයෙහි නිමන වූ නිදුක්බැව්හි නිමන වූ අර්හත්වයෙහි නිමනවූ –

641 තණ්හක්ඛයාධිමුත්තස්ස අසම්මොහං ච චෙතසො,
දිස්වා ආයතනුප්පාදං සම්මා චිත්තං විමුච්චති.

642. තස්ස සම්මා විමුත්තස්ස සන්තචිත්තස්ස භික්ඛුනො,
කතස්ස පතිචයො නත්ථි කරණීයං න විජ්ජති.

643. සෙලො යථා එකඝනො වාතෙන න සමීරති,
එවං රූපා රසා සද්දා ගන්ධා ඵස්සා ච කෙවලා.

644. ඉට්ඨා ධම්මා අනිට්ඨා ච නප්පවෙධෙන්ති තාදිනො,
ඨිතං චිත්තං විසඤ්ඤුත්තං වයඤ්චස්සානුපස්සතී'ති.

ඉත්ථං සුදං ආයස්මා සොණො කොළිවිසො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

සොණත්ථෙරගාථා.

තස්සුද්දානං:

සොණො කොළිවිසො ථෙරො එකොයෙව මහිද්ධිකො,
තෙරසම්හි නිපාතම්හි ගාථායො චෙත්ථ තෙරසා'ති.

## තෙරසනිපාතො නිට්ඨිතො.

641. නිර්වාණයෙහි නිමග්න වූ, චිත්තයාගේ අසම්මෝහයෙහි (ආයනීමාගී-යෙහි) නිමග්න වූ තැනැත්තහුගේ සිත (චක්ෂුරාදි) ආයතනෝත්පාදය දුකැ (ආස්‍රවයන් කෙරෙන්) මෝනවට මිදෙයි.

642. (කෙලෙසුන් කෙරෙන්) මෝනවට මිදුණු එහෙයින් මැ සන්හුන් සිත් ඇති ඒ මහණහු විසින් කරනලද කම්යාගේ උපචයෙක් නැති. (ඔහු විසින්) කලයුත්තෙක් (කෘතකෘත්‍ය බැවින්) නො පැනේ.

643. යම්සේ එකඝනපර්වතයක් සුලඟට නො සැලේ නම්, එපරිද්දෙන් රූප යැ රස යැ ශබ්ද යැ ගන්ධ ය, ස්පර්ශ යැ යන සියලු-

644. ඉෂ්ටධර්මයෝ ද අනිෂ්ටධර්මයෝ ද අකම්ප්‍ය වූ සංයෝග රහිත වූ තාදිහුගේ සිත කම්පා නො කරත්. (හෙතෙම) ඒ ආරම්මණයාගේ නිරෝධය ද දකී.

මෙසේ ආයුෂ්මත් 'කොළිවිස සොණ' ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

'සෝණ' ස්ථවිරගාථා සි.

උද්දානය:

තෙළෙස් වැනි නිපාතයෙහි එක් මැ මහත් සෘද්ධි ඇති කොළිවිස සොණ ස්ථවිරයන් වහන්සේ යැ, මෙහි ගාථාවෝ ද තෙළෙසෙකි.

# තෙරසනිපාතය නිමි.

# 14. චුද්දසනිපාතො

## 14. 1. 1

645. යදා අහං පබ්බජිතො අගාරස්මානගාරියං,
නාභිජානාමි සඞ්කප්පං අනරියං දොසසංහිතං.

646. ඉමෙ හඤ්ඤන්තු වජ්ඣන්තු දුක්ඛං පප්පොන්තු පාණිනො,
සඞ්කප්පං නාභිජානාමි ඉමස්මිං දීඝමන්තරෙ.

647. මෙත්තං ච අභිජානාමි අප්පමාණං සුභාවිතං,
අනුපුබ්බං පරිචිතං යථා බුද්ධෙන දෙසිතං.

648. සබ්බමිත්තො සබ්බසඛො සබ්බභූතානුකම්පකො,
මෙත්තං චිත්තං ච භාවෙමි අබ්‍යාපජ්ඣරතො[1] සදා.

649. අසංහීරං අසංකුප්පං චිත්තං ආමොදයාමහං,
බ්‍රහ්මවිහාරං භාවෙමි අකාපුරිසසෙවිතං.

650. අවිතක්කං සමාපන්නො සම්මාසම්බුද්ධසාවකො,
අරියෙන තුණ්හීභාවෙන උපෙතො හොති තාවදෙ.

651. යථා'පි පබ්බතො සෙලො අචලො සුප්පතිට්ඨිතො,
එවං මොහක්ඛයා භික්ඛු පබ්බතො'ව න වෙධති.

652. අනඞ්ගණස්ස පොසස්ස නිච්චං සුචිගවෙසිනො,
වාලග්ගමත්තං පාපස්ස අබ්භමත්තං[2] ච ඛායති.

653. නගරං යථා පච්චන්තං ගුත්තං සන්තරබාහිරං,
එවං ගොපෙථ අත්තානං ඛණො වො[3] මා උපච්චගා.

654. නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං,
කාලං ච පටිකඞ්ඛාමි නිබ්බිසං භතකො යථා.

655. නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං,
කාලං ච පටිකඞ්ඛාමි සම්පජානො පතිස්සතො.

656. පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං,
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා.

657. යස්ස චත්ථාය පබ්බජිතො අගාරස්මානගාරියං,
සො මෙ අත්ථො අනුප්පත්තො සබ්බසංයොජනක්ඛයො.

---

1 අබ්‍යාපජ්ජරතො - සීමු. 1, 2. 2. අබ්භාමත්තං - PTS, ථ. 3. වෙ - PTS.

# 14. චුද්දසනිපාතය.

## 14. 1. 1

645. යම් කලෙක මම ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් නම් එතැන් පටන් කොට දොෂයෙන් යුක්ත වූ අනාර්‍ය්‍යසංකල්පයක් නො දනිමි.

646. මේ ප්‍රාණීහු නැසෙත්වා පෙළෙත්වා දුකට පැමිණෙත්වා’යි සංකල්පයක් මේ දීර්‍ඝකාලය අතුරෙහි නො දනිමි.

647. අප්‍රමාණ්‍ය වූ මොනවට වඩනලද්දා වූ අනුක්‍රමයෙන් ප්‍රගුණකරන ලද්දා වූ මෛත්‍රියත් බුදුන් විසින් දෙසනලද පරිදි ඇස්සමූකොට දනිමි.

648 හැමට මිතුරු වැ හැමට යහළු වැ සියලු සතුන් කෙරෙහි අනුකම්පා ඇති වැ හැමකල්හි අව්‍යාපාදයෙහි (සත්‍වයනට හිතසුව එළවීමෙහි ඇලුණෙම් මෙත් සිතත් වඩමි.

649 ආකම්පණ රහිත වූවක් කොප්‍ය රහිත වූවක් කොට මම සිත සතුටු කරමි. නීවජනයන් විසින් නො සෙවුනාලද බ්‍රහ්මවිහාරය වඩමි.

650. ද්විතීයධ්‍යානයට සමවන් සම්‍යක් සම්බුද්ධශ්‍රාවක තෙමේ එකෙණෙහි ආර්‍ය්‍ය වූ තූෂ්ණීම්භාවයෙන් සමන්‍වාගත වූයේ වේ.

651. ශෛලපර්‍වතය තෙම යම්සේ අචල ද මොනවට පිහිටියේ වේ ද එපරිද්දෙන් මොහක්‍ෂය හෙතුකොටගෙන පර්‍වතයක් මෙන් (අචල) වූ මහණ තෙම නො සැලේ.

652. (රාගාදි) අඞ්ගණ රහිත වූ නිරතුරු නිරවද්‍ය ධර්‍මයන් සොයන සුලු පුරුෂයාහට කෙසගක් (වලගක්) පමණ වූ පාපය වලාකුළක් පමණ මෙන් වැටහේ.

653. ඇතුළත පිටත සහිත වැ ගොපනය (රැකවරණ) කරනලද පසල් නුවර යම්සේ ද එසේ තමා (සිත) රකිවූ, ක්‍ෂණය තෙම තොප නහමක් ඉක්ම යා.

654. මරණය නො කැමැත්තෙමි, ජීවිතය නො කැමැත්තෙමි, මෙහෙ කරන කම්කරුවකු වේතනය අපෙක්‍ෂා කරන සේ කාලය පමණක් අපේක්‍ෂා කරමි.

655. මරණය නො කැමැත්තෙමි, ජීවිතය නො කැමැත්තෙමි. සම්‍යක් ප්‍රඥ ඇති වැ සිහි ඇති වැ කාලය පමණක් අපේක්‍ෂා කරමි.

656. මා විසින් ශාස්තෲන් වහන්සේ ඇසුරු කරනලදහ. බුදුන්ගේ අවවාදය කරනලද යැ. ගුරු බර බහා තබනලද්දේ යැ, භවනෙත්තිය (තෘෂ්ණාව) මුලුසුන් කරනලදි.

657. යම් අර්‍ථයක් සඳහා ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් නම් සියලු සංයෝජනයන් ක්‍ෂය කිරීමැ යි කියනලද ඒ අර්‍ථය මා විසින් ලබනලද්දේ යැ.

658 සම්පාදෙථ'ප්පමාදෙන එසා මෙ අනුසාසනී,
හන්දාහං පරිනිබ්බිස්සං විප්පමුත්තොම්හි සබ්බධී'ති

ඉත්ථං සුදං ආයස්මා ඛදිරවනියො රෙවතො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**ඛදිරවනියරෙවතත්ථෙර ගාථා.**

## 14. 1. 2

659 යථා'පි භද්දො ආජඤ්ඤො ධුරෙ යුත්තො ධුරාසහො,[1]
මථිතො අතිභාරෙන සංයුගං නාතිවත්තති.

660. එවං පඤ්ඤාය යෙ තිත්තා සමුද්දො වාරිනා යථා,
න පරෙ අතිමඤ්ඤන්ති අරියධම්මො'ව පාණිනං.

661. කාලෙ කාලවසං පත්තා භවාභවවසං ගතා,
නරා දුක්ඛං නිගච්ඡන්ති තෙධ සොචන්ති මානවා.

662. උන්නතා සුඛධම්මෙන දුක්ඛධම්මෙන චොනතා,[2]
ද්වයෙන බාලා හඤ්ඤන්ති යථාභූතං අදස්සිනො.

663. යෙ ච දුක්ඛෙ සුඛස්මිං ච මජ්ඣෙ සිබ්බිනිමච්චගු[3]
ඨිතා තෙ ඉන්දඛීලො'ව න තෙ උන්නතඔනතා.

664. නහෙව ලාභෙ නාලාභෙ අයසෙ[4] න ච කිත්තියා,
න නින්දායං පසංසාය න තෙ දුක්ඛෙ සුඛම්හි ච.

665. සබ්බත්ථ තෙ න ලිප්පන්ති උදබින්දුව පොක්ඛරෙ,
සබ්බත්ථ සුඛිතා ධීරා සබ්බත්ථ අපරාජිතා.

666. ධම්මෙන ච අලාභො යො යො ච ලාභො අධම්මිකො,
අලාභො ධම්මිකො සෙය්‍යො යං චෙ ලාභො අධම්මිකො.

667. යසො ච අප්පබුද්ධීනං විඤ්ඤූනං අයසො ච යො,
අයසො'ව සෙය්‍යො විඤ්ඤූනං න යසො අප්පබුද්ධිනං.

668. දුම්මෙධෙහි පසංසා ච විඤ්ඤූහි ගරහා ච යා,
ගරහා'ව සෙය්‍යො විඤ්ඤූහි යං චෙ බාලප්පසංසනා.

---

1 ධුරස්සහො - සිමු 1, 2    2 චොනතා - PTS.
3 සිබ්බිනිමජ්ඣගු - PTS    4 නයසෙ - මජසං, PTS

658. නො පමා වැ (දානශීලාදිය) සම්පාදනය කරවු, මේ මාගේ අවවාදය යි, එකත්හෙත් මම පිරිනිවෙන්නෙමි, සියලු භවයන් කෙරෙන් මිදුණෙමි'යි.

මෙසේ ආයුෂ්මත් ඛදිරවනිය රේවත ස්ථවිරයන් වහන්සේ ...

**ඛදිරවනියරේවත ස්ථවිරගාථා යි.**

## 14. 1. 2

659. ධුරයෙහි (වියෙහි) යොදනලද රියබර උසුලනු සමත් වූ අතිභාරයෙන් මඩනාලද භද්‍ර වූ වෘෂභරාජයෙක් යම්සේ තමාගේ වියදඬ නො ඉක්ම සිටී ද,

660. එපරිද්දෙන් යම් කෙනෙක් ජලයෙන් සමුද්‍රය සෙයින් ප්‍රඥයෙන් තෘප්ත වූවාහු ද ඔහු අන්‍යයන්ට අවමන් නො කරත්. (මේ) සත්ත්වයන්ගේ ආයශීධර්මයෙක් මැ යි.

661. මිනිස්සු (ලාභාලාභාදි) කාලයෙහි කාලයාගේ වශයට පැමිණියාහු වෘද්ධිහානි වශයට ගියාහු දුකට පැමිණෙත්. ඒ මිනිස්සු මෙලෙව්හි ශෝක කරත්.

662. සුඛ හේතුයෙන් උන්නත වූ, යළි දුඃඛහේතුයෙන් අවනත වූ, ඇති සැටියෙන් නො දක්නාසුලු බාලයෝ දෙකරුණින් පෙළෙත්.

663 තවද යම් කෙනෙක් දුකෙහිත් සැපෙහිත් මධ්‍යස්ථයෙහිත් තෘෂ්ණාව ඉක්මගියාහු නම් ඔහු ඉන්ද්‍රඛීලය මෙන් නිශ්චලයහ ඔහු උන්නතාවනත නො වෙත්.

664. ඔහු ලාභයෙහි, අලාභයෙහි, අයසෙහි, කීර්තියෙහි, නින්දායෙහි, ප්‍රශංසායෙහි, දුකෙහි හා සුවයෙහි නො ඇලෙත් මැ යි.

665 ඔහු පෑකුරුපතැ දියබිඳු මෙන් කිසිතැනෙක නො ඇලෙත්. ප්‍රාඥයෝ හැම තැන්හි සුඛිතයහ, හැම තැන්හි අපරාජිතයහ.

666. දැහැමින් වන යම් අලාභයෙකුත් වේ නම් අත්නැයෙන් වන යම් ලාභයෙකුත් වේ නම් (මෙදෙක අතුරින්) ඉදින් අත්නැයෙන් වන ලාභය යමක් නම් එයට වඩා දැහැමින් වන ලාභය උතුම්.

667. නුවණ නැතියන්ගේ යම් යසසකුත් නුවණැතියන්ගේ යම් අයසකුත් වේ නම් (ඔවුනතුරෙහි) නුවණැතියන් ගේ අයස මැ උතුම්. නුවණ නැතියන් ගේ යසස උතුම් නො වේ.

668 මූඪයන් විසින් කරන යම් ප්‍රශංසාවකුත් නුවණැතියන් විසින් කරන යම් ගර්හාවකුත් වේ නම් (ඔවුනතුරෙහි) ඉදින් බාලයන් විසින් කරන ප්‍රශංසාව යමක් නම් එයට වඩා නුවණැතියන් විසින් කරන ගර්හාව මැ උතුම්.

669. සුඛං ච කාමමයිකං දුක්ඛං ච පවිවෙකියං,
පවිවෙක[1]දුක්ඛං සෙය්‍යො යං චෙ කාමමයං සුඛං.

670. ජීවිතං ච අධම්මෙන ධම්මෙන මරණං ච යං,
මරණං ධම්මිකං සෙය්‍යො යං චෙ ජීවෙ අධම්මිකං.

671. කාමකොපප්පහීනා යෙ සන්තචිත්තා භවාභවෙ,
චරන්ති ලොකෙ අසිතා නත්ථි තෙසං පියාප්පියං.

672. භාවයිත්වාන බොජ්ඣඞ්ගෙ ඉන්ද්‍රියානි බලානි ච,
පප්පුය්‍ය පරමං සන්තිං පරිනිබ්බන්ත්‍යනාසවා'ති.[2]

ඉත්ථං සුදං ආයස්මා ගොදත්තො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

ගොදත්තත්ථෙරගාථා.

තස්සුද්දානං:

රෙවතො චෙව ගොදත්තො ථෙරා ද්වෙ තෙ මහිද්ධිකා,
චුද්දසම්හි නිපාතම්හි ගාථායො අට්ඨවීසති'ති.

## චුද්දසනිපාතො නිට්ඨිතො.

1 පවිවෙකියං - සයා PTS, 2 පරිනිබ්බන්තිඅනාසවා'ති - PTS

669. කාමප්‍රකෘතික සුඛයෙකුත් පවිවෙකයෙන් හටගත් දුඃඛයෙකුත් වේ නම් (ඔවුනතුරෙහි) ඉදින් කාමප්‍රකෘතික සුඛය යමක් නම් එයට වඩා පවිවෙකයෙන් හටගත් දුඃඛය උතුම්.

670. අත්නෑයෙන් දිවිරැක්ම ද දැහැමින් මරණය ද යන යමෙක් වේ නම් (ඔවුනතුරෙහි) ඉදින් අත්නෑයෙන් දිවිරක්නේ යැ යන යමෙක් ඇත් ද (එයට වඩා) දැහැමින් මරණය ශ්‍රෙෂ්ඨ සි.

671. කාමකොප ප්‍රහීණ වූ යම් කෙනෙක් කුදුමහත් භවයෙහි සත්හුන් සිත් ඇති වැ ලොකයෙහි අනිශ්‍රිත වැ හැසිරෙත් නම් ඔවුන්ට ප්‍රියාප්‍රිය දැයෙක් නැති.

672. බොධ්‍යඞ්ගයන් ද ඉන්‍ද්‍රියයන් ද බලධර්මයන් ද වඩා පරමශාන්තියට පැමිණ රහත්හු පිරිනිවෙති'සි.

මෙසේ ආයුෂමත් ගොදත්ත ස්ථවිරයන් වහන්සේ ...

**ගෝදත්ත ස්ථවිරගාථා සි.**

**උද්දානය**:

තුදුස් වැනි නිපාතයෙහි 'රෙවත' ද 'ගොදත්ත' ද යි ඒ මහත් සෘද්ධි ඇති තෙරවරු දෙදෙනෙකි. ගාථා අටවිස්සෙකි.

## චුද්දසනිපාතය නිමි.

# 16. සොළසනිපාතො

## 16. 1. 1

673. එස භිය්‍යො පසීදාමි සුත්වා ධම්මං මහාරසං,
විරාගො දෙසිතො ධම්මො අනුපාදාය සබ්බසො.

674. බහූනි ලොකෙ චිත්‍රානි අස්මිං පථවිමණ්ඩලෙ,[1]
මථෙන්ති මඤ්ඤෙ සඞ්කප්පං සුභං රාගූපසංහිතං.

675. රජමුහතං[2] ච වාතෙන යථා මෙඝොපසම්මයෙ[3]
එවං සම්මන්ති සඞ්කප්පා යදා පඤ්ඤාය පස්සති.

676. සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා.

677. සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා.

678. සබ්බෙ ධම්මා අනත්තා'ති යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා.

679. බුද්ධානුබුද්ධො යො ථෙරො කොණ්ඩඤ්ඤො තිබ්බනික්කමො,[4]
පහීනජාතිමරණො බ්‍රහ්මචරියස්ස කෙවලී.

680. ඔඝපාසො දළ්හඛිලො පබ්බතො දුප්පදාලියො,[5]
ඡෙත්වා ඛිලං ච[6] පාසං ච සෙලං භෙත්වාන[7] දුබ්භිදං,
තිණ්ණො පාරඞ්ගතො ඣායී මුත්තො සො මාරබන්ධනා.

681. උද්ධතො චපලො භික්ඛු මිත්තෙ ආගම්ම පාපකෙ,
සංසීදති මහොඝස්මිං ඌමියා පටිකුජ්ජිතො.

682. අනුද්ධතො අචපලො නිපකො සංවුතින්ද්‍රියො,
කල්‍යාණමිත්තො මෙධාවී දුක්ඛස්සන්තකරො සියා.

683. කාලපබ්බඞ්ගසඞ්කාසො කිසො ධමනිසන්ථතො,
මත්තඤ්ඤූ අන්නපානස්මිං අදීනමානසො නරො.

684. ඵුට්ඨො ඩංසෙහි මකසෙහි අරඤ්ඤස්මිං බ්‍රහාවනෙ,
නාගො සඞ්ගාමසීසෙ'ව සතො තත්‍රාධිවාසයෙ.

685. නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං,
කාලං ච පටිකඞ්ඛාමි නිබ්බිසං භතකො යථා.

1. පුථුවිමණ්ඩලෙ - PTS 2. රජමුපාතං - PTS 3. මෙඝො පසාමයෙ - PTS
4. තිබ්බනික්ඛමො - PTS 5. දුප්පදලයො - සිමු 1,2, 6. ඛිලඤ්ච - PTS
7. ඡෙත්වාන - සිමු 1, 2

# 16. සොළසනිපාතය.

## 16. 1. 1

673. ඒ මම (ඔබගේ) ඉතා රසවත් ධර්මය අසා බෙහෙවින් පහදිමි. සර්වප්‍රකාරයෙන් උපාදාන රහිත වූ විරාගධර්මය දෙසනලද්දේ යැ.

674. ලොකයෙහි විසිතුරු වූ අරමුණු බොහෝ වෙත්. (ඔහු) මේ මිතිස්ලො වැ රාගයෙන් යුක්ත වූ මිථ්‍යාසංකල්පය අලළතී හගිමි.

675. මෙසය වායුව විසින් නගනලද ධූලි යම්සේ සන්හිඳුවා ද එසේ යම් කලෙක (ආයර්‍යශ්‍රාවක තෙම විසිතුරු අරමුණ) විදර්ශනා ප්‍රඥයෙන් දකී නම්, එකල්හි සංකල්පයෝ සන්හිඳෙත්.

676. 'සියලු සංස්කාරයෝ අනිත්‍යහ'යි යම්කලෙක (ආයර්‍යශ්‍රාවක තෙම) විදර්ශනා ප්‍රඥයෙන් දකී ද යළි දුකෙහි කලකිරේ ද (ඥානදර්ශන) විසුඩියට මේ මාර්ගය වේ.

677. 'සියලු සංස්කාරයෝ දුඃඛයහ'යි යම් කලෙක ප්‍රඥයෙන් දකී ද යළි දුකෙහි කලකිරේ ද මේ විසුඩියට මාර්ගය යි.

678 'සියලු (ත්‍රෛභූමක) ධර්මයෝ අනාත්මයහ'යි යම් කලෙක ප්‍රඥයෙන් දකී ද යළි දුකෙහි කලකිරේ ද මේ විසුද්ධියට මාර්ගය යි.

679. යමෙක් බුද්ධානුබුද්ධ වූයේ ද ස්ථිර ගුණ ඇත්තේ ද, කොණ්ඩඤ්ඤ නම් වූයේ ද දෘඪවීර්‍යය ඇත්තේ ද, ප්‍රහීණ වූ ජාතිමරණ ඇත්තේ ද පිරිපුන් මඟබඹසර ඇත්තේ ද නොහොත් මඟ-පල නුවණ ඇත්තේ ද,

680. ඕඝපාශ ඇති ස්ථිර වූ චේතොඛිල ඇති පැළීමට දුෂ්කර වූ අවිද්‍යා-පර්වතයක් ඇති හෙතෙම ඛිලයත් පාශයත් සිඳ, බිඳීමට දුෂ්කර වූ පර්වතය බිඳ, ඔඝතරණය කොළේ පරතෙරට (නිවනට) ගියේ ධ්‍යාන කරන සුලු වූයේ මාරබන්ධයෙන් මිදුණේ යි.

681. උඩඟු (නො සන්හුන්) වූ චපල වූ මහණ තෙම පාපමිත්‍රයන් ලැබ ක්‍රොධ උපායාස නැමැති රළ විසින් යට කොට ගන්නාලද්දේ (කාමාදි) මහොඝයෙහි ගැලෙයි.

682. උඩඟු නො වූ චපල නො වූ (ආත්මාර්ථ පරාර්ථයන්හි) නිපුණ වූ සංවරණය කරනලද ඉඳුරන් ඇති කල්‍යාණමිතුරන් ඇති නුවණැත්තේ දුක් කෙළවර කරන්නෙක් වන්නේ යි.

683. කළුවැල්පුරුක් බඳු අවයව ඇති, කෘශ වූ, ඉපිලගිය නහරවැල් ඇති ආහාරපානයෙහි පමණ දන්නා වූ, නො මැලි සිත් ඇති පුරුෂ තෙම-

684. අරණ්‍යයෙහි මහවනයෙහි මැසි මදුරුවන් විසින් විදුනාලද්දේ රණබිම්හි ඇතකු සෙයින් එහි සිහි ඇති වැ ඉවසන්නේ යි.

685. මරණය නො කැමැත්තෙමි. ජීවිතය නො කැමැත්තෙමි. මෙහෙ කරන කම්කරුවකු වෙතනය අපෙක්‍ෂා කරන සේ හුදෙක් කාලය අපේක්‍ෂා කරමි.

686. නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං,
කාලං ච පතිකඞ්ඛාමි සම්පජානො පතිස්සතො.

687. පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං,
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා.

688. යස්සත්ථාය[1] පබ්බජිතො අගාරස්මානගාරියං,
සො මෙ අත්ථො අනුප්පත්තො කිං මෙ සද්ධිවිහාරිනා'ති[2].

ඉත්ථං සුදං ආයස්මා අඤ්ඤාකොණ්ඩඤ්ඤො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

අඤ්ඤාකොණ්ඩඤ්ඤත්ථෙරගාථා.

## 16. 1. 2

89. මනුස්සභූතං සම්බුද්ධං අත්තදන්තං සමාහිතං,
ඉරියමානං[3] බ්‍රහ්මපථෙ චිත්තස්සූපසමෙ රතං.

690. යං මනුස්සා නමස්සන්ති සබ්බධම්මාන පාරගුං,
දෙවා'පි තං නමස්සන්ති ඉති මෙ අරහතො සුතං.

691. සබ්බසංයොජනාතීතං වනා නිබ්බනමාගතං[4]
කාමෙහි නෙක්ඛම්මරතං[5] මුත්තං සෙලා'ව[6] කඤ්චනං.

692. ස වෙ අච්චන්තරුචි නාගො හිමවා චඤ්ඤෙ සිලුච්චයෙ,
සබ්බෙසං නාගනාමානං සච්චනාමො අනුත්තරො.

693. නාගං වො කිත්තයිස්සාමි න හි ආගුං කරොති සො,
සොරච්චං අවිහිංසා ච පාදා නාගස්ස තෙ දුවෙ.

694. සති ච සම්පජඤ්ඤං ච චරණා නාගස්ස තෙ පරෙ,
සද්ධාහත්ථො මහානාගො උපෙක්ඛාසෙතදන්තවා.

695. සති ගීවා සිරො පඤ්ඤා වීමංසා ධම්මචින්තනා,
ධම්මකුච්ඡිසමාවාසො විවෙකො තස්ස වාලධි.

696. සො ඣායී අස්සාසරතො අජ්ඣත්තං සුසමාහිතො,
ගච්ඡං සමාහිතො නාගො ඨිතො නාගො සමාහිතො.

697. සයං සමාහිතො නාගො නිසින්නො'පි සමාහිතො,
සබ්බත්ථ සංවුතො නාගො එසා නාගස්ස සම්පදා.

698. භුඤ්ජති අනවජ්ජානි සාවජ්ජානි න භුඤ්ජති,
ඝාසමච්ඡාදනං ලද්ධා සන්නිධිං පරිවජ්ජයං.

---

1. යස්සමත්ථාය - PTS 2. සද්ධිවිහාරෙනා'ති - PTS
3. ඉරිමානං - ට, ඉරියමානං - සීමු 1, 2
4. නිබ්බාණමාගතං - සීමු. 1, 2. 5. නික්ඛම්මරතං - PTS.
6. මුත්තසෙලාව - PTS

686. මරණය නො කැමැත්තෙමි. ජීවිතය නො කැමැත්තෙමි. සම්‍යක් ප්‍රඥ ඇති වැ සිහි ඇති වැ හුදෙක් කාලය අපේක්‍ෂා කරමි.

687. මා විසින් ශාස්තෘන් වහන්සේ ආශ්‍රිතයහ. බුදුරදුන්ගේ අනුශාසනය කරනලද යැ. ගුරු වූ බර බහාතබනලද යැ. තෘෂ්ණා සඞ්ඛ්‍යාත භවනෙත්තිය නසනලදී.

689. යම් අර්ථයක් සඳහා ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් නම් ඒ අර්ථය මා විසින් ලබනලද්දේ යැ. මට සද්ධිවිහාරිකයකුගෙන් කවර අර්ථයෙක් දැ'යි.

මෙසේ ආයුෂ්මත් අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේ ...

අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරගාථා යි.

## 16. 1. 2

689. මිනිසුන් අතර උපන්නා වූ (දමනයුතු දය) තමා මැ දන්තා වූ තමා මැ දමුණා වූ සමාහිත වූ බ්‍රහ්මවිහාර මාර්ගයෙහි පවත්නා වූ චිත්තයාගේ ව්‍යුපශමයෙහි (නිවනෙහි) ඇලුණා වූ,

690 මිනිස්සු (ස්කන්ධායතනාදි) සියලු ධර්මයන්ගේ පරතෙරට ගියා වූ යමකු නමදිත් ද දෙවියෝ ද ඔහු නමදිති මා විසින් රහතුන් වෙත අසනලදි.

691. ඉක්මගිය සියලු සංයෝජනයන් ඇති, (කෙලෙස්) වනයෙන් නික්ම නිවනට පැමිණි, කාමයෙන් නික්ම නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණු, සෙලින් මුත් කසුනක් (රනක්) බඳු (ඔහු දෙවියෝ ද නමදිත්.)

692. එ බුද්ධනාග තෙමේ ඒකාන්තයෙන් අන්‍ය පර්වතයන් ඉක්ම සිටි හිමවත් පර්වතය මෙන් අත්‍යන්තයෙන් බැබැළී, 'නාග' නාමය ඇති සියල්ලන් අතුරෙහි නිරුත්තර වූ සත්‍යනාමය ඇත්තේ යි.

693. තොපට නාග(හස්ති)යා ප්‍රකාශ කරන්නෙමි, හෙතෙම පව් නො මැ කෙරේ. ශීලයත් කරුණාවත් යන එදෙක නාගයාගේ (පූර්ව) පාදයෝ යි.

694. ස්මෘතියත් සම්‍යක්ප්‍රඥවත් නාගයාගේ ඒ අන්‍ය (පසු) පාදයෝ යි. මහානාග තෙමේ ශ්‍රද්ධා නැමැති අත් ඇත්තේ යැ. උපෙක්‍ෂා නැමැති සුදුදළ ඇත්තේ යි.

695. ස්මෘතිය ඔහුගේ ග්‍රීවය යැ, ප්‍රඥව ශීර්ෂය යැ, ධර්මචින්තාව විමර්ශනය යැ,(සමථ-විදර්ශනා) ධර්මය කුක්ෂිය යැ, විවේකය වාලධිය යි.

696. එ නාග තෙමේ ධ්‍යාන කරනසුලු යැ, ආශ්වාදයෙහි (නිවනෙහි) ඇලුණේ යැ, අධ්‍යාත්මයෙහි මොනවට සමාහිත යැ, නාග තෙම යන්නේ සමාහිත යැ, සිටියේ සමාහිත යි.

697. නාග තෙම හෝනේ සමාහිත යැ, හුන්නේ ද සමාහිත යැ, සියලු අරමුණෙහි සංවෘත යැ, මේ වනාහි නාගයාගේ සම්පත්තිය යි.

698. වස්ත්‍රාහාර ලැබැ සන්නිධිකාරය (රැස්කිරීම) දුරු කරනුයේ නිරවද්‍ය දය වළඳයි. සාවද්‍ය දය නො වළඳ යි.

699. සංයොජනං අණුං ථූලං සබ්බං ඡෙත්වාන බන්ධනං,
යෙන යෙනෙව ගච්ඡති අනපෙක්ඛොව ගච්ඡති.

700. යථාපි උදකෙ ජාතං පුණ්ඩරීකං පවඩ්ඪති,
නොපලිප්පති තොයෙන සුචිගන්ධං මනොරමං.

701. තථෙව ච ලොකෙ ජාතො බුද්ධො ලොකෙ විහරති,
නොපලිප්පති ලොකෙන තොයෙන පදුමං යථා.

702. මහාග්ගිනි පජ්ජලිතො අනාහාරොපසම්මති,
අඞ්ගාරෙසු ච සන්තෙසු නිබ්බුතො'ති පවුච්චති.

703. අත්ථස්සායං විඤ්ඤාපනී උපමා විඤ්ඤූහි දෙසිතා,
විඤ්ඤිස්සන්ති මහානාගා නාගං නාගෙන දෙසිතං.

704. වීතරාගො වීතදොසො වීතමොහො අනාසවො,
සරීරං විජහං නාගො පරිනිබ්බිස්සත්‍යනාසවො' ති.

ඉත්ථං සුදං ආයස්මා උදායී ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**උදායිත්ථෙරගාථා.**

තස්සුද්දානං:

කොණ්ඩඤ්ඤො ච උදායී ච ථෙරා ද්වෙ තෙ මහිද්ධිකා,
සොළසම්හි නිපාතම්හි ගාථායො ද්වෙ ච තිංස චා'ති.

## සොළසනිපාතො නිට්ඨිතො.

699. සංයෝජන යැ කුදුමහත් සියලු කෙලෙස් බැඳුම් යැ යන මොවුන් (මාර්‍ගඥානයෙන්) සිඳැ යම් යම් මැ දිශායෙකින් යේ නම් අපෙක්‍ෂා රහිත වැ මැ යේ.

700. යම්සේ දියෙහි උපන්නා වූ සුවඳැති මනරම් පඹර (හෙලපියුම) දියෙහි වැඩේ ද දියෙන් නො තැවරේ ද,

701. එසේ මැ ලෝකයෙහි උපන් සම්බුදු තෙමේ ලෝකයෙහි වෙසෙයි. දියෙන් පියුම යම්සේ නම් එසේ මැ ලෝකය විසින් නො තැවැරේ.

702. ඇවිලගත් මහගින්න නිරාහාර වූයේ (දර නැත්තේ) සන්හිඳේ. අඟුරු ඇති කල්හි දු නිවුණේ යැ යි කියනු ලැබේ.

703. මේ වනාහි නුවණැතියන් විසින් දෙසනලද අර්‍ථප්‍රකාශක උපමා-වකි. මහානාගයෝ (ක්‍ෂීණාශ්‍රවයෝ) නාගයා (මා) විසින් දෙසනලද නාගයා හඳුනත්.

704. පහ වූ රාගය ඇති, පහ වූ ද්වෙෂය ඇති, පහ වූ මොහය ඇති (සඋපාදිශෙෂ නිර්‍වාණයෙන්) නිරාස්‍රව වූ බුද්ධනාග තෙමේ ශරීරය හරිමින් (ඛන්‍ධපරිනිබ්බානයෙන්) පිරිනිවෙන්නේ යි.

මෙසේ ආයුෂ්මත් උදායි ස්ථවිරයන් වහන්සේ ...

**උදායි ස්ථවිරගාථා යි.**

උද්දානය:

සොළොස් වැනි නිපාතයෙහි කොණ්ඩඤ්ඤ ද උදායි දැයි මහත් සෘද්ධි ඇති ඒ තෙරවරු දෙදෙනෙකි. ගාථා ද දෙතිසෙකි.

## සොළසනිපාතය නිමි.

# 20. වීසතිනිපාතො.

### 20. 1. 1

705. යඤ්ඤත්ථං වා ධනත්ථං වා යෙ හනාම මයං පුරෙ,
අවසෙ තං භයං හොති වෙධන්ති විලපන්ති ච.

706. තස්ස තෙ නත්ථි භීතත්තං භිය්‍යො වණ්ණො පසීදති,
කස්මා න පරිදෙවෙසි එවරූපෙ මහබ්භයෙ.

707. නත්ථි චෙතසිකං දුක්ඛං අනපෙක්ඛස්ස ගාමණි,
අතික්කන්තා භයා සබ්බෙ ඛීණසංයොජනස්ස වෙ.

708. ඛීණාය භවනෙත්තියා දිට්ඨෙ ධම්මෙ යථාතථෙ,
න භයං මරණෙ හොති භාරනික්ඛෙපනෙ යථා.

709 සුචිණ්ණං බ්‍රහ්මචරියං මෙ මග්ගො චාපි සුභාවිතො,
මරණෙ මෙ භයං නත්ථි රොගානමිව සඞ්ඛයෙ.

710. සුචිණ්ණං බ්‍රහ්මචරියං මෙ මග්ගො චාපි සුභාවිතො,
නිරස්සාදා භවා දිට්ඨා විසං පිත්වාව[1] ඡඩ්ඩිතං.

711. පාරගූ අනුපාදානො කතකිච්චො අනාසවො,
තුට්ඨො ආයුක්ඛයා හොති මුත්තො ආඝාතනා යථා.

712. උත්තමං ධම්මතං පත්තො සබ්බලොකෙ අනත්ථිකො,
ආදිත්තාව ඝරා මුත්තො මරණස්මිං න සොචති.

713. යදත්ථි සඞ්ගතං කිඤ්චි භවො වා[2] යත්ථ ලබ්භති,
සබ්බං අනිස්සරං එතං ඉති වුත්තං මහෙසිනා.

714. යො තං තථා පජානාති යථා බුද්ධෙන දෙසිතං,
න ගණ්හාති භවං කිඤ්චි සුතත්තංව අයොගුළං.

715. න මෙ හොති අහොසින්ති භවිස්සන්ති න හොති මෙ,
සඞ්ඛාරා විගමිස්සන්ති තත්ථ කා පරිදෙවනා.

716. සුද්ධං ධම්මසමුප්පාදං සුද්ධං සඞ්ඛාරසන්තතිං,
පස්සන්තස්ස යථාභූතං න භයං හොති ගාමණි.

717. තිණකට්ඨසමං ලොකං යදා පඤ්ඤාය පස්සති,
මමත්තං සො අසංවින්දං 'නත්ථි මෙ'ති න සොචති.

---

1. පිත්වාන - PTS. 2. ච - PTS.

# 20. විසතිනිපාතය.

## 20. 1. 1

705. පෙර අපි කිලියම් පිණිස හෝ ධනය පිණිස හෝ යම් කෙනකුන් අවස කොට නැසුවමෝ නම් ඔවුනට බිය උපන. එහෙයින් ඔහු වෙවුළුහ. වැලපුණහ.

706. ඒ තොපට බිය බවෙක් නැත. සිරුරු පැහැය බෙහෙවින් පැහැපත් යැ. මෙබඳු මහබිය ඇති කල්හි කවර හෙයින් නො වැලපෙහි ද?

707. ගාමණීය, අපේක්ෂා රහිතයාහට මානසික දුඃඛයෙක් නැත ක්ෂය වූ සංයෝජන ඇතියහු විසින් ඒකාන්තයෙන් සියලු භය ඉක්මවනලදහ.

708. ක්ෂීණ වූ භවනෙත්තිය (තෘෂ්ණාව) ඇති කල්හි ඇති සැටියෙන් දක්නාලද සිව්සස්දම් ඇති කල්හි බර බහා තැබූ කල්හි යම්සේ ද එසේ මරණයෙහි බිය නූපදී.

709. මා විසින් බඹසර මොනවට හසළේ යැ. මාර්ගය ද මොනවට වඩනලද යැ, රෝගයන්ගේ ක්ෂයයෙහි මෙන් මට මරණයෙහි බියෙක් නැති.

710. මා විසින් බඹසර මොනවට හසළේ යැ, මාර්ගය ද මොනවට වඩනලද යැ. ආස්වාද රහිත භවයෝ දක්නාලදහ. (මේ මරණය) විෂ පානය කොට වමාලා වැන්න.

711. (සසර) පරතෙරට ගියා වූ, උපාදන රහිත වූ, කළ කිස ඇති, නිරාස්‍රව (රහත්) තෙමේ දම්ගෙඩියෙන් මිදුණකු මෙන් ආයුඃක්ෂය හේතුයෙන් තුටු වේ.

712. උත්තමධර්මස්වභාවයට (රහත් බවට) පැමිණියේ මුළු ලොව අපේක්ෂා රහිත වැ ගිනිගත් ගෙයින් මිදුණකු සෙයින් මරණයෙහි ශෝක නො කෙරේ.

713. යම්කිසි ප්‍රතීත්‍යසමුත්පන්නයෙක් ඇත් ද, යම් තැනෙකැ භවයෙක් හෝ ලැබේ ද, තෙල සියල්ල අනීශ්වර යැ යි මහර්ෂිහු (බුදුන්) විසින් දෙසන ලදි.

714. බුදුන් විසින් දෙසනලද පරිදි යමෙක් ඒ භවත්‍රය දනී නම් හෙතෙම මැනැවින් තවනලද යවටක් සෙයින් කිසිභවයක් නො ගනී.

715. (පෙර) 'වූයෙමි' සිතෙක් මට නැත, (මතු) 'වන්නෙමි' සිතෙක් මට නැති, සංස්කාරයෝ පහව යෙත්, එහි කවර නම් වැලැපුමෙක් ද?

716. ගාමණීය, හුදු ධර්මසමුත්පාදය හුදු සංස්කාර ප්‍රබන්ධය ඇති සැටියෙන් දක්නාහට බියෙක් නූපදී.

717. යමෙක් යම් කලෙකැ තෘණකාෂ්ඨසම වූ (සංස්කාර) ලොකය ප්‍රඥායෙන් දකී ද හෙතෙම මමත්වය නො ලබන්නේ 'මට නැතැ' යි නො සෝවී.

718. උක්කණ්ඨාමි සරීරෙන භවෙනම්හි අනත්ථිකො,
සො'යං භිජ්ජිස්සති කායො අඤ්ඤො ච න භවිස්සති.

719. යං වො කිච්චං සරීරෙන තං කරොථ යදිච්ඡථ,
න මෙ තප්පච්චයා තත්ථ දොසො පෙමං ච හොහිති.

720 තස්ස තං වචනං සුත්වා අබ්භුතං ලොමහංසනං,
සත්ථානි නික්ඛිපිත්වාන මාණවා එතදබ්‍රවුං.

721. කිං භද්දන්තෙ[1] කරිත්වාන කො වා ආචරියො තව,
කස්ස සාසනමාගම්ම ලබ්භතෙ තං අසොකතා.

722. සබ්බඤ්ඤූ සබ්බදස්සාවී ජිනො ආචරියො මම,
මහාකාරුණිකො සත්ථා සබ්බලොකතිකිච්ඡකො.

723. තෙනායං දෙසිතො ධම්මො ඛයගාමී අනුත්තරො,
තස්ස සාසනමාගම්ම ලබ්භතෙ තං අසොකතා.

724. සුත්වාන චොරා ඉසිනො සුභාසිතං,
නික්ඛිප්ප සත්ථානි ච ආවුධානි ච
තම්හා ච කම්මා විරමිංසු එකෙ
එකෙ පබ්බජ්ජ මරොචයිංසු.

725. තෙ පබ්බජිත්වා සුගතස්ස සාසනෙ
භාවෙත්ව බොජ්ඣඞ්ගබලානි පණ්ඩිතා
උදග්ගචිත්තා සුමනා කතින්ද්‍රියා
ඵුසිංසු නිබ්බානපදං අසඞ්ඛත'න්ති.

ඉත්ථං සුදං ආයස්මා අධිමුත්තො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

අධිමුත්තථෙරගාථා.

20. 1. 2

726. සමණස්ස අහු චින්තා පාරාසරියස්ස[2] භික්ඛුනො,
එකකස්ස නිසින්නස්ස පවිවිත්තස්ස ඣායිනො.

727. කිමානුපුබ්බං පුරිසො කිං වතං[3] කිං සමාචරං,
අත්තනො කිච්චකාරිස්ස න ච කිඤ්චි විහෙඨයෙ.

728. ඉන්ද්‍රියානි මනුස්සානං හිතාය අහිතාය ච,
අරක්ඛිතානි අහිතාය රක්ඛිතානි හිතාය ච.

729. ඉන්ද්‍රියානෙව සාරක්ඛං ඉන්ද්‍රියානි ච ගොපයං,
අත්තනො කිච්චකාරිස්ස න ච කිඤ්චි විහෙඨයෙ.

730. චක්ඛුන්ද්‍රියං චෙ රූපෙසු ගච්ඡන්තං අනිවාරයං,
අනාදීනවදස්සාවී සො දුක්ඛා න හි මුච්චති.

---

1. විභවිස්සන්ති - PTS.
2. පාරාපරියස්ස - සීමු .1,2 3. වත්තං - ස්‍යා.

718. (මම) සිරුරින් උකටලී වෙමි, භවයෙන් අර්ථයක් නැතියෙමි. මේ කය බිඳෙයි. අනෙක් කයෙක් නො වන්නේ යි.

719. සිරුරින් තොපට යම් කිසෙක් ඇත් ද ඉදින් කැමැත්තහු නම් එය කරවු, ඒ හේතුයෙන් මට එහි ද්වේෂයෙක් හෝ ප්‍රේමයෙක් හෝ නො වන්නේ යි.

720. උන්වහන්සේගේ ඒ අද්භූත වූ ලොමුදැහගන්වන වචනය අසා සොරු ආයුධ බහා තබා මෙය කීහු,

721. වහන්ස, ඔබ ගේ ආචාර්ය්‍ය තෙමේ කවරෙක් හෝ වේ ද කුමක් හෝ කොට කවරකු ගේ හෝ අවවාද ලැබැ ඒ අශොකත්‍වය ලැබේ දැ? යි.

722. සර්‍වඥ වූ සර්‍වදර්ශී වූ මහා කාරුණික වූ ශාස්තෘ වූ ජගද්වෛද්‍ය වූ ජින තෙමේ මාගේ ආචාර්ය්‍ය තෙමේ යි.

723. උන්වහන්සේ විසින් මේ නිර්‍වාණගාමී වූ නිරුත්තර වූ ධර්‍මය දේශිත යැ, උන් වහන්සේගේ අවවාදය ලැබැ ඒ අශොකත්‍වය ලැබේ' යි. (කීහ.)

724. සොරු ඍෂිහුගේ සුභාෂිතය අසා ශස්ත්‍රයන් ද ආයුධයන් ද බහා තබා ඇතැම් කෙනෙක් ඒ සොරකමින් වැලකුණහ. ඇතැම් කෙනෙක් පැවිද්ද බැබැලවූහ (පැවිදි වූහ).

725. ඔහු සුගත් සසුන්හි පැවිදි වැ නුවණැති වැ බොධ්‍යඞ්ග - බල ධර්‍මයන් වඩා ඔද වැඩිසිත් ඇති වැ සොම්නස් වැ වඩනලද ඉන්ද්‍රියයන් ඇති වැ අසංස්කෘත වූ නිර්‍වාණපදය පැහැසැ ගත්හ'යි.

මෙසේ ආයුෂමත් අධිමුත්ත ස්ථවිරයන් වහන්සේ ...

අධිමුත්ත ස්ථවිරගාථා යි.

## 20. 1. 2

726. එකලා වැ හුන්නා වූ පවිවේකය ඇති ධ්‍යාන කරනසුලු වූ ශ්‍රමණ වූ පාරාපරිය නම් වූ භික්‍ෂුහට සිතිවිල්ලෙක් උපනි.

727. මිනිසා කවර පිළිවෙතක් කවර ශීලයක් ඇසුරු කරන්නේ තමා ගේ කටයුතු කරනසුලු වන්නේ ද කිසිවකු නො පෙලන්නේත් වේ දැ'යි.

728. ඉන්ද්‍රියයෝ මිනිසුන්ට හිත පිණිස ද අහිත පිණිස ද පවතිත්, නොරක්නාලදහු අහිත පිණිසත් රක්නාලදහු හිත පිණිසත් පවතිත්.

729. ඉන්ද්‍රියයන් මැ මැනැවින් රක්නේත් ඉන්ද්‍රියයන් මැ ගෝපනය කරන්නේත් තමාගේ කටයුතු කරනසුලු වෙයි, හෙතෙම කිසිවකු නො පෙලන්නේත් වේ.

730. ඉදින් (යමෙක්) රූ අරමුණු කරා යන්නා වූ චක්‍ෂුරින්ද්‍රියය නො වලකන්නේ ආදීනව නො දක්නාසුලු වේ නම් හෙතෙම දුකින් නො මැ මිදේ.

731. සොතංපියං චෙ[1] සද්දෙසු ගච්ඡන්තං අනිවාරයං,
අනාදීනවදස්සාවී සො දුක්ඛා න හි මුච්චති.

732. අනිස්සරණදස්සාවී ගන්ධෙ චෙ පටිසෙවති,
න සො මුච්චති දුක්ඛම්හා ගන්ධෙසු අධිමුච්ඡිතො.

733. අම්බිලං මධුරග්ගං ච තිත්තකග්ගමනුස්සරං,
රසතණ්හාය ගථිතො හදයං නාවබුජ්ඣති.

734. සුභාන්‍යප්පටිකූලානි ඵොට්ඨබ්බානි අනුස්සරං,
රත්තො රගාධිකරණං විවිධං වින්දතෙ දුඛං.

735. මනං චෙතෙහි ධම්මෙහි යො න සක්කොති රක්ඛිතුං,
තතො නං දුක්ඛමන්වෙති සබ්බෙහෙතෙහි පඤ්චහි.

736. පුබ්බලොහිතසම්පුණ්ණං බහුස්ස කුණපස්ස ච,
නරවීරකතං වග්ගුං[2] සමුග්ගමිව චිත්තිතං.

737. කටුකං මධුරස්සාදං පියනිබන්ධනං දුඛං[3],
ඛුරංච මධුනා ලිත්තං උල්ලිහං[4] නාවබුජ්ඣති.

738. ඉත්ථිරූපෙ ඉත්ථිසරෙ[5] ඵොට්ඨබ්බෙ'පි ඉත්ථියා,
ඉත්ථිගන්ධෙසු සාරත්තො විවිධං වින්දතෙ දුඛං.

739. ඉත්ථිසොතානි සබ්බානි සන්දන්ති පඤ්ච පඤ්චසු,
තෙසමාවරණං කාතුං සො සක්කොති විරියවා.

740. සො අත්ථවා සො ධම්මට්ඨො සො දක්ඛො සො විචක්ඛණො,
කරෙය්‍ය රමමානො පි[6] කිච්චං ධම්මත්ථසංහිතං.

741. අථො සීදති සඤ්ඤුත්තං වජ්ජෙ කිච්චං නිරත්ථකං,
න තං කිච්චන්ති මඤ්ඤිත්වා අප්පමත්තො විචක්ඛණො.

742 යං ච අත්ථෙන සඤ්ඤුත්තං යා ච ධම්මගතා රති,
තං සමාදය වත්තෙථ සා හි වෙ උත්තමා රති.

743. උච්චාවචෙහුපායෙහි
පරෙසමභිජිගීසති,
හන්ත්වා වධිත්වා අථ සොචයිත්වා,
ආලොපති සාහසා යො පරෙසං

744. තච්ඡන්තො ආණියා ආණිං නිහන්ති බලවා යථා
ඉන්ද්‍රියානින්ද්‍රියෙහෙව නිහන්ති කුසලො[7] තථා.

---

1. ච - PTS. 2. වග්ගු - සීමු. 1, 2 3. දුක්ඛං පියනිබන්ධනං - සීමු. 1, 2
4 උල්ලිත්තං - PTS 5. ඉත්ථිරසෙ - PTS. 6. රමමානො හි - PTS.
7. කුසලා - PTS

731. ඉඳින් සද අරමුණු කෙරෙහි යත්නා වූ ශ්‍රොත්‍රෙන්ද්‍රියය නො වළහන්නේ ආදීනව නො දක්නාසුලු වේ නම් හෙතෙම දුකින් නො මැ මිදේ.

732. ඉඳින් නිස්සරණය නො දක්නාසුලු වැ ගන්ධාරම්මණය සෙවුනේ නම් ගන්ධාරම්මණයෙහි මුසපත් වූ හෙතෙම දුකින් නො මිදේ.

733. ඇඹුල යැ මිහිර යැ තිත්ත යැ යන රසයන් සිහි කෙරෙමින් රසතෘෂ්ණායෙහි ගිජු වූයේ (පැවිද්දෙහි උපන්) සිත අවබොධ නො කෙරේ.

734. අනුකූල වූ ශුභස්පර්ශයන් සිහි කෙරෙමින් (එහි) ඇලුණේ රාග හෙතු වූ නොයෙක් දුක් විඳී.

735. ඉඳින් යමෙක් මේ (රූපාදි) අරමුණු කෙරෙන් සිත රක්නට නො සමත් වේ නම් එහෙයින් මේ සියලු පඤ්චාරම්මණයන් කරණ කොට ගෙන දුක ඔහු ලුහුබඳී.

736. සමර්ථශිල්පියකු විසින් සාදනලද, විසිතුරු කරනලද, පූය හා ලෙහෙයෙන් පිරුණු බොහෝ කුණපයෙන් ද පිරුණු මනරම් සුඹුගක් (බදුනක්) වැනි වූ,

737. කටුක වූ (එහෙත්) මධුරාස්වාද ඇත්තා වූ, දුක් වූ (එහෙත්) ප්‍රිය ස්වරූප ඇත්තා වූ මිහියෙන් තවරනලද කරයක් ලොවිනා එකකු සෙයින් (සිරුර පහසනුයේ දුක) අවබොධ නො කෙරේ.

738. මාගම්රූහි ද මාගම්සදෙහි ද මාගමගේ පහසෙහි ද මාගම් ගඳෙහි ද ඇලුණේ නො යෙක් දුක් විඳී.

739. මාගමගේ (රූපාරම්මණාදි) පස්වැදෑරුම් වූ සියලු ශ්‍රොතස්හු (නදීහු) (පුරුෂයාගේ) පඤ්චද්වාරයෙහි ගලා යත්, ඔවුන් අවුරන්නට වීර්‍ය්‍ය ඇති යමෙක් සමර්ථ වේ නම්,

740. හෙතෙම අර්ථවත් යැ, හෙතෙම ධර්මස්ථ යැ, හෙතෙම දක්ෂ යැ, හෙතෙම විචක්ෂණ යැ, හෙතෙම (ගෘහරතියෙන්) රමණය කරන්නේ නමුදු ධර්මාර්ථයෙන් යුත් කෘත්‍යයක් මැ කරන්නේ යි.

741. වැළින් (ඓහිකාර්ථයෙන්) යුක්ත වූ (පාරත්‍රිකාර්ථ රහිත බැවින්) නිරර්ථක වූ කෘත්‍යය නො කර යි, අප්‍රමාද (ස්මෘතිමත්) වූ නුවණැත්තේ 'එය නො කටයුතු යැ යි දැන හරනේ යි.

742. අර්ථසංහිත වූ යම් කෘත්‍යයෙකුත් වේ ද අධිකුශලධර්මගත වූ යම් රතියකුත් වේ ද එය සමාදන් වැ (මැනැවින් ගෙන) පවත්නේ යැ, එකාන්තෙන් ඒ උතුම් රතිය යි.

743. යමෙක් කුඩමහත් උපායයන් ගෙන් අන්සතු දය දිනනු කැමැති වේ ද හෙතෙම (අනුන්) නසා, පෙළා නොහොත් ශොක කරවා සැහැසි කමින් අන්සතු දය වොලොගනි (පැහැරගනී).

744. යම්සේ (කයින් නුවණින්) සවි ඇති වඩුවෙක් ඇණයෙන් කොටමින් (දවයෙහි සිටි) ඇණය බැහැර කෙරේ නම් එපරිද්දෙන් සමත් මහණ තෙම ඉඳුරන් කරණ කොට ගෙන මැ ඉඳුරන් බැහැර කෙරේ.

745. සද්ධං විරියං සමාධිං ච සතිං පඤ්ඤඤ්ච[1] භාවයං,
පඤ්ච පඤ්චහි හන්ත්වාන අනීඝො යාති බ්‍රාහ්මණො.

746. සො අත්ථවා සො ධම්මට්ඨො කත්වා වාක්‍යානුසාසනිං,
සබ්බෙන සබ්බං බුද්ධස්ස සො නරො සුඛමෙධතී'ති.

ඉත්ථං සුදං ආයස්මා පරාසරියො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**පාරාසරියථෙරගාථා.**

**20. 1. 3**

747. චිරරත්තං වතාතාපී ධම්මං අනුවිචින්තයං,
සමං චිත්තස්ස නාලත්ථං පුච්ඡං සමණබ්‍රාහ්මණෙ.

748. කො සො පාරඞ්ගතො ලොකෙ කො පත්තො අමතොගධං,
කස්ස ධම්මං පටිච්ඡාමි පරමත්ථවිජානනං.

749. අන්තොවඞ්කගතො ආසි[2] මච්ඡොව ඝසමාමිසං,
බද්ධො[3] මහින්දපාසෙන වෙපචිත්‍යසුරො යථා.

750. අඤ්ඡාමි[4] නං න මුඤ්චාමි අස්මා සොකපරිද්දවා,
කො මෙ බන්ධං මුඤ්චං ලොකෙ සම්බොධිං වෙදයිස්සති.

751. සමණං බ්‍රාහ්මණං වා කං ආදිසන්තං පභඞ්ගුනං,
කස්ස ධම්මං පටිච්ඡාමි ජරාමච්චුපවාහනං.

752. විචිකිච්ඡාකඞ්ඛාගථිතං[5] සාරම්භබලසඤ්ඤුතං,
කොධප්පත්තමනත්ථද්ධං අභිජප්පප්පදාරණං.[6]

753. තණ්හාධනුසමුට්ඨානං ද්වෙ ච පන්නරසායුතං,
පස්ස ඕරසිකං බාළ්හං[7] හෙත්වාන යදි තිට්ඨති.

754. අනුදිට්ඨීනං අප්පහානං සඞ්කප්පපරතෙජිතං,[8]
තෙන විද්ධො පවෙධාමි පත්තං'ව මාලුතෙරිතං.

755. අජ්ඣත්තං මෙ සමුට්ඨාය ඛිප්පං පච්චති මාමකං,[9]
ඡඵස්සායතනී කායො යත්ථ සරති සබ්බදා.

756. තං න පස්සාමි තෙකිච්ඡං යො මෙතං සල්ලමුද්ධරෙ,
නානාරජ්ජෙන සත්ථෙන නාඤ්ඤෙන විචිකිච්ඡිතං.

---

1. සතිපඤ්ඤං'ච - PTS 2. අසිං - PTS. 3. බන්ධො - ම
4. අඤ්චාමි - PTS. 5. විචිකිච්ඡාකඞ්ඛාගන්ථිතං - ම 6. අභිජප්පදාරණං -PTS.
7. බාලං - සයා, PTS. 8 සරතෙජිතං - PTS. 9. පාපකං - සයා.

745. ශ්‍රද්ධාවත් වීර්‍ය්‍යයත් සමාධියත් සමෘතියත් ප්‍රඥාවත් වඩන්නා වූ (බාහිත පාපී) බ්‍රාහ්මණ තෙම පසිඳුරන්ගෙන් පසිඳුරන් නසා නිදුක් වැ (නිවනට) යේ.

746. හෙතෙම් තමහට වැඩ ඇත්තේ යැ, හෙතෙම බුදුන්ගේ අවවාද වාක්‍යය සියල්ලෙන් සියල්ල කොට (පිළිපැද) ධර්‍මයෙහි සිටියේ යැ, එ (උතුම්) පුරුෂ තෙම (නිවන් සුව) වඩා' යි.

මෙසේ ආයුෂ්මත් 'පාරාසරිය' ස්ථවිරයන් වහන්සේ ...

පාරාසරිය ස්ථවිරගාථා යි.

## 20. 1. 3

747. දිගුකලක් මුළුල්ලෙහි වීර්‍ය්‍ය ඇත්තෙම් විමොක්‍ෂධර්‍මය සොයන්නෙම්, මහණ බමුණන් විචාරන්නෙම් චිත්තයාගේ ව්‍යුපශමය වූ ආර්‍ය්‍යධර්‍මය නො ලදිමි.

748. යමෙක් ලොවැ පරතෙරට ගියේ නම් හේ කවරේ ද? කවරෙක් නිර්‍වාණ නැමැති ප්‍රතිෂ්ඨාවට පැමිණියේ ද? කවරක්හුගේ පරමාර්‍ථාව බොධන ධර්‍මය පිළිගනිම් ද?

749. බිලිය ගිලි මසකු මෙන් ඇතුළත (හෘදයයෙහි) වඞ්කගතයෙක් වීමි. මහෙන්ද්‍ර (ශක්‍ර) පාශයෙන් 'වේපචිත්ති' අසුරයා මෙන් (මම) කෙලශපාශයෙන් බැඳුණෙමි.

750. (මම) එය (කෙලශපාශය) අදිමි. (එතෙකුදුවත්) මේ ශොකපරිදෙවයෙන් නො මිදෙමි. ලෝකයෙහි කවරෙක් බන්ධනය මුදමින් මට විමොක්‍ෂමාර්‍ගය ප්‍රකාශ කරන්නේ ද?

751. කෙලෙසුන් නසන්නා වූ දහම් දෙසන කවර මහණකු හෝ බමුණකු හෝ පිණිස්නෙම් (ගිවිස්නෙම්) ද, ජරාමරණ උල්පවා හරනා වූ කවරකුගේ දහම් පිණිස්නෙම් ද?

752. විචිකිච්ඡායෙන් හා සැකයෙන් ගෙතුණු (කරණොත්තරීය කරණ ලක්‍ෂණ) සාරම්භබලයෙන් මොනවට බඳනාලද ක්‍රොධයට පැමිණි සිත් විසින් දැඩි වූ ප්‍රාර්‍ථනා නැමැති විදූරණය ඇති,

753. තෘෂ්ණා නැමැති දුන්නෙන් නැගෙන්නා වූ, (විංශද්වස්තුක සත්කායදෘෂ්ටි දශවස්තුක මිථ්‍යාදෘෂ්ටි විසින්) තිසක් පමණ වූ දෘෂ්ටිශල්‍යය ළය දැඩි වැ පළාගෙන ළයෙහි මැ සිටී. (එය) බලව.

754. සෙසු දෘෂ්ටීන්ගේ අප්‍රහාණ කාරණය වූ මිථ්‍යා විතර්‍ක විසින් අන්‍යයන් උත්සාහවත් කරනලද්දා වූ (යම් සත්කායදෘෂ්ටිශල්‍යයෙක් ඇද්ද) එයින් විදුනාලද්දෙම් පවනින් සොලවනලද පත්‍රයක් මෙන් අතිශයින් වෙවුලමි.

755. සවැදෑරුම් ස්පර්‍ශායතනය මාගේ ආත්මභාවයෙහි නැගී මා සතු ආත්මභාවය ශුහු වැ දවයි, හේ යම් තැනෙක උපන්නේ නම් එහි හැම කල්හි හැසිරේ (පවතී).

756. යමෙක් එෂණීශලාකායෙන් හෝ සැතින් හෝ අන්‍ය මන්ත්‍රාගදයකින් හෝ පිළියම් නො කළහැකි මාගේ ඒ ශල්‍යය උදුරා නම් ඒ සැත් වෙදහු නො දක්මි.

757. කො මෙ අසත්ථො අවණො සල්ලමබ්භන්තරපස්සයං,
අහිංසං සබ්බගත්තානි සල්ලං මෙ උද්ධරිස්සති.

758. ධම්මප්පති හි සො සෙට්ඨො විසදොසප්පවාහකො,
ගම්භීරෙ පතිතස්ස මෙ ථලං පාණිං ච[1] දස්සයෙ.

759. රහදෙ'හමස්මි ඔගාළ්හො අහාරියරජමත්තිකෙ,[2]
මායාඋසූයසාරම්භ[3] ථිනමිද්ධපත්ථටෙ.

760. උද්ධච්චමෙඝථනිතං සංයොජනවලාහකං,
වාහා වහන්ති දුද්දිට්ඨිං[4] සඞ්කප්පා රාගනිස්සිතා.

761. සවන්ති සබ්බධි සොතා ලතා උබ්භිජ්ජ තිට්ඨති,
තෙ සොතෙ කො නිවාරෙය්‍ය තං ලතං කො හි ඡෙච්ඡති.

762. වෙලං කරොථ භද්දන්තෙ සොතානං සන්නිවාරණං,
මා තෙ මනොමයො සොතො රුක්ඛං'ව සහසා ලුවෙ.

763. එවං මෙ භයජාතස්ස අපාරා පාරමෙසතො,
තාණො පඤ්ඤාවුධො සත්ථා ඉසිසඞ්ඝනිසෙවිතො.

764. සොපාණං සුකතං සුද්ධං ධම්මසාරමයං දළං,[5]
පාදාසි වුය්හමානස්ස 'මා භායී'ති ච අබ්‍රවී.[6]

765. සතිපට්ඨානපාසාදං ආරුය්හ පච්චවෙක්ඛිසං,
යං තං පුබ්බෙ අමඤ්ඤිස්සං සක්කායාභිරතං පජං.

766. යදා ච මග්ගමද්දක්ඛිං නාවාය අභිරූහනං,
අනධිට්ඨාය අත්තානං තිත්ථමද්දක්ඛිමුත්තමං.

767. සල්ලං අත්තසමුට්ඨානං භවනෙත්තිපභාවිතං,[7]
එතෙසං අප්පවත්තාය දෙසෙසි මග්ගමුත්තමං.

768. දීඝරත්තානුසයිතං චිරරත්තමධිට්ඨිතං,[8]
බුද්ධො මෙ පානුදී ගන්ථං[9] විසදොසප්පවාහනො'ති.

ඉත්ථං සුදං ආයස්මා තෙලකානි ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

තෙලකානිත්ථෙරගාථා.

1. පාණිච - සයා, PTS. 2. අහාරියරජමත්තිකෙ - PTS.
3. මායාඋසූයසාරම්භ - PTS. 4. කුදිට්ඨිං - ප. 5. දළ්හං - PTS
6. අබ්‍රවි - PTS. 7. භවනෙත්තිප්පභාවිතං - සීමු. 1, 2.
8. චිරරත්තපතිට්ඨිතං - PTS. 9. ගණ්ඨං - PTS.

757. කවරෙක් සැත් නැති වැ වණ රහිත වැ කිසි අවයවයක් නො පෙළමින් මාගේ හෘදය ඇසිරි කොට ඇති (දෘෂ්ටි-කෙලශ) ශල්‍යය උදුරන්නේ ද?

758. (යමෙක්) ගැඹුරෙහි වැටුණු මට නිර්වාණ ස්ථලයත් මාගී හස්තයත් ඇරැපවී නම් ධර්මහේතුවින් විෂදෝෂයත් සිඳුනා වූ හෙතෙම ශ්‍රෙෂ්ඨ යි.

759. මම ඉවත් කල නො හැකි වූ රාගාදි රජස් මැටි ඇති මාය උසූයා, සාරම්භ, ථිනමිද්ධ යන මොවුන් පැතිර ඇති ජලාශයෙකැ ගිලුණෙම් වෙමි.

760. ඖද්ධත්‍ය නැමැති මේඝගර්ජනා ඇති සංයෝජන නැමැති වලාහක ඇති රාගනිශ්‍රිත සංකල්ප නැමැති ප්‍රවාහයෝ මිසදිටු මා අපාය නැමැති සමුද්‍රයට ගෙනයත්.

761. තෘෂ්ණාදි ශ්‍රොතස්හු රූපාරම්මණාදි සියලු තැන්හි ගලා යෙත්. තෘෂ්ණා ලතාව හැප්සැ සිටී, ඒ ශ්‍රොතසුන් කවරෙක් වළහන්නේ ද? ඒ ලතාව කවරෙක් සිඳලන්නේ ද?

762. වහන්ස! ශ්‍රොතසුන් අවුරන හෙයක් (වේල්ලක්) කරවු, තොපගේ මනොමය ශ්‍රොතස රැකක් මෙන් (තොප) ලාහෙලා නො සිඳිවා (නො හෙලාවා:)

763. මෙසේ භටගත් බිය ඇත්තා වූ මෙතෙරින් (සසරින්) එතෙර (නිවන) සොයන්නා වූ මට ආරක්‍ෂක වූ සෘෂිසමූහයා විසින් සෙවුනා ලද, ප්‍රඥ නැමැති ආයුධ ඇති ශාස්තෘන් වහන්සේ,

764. මොනවට කරනලද ශුද්ධ වූ ධර්මසාරමය වූ දෘඪ වූ සොපානයක් දුන්හ, (දියෙහි) පාවී යන්නා වූ මට 'නාහමක් බව'යි ද වදාළහ.

765. සිවටන් පහයට නැගැ ප්‍රත්‍යවෙක්‍ෂා කෙළෙමි. සත්කායයෙහි ඇලුණු යම් ඒ ප්‍රජාවක් පෙර (අඥන බැවින් සාරත්වයෙන්) සිතුයෙම් නම්,

766. (ඒ මම) වැළිඳු යම් කලෙකැ නැවට නැගෙන මඟ දුටුයෙම් නම්, එකල්හි ආත්මයෙහි නො ස්ට උත්කෘෂ්ට වූ තීර්ථය දිටිමි.

767. කෙලශ ශල්‍යය සන්තානයෙහි නැඟුණේ යැ, භවතෘෂ්ණාව විසින් පහළ කරනලද්දේ යැ, මොවුන්ගේ නො පැවැත්ම පිණිස උතුම් මඟ (ශාස්තෘන් වහන්සේ) දෙසූහ.

768. කෙලශවිෂදෝෂයන් සිඳුනා සර්ඥ තෙම දිගුකලක් අනුශය වැ පැවැති, බොහෝ කලක් සන්තානාරූඪ වැ සිටි, මාගේ (අභිධ්‍යා-කායග්‍රන්ථාදි) ග්‍රන්ථය පහ කෙළේ යි.

මෙසේ ආයුෂ්මත් තෙලකානි ස්ථවිරයන් වහන්සේ ...

තෙලකානි ස්ථවිරගාථා යි.

## 20. 1. 4

769. පස්ස චිත්තකතං[1] බිම්බං අරුකායං සමුස්සිතං,
ආතුරං බහුසඞ්කප්පං යස්ස නත්ථි ධුවං ඨිති.

770. පස්ස චිත්තකතං[1] රූපං මණිනා කුණ්ඩලෙන ච,
අට්ඨිං තචෙන[2] ඔනද්ධං සහ වත්ථෙහි සොභති.

771. අලත්තකකතා පාදා මුඛං චුණ්ණකමක්ඛිතං,
අලං බාලස්ස මොහාය නො ච පාරගවෙසිනො.

772. අට්ඨපාදකතා[3] කෙසා නෙත්තා අඤ්ජනමක්ඛිතා,
අලං බාලස්ස මොහාය නො ච පාරගවෙසිනො.

773. අඤ්ජනීව නවා චිත්තා පූතිකායො අලඞ්කතො,
අලං බාලස්ස මොහාය නො ච පාරගවෙසිනො.

774. ඔදහි මිගවො පාසං නාසදා වාගුරං[4] මිගො,
භුත්වා නිවාපං ගච්ඡාම කන්දන්තෙ මිගබන්ධකෙ.

775. ඡින්නො පාසො[5] මිගවස්ස නාසදා වාගුරං[4] මිගො,
භුත්වා නිවාපං ගච්ඡාම සොචන්තෙ මිගලුද්දකෙ.

776. පස්සාමි ලොකෙ සධනෙ මනුස්සෙ
ලද්ධාන විත්තං න දදන්ති මොහා,
ලුද්ධා[6] ධනං සන්නිචයං කරොන්ති
භිය්‍යො ච කාමෙ අභිපත්ථයන්ති.

777 රාජා පසය්හ පථවිං විජෙත්වා
සසාගරන්තං මහිමාවසන්තො,
ඔරං සමුද්දස්ස අතිත්තරූපො
පාරං සමුද්දස්ස'පි පත්ථයෙථ.

778 රාජා ච අඤ්ඤෙ ච බහූ මනුස්සා
අවීතතණ්හා මරණං උපෙන්ති,
ඌනාව හුත්වාන ජහන්ති දෙහං
කාමෙහි ලොකම්හි න හත්ථි තිත්ති.

779. කන්දන්ති නං ඤාතී පකිරිය කෙසෙ
අහො වතා නො අමරාති චාහු,
වත්ථෙන නං පාරුතං නීහරිත්වා
චිතං සමොධාය තතො ඩහන්ති.

780. සො ඩය්හති සූලෙහි තුජ්ජමානො
එකෙන වත්ථෙන පහාය භොගෙ,
න මීයමානස්ස භවන්ති තාණා
ඤාතී ච මිත්තා අථවා සහායා.

781. දායාදකා තස්ස ධනං හරන්ති
සත්තො පන ගච්ඡති යෙන කම්මං,
න මීයමානං ධනමන්වෙති කිඤ්චි
පුත්තා ච දාරා ච ධනං ච රට්ඨං.

---

1. චිත්තීකතං - සීමු. 1, 2 ප. 2. අට්ඨීතචෙන - PTS.
3. අට්ඨාපදකතා - සතා, PTS. අට්ඨපදකතා - ප. 4. වාකුරං - සතා, PTS.
5. ඡින්නපාසො - සතා PTS. 6. ලද්ධා - සතා.

## 20. 1 4

769. යම් ශරීරයක්හුගේ ධ්‍රැව (නිත්‍ය) ස්ථිතිභාවයක් නැද් ද, වණ වූ ඇටසැකිල්ල විසින් හුවනලද්දා වූ, ගිලන් වූ, බාල ජනයන් විසින් නොයෙක් අයුරින් සංකල්පනය කටයුතු වූ, විසිතුරු කරනලද්දා වූ ඒ සිරුර බලව.

770. සමින් වෙළනලද (තුන්සියක්) ඇට ඇති, මිණියෙතුදු සොබො-ලිනු ද විසිතුරු කරනලද රූපය බලව, වස්ත්‍ර සහිත වැ මැ හොබී.

771. ලාරසින් රඳනාලද පාදයෝ, සුවඳ සුන්නෙන් තවරනලද මූව, බාලයා ගේ සම්මෝහයට පමණා, පාරගවේෂීහු ගේ මෝහයට නො ද පමණී.

772. කිනඹුවැල් ද අඳුන් ඇඳි නෙත් ද බාලයාගේ මෝහයට පමණා, පාරගවේෂීහු ගේ මෝහයට නො ද පමණී.

773. සිතියම් කළ අළුත් අඳුන් කොපුවක් මෙන් සරසනලද කුණුකය බාලයාගේ මෝහයට පමණා, පාරගවේෂීහුගේ මෝහයට නො ද පමණී.

774. මුවවැදි තෙම මලපුඩුව දමාලී යා, මුවා පාශය නො පැහැසී (නො ගැටී) යා, මුවවැද්දා හඬද්දී (ඇපි) ගොදුරු කා යම්හ

775. මුවවැද්දාගේ මලපුඩුව සිඳුණේ යා, මුවා පාශය නො පැහැසී යා, මුවවැද්දා සොවිද්දී (ඇපි) ගොදුරු කා යම්හ.

776. ලෝකයෙහි ධනවත් මිනිසුන් දක්මි, ඔහු ධනය ලැබැ මෝහ හේතුවින් නො දෙත්, ලුබ්ධයෝ ධනය රැස් කෙරෙත්, මතුයෙහි බෙහෙවින් මැ කාමයන් ප්‍රාර්ථනා කෙරෙත්.

777. රජ තෙම බලාත්කාරයෙන් පෘථිවිය දිනාගෙන සයුරු හිම් කොට ඇති පොළොවැ රජය කරන්නේ මුහුදින් මෙතෙරට නො තිත් සෑහැවි ඇතියා වැ මුහුදින් එතෙර ද ප්‍රාර්ථනා කරන්නේ යි

778. රජ තෙමේ ද අනින් බොහෝ මිනිස්සු ද නො පහ වූ තෘෂ්ණා ඇති වැ මරණයට පැමිණෙත්, තුපුන් මනදෙල මැ ඇති වැ සිරුර හැරදමත්, ලෝකයෙහි කාම හේතුවින් තෘප්තියක් නැත් මැ යි.

779. ඥතීහු කෙහෙවලු විසුරුවාගෙන ඔහු ගැන හඬත්, 'අහෝ එකත්නෙත් අප නෑයෝ අමර වේත්ව'යි ද කියත්, ඉක්බිති කඩින් පොරෝනාලද ඔහු ගෙන ගොස් සෑය නඟා දවත්.

780. හෙතෙම භෝගයන් හැරැ එක්වතින් යුතු වැ හුලින් පෙළනු ලැබෙමින් දැවෙයි, මැරෙන්නහුට ඥතීහු ද මිත්‍රයෝ ද නොහොත් සහායකයෝ ද ආරක්ෂක නො වෙත්.

781 දායාදයෝ ඔහුගේ ධනය ගෙන යෙත්. සත්ත්ව තෙම කර්මානු-රූපව වැ යේ, අඹුදරුවෝ යැ ධනය යැ රට යැ යන කිසිවක් මැරෙන්නහු අනු වැ නො ඒ.

782. න දීඝමායුං ලභතෙ ධනෙන
න චා'පි විත්තෙන ජරං විහන්ති,
අප්පං හි තං[1] ජීවිතමාහු ධීරා
අසස්සතං විප්පරිණාමධම්මං.

783. අඩ්ඪා දළිද්දා ච ඵුසන්ති ඵස්සං
බාලො ච ධීරො ච තථෙව ඵුට්ඨො,
බාලො හි බාල්‍යා වධිතො'ව සෙති
ධීරො ච නො වෙධති ඵස්සඵුට්ඨො.

784. තස්මා හි පඤ්ඤා'ව ධනෙන සෙය්‍යා[2]
යාය වොසානමිධාධිගච්ඡති,
අබ්‍යොසිතත්තා[3] හි භවාභවෙසු,
පාපානි කම්මානි කරොති[4] මොහා.

785. උපෙති ගබ්භඤ්ච පරඤ්ච ලොකං
සංසාරමාපජ්ජ පරම්පරාය,
තස්සප්පපඤ්ඤො අභිසද්දහන්තො
උපෙති ගබ්භඤ්ච පරඤ්ච ලොකං.

786. චොරො යථා සන්ධිමුඛෙ ගහීතො
සකම්මුනා හඤ්ඤති පාපධම්මො,
එවං පජා පච්ච[5] පරම්හි ලොකෙ
සකම්මුනා හඤ්ඤති පාපධම්මා.[6]

787. කාමා හි චිත්‍රා මධුරා මනොරමා
විරූපරූපෙන මථෙන්ති චිත්තං,
ආදීනවං කාමගුණෙසු දිස්වා
තස්මා අහං පබ්බජිතොම්හි රාජ.

788 දුමප්ඵලානීව පතන්ති මානවා
දහරා ච වුද්ධා ච සරීරභෙදා,
එතම්පි දිස්වා පබ්බජිතොම්හි රාජ
අපණ්ණකං සාමඤ්ඤමෙව සෙය්‍යො.

789. සද්ධායාහං පබ්බජිතො උපෙතො ජිනසාසනෙ,
අවඤ්ඣා මය්හං පබ්බජ්ජා අනණො භුඤ්ජාමි භොජනං.

790. කාමෙ ආදිත්තතො දිස්වා ජාතරූපානි සත්ථතො,
ගබ්භවොක්කන්තිතො දුක්ඛං නිරයෙසු මහබ්භයං.

791. එතමාදීනවං ඤත්වා සංවෙගං අලභිං තදා,
සො'හං විද්ධො තදා සන්තො සම්පත්තො ආසවක්ඛයං.

792. පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා.

793. යස්සත්ථාය පබ්බජිතො අගාරස්මානගාරියං
සො මෙ අත්ථො අනුප්පත්තො සබ්බසංයොජනක්ඛයො'ති.

ඉත්ථං සුදං ආයස්මා රට්ඨපාලො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

**රට්ඨපාලත්ථෙරගාථා.**

---

1. අප්පඤ්හි තං - සයා, PTS
2. සෙය්‍යො - PTS.
3. අබ්‍යොසිතත්තා - සයා, PTS.
4. කරොන්ති - PTS.
5. පෙච්ච - සීමු. 1, 2. PTS.
6. පාපධම්මො - PTS

782. ධන හේතුවෙන් දීර්ඝායුෂ නො ලැබෙයි. භෝග හේතුවෙන් ජරාව නො නසයි, 'ජීවිතය අල්ප යැ, අශාශ්වත යැ, විපරිණාම ස්වභාව ඇත්තේ යැ'යි ප්‍රාඥයෝ කීහු මැ යි.

783. ධනවත්හු ද දිළින්දෝ ද පහස පහසිත් (ස්පර්ශය ලැබෙත්,) නුවණ මඳ වූයේ ද නුවණැත්තේ ද එසේ මැ පැහැසුණේ (ස්පර්ශ ලද්දේ) වෙයි, බාල තෙම බාල බැවින් පෙළුණේ මැ හෙ වී. පහසින් පැහැසුණු නුවණැත්තේ මැ නො සැලේ.

784. එහෙයින් මැ යමෙකින් මෙලොවැ කෙළවරට යේ නම් ඒ ප්‍රඥාව මැ ධනයට වඩා ශ්‍රේෂ්ඨ යැ, නිෂ්ඨාවට නො පැමිණියේ කුදුමහ භවයන්හි මෝහ හේතුවෙන් පව්කම් කෙරේ.

785. පුනපුනා සසරට පැමිණ ගැබටත් පරලොවටත් එළැඹෙයි, ඔහුගේ පාපක්‍රියා හදහන මඳනුවණැත්තේ ද ගැබටත් පරලොවටත් එළැඹේ.

786. ලාමකගති ඇති සොර තෙම සන්ධිමුඛයෙහි (උමංබිඳුමෙහි) දී බැඳැ ගන්නාලද්දේ සියකැමින් යම්සේ පෙලනුලැබේ ද එසේ මැ පාපධර්මී ඇති ප්‍රජාව පරලොවට පැමිණ ස්වකීය කර්මය විසින් පෙලනුලබ.

787. නරපතිය, යම්හෙයෙකින් කාමයෝ විසිතුරු ද මිහිරි ද මනරම් ද විවිධරූප ස්වභාවයෙන් සිත් අලලත් ද, එහෙයින් මැ මම කාම-ගුණයෙහි ආදීනව දැකැ පැවිදි වූයෙමි.

788. තරුණ වූ ද මහලු වූ ද මිනිස්සු ශරීරභෙද හෙයින් ද්‍රැමඵලයන් (ගස්ගෙඩි) මෙන් ඇද වැටෙත්, මහරජ තෙල කරුණ ද දැකැ පැවිදි වීමි, නිවැරැදි ශ්‍රමණභාවය මැ උත්තරීතර යි.

789. මම සැදැහැයෙන් පැවිදි වීමි, ශාස්තෘශාසනයෙහි පිළිවෙතට එළැඹියෙමි, මා ගේ පැවිද්ද නො වඳ යැ, ණය නැත්තෙම් අහර වළඳමි.

790. කාමයන් ඇවිළගන්නවුන් ලෙසින්, ස්වර්ණවිකෘතීන් ආයුධයන් ලෙසින් දැකැ ගර්භාවක්‍රාන්තියෙහි පවත් දුක් යැ, නිරයෙහි මහත් භය යැ යන,

791. තෙල ආදීනව දැකැ එද සංවේගය ලදිමි, මම එද (ගිහිකල්හි රාගාදිශල්‍යයෙන්) විදුනාලද්දෙම් මැ ආස්‍රවක්‍ෂයට පැමිණියෙමි.

782. මා විසින් ශාස්තෘන් වහන්සේ ඇසුරු කරනලදහ, බුදුන්ගේ අවවාදය කරනලදි, ගුරුබර බහා තබනලද්දේ යැ, තෘෂ්ණාව උදුරනලදු.

793. යම් අර්ථයක් සඳහා ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් ද සියලු සංයෝජනයන් ක්‍ෂය කිරීම වූ ඒ අර්ථය මා විසින් ලබන-ලද්දේ යි.

මෙසේ ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහයි.

**රට්ඨපාල ස්ථවිරගාථා යි.**

### 20. 1. 5

794. රූපං දිස්වා සති මුට්ඨා පියං නිමිත්තං[1] මනසිකරොතො,
සාරත්තචිත්තො වෙදෙති තං ච අජ්ඣොස්ස[2] තිට්ඨති.

795. තස්ස වඩ්ඪන්ති වෙදනා අනෙකා රූපසම්භවා,
අභිජ්ඣා ච විහෙසා ච චිත්තමස්සූපහඤ්ඤති,
එවමාචිනතො දුක්ඛං ආරා නිබ්බානං[3] වුච්චති.

796. සද්දං සුත්වා සති මුට්ඨා පියං නිමිත්තං මනසිකරොතො,
සාරත්තචිත්තො වෙදෙති තං ච අජ්ඣොස්ස[2] තිට්ඨති.

797. තස්ස වඩ්ඪන්ති වෙදනා අනෙකා සද්දසම්භවා,
අභිජ්ඣා ච විහෙසා ච චිත්තමස්සූපහඤ්ඤති,
එවමාචිනතො දුක්ඛං ආරා නිබ්බානං[3] වුච්චති.

798. ගන්ධං ඝත්වා සති මුට්ඨා පියං නිමිත්තං මනසිකරොතො,
සාරත්තචිත්තො වෙදෙති තං ච අජ්ඣොස්ස[2] තිට්ඨති.

799. තස්ස වඩ්ඪන්ති වෙදනා අනෙකා ගන්ධසම්භවා,
අභිජ්ඣා ච විහෙසා ච චිත්තමස්සූපහඤ්ඤති,
එවමාචිනතො දුක්ඛං ආරා නිබ්බානං[3] වුච්චති.

800. රසං භොත්වා සති මුට්ඨා පියං නිමිත්තං මනසිකරොතො,
සාරත්තචිත්තො වෙදෙති තං ච අජ්ඣොස්ස[2] තිට්ඨති.

801. තස්ස වඩ්ඪන්ති වෙදනා අනෙකා රසසම්භවා,
අභිජ්ඣා ච විහෙසා ච චිත්තමස්සූපහඤ්ඤති,
එවමාචිනතො දුක්ඛං ආරා නිබ්බානං[3] වුච්චති.

802. ඵස්සං ඵුස්ස සති මුට්ඨා පියං නිමිත්තං මනසි කරොතො,
සාරත්තචිත්තො වෙදෙති තං ච අජ්ඣොස්ස[2] තිට්ඨති.

803. තස්ස වඩ්ඪන්ති වෙදනා අනෙකා ඵස්සසම්භවා,
අභිජ්ඣා ච විහෙසා ච චිත්තමස්සූපහඤ්ඤති,
එවමාචිනතො දුක්ඛං ආරා නිබ්බානං[3] වුච්චති.

804. ධම්මං ඤත්වා සති මුට්ඨා පියං නිමිත්තං මනසිකරොතො,
සාරත්තචිත්තො වෙදෙති තං ච අජ්ඣොස්ස[2] තිට්ඨති.

805. තස්ස වඩ්ඪන්ති වෙදනා අනෙකා ධම්මසම්භවා,
අභිජ්ඣා ච විහෙසා ච චිත්තමස්සූපහඤ්ඤති,
එවමාචිනතො දුක්ඛං ආරා නිබ්බානං[3] වුච්චති.

806. න සො රජ්ජති රූපෙසු රූපං දිස්වා පතිස්සතො,
විරත්තචිත්තො වෙදෙති තං ච නාජ්ඣොස්ස[4] තිට්ඨති.

807. යථාස්ස පස්සතො රූපං සෙවතො චා'පි වෙදනං,
ඛීයති නොපචීයති එවං සො චරතී සතො,
එවං අපචිනතො දුක්ඛං සන්තිකෙ නිබ්බානං[3] වුච්චති.

---

1. පියනිමිත්තං - PTS, සයා. 2. අජ්ඣොස - සයා, PTS 3. නිබ්බාන - ප. PTS
4. නාජ්ඣොස - සයා, PTS.

## 20. 1. 5

794. රූපය දැක ශුභ නිමිති මෙනෙහි කරන්නහුගේ සිහි මුළා වෙයි, රාග සිත් ඇත්තේ (එය) විඳී, යළි එහි වැඳගෙන සිටී.

795. ඔහු ගේ නොයෙක් වේදනාවෝ රූපයෙන් හටගත්තාහු වැඩෙත්. අභිධ්‍යාවත් ව්‍යාපාදයත් විසින් ඔහුගේ සිත පෙළනුලැබේ, මෙසේ දුක් රැස් කරන්නහුට නිවන දුර යැ යි කියනුලැබේ.

796. ශබ්දය අසා ශුභ නිමිති මෙනෙහි කරන්නහුගේ සිහි මුළා වෙයි, රාග සිත් ඇත්තේ එය විඳී, යළි එහි වැඳගෙන සිටී.

797. ඔහුගේ නොයෙක් වේදනාවෝ ශබ්දාරම්මණයෙන් හටගත්තාහු වැඩෙත්, අභිධ්‍යාවත් ව්‍යාපාදයත් විසින් ඔහුගේ සිත පෙළනුලැබේ, මෙසේ දුක් රැස් කරන්නහුට නිවන දුර යැ යි කියනුලැබේ.

798. ගන්ධාඝ්‍රාණය කොට ශුභ නිමිති මෙනෙහි කරන්නහුගේ සිහි මුළා වෙයි, රාග සිත් ඇත්තේ එය විඳී, යළි එහි වැඳගෙන සිටී.

799, ඔහුගේ නොයෙක් වේදනාවෝ ගන්ධාරම්මණයෙන් හටගත්තාහු වැඩෙත්, අභිධ්‍යාවත් ව්‍යාපාදයත් විසින් ඔහුගේ සිත පෙළනුලැබේ, මෙසේ දුක් රැස් කරන්නහු ගේ නිවන දුර යැ යි කියනුලැබේ.

800. රසය අනුභව කොට ශුභ නිමිති මෙනෙහි කරන්නහුගේ සිහි මුළා වෙයි, රාග සිත් ඇත්තේ එය විඳී, යළි එහි වැඳගෙන සිටී.

801. ඔහු ගේ නොයෙක් වේදනාවෝ රසාරම්මණයෙන් හටගත්තාහු වැඩෙත්, අභිධ්‍යාවත් ව්‍යාපාදයත් විසින් ඔහුගේ සිත පෙළනුලැබේ. මෙසේ දුක් රැස් කරන්නහුගේ නිවන දුර යැ යි කියනුලැබේ.

802. ස්පර්ශය විඳ ශුභ නිමිති මෙනෙහි කරන්නහුගේ සිහි මුළා වෙයි, රාග සිත ඇත්තේ එය විඳී, යළි එහි වැඳගෙන සිටී.

803. ඔහුගේ නොයෙක් වේදනාවෝ ස්පර්ශාරම්මණයෙන් හටගත්තාහු වැඩෙත්, අභිධ්‍යාවත් ව්‍යාපාදයත් විසින් ඔහුගේ සිත පෙළනුලැබේ, මෙසේ දුක් රැස් කරන්නහුගේ නිවන දුර යැ යි කියනුලැබේ.

804. ධර්මාරම්මණය දැන ශුභ නිමිති මෙනෙහි කරන්නහුගේ සිහි මුළා වෙයි, රාග සිත් ඇත්තේ එය විඳී, යළි එහි වැඳගෙන සිටී.

805. ඔහුගේ නොයෙක් වේදනාවෝ ධර්මාරම්මණයෙන් හටහත්තාහු වැඩෙත්, අභිධ්‍යාවත් ව්‍යාපාදයත් විසින් ඔහුගේ සිත පෙළනුලැබේ, මෙසේ දුක් රැස් කරන්නහුට නිවන දුර යැ යි කිනුයලැබේ.

806. යමෙක් රූ අරමුණ දැක එහි සිහි ඇත්තේ වේ ද, හෙතෙම රූපයෙහි නො ඇලෙයි, විරාග සිත් ඇත්තේ අරමුණු රස විඳී, එතෙකුදු වුවත් එහි වැඳගෙන නො සිටී.

807. යම්සේ රූපය දක්නා වූ ද (එය අරමුණු කොට උපන්) වේදනාව සෙවුනා වූ ද ඔහුගේ කෙලෙස් ක්‍ෂය වේ ද රැස් නො වේ ද හෙතෙම එසේ සිහි ඇති වැ වෙසේ, මෙසේ දුක් පහ කරන්නහුට නිවන ළඟ යැ යි කියනුලැබේ.

808. න සො රජ්ජති සද්දෙසු සද්දං සුත්වා පතිස්සතො,
විරත්තචිත්තො වෙදෙති තං ච නාජ්ඣොස්ස[1] තිට්ඨති.

809. යථාස්ස සුණතො සද්දං සෙවතො චා'පි වෙදනං,
ඛීයති නොපචීයති එවං සො චරතී සතො,
එවං අපචිනතො දුක්ඛං සන්තිකෙ නිබ්බානං[2] වුච්චති.

810. න සො රජ්ජති ගන්ධෙසු ගන්ධං ඝත්වා පතිස්සතො,
විරත්තචිත්තො වෙදෙති තං ච නාජ්ඣොස්ස[1] තිට්ඨතී'ති.

811. යථාස්ස ඝායතො ගන්ධං සෙවතො චා'පි වෙදනං,
ඛීයති නොපචීයති එවං සො චරතී සතො,
එවං අපචිනතො දුක්ඛං සන්තිකෙ නිබ්බානං[2] වුච්චති.

812. න සො රජ්ජති රසෙසු රසං භොත්වා[3] පතිස්සතො,
විරත්තචිත්තො වෙදෙති තං ච නාජ්ඣොස්ස[1] තිට්ඨති.

813. යථාස්ස සායතො රසං සෙවතො චා'පි වෙදනං,
ඛීයති නොපචීයති එවං සො චරතී සතො,
එවං අපචිනතො දුක්ඛං සන්තිකෙ නිබ්බානං[2] වුච්චති.

814. න සො රජ්ජති ඵස්සෙසු ඵස්සං ඵුස්ස පතිස්සතො,
විරත්තචිත්තො වෙදෙති තං ච නාජ්ඣොස්ස[1] තිට්ඨති.

815. යථාස්ස ඵුසතො ඵස්සං සෙවතො චා'පි වෙදනං,
ඛීයති නොපචීයති එවං සො චරතී සති,
එවං අපචිනතො දුක්ඛං සන්තිකෙ නිබ්බානං[2] වුච්චති.

816. න සො රජ්ජති ධම්මෙසු ධම්මං ඤත්වා පතිස්සතො,
විරත්තචිත්තො වෙදෙති තං ච නාජ්ඣොස්ස තිට්ඨති.

817. යථාස්ස විජානතො ධම්මං සෙවතො චා'පි වෙදනං,
ඛීයති නොපචීයති එවං සො චරතී සතො,
එවං අපචිනතො දුක්ඛං සන්තිකෙ නිබ්බානං[2] වුච්චතී'ති.

ඉත්ථං සුදං ආයස්මා මාලුඞ්ක්‍යපුත්තො ථෙරො ගාථායො
අභාසිත්ථා'ති.

මාලුඞ්ක්‍යපුත්තත්ථෙරගාථා.

1. නාජ්ඣොසං - සයා, PTS. 2. නිබ්බාන - ප. PTS, 3. භුත්වා - සිමු, 1, 2.

808. යමෙක් ශබ්දය අසා එහි සිහි ඇත්තේ වේ ද, හෙතෙම ශබ්දයෙහි නො ඇලෙයි, විරාග සිත් ඇත්තේ අරමුණු රස විඳී, එතෙකුදු වුවත් එහි වැදගෙන නො සිටී.

809. යම්සේ ශබ්දය ශ්‍රවණය කරන්නා වූ ද වේදනාව සෙවුනා වූ ද ඔහුගේ කෙලෙස් ක්‍ෂය වේ නම් රැස් නො වේ නම්, හෙතෙම එසේ සිහි ඇති වැ වෙසේ, මෙසේ දුක් පහ කරන්නහුට නිවන ළඟ යැ යි කියනු ලැබේ.

810. යමෙක් ගන්ධාඝ්‍රාණය කොට එහි සිහි ඇත්තේ වේ ද, හෙතෙම ගන්ධාරම්මණයෙහි නො ඇලෙයි, විරාග සිත් ඇත්තේ අරමුණුරස විඳී, එතෙකුදු වුවත් එහි වැදගෙන නො සිටී.

811. යම්සේ ගන්ධාඝ්‍රාණය කරන්නා වූ ද වේදනාව සෙවුනා වූ ද ඔහුගේ කෙලෙස් ක්‍ෂය වේ නම් රැස් නො වේ නම්, හෙතෙම එසේ සිහි ඇති වැ වෙසේ. මෙසේ දුක් පහ කරන්නහු ගේ නිවන ළඟ යැ යි කියනු ලැබේ.

812. යමෙක් රසානුභවය කොට එහි සිහි ඇත්තේ වේ ද, හෙතෙම රසයෙහි නො ඇලෙයි, විරාග සිත් ඇත්තේ අරමුණු රස විඳී, එතෙකුදු වුවත් එහි වැදගෙන නො සිටී.

813 යම්සේ රසාස්වාදය කරන්නා වූ ද වේදනාව සෙවුනා වූ ද ඔහුගේ කෙලෙස් ක්‍ෂය වේ නම් රැස් නො වේ නම්, හෙතෙම එසේ සිහි ඇති වැ වෙසේ, මෙසේ දුක් පහ කරන්නහුට නිවන ළඟ යැ යි කියනු ලැබේ.

814. යමෙක් පහස විඳ එහි සිහි ඇත්තේ වේ ද, හෙතෙම ස්පර්ශා-ලම්බනයෙහි නො ඇලෙයි, විරාග සිත් ඇත්තේ අරමුණුරස විඳී, එතෙකුදු වුවත් එහි වැදගෙන නො සිටී.

815. යම්සේ පහස විඳුනා වූ ද වේදනාව සෙවුනා වූ ද ඔහුගේ කෙලෙස් ක්‍ෂය වේ නම් රැස් නො වේ නම්, හෙතෙම එසේ සිහි ඇති වැ වෙසේ, මෙසේ දුක පහ කරන්නහුට නිවන ළඟ යැ යි කියනු ලැබේ.

816. යමෙක් දහම්අරමුණ පසක් කොට එහි සිහි ඇත්තේ වේ ද, හෙතෙම දහම්අරමුණෙහි නො ඇලෙයි, විරාගසිත් ඇත්තේ අරමුණු රස විඳී, එතෙකුදු වුවත් එහි වැදගෙන නො සිටී.

817. යම්සේ දහම්අරමුණ පසක් කරන්නා වූ ද වේදනාව සෙවුනා වූ ද ඔහුගේ කෙලෙස් ක්‍ෂය වේ නම් රැස් නො වේ නම්, හෙතෙම එසේ සිහි ඇති වැ වෙසේ. මෙසේ දුක් පහ කරන්නහුට නිවන ළඟ යැ යි කියනු ලැබේ යි.

මෙසේ ආයුෂ්මත් මාලුඞ්ක්‍යපුත්ත ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ යි.

මාලුඞ්ක්‍යපුත්ත ස්ථවිරගාථා යි.

## 20. 1. 6

818. පරිපුණ්ණකායො සුරුචි සුජාතො චාරුදස්සනො,
සුවණ්ණවණ්ණොසි භගවා සුසුක්කදාඨො[1] විරියවා.

819. නරස්ස හි සුජාතස්ස යෙ භවන්ති වියඤ්ජනා
සබ්බෙ තෙ තව කායස්මිං මහාපුරිසලක්ඛණා.

820. පසන්නනෙත්තො සුමුඛො බ්‍රහ්මා උජු පතාපවා,
මජ්ඣෙ සමණසඞ්ඝස්ස ආදිච්චො'ව විරොචසි.

821. කල්‍යාණදස්සනො භික්ඛු කඤ්චනසන්නිභත්තචො,
කිං තෙ සමණභාවෙන එවං උත්තමවණ්ණිනො.

822. රාජා අරහසි භවිතුං චක්කවත්තී රථෙසභො,
චාතුරන්තො විජිතාවී ජම්බුසණ්ඩස්ස[2] ඉස්සරො.

823. ඛත්තියා භොගා රාජානො[3] අනුයන්තා භවන්ති තෙ,
රාජාධිරාජා[4] මනුජින්දො රජ්ජං කාරෙහි ගොතම.

824. රාජාහමස්මි සෙල (සෙලාති භගවා) ධම්මරාජා අනුත්තරො,
ධම්මෙන චක්කං වත්තෙමි චක්කං අප්පටිවත්තියං.

825. සම්බුද්ධො පටිජානාසි (ඉති සෙලො බ්‍රාහ්මණො)
ධම්මරාජා අනුත්තරො,
ධම්මෙන චක්කං වත්තෙමි ඉති භාසසි[5] ගොතම.

826. කො නු සෙනාපති භොතො සාවකො සත්ථු අන්වයො,[6]
කො තෙ මං අනුවත්තෙති ධම්මචක්කං පවත්තිතං.

827. මයා පවත්තිතං චක්කං (සෙලාති භගවා) ධම්මචක්කං අනුත්තරං,
සාරිපුත්තො අනුවත්තෙති අනුජාතො තථාගතං.

828. අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං භාවෙතබ්බං ච භාවිතං,
පහාතබ්බං පහීනං මෙ තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණ.

829. විනයස්සු මයි කඞ්ඛං අධිමුච්චස්සු බ්‍රාහ්මණ,
දුල්ලභං දස්සනං හොති සම්බුද්ධානං අභිණ්හසො.

830. යෙසං වෙ දුල්ලභො ලොකෙ පාතුභාවො අභිණ්හසො,
සො'හං බ්‍රාහ්මණ සම්බුද්ධො[7] සල්ලකත්තො අනුත්තරො.

831. බ්‍රහ්මභූතො අතිතුලො මාරසෙනප්පමද්දනො,
සබ්බාමිත්තෙ වසෙ කත්වා[8] මොදාමි අකුතොභයො.

1. සුසුක්කදාඨොසි - මජසං, PTS. 2. ජම්බුමණ්ඩස්ස - සීමු, 1, 2.
3 භොජරාජානො - PTS 4 රාජාභිරාජා - PTS. 5 භාසථ - සීමු 1, 2
6 සත්ථුරන්වයො - PTS. 7 බුද්ධො'ස්මි - PTS. 8 වසීකත්වා - PTS.

## 20. 1. 6

818. පිරිපුන්සිරුරු ඇත්තෙහි, මනා සිරුරුකැළුම් ඇත්තෙහි, අභිජාතයෙහි, රමණී දකුම් ඇත්තෙහි, රන්වන් වෙහි, භගවත්හි, සුදෝසුදු දත්පෙළ ඇතියෙහි, වියසී ඇත්තෙහි යැ.

819. අභිජාතපුරුෂයක්හුගේ යම් ලක්‍ෂණ කෙනෙක් වෙත් ද, ඒ සියලු මහාපුරුෂලක්‍ෂණයෝ ඔබගේ සිරුරෙහි වෙත්.

820. පස්පැ දිස්නා නෙත් ඇත්තෙහි, මනා මුව ඇතියෙහි, ආරෝහපරිණාහසම්පන්නයෙහි, ඍජුගාත්‍ර ඇතියෙහි, ප්‍රතාපවත් වූයෙහි, මහණගණ මැද සූර්ය්‍යයා මෙන් බබලන්නෙහි යැ.

821. කලණදකුම් ඇතියෙහි, කසුන් පැහැසිවි ඇතියෙහි යැ, මහණ, මෙසේ උත්තමස්වරූප ඇති තොපට ශ්‍රමණභාවයෙන් කිම්?

822. මහාරථික වූ සිව්සැයුරු හිමි කොට ඇති පොළොවට අධිපති වූ කළ දික් විජය ඇති ජම්බුද්වීපයට ඊශ්වර වූ සක්විතිරජ වන්නට සුදුස්සෙහි යැ.

823. භෝග ඇති ක්‍ෂත්‍රිය රජවරු තොපගේ අනුගාමීහු වෙත්, ගෞතමය, රාජාධිරාජ වූ මනුජේන්ද්‍රයක් වැ රාජ්‍යය කරව.

බුදුහු:-

824. සේල! මම රජයෙමි. නිරුත්තර වූ ධර්මරාජ වූයෙමි දහැමින් අණසක පවත්වමි, අණසක (අනෙකකු විසින්) පෙරළිය නො හැක්කෙකි'යි.

සෙල බ්‍රාහ්මණ:-

825. 'නිරුත්තර ධර්මරාජන් වූ සම්බුද්ධයෙමි'යි ප්‍රතිඥා කරව, ගෞතමය, දහැමින් අණසක පවත්වමි කියව.

826. භවත්හුගේ සෙන්පති කවරෙ යැ? ශ්‍රාවක වූ ශාස්තෘ අන්වය ඇති කවරෙක් තොප විසින් පවත්වනලද මේ දහම්සක අනුවර්තනය කෙරේ ද'

බුදුහු:-

827. සේල! මා විසින් පවත්වනලද නිරුත්තර වූ ධර්මචක්‍රය තථාගත අනුජාත වූ ශාරිපුත්‍ර තෙමේ අනුවර්තනය කෙරේ.

828. මා විසින් දතයුතු දය දන්නාලද යැ, භාවිත කළ යුත්ත භාවිත යැ, ප්‍රහාතව්‍යය ප්‍රහීණ යැ, එහෙයින් බමුණ! මම බුද්ධයෙමි,

829. බමුණ, මා කෙරෙහි සැක දුරුකරව, මා හදහව, සම්බුද්ධයන්ගේ එක්වන් දක්ම දුර්ලභ වේ.

830. ලෝකයෙහි යම් කෙනකුන්ගේ එක්වන් පහළ වීම ඒකාන්තයෙන් දුර්ලභ වේ ද, බමුණ! ඒ මම නිරුත්තර ශල්‍යවෛද්‍ය වූ සම්බුද්ධයෙමි.

831. බ්‍රහ්ම (ශ්‍රේෂ්ඨ) වූයෙම් නිරුපම වූයෙම් මරසෙන් මඩනසුලු වූයෙම් සියලු සතුරන් වසඟ කොට කිසිවෙකින් බිය නැත්තෙම් සතුටු වෙමි.

832. ඉදං භොන්තො නිසාමෙථ යථා භාසති චක්ඛුමා,
සල්ලකත්තො[1] මහාවීරො සීහො'ව නදතී වනෙ.

833. බ්‍රහ්මභූතං අතිතුලං මාරසෙනප්පමද්දනං,
කො දිස්වා නප්පසීදෙය්‍ය අපි කණ්හාභිජාතිකො.

834. යො මං ඉච්ඡති අන්වෙතු යො වා නිච්ඡති ගච්ඡතු,
ඉධාහං පබ්බජිස්සාමි වරපඤ්ඤස්ස සන්තිකෙ.

835. එතං චෙ රුච්චති භොතො සම්මාසම්බුද්ධසාසනං,
මයම්පි පබ්බජිස්සාම වරපඤ්ඤස්ස සන්තිකෙ.

836. බ්‍රාහ්මණා තිසතා ඉමෙ යාචන්ති පඤ්ජලීකතා,
බ්‍රහ්මචරියං චරිස්සාම භගවා තව සන්තිකෙ.

837. ස්වාක්ඛාතං බ්‍රහ්මචරියං (සෙලාති භගවා) සන්දිට්ඨිකමකාලිකං,
යත්ථ අමොඝා පබ්බජ්ජා අප්පමත්තස්ස සික්ඛතො.

838. යං තං සරණමාගම්ම ඉතො අට්ඨමෙ[2] චක්ඛුම,
සත්තරත්තෙන භගවා දන්තාම්හ තව සාසනෙ.

839. තුවං බුද්ධො තුවං සත්ථා තුවං මාරාභිභූ මුනි,
තුවං අනුසයෙ ඡෙත්වා තිණ්ණො තාරෙසිමං පජං.

840. උපධී තෙ සමතික්කන්තා ආසවා තෙ පදාලිතා,
සීහො'ව අනුපාදානො පහීනභයභෙරවො.

841. භික්ඛවො තිසතා ඉමෙ තිට්ඨන්ති පඤ්ජලීකතා,
පාදෙ වීර පසාරෙහි නාගා වන්දන්තු සත්ථුනො'ති.

ඉත්ථං සුදං ආයස්මා සෙලො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

සෙලත්ථෙරගාථා.

---

1 සල්ලකන්තො - සිමු 1, 2.
2 අට්ඨමි - ට, PTS.

832. භවත්නි! පසැස් ඇත්තේ යම්සේ කියා ද, එසේ මෙය අසව්, (රාගාදි ශල්‍යයන් උදුරන බැවින්) සල්ලකත්ත වූ මහාවීර තෙම වනයෙහි සිංහයකු මෙන් ගර්ජනා කෙරේ.

833. බ්‍රහ්ම වූ තුලනාතික්‍රාන්ත වූ මරසෙන් මඬනාසුල්ලහු දැක (තම- පරායණ බැවින්) නීචජාතික වූ කවරෙක් නො පහදින්නේ ද?

834. යමෙක් කැමැති වේ ද (හෙ) මා අනුව ඒවා, නොහොත්, යමෙක් නො කැමැති වේ ද (හෙතෙම) යේවා, මම මෙහි උතුම් නුවණැත්තහු වෙත පැවිදි වන්නෙමි.

835. ඉදින් භවත්හට තෙල සම්‍යක් සම්බුද්ධශාසනය රුචි වේ නම්, අපිදු උතුම් නුවණැත්තහු වෙත පැවිදි වම්හ.

836. භාග්‍යවතුන් වහන්ස! මේ තුන්සියක් බ්‍රාහ්මණයෝ ඇඳිලි බැන්දාහු බඹසර යදිත්, (ඒ අපි) ඔබ වෙත බඹසර රක්නෙමු.

බුදුහු:-

837. ශේල! යම් සසුනෙක අප්‍රමාද වැ හික්මෙනුවහට පැවිද්ද අමොඝ (නොසිස්) වේ ද එහි මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යය ස්වාඛ්‍යාත යැ, සාංදෘෂ්ටික යැ, අකාලික යි.

838. ඇසැතියාණෙනි! යම් හෙයෙකින් මින් අටවැනි දිනයෙහි ඔබ සරණයට පැමිණියමෝ ද, එහෙයින් භාග්‍යවතුන් වහන්ස! සත් රැයින් ඔබ සසුන්හි දැමුණම්හ.

839. බුදු වූවහු මුඹ යැ, ශාස්තෘ වූවහු මුඹ යැ, මාරාභිභූමුනි වූවහු මුඹ යැ, මුඹ වහන්සේ අනුශය සිඳැ පාරගත වූවහු මේ ප්‍රජාව තරණය කරවූහු යැ.

840. ඔබ විසින් උපධීහු ඉක්මවනලදහ, ඔබ විසින් ආස්‍රවයෝ විදරණය කරනලදහ, උපාදාන රහිත වූවහු, සිංහයකු මෙන් පහ වූ භය භෛරව ඇත්තහු යැ.

841. මේ තුන්සියක් භික්ෂූහු ඇඳිලි බැඳැගෙන සිටිත්. වීරයන් වහන්ස, පා සඟල දිගු කළ මැනවැ. පුරුෂනාගයෝ ශාස්තෲහුගේ පා සඟල වඳිත්වා! යි.

මෙසේ ආයුෂ්මත් සේල ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ යි.

සේල ස්ථවිරගාථා යි.

## 20. 1. 7

842. යාතං මෙ හත්ථිගීවාය සුඛුමා වත්ථා පධාරිතා,
සාලීනං ඕදනො භුත්තො සුචිමංසූපසෙචනො.

843. සොජ්ජ භද්දො සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදනො පුත්තො ගොධාය භද්දියො.

844. පංසුකූලී සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදනො පුත්තො ගොධාය භද්දියො.

845. පිණ්ඩපාතී සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදනො පුත්තො ගොධාය භද්දියො.

846 තෙචීවරී සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදනො පුත්තො ගොධාය භද්දියො.

847. සපදානචාරී සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදනො පුත්තො ගොධාය භද්දියො.

848. එකාසනී සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදනො පුත්තො ගොධාය භද්දියො.

849. පත්තපිණ්ඩී සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදනො පුත්තො ගොධාය භද්දියො.

850. ඛලුපච්ඡාභත්තී සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[2] රතො,
ඣායති අනුපාදනො පුත්තො ගොධාය භද්දියො.

851. ආරඤ්ඤිකො සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදනො පුත්තො ගොධාය භද්දියො.

852. රුක්ඛමූලිකො සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදනො පුත්තො ගොධාය භද්දියො.

853. අබ්භොකාසී සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදනො පුත්තො ගොධාය භද්දියො.

854. සොසානිකො සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදනො පුත්තො ගොධාය භද්දියො.

855. යථාසන්ථතිකො සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදනො පුත්තො ගොධාය භද්දියො.

856. නෙසජ්ජිකො සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදනො පුත්තො ගොධාය භද්දියො.

857. අප්පිච්ඡො සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදනො පුත්තො ගොධාය භද්දියො.

858. සන්තුට්ඨො සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදනො පුත්තො ගොධාය භද්දියො.

---

1 උඤ්ඡාපත්තගතෙ - සීමු 1, 2.

## 20. 1. 7

842. මා විසින් ඇත්කඳ නැගී සැරිසරනලද යැ, සියුම් වස්ත්‍ර දරන ලද යැ, මනා මසින් හැනූ හැල්බත් වළඳනලදී.

843. අද (සීලාදි ගුණ හෙයින්) භද්‍ර වූ ශ්‍රමණධර්මයෙහි නිරත වූ පිණ්ඩාහාරයෙහි ඇලුණු උපාදාන රහිත වූ කාලිගොධාපුත්‍ර ඒ භද්දිය තෙමේ ධ්‍යාන කෙරේ.

844. පංශුකූලිකාඞ්ග ඇති, ශ්‍රමණධර්මයෙහි නිරත වූ පිණ්ඩාහාරයෙහි ඇලුණු උපාදාන රහිත වූ කලිගොධාපුත්‍ර භද්දිය තෙමේ ධ්‍යාන කෙරේ.

845. පිණ්ඩපාතිකඞ්ග ඇති ශ්‍රමණධර්මයෙහි නිරත වූ ...

846 තෙචීවරිකඞ්ග ඇති ශ්‍රමණධර්මයෙහි නිරත වූ ...

847. සපදානචාරිකඞ්ග ඇති ශ්‍රමණධර්මයෙහි නිරත වූ ...

848. ඒකාසනිකඞ්ග ඇති ශ්‍රමණධර්මයෙහි නිරත වූ ...

849. පත්තපිණ්ඩිකඞ්ග ඇති ශ්‍රමණධර්මයෙහි නිරත වූ ...

850. ඛලුපච්ඡාභත්තිකඞ්ග ඇති ශ්‍රමණධර්මයෙහි නිරත වූ ...

851. ආරඤ්ඤිකඞ්ග ඇති ශ්‍රමණධර්මයෙහි නිරත වූ ...

852. රුක්ඛමූලිකඞ්ග ඇති ශ්‍රමණධර්මයෙහි නිරත වූ ...

853. අබ්භොකාසිකඞ්ග ඇති ශ්‍රමණධර්මයෙහි නිරත වූ ...

854. සොසානිකඞ්ග ඇති ශ්‍රමණධර්මයෙහි නිරත වූ ...

855. යථාසන්තතිකඞ්ග ඇති ශ්‍රමණධර්මයෙහි නිරත වූ ...

856. නෙසජ්ජිකඞ්ග ඇති ශ්‍රමණධර්මයෙහි නිරත වූ ...

857. අල්පෙච්ඡ වූ ශ්‍රමණධර්මයෙහි නිරත වූ ...

858. සන්තුෂ්ට වූ ශ්‍රමණධර්මයෙහි නිරත වූ ...

859. පවිවිත්තො සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදානො පුත්තො ගොධාය භද්දියො.

860. අසංසට්ඨො සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදානො පුත්තො ගොධාය භද්දියො.

861. ආරද්ධවිරියො සාතතිකො උඤ්ඡාපත්තාගතෙ[1] රතො,
ඣායති අනුපාදානො පුත්තො ගොධාය භද්දියො.

862. හිත්වා සතපලං කංසං සොවණ්ණං සතරාජිකං,
අග්ගහිං මත්තිකාපත්තං ඉදං දුතියාභිසෙචනං.

863. උච්චෙ මණ්ඩලිපාකාරෙ දළ්හමට්ටාලකොට්ඨකෙ,
රක්ඛිතො ඛග්ගහත්ථෙහි උත්තසං විහරිං පුරෙ.

864. සොජ්ජ භද්දො අනුත්‍රාසී පහීනභයභෙරවො,
ඣායති වනමොගය්හ පුත්තො ගොධාය භද්දියො.

865. සීලක්ඛන්ධෙ පතිට්ඨාය සතිං පඤ්ඤං ච භාවයං,
පාපුණිං අනුපුබ්බෙන සබ්බසංයොජනක්ඛය'න්ති.

ඉත්ථං සුදං ආයස්මා භද්දියො කාළිගොධාය පුත්තො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

භද්දියත්ථෙරගාථා.

20. 1. 8

866. ගච්ඡං වදෙසි සමණට්ඨිතොම්හි
මමං ච බ්‍රූසි ඨිතමට්ඨිතො'ති,
පුච්ඡාමි තං සමණ එතමත්ථං
කථං[2] ඨිතො ත්වං අහමට්ඨිතොම්හි.

867. ඨිතො අහං අඞ්ගුලිමාල සබ්බදා
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං,
තුවඤ්ච පාණෙසු අසඤ්ඤතොසි
තස්මා ඨිතොහං තුවමට්ඨිතොසි.

868. චිරස්සං වත මෙ මහිතො මහෙසි
මහාවනං සමණො පච්චුපාදි,
සො'හං චජිස්සාමි සහස්සපාපං
සුත්වාන ගාථං තව ධම්මයුත්තං.

869. ඉච්චෙව චොරො අසිමාවුධං ච
සොබ්භෙ පපාතෙ නරකෙ අන්වකාසි,
අවන්දි චොරො සුගතස්ස පාදෙ
තත්ථෙව පබ්බජ්ජමයාචි බුද්ධං.

870. බුද්ධො ච ඛො කාරුණිකො මහෙසි
යො සත්ථා ලොකස්ස සදෙවකස්ස,
තමෙහි භික්ඛූ'ති තදා අවොච
එසො'ව තස්ස අහු භික්ඛුභාවො.

871. යො ච පුබ්බෙ පමජ්ජිත්වා පච්ඡා සො නප්පමජ්ජති,
සො'මං ලොකං පභාසෙති අබ්භා මුත්තො'ව චන්දිමා.

---

1 උඤ්ඡාපත්තගතෙ - සීමු 1, 2. 2 කස්මා - PTS

859. ප්‍රවිවික්ත වූ ශ්‍රමණධර්මයෙහි නිරත වූ ...

860. අසංසෘෂ්ට වූ ශ්‍රමණධර්මයෙහි නිරත වූ ...

861. ආරබ්ධවීර්‍ය්‍ය ඇති ශ්‍රමණධර්මයෙහි නිරත වූ පිණ්ඩාහාරයෙහි ඇලුණු, උපාදාන රහිත වූ ගොධාපුත්‍ර භද්දිය තෙමේ ධ්‍යාන කෙරේ.

862. රතින් තිමැ වූ නොයෙක් කැටයම් ඇති සියක්පල් අගනා කස්-ලෝතලිය හැරදමා මැටිපාත්‍රය ගතිමි, මේ දෙවැනි අභිෂේක යි.

863. උස් වූ මඹුලුපවුරු ඇති තිර වූ අටලු කොටු ඇති පුරයෙහි ඛඩගධාරීන් විසින් රක්නාලද්දෙම ත්‍රස්ත වැ විසුයෙමි.

864. අද ඒ භද්‍ර වූ ත්‍රස්ත නො වනසුලු වූ පහ වූ භය භෛරව ඇති ගොධාපුත්‍ර භද්දිය තෙමේ වනයෙහි පිවිස ධ්‍යාන කෙරේ.

865. ශීලස්කන්ධයෙහි පිහිටා සමාධියත් ප්‍රඥාවත් වඩනෙම් අනුක්‍රම-යෙන් සියලු සංයොජනයන් ගේ ක්‍ෂය භාවයට පැමිණියෙමි යි.

මෙසේ ආයුෂ්මත් කාලිගොධාපුත්‍ර භද්දිය ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ යි.

භද්දිය ස්ථවිරගාථා යි.

## 20. 1. 8

866. මහණ! යන්නෙහි 'සිටියෙමි'යි කියහි, සිටි මා 'නො සිටියහ' යි ද කියහි, මහණ! මෙකරුණ ඔබ විචාරමි, භවත් කෙසේ සිටියෙ යැ? මම් කෙසේ නො සිටියෙම් වේ ද?

867. අඟුල්මල! මම හැම කල්හි සියලු සතුන් කෙරෙහි දණ්ඩනය හැරපියා සිටියෙමි, තෝ වනාහි ප්‍රාණීන් කෙරෙහි සංයම රහිත වෙහි, එහෙයින් මම සිටියෙමි, තෝ නො සිටියෙහි.

868. පූජිත වූ මහර්ෂි වූ ශ්‍රමණ තෙම කලෙකින් මට හිත පිණිස මහවනයට එළඹියේ යැ, මම ඔබගේ ධර්මයුක්ත වූ ගාථාව අසා දහසක් පව් හැරදමන්නෙමි.

869. මෙසේ කියා අඟුල්මල් සොර අසිපත ද සෙසු අවි ද හෙබෙහි ප්‍රපාතයෙහි, පොළෝ විවරයෙහි දැමී යැ, සොරා බුදුන් ගේ පාසඟළ වැන්දේ යැ, එතැන්හි මැ බුදුන් ගෙන් පැවිද්ද අයැදී.

870. එක්කිති යම් කෙනෙක් දෙවියන් සහිත සත්ත්වලෝකයාට කාරුණික වෙත් ද, මහර්ෂි වෙත් ද ඒ බුදුහු 'එව මහණ' යි එදා ඔහුට වදාළහ. එ මැ ඔහු ගේ භික්‍ෂුභාවය වී.

871. යමෙක් පළමු ප්‍රමාදයට පැමිණ පසුව අප්‍රමාද වේ ද හෙතෙම වලායෙන් මුත් තිසයුරු සෙයින් මෙලොව බබුළුවයි.

872. යස්ස පාපං කතං කම්මං කුසලෙන පිපීයති,[1]
සො'මං ලොකං පභාසෙති අබ්භා මුත්තො'ව චන්දිමා.

873. යො හවෙ දහරො භික්ඛු යුඤ්ජති බුද්ධසාසනෙ,
සො'මං ලොකං පභාසෙති අබ්භා මුත්තො'ව චන්දිමා.

874. දිසා'පි[2] මෙ ධම්මකථං සුණන්තු
දිසා'පි මෙ යුඤ්ජන්තු බුද්ධසාසනෙ,
දිසා'පි[2] මෙ තෙ මනුජෙ[3] භජන්තු
යෙ ධම්මමෙවාදපෙන්ති[4] සන්තො.

875. දිසා හි මෙ ඛන්තිවාදානං අවිරොධප්පසංසිනං,
සුණන්තු ධම්මං කාලෙන තඤ්ච අනුවිධීයන්තු.

876. න හි ජාතු සො මමං හිංසෙ අඤ්ඤං වා පන කිඤ්චනං,
පප්පුය්‍ය පරමං සන්තිං රක්ඛෙය්‍ය තසථාවරෙ.

877. උදකං හි නයන්ති නෙත්තිකා උසුකාරා නමයන්ති තෙජනං,
දාරුං නමයන්ති තච්ඡකා අත්තානං දමයන්ති පණ්ඩිතා.

878. දණ්ඩෙනෙකෙ දමයන්ති අඞ්කුසෙහි කසාහි ච
අදණ්ඩෙන අසත්ථෙන අහං දන්තොම්හි තාදිනා.

879 අහිංසකො'ති මෙ නාමං හිංසකස්ස පුරෙ සතො,
අජ්ජාහං සච්චනාමොම්හි න නං හිංසාමි කිඤ්චනං.

880. චොරො අහං පුරෙ ආසිං අඞ්ගුලිමාලො'ති විස්සුතො,
වුය්හමානො මහොඝෙන බුද්ධං සරණමාගමං.

881. ලොහිතපාණි[5] පුරෙ ආසිං අඞ්ගුලිමාලො'ති විස්සුතො,
සරණාගමනං පස්ස භවනෙත්ති සමූහතා.

882. තාදිසං කම්මං කත්වාන බහුං දුග්ගතිගාමිනං
ඵුට්ඨො කම්මවිපාකෙන අනණො භුඤ්ජාමි භොජනං.

883. පමාදමනුයුඤ්ජන්ති බාලා දුම්මෙධිනො ජනා.
අප්පමාදං ච මෙධාවී ධනං සෙට්ඨං'ව රක්ඛති.

884. මා පමාදමනුයුඤ්ජෙථ මා කාමරතිසන්ථවං,
අප්පමත්තො හි ඣායන්තො පප්පොති පරමං සුඛං.

885. ස්වාගතං නාපගතං නෙතං දුම්මන්තිතං මම,
සංවිභත්තෙසු[6] ධම්මෙසු යං සෙට්ඨං තදුපාගමං.

---

1 පිධියති - ප. 2 දිසාසි - PTS, 3 මනුස්සෙ - PTS.
4 ධම්මමෙවාදපයන්ති-ප, PTS 5. ලොහිතපාණී - PTS 6. සම්භත්තෙසු-සීමු.1,2

872. යමකු විසින් කරනලද පව්කම් කුශලයෙන් වසනුලැබේ ද හෙතෙම වලායෙන් මුත් නිසඟුරු සෙයින් මෙලොව බබුළුවයි.

873. යම් තරුණ මහණෙක් ත්‍රිවිධශික්‍ෂායෙහි යුක්තප්‍රයුක්ත වේ ද හෙතෙම ඒකාන්තයෙන් වලායෙන් මුත් නිසඟුරු සෙයින් මෙලොව බබුළුවයි.

874. මා ගේ සතුරෝ ද (මා ඇසූ)ධර්මකථාව අසත්වා! මාගේ සතුරෝ ද බුද්ධශාසනයෙහි යුක්තප්‍රයුක්ත වෙත්වා! (යෙදෙත්වා) යම් සත්පුරුෂ කෙනෙක් ධර්මය මැ ගන්වත් ද මා ගේ සතුරෝ ද එබඳු මිනිසුන් භජනය කෙරෙත්වා!

875. මා ගේ සතුරෝ ක්‍ෂාන්තිවාදීන්ගේ මෛත්‍රිය පසස්නවුන් ගේ ධර්මය සුදුසු කල්හි අසත්වා! එ ද අනුගමනය කෙරෙත්වා!

876. ඒ මාගේ සතුරා කිසි කලෙකැ මා නො මැ නසන්නේ යැ, අන් කිසිවකු හෝ නො නසන්නේ යැ, (හෙතෙම) පරම ශාන්තියට පැමිණ තැතිගන්නවුන් (පුහුදුන්) හා ස්ථාවරයන් (රහතුන්) රක්නේ යි.

877. දියාලුවෝ (කැමැති තැනට) දියගෙන යෙති, හීවඩුවෝ හී සෘජු කෙරෙති, දුවවඩුවෝ දුව නමති, නුවණැතියෝ ආත්මය දමනය කෙරෙත්.

878. ඇතැම් කෙනෙක් කැවිරිනුදු අකුස්සෙනුදු කසයෙනුදු දමනය කරත්, මම කැවිරි නැති අවි නැති තාදිහු (බුදුන්) විසින් දමනය කරනලද්දෙම් වෙමි.

879. හිංසක වූ මට පෙර 'අහිංසක' යැ යි නමෙක් වී යැ, අද මම නිබොරු නම් ඇත්තෙමි, කිසිවකු නො නසමි.

880. පෙර මම 'අඞ්ගුලිමාල'යි ප්‍රසිඬ වූ සොර වීමි, (කාමාදි) මහොඝය විසින් පා කොට ගෙන යන ලද්දෙම් බුදුන් සරණගියෙමි.

881. පෙර අඟුල්මලැ යි ප්‍රසිඬ වූයෙම් ලෙහෙ වැකුණු අත් ඇත්තෙම් වීමි, සරණාගමන අනුසස් බලව. (මා විසින්) තෘෂ්ණාව උගුළුවන ලදි.

882. දුගතියට යනසුලු එබඳු බොහෝ පව්කම් කොට කර්මවිපාකය විසින් ස්පර්ශ කරනලද්දෙම් ණය නැති ව සිව්පසය වළඳමි.

883. නුවණ නැති බාලජනයෝ ප්‍රමාදයෙහි පුනපුනා යෙදෙති, නුවණැත්තෝ වැළිත් ශ්‍රෙෂ්ඨධනයක් මෙන් අප්‍රමාදය රකී.

884. පමායෙන් කල් නො ගලවවු, කාමරතිසන්ථවය නො ලබවු, අප්‍රමාද වූ ධ්‍යාන කරන පුද්ගල තෙම පරමසුවය ලබයි.

885. මනා ඊමෙකි, නිරර්ථක වූයේ නො වේ, මා විසින් තෙල (පැවිදි-වෙමි යන කරුණ) නපුරු කොට සිතනලද්දේ නො වේ, (සාවද්‍ය අනවද්‍යාදි විසින්) විභාග කරනලද ධර්මයෙහි යමක් ශ්‍රෙෂ්ඨ නම් එ නිවන ට පැමිණියෙමි.

886. ස්වාගතං නාපගතං නෙතං දුම්මන්තිතං මම,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

887. අරඤ්ඤෙ රුක්ඛමූලෙ වා පබ්බතෙසු ගුහාසු වා,
තත්ථ තත්ථෙව අට්ඨාසිං උබ්බිග්ගමනසො තදා.

888. සුඛං සයාමි ඨායාමි සුඛං කප්පෙමි ජීවිතං,
අහත්ථපාසො මාරස්ස අහො සත්ථානුකම්පිතො.

889. බ්‍රහ්මජච්චො පුරෙ ආසිං උදිච්චො උභතො අහු,[1]
සොජ්ජ පුත්තො සුගතස්ස ධම්මරාජස්ස සත්ථුනො.

890. වීතතණ්හො අනාදානො ගුත්තද්වාරො සුසංවුතො,
අඝමූලං වධිත්වාන[2] පත්තො මෙ ආසවක්ඛයො.

891. පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං,
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා'ති.

ඉත්ථං සුදං ආයස්මා අඞ්ගුලිමාලො ථෙරො ගාථායො අභාසිත්ථා'ති

**අඞ්ගුලිමාලත්ථෙරගාථා.**

**20. 1. 9**

892. පහාය මාතාපිතරො භගිනී ඤාතිභාතරො,
පඤ්චකාමගුණෙ හිත්වා අනුරුද්ධො'ව ඣායතු.

893. සමෙතො නච්චගීතෙහි සම්මතාළප්පබොධනො,
න තෙන සුද්ධිමජ්ඣගං[3] මාරස්ස විසයෙ රතො.

894. එතං ච සමතික්කම්ම රතො බුද්ධස්ස සාසනෙ,
සබ්බොඝං සමතික්කම්ම අනුරුද්ධො'ව ඣායති.

895. රූපා සද්දා රසා ගන්ධා ඵොට්ඨබ්බා ච මනොරමා,
එතෙ ච සමතික්කම්ම අනුරුද්ධො'ව ඣායති.

896. පිණ්ඩපාතා පටික්කන්තො[4] එකො අදුතියො මුනි,
එසති පංසුකූලානි අනුරුද්ධො අනාසවො.

897. විචිනී අග්ගහී ධොවී රජයී ධාරයී මුනි,
පංසුකූලානි මතිමා අනුරුද්ධො අනාසවො.

1. අහුං - PTS. 2. වමිත්වාන - PTS. 3. සුද්ධිමජ්ඣගා - සීමු 1, 2 PTS මජ්ඣං.
4. පිණ්ඩපාතමතික්කන්තො - සීමු. 1, 2. ප පිණ්ඩපාතපටික්කන්තො - PTS.

886. මනා ඊමෙකි, තිරශ්චීන වූයේ නො වේ, මා විසින් තෙල නපුරු කොට සිතනලද්දේ නො වේ, ත්‍රිවිද්‍යාව අනුක්‍රමයෙන් ලබනලද යැ, බුදුන් ගේ අනුශාසනය කරනලදි.

887. අරණ්‍යයෙහි හෝ රුක්මුල හෝ පර්වතයෙහි හෝ ගුහායෙහි හෝ ඒ ඒ තැන්හි මැ කලකුළුසිත් ඇති වැ එද සිටියෙමි.

888. සුවසේ හොවිමි, සිටිමි, සුවසේ දිවි ගෙවමි, මරහු ගේ අත් පසින් බැහැර යෙමි, අසිරි යැ! ශාස්තෘහු විසින් අනුකම්පිතයෙමි.

889. පෙර බ්‍රාහ්මණජාතික වීමි, (මා පිය) දෙපසින් පරිශුද්ධ වීමි, ඒ මම අද සුගත වූ ධර්මරාජන් වූ ශාස්තෘහු ගේ පුත්‍රයෙමි.

890. පහ කල තෘෂ්ණා ඇතියෙම් උපාදාන රහිතයෙම් ඉඳුරන්හි වසන ලද දොර ඇතියෙම් සුසංවෘත වූයෙම් වෙමි. දුක්මුල් සිඳැ මා විසින් ආශ්‍රවක්‍ෂය (නිවන) ලබනලද්දේ යි.

891. මා විසින් ශාස්තෘන් වහන්සේ ඇසුරු කරනලදහ, බුදුන්ගේ අනුශාසනය කොට නිමවනලදි, ගුරු බර බහා තබනලද්දේ යැ තෘෂ්ණාව උපුරනලද්දී යැ.

මෙසේ ආයුෂ්මත් අඞ්ගුලිමාල ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ යි.

අඞ්ගුලිමාල ස්ථවිරගාථා යි.

## 20. 1. 9

892. මාපියන්, සොහොවුරි නෑ සොහොවුරන් හැරදමා පස්කම්ගුණ හැරදමා (යමෙක් ධ්‍යාන කෙරේ නම් හෙතෙම) අනුරුද්ධමුනි මෙත් ධ්‍යාන කෙරේ.

893. නෘත්‍යගීතයෙන් යුක්ත වූයෙම්, කුළුතාලම්න් පිබිදෙනසුලු වූයෙම්, කාමගුණයෙහි ඇලුණෙම් එයින් ශුද්ධියට නො පැමිණියෙම්.

894. තෙල පස්කම් ගුණය ද ඉක්ම බුදුසසුන්හි ඇලුණේ (කාමාදි) සියලු ඔඝයන් මැනැවින් ඉක්ම අනුරුද්ධ මෙත් ධ්‍යාන කෙරේ.

895. රූපයෝ ද ශබ්දයෝ ද රසයෝ ද, ගන්ධයෝ ද ස්පර්ශයෝ ද, සිත්කලු වූවෝ ය, ඔවුන් ද ඉක්ම (ධ්‍යාන කරන්නේ) අනුරුද්ධ මෙත් ධ්‍යාන කෙරේ.

896. නිරාශ්‍රව වූ අනුරුද්ධමුනි තෙම පිණ්ඩපාතයෙන් නැවැත්තේ එකලා වූයේ දෙවැන්නක (තෘෂ්ණාව) නැත්තේ පංශුකූලයන් සොයයි.

897. සමෘතිමත් වූ නිරාශ්‍රව වූ අනුරුද්ධමුනි තෙම පංශුකූලයන් ගත්තේ ය, දෙවී යැ, රැඳී යැ, දැරී යැ.

898. මහිච්ඡො ච අසන්තුට්ඨො සංසට්ඨො යො ච උද්ධතො,
තස්ස ධම්මා ඉමෙ හොන්ති පාපකා සඞ්කිලෙසිකා.

899. සතො ච හොති අප්පිච්ඡො සන්තුට්ඨො අවිඝාතවා,
පවිවෙකරතො විත්තො නිච්චමාරද්ධවීරියො.

900. තස්ස ධම්මා ඉමෙ හොන්ති කුසලා බොධිපක්ඛිකා,
අනාසවො ච සො හොති ඉති වුත්තං මහෙසිනා.

901. මම සඞ්කප්පමඤ්ඤාය සත්ථා ලොකෙ අනුත්තරො,
මනොමයෙන කායෙන ඉද්ධියා උපසඞ්කමි.

902. යදා මෙ අහු සඞ්කප්පො තතො උත්තරි දෙසයි,
නිප්පපඤ්චරතො බුද්ධො නිප්පපඤ්චමදෙසයි.

903. තස්සාහං ධම්මමඤ්ඤාය විහාසිං සාසනෙ රතො,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

904. පඤ්චපඤ්ඤාසවස්සානි යතො නෙසජ්ජිකො අහං,
පඤ්චවීසතිවස්සානි යතො මිද්ධං සමූහතං.

905. නාහු අස්සාසපස්සාසා ඨිතචිත්තස්ස තාදිනො,
අනෙජො සන්තිමාරබ්භ චක්ඛුමා පරිනිබ්බුතො.

906. අසල්ලීනෙන චිත්තෙන වෙදනං අජ්ඣවාසයි,
පජ්ජොතස්සෙව නිබ්බානං විමොක්ඛො චෙතසො අහු.

907. එතෙ පච්ඡිමකා දානි මුනිනො ඵස්සපඤ්චමා,
නාඤ්ඤෙ ධම්මා භවිස්සන්ති සම්බුද්ධෙ පරිනිබ්බුතෙ.

908. නත්ථි දානි පුනාවාසො දෙවකායස්මි[1] ජාලිනි,
වික්ඛීණො ජාතිසංසාරො නත්ථි දානි පුනබ්භවො.

909. යස්ස මුහුත්තෙන[2] සහස්සධා ලොකො සංවිදිතො සබ්‍රහ්මකප්පො,
වසී ඉද්ධිගුණෙ චුතූපපාතෙ කාලෙ පස්සති දෙවතා ස භික්ඛු.[3]

910. අන්නහාරො[4] පුරෙ ආසිං දලිද්දො ඝාසහාරකො,
සමණං පටිපාදෙසිං උපරිට්ඨං යසස්සිනං.

911. සොම්හි සක්‍යකුලෙ ජාතො අනුරුද්ධො'ති මං විදූ,
උපෙතො නච්චගීතෙහි සම්මතාළප්පබොධනො.

1. දෙවකායස්මි - PTS. දෙවකායස්මිං - ප 2. මුහුත්තෙන - PTS
3. භික්ඛුනො - සිමු 1, 2. 4. අන්නභාරං - සිමු. 1, 2.

898. යමෙකුත් මහත් වූ ආශා ඇත්තේත් සන්තොෂ රහිත වූයේත් ආකීර්ණවිහාර ඇත්තේත් විසුරුණුසිත් ඇත්තේත් වේ ද, ඔහුට මේ ධර්මයෝ ලාමක වූ සාංක්ලේශිකයෝ වෙත්.

899. (යමෙකුත්) සිහි ඇත්තේත් අල්පෙච්ඡ වූයේත් සන්තුෂ්ට වූයේත් සමාහිත වූයේත් පවිවේකයෙහි ඇලුණේත් නිරතුරු ආරබ්ධවීර්‍යය ඇත්තේත් වේ ද,

900. ඔහුට මේ ධර්මයෝ බෝධිපාක්ෂික කුශලයෝ වෙත්, හෙතෙම අනාස්‍රවත් වේ යැ යි මහර්ෂිහු විසින් වදුරනලදි.

901. ලෝකයෙහි නිරුත්තර වූ ශාස්තෲත් වහන්සේ මා ගේ සංකල්පයන් දැන මනෝමය කයින් ඍද්ධියෙන් එළඹියහ.

902. යම් කලෙක මට සංකල්පයෙක් වී ද (ශාස්තෲන් වහන්සේ) ඉන් මතුයෙහි දෙසූහ. ලෝකෝත්තරධර්මයෙහි ඇලුණු බුදුන් වහන්සේ ලෝකෝත්තරධර්මය දෙසූහ.

903. මම උන් වහන්සේ ගේ ධර්මය දැනගෙන ශාසනයෙහි ඇලුණෙම් විසීමි, මා විසින් ත්‍රිවිද්‍යාව ලබනලද යැ, බුදුන්ගේ අවවාදය කරන ලදි.

904. යම් කලෙක පටන් මම නෙසජ්ජික වීම් ද, ඒ මට පස්පනස්වසෙකි. යම් කලෙක පටන් මා විසින් නිදි වරනලද ද ඒ මට පස්විසිවසෙකි.

905. (චතුර්ථධ්‍යානයෙහි) නැවැති සිත් ඇති තාදිහු (බුදුන්) ගේ ආශ්වාස ප්‍රශ්වාසයෝ නො වූහ, අනෙජ (තෘෂ්ණා රහිත බැවින් හෝ සමාධි විසින් අකම්ප්‍ය බැවින්) වූ පසැස් ඇත්තේ නිර්වාණය අරමුණු කොට පිරිනිවියේ යි.

906. නො හැකුළුණු සිතින් (මාරණාන්තික) වෙදනාව ඉවසී, ප්‍රදීපයාගේ නිවීම සෙයින් චිත්තයාගේ විමොක්ෂය වී.

997. දැන් මොහු මුනිහු ගේ පශ්චිමක වූ ස්පර්ශපඤ්චමකධර්මයෝ යි. සම්බුදුන් පිරිනිවි කල්හි (පරිනිර්වාණචිත්ත චෛතසිකයෙන්) අන්‍යධර්මයෝ නො වෙති.

908 ජාලිනිය! මෙතැන් පටන් දේවකායයෙහි යළි මා ගේ වාසයෙක් නැත, ජාතිසංසාරය ක්ෂය වූයේ ය, මින් මතු පුනර්භවයෙක් නැති.

909. යම් ක්ෂීණාස්‍රව මහණක්හු විසින් බඹලොව සහිත සහස්‍රප්‍රකාරලෝකය ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ ද ඍද්ධිගුණයෙහි ද චුතූපපාතඥානයෙහි ද වශිප්‍රාප්ත වූ එ මහණ තෙම එළඹි කල් ඇති කල්හි දෙවියන් දකී.

910. පෙර දිළිඳු වූයෙම් (බැලයට) ඉඳුල් අහර ගෙන යන්නෙම් 'අන්නභාර (නම්) වීමි. සමිතපාපි (සමණ) වූ කීර්තිමත් වූ 'උපරිට්ඨ නම් පසේ බුදුනට (දන්) පිළිගැන්වීමි.

911. එ මම ශාක්‍යකුලයෙහි උපන්මි, 'අනුරුද්ධ' යැ යි මා දත්හ නෘත්‍යගීතයෙන් පිරිවරන ලද්දෙම් කුළුතාළම්න් පිබිදෙනසුලු වූයෙම්

912. අථද්දසාසිං සම්බුද්ධං සත්ථාරං අකුතොභයං,
තස්මිං චිත්තං පසාදෙත්වා පබ්බජිං අනගාරියං.

913. පුබ්බෙනිවාසං ජානාමි යත්ථ මෙ වුසිතං පුරෙ,
තාවතිංසෙසු දෙවෙසු අට්ඨාසිං සතජාතියා.

914. සත්තක්ඛත්තුං මනුස්සින්දො අහං රජ්ජමකාරයිං,
චාතුරන්තො විජිතාවී ජම්බුසණ්ඩස්ස[1] ඉස්සරො,
අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අනුසාසයිං.

915. ඉතො සත්ත තතො[2] සත්ත සංසාරානි චතුද්දස,
නිවාසමභිජානිස්සං දෙවලොකෙ ඨිතො තදා.

916. පඤ්චඞ්ගිකෙ සමාධිම්හි සන්තෙ[3] එකොදිභාවිතෙ,
පටිප්පස්සද්ධිලද්ධම්හි[4] දිබ්බචක්ඛු[5] විසුජ්ඣි මෙ.

917. චුතූපපාතං ජානාමි සත්තානං ආගතිං ගතිං,
ඉත්ථභාවඤ්ඤථාභාවං ඣානෙ පඤ්චඞ්ගිකෙ ඨිතො.

918. පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං,
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා.

919. වජ්ජීනං වෙළුවගාමෙ අහං ජීවිතසඞ්ඛයා,
හෙට්ඨතො වෙළුගුම්බස්මිං නිබ්බායිස්සං අනාසවො’ති.

ඉත්ථං සුදං ආයස්මා අනුරුද්ධො ථෙරො ගාථායො අභාසිත්ථා’ති.

**අනුරුද්ධත්ථෙරගාථා.**

## 20. 1. 10

920. සමණස්ස අහු[6] චින්තා පුප්ඵිතම්හි මහාවනෙ,
එකග්ගස්ස නිසින්නස්ස පවිවිත්තස්ස ඣායිනො.

921. අඤ්ඤථා ලොකනාථම්හි තිට්ඨන්තෙ පුරිසුත්තමෙ,
ඉරියං ආසි භික්ඛූනං අඤ්ඤථා දානි දිස්සති.[7]

922. සීතවාතපරිත්තානං හිරිකොපීනඡාදනං,
මත්තට්ඨියං අභුඤ්ජිංසු සන්තුට්ඨා ඉතරීතරෙ.

223. පණීතං යදි වා ලූඛං අප්පං වා යදි වා බහුං,
යාපනත්ථං අභුඤ්ජිංසු අගිද්ධා නාධිමුච්ඡිතා.

924. ජීවිතානං පරික්ඛාරෙ භෙසජ්ජෙ අථ පච්චයෙ,
න බාළ්හං උස්සුකා ආසුං යථා තෙ ආසවක්ඛයෙ.

---

1. ජම්බුමණ්ඩස්ස - සිමු. 1, 2. 2. ඉතො - PTS
3. සන්තො - සිමු 1, 2. 4. පටිප්පස්සද්ධිලද්ධොම්හි - සිමු 1, 2. පටිප්පස්සද්ධිලද්ධාම්හි - PTS. 5. දිබ්බචක්ඛුං - PTS.
6. අහූ - PTS 7. දිස්සතෙ - PTS.

912. ඉක්බිති තිහීය වූ ශාස්තෘ වූ සම්බුදුන් දිටිම්, උන් වහන්සේ කෙරෙහි සිත පහදවා පැවිද්දට පැමිණියෙමි.

913. පෙර මා විසින් යම් නොයෙක වසනලද ද (ඒ) පූර්වේනිවාසය දනිමි. තව්තිසා දෙවියන් අතුරෙහි සියක්දුහි සිටියෙමි.

914. මම සත් ඉඩක් නරේන්ද්‍ර වූයෙමි රාජ්‍යය කෙළෙමි, සාගරපර්‍ය්‍යන්ත පෘථිවියට ඊශ්වර වූයෙමි දික්විජය ඇතියෙමි දඹදිවට ඉසුරු වූයෙමි දඬු නැති ව, අවි නැති ව, දැහැමින් අනුශාසනා කෙළෙමි.

915. මෙ මිනිස්ලොවින් සැව දෙව්ලො ව සත්වරෙක, එ දෙව්ලොවින් සැව මිනිස්ලොව සත්වරෙක සි භවාන්තර තුදුසෙක එදු දෙව්ලොව සිටියෙම් පූර්වේනිවාසය දනිමි.

916. ශාන්ත වූ එකඟ බවට ගියා වූ චතුර්ථධ්‍යාන සමාධිය ඇති කල්හි (කෙලෙසුන්) සන්හිඳීම ඇති කල්හි මාගේ දිව්‍යචක්ෂුස විශුද්ධ වී.

917. පඤ්චාඞ්ගික (චතුර්) ධ්‍යානයෙහි සිටියෙම් සත්ත්වයන්ගේ ච්‍යුති උත්පත්ති, ගතාගති, ඉත්ථම්භාවාන්‍යථාභාව දනිමි.

918. මා විසින් ශාස්තෘන් වහන්සේ ඇසුරු කරනලදහ, බුදුන්ගේ ශාසනය කරනලද යෑ, ගුරුබර බහා තබනලද්දේ ය, තෘෂ්ණාව මුලුසුන් කරනලදු.

919. මම ආයුක්ෂය හෙයින් වැදූරට 'වෙළුව' නම් ගම්හි හුණලැහැබ යට නිරාස්‍රව ව පිරිනිවෙන්නෙමි'යි.

මෙසේ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ ගාථා වදාලහ'යි.

අනුරුද්ධ ස්ථවිරගාථා යි.

## 20. 1. 10

920. මහ (සල්) වනය පිපිසිටි කල්හි (එහි) හුන් එකඟ වූ සිත් ඇති ප්‍රකම්පිවේ ඇති ධ්‍යාන කරනසුලු වූ (පාරාසරිය) මහණහට චින්තාවෙ (සිතිවිල්ලෙක්) වූ ය.

921. පුරුෂෝත්තම වූ ලෝහිමියන් සිටුනා කල්හි භික්ෂූන්ගේ පැවැත්ම අන් අයුරු (වෙනස්) වී යෑ. දැන් අන් අයුරින් දක්නාලැබේ.

922. ඉතරීතර ප්‍රත්‍යයෙහි සන්තුෂ්ට වූවාහු ශීතවාතයෙන් රැක්ම හිරිකොපීනප්‍රතිච්ඡාදන වැස්ම පමණක් ප්‍රයෝජන කොට සිවුරු වැළඳූහ.

923. ඉදින් පිණී වූ හෝ රළු වූ හෝ මඳ වූ හෝ බොහෝ වූ හෝ බොදුන් ගිජු නො වූවාහු නො බැඳුණාහු යාපනය පිණිස වැළඳූහ.

924. ඔහු දිවිපැවැත්මට කරුණු වූ බෙහෙත් පසයෙහි ආස්‍රවක්ෂයෙහි තරම් දැඩි උත්සා ඇතියෝ නො වූහ.

925. අරඤ්ඤෙ රුක්ඛමූලෙසු කන්දරාසු ගුහාසු ච,
විවෙකමනුබ්‍රූහෙන්තා[1] විහංසු[2] තප්පරායනා.

926. නීචා නිවිට්ඨා සුභරා මුදූ අත්ථද්ධමානසා,
අබ්‍යාසෙකා අමුඛරා අත්ථචින්තාවසානුගා.

927. තතො පාසාදිකං ආසි ගතං භුත්තං නිසෙවිතං,
සිනිද්ධා තෙලධාරා'ව අහොසි ඉරියාපථො.

928. සබ්බාසවපරික්ඛීණා මහාඣායී මහාහිතා,
නිබ්බුතා දානි තෙ ථෙරා පරිත්තා දානි තාදිසා.

929. කුසලානං ච ධම්මානං පඤ්ඤාය ච පරික්ඛයා,
සබ්බාකාරවරූපෙතං ලුජ්ජතෙ ජිනසාසනං.

930. පාපකානං ච ධම්මානං කිලෙසානං ච යො උතු,
උපට්ඨිතා විවෙකාය යෙ ච සද්ධම්මසෙසකා.

931. තෙ කිලෙසා පවඩ්ඪන්තා ආවිසන්ති බහුං ජනං,
කීළන්ති මඤ්ඤෙ බාලෙහි උම්මත්තෙහි ච රක්ඛසා.

932. කිලෙසෙහාභිභූතා තෙ තෙන තෙන විධාවිතා,
නරා කිලෙසවත්ථූසු සසඞ්ගාමෙව[3] ඝොසිතෙ.

933. පරිච්චජිත්වා සද්ධම්මං අඤ්ඤමඤ්ඤෙහි භණ්ඩරෙ,
දිට්ඨිගතානි අන්වෙන්තා ඉදං සෙය්‍යොති මඤ්ඤරෙ.

934. ධනං ච පුත්තං භරියං ච ඡඩ්ඩයිත්වාන නිග්ගතා,
කටච්ඡුභික්ඛාහෙතූ[4] අකිච්චානි නිසෙවරෙ.

935. උදරාවදෙහකං භුත්වා සයන්තුත්තානසෙය්‍යකා,
කථා වඩ්ඪෙන්ති[5] පටිබුද්ධා[6] යා කථා සත්ථුගරහිතා.

936. සබ්බකාරුකසිප්පානි චිත්තීකත්වාන[7] සික්ඛරෙ
අවූපසන්තා අජ්ඣත්තං සාමඤ්ඤත්ථො'ති අච්ඡති.

937. මත්තිකං තෙලං චුණ්ණං ච උදකාසනභොජනං,
ගිහීනං උපනාමෙන්ති ආකඞ්ඛන්තා බහුත්තරං.

938. දන්තපොනං කපිත්ථං ච පුප්ඵං ඛාදනියානි[8] ච,
පිණ්ඩපාතෙ ච සම්පන්නෙ[9] අම්බෙ ආමලකානි ච.

939. භෙසජ්ජෙසු යථා වෙජ්ජා කිච්චාකිච්චෙ යථා ගිහී,
ගණිකා'ව විභූසායං ඉස්සරෙ ඛත්තියා යථා.

940. නෙකතිකා වඤ්චනිකා කූටසක්ඛී අපාටුකා,[10]
බහූහි පරිකප්පෙහි ආමිසං පරිභුඤ්ජරෙ.

---

1. විවෙකමනුබ්‍රූහන්ත - ම, PTS. 2. විහිංසු - ම, PTS.
3. සයං ගෙහෙව - PTS. 4 කටච්ඡුභික්ඛහෙතුපි - PTS. 5. කථා වදෙන්ති - PTS.
6. පබුද්ධා - ම. 7. චිත්තිකත්වාන - PTS. 8. පුප්ඵඛාදනියානි - සීමු. 1, 2
9. සම්පණ්ණා - සීමු 1, 2. 10 අවාටුකා - PTS.

925. අරණ්‍යයෙහි රුක්මුල්හි කඳුරුවල හා ගුහාවල විවේකය වඩන්නාහු විවේකයෙහි නමිත වැ විසූහ.

926. යටත් පැවැතුම් ඇත්තාහු සසුන්හි වැදගත්තාහු සුභර වූවාහු මොළොක් වූවාහු නො දැඩිසිත් ඇත්තාහු කෙලෙස් වැගිරීම් නැත්තාහු මුඛර නො වූවාහු අර්ථචින්තාවශයට ගියාහු යි.

927. එහෙයින් ගමන, බොජුන, ඇසුර ප්‍රසාදික වී යැ ඉරියවු තෙල්දහරක් මෙන් සිනිඳු වී.

928. සියලු ආස්‍රවයන් ක්‍ෂය කළා වූ මහත් - ධ්‍යායී වූ මහත් - හිතයන් වූ ඒ තෙරවරු දැන් පිරිනිවියහ, එබන්දෝ දැන් අල්පයහ.

929. කුශලධර්මයන් හා ප්‍රඥව ගේ අභාව හෙයින් (ආදිකාල්‍යාණතාදි) සියලු ආකාරයෙන් යුක්ත වූ ජිනශාසනය වැනැසේ.

930 පාපධර්මයන්ට ද ක්ලේශයන්ට ද මේ කාලය යි. යම් කෙනෙක් විවේකයට එළඹියාහු නම් ඔහු ද සද්ධර්මශේෂක වෙත්. (ප්‍රතිපත්තිය විනා ලොවුතුරු දහම් පල ගන්වන්නට නො සමත් බව කී සේ යි.)

931. ඒ කෙලශයෝ වැඩෙමින් බොහෝ දෙනාට අවුසිත් (ආවිෂ්ට වෙත්). උමතුවන් සමග රකුසන් මෙන් බාලයන් සමග කෙළිති සිතමි.

932. සඞ්ග්‍රාමභූමියෙහි (සෙන්පතිහු විසින්) අණ කළ කල්හි සෙයින් කෙලෙසුන් විසින් අභිභවනය කරනලද ඒ මිනිස්සු කෙලශවස්තූන්හි ඒ ඒ අරමුණු විසින් දුවවනලද්දාහු-

933. සද්ධර්මය හැරදමා ඔවුනොවුන් සමග කලහ කෙරෙත්, මිථ්‍යාදෘෂ්ටින් අනුගමනය කරන්නාහු මේ මැ ශ්‍රේෂ්ඨ යැ යි සිතත්.

934. ධනයත් අඹුදරුවනුත් හැරදමා ගිහිගෙන් නික්මුණාහු එවක් අහර හේතුවිනුදු නො කටයුතු කෙරෙත්.

935. කුස පුරා වළඳා උඩුකුරු වැ හොවිත්. පිබිදුණාහු යම් කථාවක් ශාස්තෘන් විසින් ගරහනලද නම් ඒ කථා පෝෂණය කෙරෙත්.

936. නො සන්හුන් සිත් ඇත්තාහු සියලු කාර්මිකශිල්පයන් ආදරය කොට උ[illegible]න්, ශ්‍රාමණ්‍යාර්ථය වෙත් වැ පවතී.

937. මතුයෙහි බොහෝ (ලාභ) කැමැත්තාහු මැටි, තෙල්, නහනසුණු, දිය, අසුන් හා බොජුන් ද ගිහීනට පිරිනමත්.

938. දැහැටි ද දිවුල්පල ද මල් ද කැවිලි ආදිය ද සුපයෙන් යුත් පිඩුවා ද අඹපල ද ඇඹුළුපල ද (ගිහීනට පිරිනමත්.)

939. (ගිහීනට) බෙහෙත් කිරීමෙහි වෙදකු වැන්න, කුදුමහකටයුතුතෙහි ගිහියකු වැන්න. සිරුරු සැරසීමෙහි ගණිකාවක වැන්න, ඓශ්වර්‍ය්‍යයෙහි ක්‍ෂත්‍රියයකු වැන්න.

940. ශඨ බැව්හි නියුක්ත වූවාහු කපට ක්‍රියායෙහි නියුක්ත වූවාහු බොරු සාක්‍ෂ්‍ය කියනසුලු වූවාහු අසංයම පැවැතුම් ඇත්තාහු බොහෝ වූ මිථ්‍යාජීවයන්ගෙන් ආමිස වළඳත්.

941. ලෙසකප්පෙ පරියායෙ පරිකප්පෙනුධාවිතා,
ජීවිකත්ථා උපායෙන සඞ්කඩ්ඪන්ති බහුං ධනං.

942. උපට්ඨාපෙන්ති පරිසං කම්මතො නො ච ධම්මතො,
ධම්මං පරෙසං දෙසෙන්ති ලාභතො නො ච අත්ථතො.

943. සඞ්ඝලාභස්ස භණ්ඩන්ති සඞ්ඝතො පරිබාහිරා,[1]
පරලාභූපජීවන්තා[2] අහිරීකා[3] න ලජ්ජරෙ.

944. නානුයුත්තා තථා එකෙ මුණ්ඩා සඞ්ඝාටිපාරුතා,
සම්භාවනංයෙවිච්ඡන්ති ලාභසක්කාරමුච්ඡිතා.

945. එවං නානප්පයාතම්හි න දැනි[4] සුකරං තථා,
අඵුසිතං[5] වා ඵුසිතුං ඵුසිතං නානුරක්ඛිතුං.

946. යථා කණ්ටකට්ඨානම්හි චරෙය්‍ය අනුපාහනො,
සතිං උපට්ඨපෙත්වාන එවං ගාමෙ මුනී චරෙ.

947. සරිත්වා පුබ්බකෙ යොගී තෙසං වත්තමනුස්සරං,
කිඤ්චා’පි පච්ඡිමො කාලො ඵුසෙය්‍ය අමතං පදං.

948. ඉදං වත්වා සාලවනෙ සමණො භාවිතින්ද්‍රියො,
බ්‍රාහ්මණො පරිනිබ්බායී ඉසි ඛීණපුනබ්භවො’ති.

ඉත්ථං සුදං ආයස්මා පාරාසරියො ථෙරො ගාථායො අභාසිත්ථා’ති.

**පාරාසරියථෙරගාථා.**

**තස්සුද්දානං:**

අධිමුත්තො පාරාසරියො තෙලකානි රට්ඨපාලො,
මාලුඞ්ක්‍යසෙලො භද්දියො අඞ්ගුලී දිබ්බචක්ඛුකො.
පාරාසරියො දසෙතෙ වීසතිනිපාතම්හි පරිකිත්තිතා,
ගාථායො ද්වෙසතා හොන්ති පඤ්චතාලීස උත්තරින්ති.

# වීසතිනිපාතො නිට්ඨිතො

1. පරිබාහියා - ප. 2. පරලාභොපජීවන්තා - PTS. 3. අහිරිකාව - PTS.
4. හිදානි - PTS 5. අප්ඵුසිතං - සිමු. 1, 2.

941. කප්පියප්‍රතිරූපක වූ ප්‍රයෝග ඇති කැපයෙහි දිවගිය ජීවිකාව ඇත්තෝ (ප්‍රත්‍යය උපදවන) උපායයෙන් බොහෝ ධනය ඇදගනිත්.

942. පිරිස ලවා උවැටැන් කරවත්, (එ ද) කම් හෙයිනි, වැළිත් ධම් හෙයින් නො වේ, අනුනට දහම් දෙසත්, (එද) ලාභ නිමිත්තෙනි, වැළිත් අර්ථ නිමිත්තෙන් නො වේ.

943. සඞ්ඝයා කෙරෙන් බැහැර වූවාහු සඞ්ඝලාභයට කලහ කෙරෙති අනුන් ගේ ලාභයෙන් රැකෙන්නා වූ (ඒ) අහිරිකයෝ ලජ්ජා නො වෙත්.

944 එසේ මැ ශ්‍රමණධර්මයෙහි නො යෙදුණු මුඩු වූ සඟල පෙරෙව් ඇතැම් කෙනෙක් ලාභසත්කාරයෙහි මුසපත් වූවාහු සම්භාවනාය මැ කැමැති වෙත්.

945. මෙසේ විවිධත්වයට ගිය කල්හි මෙකල ස්පර්ශ නො කළ (ධ්‍යානාදී) දහම් ස්පර්ශ කරන්නට හෝ ස්පර්ශ කළ දහම් රක්නට හෝ සුකර නො වේ.

946. යම්සේ වහන් නැතියෙක් කටුපියසෙහි හැසිරෙන්නේ නම් එපරිද්දෙන් මුනි තෙම සිහි එළවා ගෙන ගමෙහි හැසිරෙන්නේ යි.

947. පූර්වයෙහි වූ යෝගීන් සිහි කොට ඔවුන්ගේ වත් අනුගමනය කරන්නේ ඉදින් පශ්චිමවයස් ඇත්තේ නමුදු නිවනට පැමි-ණෙන්නේ යි.

948. වඩනාලද ඉඳුරන් ඇති (බාහිතපාපී හෙයින්) බ්‍රාහ්මණ වූ සෘෂි වූ ක්ෂය කළ පුනර්භවය ඇති (පාරාසරිය) මහණ තෙම සල්වෙනෙහි දී මෙය වදරා පිරිනිවියේ යි.

මෙසේ ආයුෂ්මත් පාරාසරිය ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ යි.

**පාරාසරිය ස්ථවිරගාථා යි.**

**උද්දානය:**

අධිමුත්ත යැ, පාරාසරිය යැ, තේලකානි යැ, රට්ඨපාල යැ, මාලුඞ්ක්‍යපුත්ත යැ, සේල යැ, භද්දිය යැ, අඞ්ගුලිමාල යැ, අනුරුද්ධ යැ, පාරාසරිය යැ යි මේ දශ දෙනා විසි වැනි නිපාතයෙහි ප්‍රසිද්ධ යැ, ගාථාවෝ පන්සාළිස් තුරා දෙසියයක් වෙති.

## වීසතිනිපාතය නිමි.

# 30. තිංසනිපාතො

### 30. 1. 1

949. පාසාදිකෙ බහූ දිස්වා භාවිතත්තෙ සුසංවුතෙ,
ඉසි පණ්ඩරස්ස ගොත්තො අපුච්ඡි ඵුස්සසව්හයං.

950. කිංඡන්දා කිමධිප්පායා කිමාකප්පා භවිස්සරෙ,
අනාගතම්හි කාලම්හි තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

951. සුණොහි වචනං මය්හං ඉසිපණ්ඩරසව්හය,
සක්කච්චං උපධාරෙහි ආචික්ඛිස්සාම්‍යනාගතං.

952. කොධනා උපනාහී ච මක්ඛී ථම්භී සඨා බහූ,
ඉස්සුකී නානාවාදා ච භවිස්සන්ති අනාගතෙ.

953. අඤ්ඤාතමානිනො ධම්මෙ ගම්භීරෙ තීරගොචරා,
ලහුකා අගරූ ධම්මෙ අඤ්ඤමඤ්ඤමගාරවා.

954. බහූ ආදීනවා ලොකෙ උප්පජ්ජිස්සන්ත්‍යනාගතෙ,[1]
සුදෙසිතං ඉමං ධම්මං කිලෙසිස්සන්ති දුම්මතී.

955. ගුණහීනා'පි සඞ්ඝම්හි වොහරන්තා[2] විසාරදා,
බලවන්තො භවිස්සන්ති මුඛරා අස්සුතාවිනො.

956. ගුණවන්තො'පි සඞ්ඝම්හි වොහරන්තා යථාත්ථතො,
දුබ්බලා තෙ භවිස්සන්ති හිරීමනා අනත්ථිකා.

957. රජතං ජාතරූපං ච ඛෙත්තං වත්ථුමජෙළකං,
දාසිදාසං ච දුම්මෙධා සාදියිස්සන්ත්‍යනාගතෙ.[3]

958. උජ්ඣානසඤ්ඤිනො බාලා සීලෙසු අසමාහිතා,
උන්නළා විචරිස්සන්ති කලහාභිරතා මගා.

959. උද්ධතා ච භවිස්සන්ති නීලචීවරපාරුතා,
කුහා ථද්ධා ලපා සිඞ්ගී චරිස්සන්ත්‍යරියා විය.

960. තෙලසණ්ඨෙහි[4] කෙසෙහි චපලං අඤ්ජනක්ඛිකා[5]
රථියාය ගමිස්සන්ති දන්තවණ්ණිකපාරුතා[6]

961. අජෙගුච්ඡං විමුත්තෙහි සුරත්තං අරහද්ධජං,
ජිගුච්ඡිස්සන්ති කාසාවං ඔදාතෙසු සමුච්ඡිතා.

962. ලාභකාමා භවිස්සන්ති කුසීතා හීනවීරියා,
කිච්ඡන්තා වනපත්ථානි[7] ගාමන්තෙසු වසිස්සරෙ.

---

1. උප්පජ්ජිස්සන්ති'නාගතෙ - PTS, ම. 2. වොහරන්ති - PTS.
3. සාදියිස්සන්ති'නාගතෙ - PTS. 4. තෙලසණ්ඨිහි - PTS.
5. අඤ්ජිතක්ඛිකා - PTS. 6. දන්තවණ්ණකපාරුතා - PTS 7. වනපත්තානි - PTS

# 30. තිංසතිනිපාතය

### 30. 1. 1

949. ප්‍රාසාදික වූ වඩනාලද සිත් ඇති සන්හුන් ඉඳුරන් ඇති බොහෝ දෙනා (භික්ෂූන්) දැක 'පණ්ඩරගොත්ත' නම් තවුස් තෙම 'ඵුස්ස' නමැති තෙරුන් විචාළේ යි.

950. අනාගතකාලයෙහි (භික්ෂූහු) කෙබඳු ඡන්ද ඇතියාහු කෙබඳු අදහස් ඇතියාහු කෙබඳු ආකල්ප ඇතියාහු වෙත් ද? විචාරනලද මට එය කියනු මැනැවි.

951. පණ්ඩරාභිධාන රුසිය, මා ගේ වචනය අසනු මැනැවැ, සකසා සලකනු මැනැවැ, අනාගතය ප්‍රකාශ කරන්නෙමි.

952. කිපෙනසුල්ලෝ ද බද්ධවෛර ඇත්තෝ ද ගුණමකුවෝ ද අතිමානයෝ ද නැතිගුණ පාල කරන්නෝ ද ඊර්‍ෂ්‍යා ඇත්තෝ ද වෙන් වෙන් දෘෂ්ටි ඇත්තෝ ද අනාගතයෙහි වන්නාහ.

953. ගැඹුරු දහම්හි දතිමි මාන ඇත්තාහු වෙරළ මැ ඇසුරු කළාහු චපල වූවාහු සද්ධර්මයෙහි ගෞරව නැත්තාහු අන්‍යොන්‍ය ගෞරව නැත්තාහු (අනාගතයෙහි වන්නාහ).

954. අනාගත ලෝකයෙහි බොහෝ ආදීනවයෝ උපදින්නාහ, මොනවට දෙසනලද මේ ආගමසද්ධර්මය දුර්මතීහු කෙලෙසන්නාහ.

955. අශ්‍රැතවත් ගුණහීනයෝ ද සඟමැද කථා කරන්නාහු බුහුටි වූවාහු රළුබස් ඇත්තාහු බලවත් වන්නාහ.

956. ගුණවත්තු ද සඟමැද අර්ථානුරූප වැ කථා කරන්නාහු ලජ්ජාසිත් ඇත්තාහු පලක් නැත්තාහු දුර්වල වන්නාහ.

957. දුෂ්ප්‍රාඥයෝ අනාගතයෙහි රන්-රිදී ද කෙත් වතු ද එළු තිරෙළු-වන් ද දැසිදසුන් ද ඉවසන්නාහ.

958. අගුණ කියන සිත් ඇති, සිව්පිරිසිදු සිල්හි සමාහිත නො වූ, උස් වූ හිස්මත් ඇති, කලහයෙහි ඇලුණු බාලයෝ මෘගයන් මෙන් හැසිරෙන්නාහ.

959. නිල්සිවුරු පෙරෙව්යාහු උඩඟු ද වන්නාහ, කුහු වැ දැඩි සිත් ඇති වැ ප්‍රත්‍යොත්පාදක කථා ඇති වැ ශෘඞ්ගාරචරිත ඇති වැ ආර්‍ය්‍ය-යන් මෙන් හැසිරෙන්නාහු ද වෙත්.

960. දල පැහැ සිවුරු පෙරෙව්යාහු තෙලින් මට කල කෙසින් යුතු වැ චපල වැ අඳුන් ඇඳි නුවන් ඇති වැ මහමඟ යන්නාහ.

961. සුදුවත්හි මොනොවට මූසපත් (ගිජු) වූවාහු ආර්‍ය්‍යයන් විසින් මොනොවට රඳනාලද (එහෙයින් මැ) පිළිකුල් නො කටයුතු අර්හත් ධ්වජය වූ කහවත පිළිකුල් කරන්නාහ.

962. කුසීතයෝ, හීනවීර්‍ය්‍යයෝ, ලාභකැමැතියෝ වන්නාහ. වානප්‍රස්ථ-සෙනාසනයන්හි කලාන්ත වන්නාහු ග්‍රාමාන්ත සෙනාසනයන්හි වසන්නාහ.

963. යෙ යෙ ලාභං ලභිස්සන්ති මිච්ඡාජීවරතා සදා,
තෙ තෙ'ව අනුසික්ඛන්තා භමිස්සන්ති[1] අසංයතා.

964. යෙ යෙ අලාභිනො ලාභං න තෙ පුජ්ජා භවිස්සරෙ,
සුපෙසලෙ'පි තෙ ධීරෙ සෙවිස්සන්ති න තෙ තදා.

965. පිලක්ඛුරජනං රත්තං ගරහන්තා සකං ධජං,
තිත්ථියානං ධජං කෙචි ධාරෙස්සන්ත්‍යවදාතකං[2].

966. අගාරවො ච කාසාවෙ තදා තෙසං භවිස්සති,
පටිසඞ්ඛා ච කාසාවෙ භික්ඛූනං න භවිස්සති.

967. අභිභූතස්ස දුක්ඛෙන සල්ලවිද්ධස්ස රුප්පතො,
පටිසඞ්ඛා මහාඝොරා නාගස්සාසි අචින්තියා.

968. ඡද්දන්තො හි තදා දිස්වා සුරත්තං අරහද්ධජං,
තාවදෙව භණී ගාථා ගජො අත්ථොපසංහිතා.

969. අනික්කසාවො කාසාවං යො වත්ථං පරිදහෙස්සති,
අපෙතො දමසච්චෙන න සො කාසාවමරහති.

970. යො ච වන්තකසාවස්ස සීලෙසු සුසමාහිතො,
උපෙතො දමසච්චෙන ස වෙ කාසාවමරහති.

971. විපන්නසීලො දුම්මෙධො පාකටො කාමකාරියො,
විබ්භන්තචිත්තො නිස්සුක්කො න සො කාසාවමරහති.

972. යො ච සීලෙන සම්පන්නො වීතරාගො සමාහිතො,
ඔදාතමනසඞ්කප්පො සවෙ කාසාවමරහති.

973. උද්ධතො උන්නළො බාලො සීලං යස්ස න විජ්ජති,
ඔදාතකං අරහති කාසාවං කිං කරිස්සති.

974. භික්ඛූ ච භික්ඛුනියො ච දුට්ඨචිත්තා අනාදරා,
තාදීනං මෙත්තචිත්තානං නිග්ගණ්හිස්සන්ත්‍යනාගතෙ.[3]

975. සික්ඛාපෙන්තා'පි ථෙරෙහි බාලා චීවරධාරණං,
න සුණිස්සන්ති දුම්මෙධා පාකටා කාමකාරියා.

976 තෙ තථා සික්ඛිතා බාලා අඤ්ඤමඤ්ඤං අගාරවා;
නාදියිස්සන්තුපජ්ඣායෙ ඛළුඞ්කො විය සාරථිං.

---

1. භජිස්සන්ති - PTS.
2. ධාරිස්සන්ත්‍යවදාතකං - සීමු. 1, 2.
3. නිග්ගහිස්සන්ති'නාගතෙ - PTS.

963. යම් යම් කෙනෙක් මිථ්‍යාජීවයෙහි ඇලුණාහු හැම කල්හි ලාභ ලබත් ද, ඔවුන් ඔවුන් අනු වැ හික්මෙන්නාහු අසංයත වැ හැසිරෙන්නාහ.

964. යම් යම් කෙනෙක් ලාභ නො ලබනසුලුහු නම් ඔහු පූජ්‍ය නො වන්නාහ, එකල ඔවුන් සුපේශලයන් වුව ද ප්‍රාඥයන් වුව ද ඔහු සේවනය නො කරන්නාහ.

965. කිසි කෙනෙක් කළුහුග කසවින් රදනාලද සවකීය ධවජය වූ කහවත ගරහන්නාහු තිත්ථිකයන්ගේ ධවජය වූ සුදුවත් දරන්නාහ.

966. එකල්හි කහවත කෙරෙහි ඔවුන්ගේ අගෞරවය ද වන්නේ යැ. කහවත්හි භික්‍ෂූන්ගේ ප්‍රත්‍යවෙක්‍ෂා ද නො වන්නේ යි.

967. විෂ සහිත හීයෙන් විදුනාලද (එහෙයින්) මැ දුකින් මඩනාලද ශරීරවිකාරයට පැමිණෙන්නා වූ (සදන්) ඇත්රජහට ද අවිනාත්‍ය වූ අතිශයින් ගුරු (බර) වූ ප්‍රත්‍යවෙක්‍ෂාව වූ.

968. ඒ එසේ මැ යි. එදු සදන්ඇත්රජ මොනොවට රදනාලද අහීන් ධවජය දැක එකෙණෙහි අර්ථනිශ්‍රිත වූ ගාථා කී.

969. නො පහ වූ (රාගාදි) කසට ඇති යමෙක් කහවත් පරිභොග- කෙරේ නම් ඉන්ද්‍රියදමය හා සත්‍යයෙන් තොර වූ හෙතෙම කහවතට නො හොබී.

970. තවද යමෙක් පහ කළ කෙලෙස් කසට ඇත්තේ වේ නම් ශීලයෙහි පිහිටියේ නම් ඉන්ද්‍රියදමය හා වාක්සත්‍යයෙන් යුක්ත නම් හෙතෙම එකාන්තයෙන් කහවතට හොබී.

971. යමෙක් ශීලවිපන්න නම් දුෂ්ප්‍රාඥ නම් ‘දුශ්ශීල ය’යි ප්‍රකට නම් යථෙපසිතයක් (මරහුට කැමැති සෙයක්) කරනුයේ නම් වික්‍ෂිප්ත වූ සිත් ඇත්තේ නම් ශුකලධර්ම රහිත නම් හෙතෙම කහවතට නො හොබී.

972. යමෙක් ශීලසම්පන්න නම් වීතරාග නම් සමාහිත නම් සුවිශුද්ධ- මනොවිතර්ක ඇත්තේ නම් හෙතෙම එකාන්තයෙන් කහවතට හොබී.

973. යමෙක් උද්ධත නම් උස් වූ හිස්මත් ඇත්තේ නම් අව්‍යක්ත- නම් යමක්හුගේ ශීලය නො පැතේ නම් හෙතෙම සුදුවතට සුදුසු යැ, කහවත් කුමක් කරන්නේ ද?

974. අනාගතයෙහි මහණහු ද මෙහෙණහු ද දුෂ්ට වූ සිත් ඇති වැ අනාදර වැ මෙත් සිත් ඇති තාදිගුණැතියන් නිගන්නාහ.

975. දුෂ්ප්‍රාඥ වූ ‘දුශ්ශීල යැ’ යි ප්‍රකට වූ හිතුවක් කරන්නාවූ බාලයෝ තෙරුන් විසින් සිවුරු බැරීමෙහි හික්මවනු ලබන්නාහු ද නො අසන්නාහ.

976. එසේ හික්මවනලද ඒ බාලයෝ උතුනට ගෞරව නැතියාහු රිය- සැරිහු නො තකන කුළුඅසකු මෙන් උපාධ්‍යායන් කෙරෙහි ආදරය නො කරන්නාහ.

977. එවං අනාගතද්ධානං පටිපත්ති භවිස්සති,
භික්ඛූනං භික්ඛුනීනං ච පත්තෙ කාලම්හි පච්ඡිමෙ.

978 පුරා ආගච්ඡතෙ එතං අනාගතං මහබ්භයං,
සුබ්බචා හොථ සඛිලා අඤ්ඤමඤ්ඤං සගාරවා.

979. මෙත්තචිත්තා කාරුණිකා හොථ සීලෙසු සංවුතා,
ආරද්ධවිරියා පහිතත්තා නිච්චං දළ්හපරක්කමා

980. පමාදං භයතො දිස්වා අප්පමාදං ච ඛෙමතො,
භාවෙථට්ඨඞ්ගිකං මග්ගං ඵුසන්තා[1] අමතං පද'න්ති.

ඉත්ථං සුදං ආයස්මා ඵුස්සො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

ඵුස්සත්ථෙරගාථා.

## 30. 1. 2

981. යථාචාරී යථාසතො සතීමා යතසඞ්කප්පජ්ඣායී අප්පමත්තො,
අජ්ඣත්තරතො සමාහිතත්තො[2] එකො සන්තුසිතො තමාහු භික්ඛුං

982. අල්ලං සුක්ඛං වා[3] භුඤ්ජන්තො න බාළ්හං සුහිතො සියා,
ඌනොදරො[4] මිතාහාරො සතො භික්ඛු පරිබ්බජෙ.

983. චත්තාරො පඤ්ච ආලොපෙ අභුත්වා උදකං පිවෙ,
අලං ඵාසුවිහාරාය පහිතත්තස්ස භික්ඛුනො.

984. කප්පියං තං චෙ ඡාදෙති[5] චීවරං ඉදමත්ථිකං,
අලං ඵාසුවිහාරාය පහිතත්තස්ස භික්ඛුනො.

985. පල්ලඞ්කෙන නිසින්නස්ස ජණ්ණුකෙ නාභිවස්සති,
අලං ඵාසුවිහාරාය පහිතත්තස්ස භික්ඛුනො.

986. යො සුඛං දුක්ඛතො අද්ද දුක්ඛමද්දක්ඛි සල්ලතො,
උභයන්තරෙන[6] නාහොසි කෙන ලොකස්මිං[7] කිං සියා.

987. මා මෙ කදාචි පාපිච්ඡො කුසීතො හීනවීරියො,
අප්පස්සුතො අනාදරො කෙන ලොකස්මිං[7] කිං සියා.

988. බහුස්සුතො ච මෙධාවී සීලෙසු සුසමාහිතො,
චෙතොසමථමනුයුත්තො අපි මුද්ධනි තිට්ඨතු.

---

1. ඵුසන්ති - PTS. 2. සුසමාහිතත්තො - PTS 3. ච - PTS
4. ඌනූදරො - ප. PTS. 5. කප්පියන්තඤ්ච ඡාදෙති - PTS.
6. උභයන්තරෙ - සිමු. 1, 2. 7. ලොකස්මි - PTS.

977. මහණුන්ගේ ද මෙහෙණන්ගේ ද පශ්චිම කාලය පැමිණි කල්හි අනාගත කාලයෙහි මෙබඳු පිළිවෙත් වන්නේ යි.

978. තෙල අනාගත මහබිය එන්නට පෙර (තෙපි) සුවච වැ මෘදුසිත් ඇති වැ උනුනට ගෞරව සහිත වවු.

979. (තෙපි) මෙත්සිත් ඇතියහු කරුණා ඇතියහු ශීලයෙහි සංවෘත වූවහු ආරබ්ධවීර්‍ය්‍ය ඇතියහු නිවනෙහි යවනලද සිත් ඇතියහු නිරතුරු දෘඪ පරාක්‍රම ඇතියහු වවු.

980. ප්‍රමාදය භය වශයෙන් ද අප්‍රමාදය ක්‍ෂෙම වශයෙන් ද දැක අමෘතපදය ස්පර්ශ කෙරෙමින් අෂ්ටාඞ්ගික මාර්ගය වඩවු.

මෙසේ ආයුෂ්මත් 'ඵුස්ස' ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ'යි

ඵුස්ස ස්ථවිරගාථා යි.

## 30. 1. 2

981. (යමෙක්) ශීලසම්පන්න ද ආයසීංත් හා එක්බඳු ද සමෘතිමත් ද සංයත සංකල්ප ඇති වැ ධ්‍යාන කරනසුලු ද ප්‍රමාද රහිත ද කමටහන් වැඩීමෙහි ඇලුණේ ද එකඟසිත් ඇත්තේ ද එකලා වූයේ ද සන්තුෂ්ට ද ඔහු භික්‍ෂු යැ යි කීහු.

982. තෙත්දූය හෝ වියලි දූය හෝ වළඳන්නේ පමණ ඉක්ම සුහිත නො වන්නේ යැ, මහණ තෙම ඌනෝදර වැ පමණට ගන්නා ආහාර ඇති වැ සිහි ඇති වැ වසන්නේ යි.

983. (කුසපමණින්) සතරපස්පිඩක් නො වළඳා දිය බොන්නේ යැ, නිවනට යවනලද සිත් ඇති මහණහට ඵාසුවිහාරයට පමණි

984. ඉදින් වැසියයුතු තැන් වසා නම් මේ සඳහා වූ කැප වූ සිවුර නිවනට යවන ලද සිත් ඇති මහණහට ඵාසුවිහරණය පිණිස පමණි.

985. (යම් කුටියක) පලඟින් හුන්නහුගේ දණ සඟල (වැසිදිය) නො තෙමා නම් (එ කුටිය) නිවනට යවනලද සිත් ඇති මහණහට ඵාසු-විහාරයට පමණි.

986. යමෙක් සුඛවෙදනාව (විපරිණාම) දුඃඛ වශයෙන් දුටුයේ ද දුඃඛවෙදනාව ශල්‍ය වශයෙන් දුටුයේ ද දෑතුරෙහි හෙවත් උපෙක්‍ෂායෙහි (ආත්මාත්මීයාභිනිවේශය) නො වී ද හෙතෙම කවර නම් කෙලෙසින් (බැඳී) ලොකයෙහි (දෙවාදීන් අතුරෙහි) කිම වන්නේ ද?

987. පාපේච්ඡයෙක් හීනවීර්‍ය්‍යයෙක් අල්පශ්‍රැතයෙක් අනාදරයෙක් කිසිකලෙකැ මට හමු නො වේවා! සත්ත්වනිකායයෙහි (එබඳු-පුද්ගලයාගේ) කවර නම් අවවාදයෙකින් කවර අර්ථයෙක් වන්නේ ද?

988 (යමෙක්) බහුශ්‍රැත නම් ප්‍රඥාවත් නම් ශීලයෙහි මොනවට පිහිටියේ නම් චිත්තසමථයෙහි යෙදුණේ නම් හෙතෙම (මාගේ) මුදුනෙහි පවා සිටීවා.

989. යො පපඤ්චමනුයුත්තො පපඤ්චාභිරතො මගො,
විරාධයී සො නිබ්බානං යොගක්ඛෙමං අනුත්තරං.

990. යො ච පපඤ්චං හිත්වාන නිප්පපඤ්චපථෙ රතො,
ආරාධයී සො නිබ්බානං යොගක්ඛෙමං අනුත්තරං.

991 ගාමෙ වා යදි වා රඤ්ඤෙ නින්නෙ වා යදි වා ථලෙ,
යත්ථ අරහන්තො විහරන්ති තං භූමිං රාමණෙය්‍යකං.

992. රමණීයා[1] අරඤ්ඤානි යත්ථ න රමතී ජනො,
වීතරාගා රමිස්සන්ති[2] න තෙ කාමගවෙසිනො.

993. නිධීනං'ව පවත්තාරං යං පස්සෙ වජ්ජදස්සිනං,
නිග්ගය්හවාදිං මෙධාවිං තාදිසං පණ්ඩිතං භජෙ,
තාදිසං භජමානස්ස සෙය්‍යො හොති න පාපියො.

994. ඔවදෙය්‍යානුසාසෙය්‍ය අසබ්භා ච නිවාරයෙ,
සතං හි සො පියො හොති අසතං හොති අප්පියො.

995. අඤ්ඤස්ස භගවා බුද්ධො ධම්මං දෙසෙසි චක්ඛුමා,
ධම්මෙ දෙසියමානම්හි සොතමොධෙසිමත්ථිකො,
තං මෙ අමොඝං සවනං විමුත්තොම්හි අනාසවො.

996. නෙව පුබ්බෙනිවාසාය න'පි දිබ්බස්ස චක්ඛුනො,
චෙතොපරියාය ඉද්ධියා චුතියා උපපත්තියා,
සොතධාතුවිසුද්ධියා පණිධි මෙ න විජ්ජති.

997. රුක්ඛමූලං'ව නිස්සාය මුණ්ඩො සඞ්ඝාටිපාරුතො,
පඤ්ඤාය උත්තමො ථෙරො උපතිස්සො ච[3] ඣායති.

998. අවිතක්කං සමාපන්නො සම්මාසම්බුද්ධසාවකො,
අරියෙන තුණ්හීභාවෙන[4] උපෙතො හොති තාවදෙ.

999. යථා'පි පබ්බතො සෙලො අචලො සුප්පතිට්ඨිතො,[5]
එවං මොහක්ඛයා භික්ඛු පබ්බතො'ව න වෙධති.

1000. අනඞ්ගණස්ස පොසස්ස නිච්චං සුචිගවෙසිනො,
වාලග්ගමත්තං පාපස්ස අබ්භාමත්තං'ව ඛායති.

1001. නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං,
නික්ඛිපිස්සං ඉමං කායං සම්පජානො පතිස්සතො.

---

1. රමණීයානි - සිමු. 1, 2. 2. රමෙස්සන්ති - සිමු 1, 2. 3. උපතිස්සො'ව - PTS.
4. තුණ්හීභාවෙන - PTS. 5. සුපතිට්ඨිතො - PTS.

989 යමෙක් ප්‍රපඤ්චයෙහි (තෘෂ්ණායෙහි) බැඳුණේ ප්‍රපඤ්චයෙහි ඇලුණේ සිවුපාවකු බඳු වූයේ වේ නම් හෙතෙම නිරුත්තර වූ යෝගයන් ගෙන් නිරුපද්‍රැත වූ නිවන වැරදූ වී (නිවනින් දුරු වූයේ-යැ යි සේ යි.)

990. යමෙකුත් ප්‍රපඤ්චය හැර ආර්‍ය්‍යමාර්ගයෙහි ඇලුණේ වේ නම් හෙතෙම නිරුත්තර වූ යෝගක්ෂෙම වූ නිවන සිදු කෙළේ යි (සාක්ෂාත්-කෙළේ යි.)

991. ඉදින් ගම්හි හෝ වේව යි වනයෙහි හෝ වේව යි පහත් බිම්හි හෝ වේවයි උස්බිම්හි හෝ වේවයි යම් තැනෙක රහත්හු වෙසෙත් නම් එබිම රමණීය යි.

992. යම් වනයෙකැ ජනයා රමණය නො කෙරේ නම් ඒ වනයෝ රමණීයයෝ යි, වීතරාගීහු එහි රමණය කරන්නාහ. ඔහු කාම ගවේෂීහු නො වෙත්.

993. යමකු නිධන් කියන්නකු මෙන් දක්නේ නම්, වරද දක්නා සුලු (වරදෙහි) නිගා කොට කියනසුලු ධර්මෞජස්ප්‍රඥ ඇති එබඳු-නුවණැත්තහු භජනය කරන්නේ යැ, එබන්දහු භජනය කරන්නහුට වැඩෙක් මැ වෙයි. අවැඩෙක් නො වේ.

994. අවවාද දුන මැනැවි, අනුශාසනා කළ මැනැවි, අකුසල් දහමින් ද වළහනු මැනැවි, එ බඳු පුද්ගල තෙම සත්පුරුෂයනට ප්‍රිය වෙයි. අසත්පුරුෂයනට අප්‍රිය වේ.

995. පසැස් ඇති භාග්‍යවතුන් වහන්සේ අනෙකකු (බැනණුවන්) හට දහම් දෙසූහ. දහම් දෙසන කල්හි (මම) අර්ථි ඇතියෙම් සවන් (දුනිමි) යොමු කෙළෙමි. මා ගේ ඒ ශ්‍රවණය නො සිස් විය. (මම) ආශ්‍රව රහිත වැ විමුක්තයෙමි.

996. (මට) පූර්වනිවාසානුස්මෘතිඥානය පිණිස (ප්‍රාර්ථනාවක්) නො වේ මැ යැ, දිව්‍ය චක්ෂුස පිණිස ද නො වේ මැ යි, චෙතොපරියඥානය පිණිස සෘද්ධිවිධඥානය පිණිස ච්‍යුති-උපපත්ති ඥානය පිණිස දිව්‍ය-ශ්‍රොත්‍රඥානය පිණිස ප්‍රාර්ථනාවක් මට නැති.

997. උපතිස්ස තෙමේත් මුඬු වැ සඟල පෙරෙවියේ ප්‍රඥයෙන් උත්තම වැ ස්ථවිර වැ, රුක්මුල ඇසිරි කොට ධ්‍යාන කෙරේ.

998. චතුර්ථධ්‍යාන සමාපත්තියට සමවන් සම්‍යක් සම්බුද්ධශ්‍රාවක තෙම එකෙණෙහි ආර්‍ය්‍ය වූ තුෂ්ණීම්භාවයෙන් යුක්ත වූයේ වේ

999. යම්සේ අචල වූ මොනොවට පිහිටි ශෛලමය පර්වතයෙක් නො සැලේ නම් එසේ මැ මහණ තෙම මෝහක්ෂය හෙතුවින් අචල වැ සුප්‍රතිෂ්ඨිත වැ පර්වතයක් මෙන් නො සැලේ

1000. ලාමක ඉච්ඡාචාර රහිත වූ නිරතුරු පාරිසුද්ධිය සොයනසුලු පුරුෂයාහට වලගක් පමණ වූ වරද වලාවක් පමණ මෙන් හැගේ.

1001. මරණය නො කැමැත්තෙමි, ජීවිතය නො කැමැත්තෙමි. සම්‍යක් ප්‍රඥ ඇතියෙම් සිහි ඇතියෙම් මෙ කය බහා තබන්නෙමි.

1002. නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං,
කාලං ච පටිකඞ්ඛාමි නිබ්බිසං භතකො යථා.

1003. උභයෙනමිදං මරණමෙව නාමරණං පච්ඡා වා පුරෙ වා,
පටිපජ්ජථ මා විනස්සථ ඛණො වො[1] මා උපච්චගා.

1004. නගරං යථා පච්චන්තං ගුත්තං සන්තරබාහිරං,
එවං ගොපෙථ අත්තානං ඛණො වො මා උපච්චගා,
ඛණාතීතා හි සොචන්ති නිරයම්හි සමප්පිතා.

1005. උපසන්තො උපරතො මන්තභාණී[2] අනුද්ධතො,
ධුනාති පාපකෙ ධම්මෙ දුමපත්තං ව මාලුතො.

1006. උපසන්තො උපරතො මන්තභාණී[2] අනුද්ධතො,
අප්පාසි[3] පාපකෙ ධම්මෙ දුමපත්තං ව මාලුතො.

1007. උපසන්තො අනායාසො විප්පසන්නො අනාවිලො,[4]
කල්‍යාණසීලො මෙධාවී දුක්ඛස්සන්තකරො සියා.

1008. න විස්සසෙ එකතියෙසු එවං
අගාරිසු පබ්බජිතෙසු චා'පි,
සාධූ'පි[5] හුත්වාන අසාධු හොන්ති
අසාධු හුත්වා පුන සාධු හොන්ති.

1009. කාමච්ඡන්දො ච ව්‍යාපාදො ථිනමිද්ධං ච භික්ඛුනො,
උද්ධච්චං විචිකිච්ඡා ච පඤ්චෙතෙ චිත්තකෙලිසා.

1010. යස්ස සක්කරියමානස්ස අසක්කාරෙන චූභයං,
සමාධි න විකම්පති අප්පමාදවිහාරිනො.

1011. තං ඣායිනං සාතතිකං සුඛුමදිට්ඨිවිපස්සකං,
උපාදානක්ඛයාරාමං ආහු සප්පුරිසො ඉති.

1012 මහාසමුද්දො පඨවී[6] පබ්බතො අනිලො'පි ච,
උපමාය න යුජ්ජන්ති සත්ථු වරවිමුත්තියා.

1013. චක්කානුවත්තකො ථෙරො මහාඤාණී සමාහිතො,
පඨවාපග්ගිසමානො[7] න රජ්ජති න දුස්සති.

1014. පඤ්ඤාපාරමිතං පත්තො මහාබුද්ධි මහාමති,[8]
අජළො ජළසමානො සදා චරති නිබ්බුතො.

---

1 වෙ - සිමු 1, 2. 2 මත්තභාණී - සිමු 1, 2.
3 අබ්බහි - සයා, PTS. 4 විප්පසන්නමනාවිලො - PTS
5 සාධු - සිමු 1, 2. 6 පඨවි - 7 පඨවිංපග්ගිසමානො - PTS.
8 මහාමුනි - සයා, PTS.

1002. මරණය නො කැමැත්තෙමි, ජීවිතය නො කැමැත්තෙමි. බැලයට මෙහෙ කරන සේවකයකු මෙන් කල් මතුවක් අපේක්‍ෂා කරමි.

1003 පසු හෝ පෙර හෝ දෙකල්හි මැ මරණය මැ යි. නො මැරිමෙක් නැත් මැ යි. පිළිවෙත් පුරවු, නගමක් වැනසෙවු, ක්‍ෂණ සම්පත්තිය එකත්නෙත් නගමක් (තොප) ඉක්මැ යා.

1004. ඇතුළත පිටත සහිත වැ ගෝපනය කරනලද පසල් නුවරක් යම්සේ ද එපරිද්දෙන් තමා රකිවු, ක්‍ෂණය තෙම එකත්නෙත් (තොප) නො ඉක්මැ යා, ක්‍ෂණ සම්පත්තිය ඉක්මගියාහු (සියකම්-විසින් නිරැහි දම්නලද්දාහු) ශෝක කෙරෙත් මැ යි.

1005. උපශාන්ත වූයේ දුසිරිතින් වැළකුණේ මිතභාණී වූයේ උද්ධත නො වූයේ පවන රුක්පතක් සලන්නාක් මෙන් පාපධර්මයන් සල්වයි. (බැහැර කරයි).

1006 උපශාන්ත වූයේ දුසිරිතින් වැළකුණේ මිතභාණී වූයේ උද්ධත නො වූයේ පවන රුක්පතක් සලන්නාක් මෙන් පාපධර්මයන් නුදුරෙහි පහ කෙළේ යි.

1007. උපශාන්ත වූ ආයාස රහිත වූ වෙසෙසින් ප්‍රසන්න වූ නො කැලඹුණු කලණදහම් ඇති නුවණැත්තේ දුක් කෙළවර කරන්නෙක් වන්නේ යි.

1008. ගිහි වූ ද පැවිදි වූ ද ඇතැමුන් කෙරෙහි මෙසේ විස්වැසි නො වන්නේ යැ (ඔහු) සත්පුරුෂ වැ සිට අසත්පුරුෂ වෙති, අසත්පුරුෂ වැ සිට යළි සත්පුරුෂ වෙත්.

1009. කාමච්ඡන්ද යැ ව්‍යාපාද යැ ථිනමිද්ධ යැ උද්ධච්ච යැ විචිකිච්ඡා යැ යන මොහු පස් දෙන මහණහු ගේ සිත කිලිටි කරන්නෝ යි.

1010. ස[illegible]ාර කරනුලබන අප්‍රමාද විහාර ඇති යමක්හුගේ සමාධිය සත්කා[illegible]යෙන් ද අසත්කාරයෙන් ද යන දෙකින් නො සැලේ නම්,

1011. නිරතුරු ධ්‍යාන කරනසුලු වූ සූක්‍ෂමදෘෂ්ටිවිදර්ශීක වූ උපාදාන-ක්‍ෂයයෙහි ඇලුණා වූ ඔහු සත්පුරුෂ යැ යි කිහු.

1012. මහාසමුද්‍රය ද පෘථිවිය ද පර්වතය ද පවන ද (යන මොහු) ශාස්තෲන් වහන්සේගේ අග්‍රඵල විමුක්තිය පිළිබඳ උපමාවට නො යෙදෙත් (නුසුදුසු යි.)

1013. මහනුවණැති වූ සමාහිත වූ පෘථිවිය ජලය ගින්න බඳු පැවැතුම් ඇති වූ ධර්මචක්‍රානුවර්තක වූ ස්ථවිර තෙමේ (ඉට්ඨ'නිට්ඨ අරමුණුහි) නො ඇලෙයි, දූෂ්‍ය නො වේ.

1014. ප්‍රඥායෙහි පරතෙරට පැමිණියේ මහත් වූ බුද්ධි ඇති වැ මහත් වූ ස්මෘති ඇති වැ තිබියේ බුද්ධිහීන නො වූයේ මැ බුද්ධිහීනයකු බඳු වැ නිති වෙසේ.

1015. පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං,
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා’ති.

1016. සම්පාදෙථප්පමාදෙන එසා මෙ අනුසාසනී,
හන්දාහං පරිනිබ්බිස්සං විප්පමුත්තොම්හි සබ්බධී’ති.

ඉත්ථං සුදං ආයස්මා සාරිපුත්තො ථෙරො ගාථායො අභාසිත්ථා’ති.

**සාරිපුත්තත්ථෙරගාථා.**

## 30. 1. 3

1017. පිසුණෙන ච කොධනෙන ච මච්ඡරිනා ච විභූතනන්දිනා,
සඛිතං න කරෙය්‍ය පණ්ඩිතො පාපො කාපුරිසෙන සඞ්ගමො.

1018. සද්ධෙන ච පෙසලෙන ච පඤ්ඤවතා බහුස්සුතෙන ච,
සඛිතං හි[1] කරෙය්‍ය පණ්ඩිතො භද්දො සප්පුරිසෙන සඞ්ගමො.

1019. පස්ස චිත්තකතං[2] බිම්බං අරුකායං සමුස්සිතං,
ආතුරං බහුසඞ්කප්පං යස්ස නත්ථි ධුවං ඨිති.

1020 පස්ස චිත්තකතං[2] රූපං මණිනා කුණ්ඩලෙන ච,
අට්ඨිං තචෙන ඔනද්ධං සහ වත්ථෙහි සොභති.

1021. අලත්තකකතා පාදා මුඛං චුණ්ණකමක්ඛිතං,
අලං බාලස්ස මොහාය නො ච පාරගවෙසිනො.

1022. අට්ඨපාදකතා කෙසා නෙත්තා අඤ්ජනමක්ඛිතා,
අලං බාලස්ස මොහාය නො ච පාරගවෙසිනො.

1023 අඤ්ජනීව නවා චිත්තා පූතිකායො අලඞ්කතො,
අලං බාලස්ස මොහාය නො ච පාරගවෙසිනො.

1024. ඔදහි මිගවො පාසං නාසදා වාගුරං මිගො,
භුත්වා නිවාපං ගච්ඡාම කන්දන්තෙ මිගබන්ධකෙ.

1025. ඡින්නො පාසො මිගවස්ස නාසදා වාගුරං මිගො,
භුත්වා නිවාපං ගච්ඡාම සොචන්තෙ මිගලුද්දකෙ.

1026. බහුස්සුතො චිත්තකථී බුද්ධස්ස පරිචාරකො,
පන්නභාරො විසඤ්ඤුත්තො සෙය්‍යං කප්පෙති ගොතමො.

---

1 සඛිතං - සිමු 1, 2     2 චිත්තීකතං - සිමු: 1, 2

1015. මා විසින් ශාස්තෘන් වහන්සේ ඇසුරු කරනලදහ. බුදුන්ගේ අනුශාසනය කරනලදී. ගුරු වූ බර බහා තබනලද්දේ යැ. මෙවක් පටන් පුනර්භවයෙක් (මට) නැති.

1016. අප්‍රමාද වැ පිළිවෙත් පුරව්, මේ මාගේ අනුශාසනය යි, මම පිරිනිවෙන්නෙමි, සියලු භවයෙහි විමුක්තයෙමි. (වෙසෙසින් මිදුනෙමි)

මෙසේ ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

සාරිපුත්ත ස්ථවිරගාථා යි.

## 30. 1. 3

1017. පිසුනු බස් ඇතියහු හා ද කිපෙනසුල්ලහු හා ද මසුරු බැව් ඇතියහු හා ද විනාශය හෝ වෙත් විම කැමැත්තහු හා ද නුවණැත්තේ යහළු බව නොකරන්නේ ය. පාපපුද්ගලයා හා සඞ්ගමය ලාමක යි.

1018. සැදැහැ ඇතියහු හා ද සිල්වතා හා ද නැණවතා හා ද බහුශ්‍රුතයා හා ද නුවණැත්තේ යහළු බව කරන්නේ ය, සත්පුරුෂයා හා සඞ්ගමය සුන්දර යි.

1019. යම් ශරීරයක්හුගේ ධ්‍රැව (නිත්‍ය) භාවයෙක් ස්ථිතිභාවයෙක් නැත් ද (ඒ) වණ වූ ඇටසැකිල්ල විසින් ඔසවනලද ගිලන් වූ (බාලයන් විසින්) නොයෙක් අයුරින් සංකල්පනය කටයුතු වූ විසිතුරු කරනලද සිරුර බලව.

1020. මිණියෙන් ද කොඬොලින් ද විසිතුරු කරනලද, යටින් බඳනා ලද (තුන්සියයකට අධික) ඇට ඇති රූපය බලව, වස්ත්‍ර සහිත වැ හොබී.

1021. ලාරසින් රැඳු පාදයෝ සුවඳසුණු තැවැරූ මුව බාලයාගේ මුළාවට පමණි, පාරගවේෂිහුගේ මුළාවට නො ද පමණි.

1022. කියඹුවැල් ද අඳුන් ඇඳි නෙත් ද බාලයාගේ මෝහයට පමණි පාරගවේෂිහුගේ මෝහයට නො ද පමණි.

1023 සිතියම් කළ අභිනව අඳුන්කොපුවක් මෙන් සරසන ලද කුණුකය බාලයාගේ මෝහයට පමණි, පාරගවේෂිහුගේ මෝහයට නො ද පමණි,

1024. මුවවැදි මලපුඹුව දැමී යැ. මුවා පාශය නො ගැටී මුවවැද්දා හඬද්දී ගොදුරු කා යම්හ.

1025. මුවවැද්දාගේ පාශයෝ සිඳිනලදහ, මුවා පාශය නො ගැටී. මුවවැද්දා සොවිද්දී ගොදුරු කා යම්හ.

1026. බහුශ්‍රැත වූ චිත්‍රකථි වූ බුද්ධෝපස්ථායක වූ ගිලිහුණුබර ඇති පහ වූ සංයොග ඇති ගෞතමගෝත්‍ර ඇති ශ්‍රාවක ශයනය කෙරේ.

1027. ඛීණාසවො විසඤ්ඤුත්තො සඞ්ගාතීතො සුනිබ්බුතො,
ධාරෙති අන්තිමං දෙහං ජාතිමරණපාරගූ [1]

1028. යස්මිං පතිට්ඨිතා ධම්මා බුද්ධස්සාදිච්චබන්ධුනො,
නිබ්බානගමනෙ මග්ගෙ සො'යං තිට්ඨති ගොතමො.

1029 ආසීතිං බුද්ධතො ගණ්හිං[2] ද්වෙ සහස්සානි භික්ඛුතො,
චතුරාසීතිසහස්සානි යෙ මෙ ධම්මා පවත්තිනො.

1030 අප්පස්සුතා'යං[3] පුරිසො බලිබද්දො'ව ජීරති,
මංසානි තස්ස වඩ්ඪන්ති පඤ්ඤා තස්ස න වඩ්ඪති.

1031. බහුස්සුතො අප්පස්සුතං යො සුතෙනාතිමඤ්ඤති,
අන්ධො පදීපධාරො'ව තථෙව පටිභාති මං.

1032 බහුස්සුතං උපාසෙය්‍ය සුතං ච න විනාසයෙ,
තං මූලං බ්‍රහ්මචරියස්ස තස්මා ධම්මධරො සියා.

1033 පුබ්බාපරඤ්ඤූ අත්ථඤ්ඤූ නිරුත්තිපදකොවිදො,
සුග්ගහීතං ච ගණ්හාති අත්ථං චොපපරික්ඛති

1034. ඛන්ත්‍යා ඡන්දිකතො[4] හොති උස්සහිත්වා තුලෙති තං,
සමයෙ සො පදහති අජ්ඣත්තං සුසමාහිතො.

1035. බහුස්සුතං ධම්මධරං සප්පඤ්ඤං බුද්ධසාවකං,
ධම්මවිඤ්ඤාණමාකඞ්ඛං තං භජෙථ තථාවිධං.

0136. බහුස්සුතො ධම්මධරො කොසාරක්ඛො මහෙසිනො,
චක්ඛු සබ්බස්ස ලොකස්ස පූජනීයො බහුස්සුතො.

1037. ධම්මාරාමො ධම්මරතො ධම්මං අනුවිචින්තයං,
ධම්මං අනුස්සරං භික්ඛු සද්ධම්මා න පරිහායති.

1038 කායමච්ඡෙරගරුනො[5] හිය්‍යමානෙ[6] අනුට්ඨහෙ,
සරීරසුඛගිද්ධස්ස කුතො සමණඵාසුතා.

1039. න පක්ඛන්ති දිසා සබ්බා ධම්මා නප්පටිභන්ති මං,
ගතෙ කල්‍යාණමිත්තම්හි අන්ධකාරංව ඛායති.

1040 අබ්භතීතසහායස්ස අතීතගතසත්ථුනො,
නත්ථි එතාදිසං මිත්තං යථා කායගතා සති.

---

1. ජාතිමරණපාරගු -PTS. 2. ගණ්හි - PTS.
3. අප්පස්සුතොයං - සයා, PTS 4. ඡන්දිකතො - PTS
5. කායමච්ඡෙරගරුකො - සීමු 1, 2 6. හිය්‍යමානො - සීමු. 1, 2.

1027. ක්ෂීණාස්‍රව තෙමේ පහ වූ සංයොග ඇත්තේ ඉක්මැවූ (රාගාදි) සඞ්ග ඇත්තේ මොනවට නිවියේ ජාති - මරණ දෙක්හි පරතෙරට ගියේ අන්තිමදේහය දරයි.

1028 සූර්යබන්ධු වූ බුදුන්ගේ ධර්මයෝ යමකු කෙරෙහි පිහිටියාහු නම් ඒ මේ ගෞතම (ගොත්‍ර ඇති ආනන්ද) තෙමේ නිවනට යන මඟැ සිටී.

1029. දෙයාසූදහසක් බුදුන් වෙතින් උගත්මි, දෙදහසක් භික්ෂූන් වෙතින් උගත්මි, මට යම් ධර්මස්කන්ධ කෙනෙක් ප්‍රගුණ වූවාහු නම් ඔහු සුවාසූදහසෙකි.

1030. මේ අල්පශ්‍රැත පුරුෂ තෙම ගොනකු මෙන් වැඩේ, ඔහුගේ මස්පිඬුහු වැඩෙත්, ඔහුගේ ප්‍රඥාව නො වැඩේ.

1031. යම් බහුශ්‍රැතයෙක් තම බහුශ්‍රැත කමින් අල්පශ්‍රැතයාහට අවමන් කෙරේ නම් ඔහු පහනක් ගත් අන්ධයකු මෙන් මට වැටහේ.

1032. බහුශ්‍රැතයා ඇසුරු කරන්නේ යැ. ඇසූ දැන ද නො නසන්නේ යැ, බ්‍රහ්මචර්යාවට ඒ මුල් වෙයි, එහෙයින් ධර්මධරයෙක් වන්නේ යි.

1033. පූර්වාපරභාගයත් දන්නේ අර්ථ දන්නේ නිරුක්තිපදයෙහි දක්ෂ වූයේ මැනවින් උගනී, (අසනලද පිරිවහනලද ධර්මයාගේ) අර්ථයත් විමසයි.

1034. (විමසූ ධර්මයෙහි) දෘෂ්ටිනිධ්‍යානක්ෂාන්තියෙන් (විදර්ශනාභිනිවේශ-යෙහි) කරනලද ඡන්ද ඇත්තේ වෙයි, උත්සාහ කොට ඒ නාම රූපය තුලනය කෙරේ, යොග්‍යසමයෙහි ප්‍රධන්වීර්ය කරයි, අධ්‍යා-ත්මයෙහි සුසමාහිත වේ.

1035. ධර්මඥනය කැමැත්තේ එබඳු බහුශ්‍රැත වූ ධර්මධර වූ සප්‍රාඥ වූ ඒ බුද්ධශ්‍රාවකයා භජනය කරන්නේ යි.

1036. බහුශ්‍රැත වූ ධර්මධර වූ මහර්ෂිහු (බුදුන්)ගේ කොටුගේ (ධර්ම-රත්නය) රක්නා වූ සියලුලොකයාට ඇසක් වූ පිදියයුතු වූ-

1037. (සමථ විදර්ශනා) ධර්මයට නිවාස වූ ධර්මයෙහි ඇලුණා වූ ධර්මය මෙනෙහි කරන්නා වූ ධර්මය අනුස්මරණය කරන්නා වූ මහණ තෙම සද්ධර්මයෙන් නො පිරිහේ.

1038. කායම්‍රාත්සර්යගරුකයා (ක්ෂණක්ෂණයෙහි) පිරිහෙන්නේ උත්ථානවීර්යය නො කරන්නේ යැ. ශරීරසුඛයෙහි ගිජු වූවහුට ශ්‍රමණ-ඵාසුතාවක් කොයින් ද?

1039. සියලු දිශාවෝ නො පැනෙත්, ධර්මයෝ මට නො වැටහෙත්, කල්‍යාණමිතුරා (සැරියුත් තෙරුන්) පිරිනිවි කල්හි (ලොව) අඳුරක් මෙන් හැඟේ.

1040 පහ වැ ගිය කල්‍යාණමිතුරන් ඇතියාහට, පළමු පිරිනිවි ශාස්තෘන් ඇතියාහට, කායගතාස්මෘතිය යම්සේ ද එබඳු මිතුරෙක් නැති.

1041. යෙ පුරාණා අතීතා තෙ නවෙහි න සමෙති මෙ,
සවජ්ජ එකො’ව ඣායාමි වස්සුපෙතො’ව[1] පක්ඛිමා.

1042. දස්සනාය අභික්කන්තෙත[2] නානා වෙරජ්ජකෙ බහූ,
මා වාරයිත්ථ සොතාරො පස්සන්තු සමයො මමං.

1043 දස්සනාය අභික්කන්තෙත[2] නානා වෙරජ්ජකෙ පුථු,
කරොති සත්ථා ඔකාසං න නිවාරෙති චක්ඛුමා.

1044. පණ්ණවීසති වස්සානි සෙඛභූතස්ස මෙ සතො,
න කාමසඤ්ඤා උප්පජ්ජි පස්ස ධම්මසුධම්මතං.

1045. පණ්ණවීසති වස්සානි සෙඛභූතස්ස මෙ සතො,
න දොසසඤ්ඤා උප්පජ්ජි පස්ස ධම්මසුධම්මතං.

1046. පණ්ණවීසති වස්සානි භගවන්තං උපට්ඨහිං,
මෙත්තෙන කායකම්මෙන ඡායා’ව අනපායිනී.

1047. පණ්ණවීසතිවස්සානි භගවන්තං උපට්ඨහිං,
මෙත්තෙන වචීකම්මෙන ඡායා’ව අනපායිනී.

1048. පණ්ණවීසතිවස්සානි භගවන්තං උපට්ඨහිං,
මෙත්තෙන මනොකම්මෙන ඡායා’ව අනපායිනී.

1049. බුද්ධස්ස චඞ්කමන්තස්ස පිට්ඨිතො අනුචඞ්කමිං,
ධම්මෙ දෙසියමානම්හි ඤාණං මෙ උදපජ්ජථ.

1050. අහං සකරණීයොම්හි සෙඛො[3] අප්පත්තමානසො,
සත්ථු ච පරිනිබ්බානං යො අම්හං අනුකම්පකො.

1051. තදාසි යං භිංසනකං තදාසි ලොමහංසනං,
සබ්බාකාරවරූපෙතෙ සම්බුද්ධෙ පරිනිබ්බුතෙ.

1052. බහුස්සුතො ධම්මධරො කොසාරක්ඛො මහෙසිනො,
චක්ඛු සබ්බස්ස ලොකස්ස ආනන්දො පරිනිබ්බුතො.

1053. බහුස්සුතො ධම්මධරො කොසාරක්ඛො මහෙසිනො,
චක්ඛු සබ්බස්ස ලොකස්ස අන්ධකාරෙ තමොනුදො.

1. ‘වංසුපෙතො’තිපි පාළි. 2. අභික්කන්තෙත - PTS
3. සෙක්ඛා - සිමු. 1, 2.

1041. යම් පැරණිමිතුරු කෙනෙක් වූහු නම් ඔහු ඉකුත් වූහ, නවකයන් හා මා ගේ සිත නො සැසැඳෙයි, ඒ මම අද වැසි කල්හි කැදෑල්ලට වත් පක්ෂියකු මෙන් එකලා වැ ධ්‍යාන කෙරෙමි.

1342. දැක්මට පෙරට පැමිණි නොයෙක් රටවැසි බොහෝ දෙනා නහමක් වළහ, ධර්මශ්‍රාවකයෝ මා දකිත්වා, දැක්මට මේ කාලය යි.

1043. නොයෙක් රටවැසි බොහෝ දෙනා (තමන්) වහන්සේ දැක්මට පෙරට පැමිණි කල්හි ශාස්තෘන් වහන්සේ ඉඩ දෙති, පනැස් ඇත්තේ (ඔවුන්) නො වළහයි.

1044. පස්විසි වසක් මුළුල්ලෙහි ශෛක්ෂ වූ මට කාමසංඥාව නූපන, ධර්මයා ගේ සුධර්මත්වය බලව.

1045. පස්විසිවසක් මුළුල්ලෙහි ශෛක්ෂ වූ මට ද්වේෂසංඥාව නූපන, ධර්මයා ගේ සුධර්මත්වය බලව.

1046. පස්විසිවසක් මුළුල්ලෙහි මෛත්‍රිකායකර්මයෙන් යුක්ත වැ නො හැරැ සිටුනා සේයාවක් මෙන් භාග්‍යවතුන් වහන්සේට උවැටන් කෙළෙමි.

1047. පස්විසිවසක් මුළුල්ලෙහි මෛත්‍රීවාක්කර්මයෙන් යුක්ත වැ නො හැරැ සිටුනා සේයාවක් මෙන් භාග්‍යවතුන් වහන්සේට උවැටන් කෙළෙමි.

1048. පස්විසිවසක් මුළුල්ලෙහි මෛත්‍රීමනඃකර්මයෙන් යුක්ත වැ නො හැරැ සිටුනා සේයාවක් මෙන් භාග්‍යවතුන් වහන්සේට උවැටන් කෙළෙමි.

1049. සක්මන් කරන බුදුන් වහන්සේගේ පිටුපසින් අනුසක්මන් කෙළෙමි, දහම් දෙසනු ලබන කල්හි මට (ශෛක්ෂභූමිය පිළිබඳ) ඥානය පහළ වී.

1050. මම කළයුතු කිස ඇතියෙමි, ශෛක්ෂයෙමි. නො පත් රහත් බව ඇතියෙමි, යමෙක් මට අනුකම්පක නම් (ඒ) ශාස්තෘන් වහන්සේගේ ද පිරි නිවන එළඹියේ යි.

1051. සියලු ආකාරවරයෙන් යුක්ත වූ සම්බුදුහු පිරිනිවියහ. එකල්හි යම් භිංසනකයෙක් (සෙණහඬ ආදී බිය අරමුණක්) වී නම් එකල්හි ලොමුදැහ ගැන්ම වී.

1052. බහුශ්‍රැත වූ ධර්මධර වූ මහර්ෂිහු (බුදුන්) ගේ ධර්මභාණ්ඩාගාරික වූ මුළුලොවට ඇසක් වූ අනන්ද ස්ථවිරයන් වහන්සේ පිරිනිවියහ.

1053. බහුශ්‍රැත වූ ධර්මධර වූ මහර්ෂිහුගේ ධර්මභාණ්ඩාරික වූ මුළු-ලොවට ඇසක් වූ අන්ධකාරයෙහි තමොනුද (අඳුර දුරු කරන කිසිවක්) වූ.

1054. ගතිමන්තො සතිමන්තො ධිතිමන්තො ච යො ඉසි,
සද්ධම්මධාරකො ථෙරො ආනන්දො රතනාකරො.

1055. පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං,
ඔහිතො ගරුකො භාරො නත්ථි දානි පුනබ්භවො'ති.

ඉත්ථං සුදං ආයස්මා ආනන්දො ථෙරො ගාථායො අභාසිත්ථා'ති

ආනන්දත්ථෙරගාථා.

තස්සුද්දානං:

පුස්සොපතිස්සා ආනන්දො තයො'තිංමෙපකිත්තිතා[1]
ගාථායො තත්ථ සඞ්ඛාතා සතං පඤ්ච ච උත්තරී'ති

## තිංසනිපාතො නිට්ඨිතො.

1 තයො'තිමෙව කිත්තිතා - සීමු 1, 2. තයො'තිමෙ පකිත්තිතා - PTS

1054. ඥනගති ඇති ස්මෘති සම්පන්න වූ ධෘතිමත් වූ යම් සෘෂිවරයෙක් වේ ද සද්ධර්මධාරක වූ ඒ ආනන්ද ස්ථවිරයන් වහන්සේ රත්නාකරයෙකි

1055. මා විසින් ශාස්තෲන් වහන්සේ ඇසුරු කරනලදහ. බුදුන් වහන්සේගේ අනුශාසනය කරනලද යැ, ගුරු වූ බර බහා තබන ලද්දේ යැ, මින්මතු පුනර්භවයෙක් නැති'යි.

මෙසේ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ ගාථා වදාලහ'යි

**ආනන්ද ස්ථවිරගාථා යි.**

**උද්දානය**:

ඵුස්ස යැ උපතිස්ස යැ ආනන්ද යැ යි තෙරවරු තිදෙනෙක් තිස් වැනි නිපාතයෙහි ප්‍රකාශිතයහ. එහි පසුතුරු සියක් (එක්සියපසක්) ගාථාවෝ ප්‍රකාශිතයහ.

## තිංසතිනිපාතය නිමි.

# 40. චත්තාලීසනිපාතො.

### 40. 1. 1

1056. න ගණෙන පුරක්ඛතො චරෙ
විමනො හොති සමාධි දුල්ලභො,
නානා ජනසඞ්ගහො දුඛො[1]
ඉති දිස්වාන ගණං න රොචයෙ.

1057. න කුලානි උපබ්බජෙ මුනි
විමනො හොති සමාධි දුල්ලභො,
සො උස්සුක්කො රසානුගිද්ධො
අත්ථං රිඤ්චති යො සුඛාවහො.[2]

1058 පඞ්කොති හි නං පවෙදයුං[3]
යායං වන්දනපූජනා කුලෙසු,
සුඛුමං සල්ලං දුරුබ්බහං[4]
සක්කාරො කාපුරිසෙන දුජ්ජහො.

1059. සෙනාසනම්හා ඔරුය්හ නගරං පිණ්ඩාය පාවිසිං,
භුඤ්ජන්තං පුරිසං කුට්ඨිං සක්කච්චං තං උපට්ඨහිං.

1060. සො මෙ පක්කෙන හත්ථෙන ආලොපං උපනාමයි,
ආලොපං පක්ඛිපන්තස්ස අඞ්ගුලිපෙත්ථ ඡිජ්ජථ.

1061. කුඩ්ඩමූලං ච නිස්සාය ආලොපං තං අභුඤ්ජිසං,
භුඤ්ජමානෙ ච[5] භුත්තෙ වා ජෙගුච්ඡං මෙ න විජ්ජති.

1062. උත්තිට්ඨපිණ්ඩො ආහාරො පූතිමුත්තං ච ඔසධං,
සෙනාසනං රුක්ඛමූලං පංසුකූලං ච චීවරං,
යස්සෙතෙ අභිසම්භුත්වා ස වෙ චාතුද්දිසො නරො.

1063. යත්ථ එකෙ විහඤ්ඤන්ති ආරුහන්තා සිලුච්චයං
තත්ථ[6] බුද්ධස්ස දායාදො සම්පජානො පතිස්සතො,
ඉද්ධිබලෙනුපත්ථද්ධො කස්සපො අභිරුහති.

1064. පිණ්ඩපාතපටික්කන්තො සෙලමාරුය්හ කස්සපො,
ඣායති අනුපාදානො පහීනභයභෙරවො.

1065. පිණ්ඩපාතපටික්කන්තො සෙලමාරුය්හ කස්සපො,
ඣායති අනුපාදානො ඩය්හමානෙසු නිබ්බුතො.

1066. පිණ්ඩපාතපටික්කන්තො සෙලමාරුය්හ කස්සපො,
ඣායති අනුපාදානො කතකිච්චො අනාසවො.

---

1 දුක්ඛො - සයා, PTS, සීමු 1, 2. 2 සුඛාසිවාවහං - සයා
3 අවෙදයුං - ථ, . 4 දුජ්ජහං - ථ. 5 භුඤ්ජමානෙ ච - PTS.
තස්ස - සීමු 1, 2.

# 40. චත්තාලීසනිපාතය.

## 40. 1. 1

1056. ගණයා විසින් පිරිවරනලද්දක් වූ නො හැසිරෙන්නේ යා, (ගණපිරිවර ඇත්තේ) විකෘතිසිත් ඇත්තෙක් වෙයි, සමාධි දුර්ලභයෙක් වෙයි, නොයෙක් දෙනාට සඞ්ග්‍රහ කිරීම දුකෙකි, මෙසේ ආදීනව දැක ගණවාසය නුරුස්සේ යි.

1057. මුනි තෙම කුලයන් කරා නො එළඹෙන්නේ යා, (කුලූපගතෙම) විකෘති සිත් ඇත්තෙක් වෙයි, සමාධි දුර්ලභයෙක් වෙයි. හෙතෙම (කුලෝපගමනයෙහි) උත්සුක වූ රසයෙහි ගිජු වූ යම් අර්ථයෙක් තමහට සුව එළවා නම් ඒ (ශීල විශුද්ධි ආදි) අර්ථය වමාරයි (හැර දමයි.)

1058 යම් මේ කුලයන්හි වැඳීමෙක් පිදීමෙක් වේ නම් එය පඞ්කයෙකැ (මඩෙකැ) යි ද දුකසේ උපුළ යුතු සූක්ෂ්ම ශල්‍යයෙකැයි ද ප්‍රකාශ කළහ. සත්කාරය අසත්පුරුෂයා විසින් හැර දමනු දුෂ්කර යි.

1059. සෙනසුනෙන් බැස පිඬු පිණිස නගරයට පිවිසියෙමි, ඒ වළඳනා කුෂ්ඨී පුරුෂයා කරා ආදරයෙන් එළඹ සිටියෙමි.

1060. හෙතෙම (රෝගීත්) පැසීගිය අතින් ඒ අහරපිඬුව (මට) පිරිනැමී යැ, පිඬුව බහා ලන්නහුගේ ඇඟිල්ල ද මේ පාත්‍රයෙහි ගිලිහිණි.

1061. ඉක්බිති ගෙබිතක් සමීපයෙහි හිඳ ඒ බත්පිඬුව වැළඳීමි, වළඳනා කල්හි හෝ වැළැඳූ කල්හි හෝ පිළිකුලෙක් මට නො පැනේ.

1062. සිඟා ලද පිඩ අහර යා, පූතිමූත්‍ර බෙහෙද යා, රුක්මුල සෙනසුන යා පසුල සිවුර යි. යමෙක් මේ සිව්පසය වළඳන්නේ නම් හෙතෙම එකන්නෙන් සිව්දිගට යොග්‍ය පුරුෂයෙකි, (ඔහුට කොතැනත් දිවිරැක්ක හැකි යා යි සේ යි)

1063. සමහර කෙනෙක් පර්වතය නැගෙන්නාහු යම් බඳු වියෙක දී කලාන්ත වෙත් නම් බුදුන්ගේ දායාදයෙක් වූ කාශ්‍යප තෙම ඒ මහලුවියෙහි සම්‍යක් ප්‍රඥ ඇති වූ එළඹසිටි සිහි ඇති වූ සෘද්ධිබලයෙන් කරනලද උපත්ථම්භ ඇති වූ පර්වතයට නගී.

1064 පිණ්ඩපාතයෙන් පෙරළා ආ කාශ්‍යප තෙම පර්වතයට නැගැ උපාදාන රහිත වූ පහ වූ භයභිංසන ඇති වූ ධ්‍යාන කෙරේ.

1065. පිණ්ඩපාතයෙන් පෙරළා ආ කාශ්‍යප තෙම පර්වතයට නැගැ උපාදාන රහිත වූ ධ්‍යාන කෙරේ. (රාගාදි ගින්නෙන්) දැවෙන්නන් අතුරෙහි නිවියේ යි.

1066. පිණ්ඩපාතයෙන් පෙරළා ආ කාශ්‍යප තෙම පර්වතයට නැඟැ උපාදාන රහිත වූ කළ (පැවිදි) කිස ඇති වූ නිරාස්‍රව වූ ධ්‍යාන කෙරේ.

1067. කරෙරිමාලාවිතතා භූමිභාගා මනොරමා,
කුඤ්ජරාභිරුද්‍ා රම්මා තෙ සෙලා රමයන්ති මං

1068. නීලබ්භවණ්ණා රුචිරා වාරිසීතා සුචින්ධරා,
ඉන්දගොපකසඤ්ඡන්නා තෙ සෙලා රමයන්ති මං.

1069. නීලබ්භකූටසදිසා කූටාගාරවරූපමා,
වාරණාභිරුද්‍ා රම්මා තෙ සෙලා රමයන්ති මං.

1070. අභිවුට්ඨා රම්මතලා නගා ඉසිභි සෙවිතා,
අබ්භුන්නදිතා සිඛීහි තෙ සෙලා රමයන්ති මං.

1071 අලං ඣායිතුකාමස්ස පහිතත්තස්ස මෙ සතො,
අලං මෙ අත්ථකාමස්ස පහිතත්තස්ස භික්ඛුනො.

1072. අලං මෙ ඵාසුකාමස්ස පහිතත්තස්ස භික්ඛුනො,
අලං මෙ යොගකාමස්ස පහිතත්තස්ස තාදිනො.

1073. උම්මාපුප්ඵෙන[1] සමානා ගගනාවබ්භඡාදිතා,
නානාදිජගණාකිණ්ණා තෙ සෙලා රමයන්ති මං.

1074. අනාකිණ්ණා ගහට්ඨෙහි මිගසඞ්ඝනිසෙවිතා,
නානාදිජගණාකිණ්ණා තෙ සෙලා රමයන්ති මං.

1075. අච්ඡොදිකා පුථුසිලා ගොනඞ්ගුලමිගායුතා,
අම්බුසෙවාලසඤ්ඡන්නා තෙ සෙලා රමයන්ති මං.

1076. න පඤ්චඞ්ගිකෙන තුරියෙන රති මෙ හොති තාදිසී,
යථා එකග්ගචිත්තස්ස සම්මා ධම්මං විපස්සතො.

1077. කම්මං බහුකං න කාරයෙ පරිවජ්ජෙය්‍ය ජනං න උය්‍යමෙ,
උස්සුක්කො සො රසානුගිද්ධො අත්ථං රිඤ්චති යො සුඛාවහො

1078. කම්මං බහුකං න කාරයෙ පරිවජ්ජෙය්‍ය අනත්තනෙය්‍යමෙතං,
කිච්ඡති කායො කිලමති දුක්ඛිතො සො සමථං න වින්දති.

1079. ඔට්ඨප්පහතමත්තෙන අත්තානම්පි න පස්සති,
පත්ථද්ධගීවො චරති අහං සෙය්‍යොති මඤ්ඤති.

---

1 උම්මාපුප්ඵවසමානා-PTS.

1067. ලුහුවරණ රුක්පෙතින් පැතිරගිය සිත්කලු වූ භූමිභාග ඇති ඇතුන්ගේ ගජිතායෙන් රම්‍ය වූ ඒ පර්වතයෝ මා සිත් අලවත්.

1068. නිල්වලාවනට බඳු පැහැ ඇති වූ පැහැසර වූ සිහිල් දිය ඇති වූ පිරිසිදු වූ ඉඳුගොව්වන් විසින් ගැවැසීගත්තා වූ ඒ පර්වතයෝ මා සිත් අලවත්.

1069. නිල්වලාකුළු සුදුසු වූ කුළුගෙවලට උවම් වූ ඇතුන්ගේ ගජිතායෙන් රම්‍ය වූ ඒ පර්වතයෝ මා සිත් අලවත්.

1070. බෙහෙවින් මට වැසි ඇති රම්‍ය වූ තලා ඇති ශිඛීන් (මොනරුන්) විසින් කරනලද මධුර වූ උන්නාද ඇති ඍෂීන් විසින් සෙවුනාලද 'නග' නම් වූ ඒ පර්වතයෝ මා සිත් අලවත්.

1071. ධ්‍යාන කරනු කැමැති වූ නිවනෙහි එල වූ සිත් ඇති වූ මට මැනැවි, තමහට වැඩ කැමති නිවනෙහි එලවූ සිත් ඇති 'භික්ෂු' වූ මට මැනැවි.

1072. උමාකුසුම් (නිල්කටරොළු) බඳු පැහැ ඇති වූ නිල්වලායෙන් වැසුණු ගුවන්තලය වැනි වූ නොයෙක් පක්ෂිගණයා විසින් ගැවැසීගත්තාවූ ඒ පර්වයෝ මා රමණය කරත්.

1073. පහසු කැමැති වූ නිවනෙහි එල වූ සිත් ඇති 'භික්ෂු'වූ මට මැනැවි, යොග කැමැති වූ නිවනෙහි එල වූ සිත් ඇති 'තාදි'වූ මට මැනැවි.

1074. ගිහීන්ගෙන් ආකීර්ණ නො වූ මුව (සිලුපා) සමූහයා විසින් සෙවුනාලද්ද වූ නොයෙක් පක්ෂිගණයාගෙන් ආකීර්ණ වූ ඒ පර්වතයෝ මා සිත් ගනිත්.

1075. පහන් දිය ඇති පුළුල්ගලතල ඇත්තා වූ ගොනගුලන් (වඳුරන්) හා මුවන් (සිලුපාවුන්) ගෙන් යුක්ත වූ දියසෙවෙලින් වැසුණා වූ ඒ පර්වතයෝ මා සිත් අලවත්.

1076. එකඟසිත් ඇත්තා වූ රූපාදිධර්මයන් මොනවට (අනිත්‍යාදි විසින්) විදර්ශනා කරන්නා වූ මට යම් බඳු නම් එබඳු රතියක් පසඟතුරු රැවින් මට නො වේ.

1077. (කර්මාරාම වැ) කර්ම බොහෝ කොට නො කරවුව මැනැවැ, (කල්‍යාණමිත්‍ර නො වූ) ජනයා දුරු කල මැනැවැ (ප්‍රත්‍යයොත්පාදනයෙහි) ව්‍යායාම නො කල මැනැව, හෙතෙම (කුලොපගමනයෙහි) උත්සුක වැ රසයෙහි ගිජු වැ යම් අර්ථයෙක් (තමහට) සුව එලවා නම් ඒ අර්ථය වමාරයි.

1078. කර්ම බොහෝ කොට නො කරවුව මැනැවැ, තමහට හිත නො වූ තෙල කර්මාධිෂ්ඨානය හල මැනැවි, (ඉන්) කය වෙහෙසෙයි, ක්ලාන්ත වේ, හෙතෙම දුඃඛිත වූයේ සමථය නො ලබයි.

1079. පණ්ඩිතම්මන්‍යයා (ස්වාධ්‍යායශීලීයෙන්) තොල් පහල පමණින් තමා පමණුදු නො දකී, (අධිමානයෙන්) තද වූ කඳට ඇති වැ හැසිරෙයි, 'මම ශ්‍රෙෂ්ඨයෙමී' හඟී.

1080. අසෙය්‍යො සෙය්‍යසමානං බාලො මඤ්ඤති අත්තානං,
න තං විඤ්ඤූ පසංසන්ති පත්ථද්ධමානසං නරං.

1081. යො ච සෙය්‍යොහමස්මීති නාහං සෙය්‍යොති වා පුන,
හීනොහං[1] සදිසො වා'ති විධාසු න විකම්පති.

1082. පඤ්ඤවන්තං තථා තාදිං[2] සීලෙසු සුසමාහිතං,
චෙතොසමථමනුයුත්තං[3] තං වෙ[4] විඤ්ඤූ පසංසරෙ.

1083. යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවො නූපලබ්භති,
ආරකා හොති සද්ධම්මා නභසො පථවී[5] යථා.

1084 යෙසං ච හිරි ඔත්තප්පං සදා සම්මා උපට්ඨිතං,
විරූළ්හබ්‍රහ්මචරියා තෙ[6] තෙසං ඛීණා පුනබ්භවා.

1085. උද්ධතො චපලො භික්ඛු පංසුකූලෙන පාරුතො,
කපීව සීහචම්මෙන න සො තෙනුපසොභති.

1086. අනුද්ධතො අචපලො නිපකො සංවුතින්ද්‍රියො,
සොභති පංසුකූලෙන සීහො'ව ගිරිගබ්භරෙ.

1087. එතෙ සම්බහුලා දෙවා ඉද්ධිමන්තො යසස්සිනො,
දසදෙවසහස්සානි සබ්බෙ තෙ බ්‍රහ්මකායිකා.

1088. ධම්මසෙනාපතිං වීරං[7] මහාඣායිං සමාහිතං,
සාරිපුත්තං නමස්සන්තා තිට්ඨන්ති පඤ්ජලීකතා.

1089. නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම,
යස්ස තෙ නාභිජානාම යං'පි නිස්සාය ඣායති.

1090. අච්ඡෙරං වත බුද්ධානං ගම්භීරො ගොචරො සකො,
යෙ මයං නාභිජානාම වාලවෙධිසමාගතා.

1091. තං තථා දෙවකායෙහි පූජිතං පූජනාරහං,
සාරිපුත්තං තදා දිස්වා කප්පිනස්ස සිතං අහු.

1092. යාවතා බුද්ධඛෙත්තම්හි ඨපයිත්වා මහාමුනිං,
ධුතගුණෙ විසිට්ඨොහං සදිසො මෙ න විජ්ජති.

1093. පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං,
ඔහිතො ගරුකො භාරො නත්ථි දානි පුනබ්භවො.

---

1 හීනො හං - සීමු 1 2, ප. 2 තථාචාදිං - සයා, PTS.
3 චෙතොසමථසංයුත්තං - PTS. 4 තං ච - PTS.
5 පුථවී - මජසං, PTS, පුථුවී - සයා. 6. විරූළ්හබ්‍රහ්මචරියං - PTS.
7. ධීරං - PTS.

1080. බාල තෙම හීන වූයේ තමා ශ්‍රෙෂ්ඨයකු සම කොට හඟී. නුවණැතියෝ බෙහෙවින් තදමත් ඇති මිනිසකු වූ ඔහු නො පසසත්.

1081. යමෙකුත් 'මම උසස්මි' හෝ 'උසස් නො වෙමි' හෝ 'පහත්මි' හෝ 'එබන්දෙමි' හෝ නවවිධමානයෙහි නො සැලේ ද,

1082. එසේ නුවණැත්තා වූ තාදිගුණ ඇත්තා වූ අශෛක්ෂශීලයෙහි මොනොවට පිහිටියා වූ (රහත්පලසමවත් සමවැදුමින්) චිත්තසමථයෙහි යෙදුණා වූ ඔහු නුවණැතියෝ පසසත්.

1083. සබ්‍රම්සරුන් කෙරෙහි යමකුගේ ගෞරවයෙක් නො ලැබේ ද, හෙතෙම අහසට පොළොව මෙන් සද්ධර්මයෙන් දුරු වේ.

1084. තවද යම් කෙනකුන්හට හිරිඔතප් දෙක හැම කල්හි මොනොවට එළඹසිටියේ ද ඔහු වැඩුණු බඹසර ඇත්තාහු යැ. ඔවුන්ගේ පුනර්භවයෝ ක්‍ෂය වූවාහු යි.

1085. උද්ධත වූ චපල (පාසිවුරු සැරසීම් ආදිය ඇති) වූ මහණ තෙම පසුල් සිවුරින් පොරෝනාලද්දේ වේද, සිහසමින් පොරෝනාලද වඳුරකු බඳු හෙතෙම ඉන් නො හොබී.

1086. උද්ධත නො වූ චපල නො වූ (ආත්මාර්ථපරාර්ථයෙහි) නිපුණ වූ වසනලද ඉඳුරන් ඇත්තා වූ මහණ තෙම ගිරිගුහායෙහි සිරදකු මෙන් පසුල්සිවුරින් හොබී.

1087. තෙල බොහෝ වූ දෙවිවරු සෘද්ධිමත්හු යැ, යශස් ඇත්තාහු යැ, බ්‍රහ්මකායික වූ ඒ සියලු දසදහසක් දෙවියෝ,

1088. ධර්මසේනාපති වූ වීර වූ මහත් ධ්‍යාන ඇත්තා වූ එකඟ සිත් ඇත්තා වූ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට ඇඳිලි බැඳියාහු නමස්කාර කෙරෙමින් සිටිත්.

1089. ආජානීය පුරුෂය, ඔබට නමස්කාර වේවා! පුරුෂෝත්තමය, ඔබට නමස්කාර වේවා! (තෙපි) යම් අරමුණක් නිසා ධ්‍යාන කරවු නම් තොපගේ ඒ අරමුණ (ඇපි) නො දනුම්හ.

1090. එකත්තෙන් ආශ්චර්‍ය්‍ය යැ, බුදුවරුන්ගේ ස්වවිෂය ගැඹුරු සැ. වාලවෙඩින් සම වැ (සියුම් අරුත් දක්නට) සමර්ථ වැ ආ යම්බඳු ඇපි (බුද්ධවිෂය) පිරික්සන්නමෝ නො දනුම්හ.

1091. දේව සමූහයා විසින් එසේ පුදනලද පූජාර්හ වූ ඒ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ දැකැ එදා මහාකප්පිනහට සිනායෙක් (පහළ) වී.

1092. සකල බුද්ධක්ෂේත්‍රයෙහි මහමුනිහු (සම්‍යක් සම්බුදුන්) හැර ධූතගුණයෙන් මා බන්දෙක් නො පැනෙයි. ධූතගුණයෙහි මම විශිෂ්ටයෙමි.

1093. මා විසින් ශාස්තෲන් වහන්සේ ඇසුරු කරනලදහ. බුදුන්ගේ අනුශාසනය කරනලද යැ, ගුරුබර බහා තබනලද්දේ යැ. මින්මතු (මට) පුනර්භවයෙක් නැති

1094. න චීවරෙ න සයනෙ භොජනෙ නුපලිප්පති[1]
ගොතමො අනප්පමෙය්‍යො මූළාලපුප්ඵං[2] විමලං'ව,
අම්බුනා නික්ඛමනින්නො[3] තිභවාභිනිස්සටො.[4]

1095. සතිපට්ඨානගීවො සො සද්ධාහත්ථො මහාමුනි
පඤ්ඤාසීසො මහාඤාණී සදා චරති නිබ්බුතො'ති.

ඉත්ථං සුදං ආයස්මා මහාකස්සපො ථෙරො ගාථායො අභාසිත්ථා'ති

**මහාකස්සපත්ථෙරගාථා.**

**තස්සුද්දානං:**

චත්තාලීසනිපාතම්හි මහාකස්සපසව්හයො,
එකො'ව ථෙරො ගාථායො චත්තාලීස දුවෙ'පි චා'ති.

## චත්තාලීසනිපාතො නිට්ඨිතො.

---

1, නුපලිම්පති - ප. 2. මූළාලිපුප්ඵං - PTS
3. නික්ඛම්මනින්නො - PTS. නික්ඛම්මනින්නොති - සිමු. 1, 2.
4. භවාභිනිස්සටො - සිමු. 1, 2.

1094. (තෘෂ්ණායෙන්) චීවරයෙහි නො තැවරෙයි, සයනයෙහි නො තැවරෙයි, භෝජනයෙහි නො තැවරෙයි, ගෞතම තෙමේ ප්‍රමාණාගී නො වේ. දිය නො තැවරෙන නිර්මල වූ නිලුපුලක් වැන්නා, අභිනිෂ්ක්‍රමයට නැඹුරු වූයේ යැ, භවත්‍රයෙන් නික්මුණේ යි.

1095. සිවටන් මැ කඳට ඇත්තා වූ සැදැහැ මැ අත් ඇත්තා වූ මහාමුනි වූ නුවණ මැ මුදුනත් ඇත්තා වූ මහනුවණැති වූ හෙතෙම හැම කල්හි නිවියෙක් වැ වෙසේ.

මෙසේ ආයුෂ්මත් 'මහාකස්සප' ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

මහාකස්සප ස්ථවිරගාථා යි.

**උද්දානය**:

සතළිස් වැනි නිපාතයෙහි 'මහාකස්සප' යන ස්වාභිධානය ඇති එක් මැ තෙරනමකි. ගාථාවෝ ද දෙසාළිසෙකි.

## චත්තාලීසනිපාතය නිමි.

# 50. පඤ්ඤාසනිපාතො.

### 50. 1. 1

1096. කදා නු'හං පබ්බතකන්දරාසු
එකාකියො අද්දුතියො විහස්සං
අනිච්චතො සබ්බභවං විපස්සං
තං මෙ ඉදං තං නු කදා භවිස්සති.

1097. කදා නු'හං භින්නපටන්ධරො[1] මුනි
කාසාවවත්ථො අමමො නිරාසො[2]
රාගං ච දොසං ච තථෙව මොහං
හන්ත්වා සුඛී පවනගතො විහස්සං.

1098. කදා අනිච්චං වධරොගනීළං[3]
කායං ඉමං මච්චුජරායුපද්දුතං
විපස්සමානො වීතභයො විහස්සං
එකො වනෙ තං නු කදා භවිස්සති.

1099. කදා නු'හං භයජනනිං දුඛාවහං[4]
තණ්හාලතා බහුවිධානුවත්තනිං
පඤ්ඤාමයං තිඛිණමසිං ගහෙත්වා
ඡෙත්වා වසෙ තම්පි කදා භවිස්සති.

1100 කදා නු පඤ්ඤාමයමුග්ගතෙජං
සත්ථං ඉසීනං සහසාදියිත්වා[5]
මාරං සසෙනං සහසා භඤ්ජිස්සං
සීහාසනෙ තං නු කදා භවිස්සති.

1101. කදා නු'හං සබ්භිසමාගමෙසු
දිට්ඨො භවෙ ධම්මගරූහි තාදිහි
යථාවදස්සීහි ජිතින්ද්‍රියෙහි
පධානියො තං නු කදා භවිස්සති.

1102. කදා නු මං තන්දිඛුදා පිපාසා
වාතාතපා කීටසිරිංසපා[6] වා
නබාධයිස්සන්ති[7] න තං ගිරිබ්බජෙ
අත්ථියං තං නු කදා භවිස්සති

1103. කදා නු ඛො යං විදිතං මහෙසිනා
චත්තාරි සච්චානි සුදුද්දසානි
සමාහිතත්තො සතිමා අගච්ඡං,
පඤ්ඤාය තං තං නු කදා භවිස්සති.

1104 කදා නු රූපෙ අමිතෙ ච සද්දෙ
ගන්ධෙ රසෙ ඵුසිතබ්බෙ ච ධම්මෙ
ආදිත්තතොහං සමථෙහි යුත්තො
පඤ්ඤාය දක්ඛං[8] තදිදං කදා මෙ

1105. කදා නු'හං දුබ්බචනෙන වුත්තො
තතො නිමිත්තං විමනො න හෙස්සං
අථො පසත්ථො'පි තතො නිමිත්තං
තුට්ඨො න හෙස්සං තදිදං කදා මෙ.

---

1. පටන්ධරො - මජ්ඣං. 2. නිරාසයො - PTS. 3. වධරොගනීළ - සිමු. 1, 2.
4. දුක්ඛාවහං - PTS 5. අභිමාදියිත්වා - සයා.
6. කීටසරීසපා - සිමු. 1,2. ප 7 නිබාධයිස්සන්ති - PTS 8. දච්ඡං - සිමු. 1, 2 ප.

# 50. පඤ්ඤාසනිපාතය.

## 50. 1. 1

1096. කවරදා නම් මම ගිරිකඳුරැහි එකලා වැ තෘෂ්ණා රහිත වැ වෙසෙම් ද? සියලු භවය අනිත්‍ය විසින් විදර්ශනා කරනෙම්ද? මා ගේ ඒ මේ පරිවිතර්කය කවරදා නම් (මුදුන්පත්) වන්නේ ද?

1097. කවරදානම් මම භින්නපටධර වැ පැවිදි වැ කහවත් ඇති වැ මමත්ව නැති වැ ආශා රහිත වැ රාගයත් ද්වේෂයත් එසේ මැ මොහයත් නසා මහවනගත වැ සුවසේ වෙසෙම් ද?

1098. කවරදා නම් (මම) අනිත්‍ය වූ මරණයටත් රොගයටත් කසලුවක් (කැදැල්ලක්) වූ ජරාමරණ විසින් උපද්‍රැත වූ මේකය විදර්ශනා කෙරෙමින් පහ වූ භය ඇති වැ එකලා වැ වෙනෙහි වෙසෙම් ද? කවරදා නම් ඒ අදහස මුදුන් පත් වන්නේ ද?

1099. කවරදා නම් මම භය උපදවන්නා වූ දුක් එළවන්නා වූ නොයෙක් අගුරු අරමුණු (හෝ භවයන්) අනුව පවත්නා වූ තෘෂ්ණාලතාව මගනැණමුවා තිහිණි (මුවහත් ඇති) අසිපත ගෙනැ සිඳැලා වෙසෙම් ද? එද කවරදා නම් මුදුන්පත් වන්නේ ද?

1100. කවරදා නම් මම සිහසුන්(තිර අසුන්)හි හිඳ තියුණු මුවහත් ඇත්තා වූ මාගීඥනමය වූ සෘෂීන්ගේ ශසත්‍රය සැහැසි වැ ගෙන සෙන් සහිත මරහු සැහැසි වැ මඩනෙම් ද? ඒ අදහස කවරදා නම් මුදුන්පත් වන්නේ ද?

1101. කවරදා නම් මම සත්පුරුෂ සමාගමයෙහි තාදීගුණ ඇත්තා වූ අවිපරීතදර්ශන ඇත්තා වූ දිනනලද ඉඳුරන් ඇත්තා වූ ධර්මගරුක-යන් විසින් දක්නාලද ප්‍රධන් වීර්‍ය්‍ය ඇත්තෙම් වන්නෙම් ද? ඒ අදහස කවරදා නම් මුදුන්පත් වන්නේ ද?

1102. කවරදා නම් සවාර්‍ය කැමැති වූ ඒ මා ගිරිකඳුරෙහි දී අලස බව හෝ සාපවස් හෝ අවුසුලං හෝ කෘමි කුහුසුවෝ හෝ නො පෙලත් ද? ඒ අදහස කවරදා නම් මුදුන්පත් වන්නේ ද?

1103. කවරදා නම් මම මහර්ෂි වූ සම්බුදුන් විසින් යම් සත්‍යයක් අවබෝධ කරනලද නම් දැකීමට අතිශයින් දුෂ්කර වූ ඒ චතුරාර්‍ය්‍ය-සත්‍යයන් එකඟ වූ සිත් ඇති වැ සිහි ඇති වැ මාර්ගප්‍රඥයෙන් අවබොධ කරනෙම් ද? ඒ අදහස කවරදා නම් මුදුන් පත් වන්නේ ද?

1104. කවරදා නම් සමාධියෙන් යුක්ත වූ මම අප්‍රමාණ වූ රූපයන් ද ශබ්දයන් ද ගන්ධයන් ද ස්ප්‍රෂ්ටව්‍යයන් ද ධර්මාරම්මණයන් ද ගිනි ඇවිලගත්තවුන් සෙයින් (විදර්ශනා) ප්‍රඥයෙන් දක්නෙම් ද, මා ගේ ඒ අදහස කවරදා නම් මුදුන්පත් වන්නේ ද?

1105. කවරදා නම් මම දුර්භාෂිතයෙන් ගටනාලද්දෙම් එය නිමිති කොට දොම්නස් නො වෙම් ද, නොහොත් පසස්නාලද්දෙම් එය නිමිති කොට තුටුයෙම් නො වෙම් ද, මා ගේ ඒ මේ අදහස කවරදා නම් මුදුන්පත් වන්නේ ද?

1106. කදා නු කට්ඨෙ ච තිණෙ ලතා ච
ඛන්ධෙ ඉමෙහං අමිතෙ ච ධම්මෙ
අජ්ඣත්තිකානෙව ච බාහිරානි ච
සමං තුලෙය්‍යං තදිදං කදා මෙ.

1107. කදා නු මං පාවුසකාලමෙඝො
නවෙන තොයෙන සචීවරං වනෙ
ඉසිප්පයාතම්හි පථෙ වජන්තං
ඔවස්සතෙ තං නු කදා භවිස්සති.

1108. කදා මයූරස්ස සිඛණ්ඩිනො වනෙ
දිජස්ස සුත්වා ගිරිගබ්භරෙ රුතං
පච්චුට්ඨහිත්වා අමතස්ස පත්තියා
සංචින්තයෙ තං නු කදා භවිස්සති.

1109. කදා නු ගඞ්ගං යමුනං සරස්සතිං
පාතාලඛිත්තං වළවාමුඛං ච[1]
අසජ්ජමානො පතරෙය්‍යමිද්ධියා
විභිංසනං[2] තං නු කදා භවිස්සති.

1110. කදා නු නාගො'ව අසඞ්ගචාරී[3]
පදාලයෙ කාමගුණෙසු ඡන්දං
නිබ්බජ්ජයං සබ්බසුභං නිමිත්තං
ඣානෙ යුතො තං නු කදා භවිස්සති.

1111. කදා ඉණට්ටො'ව දලිද්දකො නිධිං
ආරාධයිත්වා ධනිකෙහි පීළිතො
තුට්ඨො භවිස්සං අධිගම්ම සාසනං
මහෙසිනො තං නු කදා භවිස්සති.

1112. බහූනි වස්සානි තයාම්හි යාචිතො
අගාරවාසෙන අලං නු තෙ ඉදං
තං දානි මං පබ්බජිතං සමානං
කිංකාරණා චිත්ත තුවං න යුඤ්ජසි.

1113. නනු අහං චිත්ත තයාම්හි යාචිතො
ගිරිබ්බජෙ චිත්‍රඡදා විහඞ්ගමා
මහින්දඝොසත්ථනිතාභිගජ්ජිනො
තෙ තං රමිස්සන්ති[4] වනම්හි ඣායිනං.

1114. කුලම්හි මිත්තෙ ච පියෙ ච ඤාතකෙ
ඛිඩ්ඩාරතිං කාමගුණං ච ලොකෙ
සබ්බං පහාය ඉමමජ්ඣුපාගතො[5]
අථො'පි ත්වං චිත්ත න මය්හ තුස්සසි[6]

1115. මමෙව එතං න හි ත්වං පරෙසං
සන්නාහකාලෙ පරිදෙවිතෙන කිං
සබ්බං ඉදං චලමිති පෙක්ඛමානො
අභිනික්ඛමිං අමතපදං[4] ජිගීසං.

---

1. ඛලවාමුඛඤ්ච - PTS. ප 2. විහිංසනං - PTS 3. සඞ්ගාමචාරී - ස්‍යා, PTS අඞ්ගාමචාරී - ප 4. රමෙස්සන්ති - සී මු 1, 2.
5. ඉදමජ්ඣුපාගතො - ස්‍යා PTS ඉධමජ්ඣුපාගතො - ප
6 තුස්සති - සීමු. 1, 2. ප. 7. අමතං පදං - ස්‍යා, PTS ප.

1106. කවරදා නම් මම කාෂ්ඨයන් ද තෘණයන් ද ලතාවන් ද මේ පඤ්චස්කන්ධය ද ආධ්‍යාත්මික වූත් බාහ්‍ය වූත් අප්‍රමාණ රූපධර්මයන් ද සමසේ තුලනය කෙරෙම් ද, මා ගේ ඒ මේ අදහස කවරදා නම් මුදුන්පත් වන්නේ ද?

1107 කවරදා නම් වැසිකල්හි වූ මේඝය තෙම වනයෙහි සෘෂීන් ගිය මඟ සිවුරු සහිත වැ යන මා අළුත් දියෙන් තෙමන්නේ ද? (මාගේ) ඒ අදහස කවරදා නම් මුදුන්පත් වන්නේ ද?

1108. කවරදා නම් මම වනයෙහි ගිරිලැහැබිහි දී සිළු ඇති මයූර පාක්ෂියා ගේ කේකාරවය අසා යහනින් නැඟී නිර්වාණාධිගමය පිණිස (අනිත්‍යාදි විසින්) මෙනෙහි කෙරෙම් ද, මා ගේ ඒ අදහස කවරදා නම් මුදුන්පත් වන්නේ ද?

1109. කවරදා නම් මම ගඞ්ගා යැ යමුනා යැ සරස්වතී යැ යන නදීන් හා ඉතා බිහිසුණු වූ පාතාල භූමීන් (නරාවල) හා වඩබාමුඛය හා යන මොවුන් නො පැකිළැ සෘද්ධියෙන් තරණය කෙරෙම් ද, මා ගේ ඒ අදහස කවරදා නම් මුදුන්පත් වන්නේ ද?

1110. කවරදානම් මම (කිසිවක) නො ලැගෙන පැවැතුම් ඇති වූ ඇතකු මෙන් සියලු ශුභාරම්මණයන් නිරවශේෂයෙන් බැහැර කෙරෙමින් ධ්‍යානයෙහි යෙදුණෙම් කාමගුණයෙහි ඡන්දය පලනෙම් ද, මාගේ ඒ අදහස කවරදා නම් මුදුන්පත් වන්නේ ද?

1111 කවරදා නම් මම ධනහිමියන් විසින් පෙළනුලැබූවා වූ ණය හෙයින් ලජ්ජා ඇත්තා වූ දිළින්දකු නිදහනක් ලැබ මෙන් මහර්ෂි වූ සම්බුදුන්ගේ ශාසනය සාක්ෂාත් කොට ගෙන තුෂ්ට වන්නෙම් ද, මාගේ ඒ අදහස කවරදා නම් මුදුන්පත් වන්නේ ද?

1112. එම්බා චිත්තය, තා විසින් වනාහි දූත් තා ගේ ගිහිගේ වාසයෙන් කම් නැතැ'යි බොහෝ කලක් මුළුල්ලෙහි මම අයදනාලද්දෙම් නො වෙම් ද, ඒ මා දූත් පැවිදි වත් මැ කවර හෙයින් තෝ යොග නො කරන්නෙහි ද?

1113. එම්බා චිත්තය, තා විසින් වනාහි ගිරිකඳුරුයෙහි (වසන) ඒ විසිතුරු පියාපත් ඇත්තා වූ (මයූර) පක්ෂීහු ද ජලනිඝෝෂයෙන් උන්නාදවත් වූ ගලතලාමෝ ද වනයෙහි ධ්‍යාන කරන්නා වූ තා රමණය කරති' මම අයදනා ලද්දෙම් නො වෙම් ද?

1114. එම්බා චිත්තය, (තාගේ) අයැදුමෙන්) කුලයෙහි මිතුරන් ද ප්‍රියයන් ද නෑයන් ද ක්‍රීඩාරතිය ද ලොකයෙහි කාමගුණයන් ද යන සියල්ල හැර දමා මේ අරනට (හෝ පැවිද්දට) එළඹියෙමි, එතෙකුදු-වත් තෝ මා නො පිණවන්නෙහි යැ.

1115. එම්බා චිත්තය, තෙල සිත මා ගේ මැ යැ, තෝ පරසතු නො වේ මැ යි, (ක්ලෙශයුද්ධයට භාවනායෙන්) සන්නාහ සන්නද්ධ වන කල්හි වැලැප්මෙන් කිම, මේ (ත්‍රෛභූමක ධර්ම) සියල්ල චපල (අනිත්‍ය) යැ යි නුවණින් දක්මින් අමෘතපදය (නිවන) සොයන්නෙම් අභිනිෂ්ක්‍රමණය කෙළෙමි.

1116. සුයුත්තවාදී[1] ද්විපදානමුත්තමො
මහාභිසක්කො නරදම්මසාරථි[2]
චිත්තං චලං මක්කටසන්නිභං ඉති
අවීතරාගෙන සුදුන්නිවාරයං.

1117. කාමා හි චිත්‍රා මධුරා මනොරමා
අවිද්දසු යත්ථ සිතා පුථුජ්ජනා
තෙ දුක්ඛමිච්ඡන්ති පුනබ්භවෙසිනො
චිත්තෙන නීතා නිරයෙ නිරාකතා.

1118. මයූරකොඤ්චාභිරුතම්හි කානනෙ
දීපීහි ව්‍යග්ඝෙහි පුරක්ඛතො වසං
කායෙ අපෙක්ඛං ජහ මා විරාධය[3]
ඉතිස්සු මං චිත්ත පුරෙ නියුඤ්ජසි.

1119. භාවෙහි ඣානානි ච ඉන්ද්‍රියානි[4]
බලානි බොජ්ඣඞ්ගසමාධිභාවනා
තිස්සො ච විජ්ජා ඵුස බුද්ධසාසනෙ
ඉතිස්සු මං චිත්ත පුරෙ නියුඤ්ජසි.

1120. භාවෙහි මග්ගං අමතස්ස පත්තියා
නිය්‍යානිකං සබ්බදුක්ඛක්ඛයොගධං
අට්ඨඞ්ගිකං සබ්බකිලෙසසොධනං
ඉතිස්සු මං චිත්ත පුරෙ නියුඤ්ජසි.

1121. දුක්ඛන්ති ඛන්ධෙ පටිපස්ස යොනිසො
යතො ච දුක්ඛං සමුදෙති තං ජහ
ඉධෙව දුක්ඛස්ස කරොහි අන්තං
ඉතිස්සු මං චිත්ත පුරෙ නියුඤ්ජසි

1122. අනිච්චං දුක්ඛන්ති විපස්ස යොනිසො
සුඤ්ඤං අනත්තාති අඝං වධන්ති ච
මනොවිචාරෙ උපරුන්ධ චෙතසො
ඉතිස්සු මං චිත්ත පුරෙ නියුඤ්ජසි.

1123. මුණ්ඩො විරූපො අභිසාපමාගතො
කපාලහත්ථොව කුලෙසු භික්ඛසු[5]
යුඤ්ජස්සු සත්ථුවචනෙ මහෙසිනො
ඉතිස්සු මං චිත්ත පුරෙ නියුඤ්ජසි.

1124. සුසංවුතත්තො විසිඛන්තරෙ[6] චරං
කුලෙසු කාමෙසු අසඞ්ගමානසො
චන්දො යථා දොසිනපුණ්ණමාසියා
ඉතිස්සු මං චිත්ත පුරෙ නියුඤ්ජසි.

1125. ආරඤ්ඤිකො හොහි[7] ච පිණ්ඩපාතිකො
සොසානිකො හොහි[7] ච පංසුකූලිකො
නෙසජ්ජිකො හොහි[7] සදා ධුතෙ රතො
ඉතිස්සු මං චිත්ත පුරෙ නියුඤ්ජසි.

---

1. සුවුත්තවාදී - සෳා. PTS 2. නිරංකතා - සෳා PTS
3. විරාධයෙ - PTS. 4. ඉන්ද්‍රියානි ච - PTS 5. භික්ඛුසු - සීමු. 1,2
6. සිඛන්තරං - සෳා, PTS. 7. හොති - සෳා, PTS.

1116. එම්බා චිත්තය, අවීතරාගයා විසින් වළඟනු දුකර වූ චපල සිත වනාහි වන වඳුරකු වැන්නැ යි සුභාෂිතවාදී වූ දෙපා ඇත්තවුන් අතුරෙහි උතුම් වූ (දුකට) ජගද්වෛද්‍ය වූ භාරදම්‍යසාරථීහු වදාළහ.

1117. නුවණමද පුහුදුන්හු යම් තැනෙකැ ඇලුණාහු නම් ඒ කාමයෝ විචිත්‍රහ, මධුරහ, මනෝරම්‍යහ, ඔහු පුනර්භවය සොයන්නාහු සිත විසින් (සුඛයෙන්) තිරාකෘත (වළඟනලද්) වැ නිරයෙහි පමුණුවන ලද්දාහු දුක් කැමැති වෙත්.

1118. මොනරුන් විසින් විල්ලිහිණියන් විසින් කරනලද නාද ඇති වනයෙහි දිවියන් විසින් වගුන් විසින් පෙරටු කරනලදු වැ වනන්-තෙහි සිරුරෙහි අපෙක්‍ෂාව හැරැදමව, නවමක්‍ෂණය නහමක් වරද'යි පෙර මා (පැවිද්දෙහි) යෙදූයෙහි

1119. එම්බා චිත්තය, පෙර තෝ 'බුදුසසුන්හි ධ්‍යාන වඩව, ඉන්ද්‍රිය බල බොධ්‍යඞ්ගසමාධිභාවනාවන් වඩව, ත්‍රිවිද්‍යාවන් ද ලබව'යි මට අණ කෙළෙහි.

1120. එම්බා චිත්තය, තෝ පෙර නෛර්‍යාණික වූ සර්වදුඃඛක්‍ෂය සඞ්ඛ්‍යාත නිවන අරමුණු කළ සර්වක්ලේශශොධන වූ අෂ්ටාඞ්ගිකමාර්ගය නිර්වාණ ප්‍රාප්තිය පිණිස වඩව'යි මෙසෙයින් මට අණ කෙළෙහි.

1121. එම්බා චිත්තය, පෙර තෝ 'ස්කන්ධයන් දුකැ යි නුවණින් බලව, යළි යමකින් දුක හටගැනේ නම් එය දුරු කරව, මෙ අත් බැව්හි දී මැ දුක් කෙළවර කරව'යි මට අණ කෙළෙහි.

1122. එම්බා චිත්තය, පෙර තෝ '(ස්කන්ධයන්) අනිත්‍ය යැ යි ද (උදයව්‍යය පීඩිත හෙයින්) දුකැ යි ද (අසාරාදි බැවින්) ශූන්‍ය යැ යි ද අනාත්ම යැ යි ද අඝ යැ යි ද හිංසක යැ යි ද නුවණින් විදර්ශන කරව (අවලොස්) මනොපවිචාරයන් සිතින් වළකව'යි මට අණ කෙළෙහි.

1123. එම්බා චිත්තය, තෝ වනාහි පෙර "තෝ මුඩු වැ විරූප වැ භික්‍ෂු-සමූහයා අතුරෙහි කබල් ගත් අත් ඇති වැ ('කබල්ගත් අත් ඇති වැ සිඟා ඇවිදුව යන) අභිශාපයට පැමිණියෙහි මහර්ෂි වූ ශාස්තෘන් වහන්සේගේ වචනයෙහි නියුක්ත වව යි මට අණ කෙළෙහි.

1124. එම්බා චිත්තය, තෝ වනාහි පෙර "තෝ සුසංවෘත වැ වීථි අතුරෙහි සරමින් පැහැදිලි පුරපසලොස්වක් දා සඳ මෙන් කුලයන්-හිදු පන්කම්හිදු නො ඇලුණු සිත් ඇතියෙක් වව යි මට අණ කෙළෙහි.

1125. එම්බා චිත්තය, තෝ වනාහි පෙර 'තෝ හැම කල්හි ධූතාඞ්ගයෙහි ඇලුණෙහි ආරණ්‍යක වන්නැ යි පිණ්ඩපාතික වන්නැ යි සමශානික වන්නැයි පාංශුකූලික වන්නැ යි නෙසජ්ජික වන්නැයි මට අණ කෙළෙහි.

1126. රොපෙත්ව[1] රුක්ඛානි යථා ඵලෙසී
මූලෙ තරුං ඡෙත්තු තමෙව ඉච්ඡසි
තථූපමං චිත්තමිදං[2] කරොසි
යං මං අනිච්චම්හි චලෙ නියුඤ්ජසි.

1127 අරූප දූරඞ්ගම එකචාරි
න තෙ කරිස්සං වචනං ඉදානිහං
දුක්ඛා හි කාමා කටුකා මහබ්භයා
නිබ්බානමෙවාභිමනො චරිස්සං.

1128. නාහං අලක්ඛ්‍යා අහිරික්කතාය[3] වා
න චිත්තහෙතූ න ච දූරකන්තනා
ආජීවහෙතූ ච අහං න නික්ඛමිං
කතො ච තෙ චිත්ත පටිස්සවො මයා

1129. අප්පිච්ඡතා සප්පුරිසෙහි වණ්ණිතා
මක්ඛප්පහානං වූපසමො දුඛස්ස[4]
ඉතිස්සු මං චිත්ත තදා නියුඤ්ජසි
ඉදානි ත්වං ගච්ඡසි පුබ්බචිණ්ණං.

1130. තණ්හා අවිජ්ජා[5] ච පියාප්පියඤ්ච[6]
සුභානි රූපානි සුඛා ච වෙදනා
මනාපියා කාමගුණා ච වන්තා
වන්තෙ අහං ආවමිතුං[7] න උස්සහෙ.

1131. සබ්බත්ථ තෙ චිත්ත වචො කතං මයා
බහූසු ජාතීසු න මෙසි කොපිතො
අජ්ඣත්තසම්භවො කතඤ්ඤුතාය තෙ
දුක්ඛෙ චිරං සංසරිතං තයා කතෙ.

1132. ත්වඤ්ඤෙව නො චිත්ත කරොසි බ්‍රාහ්මණො
ත්වං ඛත්තියො[8] රාජදසී කරොසි
වෙස්සා ච සුද්දා ච භවාම එකදා
දෙවත්තනං වා'පි තවෙව වාහසා.

1133. තවෙ'ව හෙතූ අසුරා භවාමසෙ
ත්වංමූලකං නෙරයිකා භවාමසෙ
අථො තිරච්ඡානගතා'පි එකදා
පෙතත්තනං වා'පි තවෙ'ව වාහසා.

1134. නනු[9] දුබ්භිස්සසි මං පුනප්පුනං
මුහුං මුහුං චාරණිකං'ව දස්සයං[10]
උම්මත්තකෙනෙව මයා පලොභසි
කිඤ්චා'පි තෙ චිත්ත විරාධිතං මයා.

1135. ඉදං පුරෙ චිත්තමචාරි චාරිකං
යෙනිච්ඡකං යත්ථකාමං යථාසුඛං
තදජ්ජහං නිග්ගහෙස්සාමි[11] යොනිසො
හත්ථිප්පභින්නං[12] විය අඞ්කුසග්ගහො.

---

1. රොපෙත්වා – PTS. 2. චිත්ත ඉදං – PTS. 3. අහිරීකතාය – PTS
4 දුක්ඛස්ස – PTS. 5. තණ්හං අවිජ්ජං – PTS. 6. පියාපියං ච – PTS.
7. ආවසිතුං – සයා. ආගමිතුං – PTS. 8. ඛත්තියා – PTS.
9. න නූන – සයා, PTS. 10. චාරු කංව දස්සහං–PTS. චාරණිකං ච දුස්සහං– සයා
11. නිග්ගහිස්සාමි – සයා 12. හත්ථිං පභින්නං – සයා.

1126. එම්බා චිත්තය, තෝ මා අනිත්‍ය වූ චලත්සංසාරයෙහි යොදව-නෙහි ද ඒ තෝ ඵල කැමැත්තකු වෘක්ෂයක් වවා ඒ වෘක්ෂ මුල ලා සිඳින්නට කැමැතියකු සේ මෙය කෙරෙහි.

1127. එම්බා රූ නැත්තව, දූරඞ්ගමය, එකලා නැනැත්තව, මින් මතු මම තාගේ වචනය නො කරන්නෙමි යම් හෙයකින් කාමයෝ (අතීත-යෙහි) දුක් වූවාහු ද, (අනාගතයෙහි) කටුකඵල ඇත්තාහු ද මහත් භය ඇත්තාහු ද එහෙයින් මම නිවනට මැ මුහුණ ලා හැසිරෙන්නෙමි.

1128. එම්බා චිත්තය, මම අභාග්‍ය හෙයින් හෝ නිර්ලජ්ජ බැවින් හෝ (චපල) සිතට වහල් වැ හෝ රාජද්‍රෝහී බැවින් හෝ දිවි රැකගන්නා හෙයින් හෝ ගිහිගෙන් නික්මුණෙම් නො වෙමි. මා විසින් තට 'තා වශයෙහි නො සිටුනා බවට ප්‍රතිඥා කරනලදි.

1129. එම්බා චිත්තය, තෝ එකල්හි ''අල්පෙච්ඡ බව සත්පුරුෂයන් විසින් වර්ණිත යැ යි, ගුණමකු බව ප්‍රහීණ කිරීම දුඃඛයාගේ ව්‍යුපශම යැ'යි (එහෙයින් එගුණයන්හි පිහිටිය යුතු යැ යි) මට අණ කෙළෙහි ය. දැන් තෝ පෙර පුරුදු දැයට යන්නෙහි.

1130. තෘෂ්ණාව ද අවිද්‍යාව ද ප්‍රියාප්‍රියයෝ ද ශුභරූපයෝ ද සුඛ-වේදනාව ද මන වඩන කාමගුණයෝ ද (මා විසින්) වමරා දමන ලදහ, වමාල දෑ යළි ගිලින්නට මම උත්සාහ නො කරමි.

1131. එම්බා චිත්තය, සියලු (භව,යොනි,ගති,විඥානස්ථිති යන) තැන්හි මා විසින් තා ගේ වචනය කරනලද යැ, නොයෙක් ජාතීන්හි දී මා විසින් තෝ කෝප නො කරන ලද්දෙහි යැ. අධ්‍යාත්මයෙහි (සන්තාන-යෙහි) සම්භව වැද තා කළගුණ නො දත්නා බැවින් තා විසින් නිපදවනලද (සසර) දුක්හි මා දිගුකලක් හැරිහැරූ බව යැ.

1132. එම්බා චිත්තය, තෝ මැ අපට උපකාර වෙහි, තෝ මැ බ්‍රාහමණ වෙහි, තෝ මැ ක්ෂත්‍රිය වෙහි, තෝ මැ රජ වෙහි, තා මැ හේතු කොට ගෙන අපි ඇතැම් කලෙකැ වෛශ්‍යත් ශුද්‍රත් වම්හ. දිව්‍ය-භාවය ද ...බම්හ.

1133 තා මැ හේතුකොට ගෙන අසුර වම්හ, තා මැ මූල් කොට ගෙන තිරිසත් වම්හ, තවද ඇතැම් කලෙකැ තා මැ මූල් කොට ගෙන තිරිසත්ගත ද වම්හ, තා ගේ මැ කාරණභාවයෙන් ප්‍රෙතභාවය ද ලබම්හ.

1134. එම්බා චිත්තය, එක්වත් චරණචිත්‍ර (පෙතිකඩ) දක්වන්නකු සෙයින් තෝ මට පුනපුනා ද්‍රොහ වන්නෙහි නො වේ ද, උමතුවකු හා සෙයින් මා හා කෙළිමින් මා පොළොඹන්නෙහි නො වේ ද? එම්බා චිත්තය, තට මා කළ වරද කිම.

1135. පෙර මේ සිත කැමැති අයුරින් කැමැති තැනෙකැ සුවසේ හැරි-හැරී යැ, අද මම ඒ සිත අකුස්සක් ගත්තෙක් මතැතකු සෙයින් යොනිසො මනසිකාරයෙන් නිගන්නෙමි.

1136. සබ්බං ච මෙ ලොකමිමං අධිට්ඨහි
අනිච්චතො අද්ධුවතො අසාරතො,
පක්ඛන්ද මං චිත්ත ජිනස්ස සාසනෙ
තාරෙහි ඔඝා මහතා[1] සුදුත්තරා.

1137. න තෙ ඉදං චිත්ත යථා පුරාණකං
නාහං අලං තුය්හවසෙ නිවත්තිතුං,
මහෙසිනො පබ්බජිතොම්හි සාසනෙ
න මාදිසා හොන්ති විනාසධාරිනො.

1138. නගා සමුද්දා සරිතා වසුන්ධරා
දිසා චතස්සො විදිසා අධො දිවා,[2]
සබ්බෙ අනිච්චා තිභවා උපද්දුතා
කුහිං ගතො චිත්ත සුඛං රමිස්සසි.

1139. ධිතිප්පරං[3] කිං මමචිත්ත කාහිසි
න තෙ අලං චිත්ත වසානුවත්තකො,
න ජාතු භස්තං උභතොමුඛං[4] ඡුපෙ
ධිරත්ථු පූරං නව සොතසන්දනිං[5]

1140. වරාහඑණෙය්‍ය විගාළ්හසෙවිතෙ
පබ්භාරකූටෙ පකතෙ'ව සුන්දරෙ,
නවම්බුනා පාවුසසිත්තකානනෙ
තහිං ගුහාගෙහගතො රමිස්සසි.

1141. සුනීලගීවා සුසිඛා සුපෙඛුණා
සුචිත්තපත්තච්ඡදනා විහඞ්ගමා,
සුමඤ්ජුඝොසත්ථනිතාභිගජ්ජිනො
තෙ තං රමිස්සන්ති[6] වනම්හි ඣායිනං.

1142. වුට්ඨම්හි දෙවෙ චතුරඞ්ගුලෙ තිණෙ
සංපුප්ඵිතෙ මෙඝනිභම්හි කානනෙ,
නගන්තරෙ විටපිසමො සයිස්සං
තං මෙ මුදූ හෙහිති තූලසන්නිභං.

1143. තථා තු කස්සාමි[7] යථා'පි ඉස්සරො
යං ලබ්භති තෙන'පි හොතු මෙ අලං,
න තාහං කස්සාමි[8] යථා අතන්දිතො
බිළාරභස්තං'ව යථා සුමද්දිතං.

1144. තථා තු කස්සාමි යථා'පි ඉස්සරො
යං ලබ්භති තෙන'පි හොතු මෙ අලං,
විරියෙන තං මය්හ වසානයිස්සං
ගජං'ව මත්තං කුසලඞ්කුසග්ගහො.

---

1. මහතො - සයා, PTS 2. දිසා - සයා, PTS 3. ධි ධි පරං - PTS
4. දුභතො - PTS 5. නව සොතසන්දනි - සයා, PTS 6, රමෙස්සන්ති - සිමු. 1,2
7. කරිස්සාමි - සයා 8. තං තං කරිස්සාමි - සයා, PTS.

1136 මා ගේ ශාස්තෲන් වහන්සේ ද මේ (ස්කන්ධ) ලෝකය අනිත්‍ය වශයෙන් අස්ථිර වශයෙන් අසාර වශයෙන් අධිෂ්ඨාන කළහ. එම්බා චිත්තය, (තෝ) මා බුදුසසුන්හි පිවිසව, තරණයට අතිශයින් දුෂ්කර වූ මහත් වූ ඕඝයෙන් තරවාලව (එතෙර කරව).

1137. එම්බා චිත්තය, මේ ආත්මභාව (ගෘහ) ය. පැරැණි ආත්මභාව (ගෘහ)ය සෙයින් තා සතු නො වෙයි, මා තාගේ වශයෙහි නවත්නට නො මැනැවි, මම මහර්ෂිහුගේ සසුන්හි පැවිදි වීමි, මා වැන්නෝ විනාශධාරීහු නො වෙත් (එකාන්තයෙන් ශ්‍රමණ මැ වෙත්.)

1138. පර්වතයෝ යැ සමුද්‍රයෝ යැ නදීහු යැ පෘථිවිය යැ චතුර්දිශා යැ අනුදිශා යැ (උදක සඞ්ඛාරකවායුස්කන්ධය තෙක්) අධෝභාග යැ දෙවලොකයෝ යැ යන සියල්ල අනිත්‍යයෝ යැ, භවත්‍රය (කෙලෙසුන් විසින්) උපද්‍රැත යි. එම්බා චිත්තය, කොහි ගියෙහි සුවසේ රමණය කරන්නෙහි ද?

1139. එම්බා චිත්තය, ධෛර්‍ය්‍ය පිහිට කොට ඇති මට තෝ කුමක් කරන්නෙහි ද, චිත්තය, (මම) තාගේ වශයෙහි පවත්නෙම් නො වෙමි, දෙපස මුව ඇති සම්පිහිවාවක් කිසිකලෙකත් නො පහසන්නේ යැ. අශුචියෙන් පිරුණා වූ ශ්‍රෝතස් නවයකින් අශුචි වැගිරෙන්නා වූ කයට නින්දා වේවා!

1140. එම්බා චිත්තය, තෝ වනාහි වල්හූරන් හා 'එණි' මුවන් විසින් පිවිස සෙවුනා ලද ප්‍රාග්භාරයන් හා ගිරිකුළු ඇති, පියොවින් මැ සුන්දර වූ භූමිභාග ඇති, අළුත් වැසි දියෙන් තෙත් වූ ඒ වනයෙහි ගුහා නැමැති ගෙට පැමිණියෙහි (භාවනා රතියෙන්) රමණය කරව.

1141. (එම්බා චිත්තය), සුනිල්ගෙල ඇත්තා වූ මනාසිළු ඇත්තා වූ මනා පිල්බර ඇත්තා වූ විසිතුරු පියාපත් සෙවෙණි ඇත්තා වූ පක්ෂි වූ මේඝගර්ජනා හෙතුයෙන් මිහිරිහඬින් නාද කරනසුලු වූ ඒ මයුරයෝ වනයෙහි ධ්‍යාන කරනසුලු වූ තා සිත් අලවන්නාහ.

1142. වැ[illegible]වට කල්හි, සිව් අඟුල් තණ ඇති කල්හි, වැසිවලා බඳු වූ වනය මොනවට පිපීගිය කල්හි, පර්වත අතුරෙහි රුක් බඳු වැ හෝනෙමි, ඒ තණ පසතුරුණ අළුත් යහනක් සෙයින් මට මොලොක් වන්නේ යි.

1143. (එම්බා චිත්තය) ඊශ්වර පුරුෂයෙක් (බැලයකු) යම්සේ නම් මම එසේ තා වසග කරන්නෙමි, (සිගුපසයෙන්) යම්තමක් හෝ ලැබේ නම් ඉතිදු මට පමණ වේවා! (භාවනායෙහි) නො මැළියෙක් යම්සේ නම් මම එසේ තා මොනොවට මඩනාලද බළල්සම්පිහිවාවක් සෙයින් (කම්ක්ෂම) නො කරන්නෙම් ද?

1144. (එම්බා චිත්තය) ඊශ්වර පුරුෂයෙක් (බැලයකු) යම්සේ නම් මම එසේ තා වසග කරන්නෙම්, (සිගුපසයෙහි) යම්තමක් හෝ ලැබේ නම් ඉතිදු මට පමණ වේවා, දක්ෂ වූ ඇතරුවෙක් මතැතකු සෙයින් (මම) වීර්‍ය්‍යයෙන් තා මා ගේ වශයට පමුණුවන්නෙමි.

1145. තයා සුදන්තෙන අවට්ඨිතෙන[1] හි
හයෙන යොග්ගාචරියො'ව උජ්ජුනා,
පහොමි මග්ගං පටිපජ්ජිතුං සිවං
චිත්තානුරක්ඛීහි සදා නිසෙවිතං.

1146. ආරම්මණෙ තං බලසා නිබන්ධිසං[2]
නාගං'ව ථම්භම්හි දළ්හාය රජ්ජුයා,
තං මෙ සුගුත්තං සතියා සුභාවිතං
අනිස්සිතං සබ්බභවෙසු හෙහිසි.

1147. පඤ්ඤාය ඡෙත්වා විපථානුසාරිනං
යොගෙන නිග්ගය්හ පථෙ නිවෙසිය,
දිස්වා සමුදයං විභවං ච සම්භවං
දායාදකො හෙහිසි අග්ගවාදිනො

1148. චතුබ්බිපල්ලාසවසං අධිට්ඨිතං
ගාමණ්ඩලං'ව පරිනෙසි චිත්ත මං,
නූන[3] සඤ්ඤොජනබන්ධනච්ඡිදං
සංසෙවසෙ කාරුණිකං මහාමුනිං.

1149. මිගො යථා සෙරි සුචිත්තකානනෙ
රම්මං ගිරිං පාවුසඅබ්භමාලිනිං,[4]
අනාකුලෙ තත්ථ නගෙ රමිස්සං[5]
අසංසයං චිත්ත පරාභවිස්සසි

1150. යෙ තුය්හ ඡන්දෙන වසෙන වත්තිනො
නරා ච නාරී ච අනුභොන්ති යං සුඛං,
අවිද්දසු මාරවසානුවත්තිනො
භවාභිනන්දී තව චිත්ත සාවකා'ති.[6]

ඉත්ථං සුදං ආයස්මා තාලපුටො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

තාලපුටත්ථෙරගාථා.

තස්සුද්දානං:

පඤ්ඤාසම්හි නිපාතම්හි එකො තාලපුටො සුචි
ගාථායො තත්ථ පඤ්ඤාස පුන පඤ්ච ච උත්තරින්ති.

## පඤ්ඤාසනිපාතො නිට්ඨිතො.

1. අවත්ථිතෙන - ස්‍යා. 2 නිබන්ධියං - ස්‍යා 3. නනු - ස්‍යා, PTS.
4. පාවිසි අබ්භමාලිනිං - ස්‍යා, PTS. 5. රමිස්සසි - ස්‍යා, PTS. 6. සෙවකා - PTS

1145. (එම්බා චිත්තය) මොනොවට දමුණා වූ (සමාහිත බැවින්) සිටියා වූ තා කරණ කොටගෙන සෘජු ගති ඇති අශ්වාජානීයයකු කරණකොට ගෙන අශ්දම්සැරියකු සෙයින් මම චිත්තානුරක්ෂීන් විසින් හැම කල්හි සෙවුනාලද ක්ෂේමමාර්ගයට පැමිණෙන්නට සමත්මි.

1146. එම්බා චිත්තය, දැඩි රැහැනින් වැඩෙකැ බඳනාලද ඇතකු සෙයින් භාවනා බලයෙන් මම තා අරමුණෙහි බඳින්නෙමි. මා විසින් සිහියෙන් මොනොවට රක්නාලද්දා වූ (භාවනායෙන්) මොනොවට වඩනාලද්දා වූ ඒ තෝ සියලු භවයන්හි අනිශ්‍රිත වන්නෙහි.

1147. නො මග යන්නා වූ ඉඳුරන් (පටිසඞ්ඛාන) ප්‍රඥායෙන් සිඳ යොග (විදර්ශනා භාවනා) යෙන් නිග්‍රහ (දමනය) කොට මාර්ග (විදර්ශනාවීථි) යෙහි පිවිසවා (ආයතනයන්ගේ) සමුදය ද විභවය ද සම්භවය ද (මාර්ගප්‍රඥායෙන්) දැකැ අග්‍රවාදීන් (සම්බුදුන්)ගේ ඖරස පුත්‍ර වන්නෙහි·

1148. එම්බා චිත්තය, තෝ චතාහි චතුර්විධ විපර්‍ය්‍යාසයන්ගේ වශයෙහි සිටි මා ගම්දරුවකු සෙයින් (රිසිසේ) ඔබ මොබ අදනෙහි යැ (එහෙත්) සංයොජනබන්ධනයෙන් සිඳුනා වූ කාරුණික වූ මහමුනිහු (සම්බුදුන්) එකන්නෙන් මොනොවට සෙවුනෙහි.

1149 එම්බා චිත්තය, මම (වෘක්‍ෂලතාදියෙන්) විසිතුරු වූ වනයෙහි සෙවරි මෘගයෙක් යම්සේ ඇලේ නම් එසේ මැ වැසි කල්හි වලාපෙළ ඇති සිත්කලු වූ පර්වතයක් ලැබැ නිරවුල් (විවික්ත) වූ ඒ පර්වතයෙහි සිත් අලවන්නෙමි, තෝ නිසැක වැ පරදනෙහි.

1150. එම්බා චිත්තය, තොපගේ ඡන්දයෙහි ද වශයෙහි ද සිටුනා වූ යම් නරනාරී කෙනෙක් යම් ගේහනිශ්‍රිතසුඛයක් අනුභව කරන්නාහු නම් තුවණ මඳ වූ ද මරහුගේ වශයෙහි පවත්නාසුලු වූ ද භවය මැ කැමති වනසුලු වූ ද ඔහු තාගේ ශ්‍රාවකයෝ යි (මම එබඳු නො වෙමි සේ යි).

මෙසේ ආයුෂ්මත් 'තාලපුට' ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

**තාලපුට ස්ථවිරගාථා යි.**

උද්දානය:

පනස් වැනි නිපාතයෙහි ශොභන වූ එක් මැ 'තාලපුට' ස්ථවිරයන් වහන්සේ යැ එහි ගාථාවෝ පසක් වැඩි පනසෙකි. (පන්පනසෙකි).

**පඤ්ඤාසනිපාතය නිමි.**

# 60. සට්ඨිනිපාතො.

## 60. 1. 1

1151. ආරඤ්ඤකා පිණ්ඩපාතිකා උඤ්ඡාපත්තාගතෙ රතා,
දාලෙමු මච්චුනො සෙනං අජ්ඣත්තං සුසමාහිතා.

1152. ආරඤ්ඤකා පිණ්ඩපාතිකා උඤ්ඡාපත්තාගතෙ රතා,
ධුනාම[1] මච්චුනො සෙනං නළාගාරං'ව කුඤ්ජරො.

1153. රුක්ඛමූලිකා සාතතිකා උඤ්ඡාපත්තාගතෙ රතා,
දාලෙමු මච්චුනො සෙනං අජ්ඣත්තං සුසමාහිතා.

1154. රුක්ඛමූලිකා සාතතිකා උඤ්ඡාපත්තාගතෙ රතා,
ධුනාම මච්චුනො සෙනං නළාගාරං'ව කුඤ්ජරො.

1155. අට්ඨිකඞ්කාලකුටිකෙ[2] මංසනහාරුසිබ්බිතෙ,[3]
ධිරත්ථු පූරෙ දුග්ගන්ධෙ පරගත්තෙ මමායසෙ,

1156. ගූථභස්තෙ තචොනද්ධෙ උරගණ්ඩි[4] පිසාචිනී,
නව සොතානි තෙ කායෙ යානි සන්දන්ති සබ්බදා.

1157. තව සරීරං නවසොතං දුග්ගන්ධකරං පරිබන්ධං,[5]
භික්ඛු පරිවජ්ජයතෙ තං මීළ්හඤ්ච[6] යථා සුචිකාමො.

1158. එවං චෙ තං ජනො ජඤ්ඤා යථා ජානාමි තං අහං,
ආරකා පරිවජ්ජෙය්‍ය ගූථට්ඨානං'ව පාවුසෙ.

1159. එවමෙතං මහාවීර යථා සමණ භාසසි,
එත්ථ චෙකෙ විසීදන්ති පඞ්කම්හි'ව ජරග්ගවො.

1160. ආකාසම්හි හලිද්දියා යො මඤ්ඤෙථ රජෙතවෙ,
අඤ්ඤෙන වා'පි රඞ්ගෙන විඝාතුදයමෙව තං.

1161. තදාකාසසමං චිත්තං අජ්ඣත්තං සුසමාහිතං,
මා පාපචිත්තෙ අහනි[7] අග්ගික්ඛන්ධං'ව පක්ඛිමා.

---

1. ධුනාමු - ස්‍යා 2. අට්ඨිකඞ්ඛාලකුටිකෙ - සීමු 1, 2
3. මංසන්හාරුපපසිබ්බිතෙ - ස්‍යා, PTS මංසනහාරුපසිබ්බිතෙ - ප
4. උරගාණ්ඩි - සීමු 1, 2, ප 5 දුග්ගන්ධකං පරිවජ්ජෙය්‍ය - ස්‍යා, දුග්ගන්ධං කරිපරිබන්ධං - PTS 6. මීළ්හංච - PTS
7. ආහරි - PTS. ආහති - ප

# 60 සට්ඨිනිපාතය

## 60. 1. 1

1151. (අපි) ආරණ්‍යක වැ පිණ්ඩපාතික වැ පිඬුසිඟීමෙන් පාත්‍රයට පැමිණි අහරෙහි තුටු වැ (ගොචර) අධ්‍යාත්මයෙහි මැනැවින් සමාහිත වැ මරහුගේ සේනාව සුන් කරම්හ.

1152. (අපි) ආරණ්‍යක වැ පිණ්ඩපාතික වැ පිඬුසිඟීමෙන් පාත්‍රයට පැමිණි අහරෙහි තුටු වැ ඇත්රදෙක් නළාගාරයක් (බටගෙයක්) සෙයින් මරසෙන් සලවම්හ.

1153. (අපි) වෘක්‍ෂ මූලික වැ (භාවනායෙහි) සාතත්‍යකාරී (නිරතුරු යෙදුණක් වැ) සිඟා ලද අහරෙහි තුටු වැ (ගොචර) අධ්‍යාත්මයෙහි මැනැවින් සමාහිත වැ මරසෙන් සුන් කරම්හ.

1154. (අපි) වෘක්‍ෂමූලික වැ (භාවනායෙහි) සාතත්‍යකාරී (නිරතුරු යෙදුණක්) වැ සිඟා ලද අහරෙහි තුටු වැ ඇත්රදෙක් නළාගාරයක් සෙයින් මරසෙන් සලවම්හ.

1155. එම්බා ඇටසැකිලිමුවා කිලියක් ඇත්තිය, මසින් හා නහර වැලින් හිවුණිය (මැසුණිය), අසුචියෙන් පිරුණිය, දුගඳ වහන්නිය, තිට නින්දා වේවා! මෙරමා අයත් සිරුරෙහි තෝ මමායන කරනෙහි.

1156. එම්බා පුජ්පිහිවාව (ගූථභස්ත්‍රාව), සමින් වැසුණිය, ළගඬු (උරයෙහි නැගුණු ගඬු ඇති) පිසස්නිය, යම් (ව්‍රණමුඛ) කෙනෙක් හැම කල්හි (අශුචි) වගුරත් නම් තීගේ සිරුරෙහි ඒ ව්‍රණමුඛයෝ නව දෙනෙකි.

1157. තීගේ සිරුර වණමුව නවයක් ඇතියේ යැ, දුගඳකර යැ, පරිබන්ධ (මනා පිළිවෙතට බාධක)යෙකි, පිරිසුදු බව කැමැත්තකු සෙයින් මහණ තෙම ඒ පුජ් (අශුචි) වළ දුරු කෙරේ.

1158. මම යම්සේ ඒ අශුචිපිණ්ඩය දනිම් ද ජන තෙමේ එය එපරිද්දෙන් දනී නම් වැසි කල්හි අමේධ්‍යස්ථානයක් සෙයින් දුරින් දුරු කරන්නේ යි.

1159. ශ්‍රමණයන් වහන්ස, තෙපි යම්සේ වදාරවු නම් මහාවීරය, එය එසේ යැ, එනෙකුදුවත් මඩෙහි ජරද්ගවයකු සෙයින් ඇතැමෙක් මෙහි ගැලෙත් ලගිත්).

1160. යමෙක් කසවින් හෝ අන්රදනෙකින් හෝ අහස රඳන්නට සිතන්නේ නම් ඒ වනාහි වෙහෙස පාළු කරන්නක් මැ වේ.

1161. (මා ගේ) ඒ සිත ආකාශය වැන්නැ, අධ්‍යාත්මයෙහි මැනැවින් සමාහිත යැ, එම්බා ළමු (තිහීන) සිත් ඇත්තිය, ගිනිකඳක් (ගවනා) පළඟකු සෙයින් (මා) නහමක් ගටව (නොගට).

1162 පස්ස චිත්තකතං බිම්බං අරුකායං සමුස්සිතං,
ආතුරං බහුසඞ්කප්පං යස්ස නත්ථි ධුවං ඨිති.

1163. පස්ස චිත්තකතං රූපං මණිනා කුණ්ඩලෙන ච,
අට්ඨිං තචෙන ඔනද්ධං සහ වත්ථෙහි සොභති.

1164. අලත්තකකතා පාදා මුඛං චුණ්ණකමක්ඛිතං,
අලං බාලස්ස මොහාය නො ච පාරගවෙසිනො.

1165. අට්ඨපාදකතා කෙසා නෙත්තා අඤ්ජනමක්ඛිතා,
අලං බාලස්ස මොහාය නො ච පාරගවෙසිනො.

1166. අඤ්ජනීව නවා චිත්තා පූතිකායො අලඞ්කතො,
අලං බාලස්ස මොහාය නො ච පාරගවෙසිනො.

1167. ඔදහි මිගවො පාසං නාසද වාගුරං මිගො,
භුත්වා නිවාපං ගච්ඡාම කන්දන්තෙ මිගබන්ධකෙ.

1168. ඡින්නො පාසො මිගවස්ස නාසද වාගුරං මිගො,
භුත්වා නිවාපං ගච්ඡාම සොචන්තෙ මිගලුද්දකෙ.

1169. තදාසි යං භිංසනකං තදාසි ලොමහංසනං,
අනෙකාකාරසම්පන්නෙ සාරිපුත්තම්හි නිබ්බුතෙ.

1170. අනිච්චා වත සඞ්ඛාරා උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛො.

1171. සුඛුමං තෙ පටිවිජ්ඣන්ති[1] වාලග්ගං උසුනා යථා,
යෙ පඤ්චක්ඛන්ධෙ පස්සන්ති පරතො නො ච අත්තතො.

1172. යෙ ච පස්සන්ති සඞ්ඛාරෙ පරතො නො ච අත්තතො
පච්චබ්‍යාධිංසු නිපුණං වාලග්ගං උසුනා යථා.

1173. සත්තියා විය ඔමට්ඨො ඩය්හමානො'ව මත්ථකෙ
කාමරාගප්පහානාය සතො භික්ඛු පබ්බජෙ.

1174. සත්තියා විය ඔමට්ඨො ඩය්හමානො'ව මත්ථකෙ
භවරාගප්පහානාය සතො භික්ඛු පරිබ්බජෙ.

1175. චොදිතො භාවිතත්තෙන සරීරන්තිමධාරිනා
මිගාරමාතුපාසාදං පාදඞ්ගුට්ඨෙන කම්පයිං.

1 සුඛුමංපටිවිජ්ඣන්ති - PTS

1162. යමක්හුගේ බ්‍රැවභාවයක් හෝ සපිතිභාවයක් හෝ නැත් ද, වණ වූ ඇටසැකිල්ල විසින් ඔසවනලද්දා වූ ගිලන් වූ නොයෙක් අශුචින් සංකල්පනය කටයුතු වූ විසිතුරු කරනලද්දා වූ ඒ සිරුර බලව.

1163. සමිත් වෙලනලද (තුන්සියක්) ඇට ඇති, මිණියෙනුදු කොඬොලිනුදු විසිතුරු කරනලද රූපය බලව (ඒ) වස්ත්‍ර සහිත වැ මැ හොබනේ යි.

1164. ලහරසින් රඳනාලද පාදයෝ, සුවඳසුනු අලෙව්දුත් මුව, බාලයාගේ සම්මෝහයට නිස්සැ පාරගවේෂිහුගේ මෝහයට නිසි නො වෙයි.

1165. අෂ්ටපාදකෘතකේශයෝ (කියඹුවැල්) ද අඳුන් ඇඳි නෙත්‍රයෝ ද බාලජනයාගේ මෝහයට පමණු, පාරගවේෂිහුගේ මෝහයට නො ද පමණි.

1166. සිතියම් කළ අළුත් අඳුන් කොපුවක් සෙයින් සරසනලද කුණු-කය බාලයාගේ මෝහයට පමණු, පාරගවේෂිහුගේ මෝහයට නො ද පමණි.

1167. මුවවැදි තෙම මලපුඩුව දමාලී යැ, මුවා වරදල නො පැහැසී (නො ගැටී) යැ, මුවවැද්දා හඬද්දී (ඇපි) ගොදුරු කා යම්හ.

1168. මුවවැද්දාගේ මලපුඩුව සිඳුණේ යැ, මුවා වරදල නො පැහැසී යැ, මුවවැදි සොවිද්දී (ඇපි) ගොදුරු කා යම්හ

1169. (ශීලාදි) නොයෙක් ආකාරවරයෙන් පරිපූණී වූ සැරියුත් තෙරුන් පිරිනිවි කල්හි යම් (සෙනහඬ ආදි) බිහිසුණු අරමුණෙක් වී නම් එකල්හි ලොමුදහගැන්ම වී,

1170. අහෝ! සංස්කාරයෝ අනිත්‍යයෝ යැ. ඇතිවීම හා නැතිවීම සවභාව කොට ඇත්තෝ යැ, ඉපැද නිරුද්ධ වෙති, ඔවුන්ගේ සන්හිඳීම සුව යි.

1171. යම් කෙනෙක් පඤ්චස්කන්ධය අනාත්ම විසින් දකිත් නම් ඔහු (අඳුරෙහි විදුලිය එළියෙන්) සරයෙන් වලග විදුනා සේ සියුම් අරුත් පිළිවිදිත් (විනිවිද දකිත්). ආත්ම විසින් දක්නාහු නො ද පිළිවිදිත්.

1172. තවද යම් කෙනෙක් සංස්කාරයන් අනාත්ම විසින් දකිත් නම් ඔහු සරයෙන් වලග සේ නිපුණ වැ සියුම් අරුත් පිළිවිදියහ. ආත්ම විසින් දක්නාහු නො ද පිළිවිදියහ

1173. මහණ තෙම සැතින් විදුනාලද්දකු සෙයින් හිස ගිනිගත්තකු සෙයින් කාමරාග ප්‍රහාණය පිණිස සිහි ඇති වැ වෙසෙන්නේ යි.

1174. මහණ තෙම සැතින් විදුනාලද්දකු සෙයින් හිස ගිනිගත්තකු සෙයින් භවරාග ප්‍රහාණය පිණිස සිහි ඇති වැ වෙසෙන්නේ යි.

1175. වඩනාලද සිත් ඇති පැසිම් සිරුරු (අන්තිම දේහය) දරන්නහු (ශාස්තෘන් වහන්සේ) විසින් චුදිතයෙම් පයැ මහපටැඟිල්ලෙන් මුවරමාපාය සැලීම්.

1176. නයිදං සිථිලමාරබ්භ නයිදං අප්පෙන ථාමසා,
නිබ්බානමධිගන්තබ්බං සබ්බගන්ථපමොචනං.

1177. අයං ච දහරො භික්ඛු අයමුත්තමපොරිසො,
ධාරෙති[1] අන්තිමං දෙහං ජෙත්වා[2] මාරං සවාහිනිං[3]

1178. විවරමනුපතන්ති විජ්ජුතා වෙභාරස්ස ච පණ්ඩවස්ස ච,
නගවිවරගතො'ච[4] ඣායති පුත්තො අප්පටිමස්ස තාදිනො.

1179. උපසන්තො උපරතො පන්තසෙනාසනො මුනි,
දායාදො බුද්ධසෙට්ඨස්ස බ්‍රහ්මුනා අභිවන්දිතො

1180. උපසන්තං උපරතං පන්තසෙනාසනං මුනිං,
දායාදං බුද්ධසෙට්ඨස්ස වන්ද බ්‍රාහ්මණ කස්සපං

1181. යො ච ජාතිසතං ගච්ඡෙ සබ්බා බ්‍රාහ්මණජාතියො,
සොත්ථියො[5] වෙදසම්පන්නො මනුස්සෙසු පුනප්පුනං.

1182 අජ්ඣායකො'පි චෙ අස්ස තිණ්ණං වෙදාන පාරගූ,
එතස්ස වන්දනායෙතං[6] කලං නාග්ඝති සොළසිං.

1183. යො සො අට්ඨවිමොක්ඛානි පුරෙභත්තං අඵස්සයි[7],
අනුලොමං පටිලොමං තතො පිණ්ඩාය ගච්ඡති.

1184. තාදිසං භික්ඛුං මා හනි මාත්තානං ඛණී බ්‍රාහ්මණ,
අභිප්පසාදෙහි මනං අරහන්තම්හි තාදිනො
ඛිප්පං පඤ්ජලිකො වන්ද මා තෙ විපති මත්ථකං.

1185. නෙසො[8] පස්සති සද්ධම්මං සංසාරෙන පුරක්ඛතො,
අධොගමං[9] ජිම්හපථං කුම්මග්ගමනුධාවති.[10]

1186. කිමී'ව මීළ්හසල්ලිත්තො[11] සඞ්ඛාරෙ අධිමුච්ඡිතො
පගාළ්හො ලාභසක්කාරෙ තුච්ඡො ගච්ඡති පොඨිලො.[12]

1187. ඉමං ච පස්ස ආයන්තං සාරිපුත්තං සුදස්සනං,
විමුත්තං උභතොභාගෙ අජ්ඣත්තං සුසමාහිතං.

1188. විසල්ලං ඛීණසංයොගං තෙවිජ්ජං මච්චුහායිනං,
දක්ඛිණෙය්‍යං මනුස්සානං පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං.

---

1. ධාරෙසි - සීමු. 1, 2. 2. ජෙත්වා - සීමු. 1, 2. 3. සවාහනං - සීමු. 1, 2.
4. නගවිවරගතො ච - සයා PTS 5. සොත්තියො - සීමු. 1.
6 වන්දනාය තං - සීමු. 1, 2 සයා PTS 7. පුරෙභත්තමඵස්සයි - සීමු. 1, 2.
8. න සො - PTS 9 අවඩ්ඪකමං - සයා, PTS 10. කුම්මග්ගමනුධාවති - PTS
11. මීළ්හපලිත්තො - සයා. 12. පොට්ඨිලො - PTS.

1176. සියලු ග්‍රන්ථයන් වෙසෙසින් මුදනසුලු වූ මේ නිවන වූකලී ලිහිල් වැ වැර කොට සාක්‍ෂාත් කටයුත්තේ නො වෙයි, මඳ වැරෙනුදු සාක්‍ෂාත් කටයුත්තේ නො වේ.

1177. මේ උත්තම පුරුෂවූ මේ ('වෙද' නම් වූ) තරුණ මහණ තෙමේත් සෙන් සහිත මරහු දිනා අන්තිමදෙහය දරයි.

1178 'වෙභාර' පර්වතයටත් 'පාණ්ඩව' පර්වතයටත් අතර වූ විවරය ලක්‍ෂ්‍ය කොට විදුලිය වැටෙයි, අප්‍රතිම (අසම) වූ තාදීහුගේ පුත්‍ර තෙම පර්වත විවරගත වැ ධ්‍යාන කෙරේ.

1179. උපශාන්ත වූ පව්කම්න් වෙන් වූ ප්‍රාන්තසේනාසන ඇති මුනි වූ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ ඖරසපුත්‍ර තෙම බඹහු විසින් අභි-වාදනය කරනලද්දේ යි.

1180. බමුණ, තෝ උපශාන්ත වූ උපරත වූ ප්‍රාන්තසේනාසන ඇති මුනි වූ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ ඖරසපුත්‍ර වූ කසුප් තෙරුන් වඳු.

1181. යමෙකුත් මිනිසුන් අතුරෙහි පුනපුනා ජාති සියයක් සියලු බ්‍රාහ්මණජාතිත්ව (උපප්‍රාප්ති වශයෙන්) එලඹෙත්තේ නම් ශොත්‍රිය ජාති (එනම් බමුණුජාති) ඇත්තේ නම් 'වෙද' සම්පන්න වේ නම්-

1182. ඉදින් වෙදාධ්‍යයනය කරන්නේත් වේ නම්, ත්‍රිවෙදයෙහි පරතෙරට ගියේත් වේ නම් එබන්දහුට වැඳීම මේ කසුප් තෙරුනට වැඳීමෙන් සොළසින් කලාවටත් නො අගී.

1183. යම් මහණෙක් අෂ්ටවිමොක්‍ෂයන් පෙරබත් වේලෙහි අනුලෝම පිළිලෝම් විසින් සමවත්තේ නම් ඉක්බිති පිඬු සිඟා යේ නම්-

1184. බමුණ, තෝ එබඳු මහණහු නහමක් ගට (නොගට), තමා මුලුසුන් නො කර, අභීත් වූ තාදීහු කෙරෙහි සිත් පහද, වහා ඇඳිලි බැඳැ වඳු, තාගේ හිස නහමක් පලනු (නා පලාගත්).

1185. තෙල (පොසිල නම්) මහණ තෙම (අවිද්‍යාදී) සසර බැඳුම් විසින් පුරස්කෘත වූයේ (නව ලොවුතුරු) සදහම නො දකී. අධොගාමී වූ (මායාසාඨෙය්‍යාදි) වඞ්කමාගී ඇත්තා වූ (මිථ්‍යාජීව සඞ්ඛ්‍යාත) නො මඟෙහි දිවැ යේ.

1186. අමෙධ්‍යයෙන් හාත්පසින් තැවැරුණු පණුවකු සෙයින් සංස්කාර-යෙහි බැඳුණු (ගැලුණු) ලාභයෙහි ද සත්කාරයෙහි ද වෙසෙසින් කිඳුණු පොසිල මහණ තෙම් හිස් වැ යේ.

1187. තෙල එන්නා වූ ශාරිපුත්‍රයන් එනම්,- මනා දක්නුම් ඇතියා වූ උභතොභාගවිමුක්ත වූ අධ්‍යාත්මයෙහි මොනවට සමාහිත වූ-

1188. පහ වූ (රාගාදි) ශල්‍ය ඇතියා වූ ක්‍ෂය වූ සංයොජන ඇති ත්‍රිවිද්‍යා ඇති මරහු මැඬලනසුලු වූ දක්ෂිණාගී වූ මිනිසුනට නිරුත්තර පින්කෙතක් වූ ශාරිපුත්‍රයන් බලව.

1189 එතෙ සමබහුලා දෙවා ඉදධිමනෙතා යසසසිනො
දසදෙවසහසසානි සබෙබ බ්‍රහමපුරොහිතා
මොගගලලානං නමසසනතා තිටඨනති පඤජලීකතා.

1190. නමො තෙ පුරිසාජඤඤ නමො තෙ පුරිසුතතම
යසස තෙ ආසවා ඛීණා දකඛිණෙයෙයා'සි මාරිස.

1191. පූජිතො නරදෙවෙන උපපනෙනා මරණාභිභූ
පුණඩරීකං'ව තොයෙන සඞඛාරෙනොපලිපපති[1]

1192. යසස මුහුතෙතන[2] සහසසධා ලොකො සංවිදිතො සබ්‍රහමකපෙපා වසී
ඉදධිගුණෙ චුතූපපාතෙ කාලෙ පසසති දෙවතා ස භිකඛු.

1193. සාරිපුතෙතා'ව පඤඤාය සීලෙන උපසමෙන ච
යො'පි පාරඞගතො භිකඛු එතා'වපරමො සියා.

1194. කොටිසතසහසසසස අතතභාවං ඛණෙන නිමමිනෙ[3]
අහං විකුබබනාසු කුසලො වසීභූතොමහි ඉදධියා.

1195 සමාධිවිජජාවසිපාරමිං ගතො[4]
මොගගලලානගොතෙතා අසිතසස සාසනෙ
ධීරො සමුචඡිනදි සමාහිතිනද්‍රියො
නාගො යථා පූතිලතං'ව බනධනං

1196. පරිචිණෙණා මයා සතථා කතං බුදධසස සාසනං
ඔහිතො ගරුකො භාරො භවනෙතති සමූහතා.

1197. යසසතථාය පබබජිතො අගාරසමානගාරියං
සො මෙ අතෙථා අනුපපතෙතා සබබසංයොජනකඛයො

1198. කීදිසො නිරයො ආසි යතථ දුසසී අපචචථ
විධුරං සාවකමාසජජ කකුසනධං ච බ්‍රාහමණං

1199. සත ආසි අයොසඞකූ සබෙබ පචචතතවෙදනා
ඊදිසො නිරයො ආසි යතථ දුසසී අපචචථ
විධුරං සාවකමාසජජ කකුසනධං ච බ්‍රාහමණං

1. සඞඛාරෙනුපලිපපති - සීමු 1. 2 2. මුහුතෙත - PTS 3. නිමමිණෙ - සීමු 1, 2
4 වසීපාරමිගතො - PTS.

1189. තෙල බොහෝ වූ දෙව්වරු එනම් - සෑහි ඇත්තාහු, යශස් ඇත්තාහු, බ්‍රහ්මපුරෝහිත නම් බඹලෝවැසි වූ, දසදහසක් පමණ වූ සියලු දෙව්වරු ඇඳිලි බැඳ මුගලන් තෙරුනට නමස්කාර කරමින් සිටිත්.

1190 පුරුෂාජානීයය, ඔබට නමස්කාර වේවා පුරුෂෝත්තමය ඔබට නමස්කාර වේවා! භවත, ඔබගේ ආස්‍රවයෝ ක්‍ෂය වූවාහු යෑ, භවත් දක්ෂිණාර්හ වෙයි.

1191. (මුගලන් තෙර) නරදේවයන් (මිනිසුන් හා දෙවියන් හෝ සම්බුදුන්) විසින් පුදනලද්දේ (මරණයෙන් මඩනාලද ලොවැ) උපන්නේ මරණය මැඩලූයේ ජලය විසින් පඬෙර (හෙළපියුම්) සෙයින් සංස්කාරයන් විසින් නො තැවැරුණේ යි.

1192. යමකු විසින් ඇසිල්ලෙකින් සහස්‍රිලොකධාතුව සාක්‍ෂාත් කරන ලද නම් ඒ මුගලන් තෙර බ්‍රාහ්මයා සදෘශ යෑ, සෘද්ධිවිධඥානයෙහි ද චුතූපපාතඥානයෙහි ද වශීප්‍රාප්ත වූ ඒ මහණ සුදුසු කල්හි (දිවැසින්) දෙවියන් බලයි.

1193. ප්‍රඥායෙන් ද ශීලයෙන් ද ව්‍යුපශමයෙන් (කෙලෙසුන් සන්සිඳීමෙන්) ද යම් මහණෙක් පරතෙරට (පරමොත්කෘෂ්ටභාවයට) ගියේ නම් හේ ශාරිපුත්‍ර බඳු යෑ, එතත්පරම මැ වන්නේ යි.

1194. කෝටිලක්‍ෂයක් ආත්මභාවයන් ඇසිල්ලෙකින් මවන්නෙමි, මම සෘද්ධිවිකුර්වණයෙහි සමත්මි, සෘද්ධියෙහි වශී වූයෙමි.

1195. සමාධින්හි ද විද්‍යාවන්හි (ත්‍රිවිද්‍යායෙහි) ද පරතෙරට ගියා වූ තෘෂ්ණාදි නිශ්‍රය රහිත වූවහු (ශාස්තෘන් වහන්සේ) ගේ සසුන්හි ධෛර්‍ය්‍ය ඇතියා වූ වසනලද ඉඳුරන් ඇතියා වූ මොග්ගල්ලාන ගොත්‍ර ඇත්තේ රසකිඳ වැලක් සිඳුනා ඇතකු සෙයින් කෙලශබන්ධනය (සුවසේ) මැනැවින් සින්දේ යි.

1196. මා විසින් ශාස්තෘන් වහන්සේ පරිචිතයහ. සම්බුදුන්ගේ අවවාදය කරනලදී. ගුරු වූ බර බහා තබනලද්දේ යෑ, තෘෂ්ණාව මුලසුන් කරනලදු.

1197. යම් අර්ථයක් සඳහා ගිහිගෙන් නික්මැ පැවිද්දට ගියෙම් නම්, සියලු සංයොජනයන් ක්‍ෂය කිරීම නම් වූ ඒ අර්ථය මා විසින් ලබනලද්දේ යි.

1198. එම්බා මාරය, (කකුසඳ බුදුන්ගේ අග්‍ර) ශ්‍රාවක වූ 'විධුර' නම් තෙරුන් ද කකුසඳ නම් සම්බුදුන් ද පෙළා 'දූසයී' නම් මාර තෙම යම් නිරයෙකැ පැසුණේ නම් ඒ නිරය කෙබඳු වී ද,

1199. 'විධුර' නම් ශ්‍රාවකයන් ද කකුසඳ සම්මා සම්බුදුන් ද පෙළා 'දූසයී' නම් මාර තෙම යම් නිරයෙකැ පැසිණී නම් ඒ නිරය මෙබඳු වී යෑ: එහි යහුල් සියයෙක් විය, සියල්ලෝ වෙන් වෙන් වේදනා ඇත්තෝ යි.

1200. යො එතමභිජානාති භික්ඛු බුද්ධස්ස සාවකො
තාදිසං භික්ඛුමාසජ්ජ කණ්හ දුක්ඛං නිගච්ඡසි

1201. මජ්ඣෙසරස්ස[1] තිට්ඨන්ති විමානා කප්පට්ඨායිනො[2]
වෙළුරියවණ්ණා රුචිරා අච්චිමන්තො පභස්සරා
අච්ඡරා තත්ථ නච්චන්ති පුථු නානත්තවණ්ණියො

1202. යො එතමභිජානාති භික්ඛු බුද්ධස්ස සාවකො
තාදිසං භික්ඛුමාසජ්ජ කණ්හ දුක්ඛං නිගච්ඡසි.

1203. යො වෙ බුද්ධෙන චොදිතො භික්ඛුසඞ්ඝස්ස පෙක්ඛතො
මිගාරමාතුපාසාදං පාදඞ්ගුට්ඨෙන කම්පිසං[3]

1204. යො එතමභිජානාති භික්ඛු බුද්ධස්ස සාවකො
තාදිසං භික්ඛුමාසජ්ජ කණ්හ දුක්ඛං නිගච්ඡසි.

1205. යො වෙජයන්තපාසාදං පාදඞ්ගුට්ඨෙන කම්පයි
ඉද්ධිබලෙනුපත්ථද්ධො සංවෙජෙසි ච දෙවතා.

1206. යො එතමභි ජානාති භික්ඛු බුද්ධස්ස සාවකො
තාදිසං භික්ඛුමාසජ්ජ කණ්හ දුක්ඛං නිගච්ඡසි.

1207. යො වෙජයන්තපාසාදෙ සක්කං සො පරිපුච්ඡති
අපි ආවුසො ජානාසි තණ්හක්ඛයවිමුත්තියො
තස්ස සක්කො වියාකාසි පඤ්හං පුට්ඨො යථාතථං.

1208. යො එතමභිජානාති භික්ඛු බුද්ධස්ස සාවකො
තාදිසං භික්ඛුමාසජ්ජ කණ්හ දුක්ඛං නිගච්ඡසි.

1209. යො බ්‍රහ්මානං පරිපුච්ඡති සුධම්මායං ඨිතො[4] සභං
අජ්ජා'පි ත්‍යාවුසො සා දිට්ඨි යා තෙ දිට්ඨි පුරෙ අහු
පස්සසි වීතිවත්තන්තං බ්‍රහ්මලොකෙ පභස්සරං.

1210 තස්ස බ්‍රහ්මා වියාකාසි පඤ්හං පුට්ඨො යථාතථං
න මෙ මාරිස සං දිට්ඨි යා මෙ දිට්ඨි පුරෙ අහු.

1211. පස්සාමි වීතිවත්තන්තං බ්‍රහ්මලොකෙ පභස්සරං
සො'හං අජ්ජ කථං වජ්ජං අහං නිච්චොම්හි සස්සතො.

1212. යො එතමභිජානාති භික්ඛු බුද්ධස්ස සාවකො
තාදිසං භික්ඛුමාසජ්ජ කණ්හ දුක්ඛං නිගච්ඡසි.

1213. යො මහානෙරුනො කූටං විමොක්ඛෙන අඵස්සයි
වනං පුබ්බවිදෙහානං යෙ ච භූමිසයා නරා.

---

1. මජ්ඣෙසාගරස්මිං - ස්‍යා, PTS 2. කප්පට්ඨායිනෙ - සීමු 1, 2.
3. කම්පයිං - සීමු 1, 2. 4. අභිතො - PTS

1200. (මහා අභිඥලාභී) යමෙක් තෙල කම්ඵලය වෙසෙසින් දනී නම් ඒ මහණ තෙම බුද්ධශ්‍රාවකයෙකි. පවිට (මාරය), තො එබඳු මහණක්හු පෙලා දුකට පැමිණෙන්නෙහි.

1201. සමුද්‍රමධ්‍යයෙහි කල්පස්ථායී වූ වෛරළුම්ණි බඳු පැහැ ඇති මනෝඥ වූද්‍යුතිමත් වූ ප්‍රභාස්වර වූ විමානයෝ ඇත එහි නොයෙක් පැහැ ඇති බොහෝ දෙවසරහු නටත්.

1202. යමෙක් තෙල කම්ඵලය ... පවිට, තෝ දුක් විඳුනෙහි.

1203. යමෙක් සම්බුදුන් විසින් චෝදනා කරන ලද නම් ඒ මම භික්ෂු සඞ්ඝයා බලා සිටිය දී මුවරමාපාය පයැ මහපටැඟිල්ලෙන් සැලීමි.

1204. යමෙක් තෙල කරුණ ... පවිට! තෝ දුකට පැමිණෙන්නෙහි

1205. යමෙක් ඍද්ධිබලයෙන් රුකුල් ලදුයේ (දහසක් යොදුන්) විජයොත්පාය පයැ මහපටැඟිල්ලෙන් සැලී නම් සක්දෙව්රජ ද සංවේගයට පත් කෙළේ නම් (හේ මම යි)

1206. යමෙක් මෙ කරුණ ... පවිට තෝ දුකට පැමිණෙන්නෙහි,

1207. යමෙක් 'ඇවැත්නි, තෘෂ්ණා විමුක්තිය දනී දැ?යි විජයොත්පායෙහි සක්දෙව්රජ විචාරා ද (හේ යැ මේ) සක්දෙව්රජ තෙමේ ප්‍රශ්න විචාරන ලද්දේ තත් පරිද්දෙන් ඔහුට ප්‍රකාශ කෙළේ යි

1208. යමෙක් මෙකරුණ .. පවිට, තෝ දුකට පැමිණෙන්නෙහි

1209. යමෙක් (බඹලොවැ) 'සුධර්මා' නම් සභායෙහි සිටියේ 'ඇවැත්නි, පෙර තාගේ යම් (බඹලොවට පැමිණිය හැකි කිසි මහණ බමුණු කෙනෙක් නැතැ යි) දෘෂ්ටියක් වූ නම් අදත් ඒ දෘෂ්ටිය ඇද්ද? බඹලොවැ සැරිසරන (ශ්‍රාවකසඞ්ඝයා පිරුවැරූ භාග්‍යවතුන් වහන්සේගේ) ඔභාසය බලව'යි මහබඹහු විචාරා නම්, (හේ මුගලනී.)

1210. මහබඹ තෙම ප්‍රශ්න විචාරන ලදු වැ ඔහුට ඇවැත්නි, පෙර මට (බඹලොවට පැමිණිය - හැකි මහණ බමුණු කෙනෙක් නැති යි) යම් දෘෂ්ටියක් වූ නම් ඒ දෘෂ්ටිය දැන් මට නැති.

1211. බඹලොවැ සැරිසරන (ශ්‍රාවක සඞ්ඝයා සම්බුදුන් ගේ) ඔභාසය දක්මි, ඒ මම අද "මම නිත්‍යයෙමි, "මම ශාශ්වතයෙමි" කෙසේ කියම් දැ'යි ප්‍රකාශ කෙළේ යි.

1212. යමෙක් මෙ කරුණ ... පවිට, තෝ දුකට පැමිණෙන්නෙහි.

1213. යමෙක් ධ්‍යානවිමොක්ෂ (නිශ්‍රිත අභිඥන) යෙන් මහමෙර ගල් මුදුන සපශී කෙළේ යැ, ජම්බුද්වීපය ද පූර්විදෙහය ද යම් ද්වීප කෙනෙක් බිමැ හෝනා මිනිසුන් ඇත්තාහු නම් ඒ (අපරගොයාන උතුරුකුරු) දිවයින් ද සපශී කෙළේ යි.

1214. යො එතමභිජානාති භික්ඛු බුද්ධස්ස සාවකො
තාදිසං භික්ඛුමාසජ්ජ කණ්හ දුක්ඛං නිගච්ඡසි.

1215. න වෙ අග්ගි චෙතයති අහං බාලං ඩහාමීති,
බාලො'ව ජලිතං අග්ගිං ආසජ්ජ න පදය්හති.[2]

1216. එවමෙව තුවං මාර ආසජ්ජන[3] තථාගතං
සයං දහිස්සසි අත්තානං බාලො අග්ගිං'ව සම්ඵුසං.

1217. අපුඤ්ඤං පසවී මාරො ආසජ්ජන තථාගතං
කිං නු මඤ්ඤසි පාපිම න මෙ පාපං විපච්චති.

1218. කරතො තෙ චීයතෙ[4] පාපං චිරරත්තාය අන්තක
මාර නිබ්බින්ද බුද්ධම්හා ආසං මාකාසි භික්ඛුසු.

1219. ඉති මාරං අතජ්ජෙසි භික්ඛු භෙසකලාවනෙ
තතො සො දුම්මනො යක්ඛො තත්ථෙවන්තරධායථා'ති.[5]

ඉත්ථං සුදං ආයස්මා මහාමොග්ගල්ලානො ථෙරො ගාථායො
අභාසිත්ථා'ති.

**මහාමොග්ගල්ලානත්ථෙරගාථා**

**තස්සුද්දානං:**

සට්ඨිකම්හි නිපාතම්හි මොග්ගල්ලානො මහිද්ධිකො
එකො'ව ථෙරො ගාථායො අට්ඨසට්ඨී භවන්ති තා'ති.

## සට්ඨිනිපාතො නිට්ඨිතො.

1. බාලො ච - සයා, PTS. 2. පඩය්හති - ප
3. ආසජ්ජානං - PTS, 4. මීයතෙ - සීමු, 1, 2. සයා, PTS.
5. තත්ථෙවන්තරධායතීති - PTS.

1214. යමෙක් තෙල කාරුණ වෙසෙසින් දනි නම් (හේ) බුද්ධශ්‍රාවක වූ මහණ තෙමේ යි. පව්ට, තෝ එබඳු මහණහු ගටා (පෙළා) දුකට පැමිණෙන්නෙහි.

1215. මම බාලයකු දවමැ යි ගින්න නො සිතා මැ යි, බාල තෙමේ මැ දල්වෙන ගින්න ගටා දවේ.

1216. මාරය, එපරිද්දෙන් මැ තෝ තථාගතයන් වහන්සේ ගටා ගිනි පැහැසැගන්නා බාලයකු මෙන් තෙමෙ තමා දවන්නෙහි.

1217. දුසසිමාර තෙම තථාගතයන් වහන්සේ පෙළා අකුසල් රැස් කෙළේ ය. එම්බා පාපිම (මාරය), කිම "මට පව් නො පැසේ යැ"යි තෝ සිතයි ද,

1218. එම්බා අන්තකය, කරන්නාවූ තට බොහෝ කලක් (අනව්) පිණිස පව් රැස් වෙයි. මාරය, තෝ සිව්සස් බුදුන් (බුද්ධශ්‍රාවක) කෙරෙන් කලකිරෙව මහණුන් කෙරෙහි විරුද්ධ වෙමි ආශා නො කරව.

1219. මෙසේ මහණ (මුගලන්) තෙම 'භෙසකලා' වනයෙහි දී මරහුට තර්ජනය කෙළේ යැ, ඉක්බිති ඒ මාර තෙම දොම්නස් වැ එහි මැ අතුරුදහන් වී.

මෙසේ ආයුෂ්මත් 'මහාමොග්ගල්ලාන' ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

**මහාමොග්ගල්ලාන ස්ථවිර ගාථා යි.**

**උද්දානය:**

සැට වැනි නිපාතයෙහි මහත් සෘද්ධි ඇති එක් මැ 'මහමුගලන් ස්ථවිරයන් වහන්සේ යැ. ගාථාවෝ ද අටසැටකි.

## සට්ඨිනිපාතය නිමි.

# 70. මහානිපාතො.

## 70. 1. 1

1220. නික්ඛන්තං වත මං සන්තං අගාරස්මානගාරියං[1]
විතක්කා උපධාවන්ති පගබ්භා කණ්හතො ඉමෙ.

1221. උග්ගපුත්තා මහිස්සාසා සික්ඛිතා දළ්හධම්මිනො[2]
සමන්තා පරිකිරෙය්‍යුං සහස්සං අපලායිනං.

1222. සචෙ'පි එත්තකා භිය්‍යො ආගමිස්සන්ති ඉත්ථියො
නෙව මං බ්‍යාධයිස්සන්ති ධම්මෙ සම්හි පතිට්ඨිතං.[3]

1223. සක්ඛී හි මෙ සුතං එතං[4] බුද්ධස්සාදිච්චබන්ධුනො
නිබ්බානගමනං මග්ගං තත්ථ මෙ නිරතො මනො.

1224. එවං චෙ මං[5] විහරන්තං පාපිම උපගච්ඡසි
තථා මච්චු කරිස්සාමි න මෙ මග්ගම්පි දක්ඛසි[6].

1225 අරතිං රතිං ච පහාය සබ්බසො ගෙහසිතං ච විතක්කං
වනථං න කරෙය්‍ය කුහිඤ්චි නිබ්බනථො[7] අවනථො ස භික්ඛු [8]

1226. යමිධ පථවිං ච වෙහාසං රූපගතං ජගතොගධං කිඤ්චි
පරිජීයති සබ්බමනිච්චං එවං සමෙච්ච චරන්ති මුත්තත්තා.[9]

1227. උපධීසු ජනා ගධිතාසෙ දිට්ඨසුතෙ[10] පටිඝෙ ච මුතෙ ච
එත්ථ විනොදය ඡන්දමනෙජො යො එත්ථ න ලිම්පති මුනි තමාහු

1228. අථ සට්ඨිසිතා සවිතක්කා පුථුජ්ජනතායං[11] අධම්මා නිවිට්ඨා
න ච වග්ගගතස්ස[12] කුහිඤ්චි නො පන දුට්ඨුල්ලගාහී[13] ස භික්ඛු.

---

1. අගාරස්මා අනගාරියං - PTS
3 සච්චම්හි පතිට්ඨිතො - PTS 4 සක්ඛිං හි - සයා, PTS 5. එවමෙවං - PTS
6. මග්ගං උද්දික්ඛසි - සයා, PTS 7. නිබ්බනථො - PTS 8. ස හි භික්ඛු - PTS.
9. මුතත්තා - සයා, PTS 10. දිට්ඨසුතෙ - PTS 11. පුථුජ්ජනතාය - PTS
12. වග්ගගතිස්ස - සයා, PTS 13. දුට්ඨුල්ලභාණී - සයා පදුල්ලගාහී - PTS

# 70. මහානිපාතය.

1220. මා ගිහිගෙන් 'අනගාරිය' සසුනට නික්මෙත් මැ මේ සැහැසි (නිල්ලජ්ජ) වූ (කාමාදිපාප) විතර්කයෝ ලාමක බැවින් ලුහුබඳිත්.

1221. සහස්‍රස්ථාමධනු ඇති, ධනුශ්ශිල්පය උගත්, මහධනුශේදී වූ උග්‍රපුත්‍රයෝ දහස් දෙනෙක් හාත්පසින් සර වගුරුවන්නාහු නමුදු ඔහු නො 'පලා යනසුලු මා නො පෙළන්නාහ. (පෙළනු නො සමත්හ'යි සේ යි).

1222. ඉදින් මෙයටත් වැඩි මාගම්හු එන්නාහු නමුදු ඔහු ස්වකීය ධර්මයෙහි පිහිටි මා නො පෙළත් මැ යි (පෙළනු නො සමත්හ'යි සේ යි)

1223. මා විසින් පසක් කොට (හමුවෙහි) සූර්යබන්ධු (හිරුගොත්) වූ සම්බුදුන් ගේ තෙල නිවන් ගමන් මග අසන ලදි. ඒ (විදසුන්) මගැ මා සිත නිරත වේ.

1224. එම්බා කෙලෙස් මරුව, තෝ මෙසේ (අශුභ භාවනායෙහි ද විදර්ශනාභාවනායෙහි ද නිරත වැ) වෙසෙන මා වෙත එළඹියෙහි, යම්සේ මා ගේ (ආගිය) මග පවා (තෝ) නො දක්නෙහි නම් එසේ මරණය කරන්නෙමි.

1225 යමෙක් (අධිකුශල ධර්මයන්හි) උකටලී බවත් (පස්කම් ගුණයෙහි) ඇල්මත් ගෙහසිත (මිථ්‍යා) විතර්කයන් සර්වප්‍රකාරයෙන් හැරදමා කිසි තැනෙක්හිදු තෘෂ්ණාව නො කරන්නේ නම් තෘෂ්ණායෙන් නික්මුණු (එහෙයින් මැ) තෘෂ්ණා රහිත වූ හෙතෙම ශ්‍රමණ වේ.

1226. මේ ලෝකයෙහි භූමිනිශ්‍රිත වූ ද ආකාශස්ථ (දෙව්ලෝ ඇසිරි-කළ වූ ද ජගත් පර්යාපන්න (ලෞකික) වූ යම්කිසි රූපජාතයෙක් වේ නම් (ඒ) සියල්ල වෙසෙසින් දිරයි, අනිත්‍ය යැයි මෙසේ ප්‍රතිවේධ කොට රහත්හු වෙසෙත්.

1227. දනෝ (සකන්ධාදි) උපධීන්හි බැඳුණාහු යැ, රූපාලම්බනයෙහි ද ශබ්දාලම්බනයෙහි ද ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි ද ගන්ධ-රසාලම්බනයන්-හි ද යන මෙහි තෘෂ්ණා රහිත වූයේ කාමච්ඡන්දය දුරු කරන්නේ යැ. යමෙක් මෙහි (තාෂ්ණාලෙපයෙන්) නො තැවැරේ නම් ඔහු මුනි යැ යි (නුවණැතියෝ) කියත්.

1228. තවද ('අධිච්චසමුප්පන්න' වාදය හැර) සැටක් පමණ වූ මිස-දිටුව ඇසුරු කළ අධර්ම (මිථ්‍යා) විතර්කයෝ පෘථග්ජන සමූහයා තුළ ප්‍රවිෂ්ට වූහ. යමෙක් කිසි තැනෙකැ (ශාශ්වතාදි) මිථ්‍යාදෘෂ්ටි) වර්ග-ගතයෙක් (තල්ලබ්ධිකයෙක්) නො වන්නේ නම් යළි දුර්භාෂිතයන් ගන්නා සුල්ලෙක් නො වන්නේ නම් හෙතෙම භික්ෂු නම් වේ.

නොහොත් ෂඩාලම්බනය (ධර්මාලම්බන) ඇසුරු කළ බොහෝ වූ අධර්ම විතර්කයෝ ජනතාව තුළ පිවිසියහ. යමෙක් කිසි තැනෙකැ කෙලශවර්ගගතයෙක් නො වන්නේ නම් යළි දුර්භාෂිත ගන්නාසුල්ලෙක් නො වන්නේ නම් හෙතෙම භික්ෂු නම් වේ.

1229. දබ්බා චිරරත්තසමාහිතො[1] අකුහකො නිපකො අපිහාලු,
සන්තං පදං අජ්ඣගමා මුනි පටිච්ච පරිනිබ්බුතො කඞ්ඛති කාලං

1230. මානං පජහස්සු ගොතම මානපථං ච ජහස්සු අසෙසං
මානපථම්හි[2] සමුච්ඡිතො විප්පටිසාරී හුවා චිරරත්තං

1231. මක්ඛෙන මක්ඛිතා පජා මානහතා නිරයං පපතන්ති[3]
සොචන්ති ජනා චිරරත්තං මානහතා නිරයං උපපන්නා

1232. න හි සොචති භික්ඛු කදාචි මග්ගජිනො සම්මා පටිපන්නො
කිත්තිං ච සුඛං චානුභොති ධම්මදසො'ති තමාහු තථත්තං.

1233. තස්මා අඛිලො පධානවා[4] නීවරණානි පහාය විසුද්ධො
මානං ච පහාය අසෙසං විජ්ජායන්තකරො සමිතාවී.

1234. කාමරාගෙන ඩය්හාමි චිත්තං මෙ පරිඩය්හති
සාධු නිබ්බාපනං බ්‍රෑහි අනුකම්පාය ගොතම.

1235. සඤ්ඤාය විපරියෙසා චිත්තං තෙ පරිඩය්හති
නිමිත්තං පරිවජ්ජෙහි සුභං රාගූපසංහිතං.

1236 සඞ්ඛාරෙ පරතො පස්ස දුක්ඛතො මා ච අත්තතො
නිබ්බාපෙහි මහාරාගං මා ඩය්හිත්ථො පුනප්පුනං.*

1237. අසුභාය චිත්තං භාවෙහි එකග්ගං සුසමාහිතං
සති කායගතා ත්‍යත්ථු නිබ්බිදාබහුලො භව.

1238. අනිමිත්තඤ්ච භාවෙහි මානානුසයමුජ්ජහ
තතො මානාභිසමයා උපසන්තො චරිස්සසි.

1239. තමෙව වාචං භාසෙය්‍ය යායත්තානං න තාපයෙ.
පරෙ ච න විහිංසෙය්‍ය සා වෙ වාචා සුභාසිතා.

1240. පියවාචමෙව භාසෙය්‍ය යා වාචා පටිනන්දිතා
යං අනාදාය පාපානි පරෙසං භාසතෙ පියං.

1241. සච්චං වෙ අමතා වාචා එස ධම්මො සනන්තනො
සච්චෙ අත්ථෙ ච ධම්මෙ ච ආහු සන්තො පතිට්ඨිතා.

1242. යං බුද්ධො භාසති වාචං ඛෙමං නිබ්බානපත්තියා
දුක්ඛස්සන්තකිරියාය සා වෙ වාචානමුත්තමා.

---

1. චිරරත්තං සමාහිතො - ස්‍යා, PTS 2. මානපථස්මිං - ස්‍යා
3. පතන්ති - ස්‍යා, PTS 4 ඉධම්මානවා - ස්‍යා, PTS * PTS. පොත්ථකෙ නත්ථි

1229. නුවණැත්තේ දිගුකලක් මුළුල්ලෙහි සමාහිත වැ කොහොත් බව රහිත වැ නිපුණ වැ තෘෂ්ණා රහිත වැ නිවනට පැමිණියේ මුනිවැ සෝපාදිශෙෂනිර්වාණධාතුයෙන් පිරිනිවියේ (අනුපාදිශෙෂ-නිර්වාණයට) කල් බලයි.

1230. ගෞතම ශ්‍රාවකය, (තෝ) මානය දුරුකර, (ජාති ආදී) සියලු මානපථය ද දුරුකර, මානපථයෙහි මුසපත් වූයේ දිගුකලක් විපිළිසර වී

1231. මකු බව විසින් ප්‍රජාව (ගුණ මැකීමෙන්) පිස්නාලද යැ. මානය විසින් නට ගුණ ඇත්තෝ නිරයට වැටෙත්. මානය විසින් නට ගුණ ඇති, නිරයට පැමිණි ජනයෝ දිගුකලක් මුළුල්ලෙහි සොවිත්.

1232. මාර්ගයෙන් දිනූ කෙලෙස් ඇති මොනොවට පිළිපන් මහණ තෙම කිසිකලෙක නො සොවී මැ යි හෙතෙම කීර්තියත් සුඛයත් විඳී තථභාවයට ගිය ඔහු ධර්මය දක්නෙකැ යි නුවණැතියෝ කීහු.

1233. එහෙයින් (තෝ) චෙතොඛිල රහිත වැ ප්‍රධන්වීර්‍ය්‍ය ඇති වැ නීවරණයන් ප්‍රහීණ කොට පිරිසුදු සිත් ඇති වැ සියලු මානය ද දුරු කොට සන්හුන් කෙලෙස් ඇතී වැ ත්‍රිවිද්‍යායෙන් (දුක්) කෙළවරට පැමිණියෙක් වව.

1234. කාමරාගයෙන් දැවෙමි, මාගේ සිත හාත්පසින් දැවෙයි. ගෞතම (ගොත්‍ර ඇති) යෙනි. අනුකම්පා කොට (රාගය) නිවන උපාය වදාළ මැනැවි.

1235. (අශුභයෙහි ශුභ යැයි) සංඥාවිපර්‍ය්‍යාසයෙන් තොපගේ සිත හාත්පසින් දැවෙයි. රාගය ඇසුරු කළ ශුභනිමිත්ත දුරු කරව.

1236. සංස්කාරයන් අනාත්ම වශයෙන් බලව, දුක් වශයෙන් බලව, ආත්මවශයෙන් නො බලව, මහාරාගය නිවව, පුනපුනා නො දැවෙව.

1237. සිත අවික්ෂිප්ත කොට (අරමුණෙහි) මොනවට පිහිටුවා අශුභානු දර්ශනායෙන් වඩව. තොප ගේ සිහිය කය අනුවගියා වේවා, නිර්වේද බහුලයෙක් වෙව.

1238. අනිමිත්තභාවනාව ද වඩව, මානානුසය ද දුරුකරව. මානාභි-සමයෙන් උපශාන්ත වැ වෙසෙහි.

1239. යම් වචනයකින් තමා නො තවන්නේ නම් මෙරමාත් නො පෙළන්නේ නම් එ මැ වචනය කියන්නේ යැ,එකන්නෙන් ඒ වචනය සුභාෂිත වේ.

1240. යම් වචනයක් මෙරමා විසින් පිළිගන්නා ලද නම් යම් වචනයක් කියන්නේ මෙරමා ගේ අනිටු වචනයන් නො ගෙන ප්‍රිය වචනයක් මැ කියා නම් එ මැ ප්‍රිය වචනය කියන්නේ යි.

1241. සත්‍යය ඒකාන්තයෙන් අමෘතවචනයෙකි, තෙල සත්‍ය වචනය පුරාණධර්මයෙකි, සත්පුරුෂයෝ සත්‍ය වූ අර්ථයෙහිත් ධර්මයෙහිත් පිහිටියාහු යැ යි (නුවණැතියෝ) කීහු.

1242. නිවනට පැමිණෙනු පිණිස දුක් කෙළවර කරනු පිණිස සර්වඥයන් වහන්සේ යම් ක්‍ෂෙම වූ වචනයක් වදරත් නම් ඒ වචනය ඒකාන්ත-යෙන් වචනයන් අතුරින් උතුම්.

1243. ගම්භීරපඤ්ඤො මෙධාවී මග්ගාමග්ගස්ස කොවිදො
සාරිපුත්තො මහාපඤ්ඤො ධම්මං දෙසෙති භික්ඛුනං

1244. සංඛිත්තෙන'පි දෙසෙති විත්ථාරෙන'පි භාසති
සාලිකායිව[1] නිග්ඝොසො පටිභානං උදීරයි[2]

1245. තස්ස තං දෙසයන්තස්ස සුණන්ති[3] මධුරං ගිරං
සරෙන රජනීයෙන සවනීයෙන වග්ගුනා,
උදග්ගචිත්තා මුදිතා සොතං ඔධෙන්ති භික්ඛවො.

1246 අජ්ජ පණ්ණරසෙ විසුද්ධියා භික්ඛූ පඤ්චසතා සමාගතා
සංයොජනබන්ධනච්ඡිදා අනීඝා ඛීණපුනබ්භවා ඉසී

1247. චක්කවත්තී යථා රාජා අමච්චපරිවාරිතො
සමන්තා අනුපරියෙති සාගරන්තං මහිං ඉමං.

1248. එවං විජිතසංගාමං සත්ථවාහං අනුත්තරං
සාවකා පයිරුපාසන්ති තෙවිජ්ජා මච්චුහායිනො.

1249. සබ්බෙ භගවතො පුත්තා පලාසෙත්ථ[4] න විජ්ජති
තණ්හාසල්ලස්ස හන්තාරං වන්දෙ ආදිච්චබන්ධුනං

1250. පරොසහස්සං භික්ඛූනං සුගතං පයිරුපාසති
දෙසෙන්තං විරජං ධම්මං නිබ්බානං අකුතොභයං.

1251. සුණන්ති ධම්මං විමලං[5] සම්මාසම්බුද්ධදෙසිතං
සොභති වත සම්බුද්ධො භික්ඛුසංඝපුරක්ඛතො.

1252. නාගනාමොසි භගවා ඉසීනං ඉසිසත්තමො,
මහාමෙඝොව හුත්වාන සාවකෙ අභිවස්සති[6]

1253. දිවාවිහාරා නික්ඛම්ම සත්ථුදස්සනකම්‍යතා
සාවකො තෙ මහාවීර පාදෙ වන්දති වඞ්ගීසො.

1254. උම්මග්ගපථං මාරස්ස අභිභුය්‍ය චරති පභිජ්ජ ඛීලානි
තං පස්සථ බන්ධනපමුඤ්චකරං අසිතං'ව භාගසො පවිභජ්ජ.[7]

1255. ඔඝස්ස හි නිත්ථරණත්ථං අනෙකවිහිතං මග්ගං අක්ඛාසි
තස්මිඤ්ච අමතෙ අක්ඛාතෙ ධම්මද්දසා ඨිතා අසංහීරා.

1256. පජ්ජොතකරො අතිවිජ්ඣ ධම්මං[8] සබ්බට්ඨිතීනං අතික්කමමද්දා[9]
ඤත්වා ච සච්ඡිකත්වා ච අග්ගං සො දෙසයි දසද්ධානං.

---

1. සාලිකායෙව - ස්‍යා, PTS. 2. උදීය්‍යති - ස්‍යා PTS 3. සුණන්තා - PTS.
4. පලාපො එත්ථ - PTS 5. විපුලං - ස්‍යා PTS 6 අභිවස්සසි - PTS
7. පවිභජ්ජාතිපිපාඨො 8. අතිවිජ්ඣ - PTS. 9 අතික්කමමද්දද - සීමු. 1, 2.

1243. ගම්භීර ප්‍රඥ ඇති, ධම්මොජප්‍රඥ ඇති, මාර්ගාමාර්ගයෙහි නිපුණ වූ මහාප්‍රාඥ වූ ශාරිපුත්‍ර තෙමේ භික්ෂූන්ට දහම් දෙසයි.

1244. හැකෙවිනුදු දෙසයි, විතරිනුදු කියයි, සැලලිහිණියකට බදු මියුරු හඬ ඇත්තේය, (කියනු කැමැති කල්හි මුහුදෙහි රළ පෙළ මෙන්) ප්‍රතිභානය (වැටහීම) නැඟ එයි.

1245. කාන්ත වූ ශ්‍රවණීය වූ මනෝහර වූ ස්වරයෙන් දෙසන්නා වූ ඒ දහම් සෙනෙවිහුගේ ඒ මිහිරි වදන් භික්ෂූහු උනඹුබ වූ සිත් ඇති වැ මුදිත වැ අසත්, කන්යොමු කරත්.

1246. අද පසළොස්වක් පොහෝයෙහි විශුද්ධිපවාරණය සඳහා සංයෝජන සංඛ්‍යාත බන්ධනයන් සිඳැ ලූ නිදුක් වූ ක්‍ෂය කළ පුනර්භවය ඇති සෑම වූ පන්සියක් භික්ෂූහු රැස්වූහු.

1247. යම්සේ ඇමැතියන් පිරිවැරූ සක්විතිරජ තෙම සයුරු කෙළවර කොට ඇති මෙපොළොව හාත්පස්හි (සියලු තැන්හි) හැරිසරා ද,

1248. එසේ මැ මාරයා බැහැර කරනසුලු වූ ත්‍රිවිද්‍ය ප්‍රාප්ත වූ ශ්‍රාවකයෝ දිනනලද කෙලශසඞ්ග්‍රාම ඇති නිරුත්තර වූ සාර්ථවාහ වූ භාග්‍යවතුන් වහන්සේ පයිරුපාසනය කෙරෙත්.

1249. සියල්ලෝ භාග්‍යවතුන් වහන්සේගේ පුත්තු යැ. මෙහි අසාර-යෙක් නො පැනේ, තෘෂ්ණාශල්‍යය උපුරන්නා වූ සූර්යබන්ධුහු වඳිමි.

1250. භික්ෂූන් අයිරා දහසක් (දහසකට වැඩි භික්ෂූහු) පහ වූ රාගාදි රජස් ඇති කොයිනුත් බිය නැති නිවන් දහම් දෙසන සුගතයන් වහන්සේ පයිරුපාසන කෙරෙයි.

1251. සම්මාසම්බුදුන් විසින් දෙසනලද නිර්මල ධර්මය ශ්‍රවණය කෙරෙති· භික්ෂුසඞ්ඝයා විසින් පෙරටු කරගන්නා ලද සම්බුදුහු හොබනාහු මැ යි·

1252. සෑම්න් අතුරෙහි සප්තමර්ෂි වූ භාග්‍යවතුන් වහන්සේ නාග නම් වූහ. මහාමේඝයක් බඳු වැ ශ්‍රාවකයන් කෙරෙහි දහම් වැසි වසිත්.

1253. මහාවීරයන් වහන්ස, තොප වහන්සේගේ ශ්‍රාවක වූ 'වඞ්ගීස' මහණ ශාස්තෘන් වහන්සේ දක්නා කැමැත්තෙන් දිවාවිහාරයෙන් නික්මපාසඟළු වඳී.

1254. යමෙක් මර හුගේ උන්මාර්ගපථය මැඩැපියා චේතොඛිලයන් බිඳ-හැරැ හැසිරේ ද, සතිපට්ඨානාදි ධර්මයන් කොටස් විසින්, බෙදැ දෙශනා කෙරේ ද කෙලශබන්ධනයන් මුදන්නා වූ රාගාදි නිඃශ්‍රය රහිත වූ ඒ බුදුන් බලවු.

1255. යමෙක් චතුරෝඝයාගේ නිස්තරණය පිණිස අනෙකප්‍රකාර වූ මාර්ගය ප්‍රකාශ කෙළේ ද ඒ බුදුන් අමෘතය ප්‍රකාශ කළ කල්හි දහම් දක්නාහු (අනෙකක්හු විසින්) අසංහාරිය වැ සිටියාහු යැ.

1256. ප්‍රද්‍යෝතකර වූ යමෙක් දහම් අවබෝධ කොට සියලු දෘෂ්ටිස්ථාන-යන් ගේ හෝ විඥානස්ථිතීන් ගේ අතික්‍රමණය වූ නිවන දුටුයේ ද අග්‍ර-ධර්මය දැන ප්‍රත්‍යක්‍ෂ කොට ඒ සර්වඥ තෙම පස්වග මහණුන්ට දෙසී.

1257. එවං සුදෙසිතෙ ධම්මෙ
කො පමාදෙ විජානතං ධම්මං
තස්මා හි තස්ස භගවතො සාසනෙ
අප්පමත්තො සදා නමස්සමනුසික්ඛෙ

1258. බුද්ධානුබුද්ධො යො ථෙරො කොණ්ඩඤ්ඤො තිබ්බනික්කමො[1]
ලාභී සුඛවිහාරානං විවෙකානං අභිණ්හසො.

1259. යං සාවකෙන පත්තබ්බං සත්ථුසාසනකාරිනා
සබ්බස්ස තං අනුප්පත්තං අප්පමත්තස්ස සික්ඛතො.[2]

1260. මහානුභාවො තෙවිජ්ජො චෙතොපරියකොවිදො
කොණ්ඩඤ්ඤො බුද්ධදායාදො පාදෙ වන්දති සත්ථුනො.

1261. නගස්ස[3] පස්සෙ ආසීනං මුනිං දුක්ඛස්ස පාරගුං
සාවකා පයිරුපාසන්ති තෙවිජ්ජා මච්චුහායිනො

1262. චෙතසා අනුපරියෙති මොග්ගල්ලානො මහිද්ධිකො
චිත්තං නෙසං සමන්වෙසං විප්පමුත්තං නිරූපධිං.

1263. එවං සබ්බඞ්ගසම්පන්නං මුනිං දුක්ඛස්ස පාරගුං
අනෙකාකාරසම්පන්නං පයිරුපාසන්ති ගොතමං.

1264. චන්දො යථා විගතවලාහකෙ නභෙ
විරොචති වීතමලො'ව භානුමා
එවම්'පි අඞ්ගීරස ත්වං මහාමුනි
අතිරොචසි යසසා සබ්බලොකං.

1265. කාවෙය්‍යමත්තා විචරිම්හ පුබ්බෙ ගාමා ගාමං පුරා පුරං
අථද්දසාම[4] සම්බුද්ධං සබ්බධම්මාන පාරගුං.

1266. සො මෙ ධම්මමදෙසෙසි මුනි දුක්ඛස්ස පාරගූ
ධම්මං සුත්වා පසීදිම්හ අද්ධා[5] නො උදපජ්ජථ.

1267. තස්සාහං වචනං සුත්වා ඛන්ධෙ ආයතනානි ච
ධාතුයො ච විදිත්වාන පබ්බජිං අනගාරියං.

1268. බහුන්නං[6] වත අත්ථාය උප්පජ්ජන්ති තථාගතා
ඉත්ථීනං පුරිසානං ච යෙ තෙ සාසනකාරකා.

1269. තෙසං ඛො වත අත්ථාය බොධිමජ්ඣගමා මුනි
භික්ඛූනං භික්ඛුනීනං ච යෙ නියාමගතද්දසා.[7]

---

1. තිබ්බනික්කමො - සීමු. 1, 2. ප. 2. සික්ඛතො - මජසං.
3. නාගස්ස - සයා, PTS 4. අථද්දසාමි - සයා, PTS 5. සද්ධා - PTS
6. බහුනං - සබ්බත්ථ 7. නියාමගතං දසා - සයා PTS

1257. මෙසෙයින් දහම් මොනොවට දේසිත කල්හි දහම් දන්නවුන්ගේ කවර ප්‍රමාදයෙක් ද, එහෙයින් ඒ භාග්‍යවතුන්ගේ ශාසනයෙහි අප්‍ර-මත්ත වැ හැම කල්හි නමස්කාර කෙරෙමින් ත්‍රිවිධ ශික්‍ෂායෙහි හික්මෙන්නේ යැ.

1258. බුද්ධානුබුද්ධ වූ දැඩිවීර්‍ය්‍ය ඇති කොණ්ඩඤ්ඤ නම් යම් ස්ථවිර කෙනෙක් නිරතුරු ශූන්‍යාගාරයෙහි සුඛවිහරණ ඇති ත්‍රිවිධ විවේකයන් ලැබූහු ද.

1259. ශාස්තෘන් වහන්සේගේ අවවාදය පිළිපදනා සුලු වූ හැම ශ්‍රාවකයකු විසින් යම් උතුරුමිනිස්ගුණයෙක් ලැබිය යුතු වන්නේ නම් අප්‍රමාද වැ හික්මෙනුවහු විසින් එය අනුක්‍රමයෙන් ලබනලදී.

1260. මහත් වූ අනුභාව ඇති (ලබනලද) ත්‍රිවිද්‍යා ඇති, පරසිත් දන්නා නුවණෙහි නිපුණ වූ බුද්ධදායාද (ඖරසපුත්‍ර) වූ කොණ්ඩඤ්ඤ ස්ථවිර තෙම ශාස්තෘන් වහන්සේගේ පාසගල වදී.

1261. මරහු බැහැර කරනසුලු වූ ත්‍රිවිද්‍යා ප්‍රාප්ත වූ ශ්‍රාවකයෝ (ඉසිගිලි) පව්පාමුල්හි (කළුගල) මතුයෙහි වැඩහුන්නා වූ (සසර) දුකින් එතර වූ මුනිඳුන් පිරිවරා හිඳිත්.

1262. මහත් සෘද්ධිඇති මුගලන් තෙමේ කෙලෙසුන් කෙරෙන් මිදුණු උපධි රහිත වූ ඔවුන්ගේ සිත චේතොපරියඤාණයෙන් විමසමින් පිළිවෙළින් පිරිසිඳී.

1263. මෙසේ ශ්‍රාවකයෝ (ශාස්තෘ සම්පත්තියෙන්ද ශ්‍රාවක සම්පත්ති-යෙන් ද යන) සියලු අඞ්ගයන්ගෙන් සමන්විත වූ සසර දුකින් එතෙර වූ නොයෙක් අයුරු ගුණයෙන් යුක්ත වූ ගෞතම මුනිහු පිරිවරා හිඳිත්.

1264. පහ වූ වලා ඇති අහස්හි පුන්සඳ යම්සේ බබළා ද පහ වූ උපක්ලේශ ඇති සූර්‍ය්‍යයා යම්සේ බබළා ද එසේ මැ අඞගිරස මහා-මුනිවරයන් වහන්ස, නුඹ වහන්සේ යසසින් මුළු ලොව අභිභවා බබලන්නහුය.

1265. පෙර කාව්‍යකරණයෙන් මත් වැ (මානිත වැ) ගමින් ගම නුවරින් නුවර ඇවිද්දම්හ. ඉක්බිති සියලු (ඥෙය) ධර්මයන්ගේ පරතෙරට ගියා වූ සම්බුදුන් දුටුම්හ.

1266. සසරදුකින් එතෙරට ගිය ඒ මුනිවරයන් වහන්සේ මට දහම් දෙසූහ, දහම් අසා ප්‍රසන්න වූම්හ, එකත්තෙන් (තුනුරුවන්) අපට (හිත පිණිස) උපන්නේ යි.

1267. මම උන් වහන්සේගේ බස් අසා ස්කන්ධ ආයතන ධාතූන් දැන ගෙන සසුන්හි පැවිදි වීමි.

1268. යම් කෙනෙක් (ශාස්තෘන් වහන්සේගේ) අවවාදය කරන්නාහු නම් ඒ බොහෝ වූ ස්ත්‍රීන්ට ද පුරුෂයන්ට ද ඒකාන්තයෙන් වැඩ පිණිස තථාගතයෝ උපදිත්.

1269. යම් කෙනෙක් 'සම්මත්තනියාමය' සාක්‍ෂාත් කළාහු නම් ඒ භික්ෂූන්ට ද භික්‍ෂුණීන්ට ද එකත්තෙන් වැඩ පිණිස භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බෝධිය සාක්‍ෂාත් කළහ.

1270. සුදෙසිතා චක්ඛුමතා බුද්ධෙනාදිච්චබන්ධුනා
චත්තාරි අරියසච්චානි අනුකම්පාය පාණිනං.

1271. දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං
අරියං චට්ඨඞ්ගිකං[1] මග්ගං දුක්ඛූපසමගාමිනං.

1272. එවමෙතෙ තථා වුත්තා දිට්ඨා මෙ තෙ යථා තථා
සදත්ථො මෙ අනුප්පත්තො කතං බුද්ධස්ස සාසනං.

1273. ස්වාගතං වත මෙ ආසි මම බුද්ධස්ස සන්තිකෙ
සංවිභත්තෙසු[2] ධම්මෙසු යං සෙට්ඨං තදුපාගමිං.

1274. අභිඤ්ඤාපාරමිප්පත්තො සොතධාතු විසොධිතා[3]
තෙවිජ්ජො ඉද්ධිපත්තොම්හි චෙතොපරියකොවිදො.

1275 පුච්ඡාමි සත්ථාරමනොමපඤ්ඤං
දිට්ඨෙ'ව ධම්මෙ යො විචිකිච්ඡානං ඡෙත්වා
අග්ගාළවෙ කාලමකාසි භික්ඛු
ඤාතො යසස්සී අභිනිබ්බුතත්තො.

1276. නිග්‍රොධකප්පො ඉති තස්ස නාමං,
තයා කතං භගවා බ්‍රාහ්මණස්ස
සො'හං[4] නමස්සං අචරිං මුත්‍යපෙඛො[5]
ආරද්ධවිරියො දළ්හධම්මදස්සී

1277. තං සාවකං සක්ක මයං'පි සබ්බෙ
අඤ්ඤාතුමිච්ඡාම සමන්තචක්ඛු
සමවට්ඨිතා[6] නො සවනාය සොතා[7]
තුවං නො[9] සත්ථා ත්වමනුත්තරොසි.

1278 ඡින්ද නො[10] විචිකිච්ඡං බ්‍රූහි මෙතං
පරිනිබ්බුතං වෙදය භූරිපඤ්ඤ
මජ්ඣෙ'ව නො භාස සමන්තචක්ඛු
සක්කො'ව දෙවාන සහස්සනෙත්තො.

1279. යෙ කෙචි ගන්ථා[11] ඉධ මොහමග්ගා
අඤ්ඤාණපක්ඛා විචිකිච්ඡඨානා[12]
තථාගතං පත්වා න තෙ භවන්ති
චක්ඛුං හි එතං පරමං නරානං.

1280. නො චෙ හි ජාතු පුරිසො කිලෙසෙ
වාතො යථා අබ්භඝනං විහානෙ[13]
තමොවස්ස නිවුතො[14] සබ්බලොකො
ජොතිමන්තො'පි න පභාසෙය්‍යුං.[15]

---

1 අරියචට්ඨඞ්ගිකං - PTS 2 සම්භත්තෙසු - සිමු 1,2, ප 3 විසොධිතො - සයා, PTS
4 සො තං - PTS 5 මුත්‍යාපෙක්ඛො - සයා 6 සමවට්ඨිතා - සයා
7 සොතුං - සිමු, ප 8 සොතං - PTS 9 නු - සයා, PTS
10 ඡින්දෙ'ව - සයා, PTS 11 ගන්ධා - සයා, PTS 12 විචිකිච්ඡඨානා - PTS
13 විහනෙ - සිමු 1, 2 14 නිබ්බුතො - සයා, PTS 15 නප්පභාසෙය්‍යුං - සිමු 1, 2

1270. පසැස් ඇති සූර්‍යබන්ධු වූ බුදුරදුන් විසින් සත්ත්වයන්ට අනුකම්පා පිණිස චතුරාර්‍යසත්‍යයෝ දෙසනලදහ.

1271. දුක, දුක් උපදනා හේතු යැ, දුක ඉක්මවීම (නිරෝධ) යැ, දුක් සන්හිඳුවනසුලු අරි අටඟමඟ යැ යන-

1272. තෙල සත්‍යධර්මයෝ මෙසේ ඇතිසැටියෙන් දෙසනලද්දාහු යැ ඒ ධර්මයෝ දෙසනලද පරිද්දෙන් මා විසින් පසක් කරන ලදහ මා විසින් ස්වාර්ථය අනුක්‍රමයෙන් ලබනලද යැ. බුදුන්ගේ අවවාදය කරනලදී.

1273. ඒකාන්තයෙන් මනා ඊමෙක් මට විය. මාගේ බුදුන් හමුයෙහි දී විභාග කරන ලද ධර්මයන් අතුරෙහි යම් ධර්මයක් ශ්‍රේෂ්ඨ නම් මම එය සාක්ෂාත් කෙළෙමි.

1274. (මා විසින්) ෂඩභිඥාවන්ගේ පරතෙර පැමිණෙන ලද යැ ශ්‍රෝත්‍රධාතුව විශෝධනය කරන ලද යැ, (මම) ත්‍රිවිද්‍යා ඇත්තෙමි. ඍද්ධිවිධඥානය ලද්දෙමි, චේතොපරියඥාණයෙහි නිපුණයෙමි.

1275. මහාප්‍රාඥ වූ ශාස්තෘන් වහන්සේ විචාරමි, යම් මහණෙක් මේ අත් බැව්හි මැ සැක සිඳ ප්‍රකට වැ යශස් ඇති වැ සන්හුන් සිත් ඇත්තේ ද ඒ මහණ තෙම 'අග්ගාලවචේතිය' නම් වූ වෙහෙරෙහි දී කළුරිය කෙළේ ය.

1276 භාග්‍යවතුන්වහන්ස, නිග්‍රෝධකප්පයි' යනු බ්‍රාහ්මණ ජාතික වූ ඔහුට ඔබ වහන්සේ විසින් කරන ලද නමෙකි. නිවන් දහම් දක්නාසුලු භාග්‍යවතුන් වහන්ස, ඒ මම (එකල්හි) මෝක්ෂයෙහි අපේක්ෂා ඇතියෙම් රුකුළුවැර ඇතියෙම් නමස්කාර කෙරෙමින් සිටියෙමි.

1277. ශාක්‍යයන් වහන්ස, අපි සියලු දෙනා මැ ඒ (කළුරිය කළ) මහණහු දැනගන්නට කැමැත්තම්හ. සියල්ල දක්නාණෙනි, අපගේ කන් (එකරුණ) අසන්නට යොමු විය. වහන්ස, වහන්සේ අපගේ ශාස්තෘ වූ සේක. වහන්සේ අනුත්තර වූ සේකි.

1278. අපගේ විචිකිච්ඡාව සිඳ මැනැවැ, තෙල කරුණු මට වදාළ මැනවැ, මහා ප්‍රාඥයාණෙනි, සියල්ල දක්නාණෙනි, පිරිනිවියහු දැනැ දෙවියන් මැද සහස්නෙත් සක්රජහු සෙයින් අප පිරිස්මැද වදාළ මැනවි.

1279. මෙලොවැ මෝහයට මාර්ග වූ අඥානපක්ෂ ඇති, විචිකිච්ඡාවට කරුණු වූ (අභිධ්‍යාදි) යම් කිසි ග්‍රන්ථකෙනෙක් වෙත් නම් ඔහු තථාගතයන් වහන්සේ කරා පැමිණ අභාවයට යෙත්, යම්හෙයකින් තෙල තථාගතයන් වහන්සේ මිනිසුනට පරමචක්ෂුස වේ ද එහෙයිනි.

1280 ඉදින් යම් හෙයකින් තථාගත තෙම වායුව වැසිවලාවක් සෙයින් කෙලෙස් නොනසා නම් ඔකන්නෙත් මුළු ලොව අඳුරින් වැසුණේ මැ වන්නේ යැ, (ශාරිපුත්‍රාදි) ද්‍යුතිමත්හු ද නො බබලන්නාහු මැ යි.

1281. ධීරා ච පජ්ජොතකරා භවන්ති
තං තං අහං වීර[1] තථෙව මඤ්ඤෙ
විපස්සිනං ජානමුපාගමිම්හා
පරිසාසු[2] නො ආවිකරොහි කප්පං.

1282. ඛිප්පං ගිරං එරය වග්ගු වග්ගුං
හංසො'ව පග්ගය්හ සණිකං නිකූජ
බින්දුස්සරෙන සුවිකප්පිතෙන
සබ්බෙ'ව තෙ උජ්ජුගතා සුණොම.

1283. පහීනජාතිමරණං අසෙසං
නිග්ගය්හ ධොනං[3] පටිවෙදියාමි[4]
න කාමකාරො හි[5] පුථුජ්ජනානං
සඞ්ඛෙය්‍යකාරො'ව තථාගතානං.

1284. සම්පන්නවෙය්‍යාකරණං තවෙදං
සමුජ්ජුපඤ්ඤස්ස[6] සමුග්ගහීතං
අයමඤ්ජලී පච්ඡිමො සුප්පණාමිතො
මා මොහයී ජානමනොමපඤ්ඤ.

1285. පරොවරං[7] අරියධම්මං විදිත්වා
මා මොහයී ජානමනොමවීර[8]
වාරිං යථා ඝම්මනි ඝම්මතත්තො
වාචාභිකඞ්ඛාමි සුතං පවස්ස.[9]

1286. යදත්ථිකං[10] බ්‍රහ්මචරියං අචාරි
කප්පායනො කච්චි සතං අමොඝං
නිබ්බායි සො ආදු සඋපාදිසෙසො[11]
යථා විමුත්තො අහු තං සුණොම.

1287. අච්ඡෙච්ඡි තණ්හං ඉධ නාමරූපෙ (ඉති භගවා)
තණ්හාය සොතං දීඝරත්තානුසයිතං
අතාරි ජාතිං මරණං[12] අසෙසං
ඉච්චබ්‍රවී භගවා පඤ්චසෙට්ඨො.

1288. එස සුත්වා පසීදමි වචො තෙ ඉසිසත්තම
අමොඝං කිර මෙ පුට්ඨං න මං වඤ්චයි බ්‍රාහ්මණො.

1289. යථාවාදී තථාකාරී අහු බුද්ධස්ස සාවකො
අච්ඡෙච්ඡි මච්චුනො ජාලං තතං මායාවිනො දළ්හං.

1. ධීර - ස්‍යා, PTS 2. පරිසාය - ස්‍යා, PTS.
3. ධොතං - සීමු 1, 2 ප 4. වදෙස්සාමි - PTS 5. හොති - සීමු, 1, 2 ප.
6. සමුජ්ජපඤ්ඤස්ස - ස්‍යා, PTS 7. පරොපරං - සීමු 1, ප
8. ජානමනොමවිරිය - PTS 9. සුතස්සවස්සාතිපි පාළි. 10. යදත්ථියං - PTS.
11. නිබ්බායි සො අනුපාදිසෙසො - සීමු 1, 2 නිබ්බයි සො අනුපාදිසෙසො - මජසං
12. ජාතිමරණං - PTS.

1281. පණ්ඩිත පුරුෂයෝ නැණපහන් කරන්නාහු වෙත්, එහෙයින් වීරයන් වහන්ස, මම ඔබ එසේ මැ හඟිමි (සියලු ධර්මයන්) වෙසෙසින් දක්නාසුලු නැණැත්තහු වෙත දන්නහු වෙත එළැඹියම්හ. පිරිස් මැද අපට 'නිග්‍රොධකප්ප' හෙළි කළ මැනවි.

1282. භාග්‍යවතුන් වහන්ස, මනහර වූ වදන් නො ලස් වැ උසුරුවනු මැනැවි, කඳට නගා පියා සලා (තුටු පහටු වැ කූජනය කරන) හංසයකු සෙයින් මොනොවට විකල්පනය කරනලද බිඳුසවරයෙන් යුතු වැ සෙමින් වදහළ මැනැවි, (අපි) සියලු දෙනා මැ එකඟසිත් ඇති වැ අසම්හ.

1283. නිරවශේෂ කොට ප්‍රහාණය කළ ජාතිමරණ ඇති කම්පා කරන ලද පව් ඇති බුදුන් ලවා ඇවිටිලි කොට දහම් දෙසවමි. කාමකාරයෙක් (කැමැත්තක් කරනු හැකියාවක්) පුහුදුන්හට නැත. විමසා කිරීම මැ තථාගතයන්ට ඇත්තේ යි.

1284. (භාග්‍යවතුන් වහන්ස,) ඍජු ප්‍රඥනයට මුඹ වහන්සේගේ මේ පරිපූර්ණ විසර්ජනය මා විසින් මැනැවින් උගන්නා ලද්දේ යැ, මේ පශ්චිම අඤ්ජලිය මොනොවට බඳනාලද්දේ යැ, මහාප්‍රාඥයන් වහන්ස, කප්පගේ ගතිය (දන්නා සේක් එය නො දෙසීමෙන්) නහමක් මුලා කරන සේක්වා.

1285. මහාවීරයාණෙනි, පරාවර (ලෞකික ලෝකෝත්තර විසින් සුන්දරාසුන්දර) වූ සිව්සස් දහම් අවබෝධ කොට (දතයුතු) සියල්ල දත්තා සේක් නො දෙසීමෙන් මුලා නො කළ මැනවැ. ඝර්මකාලයෙහි ග්‍රීෂ්මයෙන් තැවුණකු ජලය මෙන් දේශනය කැමැත්තෙමි, (එහෙයින් මැ) ශ්‍රැතය (ශබ්දායතනය) වගුල මැනවි (වදාළ මැනවැ සි යේ යි)

1286. පූජ්‍ය 'කප්ප' තෙමේ යමක් සඳහා සත්පුරුෂයන්ගේ නොසිස් වූ බඹසර හසළේ නම් කිම, හෙතෙම අනුපාදිශෙෂයෙන් පිරිනිවියේ ද? විමුක්තයකු සෙයින් වී ද? එය අසම්හ.

1287 මේ ලෝකයෙහි නාමරූප විෂයයෙහි වූ තෘෂ්ණාව සිඳලූයේ යැ, දිගුකලක් මුළුල්ලෙහි අනුශය වූ තෘෂ්ණාශ්‍රොතස තරණය කළේ යැ. ජාතිමරණ දෙක නිරවශෙෂ කොට තරණය කරවී ය යි (පසස් ඇති හෙයින්) පඤ්ච ශ්‍රේෂ්ඨ වූ භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

1288. ඍෂිසප්තමයන් වහන්ස, මුඹ වහන්සේගේ තෙල වදන් අසා පහදිමි. මා විසින් විචාරනලද්ද නො සිස් යැ, බ්‍රාහ්මණ තෙමේ (භාග්‍යවතුන් වහන්සේ) මා නො රැවටී.

1289. බුද්ධශ්‍රාවක තෙමේ යථාවාදී තථාකාරී විය, මායාවී මරහුගේ (ත්‍රෛභූමක වර්තයෙහි) පතළා වූ දැඩි වූ (තෘෂ්ණා) ජාලය සින්දේ යැ.

1290. අද්දස භගවා ආදිං උපාදානස්ස කප්පියො
අච්චගා වත කප්පානො[1] මච්චුධෙය්‍යං සුදුත්තරං

1291. තං දෙවදෙවං වන්දාමි පුත්තං තෙ ද්විපදුත්තම
අනුජාතං මහාවීරං නාගං නාගස්ස ඔරස'න්ති

ඉත්ථං සුදං ආයස්මා වඞ්ගීසො ථෙරො ගාථායො අභාසිත්ථා'ති.

වඞ්ගීසත්ථෙරගාථා.

තස්සුද්දානං:

සත්තතිම්හි නිපාතම්හි වඞ්ගීසො පටිභාණවා
එකො'ව ථෙරො නත්ථඤ්ඤො ගාථායො එකසත්තතී'ති.

## මහානිපාතො නිට්ඨිතො.

තස්සුද්දානං:

සහස්සං හොන්ති තා ගාථා එක නවුතිද්වෙසතානි ච
ථෙරා ච ද්වෙ සතා සට්ඨි චත්තාරො ච පකාසිතා.
සීහනාදං නදිත්වාන බුද්ධපුත්තා අනාසවා
ඛෙමන්තං පාපුණිත්වාන අග්ගික්ඛන්ධා'ව නිබ්බුතා'ති.

## ථෙරගාථාපාළි නිට්ඨිතා.

1 කප්පායනො - සයා

1290. භාග්‍යවතුන් වහන්සේ උපාදානයා (වජීයා) ගේ මූල කාරණය දුටහ. 'කප්ප' තෙමේ තරණයට අති දුෂ්කර වූ ත්‍රෛභූමක වජීය එකාන්තයෙන් ඉක්මගියේ යි.

1291. ද්විපදෙත්තමයන් වහන්ස! දෙවියනට දෙව් වූ නුඹ වහන්සේ වඳිමි. (යළි) බුද්ධනාග වූ නුඹ වහන්සේගේ අනුජාතපුත්‍ර වූ ඖරසපුත්‍ර වූ මහාවීර වූ (නිග්‍රොධකප්ප නම්) නාගයා වඳිමි.

මෙසේ ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරයන් වහන්සේ ගාථා වදාළහ.

වඞ්ගීස ස්ථවිර ගාථා යි.

උද්දානය:

සැත්තෑ වැනි නිපාතයෙහි ප්‍රතිභානවත් එක් මැ වඞ්ගීස ස්ථවිරයන් වහන්සේ යැ, අනෙකෙක් නැති. ගාථා ද එක් සැත්තෑවකි.

## මහානිපාතය නිමි.

ඒ ගාථාවෝ එක්දහස් දෙසියඑක්අනූවක් වෙති, තෙරවරු ද දෙසිය සිව්සැටක් වෙති ප්‍රකාශ කරනලදහ.

නිරාස්‍රව වූ බුද්ධපුත්‍රයෝ සිංහනාද කොට නිවනට පැමිණ ගිනිකඳු මෙන් පිරිනිවියහ.

## ථේරගාථා නිමි.

# ථෙරගාථාපාළි

## අනුක්කමණිකා

I ගාථාදිපාදානුක්කමණිකා

II සඤ්ඤානාමානුක්කමණිකා

III විසෙසපදානුක්කමණිකා

# I

# ගාථාදිපාදානුක්කමණිකා

ගාථඞ්කං

අ


අක්කොධනො'නුපනාහී 502, 503, 504, 505, 506
අක්කොධස්ස කුතො කොධො 442
අගාරවො ච කාසාවෙ 966
අඞ්ගාරිනො දානි දුමා භදන්තෙ 527
අච්චයන්ති අහොරත්තා 145
අච්චාරද්ධම්හි විරියම්හි 638
අච්ඡෙච්ඡි තණ්හං ඉධ නාමරූපෙ 1287
අච්ඡෙරං වත බුද්ධානං 1090
අච්ඡොදිකා පුථුසිලා 113, 601, 1076
අවිතක්කං සමාපන්නො 650
අජ්ජ පණ්ණරසෙ විසුද්ධියා 1246
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච 337, 439
අජ්ඣත්තඤ්ච න ජානාති 470, 471, 472
අජ්ඣත්තං මෙ සමුට්ඨාය 755
අජ්ඣායකො'පි චෙ අස්ස 1182
අජරං ජීරමානෙන 32
අජෙගුච්ඡං විමුත්තෙහි 961
අඤ්ජනීව නවා චිත්තා 773, 1023, 1166
අඤ්ඤාමි තං න මුඤ්චාමි 750
අඤ්ඤථා ලොකනාථම්හි 921
අඤ්ඤස්ස භගවා බුද්ධො 995
අඤ්ඤාණමූලභෙදාය 418
අඤ්ඤාතමානිනො ධම්මෙ 953
අට්ඨපාදකතා කෙසා 772, 1022, 1165
අට්ඨසට්ඨි සිතා සවිතක්කා 1228
අට්ඨිකඞ්කාලකුටිකෙ 1155
අට්ඨිසඞ්ඝාටඝටිතො 570
අඩ්ඪා දලිද්දා ච ඵුසන්ති ඵස්සං 783
අත්ථඤ්ච යො ජානාති භාසිතස්ස 374
අත්ථස්සා'යං විඤ්ඤාපනී 703
අත්ථාය වත මෙ බුද්ධො 340
අතිමානො ච ඔමානො 428
අතිසීතං අතිඋණ්හං 231
අතිහිතා වීහි ඛලගතා සාලී 381
අථද්දසාසිං සම්බුද්ධං 622, 912
අථ පාපානි කම්මානි 146


| හීයමානමහි | 48 |
| හුරං | 6 |
| හුරාහුරං | 122 |
| හුවා | 176 |
| හෙමන්තසීතකාලරත්තියො | 78 |

බුද්ධජයන්තිත්‍රිපිටකග්‍රන්ථමාලා: 31-2

සූත්‍රාන්තපිටකයෙහි

23 වන ග්‍රන්ථය

# ථෙරීගාථාපාළි

## ඛුද්දකනිකාය

නවවැනි භාගය

---

ලංකා බෞද්ධ මණ්ඩලයේ ආරාධනයෙන්

මාකඩවර විහාරාධිවාසී
පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන්
වහන්සේ විසින් කරන ලද

සිංහල පරිවර්තනයෙන් යුක්ත යි.

---

බු. ව. 2557
ක්‍රි. ව. 2013

ඛුද්දකනිකායෙ

# ථෙරීගාථාපාළි

ඛුද්දකනිකායෙහි

# ථෙරීගාථා

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො"

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුනේ නො බබලයි."

(අඞ්ගුත්තරනිකාය - තිකනිපාතය - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය )

# පටුන

## CONTENTS


| | |
|---|---|
| සංස්කාරක නිවේදනය ... ... ... | VII |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය ... ... ... | IX |
| සඥාපනය ... ... ... ... | XI |
| පාළිහෝඩිය — PALI ALPHABET ... ... ... | XV |
| සංක්ෂිප්ත නිරූපණය — ABBREVIATIONS ... ... | XVII |
| විෂයසූචි ... ... ... ... .. | IXX |
| පෙළ හා පරිවර්තනය .. ... ... .. | 2 111 |
| ගාථාදිපාදනුක්කමණිකා ... ... ... | 115 |
| සඤ්ඤානාමානුක්කමණිකා ... ... ... | 121 |
| විසෙසපදනුක්කමණිකා ... ... .. | 123 |

# සංස්කාරක නිවේදනය

ඛුද්දකනිකායෙහි නවවැනි භාගය වූ ‘ථෙරීගාථාපාළිය’ සූත්‍රාන්තපිටකයෙහි තෙවිසි වන ග්‍රන්ථය ද බුද්ධජයන්තිත්‍රිපිටකග්‍රන්ථමාලායෙහි එකුන්තිස් වැනි ග්‍රන්ථය ද වශයෙන් මෙසේ මුද්‍රණයෙන් නිකුත් වෙයි. මෙය ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි වෙන මැ ග්‍රන්ථයක් වුව ද ප්‍රමාණයෙන් කුඩා වන බැවින් ථෙරගාථාපාළිය හා සමග එක් කොට මුද්‍රණය කරවීමට තීරණය කළම්හ. ථෙරගාථා මුද්‍රණාවස්ථායෙහි මැ ථෙරීගාථා පරිවර්තනය ද කොට මෙසේ පාඨකයා හමුයෙහි තබන්නට සිදුවිය. මෙහි ලා ස්වායත්තකාර්‍ය්‍ය සාධනයෙන් පර්‍ය්‍යාප්ති ශාසනාභිවෘද්ධිය පිණිස ක්‍රියා කළ රජයේ සංස්කෘතික දෙපාර්තමේන්තුවේ අධිකාරීහු ද ස්වදේශීය මුද්‍රණාලයේ කාර්‍ය්‍යමණ්ඩලය ද මෙයින් ජනිත කුශලයෙන් නිදුක් වෙත්වා යි ආශංසනය කරම්හ.

ලබුගම ලඞ්කානන්ද ස්ථවිර
ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලයේ
ප්‍රධාන සම්පාදක.

1972 මැයි 27 වැනි දින
ත්‍රිපිටක කාර්‍යාලයේ දී ය.
මහා නායක වාරිකාරාමය.
කොළඹ 7.

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

එක්සත් අමරපුරමහානිකායේ සභාපති අග්ගමහාපණ්ඩිත බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

අහංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති පණ්ඩිත කෝදාගොඩ ශ්‍රී ඥානාලෝක දක්ෂිණලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය්‍ය පණ්ඩිත ලබුගම ලඞ්කානන්ද - කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභාවේ අනුනායක ස්ථවිරයන් වහන්සේ.

දෙමටගොඩ ධර්මදූතාශ්‍රම විද්‍යාලයාධිපති පණ්ඩිත පරවාහැර පඤ්ඤානන්ද ( බී. ඒ. ලන්ඩන් ) කොළඹ නවකෝරළයේ ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ-මාකඩවර විහාරාධිවාසී පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

බෞද්ධාලෝක මාවතේ බෞද්ධාලෝක විහාරාධිපති පණ්ඩිත දෙරගමුවේ ධම්මපාල කොළඹ පලාතේ ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

# සංඥාපනය

---

අප මහසත්හු දිවකුරු බුදුරදුන් හමියෙහි බුදු බවට නියතවිවරණ ලබා චතුරසඞ්ඛ්‍යකල්පලක්‍ෂයක් මුළුල්ලෙහි පාරමිධර්ම පූරණය කොට පශ්චිමාත්මභාවයෙහි තුසීපුරයෙන් සැව දඹදිව කිඹුල්වත්පුර සුදොවුන් මහරජාණන් නිසා මහාමායා දේවින් කුස පිළිසිඳගෙන කලියුග වර්ෂයෙන් දෙවාදහස් සාරසිය අටසැත්තෑ (2478) වැන්නෙහි වෙසග මැදි පොහෝ දවස් ලුම්බිනී සල්උයනෙහි මඟුල්සල්සෙවණෙහි බිහි වැ සිදුහත් නම් ලබා කුමාර සැපයෙන් වැඩී හැම සිප්සතර ගෙවා දූනෑ ගිහිසැපත් වළඳා එකුන්තිස් වැනි වියෙහි අගමෙහෙසුන් යශෝධරා දේවින් කුසින් රහල් කුමරුන් බිහි වූ ඇසල මැදිපොහෝ දවස් මධ්‍යමරාත්‍රියෙහි 'ඡන්න' ඇමැතියන් හා සමග 'කන්ථක' නම් මඟුලසුන් අරා මහබිනික්මන් කොට 'අනෝමා' නම් නදීතීරයෙහි දී තවුස් පැවිදි වූහ.

**බුද්ධත්වය:** සිදුහත් තවුසාණෝ අනුක්‍රමයෙන් රජගහනුවර වැඩ මගධේශ්වර බිම්බිසාර මහරජාණන් විසින් රාජ්‍යයෙන් කළ නිමන්ත්‍රණ ද පිළිකෙව් කොට 'කිංකුසලගවේෂී වැ ඇවිදිමින් ආළාරකාලාම තවුසාණන් කෙරෙහි සප්තසමාපත්ති උපයා උද්දකරාමපුත්‍ර තවුසාණන් කෙරෙහි අෂ්ටම සමාපත්තිය උපයාගෙන එහි දු මෝක්‍ෂය නො දැක උරුවෙල්-දනව් වැඩ සාවුරුද්දක් දුෂ්කර තපස් කොට එ ද තුවජ බැවින් හැරපියා යළිදු කය සනපාගෙන වෙසග මැදිපොහෝ දවස් සෙනානී ගම 'සුජාතා' නම් සිටුදුව දුන් කිරිපිඬු පිළිගෙන 'නේරඤ්ජරා' නදී තීරයෙහි දී වළඳා සවස් වේලෙහි ගයායෙහි ඇසතු බෝරුක් මුලට එළැඹැ 'සොත්ථිය' බමුණු දුන් හිතණ අතුරා ඊ මත්තෙහි වැඩහිඳ ආනාපානසති වඩා ධ්‍යාන උපයා පෙරයමැ පෙර විසූ කඳ පිළිවෙළ සිහි කොට මැදුම්යමැ දිවැස පිරිසුදු කොට පැසුළුයමැ ප්‍රතීත්‍යසමුත්පාදයෙහි නුවණ බහා අනුලොම-ප්‍රතිලොම විසින් ප්‍රත්‍යයාකාර සම්මර්ශන කෙරෙමින් විදර්ශනා වඩා සම්‍යක්-සම්බෝධිය සමධිගම කළහ.

**මහණ සස්න.** බුදුහු පලසමවත් සුව විඳුමින් සත්සති ගෙවා රාජායතනමූලයෙහි දී 'තපුස්ස භල්ලික' වෙළෙඳ දෙබෑයන් පිළිගැන්වූ අත්සුණු හා මීපිඬු වළඳා අජපාලමූලයෙහි දී බ්‍රහ්මාරාධනා පිළිගෙන අටළොස් යොදුන් මග ගෙවා ඇසල මැදි පොහෝ දවස් බරණැස ඉසි-පතනයට වැඩ පස්වග මහණුනට ධම්සක් පවත්වා 'අඤ්ඤාකොණ්ඩඤ්ඤ' තෙරුන් සෝවන්පෙළෙහි පිහිටුවා නික්මිනියැ අවපෑළවිය දවස් 'භද්දිය' තෙරුනුදු දියවක් දවස් 'වප්ප' තෙරුනුදු තියවක් දවස් 'මහානාම' තෙරු-නුදු ජලවක් දවස් 'අස්සජි' තෙරුනුදු සෝවන්පෙළෙහි පිහිටුවා විසේනි දවස් 'අනාත්මලක්‍ෂණ' සූත්‍රදෙශනායෙන් පස්දෙනා වහන්සේ මැ අර්හත්වයට පත් කොට 'එහිභික්‍ෂු' පැවිදි දී සසුන් පිහිටුවා ඉසිපතනෙහි දී මැ බරණැස් සිටුපුත් 'යස' ප්‍රමුඛ පස්පනස් පුරුෂයන් ද 'කප්පාසික' වනලැහැබෙහි දී 'භද්දවග්ගිය' කුමරුන් තිස් දෙනා ද ගයාශීර්ෂයෙහි අතළගල්හි දහසක් පුරාණජටිලයන් ද රහත්බැව්හි පිහිටුවා 'එහිභික්‍ෂු' පැවිදි දී රජගහනුවර වැඩ මගධේශ්වර බිම්බිසාර ප්‍රමුඛ එකොළොස්නුහුවක් දෙනා සෝවන් පෙළෙහි පිහිටුවා වේළුවන විහාරය පිළිගෙන වැඩවසනසේක් පිරිස් සමග තමන් වහන්සේ කරා පැමිණි සැරියුත්-මුගලන් දෙනම අග්‍රඵලයට පමුණුවා

අගසව් තන්හි තබා කාළුදායි තෙරුන්ගේ අයදුමින් කිඹුල්වත්පුර වැඩ යමාමහපෙළහර පෑ නෑයන්ගේ මත් බිඳ පියරජු අනාගාමි ඵලෙහි ද ප්‍රජාපතීගෝතමිය සෝවාන් ඵලෙහි ද පිහිටුවා මල්බෑ නන්දකුමරු ද පුත්‍ර රාහුලකුමරු ද පැවිදි කරවා පෙරළා රජගහනුවරට වැඩිසේක.

**මෙහෙණසස්න:** මෑතභාගයෙහි විශාලා මහනුවර කූටාගාරශාලායෙහි වැඩවසන සමයෙහි සුදොවුන් මහරජු සේසත්යට රහත් වැ පිරිනිවි කල්හි ප්‍රජාපතීගෝතමීහු පැවිදි වනු රිසි වැ 'රෝහිණී' නදීතීරයෙහි දී 'කලහවිවාද' සූත්‍රාන්ත දේශනා අසා පැවිදි වූ පන්සියක් කුමරුන්ගේ පාදපරිචාරිකාවන් පන්සිය ද කැටි වැ ගෙන තුමූ නැගැවියකු ලවා කෙහෙ සිඳුවාගෙන කහවත් හැඳැපෙරෙවැ විශාලා මහනුවර කූටාගාරශාලාවට පැමිණ අනද තෙරණුවන් ලවා බුදුරදුන් අයදවා අෂ්ටගුරුධම් පිළිගෙන බුදුරදුන් කෙරෙහි පැවිදිඋපසපු ලදහ. සෙසු පන්සියක් කුමරියෝ ද භික්ෂු-සඞ්ඝයා කෙරෙහි පැවිදිඋපසම්පත් ලදහ. ප්‍රජාපතීගෝතමීහු බුදුන් කෙරෙහි දහම් අසා කමටහන් වඩා රහත් වූහ. සෙසු පන්සියක් භික්ෂුණීහු 'නන්දකෝවාද' සූත්‍රාන්ත අසා රහත් වූහ.

**ථෙරීගාථා:** මෙසේ මෙහෙණසස්න පිහිටි කල්හි ඒ ඒ ගම්නියම්ගම් රජදහන්හි නොයෙක් සියදහස් ගණන් කුලකුමරියෝ තුනුරුවන් ගුණ අසා පැහැදැ පැවිදි වැ පිළිවෙත් පුරා රහත් වූහ. ඔහු අධිගත ඵලවිශේෂයන් සිහි කොට උපන් ප්‍රීතිසෞමනස්‍යයෙන් උදානාදි වශයෙන් ගාථා වදාළහ. ඔවුනතුරෙහි 'ථෙරිකා' ආදි කොට 'සුමේධා' තෙක් රහත් මෙහෙණන් විසින් භාෂිත ගාථා එක්රැස් කොට එකකනිපාතාදි වශයෙන් විභාග කොට 'ථෙරීගාථා' නමින් ගෙන සඞ්ගීතිකාරක මහතෙරවරු සඞ්ගීතියට නගාලූහ.

එහි එකකනිපාතය පටන් නවකනිපාතය තෙක් පිළිවෙළින් ගාථා සඞ්ග්‍රහ ඇත. ඉක්බිති එකාදසක, ද්වාදසක, සොළසක, වීසති, තිංසති, චත්තාලීස නිපාත ද, මහානිපාතය ද'යි සියලු නිපාත සොළසෙක් වෙයි. එකකනිපාතයෙහි ගාථා අටළොසෙක, දුකනිපාතයෙහි ගාථාසඞ්ග්‍රහ දසයෙක, තිකනිපාතයෙහි අටෙක, චතුක්කනිපාතයෙහි එකෙක, පඤ්චක නිපාතයෙහි දොළසෙක, ඡක්කනිපාතයෙහි අටෙක, සත්තකනිපාතයෙහි තුනෙක, අට්ඨක, නවක, එකාදසක, ද්වාදසක, සොළසක නිපාතයන්හි එකි එකි ගාථාසඞ්ග්‍රහයෙක, වීසති නිපාතයෙහි ගාථාසඞ්ග්‍රහ පසෙක, තිංසති, චත්තාලීස, මහානිපාතයන්හි එකි එකි ගාථාසඞ්ග්‍රහයෙකි. මෙසේ ථෙරීගාථායෙහි සියලු ගාථාසඞ්ග්‍රහ තෙසැත්තෑවකි. පඤ්චකනිපාතයෙහි එකොළොස් වන ගාථාසඞ්ග්‍රහය ත්‍රිවිද්‍යාප්‍රාප්ත තෙරණියන් තිස් දෙනකුන්ගේ භාෂිතයෙකි. ඡක්කනිපාතයෙහි පලමු වන ගාථාසඞ්ග්‍රහය පන්සියක් තෙරණියන්ගේ භාෂිතයෙකි. මෙසේ බලත් මැ ගාථාසඞ්ග්‍රහයන්ගේ සඞ්ඛ්‍යාව තෙසැත්තෑවක් වුව ද තෙරණියෝ සසියදෙනෙක් මෙහි ඇතුළු වැ සිටිති. ඒ බව අට්ඨකථායෙහි දු 'ඡසතමත්තා ථෙරියො'යි දක්වනලද්දේ යැ. ගාථා ද සසියක් පමණ ඇතැයි අට්ඨකථායෙහි සඳහන් වතුදු ථෙරීගාථා පාළියෙහි විද්‍යමාන ගාථා සඞ්ඛ්‍යාව පන්සිය විසිඑකෙකි. ථෙරීගාථාවසාන උද්දානයෙහි සඳහන් සඞ්ඛ්‍යා පෙළ සමග හෝ අටුවා සමග හෝ නොසැසැඳෙ යි. එහි දක්වෙනුයේ ගාථා සාරසියසුවානූවක් ද තෙරණියන් එක්සිය එක් දෙනකුන් ද ඇති බව යි.

**බුද්ධකාලීන වනිතාව:** බුද්ධකාලීන භාරතීය වනිතාවන්ගේ තතු විමසනුවනට ථෙරීගාථාපාළිය අගනා නිධානයෙකි. ඔහු එදා බ්‍රාහමණ ධර්මයෙන් මිරිකී නිවසෙහි මැ සිර වී සිටියහ. වේදය ඉගෙනීමට හෝ දෙවොලකට පිවිසීමට හෝ යාගහොම ආදී ආගමික ක්‍රියාවන්ට සම්බන්ධ වීමට හෝ ඔවුනට අවසර නො ලැබිණ. හිමියා මළ කල්හි අන් හිමියකුගේ සරණ ලබාගැනීමට ද බිරිඳට අවසරයෙක් නො වී යැ. ඇය විසින් කළයුතු කාර්‍ය්‍ය දෙකෙක: හිමියා දවන චිතකයට පැන සතීපූජායෙන් දිවි නසාගෙන පරලොව්හි දී ඔහු හා එක්වීම හෝ දිවිහිම් කොට අන් පුරුෂයකු නො සිතා මළ හිමියා කෙරෙහි මැ සිත පිහිටුවා පතිව්‍රතය රැකැ පරලොව්හි දී ඔහු හා එක්වීම හෝ යි. මෙසේ අනාථ වැ සිටි භාරත වනිතාව බුදුදහමෙහි පිහිට ලැබැ නැගීසිටි අයුරු ථෙරීගාථායෙන් අනාවරණය වෙයි. බුදුසමය පැතිරගිය තාක් භාරතභූමියෙහි නොයෙක් විජිතයෙන් පැමිණ පැවිදි වැ රහත් වූ මෙහෙණහු ථෙරීගාථායෙහි හමු වෙති. ඔවුනතුරෙහි රජමෙහෙසියෝ ද මහසල්කුලෙහි බැමිණියෝ ද සිටුදියැණියෝ ද ශූද්‍රස්ත්‍රීහු ද වෙති. එ මතු නො වැ ගණිකාවෘත්තිය ජීවනොපාය කොටගත් අභිරූපිකාවෝ ද සත්ත්වඝාතනය ජීවනොපාය කොටගත් වැදිඅඟනෝ ද එ හැම හැරපියා අවුත් පැවිදි වැ රහත් වූහ.

මහාප්‍රජාපතීගොතමීන් හා සමග ශාක්‍ය කුමරියෝ පන්සියක් දෙනා පැවිද්දට වන්හ 'උබ්බිරී' කොසොල් මහරජුගේ මෙහෙසියකි. **'ඛෙමා'**වෝ මද්‍රවරට රජුගේ දියණියෝ යැ, මගධයේ බිම්සර මහරජුගේ අගමෙහෙසි යැ. **'සෙලා'**වෝ අලවීරට රජුගේ දියැණියෝ යැ. **'සුමෙධා'**වෝ මන්තාවතී නුවර **'කොඤ්ච'** රජුගේ දියැණියෝ යැ, වාරණවතී නුවර **'අණීකදත්ත'** කුමරුට විවාහ කොට දෙනලද්දහු පතිකුලයට නො ගොස් පැවිදි වූහ. **'සාමා'** කොසඹෑහි 'උදෙන' රජුගේ මෙහෙසි සාමාවතියගේ යෙහෙළියකි. **'සෝමා'**වෝ මගධයේ බිම්සර රජහුගේ පුරෝහිත බ්‍රාහමණයාගේ දියැණියෝ යැ. **'භද්‍රකාපිලානී'** මද්‍රවරට සාගල නුවර කෞශිකගොත්‍රයෙහි බ්‍රාහමණයකුගේ දියැණියෝ යැ, මහසුප් මහතෙරණුවන්ගේ පුරාණදුතියිකාවෝ යි. **'මිත්තාකාළිකා'** හා **'නන්දුත්තරා'** හා දෙදෙන කුරුරට කල්මාෂදම්‍ය නිගමයෙහි බ්‍රාහමණවංශ ඇතියෝ යැ. **'රෝහිණී'** වජ්ජිරට වෛශාලියෙහි ආඪ්‍යකුලයෙක බමුණුදුවකි. **'ජීවකම්බවනිකසුභා'** රජගහනුවර මහසල් කුලයෙක බමුණුදුවකි. **'චාලා'** **'උපචාලා'** **'සිසූපචාලා'** තිදෙන **'නාලක'** ගම රූපසාරී බැමිණියගේ දියැණියෝ යැ, **'සැරියුත්'** මහතෙරණුවන්ගේ නැගැණියෝ යි. **'සීහා'**වෝ වෛශාලියෙහි **'සීහ'** සෙනාපතිහුගේ නැගැණියන්ගේ දියැණියෝ යැ. **'ඉසිදාසී'** අවන්තියේ උදේනි නුවර ආඪ්‍යකුලයෙක සිටුදුවකි. **'උප්පලවණ්ණා'** කොසොල් රට සැවැත්නුවර සිටුදුවකි. **'වඩ්ඪමාතා'** භරුකච්ඡ නගරයෙහි කුලදුවකි. **'අඩ්ඪකාසී'** කාසිනගරයෙහි නගරශොභිනියකි, ඇය හා දිනක සහවාසයට සුංවන් කහවණු දහසෙකි. **'අභයමාතා'** (පදුමවතී) අවන්ති රට උදේනීපුර නගරශොභිනියකි, බිම්සර රජහුගේ දරු අභයරාජකුමර ඇයගේ පුතෙකි. **'අම්බපාලි'** වජ්ජි රට විශාලායෙහි නගරශොභිනියකි, මගධයේ බිම්සර මහරජ ද වෙස්වලා ඇය කරා ගියේ යැ. **'විමලා'** වෛශාලියෙහි සිටි ප්‍රසිද්ධ රූපූපජීවිනියකි, වරෙක මහමුගලන් තෙරණුවනුදු කාමයෙන් පොලොබාගන්නට තැත් කළ ඕ උන් වහන්සේගේ ඔවා අසා සංවිග්න වැ පැවිදි වැ රහත් වූ යැ. **'සුභා'** රජගහ නුවර ලෝකුරු දුවකි. **'පුණ්ණා'** සැවැත්නුවර අනේපිඬු සිටුහුගේ ගෘහ දසියකි, උදකසුද්ධික බමුණකු දමනය කොට තුනුරුවන් කෙරෙහි පහදවාලූ

ඇය කෙරෙහි ප්‍රසාදයට පත් සිටුතුමා විසින් නිදස් කරනු ලැබැ පැවිදි වැ රහත් වූ යැ. 'චාපා' වැදිදුවකි, 'උපක' ආජීවකයන්ගේ දුතියිකාව යැ, උපක සස්නෙහි පැවිදි වූ පසු 'චාපා' ද පැවිදි වැ රහත් වූ.

ළදරු පුතුගෙන් ද දුවගෙන් ද වියෝ වූ මවක් ඔවුනොවුන් නො හැඳින කලක් දියණියත් හා සමග සිය පුතුගේ මැ සපත්නී භාර්‍යා වැ වැසූ කරුණු අනාවරණය වූ පසු සංවේගයට පැමිණ පැවිදි වූ අපූරු උප්පලවණ්ණා තෙරණින් හමුයෙහි ප්‍රකාශ කළ සැටි උප්පලවණ්ණා ථෙරීගාථායෙන් අනාවරණය වෙයි.

උදේනීපුර ආඪ්‍ය සිටුකුලයෙක එක් මැ දියණියක් ගිය ගිය පතිකුලයෙන් නෙරනු ලැබ ගෙදෙරට සිඟා ආ යදියකුට විවාහ කොට දුන් සැටිත් ඔහු ද කිහිප දවසක් වැස ඇය හැරපියා සිඟමනට බැහැගිය සැටිත් 'ඉසිදාසී' ථෙරීගාථායෙන් අනාවරණය වෙයි.

'ජීවකම්බවනික සුභා' තෙරණියන් කාමයෙන් පොළොඹාගන්නට ධූර්තයකු කළ වැනුම රසබර කවිවිතනතාවකි. සුභා තෙරණියෝ ඔහුගේ වශයට හේතු වූ ඇස උපුටා ඔහු අත තැබූ අපූරු පහන්සංවේග දනවයි.

'අම්බපාලි' තෙරණියන් තමන්ගේ යොවුන්වියත් මහලුවියත් සංසන්දනා කෙරෙමින් වදාළ අනිත්‍යතාප්‍රතිසංයුක්ත ගාථා මදනිම්මදනයට මහඇඟි ඔසුවක් බඳු යැ. මේ ආදි බුද්ධකාලීන භාරතීය වනිතාවන් පිළිබඳ නොයෙක් අගනා පුවතින් ථෙරීගාථාපාළිය පිරිසිරී.

**පරිවර්තනය**: ථෙරගාථා මුද්‍රණයට පමුණුවන තුරු ථෙරීගාථා පරිවර්තනයට පත් නො වී යැ. වෙන මැ ග්‍රන්ථයක් ලෙස මුද්‍රණයට ප්‍රමාණවත් නො වූ හෙයින් ථෙරීගාථා ද ථෙරගාථා හා සමග එක් කොට මුද්‍රණය කරවීමට තීරණය කරගන්නා ලදී. එයින් ථෙරගාථා මුද්‍රණාවසරයෙහි මැ ථෙරීගාථා පරිවර්තනය ද කළයුතු විය. පරිවර්තනකාර්‍යය ත්‍රිපිටකසම්පාදකමණ්ඩලයෙහි ප්‍රධාන සම්පාදක පණ්ඩිත ලබුගම ලඞ්කානන්ද අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ද සහායසම්පාදක පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිර වන අප ද යන දෙනම විසින් කරනලදි. ශොධන අවස්ථායෙහි ත්‍රිපිටකසම්පාදක-මණ්ඩලයෙහි සභාපති පණ්ඩිත කෝදාගොඩ ඤාණාලෝක නායක ස්වාමීන්ද්‍ර-යන් වහන්සේ ද සහාය වූහ. පාඨශොධනයේ දී එංගලන්තයේ පාළිපොත් සමාගමේ (PTS) මුද්‍රණය හා ද ධම්සේන මුද්‍රණය හා ද හේවාවිතාරණ මුද්‍රණය හා ද මරම්මඡට්ඨසඞ්ගීති මුද්‍රණය හා ද සංසන්දනය කරනලදි. විශෙෂයෙන් කිවයුතු දැය ථෙරගාථා සංඥාපනයෙහි කියනලද වන බැවින් මෙහි වටාලා නො කියම්හ.

මෙයට,

කරහම්පිටිගොඩ සුමනසාර.

බු. ව 2514 / ක්‍රි. ව. 1972 මැයි 27 දින
ත්‍රිපිටක කාර්‍යාලයේ දී යැ.
මහානායක චාරිකාරාමය,
කොළඹ 7.

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS.

### VOWELS

අ a  ආ ā  ඉ i  ඊ ī  උ u  ඌ ū  එ e  ඔ o

### CONSONANTS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa | | | |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña | | | |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa | | | |
| ත ta | ථ tha | ද da | ධ dha | න na | | | |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma | | | |
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං ṃ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ ke | කො ko |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khe | ඛො kho |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ ge | ගො go |

### Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ණ්හ ṇha | ද්ද dda | ම්බ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ ñja | ද්ව dva | ම්හ mha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna | ව්හ vha |
| ඞ්ඛ ṅkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ණ්හ ṇha | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ත tta | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ථ ttha | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | ත්ව tva | ම්ප mpa | |

ා ā  ි i  ී ī  ු u  ූ ū  ෙ e  ො o

# සංකේතනිරූපණය

## ABBREVIATIONS

| | | | |
|---|---|---|---|
| සිමු | 1. | — | ථෙරීගාථා, ධම්මසේන මුද්‍රණය, 1930. |
| සිමු. | 2. | — | ථෙරීගාථා, හේවාවිතාරණ මුද්‍රණය, 1970. |
| මජසං | | — | මරම්මඡට්ඨසඞ්ගීතියෙහි ශෝධිත ථෙරීගාථා. |
| PTS. | | — | Pali Text Society - THĒRĪ GĀTHĀ, 1883. |
| ප | | — | පරමත්ථදීපනී, ථෙරීගාථට්ඨකථා. |
| පු | | — | අට්ඨකථාගතානි - පුරාතනපාඨන්තරානි. |

# ඛුද්දකනිකායෙ ථෙරීගාථාපාළි

# විසයසූචි


| විසයො | | | පිට්ඨඞ්කො |
|---|---|---|---|
| **එකකනිපාතො** | | | **1-8** |
| 1. අඤ්ඤතර ථෙරීගාථා | ... | ... | 2 |
| 2 මුත්තා ථෙරීගාථා | ... | ... | 2 |
| 3. පුණ්ණා ථෙරීගාථා | ... | ... | 2 |
| 4. තිස්සා ථෙරීගාථා | ... | ... | 4 |
| 5. ,, ,, | ... | ... | 4 |
| 6. ධීරා ථෙරීගාථා | ... | ... | 4 |
| 7. වීරා ථෙරීගාථා | ... | ... | 4 |
| 8. මිත්තා ථෙරීගාථා | ... | ... | 4 |
| 9. භද්‍රා ථෙරීගාථා | ... | ... | 6 |
| 10. උපසමා ථෙරීගාථා | ... | ... | 6 |
| 11. මුත්තා ථෙරීගාථා | ... | ... | 6 |
| 12. ධම්මදින්නා ථෙරීගාථා | ... | ... | 6 |
| 13. විසාඛා ථෙරීගාථා | ... | ... | 6 |
| 14. සුමනා ථෙරීගාථා | ... | ... | 6 |
| 15. උත්තරා ථෙරීගාථා | ... | ... | 8 |
| 16. සුමනා වුඩ්ඪපබ්බජිතා ථෙරීගාථා | ... | ... | 8 |
| 17. ධම්මා ථෙරීගාථා | ... | ... | 8 |
| 18. සඞ්ඝා ථෙරීගාථා | ... | ... | 8 |


**එකකනිපාතො නිට්ඨිතො.**


| | | | |
|---|---|---|---|
| **දුකනිපාතො** | | ... | **10-14** |
| 1. අභිරූපනන්දා ථෙරීගාථා | ... | ... | 10 |
| 2. ජෙන්තා ථෙරීගාථා | ... | ... | 10 |
| 3. සුමඞ්ගලමාතා ථෙරීගාථා | ... | ... | 10 |
| 4. අඩ්ඪකාසි ථෙරී ගාථා | ... | ... | 12 |
| 5. චිත්තා ථෙරීගාථා | ... | ... | 12 |
| 6. මෙත්තිකා ථෙරීගාථා | ... | ... | 12 |
| 7. මෙත්තා ථෙරීගාථා | ... | ... | 12 |
| 8. අභයමාතා ථෙරීගාථා | ... | ... | 14 |
| 9. අභයා ථෙරීගාථා | ... | ... | 14 |
| 10. සාමා ථෙරීගාථා | ... | ... | 14 |


**දුකනිපාතො නිට්ඨිතො.**

| | | | |
|---|---|---|---|
| | **තිකනිපාතො** | .. | **16–20** |
| 1. | සාමා ථෙරීගාථා | ... ... | 16 |
| 2. | උත්තමා ථෙරීගාථා | ... ... | 16 |
| 3. | ,, ,, | ... ... | 16 |
| 4. | දන්තිකා ථෙරීගාථා | ... ... | 18 |
| 5. | උබ්බිරි ථෙරීගාථා | ... ... | 18 |
| 6. | සුක්කා ථෙරීගාථා | ... ... | 18 |
| 7. | සෙලා ථෙරීගාථා | ... ... | 20 |
| 8. | සොමා ථෙරීගාථා | ... ... | 20 |

**තිකනිපාතො නිට්ඨිතො.**

| | | | |
|---|---|---|---|
| | **චතුක්කනිපාතො** | ... | **22** |
| 1. | භද්දාකාපිලානී ථෙරීගාථා | ... ... | 22 |

**චතුක්කනිපාතො නිට්ඨිතො.**

| | | | |
|---|---|---|---|
| | **පඤ්චකනිපාතො** | ... | **24-34** |
| 1. | අඤ්ඤතරා ථෙරීගාථා | ... ... | 24 |
| 2. | විමලා ථෙරීගාථා | ... ... | 24 |
| 3. | සීහා ථෙරීගාථා | ... ... | 26 |
| 4. | සුන්දරිනන්දා ථෙරීගාථා | ... ... | 26 |
| 5. | නන්දුත්තරා ථෙරීගාථා | ... ... | 28 |
| 6. | මිත්තාකාලී ථෙරීගාථා | ... ... | 28 |
| 7. | සකුලා ථෙරීගාථා | ... ... | 30 |
| 8. | සොණා ථෙරීගාථා | ... ... | 30 |
| 9. | භද්දාකුණ්ඩලකෙසා ථෙරීගාථා | ... ... | 32 |
| 10. | පටාචාරා ථෙරීගාථා | ... ... | 32 |
| 11. | තිංසමත්තා ථෙරීභික්ඛුනීගාථා | ... ... | 34 |
| 12. | චන්දා ථෙරීගාථා | ... ... | 34 |

**පඤ්චකනිපාතො නිට්ඨිතො.**

| | | | |
|---|---|---|---|
| | **ඡක්කනිපාතො** | ... | **36-42** |
| 1. | පඤ්චසතමත්තානං ථෙරීනං ගාථා | ... ... | 36 |
| 2. | වාසෙට්ඨී ථෙරීගාථා | ... ... | 36 |
| 3. | ඛෙමා ථෙරීගාථා | ... ... | 38 |
| 4. | සුජාතා ථෙරීගාථා | ... ... | 38 |
| 5. | අනොපමා ථෙරීගාථා | ... ... | 40 |
| 6. | අනොපමා ථෙරීගාථා | ... ... | 40 |
| 7. | මහාපජාපති ගොතමී ථෙරීගාථා | ... ... | 40 |
| 8. | ගුත්තා ථෙරීගාථා | ... ... | 42 |
| 9. | විජයා ථෙරීගාථා | ... ... | 42 |

**ඡක්කනිපාතො නිට්ඨිතො.**

සත්තකනිපාතො ... 44–46

1. උත්තරා ථෙරීගාථා ... ... 44
2. චාලා ථෙරීගාථා ... ... 46
3. උපචාලා ථෙරීගාථා ... ... 46

සත්තකනිපාතො නිට්ඨිතො.

අට්ඨකනිපාතො

1. සීසූපචාලා ථෙරීගාථා ... ... 48

අට්ඨකනිපාතො නිට්ඨිතො.

නවකනිපාතො

1. වඩ්ඪමාතා ථෙරීගාථා ... ... 50

නවකනිපාතො නිට්ඨිතො.

එකාදසකනිපාතො

1. කිසාගොතමී ථෙරීගාථා ... ... 52

එකාදසක නිපාතො නිට්ඨිතො.

ද්වාදසනිපාතො

1. උප්පලවණ්ණා ථෙරීගාථා ... ... 54

ද්වාදසකනිපාතො නිට්ඨිතො.

සොළසනිපාතො

1. පුණ්ණාථෙරීගාථා ... ... 56-58

සොළසනිපාතො නිට්ඨිතො.

වීසතිනිපාතො 60–78

1. අම්බපාලී ථෙරීගාථා ... ... 60–62
2. රොහිණී ථෙරීගාථා ... ... 64–66
3. චාපා ථෙරීගාථා ... ... 66–70
4. සුන්දරී ථෙරීගාථා .. ... 70–74
5. සුභාකම්මාරධීතු ගාථා ථෙරී ... ... 74–78

වීසතිනිපාතො නිට්ඨිතො.

තිංසතිනිපාතො

1. ජීවකම්බවනික සුභාථෙරීගාථා ... ... 80–84

තිංසතිනිපාතො නිට්ඨිතො.

චත්තාලීස නිපාතො

1. ඉසිදාසී ථෙරීගාථා ... ... 86-94

චත්තාලීසනිපාතො නිට්ඨිතො.

මහා නිපාතො

1. සුමෙධා ථෙරීගාථා ... ... 96

මහානිපාතො නිට්ඨිතො.

## ඛුද්දකනිකායෙ

# ථෙරීගාථාපාළි

## ඛුද්දකනිකායෙහි

# ථෙරීගාථා

# ඛුද්දකනිකායෙ

# ථෙරීගාථාපාළි

---

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

## එකකනිපාතො

### 1. 1

1. සුඛං සුපාහි ථෙරිකෙ කත්වා චොළෙන පාරුතා,
උපසන්තො හි තෙ රාගො සුක්ඛඩාකං ව කුම්භියන්ති.

ඉත්ථං සුදං අඤ්ඤතරා ථෙරී අපඤ්ඤාතා භික්ඛුනී ගාථං අභාසිත්ථා’ති.

අඤ්ඤතරථෙරීගාථා

### 1. 2

2. මුත්තෙ මුච්චස්සු යොගෙහි චන්දො රාහුග්ගහා ඉව,
විප්පමුත්තෙන චිත්තෙන අනණා භුඤ්ජ පිණ්ඩකන්ති.

ඉත්ථං සුදං භගවා මුත්තං සික්ඛමානං ඉමාය ගාථාය අභිණ්හං ඔවදතී’ති.

මුත්තාථෙරීගාථා

### 1. 3

3. පුණ්ණෙ පූරස්සු ධම්මෙහි චන්දො පණ්ණරසොරිව,[1]
පරිපුණ්ණාය පඤ්ඤාය තමොක්ඛන්ධං[2] පදාලයාති.

ඉත්ථං සුදං පුණ්ණා ථෙරී ගාථං අභාසිත්ථා’ති.

පුණ්ණාථෙරීගාථා.

---

1 පණ්ණරසෙරිව - මජසං,     2 තමොඛන්ධං - මජසං,

# ඛුද්දකනිකාය

# ථෙරීගාථාපාළි

---

## ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා!

# ඒකකනිපාතය

### 1. 1

1. ථෙරිකාවෙනි, පහුල්වතින් සිවුරු කොට හඳනාපොරෝනාලද සිරුරු ඇති වැ සුවසේ වාස කර. ගම්හෙයකින් තොපගේ (සන්තානයෙහි උපදනා) කාමරාගය රත් වූ කුඹුයෙහි (බඳුනෙහි,) ශුෂ්කශාකයක් (වියැළීගිය පලාවක්) සෙයින් අනාගැමි මගින් සන්හිඳුණේ වේ ද එහෙයිනි.

මෙසෙයින් ථෙරිකා නම් එක්තරා අප්‍රකට මෙහෙණක් ගාථාවක් කිවු යැ.

අඤ්ඤතරථේරීගාථා යි.

### 1. 2

2. මුත්තාවෙනි, රාහුග්‍රහයා කෙරෙන් චන්ද්‍රයා සෙයින් කාමාදි සතර යෝගයන් කෙරෙන් මිදෙව. කෙලෙසුන් කෙරෙන් (සමුච්ඡේද-විමුක්තීන්) මොනොවට මිදුණු සිතින් යුක්ත වැ කෙලෙස් ණය හැරපියා රටවැසියාගේ පිඬු (සිව්පසය) වළඳකර.

මෙසෙයින් භාග්‍යවතුන් වහන්සේ මුත්තා නම් සික්ඛමානාවට මේ ගයින් එක්වන් ඔවා දෙනසේක.

මුත්තාථේරීගාථා යි.

### 1. 3

3. පුණ්ණාවෙනි, පණුරැසි සඳ සෙයින් (සත්තිස්බොධිපාක්ෂික) ධම්යෙන් පිරෙව, පිරිපුන් (රහත්මග) නුවණින් මොහොකද බිඳුව.

මෙසෙයින් පුණ්ණා මෙහෙණ ගාථාවක් කිවු යැ.

පුණ්ණාථේරීගාථා යි.

### 1. 4

4. තිස්සෙ සික්ඛස්සු සික්ඛාය මා තං යොගා උපච්චගුං,
සබ්බයොගවිසංයුත්තා චර ලොකෙ අනාසවා'ති.

ඉත්ථං සුදං තිස්සා ථෙරී ගාථං අභාසිත්ථා'ති.

තිස්සාථෙරීගාථා.

### 1. 5

5. තිස්සෙ යුඤ්ජස්සු ධම්මෙහි ඛණො තං මා උපච්චගා,
ඛණාතීතා හි සොචන්ති නිරයම්හි සමප්පිතා'ති.

ඉත්ථං සුදං තිස්සා ථෙරී ගාථං අභාසිත්ථා'ති.

තිස්සාථෙරීගාථා.

### 1. 6

6. ධීරෙ නිරොධං ඵුසොහි[1] සඤ්ඤාවූපසමං සුඛං,
ආරාධයාහි නිබ්බානං යොගක්ඛෙමං අනුත්තරං.[2]

ඉත්ථං සුදං ධීරා ථෙරී ගාථං අභාසිත්ථා'ති.

ධීරාථෙරීගාථා

### 1. 7

7. වීරා වීරෙහි ධම්මෙහි භික්ඛුනී භාවිතින්ද්‍රියා,
ධාරෙහි අන්තිමං දෙහං ජෙත්වා[4] මාරං සවාහිනින්ති.[3]

ඉත්ථං සුදං වීරා ථෙරී ගාථං අභාසිත්ථා'ති.

වීරාථෙරීගාථා.

### 1. 8

8. සද්ධාය පබ්බජිත්වාන මිත්තෙ මිත්තරතා භව,
භාවෙහි කුසලෙ ධම්මෙ යොගක්ඛෙමස්ස පත්තියා'ති

ඉත්ථං සුදං මිත්තා ථෙරී ගාථං අභාසිත්ථා'ති.

මිත්තාථෙරීගාථා

---

1 ඵුසෙහි - මජසං. 2 යොගක්ඛෙම මනුත්තරං - මජසං.
3 සවාහනන්ති - මජසං. 4 ජෙත්වා - සී.

## 1. 4

4. තිස්සාවෙනි, (අධිශීලාදි ත්‍රිවිධ) ශික්ෂායෙහි හික්මෙව, (මනුෂ්‍යත්වය ඉන්ද්‍රිය අවිකලත්වය, බුද්ධොත්පාදය, ශ්‍රද්ධා ප්‍රතිලාභය යන) යොගයෝ - දුර්ලභක්ෂණයෝ තොප නහමක් ඉක්මයෙත්වා නොහොත් කාමාදි චතුර්යොගයෝ තොප නහමක් මඩිත්වා සියලු මැ කාමාදියොගයන් කෙරෙන් මුක්ත වැ (එහෙයින් මැ) ආස්‍රව රහිත වැ ලොවැ හැසිරෙව.

මෙසෙයින් තිස්සා මෙහෙණ ගාථාවක් කිවු යැ.

තිස්සාථෙරීගාථා යි.

## 1. 5

5. තිස්සාවෙනි, (ශමථවිදර්ශනාධර්මයන් හා ආර්යබොධිපාක්ෂිකධර්මය යන) ධර්මයෙන් යුක්ත වව, (ප්‍රතිරූපදෙශ, අවෛකල්‍යෂඩායතන, බුද්ධොත්පාද, ශ්‍රද්ධාප්‍රතිලාභ සඞ්ඛ්‍යාත) ක්ෂණය තොප නහමක් ඉක්මයේවා. යම්හෙයකින් ක්ෂණය පැනගියාහු නිරයෙහි ඉපිද නොවිත් ද, එහෙයිනි.

මෙසෙයින් තිස්සා මෙහෙණ ගාථාවක් කිවු යැ.

තිස්සාථෙරීගාථා යි.

## 1. 6

6. ධීරාවෙනි, ක්ලේශනිරොධය (නිර්වාණය) ස්පර්ශ කරව. කාමාදි ප්‍රපඤ්චයන්ගේ ව්‍යුපශම නිමිත්ත වන යොගක්ෂෙම නම් වූ සුඛාවහ වූ අනුත්තර නිර්වාණය ලබාගනුව.

මෙසෙයින් ධීරා මෙහෙණ ගාථාවක් කිවු යැ.

ධීරාථෙරීගාථා යි.

## 1. 7

7. වීරා මෙහෙණියෙනි, (වීර්‍යප්‍රධාන හෙයින්) වීරධර්ම වූ ආර්යමාර්ග ධර්මයෙන් වැඩූ ශ්‍රද්ධාදි ඉඳුරන් ඇති වැ සේනා සහිත වූ ක්ලේශ මාරයා දිනා අන්තිමදෙහය ධරව.

මෙසෙයින් වීරා මෙහෙණ ගාථාවක් කිවු යැ.

වීරාථෙරීගාථා යි.

## 1. 8

8. මිත්තාවෙනි, සැදැහැයෙන් පැවිදි වැ කල්‍යාණ මිතුරන් කෙරෙහි ඇලුම් ඇති වව. අග්‍රතම නිර්වාණ සඞ්ඛ්‍යාත යෝගක්ෂෙමයාගේ අධිගමය පිණිස ආර්යමාර්ග ධර්මයන් වඩව.

මෙසෙයින් මිත්තා මෙහෙණ ගාථාවක් කිවු යැ.

මිත්තාථෙරීගාථා යි.

### 1. 9

9. සද්ධාය පබ්බජිත්වාන භද්දෙ භද්දරතා භව,
භාවෙහි කුසලෙ ධම්මෙ යොගක්ඛෙමං අනුත්තරන්ති.

ඉත්ථං සුදං භද්දා ථෙරී ගාථං අභාසිත්ථා'ති.

භද්දාථෙරීගාථා

### 1. 10

10. උපසමෙ තරෙ ඔඝං මච්චුධෙය්‍යං සුදුත්තරං,
ධාරෙහි අන්තිමං දෙහං ජෙත්වා[1] මාරං සවාහිනින්ති[2]

ඉත්ථං සුදං උපසමා ථෙරී ගාථං අභාසිත්ථාති.

උපසමාථෙරීගාථා.

### 1. 11

11. සුමුත්තා සාධු මුත්තාම්හි තීහි ඛුජ්ජෙහි මුත්තියා,
උදුක්ඛලෙන මුසලෙන පතිනා ඛුජ්ජකෙන ච,
මුත්තාම්හි ජාතිමරණා භවනෙත්ති සමූහතාති.

ඉත්ථං සුදං මුත්තාථෙරී ගාථං අභාසිත්ථාති.

මුත්තාථෙරීගාථා.

### 1. 12

12. ඡන්දජාතා අවසායී මනසා ච ඵුටා[3] සියා,
කාමෙසු අප්පටිබද්ධචිත්තා උද්ධංසොතාති වුච්චතීති[4]

ඉත්ථං සුදං ධම්මදින්නා ථෙරී ගාථං අභාසිත්ථා'ති.

ධම්මදින්නාථෙරීගාථා.

### 1. 13

13. කරොථ බුද්ධසාසනං යං කත්වා නානුතප්පති,
ඛිප්පං පාදානි ධොවිත්වා එකමන්තෙ නිසීදථාති.

ඉත්ථං සුදං විසාඛාථෙරී ගාථං අභාසිත්ථාති.

විසාඛාථෙරීගාථා.

---

1 ජෙත්වා - සී 2. සවාහනන්ති - මජසං 3. [illegible] - මජසං
4 උද්ධංසොතා විමුච්චතීති - සී

## 1. 9

9. භද්‍රාවෙනි, සැදැහැයෙන් පැවිදි වැ භද්‍ර වූ ශීලාදි ධම්යෙහි ඇලුම් ඇති වච, චතුර්යොගයෙන් ක්ෂෙම වූ නිවනට පැමිණෙනු පිණිස (සප්තත්‍රිංශද්බොධිපාක්ෂික) ධම්යන් වඩව.

මෙසෙයින් භද්‍රා මෙහෙණ ගාථාවක් කිවු යැ.

භද්‍රාථෙරීගාථා යි.

## 1. 10

10. උපසමාවෙනි, කෙලශමාරයාගේ පැවැත්ම ඇති අත්‍යාවයෙන් දුස්තර වූ සංසාරොඝය (ආයසීමාගී නෞකායෙන්) තරණය කර, සෙනා සහිත කෙලෙස් මරහු දිනා (එහෙයින් මැ) අන්තිම ශරීරය ධරව.

මෙසෙයින් උපසමා මෙහෙණ ගාථාවක් කිවු යි.

උපසමාථෙරීගාථා යි.

## 1. 11

11. මොහොවට මිදුණෙම් වෙමි. වෙනෙනුදු මොහොලිනුදු කුදු සැමියා කෙරෙනුදු යන තුන් කුදුයෙන් මිදිමෙන් මෙසේ මොහොවට මිදුණෙම් වෙමි. ජාතිමරණයෙනුදු මිදුණෙම් වෙමි. භවනෙත්ති නම් වූ තෘෂ්ණාව නසන ලදු යැ, එහෙයිනි.

මෙසේ මුත්තා නම් මෙහෙණ ගාථාවක් කිවු යැ

මුත්තාථෙරීගාථා යි.

## 1. 12

12. (අග්‍ර ඵලය පිණිස) උපන් ඡන්දය ඇත්ති මහණුවමහි අවසානය (නිවන) පතන්නී (යට තුන්මග) සිතින් (නිවන) සපයී සලා වෙයි. කාමයෙහි පිළිබැඳි සිත් නැත්ති 'උද්ධංසොතා' යයි කියනු ලැබේ.

මෙසේ ධම්මදින්නා මෙහෙණ ගාථාවක් කිවු යැ.

ධම්මදින්නාථෙරීගාථා යි.

## 1. 13.

13. යම් අනුශාසනයක් කිරීමෙන් හො තැවේ ද බුදුරදුන්ගේ ඒ අනුසසුන් කරව, වහා පා දෙවැ එකත්පසෙක හිඳුව.

මෙසේ විශාඛා මෙහෙණ ගාථාවක් කිවු යැ.

විසාඛාථෙරීගාථා යි.

## 1. 14

14. ධාතුයො දුක්ඛතො දිස්වා මා ජාතිං පුනරාගමි,
භවෙ ඡන්දං විරාජෙත්වා උපසන්තා චරිස්සසීති.

ඉත්ථං සුදං සුමනාථෙරී ගාථං අභාසිත්ථාති.

**සුමනාථෙරීගාථා**

## 1. 15

15. කායෙන සංවුතා ආසිං වාචාය උද චෙතසා,
සමූලං තණ්හං අබ්බුය්හ[1] සීතිභූතම්හි නිබ්බුතාති

ඉත්ථං සුදං උත්තරාථෙරී ගාථං අභාසිත්ථාති.

**උත්තරාථෙරීගාථා.**

## 1. 16

16. සුඛං ත්වං වුඩ්ඪිකෙ සෙහි කත්වා චොළෙන පාරුතා,
උපසන්තො හි තෙ රාගො සීතිභූතාසි නිබ්බුතාති

ඉත්ථං සුදං සුමනා බුඩ්ඪපබ්බජිතා ථෙරී ගාථං අභාසිත්ථාති

**සුමනාබුඩ්ඪපබ්බජිතාථෙරීගාථා**

## 1. 17

17. පිණ්ඩපාතං චරිත්වාන දණ්ඩමොලුබ්භ දුබ්බලා,
වෙධමානෙහි ගත්තෙහි තත්ථෙව නිපතිං ඡමා,
දිස්වා ආදීනවං කායෙ අථ චිත්තං විමුච්චි මෙති.

ඉත්ථං සුදං ධම්මා ථෙරී ගාථං අභාසිත්ථාති.

**ධම්මාථෙරීගාථා.**

## 1. 18

18. හිත්වා ඝරෙ පබ්බජිතා[2] හිත්වා පුත්තං පසුං පියං,
හිත්වා රාගඤ්ච දොසඤ්ච අවිජ්ජඤ්ච විරාජිය,
සමූලං තණ්හං අබ්බුය්හ උපසන්තම්හි නිබ්බුතාති

ඉත්ථං සුදං සඞ්ඝාථෙරී ගාථං අභාසිත්ථාති.

**සඞ්ඝාථෙරීගාථා.**

## එකකනිපාතො නිට්ඨිතො.

---

1. තණ්හාමබ්බුය්හ - මජසං    2. පබ්බජිත්වා - මජසං

## 1. 14

14. (සවසනනතිපයසිපතන වූ චක්ෂුරාදී) ධාතූන් දුක් වශයෙන් දැක පුනර්භවයට නැවත් පැමිණෙම. භවයෙහි තෘෂ්ණා ඡන්දය හැරපියා උපශාන්ත වැ හැසිරෙව.

මෙසේ සුමනා මෙහෙණ ගාථාවක් කිවූ යැ.

සුමනාථේරීගාථා යි.

## 1. 15

15. කායසංවරයෙන් සංවෘත වීම්, වාක්සංවරයෙන් සංවෘත වීම්. මැලි අභිචිත්තයෙන් සංවෘත වීම්, අනුශය සහිත තෘෂ්ණාව උදුරාපියා සිහිල් බවට පැමිණියෙම් නිවියෙම් වෙමි.

මෙසෙයින් උත්තරා මෙහෙණ ගාථාවක් කිවූ යැ.

උත්තරාථේරීගාථා යි.

## 1. 16

16. වෘද්ධාවෙහි, තෙපි පහුල්වලින් සිවුරු කොට පෙරෙවියාව සුවසේ හොව, යම්හෙයෙකින් තොපගේ රාගය සන්හිඳි ද එහෙයින් සිහිල් වැ පිරිනිවියා වව.

මෙසෙයින් වෘද්ධප්‍රව්‍රජිත සුමනා මෙහෙණ ගාථාවක් කිවූ යැ.

සුමනාවුඩ්ඪපබ්බජිතාථේරීගාථා යි.

## 1. 17

17. දුබල වූයෙම් සැරයටිය එල්බගෙන පිඬු සිඟා ඇවිද වෙවුලන ගාත්‍ර ඇති වැ එහි මැ බිම හිණිමි. කයෙහි ආදීනව දැක යළි මා සිත කෙලෙසුන් කෙරෙන් මිදුණ.

මෙසෙයින් ධම්මා මෙහෙණ ගාථාවක් කිවූ යැ.

ධම්මාථේරීගාථා යි.

## 1. 18

18. ගිහිගෙය හැරපියා ප්‍රිය එලවන පුත්‍රයන් හා ගොවිහිණාදීන් හැරපියා රාගයත් ද්වේෂයත් ආයතීමාගීයෙන් සිඳපියා අවිද්‍යාව ද මාගීයෙන් නසා අනුශය සහිත තෘෂ්ණාව උදුරාපියා උපශාන්ත වැ නිවුණුමි.

මෙසෙයින් සඞ්ඝා මෙහෙණ ගාථාවක් කිවූ යැ.

සඞ්ඝාථේරීගාථා යි.

# එකකනිපාතය නිමි.

# 2. දුකනිපාතො

## 2. 1

19. ආතුරං අසුචිං පූතිං පස්ස නන්දෙ සමුස්සයං,
අසුභාය චිත්තං භාවෙහි එකග්ගං සුසමාහිතං.

20. අනිමිත්තඤ්ච භාවෙහි මානානුසයමුජ්ජහ,
තතො මානාභිසමයා උපසන්තා චරිස්සසීති.

ඉත්ථං සුදං භගවා අභිරූපනන්දං සික්ඛමානං ඉමාහි ගාථාහි අභිණ්හං ඔවදතීති.

අභිරූපනන්දාථෙරීගාථා

## 2. 2

21. යෙ ඉමෙ සත්තබොජ්ඣඞ්ගා මග්ගා නිබ්බානපත්තියා,
භාවිතා තෙ මයා සබ්බෙ යථා බුද්ධෙන දෙසිතා.

22. දිට්ඨො හි මෙ සො භගවා අන්තිමොයං සමුස්සයො,
වික්ඛීණො ජාතිසංසාරො නත්ථි දානි පුනබ්භවො'ති.

ඉත්ථං සුදං ජෙන්තා ථෙරී ගාථායො අභාසිත්ථා'ති.

ජෙන්තාථෙරීගාථා

## 2. 3

23. සුමුත්තිකෙ සුමුත්තිකෙ[1] සාධු මුත්තිකාම්හි මුසලස්ස,
අහිරිකො මෙ ඡත්තකං වාපි[2] උක්ඛලිකා මෙ දෙඩ්ඩුභං වාති.

24. රාගඤ්ච අහං දොසඤ්ච චිච්චිටි චිච්චිටීති විහනාමි,
සා රුක්ඛමූලමුපගම්ම අහොසුඛන්ති සුඛතො ඣායාමීති.

ඉත්ථං සුදං සුමඞ්ගලමාතාථෙරී ගාථායො අභාසිත්ථා'ති.

සුමඞ්ගලමාතාථෙරීගාථා.

---

1. සුමුත්තිකා, සුමුත්තිකා - මජසං. 2. අහිතකො මෙ වාතො වාති - පු.

# දුකනිපාතය.

## 2. 1

19. නන්දුවෙනි, ආතුර වූ අපවිත්‍ර වූ පූතිභාවයට ගිය (තෙල) ශරීරය බල, වික්ෂෙප නැතියෙන් ඒකාග්‍ර වූ (අරමුණෙහි මොනොවට පිහිටියෙන්) සුසමාහිත වූ සිත අසුභය පිණිස වඩව.

20. (නිත්‍යනිමිත්තාදීන් දුරලනුයෙන්) අනිමිත්ත නම් වූ විපස්සනාව වඩව, මානානුශය දුරලව, ඉක්බිති මානයාගේ දුරු කිරීමෙන් උපශාන්ත වූ වාස කරම.

මෙසෙයින් භාග්‍යවතුන් වහන්සේ අභිරූපනන්දා සික්ඛමානාවට මේ ගාථායෙන් නරතුරු ඔවදන් දෙනසේක.

අභිරූපනන්දාථේරීගාථා යි.

## 2. 2

21. නිර්වාණාවබෝධයට මාර්ග වූ යම් සප්තබොධ්‍යඞ්ග කෙනෙක් ඇද්ද යම් පරිදි බුදුන් විසින් දෙසන ලද්දාහු ද ඒ හැම බෝධ්‍යඞ්ගයෝ මා විසින් භාවිතයහ.

22. යම් හෙයෙකින් මා විසින් ඒ ධර්මකාය සඞ්ඛ්‍යාත භාග්‍යවතුන් වහන්සේ ( ආර්‍ය්‍යධර්මදර්ශනයෙන්) දක්නා ලද්දාහු ද එහෙයින් මේ අන්තිම ශරීරය වෙයි, ජාතිසංසාරය ක්‍ෂය වී දැන් පුනර්භවයෙක් නැති.

මෙසෙයින් ජේන්තා මෙහෙණ ගාථා කිවූ යැ.

ජේන්තාථේරීගාථා යි.

## 2. 3

23. සුමුත්තිකාවෙනි, සුමුත්තිකාවෙනි, මොහොලින් මොනොවට මිදුණමු. මාගේ සැමියා නිර්ලජ්ජයෙක. (හේ මට නො රිසි වෙයි ) (දිවි තකා කැරෙන) ඡත්‍රය ද නො රිසි වෙයි. මාගේ බත් පිසන සැළිය දියබරණ ගඳ හමයි. (මේ හැමයෙන් මොනොවට මිදුණමු )

24. මම රාගය ද ද්වේෂය ද 'චිච්චිටි චිච්චිටි' යන අනුකරණයෙන් නසාලමි. මම වෘක්ෂමූලයට එළඹ 'අහොසුඛං' යි සුඛවශයෙන් ධ්‍යාන කරමි.

මෙසෙයින් සුමඞ්ගලමාතා මෙහෙණ ගාථා කිවූ යැ.

සුමඞ්ගලමාතාථේරීගාථා යි.

## 2. 4

25. යාව කාසිජනපදෙ සුඞ්කො මෙ තත්තකො අහු,
තං කත්වා නෙගමො අග්ඝං අඩ්ඪෙනග්ඝං[1] ඨපෙසි මං.

26 අථ නිබ්බින්දහං රූපෙ නිබ්බින්දං ච විරජ්ජහං,
මා පුන ජාතිසංසාරං සන්ධාවෙය්‍යං පුනප්පුනං,
තිස්සො විජ්ජා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනන්ති.

ඉත්ථං සුදං අඩ්ඪකාසීථෙරී ගාථායො අභාසිත්ථා’ති.

අඩ්ඪකාසීථෙරීගාථා.

## 2. 5

27 කිඤ්චාපි ඛොම්හි කිසිකා ගිලානා බාළ්හදුබ්බලා,
දණ්ඩමොලුබ්භ ගච්ඡාමි පබ්බතං අභිරූහිය.

28. සඞ්ඝාටිං නික්ඛිපිත්වාන පත්තකං ච නිකුජ්ජිය,
සෙලෙ ඛම්භෙසිමත්තානං තමොක්ඛන්ධං[2] පදාලියාති.

ඉත්ථං සුදං චිත්තා ථෙරී ගාථායො අභාසිත්ථා’ති.

චිත්තාථෙරීගාථා.

## 2. 6.

29. කිඤ්චාපි ඛොම්හි දුක්ඛිතා දුබ්බලා ගතයොබ්බනා,
දණ්ඩමොලුබ්භ ගච්ඡාමි පබ්බතං අභිරූහිය.

30 නික්ඛිපිත්වාන සඞ්ඝාටිං පත්තකං ච නිකුජ්ජිය
නිසින්නා චම්හි සෙලම්හි අථ චිත්තං විමුච්චි මෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනන්ති.

ඉත්ථං සුදං මෙත්තිකා ථෙරී ගාථායො අභාසිත්ථා’ති.

මෙත්තිකාථෙරීගාථා.

## 2. 7

31. චාතුද්දසිං පඤ්චදසිං යා ච පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං,
උපොසථං උපාගඤ්ඡිං දෙවකායාභිනන්දිනී.

32. සාජ්ජ එකෙන භත්තෙන මුණ්ඩා සඞ්ඝාටිපාරුතා
දෙවකායං න පත්ථෙහං විනෙය්‍ය හදයෙ දරන්ති.

ඉත්ථං සුදං මෙත්තා[3] ථෙරී ගාථායො අභාසිත්ථා’ති.

මෙත්තාථෙරීගාථා.

---

1. අද්ධෙනග්ඝං - මජසං, 2. තමොඛන්ධං - මජසං
3 මිත්තා - මජසං

2. 4

25. කසිරට උපදනා සුංවත් යම් පමණ වේ ද මට එපමණ සුංවත් වී. නියම්ගම් වැසි ජනයා ඒ අගය කොට ගෙන එයින් අඩෙකින් මා අගය කොට තැබී.

26. ඉක්බිති මම රූපයෙහි කලකිරුණුමි. කලකිරුණු මම විරාගයට පැමිණියෙමි: වැලි පුනපුනා ජාතිසංසාරයට නො දුවමි. මා විසින් ත්‍රිවිද්‍යාවෝ පසක් කරනලදහු. බුදුන්ගේ අනුසසුන් කරනලද.

මෙසෙයින් අඩ්ඪකාසි මෙහෙණ ගාථා කිවූ යැ.

අඩ්ඪකාසීථේරීගාථා යි.

2. 5

27. මම (මද වූ මස්ලේ ඇති බැවින්) කෘශ ශරීර ඇති වැ ගිලන් වැ දුඛි දුබල වූව ද, (යම මැ තැනෙක) යමින් සැරයටිය එල්බගෙන යමි. (එබඳු වී නමුදු) ගිජුකුළුපව්වට නැඟී,

28. සඟල අත්පසැ තබා පාත්‍රය ද යටිහුරු කොට තබා ශෛලපර්වතයෙහි හිඳ මෝහස්කන්ධය ප්‍රදරණ කොට ස්කන්ධසන්තාන සඞ්ඛ්‍යාත ආත්මය මතු නූපදනා බවට පැමිණවීමෙන් විශ්‍රාමහණ කළෙමි.

මෙසෙයින් විත්තා මෙහෙණ ගාථා කිවූ යැ.

විත්තාථේරීගාථා යි.

2. 6

29. මම (රෝගින් පෙළීමෙන්) උපන් දුක් ඇති වැ එයින් මැ දුබල වැ ඉක්මගිය යොවුන් බව ඇත්තී වෙමි. සැරයටිය එල්බගෙන යමි. එතෙකුදු වුව (ගිජුකුළු පව්වට නැඟී -

30. සඟලසිවුර අත්පසැ තබා පාත්‍රය ද යටිහුරු කොට තබා ශෛලපර්වතයෙහි හුන්මූ තදනන්තර වැ (වීර්‍ය්‍යසමතායෙහි යොදනලද බැවින් මාගේ සිත ආස්‍රවයන් කෙරෙන් මිදිණ. මා විසින් ත්‍රිවිද්‍යාවෝ ලබනලදහු. බුදුරදුන්ගේ අනුසසුන් කරන ලද.

මෙසෙයින් මෙත්තිකා මෙහෙණ ගාථා කිවූ යැ.

මෙත්තිකාථේරීගාථා යි.

2. 7

31. මම දිව්‍යකාය ප්‍රාර්ථනා කරමින් පක්ෂය සම්බන්ධ තුදුස්වක් පසළොස්වක් දිනයෙහි ද ප්‍රාතිහාර්‍ය්‍යපක්ෂ (තෙළෙස්වක, පෑලවිය, සතවක, නවවක දින) යෙහි ද අෂ්ටාඞ්ග සමන්‍වාගත වූ පෙහෙවස් වුසුමි

32. මම අද එක් වේලේ වළඳන බතින් යුතු වැ මුඩු කළ කෙහෙ ඇති වැ සඟල සිවුරු පෙරෙව් සිරුරු ඇති වැ හෘදයෙහි කෙලශදරථ හැරපියා දිව්‍යනිකාය නො පතමි.

මෙසෙයින් මෙත්තා මෙහෙණ ගාථා කිවූ යැ.

මෙත්තාථේරීගාථා යි.

2. 8

33. උද්ධං පාදතලා අම්ම අධො වෙ කෙසමත්ථකා,
පච්චවෙක්ඛස්සු'මං කායං අසුචිං පූතිගන්ධිකං.

34. එවං විහරමානාය සබ්බො රාගො සමූහතො,
පරිළාහො සමුච්ඡින්නො සීතිභූතාම්හි නිබ්බුතාති

ඉත්ථං සුදං අභයමාතා ථෙරී ගාථායො අභාසිත්ථා'ති.

අභයමාතාථෙරීගාථා

2. 9

35. අභයෙ භිදුරො කායො යත්ථ සත්තා පුථුජ්ජනා,
නික්ඛිපිස්සාමිමං දෙහං සම්පජානා සතීමතී.

36. බහූහි දුක්ඛධම්මෙහි අප්පමාදරතාය මෙ,
තණ්හක්ඛයො අනුප්පත්තො කතං බුද්ධස්ස සාසනන්ති

ඉත්ථං සුදං අභයාථෙරී ගාථායො අභාසිත්ථා'ති.

අභයාථෙරීගාථා.

2. 10

37. චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං විහාරා උපනික්ඛමිං,
අලද්ධා චෙතසො සන්තිං චිත්තෙ අවසවත්තිනී

38. තස්සා මෙ අට්ඨමී රත්ති යතො තණ්හා සමූහතා,
බහූහි දුක්ඛධම්මෙහි අප්පමාදරතාය මෙ,
තණ්හක්ඛයො අනුප්පත්තො කතං බුද්ධස්ස සාසනන්ති.

ඉත්ථං සුදං සාමා ථෙරී ගාථායො අභාසිත්ථා'ති

සාමාථෙරීගාථා

## දුකනිපාතො නිට්ඨිතො.

## 2. 8

33. මැණියෙනි, පාදතලයෙන් උඩ කේශමස්තකයෙන් යට මේ අපවිත්‍ර වූ කුණුගඳ හමන කය නුවණින් ප්‍රත්‍යවේක්‍ෂා කරව.

34. මෙසේ (පුනුණුවන් අභය තෙරණුවන්ගේ ඕවා පරිදි, අනිත්‍යානුදර්ශනාදි විසින්) වාස කරන මා විසින් හැම රාගය (රහත්මඟින්) නසන ලද. හැම කෙලෙශපරිදාහ සිඳුනාලද, එහෙයින් මැ) සිහිල් වූමි. (සඋපාදිසෙසනිබ්බාන ධාතුයෙන්) නිවියා වෙමි.

මෙසෙයින් අභයමාතා මෙහෙණ ගාථා කිවු යැ

අභයමාතාථෙරීගාථා යි.

## 2. 9

35 අභයාවෙනි, යම් කයෙක පුහුදුන්හු ලැගුණාහු වෙත් ද එකය බිදෙනසුලු යැ, (එකරුණ) මැනැවින් දන්නා සිහිනුවණ ඇති මම මේ කය නිරපෙක්‍ෂක වැ හැරපියමි.

36. (ජාති ජරාදි) බොහෝ වූ දුඃඛධර්මයෙන් පහත්නාලද (එයින් මැ) අප්‍රමාදයෙහි ඇලුණු මා විසින් තෘෂ්ණාක්‍ෂය සඞ්ඛ්‍යාත නිවන ලබන ලද. බුදුරදුන්ගේ අනුසසුන් කරනලද.

මෙසෙයින් අභයා මෙහෙණ ගාථා කිවු යැ.

අභයාථෙරීගාථා යි.

## 2. 10

37. යම් දවසෙක පටන් මම (විරියසමතා නැතියෙන්) සිත්හි වශී වැ නො පවත්මින් (එහෙයින් මැ) චිත්තශාන්තිය (අයථාමාගීසමාධිය) නො ලැබ රැය සතර පස් වරක් වෙහෙරින් නික්ම ගියමු ද,

38. ඒ මා විසින් අට වැනි රාත්‍රියෙහි තෘෂ්ණාව නසන ලදු. බොහෝ වූ දුඃඛ ධර්මයෙන් පහස්නා ලද (එහෙයින් මැ) අප්‍රමාදයෙහි ඇලුණු මා විසින් නිවන් ලබනලද. බුදුරදුන්ගේ අනුශාසනා කරනලදි.

මෙසෙයින් සාමා මෙහෙණ ගාථා කිවු යැ.

සාමාථෙරීගාථා යි.

## දුකනිපාතය නිමි.

# 3. තිකනිපාතො.

## 3. 1

39. පඤ්චවීසතිවස්සානි යතො පබ්බජිතාය මෙ
නාභිජානාමි චිත්තස්ස සමං ලද්ධං කුදාචනං.

40. අලද්ධා චෙතසො සන්තිං චිත්තෙ අවසවත්තිනී
තතො සංවෙගමාපාදිං සරිත්වා ජිනසාසනං.

41. බහූහි දුක්ඛධම්මෙහි අප්පමාදරතාය මෙ
තණ්හක්ඛයො අනුප්පත්තො කතං බුද්ධස්ස සාසනං
අජ්ජ මෙ සත්තමී රත්ති යතො තණ්හා විසොසිතා'ති.

ඉත්ථං සුදං සාමා ථෙරී ගාථායො අභාසිත්ථා'ති.

සාමාථෙරීගාථා

## 3. 2

42. චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං විහාරා උපනික්ඛමිං
අලද්ධා චෙතසො සන්තිං චිත්තෙ අවසවත්තිනී.

43. සා භික්ඛුනිං උපගඤ්ඡිං[1] යා මෙ සද්ධායිකා අහු
සා මෙ ධම්මමදෙසෙසි ඛන්ධායතනධාතුයො.

44. තස්සා ධම්මං සුණිත්වාන යථා මං අනුසාසි සා
සත්තාහං එකපල්ලඞ්කෙන නිසීදිං සුඛසමප්පිතා
අට්ඨමියා පාදෙ පසාරෙසිං තමොක්ඛන්ධං[2] පදාලියා'ති

ඉත්ථං සුදං උත්තමා ථෙරී ගාථායො අභාසිත්ථා'ති

උත්තමාථෙරීගාථා.

## 3. 3

45. යෙ ඉමෙ සත්තබොජ්ඣඞ්ගා මග්ගා නිබ්බානපත්තියා
භාවිතා තෙ මයා සබ්බෙ යථා බුද්ධෙන දෙසිතා.

46. සුඤ්ඤතස්සානිමිත්තස්ස ලාභිනීහං යදිච්ඡකං
ඔරසා ධීතා බුද්ධස්ස නිබ්බානාභිරතා සදා.

47. සබ්බෙ කාමා සමුච්ඡින්නා යෙ දිබ්බා යෙ ච මානුසා
වික්ඛීණො ජාතිසංසාරො නත්ථිදානි පුනබ්භවො'ති.

ඉත්ථං සුදං අපරා උත්තමා ථෙරී ගාථායො අභාසිත්ථා'ති.

උත්තමාථෙරීගාථා.

1. උපගච්ඡිං - මජසං. 2. තමොඛන්ධං - මජසං.

# 3. තිකනිපාතය

## 3. 1

39. පැවිදි වූ තැන් පටන් කොට මට පස්විසිවසක් ගෙවී ගියේ යෑ. (මේදතුර) කිසි කලෙක ලද චිත්තෝපශමයක් නො දනිමි.

40. භාවනාචිත්තයෙහි වශවර්තිභාවයක් නැති මම චිත්තශාන්තියක් නො ලැබ එයින් ජිනශාසනය සිහි කොට සංවේගයට පැමිණියෙමි.

41. (ජාතිජරාදි) බොහෝ දුඃඛධර්මයන් විසින් පහරන ලද අප්‍රමාද-යෙහි ඇලුණු මට තෘෂ්ණාක්‍ෂය ලැබිණ, මවිසින් බුද්ධශාසනය කරන ලද. තෘෂ්ණා වියළුණු තැන් පටන් කොට අද මට සත්වන දින වෙයි.

මෙසෙයින් සාමා මෙහෙණ ගාථා කිවූ යෑ.

සාමාථේරීගාථා යි.

## 3. 2

42. චිත්තභාවනායෙහි වශවර්තීභාවයක් නැති මම චිත්තශාන්තිය නො ලදින් සතර පස් වරක් විහාරයෙන් බැහැගියෙමි.

43. මා විසින් ශ්‍රද්ධෙය වූ (ඇදහියයුතු වූ) යම් මෙහෙණක් වූ ද මම ඒ මෙහෙණ කරා එළැඹියා වෙමි. ඒ මෙහෙණ ස්කන්ධ ධාතු ආයතන නිඃශ්‍රිත වූ දහමක් දෙසූ.

44. යම් පරිදි ඒ මෙහෙණ මට අනුශාසනා කළා ද ඇගේ ධර්මානුශාසනය අසා සුඛසමර්පිත වැ සත් දිනක් එක් පලගෙහි හිඳිමි, මෝහස්කන්ධය පලාපියා අටවන දින පා දිගු කළෙමි.

මෙසෙයින් උත්තමා මෙහෙණ ගාථා කිවූ යෑ.

උත්තමාථේරීගාථා යි.

## 3. 3

45. නිර්වාණප්‍රාප්තියට මාර්ග වූ යම් සප්තබෝධ්‍යඞ්ග කෙනෙක් ඇද්ද එ හැම මා විසින් බුදුරදුන් දෙසන ලද පරිදි භාවිතයහ.

46. ශූන්‍යතසමාපත්තිය ද අනිමිත්තසමාපත්තිය ද කැමැති සේ ලබන, බුදුරදුන් ගේ ඖරසදුහිතෘ වූ මම හැම කල්හි නිවන්හි ඇලුණෙමි.

47. දිව්‍යමය වූත් මනුෂ්‍යමය වූත් යම් වස්තු කාම කෙනෙක් ඇද්ද එ හැම කාමයෝ මා විසින් සමුච්ඡේද විසින් සිඳුනා ලදහ. ජාති සංසාරය ක්‍ෂය කරන ලද, මින් මතු පුනර්භවයෙක් නැති.

මෙසෙයින් අන්‍ය උත්තමා නම් මෙහෙණක් ගාථා කිවූ යෑ

උත්තමාථේරීගාථා යි.

## 3. 4

48. දිවාවිහාරා නික්ඛම්ම ගිජ්ඣකූටම්හි පබ්බතෙ
නාගමොගාහමුත්තිණ්ණං නදීතීරම්හි අද්දසං.

49. පුරිසො අඞ්කුසමාදාය දෙහි පාදන්ති යාචති
නාගො පසාරයී පාදං පුරිසො නාගමාරුහි.

50. දිස්වා අදන්තං දමිතං මනුස්සානං වසං ගතං,
තතො චිත්තං සමාධෙසිං ඛලු තාය වනං ගතාති.

ඉත්ථං සුදං දන්තිකා ථෙරී ගාථායො අභාසිත්ථා'ති.

දන්තිකාථෙරීගාථා.

## 3. 5

51. අම්ම ජීවතීති[1] වනම්හි කන්දසි අත්තානං අධිගච්ඡ උබ්බිරි
චුල්ලාසීති සහස්සානි සබ්බා ජීව සනාමිකා
එතම්හාළාහනෙ දඩ්ඪා තාසං කමනුසොචසි.

52. අබ්බහී වත මෙ සල්ලං දුද්දසං හදයනිස්සිතං[2]
යං මෙ සොකපරෙතාය ධීතුසොකං ව්‍යපානුදි

53. සාජ්ජ අබ්බූළ්හසල්ලාහං නිච්ඡාතා පරිනිබ්බුතා
බුද්ධං ධම්මඤ්ච සඞ්ඝඤ්ච උපෙමි සරණං මුනින්ති.

ඉත්ථ සුදං උබ්බිරී ථෙරී ගාථායො අභාසිත්ථා'ති.

උබ්බිරිථෙරීගාථා.

## 3. 6

54. කිමෙ[3] කතා රාජගහෙ මනුස්සා මධුපීතාව[4] අච්ඡරෙ
යෙ සුක්කං න උපාසන්ති දෙසෙන්තිං බුද්ධසාසනං.

55. තඤ්ච අප්පටිවානීයං අසෙචනකමොජවං
පිවන්ති මඤ්ඤෙ සප්පඤ්ඤා වලාහකමිවද්ධගූ.

56. සුක්කා සුක්කෙහි ධම්මෙහි වීතරාගා සමාහිතා
ධාරෙති අන්තිමං දෙහං ජෙත්වා මාරං සවාහිනින්ති.[5]

ඉත්ථං සුදං සුක්කා ථෙරී ගාථායො අභාසිත්ථා'ති.

සුක්කාථෙරීගාථා.

---

1 ජීවාති - සාළුව්. 2 හදයස්සිතං - මජසං
3 කිං මෙ - මජසං 4 මධුං පීතාව - මජසං 5 සවාහනන්ති - මජසං.

3. 4

48. (මම) ගිජ්ඣකූළ පව්වෙහි දිවාවිහාරයෙන් නික්ම සප්පිනිකා-නදීතීරයෙහි දී දියෙහි බැස ගොඩ අා ඇතක්හු දුටුම්.

49. පුරුෂයෙක් අකුස්සක් ගෙන පය දෙවයි ඉල්වයි, ඇත් පාද ප්‍රසාරණ කෙළේ යැ, පුරුෂ තෙම ඇතු පිට නැංගේ යි.

50. (පෙර) අදාන්ත වූ (ඇතරුවන්) විසින් දමනය කරනලද (එහෙයින් මැ) මිනිසුන්ගේ වශයට ගිය (ඇතු දක) ඉක්බිති ඒ (ඇතුගේ) ක්‍රියා හෙතුවින් මැ අරණට ගිය මම චිත්තසමාධාන කළෙමි.

මෙසෙයින් දන්තිකා මෙහෙණ ගාථා කිවූ යැ.

දන්තිකාථේරීගාථා යි.

3. 5

51. උබ්බිරිය, තෝ ‘ජීවයෙහි’ යි වනයෙහි හඬන්නී, (ජීවතියෙහි) කවරක සඳහා ශෝක කරව.

උබ්බිරිය, තෝ ‘මදියණියනි, ජීවන්තියෙනි’යි ආගවාන කෙරෙහි උබ්බිරිය (පළමු) තමා දනුව, තෙල සොහොන්හි සුවාසු දහසක් දෙනා දවන ලද, හැම දෙනා ජීවන්තිය සමාන නම් ඇත්තාහ. උන් කෙරෙහි කවරක සඳහා ශෝක කරව.

52. යම් හෙයකින් සොවින් මඩනා ලද මා ගේ දුහිතෘශොකය බැහැර කළ සේක් ද, එහෙයින් දුක්ක නො හෙන හදවත් ඇසිරි කළ මාගේ ශොකශල්‍යය උපුළසේක් මැ යි.

53. ඒ මම් අද උපුල හුල් ඇති වැ තෘෂ්ණා රහිත වැ (එහෙයින් මැ කෙලෙස් පිරිනිවනින්) පිරිනිවියා සවිඳෙ වූ බුදුනුදු දහමුදු සඟුනුදු සරණ කොට එලැඹෙමි.

මෙසෙයින් උබ්බිරි මෙහෙණ ගාථා කිවූ යැ.

උබ්බිරීථේරීගාථා යි.

3. 6

54. යම් කෙනෙක් බුද්ධානුශාසනය දෙසන සුක්කා මෙහෙණ සරා නො එළඹෙත් ද රජගහනුවර වැසි මේ මිනිස්හු කුමක් කළාහු මධු-පානය කළවුන් සෙයින් හිඳිත් ද?

55. නුවණැති පුරුෂයෝ (ශ්‍රොතෘන්ගේ කන් පිණවනුයෙන්) නො බැහැර කළ හෙන පියවින් මැ රසවත් වූ එයින් මැ ඔදවත් වූ ඒ දහම (කාන්තාරයෙහි දී) මාර්ගිකයන් මෙඝජලය බොන්නාක් මෙන් (සවන් දෝතින්) බොති’ සිතම්.

56. සුක්කා මෙහෙණ කුශලධර්මයෙන් සුක්ක වැ පැහූ රාග ඇත්තී රහත්පලසමවතට වැදුණී වාහිනී සහිත මාරයා පරදවා අන්තිම දේහය දරයි.

මෙසෙයින් සුක්කා මෙහෙණ ගාථා කිවූ යැ.

සුක්කාථේරීගාථා යි.

3. 7

57. නත්ථි නිස්සරණං ලොකෙ කිං විවෙකෙන කාහසි
භුඤ්ජාහි කාමරතියො මාහු පච්ඡානුතාපිනී.

58. සත්තිසූලූපමා කාමා ඛන්ධාසං අධිකුට්ටනා
යං ත්වං කාමරතිං බ්‍රූසි අරතී දැනි සා මම.

59. සබ්බත්ථ විහතා නන්දී තමොක්ඛන්ධො පදාලිතො
එවං ජානාහි පාපිම නිහතො ත්වමසි අන්තකාති.

ඉත්ථං සුදං සෙලා ථෙරී ගාථායො අභාසිත්ථා’ති

සෙලාථෙරීගාථා.

3. 8

60. යං තං ඉසීහි පත්තබ්බං ඨානං දුරභිසම්භවං
න තං ද්වඞ්ගුලපඤ්ඤාය[1] සක්කා පප්පොතුමිත්ථියා.

61. ඉත්ථිභාවො නො කිං කයිරා චිත්තම්හි සුසමාහිතෙ
ඤාණම්හි වත්තමානම්හි සම්මා ධම්මං විපස්සතො.

62. සබ්බත්ථ විහතා නන්දී තමොක්ඛන්ධෝ පදාලිතො
එවං ජානාහි පාපිම නිහතො ත්වමසි අන්තකාති.

ඉත්ථං සුදං සොමා ථෙරී ගාථායො අභාසිත්ථා’ති.

සොමාථෙරීගාථා.

## තිකනිපාතො නිට්ඨිතො.

---

1 ද්වඞ්ගුලිපඤ්ඤාය - ප

### 3. 7

57. ලෝකයෙහි නිවනෙක් නැත, කාය විවෙකයෙන් කුමක් කෙරෙහි, කාමක්‍රීඩාරති වළඳ කර, පසු වැ අනුතාප ඇති නො වා. (මාරයාගේ වචන යි.)

58. කාමයෝ විෂ පි සැත්හුල් වැනියහ. තෙල කාමයනට උපාදනස්කන්ධයෝ මස්ලොඹු වැනියහ. තෝ යම් කාමරතියක් කියෙහි ද ඒ දූත් මට අරතියෙකි.

59. හැම විෂයෙහි තෘෂ්ණා නසන ලද මොහස්කන්ධය පළන ලදී, මාරය මෙසේ දනුව. මාරය තෝ නටුයෙහි.

මෙසෙයින් සෙලා මෙහෙණ ගාථා කිවු යැ.

සෙලාථේරීගාථා යි.

### 3. 8

60. බුද්ධාදී සෘෂින් විසින් පැමිණියයුතු (තදන්‍යයන් විසින්) දුකසේ නිපදවාලියහෙන අභීතත්ව සඞ්ඛ්‍යාත යම් පරමාශ්වාස කාරණයෙක් ඇද්ද එය දූගිලිනුවණැති ස්ත්‍රිය විසින් පැමිණෙන්නට නො හැක්ක.

61. සිත අභීත්මාගී සමාධියෙන් මොනොවට සමාහිත කල්හි රහත් මාගීඥනය පවත්නා කල්හි සිව්සස් දහම් පරිඥදි විසින් මොනොවට දක්මින් සිටිය දී ස්ත්‍රිභාවය අපට කුමක් කරන්නේ ද?

62 හැම විෂයෙහි තෘෂ්ණා, නසනලද, මෝහස්කන්ධය පළන ලදී, මාරය මෙසේ දනුව, මාරය තෝ නටුයෙහි.

මෙසෙයින් සොමා මෙහෙණ ගාථා කිවු යැ.

සෝමාථේරීගාථා යි.

## තිකනිපාතය නිමි.

# 4. චතුක්කනිපාතො.

## 4. 1

63. පුත්තො බුද්ධස්ස දායාදො කස්සපො සුසමාහිතො,
පුබ්බෙනිවාසං යො වෙදී සග්ගාපායඤ්ච පස්සති.

64. අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤාවොසිතො මුනි,
එතාහි තීහි විජ්ජාහි තෙවිජ්ජො හොති බ්‍රාහ්මණො.

65. තථෙව භද්දාකාපිලානී තෙවිජ්ජා මච්චුහායිනී,
ධාරෙති අන්තිමං දෙහං ජෙත්වා[1] මාරං සවාහිනිං.[2]

66. දිස්වා ආදීනවං ලොකෙ උභො පබ්බජිතා මයං,
ත්‍යම්හා ඛීණාසවා දන්තා සීතිභූතාම්හ නිබ්බුතාති.

ඉත්ථං සුදං භද්දාකාපිලානී ථෙරී ගාථායො අභාසිත්ථා'ති.

භද්දාකාපිලානීථෙරීගාථා.

## චතුක්කනිපාතො නිට්ඨිතො.

1 ජෙත්වා - සී. 2 සවාහනං - මජසං

# 4. චතුක්කනිපාතය

### 4. 1

63. සම්‍යක් සම්බුද්ධයන්ගේ අනුජාතපුත්‍ර වූ එහෙයින් මැ ඔබගේ දායාද වූ මොනොවට සමාහිත සිත් ඇති යම් කාශ්‍යප නම් ස්ථවිර කෙනෙක් පෙර විසූ කඳ පිළිවෙළ දත්තාහු ද ස්වර්ගය හා අපාය හා දිවැසින් දකිත් ද.

64. යළි ජාතික්ෂය සඞ්ඛ්‍යාත අර්හත්ත්වයට පැමිණියාහු ද මේ ත්‍රිවිද්‍යාවන් හේතු කොට ගෙන ත්‍රිවිද්‍යාප්‍රාප්ත බ්‍රාහ්මණ වෙත් ද.

65. එසෙයින් මැ භද්‍රාකාපිලානී මෙහෙණ ත්‍රිවිද්‍යා ඇත්තී මරු පලවා හරින සුලුවී සෙන් සහිත මරු දිනා අන්තිම ශරීරය ධරයි.

66. ඇපි දෙදෙනමෝ ලොවැ ආදීනව දැක ඒ අපි උත්තමදමනයෙන් දැමුණමෝ ක්ෂීණාස්‍රව වූම්හ.

මෙසෙයින් භද්‍රාකාපිලානී මෙහෙණ ගාථා කිවූ යැ.

භද්දාකාපිලානීථේරීගාථං සි

## චතුක්කනිපාතය නිමි.

# 5. පඤ්චකනිපාතො

### 5. 1.

67. පණ්ණවීසතිවස්සානි යතො පබ්බජිතා අහං
නාච්ඡරාසඞ්ඛාතමත්තම්පි[1] චිත්තස්සූපසමජ්ඣගං.

68 අලද්ධා චෙතසො සන්තිං කාමරාගෙනවස්සුතා,
බාහාපග්ගය්හ කන්දන්තී විහාරං පාවිසිං අහං.

69. තං භික්ඛුනිමුපාගඤ්ඡිං[2] යා මෙ සද්ධායිකා අහු
සා මෙ ධම්මමදෙසෙසි ඛන්ධායතනධාතුයො.

70. තස්සා ධම්මං සුණිත්වාන එකමන්තෙ උපාවිසිං,
පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛුං විසොධිතං

71. චෙතොපරියඤාණඤ්ච සොතධාතු විසොධිතා,
ඉද්ධිපි මෙ සච්ඡිකතා පත්තො මෙ ආසවක්ඛයො,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනන්ති.

ඉත්ථං සුදං අඤ්ඤතරා ථෙරී ගාථායො අභාසිත්ථා'ති

අඤ්ඤතරාථෙරීගාථා.

### 5. 2

72. මත්තා වණ්ණෙන රූපෙන සොභග්ගෙන යසෙන ච,
යොබ්බනෙන චුපත්ථද්ධා අඤ්ඤාසමතිමඤ්ඤිහං

73. විභූසිත්වා[3] ඉමං කායං සුචිත්තං බාලලාපනං,
අට්ඨාසිං වෙසිද්වාරම්හි ලුද්දො පාසමිවොඩ්ඩිය.

74. පිලන්ධනං විදංසෙන්තී ගුය්හං පකාසිකං බහුං,
අකාසිං විවිධං මායං උජ්ඣග්ඝන්තී බහුං ජනං.

75. සාජ්ජ පිණ්ඩං චරිත්වාන මුණ්ඩා සඞ්ඝාටිපාරුතා,
නිසින්නා රුක්ඛමූලම්හි අවිතක්කස්ස ලාභිනී.

76. සබ්බෙ යොගා සමුච්ඡින්නා යෙ දිබ්බා යෙ ච මානුසා,
ඛෙපෙත්වා ආසවෙ සබ්බෙ සීතිභූතාම්හි නිබ්බුතාති.

ඉත්ථං සුදං විමලාථෙරී ගාථායො අභාසිත්ථාති.

විමලාථෙරීගාථා.

---

1. නාච්ඡරාසඞ්ඝාතමත්තම්පි - මජසං
2. සා භික්ඛුනී උපාගඤ්ඡි - සීමු 1,2. සා භික්ඛුනිං උපාගච්ඡිං - PTS.
3. විභූසෙත්වා - මජසං.

# 5. පඤ්චකනිපාතය.

## 5. 1

67. යම් තැනක පටන් පැවිදි වූ මම් පස්විසිවසක් මුළුල්ලෙහි අසුරු-සන් ලන පමණ ඇසිල්ලකුදු චිත්තොපශමය නො ලත්මි.

68. කාමරාගයෙන් තෙත් වැ චිත්තශාන්තියක් නො ලැබ මම් දෙඅත් බැඳ හඬමින් විහාරයට පිවිසීමි.

69. යම් (ධම්මදින්නා) මෙහෙණක් මා විසින් හැදූහියයුතු වූ ද මම් ඒ මෙහෙණ කරා එළැඹිමි. ඒ මෙහෙණ මට ස්කන්ධායතනධාතූන් (පිළිබඳ) දහම් දෙසූ.

70. ඇගේ දහම් අසා එකත්පස්හි හිනිමි. මම් පෙරවිසූ කඳපිළිවෙළ දනිමි මා විසින් දිවැස පිරිසුදු කරනලද.

71. චෙතොපරියඤාණය ද පිරිසුදු කරනලද. දිබ්බසොතධාතුව ද පිරිසුදු කරනලදු. මා විසින් සෘද්ධිය ද පසක් කරනලදු. මා විසින් ආස්‍රවක්‍ෂය ලබනලද, ෂඩභිඥා ප්‍රත්‍යක්‍ෂ කරනලදහු. බුදුසසුන් කරනලදි.

මෙසේසින් එක්තරා මෙහෙණක් ගාථා කිවු යැ.

අඤ්ඤතරාථේරීගාථා යි.

## 5. 2

72. මම් වර්‍ණයෙන් රූපයෙන් සෞභාග්‍යයෙන් හා යසසින් ද මත් වූමි. යෞවන මදයෙන් තදමත් ඇති වැ අන්‍ය ස්ත්‍රීන් ඉක්මවා සිතූමි.

73. මොනොවට විසිතුරු කළ (මම යැ මාගේ යැ යි) බාලයනට කියවන මේ කය සරසාගෙන මලපුඩු එව මුව වැද්දකු සෙයින් වේශීගෘහද්වාරයෙහි සිටියෙමි.

74. ගුහ්‍යස්ථාන ප්‍රකාශ කරන බොහෝ පලඳනා දක්වමින් බොහෝ බාලජනයා (පොළඹවන්නට) උස්හඬින් සිනාසෙමින් විවිධ මායා කළෙමි.

75. ඒ මම් දූන් මුඬු කළ හිස ඇති වැ සඟළසිවුරු පෙරෙවැ පිඬු සිඟා හැසිර රුක්මුල් සෙනස්නෙහි හිඳ අවිතර්‍කධ්‍යාන පාදක කොට ඇති අග්‍රඵලය ලදුමි.

76. දිව්‍ය වූ ද මානුෂ වූ ද (කාමාදි යම් යොග කෙනෙක් ඇද්ද) එහැම යොගයෝ සිඳිනලද්දහු සියලු කාමාදි ආස්‍රවයන් ගෙවා සිහිල් වැ කෙලෙස් පිරිනිවතින් පිරිනිවීමි.

මෙසේසින් විමලා මෙහෙණ ගාථා කිවු යැ.

විමලාථේරීගාථා යි.

## 5. 3

77. අයොනිසො මනසිකාරා කාමරාගෙන අට්ටිතා,[1]
අහොසිං උද්ධතා පුබ්බෙ චිත්තෙ අවසවත්තිනී.

78. පරියුට්ඨිතා කිලෙසෙහි[2] සුභසඤ්ඤානුවත්තිනී,[3]
සමං චිත්තස්ස නාලභිං[4] රාගචිත්තවසානුගා.

79. කිසා පණ්ඩු විවණ්ණා ච සත්තවස්සානි චාරි'හං
නාහං දිවා වා රත්තිං වා සුඛං වින්දිං සුදුක්ඛිතා.

80. තතො රජ්ජුං ගහෙත්වාන පාවිසිං වනමන්තරං
වරං මෙ ඉධ උබ්බන්ධං යඤ්ච හීනං පුනාචරෙ.

81. දළ්හං පාසං කරිත්වාන රුක්ඛසාඛාය බන්ධිය
පක්ඛිපිං පාසං ගීවාය[5] අථ චිත්තං විමුච්චි මෙති.

ඉත්ථං සුදං සීහා ථෙරී ගාථායො අභාසිත්ථාති.

සීහාථෙරීගාථා.

## 5. 4

82. ආතුරං අසුචිං පූතිං පස්ස නන්දෙ සමුස්සයං
අසුභාය චිත්තං භාවෙහි එකග්ගං සුසමාහිතං.

83. යථා ඉදං තථා එතං යථා එතං තථා ඉදං
දුග්ගන්ධං පූතිකං වාති බාලානං අභිනන්දිතං.

84. එවමෙතං අවෙක්ඛන්තී රත්තින්දිවමතන්දිතා,
තතො සකාය පඤ්ඤාය අභිනිබ්බිජ්ජ[6] දක්ඛිසං.[7]

85. තස්සා මෙ අප්පමත්තාය විචිනන්තියා යොනිසො
යථාභූතං අයං කායො දිට්ඨො සන්තරබාහිරො.

86. අථ නිබ්බින්දහං[8] කායෙ අජ්ඣත්තඤ්ච විරජ්ජහං
අප්පමත්තා විසංයුත්තා උපසන්තාම්හි නිබ්බුතාති.

ඉත්ථං සුදං සුනන්දාථෙරී ගාථායො අභාසිත්ථාති.

සුනන්දාථෙරීගාථා.

---

1 අද්දිතා - PTS. 2. කෙලසෙහි - මජසං. 3 සුඛසඤ්ඤානුවත්තිනී - PTS
4 න ලභිං - සීමු. 5 ගීවායං - PTS 6 අභිනිබ්බිජ්ඣ මජසං, අභිනිබ්බිජ්ජ - සීමු.
7 දක්ඛිසිං - සීමු. 8 නිබ්බින්දිහං - සීමු.

## 5. 3

77. අනුපායමනසිකාරය හේතු කොට ගෙන කාමරාගයෙන් පීඩිත වැ පළමු මාගේ සිත වශයෙහි නො පවත්නා කල්හි නො සත්හුන් සිත් ඇති වූමු.

78. කාමරාගාදි කෙලෙසුන් විසින් මඩනාලද්දු වැ ශුභසංඥා අනු වැ වැටෙනසුලු වැ රාගචිත්තයාගේ වශයට පැමිණෙමින් චිත්තශමථය නො ලදුමු.

79. මම් කෘශ වැ පඬුපැහැ ඇති වැ විවර්ණ වූ සිරුරු ඇති වැ සත්වසක් හැසිරිණිමි. කෙලෙස්දුකින් දුක්පත් වූ මම් දහවලැ හෝ රැය හෝ මහණසුව නො ලදුමු.

80. ඉක්බිති 'යම්හෙයකින් හීන වූ ගිහිබවට පෙරළා පැමිණෙම් ද මෙහි ගෙලවැල්ලා මියනු ඒට වඩා මට උතුම්'යි රැහැනක් ගෙන වනතුරට පිවිසීමි.

81. දැඩි වූ පුඩුවක් කොට වෘක්ෂශාඛායෙකැ බැඳ පුඩුව ග්‍රීවායෙහි බහාලීමි. එකල්හි මාගේ සිත සියලු ආස්‍රවයන් කෙරෙන් මිදිණි.

මෙසෙයින් සීහා මෙහෙණ ගාථා කිවු යැ.

**සීහාථේරීගාථා යි.**

## 5. 4

82. නන්දාවෙනි, ආතුර වූ (නානාවිධ කුණපයෙන්) අපවිත්‍ර වූ පූතිභූත ශරීරය බල. අශුභභාවනා සම්පාදනය පිණිස (උපචාරසමාධියෙන්) එකග වූ (අර්පණාසමාධියෙන්) සුසමාහිත වූ සිත වඩව.

83. මේ සවිඥානක අශුභය යම්සේ ද තොල අවිඥානක අශුභයත් එබඳු විය. තොල අවිඥානක අශුභය යම්සේ (සුසානයෙහි හෝනේ) ද මේ සවිඥානක අශුභයත් එබඳු වෙයි. බාලයන් විසින් පතන ලද්දේ නමුදු දුගඳ හමයි.

84. මෙසේ සවකීය භාවනාමය ප්‍රඥායෙන් (ඝනවිනිබ්භොග කරණයෙන්) ඝනසංඥා බිඳ රැදුවල් බලමින් අනලස් වැ තොල ආතුරාදි සවභාවය ඇති සිරුර මෙසේ දුටුමු.

85. සමෘති අවිප්‍රවාසයෙන් අප්‍රමත්ත වූ උපායමනසිකාරයෙන් විමසන ඒ මා විසින් සවසන්තාන පරසන්තාන භේද වූ කය ඇතිසැටියෙන් දක්නාලද්දේ යැ

86. අනතුරු වැ මම් ආත්මභාව සඞ්ඛ්‍යාත කයෙහි (මාර්ගප්‍රඥායෙන්) නිර්වේදයට පැමිණියෙමි. මම් අධ්‍යාත්මසන්තානයෙහි ද විරාගයට පැමිණියෙමි. අප්‍රමත්ත වැ සංයොජන සමුච්ඡේදයෙන් විසංයුක්ත වැ උපශාන්ත ද පරිනිර්වෘත ද වූමු.

මෙසෙයින් සුන්දරීනන්දා මෙහෙණ ගාථා කිවු යැ.

**සුන්දරීනන්දාථේරීගාථා යි.**

**5. 5**

87. අග්ගිං චන්දඤ්ච සුරියඤ්ච[1] දෙවතා ච නමස්සිහං
නදීතිත්ථානි ගන්ත්වාන උදකං ඔරුහාමිහං.

88. බහුවතසමාදානා අඩ්ඪං සීසස්ස ඔලිඛිං,
ඡමාය සෙය්‍යං කප්පෙමි රත්තිං භත්තං න භුඤ්ජිහං[2]

89. විභූසාමණ්ඩනරතා නහාපනුච්ඡාදනෙහි ච
උපකාසිං ඉමං කායං කාමරාගෙන අට්ටිතා.

90. තතො සද්ධං ලභිත්වාන පබ්බජිං අනගාරියං,
දිස්වා කායං යථාභූතං[3] කාමරාගො සමූහතො.

91. සබ්බෙ භවා සමුච්ඡින්නා ඉච්ඡා ච පත්ථනාපි ච,
සබ්බයොගවිසංයුත්තා සන්තිං පාපුණිං[4] චෙතසොති.

ඉත්ථං සුදං නන්දුත්තරා ථෙරී ගාථායො අභාසිත්ථාති.

**නන්දුත්තරාථෙරීගාථා.**

**5. 6**

92. සද්ධාය පබ්බජිත්වාන අගාරස්මානගාරියං
විචරිහං තෙන තෙන ලාභසක්කාර උස්සුකා.

93. රිඤ්චිත්වා පරමං අත්ථං හීනං අත්ථමසෙවිහං
කිලෙසානං වසං ගන්ත්වා සාමඤ්ඤත්ථං න බුජ්ඣිහං.

94. තස්සා මෙ අහු සංවෙගො නිසින්නාය විහාරකෙ
උම්මග්ගපටිපන්නාම්හි තණ්හාය වසමාගතා.

95. අප්පකං ජීවිතං මය්හං ජරා ව්‍යාධි ච මද්දති,
ජරාය භිජ්ජතෙ කායො න මෙ කාලො පමජ්ජිතුං.

96. යථාභූතං අවෙක්ඛන්ති ඛන්ධානං උදයබ්බයං,
විමුත්තචිත්තා උට්ඨාසිං කතං බුද්ධස්ස සාසනන්ති.

ඉත්ථං සුදං මිත්තා කාළි ථෙරී ගාථායො අභාසිත්ථාති.

**මිත්තාකාළිථෙරීගාථා.**

---

1 සුරියඤ්ච - මජසං. 2 භුඤ්ජහං - මජසං.
3 තථාභූතං - PTS 4 පාපුණිං - PTS.

## 5. 5

87. (ඉන්ද්‍රාදීන් ආරාධනය සඳහා) ගිනිදෙවි ද (මසක් පාසා නව) සඳ ද (දවස් පතා උදය සවස) හිරු ද (හිරණ්‍යගර්භාදි බාහිර) දෙවියන් ද මම (ශුද්ධිය පතා) නමස්කාර කළමු, නදීතීර්ථයන් කරා එළඹ දියෙහි ගැලුනමු.

88. බොහෝ ව්‍රත සමාදානයෙන් හිස අඩක් මුඬු කළමු. බිම හෝනෙමි රාත්‍රිභෝජනය නො වැළඳීමි.

89. (යළි) වස්ත්‍රාලඞ්කාරයෙන් ගඳමලින් සැරසීමෙහි ඇලී නැහැවී-මෙන් හා ඇඟ ඉලීමෙන් ද කාමරාගයෙන් උපද්‍රැත වැ මේ කය සතපාලූමු.

90. මැතභාගයෙහි සැදැහැ උපදවා සස්නෙහි පැවිදි වූමු. විදර්ශනා සහිත මාර්ගඥානයෙන් මේ කය තතුසේ දක කාමරාගය (අගමිහින්) නසනලද්දේ යැ.

91. සියලු භවයෝ ද විෂයාභිලාෂ සඞ්ඛ්‍යාත ඉච්ඡාව ද අනාගතභව ප්‍රාර්ථනාව ද සිඳිනලද්දැහු යැ. කාමාදි සියලු යෝගයන්ගෙන් විසං-යුක්ත වැ චිත්තයාගේ ශාන්තියට පැමුණුමු.

මෙසෙයින් නන්දුත්තරා මෙහෙණ ගාථා කිවු යැ.

නන්දුත්තරාථේරීගාථා යි.

## 5. 6

92. මම සැදැහැයෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වැ ලාභ-සත්කාරයෙහි උත්සුක වැ (බාහුශ්‍රැත්‍ය ධර්මකථාදි) ඒ ඒ කරුණින් යුක්ත වැ වුසුමු.

93. මම (ධ්‍යානවිදර්ශනාදි) උත්තමාර්ථය හැරපියා (සිව්පස නම් වූ ආමිෂ බැවින්) හීන වූ අර්ථය සේවනා කෙළෙමි. කෙලෙස් වශයට ගොස් ශ්‍රාමණ්‍යාර්ථය මම නො දතුමු.

94. මා වසන ඔවරකයෙහි හුන් මට 'තෘෂ්ණාවශයට පැමිණ නො මග පිළිපන්මු'යි සංවේග උපන.

95. මාගේ ජීවිතය අල්ප යැ (එ ද) ජරාව ද ව්‍යාධිය ද මඩනේ වෙයි. කය ජරාව විසින් බිඳුනාලැබෙයි. මට ප්‍රමාද වන්නට මේ කල් නො වේ.

96. ස්කන්ධයන්ගේ උදයව්‍යය (අනිත්‍යාදි මනසිකාරයෙන්) ඇති සැටි බලමින් කෙලෙසුන් කෙරෙන් මිදුණු සිත් ඇති වැ නැගී සිටියමු. බුදුන්ගේ අනුසසුන් කරනලද.

මෙසෙයින් මෙත්තාකාළි මෙහෙණ ගාථා කිවු යැ.

මෙත්තාකාළිථේරීගාථා යි.

5. 7

97. අගාරස්මිං වසන්තීහං ධම්මං සුත්වාන භික්ඛුනො,
අද්දසං විරජං ධම්මං නිබ්බානං පදමච්චුතං.

98. සාහං පුත්තං ධීතරඤ්ච[1] ධනධඤ්ඤඤ්ච ඡඩ්ඩිය
කෙසෙ ඡේදාපයිත්වාන පබ්බජිං අනගාරියං.

99. සික්ඛමානා අහං සන්තී භාවෙන්තී මග්ගමඤ්ජසං,
පහාසිං රාගදොසඤ්ච තදෙකට්ඨෙ ච ආසවෙ.

100. භික්ඛුනී උපසම්පජ්ජ පුබ්බෙ ජාතිමනුස්සරිං
විසොධිතං දිබ්බචක්ඛුං විමලං සාධුභාවිතං.

101. සඞ්ඛාරෙ පරතො දිස්වා හෙතුජාතෙ පලොකිතෙ
පහාසිං ආසවෙ සබ්බෙ සීතිභූතාම්හි නිබ්බුතාති.

ඉත්ථං සුදං සකුලා ථෙරී ගාථායො අභාසිත්ථාති.

සකුලාථෙරීගාථං.

5. 8

102. දස පුත්තෙ විජායිත්වා අස්මිං රූපසමුස්සයෙ
තතොහං දුබ්බලා ජිණ්ණා භික්ඛුනිං උපසඞ්කමිං.

103. සා මෙ ධම්මමදෙසෙසි ඛන්ධායතනධාතුයො
තස්සා ධම්මං සුණිත්වාන කෙසෙ ඡෙත්වාන පබ්බජිං.

104. තස්සා මෙ සික්ඛමානාය දිබ්බචක්ඛු විසොධිතං,
පුබ්බෙනිවාසං ජානාමි යත්ථ මෙ වුසිතං පුරෙ.

105. අනිමිත්තඤ්ච භාවෙමි එකග්ගා සුසමාහිතා,
අනන්තරා විමොක්ඛාසිං අනුපාදාය නිබ්බුතා.

106. පඤ්චක්ඛන්ධා පරිඤ්ඤාතා තිට්ඨන්ති ඡින්නමූලකා,
ධි තවත්ථු ජරෙ ජම්මෙ[2] නත්ථි දානි පුනබ්භවොති.

ඉත්ථං සුදං සොණා ථෙරී ගාථායො අභාසිත්ථාති.

සොණාථෙරීගාථා.

1 ධිතඤ්ච - සී.
2 ධීධිවතත්ථුජරෙජම්මසි - PTS.

### 5. 7

97. මම් පෙර ගිහිගෙයි වසනුව් රහත් පැවිදි කෙනකුන්ගේ දහම් අසා කෙලෙස්රජස් රහිත වූ නිර්‍වාණ සඞ්ඛ්‍යාත වූ ච්‍යුති රහිත වූ අසඞ්ඛත ධර්‍මය දහම් ඇසින් දුටුමු.

98. ඒ මම් පුතු ද දුව ද ධනධාන්‍ය ද හැරපියා කෙහෙ බහවා සස්නෙහි පැවිදි වූමු.

99. සික්ඛමානාවක් වූ මම් අඤ්ජස සඞ්ඛ්‍යාත උපරි මාර්‍ගය වඩමින් රාගද්වේෂ දෙක ද තදෙකස්ථ ආශ්‍රවයන් ද දුරු කළමු.

100. උපසපන් මෙහෙණක වැ පෙරවිසූකඳපිළිවෙල සිහි කළමු විගතමල වූ බුද්ධාදි සාධූන් විසින් වඩනලද දිවැස් නුවණ පිරිසුදු කරනලද.

101. ප්‍රත්‍යුත්පන්න වූ බිදෙන සුලු වූ ත්‍රෛභූමක සංස්කාරයන් අනාත්ම හෙයින් දැක සියලු ආශ්‍රවයන් අගමගින් දුරු කළමු. සිහිල් වැ කෙලෙස් පිරිනිවතින් පිරිනිවුණුමු.

මෙසෙයින් සකුලා මෙහෙණ ගථා කිවු යැ.

සකුලාථේරිගාථං යි.

### 5. 8

102 මේ රූප සඞ්ඛ්‍යාත ශරීරයෙහි සිට දස දරු කෙනකුන් වදා එහෙයින් දුර්‍වල වැ දිරාගිය මම් මෙහෙණක කරා එළඹියමු.

103. ඒ මෙහෙණ මට ස්කන්ධායතනධාතු නිඃශ්‍රිත වූ දහම් දෙසූ ඇගේ දහම් අසා කෙහෙ බහා පැවිදි වූමු.

104. සික්ඛමානාවක වූ මා විසින් දිවැස පිරිසුදු කරනලද. පෙර යම් ජාතියක මාගේ වාස වි ද ඒ පෙර විසූ කඳපිළිවෙල දනිමි.

105. එකඟ වූ සමාහිත වූ සිත් ඇති වැ අනිමිත්තභාවනාව වඩමි රහත්මඟට අනතුරු වැ උපන් විමොක්‍ෂ ඇති වූමු. රූපාදි කිසි දහමක් උපාදන නො කොට නිවුණුමු.

106. පරිඥාත වූ පඤ්චස්කන්ධයෝ සුන්මුල් ඇති වැ සිටිති. ලාමක වූ ජරාව, තිට නිගා වේවා. දැන් පුනර්භවයෙක් නැති.

මෙසෙයින් සොණා මෙහෙණ ගාථා කිවු යැ.

සොණාථේරිගාථං යි.

## 5 9

107. ලූනකෙසී පඞ්කධරී එකසාටී පුරෙ චරිං,
අවජ්ජෙ වජ්ජමතිනී වජ්ජෙ චාවජ්ජදස්සිනී

108. දිවාවිහාරා නික්ඛම්ම ගිජ්ඣකූටම්හි පබ්බතෙ
අද්දසං විරජං බුද්ධං භික්ඛුසඞ්ඝපුරක්ඛතං.

109. නිහච්ච ජාණුං වන්දිත්වා සම්මුඛා පඤ්ජලිං අකං,
එහි භද්දෙති මං අවච සා මෙ ආසූපසම්පදා.

110. චිණ්ණා අඞ්ගා ච මගධා වජ්ජී කාසී ච කොසලා,
අනණා පණ්ණාසවස්සානි රට්ඨපිණ්ඩමභුඤ්ජහං.

111. පුඤ්ඤං වත පසවී බහුං සප්පඤ්ඤො වතායං උපාසකො,
යො භද්දාය චීවරං අදාසි විප්පමුත්තාය සබ්බගන්ථෙහීති.

ඉත්ථං සුදං භද්දා කුණ්ඩලකෙසා ථෙරී ගාථායො අභාසිත්ථාති.

භද්දාකුණ්ඩලකෙසාථෙරීගාථා.

## 5. 10

112. නඞ්ගලෙහි කසං ඛෙත්තං බීජානි පවපං ඡමා,
පුත්තදාරානි පොසෙන්තා ධනං වින්දන්ති මාණවා.

113. කිමහං සීලසම්පන්නා සත්ථුසාසනකාරිකා,
නිබ්බානං නාධිගච්ඡාමි අකුසීතා අනුද්ධතා.

114. පාදෙ පක්ඛාලයිත්වාන උදකෙසු කරොමහං,
පාදොදකඤ්ච දිස්වාන ථලතො නින්නමාගතං.

115. තතො චිත්තං සමාධෙසිං අස්සං භද්‍රං'වජානියං,
තතො දීපං ගහෙත්වාන විහාරං පාවිසිං අහං.

116. සෙය්‍යං ඔලොකයිත්වාන මඤ්චකම්හි උපාවිසිං,
තතො සූචිං ගහෙත්වාන වට්ටිං ඔකස්සයාමහං
පදීපස්සෙව නිබ්බානං විමොක්ඛො අහු චෙතසොති.

ඉත්ථං සුදං පටාචාරා ථෙරී ගාථායො අභාසිත්ථාති.

පටාචාරාථෙරීගාථා.

5. 9

107. පෙර නුවටු වැ තල්ඇටින් සුත් කෙහෙ ඇති වැ දත්මල ඇති වැ එක්සළුවක් හැඳ පෙරෙවැ අනවද්‍යයෙහි සාවද්‍ය යැ යන දෘෂ්ටි ඇති වැ සාවද්‍යයෙහි අනවද්‍ය යැ යි දක්මින් හැසිරුණුමු.

108. ගිජුකුළු පව්යෙහි දිවාවිහාරස්ථානයෙන් නික්ම භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරනලද, කෙලෙස්රජස් රහිත වූ බුදුන් දුටුමු.

109. බුදුන් හමුයෙහි දෙදණ බිමැ පිහිටුවා වැඳ ඇඳිලි කළමු. 'එව භද්‍රාවෙති'යි (බුදුහු) මට වදාළහ. ඒ මට උපසමපත් විය.

110. අංග මගධ වජ්ජි කාසි කොසල යන යම් ජනපද කෙනෙක් (පෙර මා විසින්)හැසිරෙනලද්දුහු ද (එහි මැ) ණය රහිත වැ (රහත් වැ) පනස්වසක් මම රටවැසියා දුන් පිඬුවා වැළඳුමු.

111. සප්‍රාඥ වූ යම් උපාසකයෙක් සියලු ග්‍රන්ථයන්ගෙන් මිදුණු භද්‍රා මෙහෙණහට සිවුරු දුන්නේ ද ඔ ෙම තෙම බොහෝ පින් රැස් කෙළේ වී.

මෙසෙයින් භද්‍රාකුණ්ඩලකෙසා මෙහෙණ ගාථා කිවු යැ.

භද්‍රාකුණ්ඩලකේසාථේරීගාථා යි.

5. 10

112. මානවකයෝ නගුලින් කුඹුර සාමින් භූමියෙහි බිජු වපුරන්නාහු අඹුදරුවන් පෝෂණය කෙරෙමින් ධනය ලබත්.

113. ශීලසමපන්න වූ ශාස්තෘන් වහන්සේගේ සසුන් කරන නුකුසි වූ උඩගු නො වූ මම කුමක් හෙයින් නිවන පසක් නො කෙරෙම් ද?

114. පා දෝනා හේතුයෙන් (තුන් වරක්) දිය ඔත් කල්හි උස්බිමින් පහතට ගලාගිය පාදෙවුන් දිය දැක මම් නිමිති කෙරෙමි.

115. අනතුරු වැ භද්‍ර වූ ආජානීය අශ්වයකු සෙයින් සිත විදර්ශනා-සමාධියෙන් සමාහිත කළමු. ඉක්බිති මම පහන අතින් ගෙන විහාරයට පිවිසියමු.

116. ශයනය පහන්එළියෙන් බලා ඇඳෙහි හිඳගතුමු. ඉක්බිති මම හිඳ ගෙන (පහන නිවන්නට) වැටිය ඇදපූමු. (එසඳ) පහන නිවීමක් මෙන් චිත්තයාගේ විමෝක්ෂය වී.

මෙසෙයින් පටාචාරා මෙහෙණ ගාථා කිවු යැ.

පටාචාරාථේරීගාථා යි.

## 5. 11

117. මුසලානි ගහෙත්වාන ධඤ්ඤං කොට්ටෙන්ති මානවා[1]
පුත්තදාරානි පොසෙන්තා ධනං වින්දන්ති මානවා[1];

118. කරොථ බුද්ධසාසනං යං කත්වා නානුතප්පති,
ඛිප්පං පාදනි ධොවිත්වා එකමන්තෙ නිසීදථ,
චෙතොසමථමනුයුත්තා කරොථ බුද්ධසාසනං.

119. තස්සා තා වචනං සුත්වා පටාචාරාය සාසනං,
පාදෙ පක්ඛාලයිත්වාන එකමන්තං උපාවිසුං,
චෙතොසමථමනුයුත්තා අකංසු බුද්ධසාසනං.

120 රත්තියා පුරිමෙ යාමෙ පුබ්බජාතිං අනුස්සරුං,
රත්තියා මජ්ඣිමෙ යාමෙ දිබ්බචක්ඛුං විසොධයුං,
රත්තියා පච්ඡිමෙ යාමෙ තමොක්ඛන්ධං පදාලයුං.

121. උට්ඨාය පාදෙ වන්දිංසු කතා තෙ අනුසාසනී,
ඉන්දංව තිදසා දෙවා සඞ්ගාමෙ අපරාජිතං,
පුරක්ඛත්වා විහරියාම තෙවිජ්ජම්හ අනාසවාති.

ඉත්ථං සුදං තිංසමත්තා ථෙරී භික්ඛුනියො ගාථායො අභාසිත්ථාති.

තිංසමත්තාථෙරී භික්ඛුනීගාථා.

## 5. 12

122. දුග්ගතාහං පුරෙ ආසිං විධවා ච අපුත්තිකා,
විනා මිත්තෙහි ඤාතීහි භත්තචොළස්ස නාධිගං.

123. පත්තං දණ්ඩඤ්ච ගණ්හිත්වා භික්ඛමානා කුලාකුලං,
සීතුණ්හෙන ච ඩය්හන්ති සත්තවස්සානි චාරිහං.

124. භික්ඛුනිං පුන දිස්වාන අන්නපානස්ස ලාභිනිං,
උපසඞ්කම්මාවොචං පබ්බජ්ජං අනගාරියං.

125. සා ච මං අනුකම්පාය පබ්බාජෙසි පටාචාරා,
තතො මං ඔවදිත්වාන පරමත්ථෙ නියොජයි.

126. තස්සාහං වචනං සුත්වා අකාසිං අනුසාසනිං,
අමොඝොය්යාය ඔවාදො තෙවිජ්ජම්හි අනාසවාති.

ඉත්ථං සුදං චන්දා ථෙරී ගාථායො අභාසිත්ථාති.

චන්දාථෙරීගාථා.

## පඤ්චකනිපාතො නිට්ඨිතො.

1 මාණවා - මජසං

5. 11

117. මිනිස්හු මොහොල් ගෙන ධාන්‍ය කොටති. මිනිස්හු අඹුදරුවන් පුස්මින් ධනය ලබත්.

118. යම් අනුසස්නක් කොට නො තැවේ ද ඒ බුදුසසුන් කරව, වහා පා දෙව විවේකස්ථානයෙකැ හිඳුව. චිත්තශමථයෙහි යෙදී කමටහන් භාවනා විසින් බුද්ධශාසනය කරව.

119 ඒ මෙහෙණහු ඒ පටාචාරාවගේ ඔවා බස් අසා පා දෙව විවේක-ස්ථානයෙකැ හුන්හ. චිත්තශමථයෙහි යෙදුණාහු බුදුසසුන් කළහ.

120. රෑ පෙරයමැ පෙරවිසූකඳපිළිවෙල සිහි කළහ. රෑ මැදියමැ දිවැස පිරිසිදු කළහ. රෑ අලුයමැ මොහඳුරුකඳ බිඳලූහ.

121. හුනස්නෙන් නැඟිසිට (තොපගේ අනුසසුන් කරනලදැ’යි) පසඟපිහිටුවා පා වැන්දුහ. තිදස්පුරවැසි දෙවියෝ සඞ්ග්‍රාමයෙහි දිනූ ඉන්ද්‍රයා සෙයින් (ඇපි තොප) පෙරටු කොට වාස කරම්හ. ත්‍රිවිද්‍යා ඇති අනාස්‍රව වූම්හ.

මෙසෙයින් තිසක් පමණ මෙහෙණහු ගාථා කිවූ යැ.

තිංසථේරීගාථා සි.

5. 12

122. මම පෙර හිමියා නැති දූපුතුන් නැති දුක්පත් වූවක් වූමු. ඥාතිමිත්‍රයන් නැති වූමු. (එසින් මැ) බත්පිළී නො ලත්මු.

123. මම මැටිපය ද දඬුකඩක් ද ගෙන ගෙන් ගෙට සිඟමින් ශීතොෂ්ණයෙන් දැවෙමින් සත්වසක් හැසිරුණුමු.

124. යළි ආහාරපාන ලබනසුලු පටාචාරා මෙහෙණ දැක ඇය කරා එළඹ සසුන්පැවිද්ද (‘දෙනුමැනැවැ’යි) කීමු

125. ඒ පටාචාරා මෙහෙණ ද අනුකම්පායෙන් මා පැවිදි කළා. ඉක්බිති ඔවාදී මා පරමාර්ථයෙහි (කමටහන් කියා) යෙදූ

126. මම ඇය බස් අසා ඒ අනුසසුන් කළමු. ආර්යාවගේ ඔවා නො සිස් විය. ත්‍රිවිද්‍යාප්‍රාප්ත වූමු. අනාස්‍රව වූමු.

මෙසෙයින් චන්‍දා මෙහෙණ ගාථා කිවූ යැ.

චන්‍දාථේරීගාථා සි.

## පඤ්චකනිපාතය නිමි.

# 6. ඡක්කනිපාතො.

### 6. 1

127. යස්ස මග්ගං න ජානාති ආගතස්ස ගතස්ස වා
තං කුතො ආගතං සත්තං මම පුත්තොති රොදසි.

128. මග්ගඤ්ච ඛොස්ස ජානාසි ආගතස්ස ගතස්ස වා
න නං සමනුසොචෙසි එවං ධම්මා හි පාණිනො.

129. අයාචිතො තතාගච්ඡි අනනුඤ්ඤාතො[1] ඉතො ගතො
කුතොචි නූන ආගන්ත්වා වසිත්වා කතිපාහකං
ඉතො'පි අඤ්ඤෙන ගතො තතො අඤ්ඤෙන[2] ගච්ඡති.

130. පෙතො මනුස්සරූපෙන සංසරන්තො ගමිස්සති,
යථාගතො තථා ගතො කා තත්ථ පරිදෙවනා.

131. අබ්බහී වත මෙ සල්ලං දුද්දසං හදයනිස්සිතං[3]
යා මෙ සොකපරෙතාය පුත්තසොකං ව්‍යපානුදි.

132. සාජ්ජ අබ්බූළ්හසල්ලාහං නිච්ඡාතා පරිනිබ්බුතා
බුද්ධං ධම්මඤ්ච සඞ්ඝඤ්ච උපෙමි සරණං මුනිං.

ඉත්ථං සුදං පඤ්චසතමත්තා ථෙරී භික්ඛුනියො ගාථායො අභාසිත්ථාති.

පඤ්චසතමත්තානං ථෙරීනං ගාථා.

### 6. 2

133. පුත්තසොකෙනහං අට්ටා ඛිත්තචිත්තා විසඤ්ඤිනී,
නග්ගා පකිණ්ණකෙසී ච තෙන තෙන විචාරිහං.

134. වසිං[4] සඞ්කාරකූටෙසු සුසානෙ රථියාසු ච
අචරිං තීණි වස්සානි ඛුප්පිපාසා සමප්පිතා.

135. අථද්දසාසිං[5] සුගතං නගරං මිථිලං පති,[6]
අදන්තානං දමෙතාරං සම්බුද්ධමකුතොභයං.

136. සචිත්තං[7] පටිලද්ධාන වන්දිත්වාන උපාවිසිං
සො මෙ ධම්මමදෙසෙසි අනුකම්පාය ගොතමො.

137. තස්ස ධම්මං සුණිත්වාන පබ්බජිං අනගාරියං
යුඤ්ජන්තී සත්ථු වචනෙ සච්ඡාකාසිං පදං සිවං.

138. සබ්බෙ සොකා සමුච්ඡින්නා පහීනා එතදන්තිකා
පරිඤ්ඤාතා හි මෙ වත්ථූ යතො සොකාන සම්භවො.

ඉත්ථං සුදං වාසෙට්ඨී ථෙරී ගාථායො අභාසීති.

වාසෙට්ඨීථෙරීගාථා.

1 නානුඤ්ඤාතො - මජ්ඣං 2. තතොචඤ්ඤෙන - මජ්ඣං 3. හදයස්සිතං - මජ්ඣ
4. වසි - මජ්ඣං. 5. අථද්දස්සාමි PTS 6. ගතං - PTS 7. සංචිත්තං - PTS.

# 6. ඡක්කනිපාතය.

## 6. 1

127. මෙලොවට ආවාවූ හෝ මෙලොවින් ගියාවූ හෝ යම් මැ කෙනකුගේ ආගියමග නො දන්නේ ද, කොහි සිට ආවාවූ ඒ සතකු ගෙන 'මාගේ පුත්‍රයහ'යි අඬන්නෙහි ද?

128. මෙලොවට ආවාවූ හෝ මෙලොවින් ගියාවූ හෝ ඔහුගේ මග දන්නෙහි ද ඔහු ගෙන ශෝක නො කරන්නෙහි යැ. ප්‍රාණීහු මෙබඳු සැහැවි ඇත්තාහු යැ.

129. නො යදනාලදු වැ එලොවින් ආයේ යැ, නො අනුදන්නාලදු වැ මෙලොවින් ගියේ යැ කිසියම් ගතියක සිට මෙලොව අවුත් කිහිප දිනක් වැස මෙලොවිනුදු අන් ගතියකට පිළිසඳ විසින් ගියේ යැ එයිනුදු අන් භවයකට යෙයි.

130. මළේ මනුෂ්‍ය ආදී රූපයෙන් සැරිසරමින් යෙයි යම්සේ ආයේ වේ ද එසේ ගියේ යැ, එහිලා කවර පරිදේවනායෙක් ද!

131. යම් මෙහෙණක් ශොකයෙන් මඩනාලද මාගේ පුත්‍රශොකය දුරලූ ද ඕතොමෝ මාගේ නො දැකියහෙන ළය ඇසුරු කළ ශෝක නමැති හුල ඒකාන්තයෙන් උදුරා ලූ යැ.

132. මම දූන් උදුරාලූ හුල් ඇති වැ තෘෂ්ණා නැති වැ පිරිනිවි බුදුන් දහම් සඟුන් සරණ කොට යෙමි.

මෙසෙයින් පන්සියක් පමණ තෙරණිහු ගාථා කීහු.

පන්සියක් පමණ තෙරණින්ගේ ගාථා. යි

## 6. 2

133. මම් පුත්‍රශෝකයෙන් පීඩිත වැ එහෙයින් මැ විසංඥ වැ එයින් මැ නග්න වැ විසුලු කෙහෙ ඇති වැ ඒ ඒ තැන හැසිරුණුමි.

134. කසලගොඩෙහි ද සොහොන්හි ද රියමග ද වාස කළමි. තුන්වසක්කල් සාපවසින් පෙළෙමින් හැසිරුණුමි.

135. අනතුරු ව මිහුලුනුවර බලා වඩනා අදාන්තයන් දමනය කරන කොයිනුදු බිය නැති සුගත වූ සම්බුද්ධයන් වහන්සේ දුටුමි.

136. පියවි සිත් ලැබ වැඳ ඔබ කරා එළැඹුමි, ඒ ගොයුම්ගොත් බුදුහු මට අනුකම්පායෙන් දහම් දෙසූසේක.

137. ඔබ ගේ දහම් අසා සසුන්හි පැවිදි වූමු. බුද්ධ වචනයෙහි (භාවනානුයොග වශයෙන්) යෙදෙමින් නිර්වාණ පදය පසක් කළමි.

138. තෙල තිවන කෙලවර කොට ඇති සියලු ශෝකයො මුලුසුන්හ ප්‍රහීණයහ. යම් වස්තුයෙක ශොකසම්භවය වේ ද, මා විසින් ඒ වස්තුහු ත්‍රිවිධ පරිඥයෙන් දන්නා ලදහ.

මෙසෙයින් වාසෙට්ඨී මෙහෙණ ගාථා කිවු ය.

වාසෙට්ඨී ථේරීගාථා. යි,

### 6. 3

139. දහරා ත්වං රූපවතී අහම්පි දහරො යුවා,
පඤ්චඞ්ගිකෙන තුරියෙන එහි ඛෙමෙ රමාමසෙ.

140. ඉමිනා පූතිකායෙන ආතුරෙන පභඞ්ගුනා
අට්ටියාමි[1] හරායාමි කාමතණ්හා සමූහතා.

141 සත්තිසූලූපමා කාමා ඛන්ධාසං[2] අධිකුට්ටනා
යං ත්වං කාමරතිං බ්‍රෑසි අරති දනි සා මම.[3]

142. සබ්බත්ථ විහතා නන්දි තමොක්ඛන්ධො පදලිතො
එවං ජානාහි පාපිම නිහතො ත්වමසි අන්තක.

143. නක්ඛත්තානි නමස්සන්තා අග්ගිං පරිචරං වනෙ
යථාභුච්චං අජානන්තා බාලා සුද්ධිං අමඤ්ඤථ.

144 අහඤ්ච ඛො නමස්සන්තී සම්බුද්ධං පුරිසුත්තමං
පරිමුත්තා සබ්බදුක්ඛෙහි සත්ථුසාසනකාරිකාති.

ඉත්ථං සුදං ඛෙමා ථෙරී ගාථායො අභාසීති.

ඛෙමාථෙරීගාථා.

### 6. 4

145 අලඞ්කතා සුවසනා මාලිනී චන්දනුක්ඛිතා
සබ්බාභරණසඤ්ඡන්නා දසීගණපුරක්ඛතා.

146 අන්නං පානඤ්ච ආදාය ඛජ්ජභොජ්ජමනප්පකං
ගෙහතො නික්ඛමිත්වාන උය්‍යානමභිහාරයිං.

147. තත්ථ රමිත්වා කීළිත්වා ආගච්ඡන්තී සකං ඝරං
විහාරං දට්ඨුං[4] පවිසිං සාකෙතෙ අඤ්ජනං වනං.

148. දිස්වාන ලොකපජ්ජොතං වන්දිත්වාන උපාවිසිං
සො මෙ ධම්මමදෙසෙසි අනුකම්පාය චක්ඛුමා.

149 සුත්වා ච ඛො මහෙසිස්ස සච්චං අප්පටිවිජ්ඣහං
තත්ථෙව විරජං ධම්මං ඵුස්සයිං අමතං පදං.

150. තතො විඤ්ඤාතසද්ධම්මා පබ්බජිං අනගාරියං
තිස්සො විජ්ජා අනුප්පත්තා අමොඝං බුද්ධසාසනං.

ඉත්ථං සුදං සුජාතා ථෙරී ගාථායො අභාසීති.

සුජාතාථෙරීගාථා.

---

1 අද්දියාමි - PTS. 2. ඛන්ධාන - PTS. 3. මමං - PTS.
4. දක්ඛිං - PTS.

## 6. 3

139. ඛේමාවෙනි තෝ යොවුන් විය පත් රූපවත්හු. මම ද යොවුන් පත් තරුණයෙමි. එව පසඟතුරුයෙන් රමණය කරම්හ.

140. ආතුර වූ බිඳෙනසුලු මේ කුණුකයින් පිළිකුල් කරමි. විලි ඇති කරමි, කාමතෘෂ්ණාවෝ මුලුසුන් කරන ලදහ.

141. කාමයෝ සැත්හුල් වැනියහ, ස්කන්ධයෝ ඔවුනට මස්ලොඹු වැනියහ, තෝ යම් කාමරතියක් කියෙහි ද, එය දැන් මට අරතියෙකි.

142 හැම තන්හි තෘෂ්ණා නසන ලදු, මොහඳුරු කඳ පළන ලදි, මාරය, මෙසේ දනුව, මාරය තෝ නටුයෙහි.

143. බාලයෝ නකත් වඳනාහු වනයෙහි ගිනිදෙවි පුදනුවෝ යථා-භූතාර්ථය නො දන්නාහු ශුද්ධිය සිතූහු.

144. මමත් පුරුෂෝත්තම සම්‍යක් සම්බුද්ධයන් වඳිමින් බුදුන් ගේ අනුසසුන්කරු වී හැම දුකින් මිදුණුමු.

මෙසෙයින් ඛේමාථේරී ගාථා කිවු ය.

ඛේමාථේරීගාථා යි.

## 6. 4

145. අලඞ්කෘත ව මනා අවජාදන ඇති ව මල්දම් ධර ව චන්දනා-ලඞ්කයෙන් අනුලිප්ත ව සර්වාභරණයෙන් ගැවසු සිරුරු ඇති ව දසිගණයා විසින් පුරස්කෘත ව-

146. ආහාර හා පානවග් ද අනල්ප ඛාද්‍ය භොජ්‍ය ද ගෙන ගෙයින් නික්මැ උයනට එළැවීමි.

147. එ උයන්හි රමණය කොට කෙළැ සියගෙට එන මම සාකේත නුවර සමීපයෙහි වූ අඤ්ජනවන විහාරය දක්නට පිවිසීමි.

148. ලොවට පහන් වැනි බුදුන් දැක වැඳැ ඔබ කරා එළැඹීමි, ඒ පසැස් වූ බුදුහු අනුකම්පායෙන් මට දහම් දෙසූහු.

149. මහර්ෂි බුදුන් ගේ බස් අසා මම සත්‍යප්‍රතිවේධ කළමි, එ අසුන්හි මැ විරාගධර්ම සඞ්ඛ්‍යාත අමෘතපදය පසක් කළමි.

150. ඉක්බිති දත් දහම් ඇති ව සසුන්හි පැවිදි වීමි, ත්‍රිවිද්‍යාවෝ ලබන ලදහ. බුදුසසුන් නො සිස් වෙයි.

මෙසෙයින් සුජාතාථේරී ගාථා කිවු ය.

සුජාතා ථේරීගාථා යි.

### 6. 5

151. උච්චෙ කුලෙ අහං ජාතා බහුවිත්තෙ මහද්ධනෙ
වණ්ණරූපෙන සම්පන්නා ධීතා මෙඝස්ස අත්‍රජා.

152. පත්ථිතා රාජපුත්තෙහි සෙට්ඨිපුත්තෙහි ගිජ්ඣිතා[1]
පිතු මෙ පෙසයී දූතං දෙථ මය්හං අනොපමං.

153. යත්තකං තුලිතා එසා තුය්හං ධීතා අනූපමා
තතො අට්ඨගුණං දස්සං හිරඤ්ඤං රතනානි ච.

154. සාහං දිස්වාන සම්බුද්ධං ලොකජෙට්ඨං අනුත්තරං
තස්ස පාදානි වන්දිත්වා එකමන්තං උපාවිසිං.

155. සො මෙ ධම්මමදෙසෙසි අනුකම්පාය ගොතමො
නිසින්නා ආසනෙ තස්මිං ඵුස්සයිං[2] තතියං ඵලං.

156. තතො කෙසානි ඡෙත්වාන පබ්බජිං අනගාරියං
අජ්ජ මෙ සත්තමී රත්ති යතො තණ්හා විසොසිතා.

ඉත්ථං සුදං අනොපමා ථෙරී ගාථායො අභාසිත්ථ.

**අනොපමාථෙරීගාථා.**

### 6. 6

157. බුද්ධවීර නමොත්‍යත්‍ථු සබ්බසත්තානමුත්තම
යො මං දුක්ඛා පමොචෙසි අඤ්ඤඤ්ච බහුකං ජනං

158. සබ්බදුක්ඛං පරිඤ්ඤාතං හෙතුතණ්හා විසොසිතා
භාවිතො අට්ඨඞ්ගිකො[3] මග්ගො නිරොධො ඵුසිතො මයා

159. මාතා පුත්තා පිතා භාතා අය්‍යකා ච පුරෙ අහුං
යථාභුච්චං අජානන්තී සංසරිහං අනිබ්බිසං.

160. දිට්ඨො හි මෙ සො භගවා අන්තිමො'යං සමුස්සයො
වික්ඛීණො ජාතිසංසාරො නත්ථි දානි පුනබ්භවො.

161. ආරද්ධවිරියෙ පහිතත්තෙ නිච්චං දළ්හපරක්කමෙ
සමග්ගෙ සාවකෙ පස්සෙ එසා බුද්ධාන වන්දනා.

162. බහුන්නං[4] වත අත්ථාය මායා ජනයි ගොතමං
ව්‍යාධිමරණතුන්නානං දුක්ඛක්ඛන්ධං ව්‍යපානුදී'ති.

ඉත්ථං සුදං මහාපජාපතීගොතමී ථෙරී ගාථායො අභාසිත්ථ.

**මහාපජාපතීගොතමීථෙරීගාථා.**

---

1. ගිජ්ඣිතා - PTS. 2. ඵුසයිං - ප. 3. අරියට්ඨඞ්ගිකො - සිමු.
4. බහූනං - මජසං.

## 6. 5

151. මම බොහෝ තුෂ්ටිජනක ද්‍රව්‍ය ඇති මහද්ධන ඇති උදාර වූ වෛශ්‍යකුලයෙහි උපන්මි. වර්ණයෙන් හා රූපයෙන් සම්පන්න වූ මේඝ නම් සිටු හට ඖරස දුවක් වීමි,

152. රජදරුවන් විසින් පතන ලදිමි, සිටු දරුවන් විසින් කැමැති වන ලදිමි, "මට අනෝපමා දුව දෙව"යි මපිය හට දූතයකු එවී

153. තොප ගේ දූ වූ තෙල අනෝපමාව යම්තාක් ධන වටිනී තුලනා කරන ලදු ද, එයට වඩා අටගුණයක් හිරණ්‍ය හා රත්න දෙමි, කියා යි.

154. ඒ මම ලෝකජ්‍යෙෂ්ඨ වූ අනුත්තර වූ සම්බුදුන් දැක ඔබ ගේ පා වැඳ එකත්පස් ව හුනිමි.

155. ඒ ගොයුම්ගොත් බුදුහු අනුකම්පායෙන් මට දහම් දෙසූහ, එ අසුන්හි හුන් මම අනාගාමිඵල පසක් කළෙමි.

156. ඉක්බිති කෙස් බහා සසුන්හි පැවිදි වීමි, යම් දිනෙක තෘෂ්ණා නසනා ලදු ද එතැන් සිට මට අද සත්වන දිනය යි.

මෙසෙයින් අනෝපමාථේරී ගාථා කිවූ ය.

**අනොපමාථේරී ගාථා සි.**

## 6. 6.

157. යමෙක් සසරදුකින් මා හා අන්‍ය බොහෝ ජනයාත් මුදාලී ද සර්ව සත්වොත්තම වූ බුද්ධවීරයන් වහන්ස, ඒ තොප වහන්සේට නමස්කාර වේවා.

158. මා විසින් හැම දුක් සම්පූර්ණකාරයෙන් දන්නා ලද, හේතු තෘෂ්ණාව නසනා ලදු, ආර්‍යාෂ්ටාංගිකමග ද නිරෝධය ද ඥානස්පර්ශයෙන් පසක්නා ලදි.

159. මම (ප්‍රවෘත්ති හේතු ආදි) යථාභූතාර්ථය නො දන්මින් සසර-මුහුදෙහි පිහිටක් නො ලබමින් අපරාපරොත්පත්ති විසින් සැරිසැරීමි. අතීතයෙහි වරෙක මවු වීමි, වරෙක පුත් වීමි. වරෙක පිය වීමි වරෙක සොහොයුරු වීමි, වරෙක මුත්තු වීමි.

160. මා විසින් ඒ භාග්‍යවතුන් වහන්සේ නුවණැසින් දක්නා ලදහ. මේ අන්තිම දේහය වෙයි, ජාති සංසාරය ක්ෂීණ විය. දැන් පුනර්භවයෙක් නැත.

161. රැකුළු වැර ඇති නිවනට මෙහෙයූ සිත් ඇති සතතයෙන් දැඩි පරාක්‍රම ඇති ශීලාදීන් සමග ව සිටි සව්වන් දකුමි. තෙල වඳනා ඒ බුදුනට වෙයි.

162. මහාමායා තොමෝ බොහෝ දෙනාට වැඩ පිණිස මැ ගොයුම්-ගොත් බුදුන් ප්‍රසව කළා (එසේ මැ යැ) ව්‍යාධි මරණ දෙකින් පෙළෙනුවන් ගේ දුඃඛරාශිය බැහැර කළේ යි.

මෙසෙයින් මහාප්‍රජාපතී ගොතමී මෙහෙණ ගාථා කිවූ ය.

**මහාපජාපතී ගෝතමිථේර ගාථා සි.**

## 6. 7

163. ගුත්තෙ යදත්ථං පබ්බජ්ජා හිත්වා පුත්තං පසුං පියං
තමෙව අනුබ්‍රූහෙහි මා චිත්තස්ස වසං ගමි.

164. චිත්තෙන වඤ්චිතා සත්තා මාරස්ස විසයෙ රතා
අනෙකජාතිසංසාරං සන්ධාවන්ති අවිද්දසු.

165. කාමච්ඡන්දඤ්ච ව්‍යාපාදං සක්කායදිට්ඨිමෙව ච
සීලබ්බතපරාමාසං විචිකිච්ඡඤ්ච පඤ්චමං.

166. සඤ්ඤොජනානි එතානි පජහිත්වාන භික්ඛුනී,
ඔරම්භාගමනීයානි නයිදං පුනරෙහිසි.

167. රාගං මානං අවිජ්ජඤ්ච උද්ධච්චඤ්ච විවජ්ජිය,
සඤ්ඤොජනානි ඡෙත්වාන දුක්ඛස්සන්තං කරිස්සසි.

168. ඛෙපෙත්වා ජාතිසංසාරං පරිඤ්ඤාය පුනබ්භවං
දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතා උපසන්තා චරිස්සසීති.

ඉත්ථං සුදං ගුත්තා ථෙරී ගාථායො අභාසීති.

ගුත්තාථෙරීගාථා.

## 6. 8

169. චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං විහාරා උපනික්ඛමිං
අලද්ධා චෙතසො සන්තිං චිත්තෙ අවසවත්තිනී.

170. භික්ඛුනිං උපසඞ්කම්ම සක්කච්චං පරිපුච්ඡහං,
සා මෙ ධම්මමදෙසෙසි ධාතු ආයතනානි ච.

171. චත්තාරි අරියසච්චානි ඉන්ද්‍රියානි බලානි ච,
බොජ්ඣඞ්ගට්ඨඞ්ගිකං මග්ගං උත්තමත්ථස්ස පත්තියා.

172. තස්සාහං වචනං සුත්වා කරොන්තී අනුසාසනිං,
රත්තියා පුරිමෙ යාමෙ පුබ්බජාතිමනුස්සරිං.

173. රත්තියා මජ්ඣිමෙ යාමෙ දිබ්බචක්ඛුං විසොධයිං,
රත්තියා පච්ඡිමෙ යාමෙ තමොක්ඛන්ධං පදාලයිං.

174. පීතිසුඛෙන ච කායං ඵරිත්වා විහරිං තදා,
සත්තමියා පාදෙ පසාරෙසිං තමොක්ඛන්ධං පදාලියාති.

ඉත්ථං සුදං විජයා ථෙරී ගාථායො අභාසීති.

විජයාථෙරීගාථා.

## ඡක්කනිපාතො නිට්ඨිතො.

6. 7

163. ගුත්තාවෙනි, ප්‍රිය වූ පුතු ද වස්තුව ද හැරපියා යම් කෙලශ-පරිනිර්වාණ සඞ්ඛාත පරිනිර්වාණයක් සඳහා බ්‍රම්සරවස් කැමැතිවනලද ද එය මැ පුනපුනා වඩව, චිත්තවශයට නහමක් යා.

164. චිත්තයා විසින් නුළු කරනලද අවිද්වත් සත්ත්වයෝ මාරයාගේ විෂයෙහි ඇලුණාහු නොයෙක් ජාතිසංසාරයෙහි දිවෙති.

165. කාමච්ඡන්දය ව්‍යාපාදය සත්කායදෘෂ්ටිය ශීලව්‍රතපරාමර්ශය පස්වැනි විචිකිත්සා යි.

166. කාමධාතුවට පමුණුවන්නාව තිසි තෙල සංයොජනයන් අනාගාමි මගින් හැරපියා මෙහෙණ නැවැත මෙ භවයට නො ඒ.

167. රූපාරූපරාග ද මානය ද අවිද්‍යා ද ඖද්ධත්‍යය ද හැර පසුව උද්ධම්භාගිය සංයොජනයනුදු සිඳ දුක් කෙළවර කරව.

168. ජාතිසංසාරය ක්ෂය කොට පුනර්භවය පිරිසිඳ ගෙන ඉහාත්මයෙහි ම නිස්තෘෂ්ණ වැ උපශාන්ත වැ ඉරියව් පවත්ම.

මෙසෙයින් ගුත්තා මෙහෙණ ගාථා කිවු යැ

ගුත්තාථෙරීගාථා යි.

6. 8

169. චිත්තයෙහි අවශවර්ති වැ චිත්තශාන්තිය නො ලදින් සතර පස් වරක් විහාරයෙන් නික්ම ගියමි.

170–171. ඛේමා මෙහෙණ කරා එළඹ මම සකසා පරිපෘච්ඡා කළමි. මට නිර්වාණප්‍රාප්තිය සඳහා ධාතුආයතනයෝ යැ චතුරාර්‍ය්‍ය-සත්‍යයෝ යැ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයෝ යැ ශ්‍රද්ධාදි බලයෝ යැ බොධ්‍යඞ්ග හා අෂ්ටාඞ්ගිකමාර්ගී යැ යන දහම් දෙසූ.

172. මම ඇයගේ බස් අසා අනුසසුන් කරමින් රැය පළමු යමැ පූර්වනිවාසානුගත ඥානය සිහි කළමි.

173. රැය මැදුම් යමැ දිවැස් ශුද්ධ කළමි. රැය පැසිම් යමැ මොහස්කන්ධය බිඳ ලූමි.

174. එකලැ ප්‍රීතිසුඛයෙන් නාමකාය ස්පර්ශ කොට ගෙන වාස කළමි. සත්වන දින මොහස්කන්ධය බිඳපියා පාදප්‍රසාරණ ද කළමි.

මෙසෙයින් විජයා මෙහෙණ ගාථා කිවු යැ.

විජයාථෙරීගාථා යි

ඡක්කනිපාතය නිමි.

# 7. සත්තකනිපාතො

## 7. 1

175. මුසලානි ගහෙත්වාන ධඤ්ඤං කොට්ටෙන්ති මාණවා,
පුත්තදාරානි පොසෙන්තා ධනං වින්දන්ති මාණවා.

176. ඝටෙථ බුද්ධසාසනෙ යං කත්වා නානුතප්පති,
ඛිප්පං පාදානි ධොවිත්වා එකමන්තං නිසීදථ.

177. චිත්තං උපට්ඨපෙත්වාන එකග්ගං සුසමාහිතං,
පච්චවෙක්ඛථ සඞ්ඛාරෙ පරතො නො ච අත්තතො.

178. තස්සාහං වචනං සුත්වා පටාචාරානුසාසනිං,
පාදෙ පක්ඛාලයිත්වාන එකමන්තෙ උපාවිසිං.

179. රත්තියා පුරිමෙ යාමෙ පුබ්බජාතිමනුස්සරිං,
රත්තියා මජ්ඣිමෙ යාමෙ දිබ්බචක්ඛුං විසොධයිං.

180. රත්තියා පච්ඡිමෙ යාමෙ තමොක්ඛන්ධං පදාලයිං,
තෙවිජ්ජා අථ වුට්ඨාසිං කතා තෙ අනුසාසනී

181. සක්කංව දෙවා තිදසා සඞ්ගාමෙ අපරාජිතා,
පුරක්ඛත්වා විහරාමි තෙවිජ්ජම්හි අනාසවාති.

ඉත්ථං සුදං උත්තරා ථෙරී ගාථායො අභාසීති.

උත්තරාථෙරීගාථා.

## 7. 2

182. සතිං උපට්ඨපෙත්වාන භික්ඛුනී භාවිතින්ද්‍රියා,
පටිවිජ්ඣි පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛං.

183. කං නු උද්දිස්ස මුණ්ඩාසි සමණී විය දිස්සසි,
න ච රොචෙසි පාසණ්ඩෙ කිමිදං චරසි මොමුහා.

184. ඉතො බහිද්ධා පාසණ්ඩා දිට්ඨියො උපනිස්සිතා,
න තෙ ධම්මං විජානන්ති න තෙ ධම්මස්ස කොවිදා.

185. අත්ථි සක්‍යකුලෙ ජාතො බුද්ධො අප්පටිපුග්ගලො,
සො මෙ ධම්මමදෙසෙසි දිට්ඨීනං සමතික්කමං.

# 7. සත්තකනිපාතය.

## 7. 1

175. මනුෂ්‍යයෝ මෝහොල් ගෙන ධාන්‍ය කොටති. මනුෂ්‍යයෝ අඹුදරුවන් පුස්නාහු ධනය ලබත්.

176. යම් අනුශාසනාවක් කොට පසුව නො තැවේ ද ඒ බුද්ධානු-ශාසනාවෙහි ව්‍යායාම කරව. වහා දෙපා දෙවා එකත්පසෙක හිඳගනුව.

177. සිත එකඟ කොට සුසමාහිත කොට එලවාගෙන සංස්කාරයන් අනාත්ම වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කරව, ආත්ම වශයෙන් ප්‍රත්‍යවේක්ෂා නො කරව.

178. මම ඈගේ මේ පටාචාරානුශාසනා වචනය අසා දෙපා දෙව එකත්පසෙක හිඳගතුමු.

179. රැය පෙරයමැ පූර්වනිවාසය සිහි කළමු. රෑ මැදුම්යමැ දිවැස ශුද්ධ කළමු.

180. රැය පැසුළුයමැ මෝහස්කන්ධය බිඳ ලූමු. ඉක්බිති ත්‍රිවිද්‍යාප්‍රාප්ත වැ නැඟීසිටියමු. තොපගේ අනුසසුන් කළමු.

181. ත්‍රිදශදෙවියන් සඞ්ග්‍රාමයෙහි ලා දිනූ ශක්‍රයා වට කොට සිටුනාක් සෙයින් පෙරටු කොට ගෙන වාස කරමි. ආස්‍රව රහිත වැ ත්‍රිවිද්‍යා-ප්‍රාප්ත වැ වාස කරමි.

මෙසෙයින් උත්තරා මෙහෙණ ගාථා කිවු යැ

උත්තරාථෙරීගාථා යි.

## 7. 2

182. කායාදියෙහි සිහි එලවා (ආර්‍යමාර්ගභාවනායෙන්) භාවිත ශ්‍රද්ධාදි ඉඳුරන් ඇති තෙල මෙහෙණ සර්වසංස්කාරයනට උපශම හෙතු වූ අත්‍යන්තසුඛ නිර්වාණ පදය ප්‍රතිවෙධ කළා, (චාලා මෙහෙණ මරුට මෙසේ කිවු යැ)

183. (තෙපි) කවරක්හු උදෙසා මුඬු කළහු, මෙහෙණක සෙයින් දක්නහු. පාෂණ්ඩයන් නො රුස්නහු, සම්මූළ වැ කුමට ඇවිදිනහු ද? (මාරයා ගේ බසි.)

184. ශාශ්වතාදි දෘෂ්ටීන් ඇසුරු කළ පාෂණ්ඩයෝ මෙසස්නෙන් බැහැර වෙති, ඔහු ධර්මය නො දනිති, ඔහු ධර්මකොවිද නො වෙති.

185 ශාක්‍යකුලයෙහි ජාත වූ අප්‍රතිපුද්ගල වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ කෙනෙක් ඇත, උන් වහන්සේ මට දෘෂ්ටි සමති-ක්‍රමණෝපාය වූ දහමක් දෙසූහ.

186. දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං,
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං.

187. තස්සාහං වචනං සුත්වා විහරිං සාසනෙ රතා,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං

188. සබ්බත්ථ විහතා නන්දී තමොක්ඛන්ධො පදාලිතො,
එවං ජානාහි පාපිම නිහතො ත්වමසි අන්තකාති.

ඉත්ථං සුදං චාලා ථෙරී ගාථායො අභාසීති.

චාලාථෙරීගාථා.

7. 3

189. සතිමතී චක්ඛුමතී භික්ඛුනී භාවිතින්ද්‍රියා,
පටිවිජ්ඣිං පදං සන්තං අකාපුරිසසෙවිතං.

190. කින්නු ජාතිං න රොචෙසි ජාතො කාමානි භුඤ්ජති,
භුඤ්ජාහි කාමරතියො මාහු පච්ඡානුතාපිනී.

191 ජාතස්ස මරණං හොති හත්ථපාදානඡෙදනං,
වධබන්ධපරික්ලෙසං ජාතො දුක්ඛං නිගච්ඡති.

192. අත්ථි සක්‍යකුලෙ ජාතො සම්බුද්ධො අපරාජිතො,
සො මෙ ධම්මමදෙසෙසි ජාතියා සමතික්කමං.

193. දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං,
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං.

194. තස්සාහං වචනං සුත්වා විහරිං සාසනෙ රතා,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

195. සබ්බත්ථ විහතා නන්දී තමොක්ඛන්ධො පදාලිතො,
එවං ජානාහි පාපිම නිහතො ත්වමසි අන්තකාති.

ඉත්ථං සුදං උපචාලාථෙරී ගාථායො අභාසීති.

උපචාලාථෙරීගාථා.

## සත්තකනිපාතො නිට්ඨිතො.

186. දුඃඛසත්‍ය යැ දුඃඛසමුදයසත්‍ය යැ දුඃඛනිරොධසත්‍ය යැ දුක්ඛොපශමය කරා පමුණුවන ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගසත්‍ය යැ යන මේ යැ.

187. මම උන් වහන්සේ ගේ බස් අසා සස්නෙහි ඇලුම් ඇති වැ වාස කළෙමි, ත්‍රිවිධ විද්‍යාවෝ ලබනලදහ. බුදුන්ගේ අනුසසුන් කරන ලදි.

188. හැම තැන්හි තෘෂ්ණා නසන ලදු, මොහස්කන්ධය බිඳිනලදි, පවිටු මාරය මෙසේ දනු, අන්තකය තෝ නටූයෙහි.

මෙසෙයින් චාලා මෙහෙණ ගාථා කිවූ යැ.

චාලාථේරීගාථා යි.

7. 8

189. ස්මෘතිමත් වූ ප්‍රඥාචක්ෂුසින් චක්ෂුර්මත් වූ වැඩූ ශ්‍රද්ධාදි ඉඳුරන් ඇති තෙල මෙහෙණ බුද්ධාදි ආර්‍ය්‍යයන් විසින් සෙවුනා ලද ශාන්තපද සංඛ්‍යාත නිවන ප්‍රතිවේධ කළා, (උපචාලා මෙහෙණ මෙසේ උදන් ඇනූ.)

120. යම්හෙයකින් ජාතිය නො රුස්නහු නම්, එයට කරුණු කිම. උපන්නේ රූපාදි කාමයන් වළඳ කෙරේ. කාමරති වළඳව. පසු වැ නො තැවෙනු වව. (මාරයා කී.)

191 උපන්නාහට මරණ වෙයි. (උපන් හෙයින්) අත්පා සිඳුම් වෙයි, ජීවිතහානි මුෂ්ටිප්‍රහාරාදි) වධ පරික්ලෙශ හා (කාරාගෘහවාසාදි) බන්ධ පරික්ලෙශ.වෙයි, මෙසෙයින් උපන්නේ දුකට පැමිණෙයි.

192. ශාක්‍යකුලයෙහි උපන් අපරාජිත වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ කෙනෙක් ඇත. උන් වහන්සේ මට ජාති සමතික්‍රමණොපාය වූ දහමක් දෙසූසේක.

123. දුඃඛසත්‍ය යැ දුඃඛසමුදයසත්‍යසත්‍ය යැ දුඃඛනිරොධසත්‍ය යැ දුඃඛොපශමය කරා පමුණුවන ආර්‍ය්‍යාෂ්ටාඞ්ගික මාර්ගසත්‍ය යි.

194. මම උන් වහන්සේ ගේ වචන අසා සස්නෙහි ඇලුම් ඇති වැ වාස කළෙමි (මා විසින්) ත්‍රිවිද්‍යා ලබනලදු බුදුසසුන් කරන ලදි.

195. හැම තන්හි නන්දි සංඛ්‍යාත තෘෂ්ණා නසන ලදු, මොහස්කන්ධය පලන ලද්දේ යැ. පවිටු මාරය මෙසේ දනුව, අන්තකය තෝ නටූයෙහි.

මෙසෙයින් උපචාලා මෙහෙණ ගාථා කිවූ යැ

උපචාලාථේරීගාථා යි.

## සත්තකනිපාතය නිමි.

# 8. අට්ඨකනිපාතො

## 8. 1

196. භික්ඛුනී සීලසම්පන්නා ඉන්ද්‍රියෙසු සුසංවුතා,
අධිගච්ඡෙ පදං සන්තං අසෙචනකමොජවං.

197. තාවතිංසා ච යාමා ච තුසිතා චාපි දෙවතා,
නිම්මාණරතිනො දෙවා යෙ දෙවා වසවත්තිනො,
තත්ථ චිත්තං පණිධෙහි යත්ථ තෙ වුසිතං පුරෙ.

198. තාවතිංසා ච යාමා ච තුසිතා චාපි දෙවතා,
නිම්මාණරතිනො දෙවා යෙ දෙවා වසවත්තිනො.

199. කාලං කාලං භවාභවං සක්කායස්මිං පුරක්ඛතා,
අවීතිවත්තා සක්කායං ජාතිමරණසාරිනො.

200. සබ්බො ආදීපිතො ලොකො සබ්බො ලොකො පදීපිතො,
සබ්බො පජ්ජලිතො ලොකො සබ්බො ලොකො පකම්පිතො.

201. අකම්පියං අතුලියං අපුථුජ්ජනසෙවිතං,
බුද්ධො ච ධම්මං දෙසෙසි තත්ථ මෙ නිරතො මනො.

202. තස්සාහං වචනං සුත්වා විහරිං සාසනෙ රතා,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

203. සබ්බත්ථ විහතා නන්දි තමොක්ඛන්ධො පදාලිතො,
එවං ජානාහි පාපිම නිහතො ත්වමසි අන්තක.

ඉත්ථං සුදං සීසූපචාලා ථෙරී ගාථායො අභාසිති.

සීසූපචාලාථෙරීගාථා

අට්ඨකනිපාතො නිට්ඨිතො.

# 8. අට්ඨකනිපාතය

## 8. 1

196. පරිශුද්ධශීලයෙන් යුක්ත වූ ඉන්ද්‍රියයෙහි මොනොවට සංවෘත වූ මෙහෙණ අව්‍යාසෙක වූ සවභාවමධුර වූ ශාන්තපද සංඛ්‍යාත නිර්වාණය ලබන්නී යැ, (සිසූපචාලා මෙහෙණ කිවු යැ.)

197. යම් දෙවි කෙනකුන් කෙරෙහි පෙර තී විසින් වාස කරන ලද ද යම් තව්තිසාවැසි දෙවි කෙනෙක් ඇද්ද යාම් දෙවි කෙනෙක් ඇද්ද තුෂිතදෙව්කෙනෙක් ඇද්ද නිම්මාණරති දෙවි කෙනෙක් ඇද්ද වශවර්ති දෙවි කෙනෙක් ඇද්ද ඔවුන් කෙරෙහි සිත් පිහිටුවාලව, (මාරයා කී.)

198. තව්තිසාවැසි වූත් යාමවැසි වූත් තුෂිතවැසි වූත්, යම් දෙවි කෙනෙක් ඇද්ද, නිම්මාණරතිවැසි යම් දෙවි කෙනෙක් ඇද්ද, යම් වශවර්ති දෙවි කෙනෙක් ඇද්ද, (ඔහු හැම)

199. ඒ ඒ කල භවයෙන් භවයෙහි සත්කායපක්‍ෂයෙහි පුරස්කෘත්‍ය-කාරීව පිහිටියාහු වෙති. සත්කායපක්‍ෂය ඉක්ම නොගියාහු ජාති-මරණ අනුව යන්නාහු වෙති.

200. හැම ලොව රාගාදීන් ආවිලැගත්තේ වෙයි, හැම ලොව එයින් මැ ප්‍රදීප්ත වෙයි, හැම ලොව වෙසෙසින් ජ්වලිත වෙයි. හැම ලොව මෙසේ ප්‍රකම්පිත වෙයි.

201. සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ කම්පා නො කළ හෙන තුලනා නො කළ හෙන ආර්‍ය්‍යයන් විසින් සෙවුනා ලද නවලොවුතුරා දහම් දෙසූසේක, එහිලා මාගේ සිත නිරත වෙයි.

202. මම ඔබගේ බස් අසා ශාසනයෙහි නිරතව මැ වාස කළෙමි. ත්‍රිවිද්‍යාවෝ ලබනලදහ. බුද්ධශාසනය කරන ලදි.

203. හැම තැන තෘෂ්ණා නසන ලදු, මෝහස්කන්ධය බිඳිනලදි. පවිටු මාරය මෙසේ දනු, අන්තකය තෝ නැවුයෙහි.

මෙසෙයින් සිසූපචාලා මෙහෙණ ගාථා කිවු යැ.

සිසූපචාලාථේරීගාථා සි.

## අට්ඨකනිපාතය නිමි.

# 9. නවකනිපාතො

## 9. 1

204. මා සු තෙ වඩ්ඪ ලොකම්හි වනථො අහු කුදාචනං,
මා පුත්තක පුනප්පුනං අහු දුක්ඛස්ස භාගිමා.

205. සුඛං හි වඩ්ඪ මුනයො අනෙජා ඡින්නසංසයා,
සීතිභූතා දමප්පත්තා විහරන්ති අනාසවා.

206 තෙහානුචිණ්ණං ඉසීහි මග්ගං දස්සනපත්තියා,
දුක්ඛස්සන්තකිරියාය ත්වං වඩ්ඪ අනුබ්‍රූහය.

207. විසාරදාව භණසි එතමත්ථං ජනෙත්ති මෙ,
මඤ්ඤාමි නූන මාමිකෙ වනථො තෙ න විජ්ජති.

208. යෙ කෙචි වඩ්ඪ සංඛාරා හීනා උක්කට්ඨමජ්ඣිමා,
අණූපි අණුමත්තොපි වනථො මෙ න විජ්ජති.

209. සබ්බෙ මෙ ආසවා ඛීණා අප්පමත්තස්ස ඣායතො,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

210. උළාරං වත මෙ මාතා පතොදං සමවස්සරි,
පරමත්ථසංහිතා ගාථා යථාපි අනුකම්පිකා.

211. තස්සාහං වචනං සුත්වා අනුසිට්ඨිං ජනෙත්තියා,
ධම්මසංවෙගමාපාදිං යොගක්ඛෙමස්ස පත්තියා.

212. සොහං පධානපහිතත්තො රත්තින්දිවමතන්දිතො,
මාතරා චොදිතො සන්තො අඵුසිං සන්තිමුත්තමං.

ඉත්ථං සුදං වඩ්ඪමාතා ථෙරී ගාථායො අභාසීති.

වඩ්ඪමාතාථෙරීගාථා.

නවකනිපාතො නිට්ඨිතො.

# 9. නවකනිපාතය.

## 9. 1

204. දරුව වඩ්ඪන, සත්වලොකයෙහි හා සංස්කාර ලෝකයෙහි ද කෙලශතෘෂ්ණායෙක් තට කිසි කලෙක නහමක් වේවා, පුනපුනා ජාති ආදි දුකට නහමක් හිමි වේවා.

205. වඩ්ඪය, තෘෂ්ණා රහිත වූ ප්‍රහීණ වූ විචිකිත්සා ඇති කෙලශාභාවයෙන් සිහිල් වූ ඉන්ද්‍රියදමනයට පැමිණි ක්ෂීණාස්‍රව වූ මුනිහු සුවයේ වෙසෙත්.

206. වඩ්ඪය, තෝ ඒ ක්ෂීණාස්‍රව සෘෂීන් විසින් පිළිපදනාලද ශමථ විදර්ශනාමාර්ගය ඥානදර්ශනයාගේ අධිගමය පිණිස සියලු වෘත්තදුඃඛය කෙළවර කරනු පිණිස වඩව.

207. මෑණියෙනි, තෙපි විශාරද ව මෙන් තෙල ඔවා මට කියන්නහු යෑ, මාගේ මෑණියෙනි, එකන්තෙන් තොපට ගෘහශ්‍රිතප්‍රේමමාත්‍ර වනථයෙකුදු නැතැ'යි හඟිමි.

208. වඩ්ඪය, හීන උත්කෘෂ්ට මධ්‍යම වූ යම්කිසි සංස්කෘත ධර්ම කෙනෙක් ඇද්ද ඔවුනතුරෙහි අණු වූ ද අණුමාත්‍ර වූ ද වනථයෙක් මට නැත.

209. අප්‍රමාද ව ධ්‍යාන කරන මට හැම ආස්‍රවයෝ ක්ෂය වූහ, මා විසින් ත්‍රිවිද්‍යාවෝ ලබන ලදහ, බුදුන්ගේ අනුසසුන් කරන ලදි.

210. මාගේ මව අනුකම්පා ඇතියක සෙයින් ('මා සු තෙ වඩ්ඪ ලොකම්හි' ආදි) පරමාර්ථ සංහිත වූ මහත් වූ අවවාද පතොදයක් පැවැත්වූ යෑ.

211. මම ඒ මවගේ අනුශාසනාවචන අසා යොගක්ෂෙම සංඛ්‍යාත නිවනට පැමිණෙනු පිණිස ධර්මසංවේගයට පැමිණියෙමි.

212. ඒ මම දවරය නො මැලි ව සතර සම්‍යක්ප්‍රධන්වීර්යයෙන් නිවනට මෙහෙයූ සිත් ඇතියෙම් මව විසින් චොදනා කරන ලද්දෙම් අනුත්තර ශාන්ති සංඛ්‍යාත නිවන පසක් කෙළෙමි.

මෙසෙයින් වඩ්ඪමාතා මෙහෙණ ගාථා කියූ.

වඩ්ඪමාතුථෙරිගාථා යි.

නවකනිපාතය නිමි.

# 11. එකාදසනිපාතො.

## 11. 1

213. කල්‍යාණමිත්තතා මුනිනා ලොකං ආදිස්ස වණ්ණිතා,
කල්‍යාණමිත්තෙ භජමානො අපි බාලො පණ්ඩිතො අස්ස.

214. භජිතබ්බා සප්පුරිසා පඤ්ඤා තථා වඩ්ඪති[1] භජන්තානං,
භජමානො සප්පුරිසෙ සබ්බෙහිපි දුක්ඛෙහි පමුච්චෙය්‍ය.[2]

215. දුක්ඛඤ්ච විජානෙය්‍ය දුක්ඛස්ස ච සමුදයං නිරොධං
අට්ඨඞ්ගිකඤ්ච මග්ගං චත්තාරිපි අරියසච්චානි.

216. දුක්ඛො ඉත්ථිභාවො අක්ඛාතො පුරිසදම්මසාරථිනා,
සපත්තිකම්පි දුක්ඛං අප්පෙකච්චා[3] සකිං විජාතායො.

217. ගලකෙ අපි කන්තන්ති සුඛුමාලිනියො විසානි ඛාදන්ති,
ජනමාරකමජ්ඣගතා උභොපි ව්‍යසනානි අනුභොන්ති.

218. උපවිජඤ්ඤා ගච්ඡන්තී අද්දසාහං පතිං මතං
පන්ථම්හි විජායිත්වාන අප්පත්තාව සකං ඝරං.

219. ද්වෙ පුත්තා කාලකතා පතී ච පන්ථෙ මතො කපණිකාය,
මාතා පිතා ච භාතා ඩය්හන්ති ච එකචිතකායං.

220. ඛීණකුලීනෙ කපණෙ අනුභූතං තෙ දුක්ඛං අපරිමාණං
අස්සු ච තෙ පවත්තං බහූනි ජාතිසහස්සානි,

221. වසිතා සුසානමජ්ඣෙ අථොපි ඛාදිතානි පුත්තමංසානි
හතකුලිකා සබ්බගරහිතා මතපතිකා අමතං අධිගච්ඡිං.

222. භාවිතො මෙ මග්ගො අරියො අට්ඨඞ්ගිකො අමතගාමී,
නිබ්බානං සච්ඡිකතං ධම්මාදාසං අපෙක්ඛිහං.

223 අහම්හි කන්තසල්ලා ඔහිතභාරා කතං හි කරණීයං,
කිසාගොතමී ථෙරී විමුත්තචිත්තා ඉමං අභණීති.

ඉත්ථං සුදං කිසාගොතමී ථෙරී ගාථායො අභාසිත්ථ.

කිසාගොතමීථෙරීගාථා.

## එකාදසනිපාතො නිට්ඨිතො

1 පවඩ්ඪති - PTS   2. මුච්චෙය්‍ය - PTS   3. අප්පෙකච්චෙ - සිමු 1, 2

# 11. ඒකාදශනිපාතය.

## 11. 1

213. ශාස්තෲන් වහන්සේ විසින් සත්ත්වලෝකය උදෙසා කල්‍යාණමිත්‍ර භාවය පසස්නාලදි. කල්‍යාණමිත්‍රයන් සෙවුනා (පලමු) මූඪ වූයේ පවා (පසු වැ) පණ්ඩිත වන්නේ යැ.

214. (බුද්ධාදි) සත්පුරුෂයෝ භජන කළ යුත්තාහ. එසේ භජන කරනුවන් ගේ ප්‍රඥ වැඩෙයි. සත්පුරුෂයන් භජනය කරන්නේ හැම (ජාත්‍යාදි) දුකින් මිදෙන්නේ යැ.

215. (සත්පුරුෂයන්) සෙවුනේ, දුඃඛයත් දැනගන්නේ යැ. දුඃඛයාගේ සමුදයත් නිරොධයත් (නිරොධොපාය වූ) අෂ්ටාඞ්ගමාර්ගයත් (යන) සතර ආර්‍ය්‍යසත්‍යය දැනගන්නේ යැ.

216. පුරුෂදම්‍යසාරථි වූ භාග්‍යවතුන් වහන්සේ විසින් ස්ත්‍රීභාවය දුක’යි වදාරනලද. සපත්නින් ඇති බව ද දුකෙකි. ඇතැම්හු වරක් වැදුවාහු - (විජායන දුක් නො සහමින්)

217. සිය ගෙල ද සිඳුති, සියුමැලියෝ විෂ කති, කුක්ෂිගතමූඪගර්භ ඇත්තාහු (ගර්භ-ගර්භිනී) දෙදෙන මැ මාරණාන්තික ව්‍යසනයනට පැමිණෙති.

218. ළං වැ සිටි වදන කල් ඇති වැ ගෙට යන මම සිය ගෙට නො පැමිණ මැ මග දරුවන් වදා (පිහිට පිණිස ගිය) හිමියා මළහු දුටුමි.

219. දුගී වූ මාගේ පුත්‍රයෝ දෙදෙන කළුරිය කළහ. හිමියා ද මග මළේ යැ, එක් මැ දරසෑයෙහි මවු පිය සොහොවුරු දැවෙති, (එ ද දුටුමි.)

220. ක්ෂය වැ ගිය කුලගොත් ඇත්තිය, දිළිඳු තැනැත්තිය, තී විසින් අප්‍රමාණ දුක් වලඳනා ලදි. බොහෝ දහස්ගණන් ජාතියෙහි තීගේ කඳුළු ද පැවැතිණ.

221. සොහොන් මැද වුසුමි, යළිදු පුත්‍රමාංශ කනලදි, නටකුල ඇති වූමි, සර්‍වජනයා විසින් ගර්හිත වූමි, මළ හිමියා ඇතියක වූමි, (එතෙකුදු වුව) නිවන් අවබොධ කළා.

222. මා විසින් අමෘතගාමී වූ ආර්‍ය්‍යාෂ්ටාඞ්ගික මාර්ගය භාවිත විය. නිවන් පසක් කරනලදි, මෙසේ මම ධර්‍මමය ආදර්ශය දිටිමි.

223. මම සිඳලූ රාගාදි හුල් ඇති ව බහා තැබූ කෙලෙස්බර ඇති වූමි. (පරිඥතාදි සොළොස්) කරණී කරනලදි. මිදුණුසිත් ඇති කිසාගොතමී මෙහෙණ මෙ කරුණ කිවු යැ.

මෙසෙයින් කිසාගොතමී මෙහෙණ ගාථා කිවු යැ.

**කිසාගොතමී ථේරීගාථා යි.**

52-53 පිටුවල සඳහන් 218-219, 220-221 යන ගාථා හතරද සිංහල සන්න හතරද, 32-33 පිටුවල සඳහන් පටාචාරා තෙරණි විසින් ගයන ලදැයි අදහස් කරමු. සිතා බලන්න.

(බෞ: සං: ම බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ පුනර් මුද්‍රණය 2005)

**එකාදශනිපාතය නිමි**

# 12. ද්වාදසනිපාතො.

### 12. 1

224. උභො මාතා ච ධීතා ච මයං ආසුං[1] සපත්තියො,
තස්සා මෙ අහු සංවෙගො අබ්භුතො ලොමහංසනො.

225. ධිරත්ථු කාමා අසුචී දුග්ගන්ධා බහු කණ්ටකා,
යත්ථ මාතා ච ධීතා ච සභරියා මයං අහුං.

226. කාමෙස්වාදීනවං දිස්වා නෙක්ඛම්මං දට්ඨු ඛෙමතො,
සා පබ්බජිං රාජගහෙ අගාරස්මානගාරියං

227. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛුං[2] විසොධිතං,
චෙතොපරිච්චඤාණඤ්ච සොතධාතු විසොධිතා.

228. ඉද්ධීපි මෙ සච්ඡිකතා පත්තො මෙ ආසවක්ඛයො,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

229. ඉද්ධියා අභිනිම්මිත්වා චතුරස්සරථං අහං,
බුද්ධස්ස පාදෙ වන්දිත්වා ලොකනාථස්ස තාදිනො.

230. සුපුප්ඵිතග්ගං උපගම්ම පාදපං,
එකා තුවං තිට්ඨසි සාලමූලෙ
න චාපි තෙ දුතියො අත්ථි කොචි
න ත්වං බාලෙ භායසි ධුත්තකානං.

231. සතං සහස්සානපි ධුත්තකානං
සමාගතා එදිසකා භවෙය්‍යුං
ලොමං න ඉඤ්ජෙ නපි සම්පවෙධෙ
කිං මෙ තුවං මාර කරිස්සසෙකො.

232. එසා අන්තරධායාමි කුච්ඡිං වා පවිසාමි තෙ
භමුකන්තරෙ වා තිට්ඨාමි තිට්ඨන්තිං මං න දක්ඛසි.

233. චිත්තම්හි වසීභූතාහං ඉද්ධිපාදා සුභාවිතා
ඡ මෙ අභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

234. සත්තිසූලූපමා කාමා ඛන්ධාසං අධිකුට්ටනා,
යං ත්වං කාමරතිං බ්‍රූසි අරතීදානි සා මම.

235. සබ්බත්ථ විහතා නන්දී තමොක්ඛන්ධො පදාලිතො,
එවං ජානාහි පාපිම නිහතො ත්වමසි අන්තක.

ඉත්ථං සුදං උප්පලවණ්ණා ථෙරී ගාථායො අභාසීති.

උප්පලවණ්ණාථෙරීගාථා.

## ද්වාදසනිපාතො නිට්ඨිතො.

1. ආසුං - සිමු 1, 2. 2. දිබ්බචක්ඛු - මජසං.

# 12. ද්වාදශනිපාතය

## 12. 1

224 මවත් දූවත් යන අපි දෙදෙන සපත්නී වූම්හ, ඒ මට අද්භූත වූ ලොමුදැහගන්වන සංවේගයෙක් වී.

225. නින්දා වේවා, කාමයෝ අපවිත්‍රයහ, දුර්ගන්ධයහ, බොහෝ කෙලෙස්කටු ඇතියහ. වැලඳියයුතු යම් කාමයෙක්හි මවත් දූවත් යන අපි සපත්නී වූමෝ ද (ඒ කාමය යි.)

226. කාමයෙහි ආදීනව දැක නෛෂ්ක්‍රම්‍යය නිර්භය විසින් දැක ඕ තොමෝ රජගහනුවර දී ගිහිගෙන් නික්ම සසුන් ගත වූ යෑ, (ගඞ්ගාතීරියථෙරමාතු මෙහෙණ කී ගාථා ගෙන කාමාදීනව දක්වන පිණිස කිවූ යෑ.)

227. (මම) පෙරවිසූ කඳපිළිවෙළ දනිමි. (මා විසින්) දිවැස විශුද්ධ කරනලදි, චේතොපරියඤාණය (පරසිත් දන්නානුවණ)ත් දිබ්බ-සොත ධාතුවත් විශුද්ධ කරන ලදහ.

228. මා විසින් ඍද්ධියෝ ද පසක් කරනලදහ. මා විසින් ආශ්‍රවක්ෂය සඞ්ඛ්‍යාත නිවන ලබනලද, ෂට් අභිඥාවෝ සාක්ෂාත්කෘතයහ, බුදුන්ගේ අනුසසුන් කරනලදි. (තමා අධිගත විෂය ගෙන කීහු.)

229. මම (යමාමහපෙළහර ද) ඍද්ධියෙන් අසුන් සතරදෙනකුන් යෙදූ රථයක් මවා ලොකනාථ වූ තාදිගුණ ඇති බුදුන් ගේ පාසගල වැඳ සිටියමි.

230. තෙපි අග පටන් මල්ගෙන සිටි සල්රුකක් කරා එළැඹ එ සල්-රුක්මුල්හි එකලාව සිටුව, තොපට කිසි දෙවැන්නෙක් නො ද ඇති, බාලාවෙහි, තෙපි ධූර්තයනට නො බියව.

231. තුලුන් බඳු ධූර්තයන් සියයකුදු දහසකුදු ඉදින් එළඹියාහු වෙත් නමුදු (මාගේ) රෝමයකුදු නො සැලෙන්නේ ය, නො ද කම්පා වන්නේ යෑ, මාරය, තෙපි එකලා වැ මට කුමක් කරවු ද?

232. (මාරය) තෙල මම (තා ඉදිරියෙහි) අතුරුදහන් වෙමි, (නො දුටෙන සේ) තාගේ කුසට හෝ පිවිසෙමි, දෙබැම අතර හෝ සිටිමි, එසේ සිටින මා නො දක්නෙහි.

233. මම වසග කළ සිත් ඇති වෙමි, මා විසින් ඍද්ධිපාදයෝ භාවනාවට වඩන ලදහ, ෂඩභිඥා පසක්කරන ලදහ, බුදුන්ගේ සසුන් කරනලද.

234. කාමයෝ (මුවහත් කළ විෂ පෙවූ) සැත්හුල් බඳු වූවාහු යෑ, උපාදානස්කන්ධයෝ ඔවුන්ගේ සිඳීමට ආධාර වූවාහු යෑ (මාරය) තෝ යම් කාමරතියක් සෙවියයුතු යයි කියෙහි ද, ඒ කාමරතිය දැන් මට අරතියකි.

235. සියලු තැන්හි නන්දි සඞ්ඛ්‍යාත තෘෂ්ණාව නසනලදු, තමස්කන්ධ ප්‍රදලන කරනලද, පවිට, මෙසේ දනුව, අන්තකය, තෝ මා විසින් පෙළනලදුයෙහි.

මෙසේ උප්පලවණ්ණා තෙරණිය ...

උත්පලවණ්ණාථේරී ගාථා යි.

ද්වාදශනිපාතය නිමි.

# 16. සොළසනිපාතො.

## 16. 1

236. උදකමාහරිං[1] සීතෙ සදා උදකමොතරිං,
අය්‍යානං දණ්ඩභයභීතා වාචාදොසභයට්ටිතා.

237. කස්ස බ්‍රාහ්මණ ත්වං භීතො සදා උදකමොතරි,
වෙධමානෙහි ගත්තෙහි සීතං වෙදයසෙ භුසං.

238. ජානන්තී වත මං භොති පුණ්ණිකෙ පරිපුච්ඡසි,
කරොන්තං කුසලං කම්මං රුන්ධන්තං කත පාපකං.

239. යො ච වුද්ධො දහරො වා පාපකම්මං පකුබ්බති,
දකාභිසෙචනා සොපි පාපකම්මා පමුච්චති.

240. කො නු තෙ ඉදමක්ඛාසි අජානන්තස්ස අජානකො,
දකාභිසෙචනා නාම පාපකම්මා පමුච්චති.

241. සග්ගං නූන ගමිස්සන්ති සබ්බෙ මණ්ඩූකකච්ඡපා,
නාකා ච සුංසුමාරා ච යෙ චඤ්ඤෙ උදකෙ චරා.

242 ඔරබ්භිකා සූකරිකා මච්ඡකා මිගබන්ධකා,
චොරා ච වජ්ඣඝාතා ච යෙචඤ්ඤෙපාපකම්මිනො.
දකාභිසෙචනා තෙපි පාපකම්මා පමුච්චරෙ.

243. සචෙ ඉමා නදියො තෙ පාපං පුබ්බෙ කතං වහුං,
පුඤ්ඤම්පිමා වහෙය්‍යුං තෙන ත්වං පරිබාහිරො.

244. යස්ස බ්‍රාහ්මණ ත්වං භීතො සදා උදකමොතරි,
තමෙව බ්‍රහ්මෙ මා කාසි මා තෙ සීතං ඡවිං හනී.

245. කුම්මග්ගං පටිපන්නං මං අරියමග්ගං සමානයි,
උදකාභිසෙචනා භොති ඉමං සාටං දදාමි තෙ.

---

1 උදහාරි අහං සීතෙ - මජසං

# 16. ෂොඩශනිපාතය.

## 16. 1.

236. ස්වාමිදරුවන්ගේ දඬුවම් බියෙන් බිය ව, වාග්දණ්ඩභීතියෙන් හා (ස්වකීය) දෞෂභීතියෙන් ද පීඩිතව , (මම) හැම කල්හි සීතයෙහිදු දිය අළිමි. දියට බටිමි.

237. බමුණාණෙනි, තෙපි කවරක් හට බියපත් වූවහු හැම කල (උදය-සවස) දියට බටහු ද, සැලෙන ගාත්‍රයෙන් යුතු ව අධික වූ සිහිල් දුක් විඳිහු ද.

238. භවතිය පුණ්ණාවෙනි, කල පව්කම් වළහන (දියෙහි ගැලීමෙන්) කුසලය රැස්කරන මා දන්නී මැ විචාරව.

239. මහල්ලෙක් වේවයි තරුණයෙක් වේවයි යම් කිසිවෙක් පව්කම් බෙහෙවින් කෙරේද හෙතෙමේත් ජලස්නානහෙතුයෙන් පව්කමින් අතිශයින් මිදේ.

240. (කර්මවිපාක) නො දත් තොපට ජලස්නානයෙන් පව් කමින් මිදෙයි' යන මේ කරුණ (කර්මවිපාක) නො දත් කවරෙක් පැවැසී ද.

241. හැම මඬු - කැසුබුවෝ ද කිඹුල්හු ද සුංසුමාරයෝ ද අන්‍ය වූත් යම් ජලචර කෙනෙක් වෙත් නම් ඔහු දු ඒකාන්තයෙන් ස්වර්ගයට යන්නාහ යි සිතමි.

242. එළුවන් මරන්නෝ ද හුරුමැද්දෝ ද කෙවුලෝ ද මුවවැද්දෝ ද සොරු ද වධ්‍යඝාතකයෝ (අළුගොසුවෝ) ද අන්‍ය වූත් පව්කම් ඇති යම් කෙනෙක් වෙත් නම්, ඔහුදු ජලස්නානයෙන් පව්කමින් මිදෙන්නාහ.

243. ඉදින් මේ (අචිරවතී ආදී) නදීහු තොප විසින් පෙර කළ පව් බැහැර කරන්නාහු නම්, මේ නදීහු (තොප කළ) පින ද බැහැර කරන්නාහු ය, (එකල) තෙපි ඒ පිනෙනුදු බැහැර වූවහු ය.

244. බමුණාණෙනි, තෙපි යම් පාපයෙකින් බියපත් වූවහු හැම කලැ උදකාවගාහන කරහු ද, බමුණාණෙනි, ඒ පාපය මැ නහමක් කල මැනැවි, (මෙබඳු) සීතය තොපගේ සිරුරෙහි සිවිය නහමක් පෙළාවා.

245. පින්වතිය, නොමඟට පිළිපන් මා දියෙහි ගැලීමෙන් බැහැර කොට ආර්‍යමාර්ගයට පැමිණවී. (එහෙයින්) මේ සළුව තුටුපඬුරු කොට තොපට දෙමි.

246. තුය්හොව සාටකො හොතු නාහං ඉච්ඡාමි සාටකං,
සචෙ භායසි දුක්ඛස්ස සචෙ තෙ දුක්ඛමප්පියං.

247. මාකාසි පාපකං කම්මං ආවි වා යදි වා රහො,
සචෙ ච පාපකං කම්මං කරිස්සසි කරොසි වා.

248. න තෙ දුක්ඛා පමුත්‍යත්ථි උපෙච්චාපි පලායතො,
සචෙ භායසි දුක්ඛස්ස සචෙ තෙ දුක්ඛමප්පියං.

249. උපෙහි සරණං බුද්ධං ධම්මං සඞ්ඝඤ්ච තාදිනං,
සමාදියාහි සීලානි තං තෙ අත්ථාය හෙහිති.

250. උපෙමි සරණං බුද්ධං ධම්මං සඞ්ඝඤ්ච තාදිනං,
සමාදියාමි සීලානි තමෙම අත්ථාය හෙහිති.

251. බ්‍රහ්මබන්ධු පුරෙ ආසිං අජ්ජම්හි සච්ච බ්‍රාහ්මණො,
තෙවිජ්ජො වෙදසම්පන්නො සොත්ථියො චම්හි නහාතකොති.

ඉත්ථං සුදං පුණ්ණා ථෙරී ගාථායො අභාසීති.

පුණ්ණාථෙරීගාථා.

## සොළසනිපාතො නිට්ඨිතො.

246. සළුව තොපට මෑ වේවා, මම සළුව නොරිසි වෙමි, ඉදින් තෙපි දුකට බියවවූ නම්, ඉදින් තොපට දුක අප්‍රිය වී නම්-

247. ප්‍රකටභාවයෙන් නො පිළිසත් ව හෝ නොහොත් රහසි ව පිළිසත්කොට හෝ පව්කම් නහමක් කරව. ඉදින් පව්කම් මතු කරත්නෙහි හෝ දුන් කෙරෙහි හෝ නම්-

248. දු නැගෙන පලායන්නා වූද තොපට දුකින් මිදීමෙක් නැති. ඉදින් තෙපි දුකට බිය වවූ නම් ඉදින් තොපට දුක අප්‍රිය වී නම්.

249. තාදී වූ බුදුන් ද දහම් ද සඟුන් ද සරණ කොට යවූ, සිල් සමාදන් වවූ, ඒ සරණගමනය හා සීලසමාදානය තොපට වැඩ පිණිස වන්නේ යි.

250. මම තාදී වූ බුදුන් ද දහම් ද සඟුන් ද සරණ කොට යමි, සිල් සමාදන් වෙමි, ඒ මට වැඩ පිණිස වන්නේ ය.

251. මම පෙර, (බමුණු කුලෙහි උපන් පමණින්) බ්‍රහමබන්‍ධු නම් වීමි, දූන් (බාහිතපාප බැවින්) පරමාර්‍ථබ්‍රාහමණ වෙමි, අධිගම කල ත්‍රිවිද්‍යා ඇතියෙමි, මාගීඥනවෙදයෙන් සමන්විතයෙමි, සොත්‍රිය ද නහාතක ද වෙමි'යි.

මෙසේ පුණ්ණා තෙරණි ...

පුණ්ණාථේරී ගාථා යි.

## ෂොඩශනිපාතය නිමි.

# 20. වීසතිනිපාතො.

## 20. 1

252. කාළකා භමරවණ්ණසාදිසා
වෙල්ලිතග්ගා මම මුද්ධජා අහු,
තෙ ජරාය සාණවාකසාදිසා[1]
සච්චවාදිවචනං අනඤ්ඤථා.

253. වාසිතොව සුරභීකරණ්ඩකො
පුප්ඵපූර[2] මම උත්තමඞ්ගජො,
තං ජරාය සසලොමගන්ධිකං
සච්චවාදිවචනං අනඤ්ඤථා.

254. කානනං'ව සහිතං සුරොපිතං
කොච්ඡසූචිවිචිතග්ගසොභිතං,
තං ජරාය විරලං තහිං තහිං
සච්චවාදිවචනං අනඤ්ඤථා.

255. කණ්හඛන්ධකසුවණ්ණමණ්ඩිතං
සොභතෙ[3] සුවෙණීහි ලඞ්කතං,
තං ජරාය ඛලිතං සිරං කතං
සච්චවාදිවචනං අනඤ්ඤථා.

256. චිත්තකාරසුකතාව ලෙඛිකා
සොභරෙ සුභමුකා පුරෙ මම,
තා ජරාය වලීහි පලම්බිතා
සච්චවාදිවචනං අනඤ්ඤථා.

257. භස්සරා සුරුචිරා යථා මණී
නෙත්තා'හෙසුං අභිනීලමායතා,
තෙ ජරාය'භිහතා න සොභරෙ
සච්චවාදිවචනං අනඤ්ඤථා.

258. සණ්හතුඞ්ගසදිසී ච නාසිකා
සොභතෙ[4] සු අභියොබ්බනං පති
සා ජරාය උපකූලිතා විය
සච්චවාදිවචනං අනඤ්ඤථා.

259. කඞ්කණං'ව සුකතං සුනිට්ඨිතං
සොභරෙ සු මම කණ්ණපාළියො
තා ජරාය වලීහි පලම්බිතා
සච්චවාදිවචනං අනඤ්ඤථා.

260. පත්තලීමකුලවණ්ණසාදිසා
සොභරෙ සුදන්තා පුරෙ මම
තෙ ජරාය ඛණ්ඩිතා ච පීතකා[5]
සච්චවාදිවචනං අනඤ්ඤථා.

261. කානනම්හි වනසණ්ඩචාරිනී
කොකිලාව මධුරං නිකූජිහං
තං ජරාය ඛලිතං තහිං තහිං
සච්චවාදිවචනං අනඤ්ඤථා.

---

1 සාණවාකසදිසා - සීමු. 2 පුප්ඵපූරං - සීමු 1, 2, පුප්ඵපූරං - PTS
3 සොභතෙතං - සීමු. 4 සොභරෙ - සීමු 1, 2 5 වායිතා - මජසං

# 20 විංශතිනිපාතය.

## 20. 1

252. (පෙර) මාගේ කේශයෝ කළුපැහැ වූවාහු බඹරුන් බඳු පැහැ ඇති ව අග්බඹරු වූහ, දැන් ඔහු ජරාහේතුයෙන් සණවැහැරි බඳු වූහ. සත්‍යවාදී වූ සම්බුදුන්ගේ වචනය අන් පරිදි නො වේ.

253. මලින් ගවසන ලද මාගේ කෙස්කලඹ පෙර සුවඳකැවූ පහයින් ජේලාවක් බඳු විය. දැන් එය ජරාහෙතුයෙන් සාලොම්ගඳ හමනු වෙයි. සත්‍යවාදී වචනය අනන්‍යථා වේ.

254. මොනොවට රෝපණය කළ හැපුණු ගෙවුයනක් බඳු වූ පණාවෙන් හා රන්හිඳින් හා අවුල් හැර සකස් කළ අග්ඇති ව හොබවනලද ඒ කෙස්කලඹ දැන් ජරාහේතුයෙන් තන්හි තන්හි විරල ව වැටුණු කෙස් ඇති වෙයි, සත්‍යවාදී බුදුන්ගේ වචනය අනන්‍යථා වේ.

255. රන්විදුරු ආදියෙන් සරසනලද කළු කෙස්වැටිය පෙර මොනොවට ගෙතීමෙන් හොබතේ විය, දැන් එය ජරාහෙතුයෙන් බලලාට ශීර්ෂ වෙයි, සත්‍යවාදීන්ගේ වචනය අනන්‍යථා වේ.

256. පෙර මාගේ හොබනා දෙබැම සිත්තරකු විසින් (නිල්පැහැයෙන්) මොනොවට අඳනාලද රේඛාවක් මෙන් ශෝභමාන විය, දැන් ජරා-හෙතුයෙන් ඒ දෙබැම නළලත්හි රැලියෙන් එල්බෙමින් සිටියා වෙයි, සත්‍යවාදීවචනය අනන්‍යථා වේ.

257 අභිනීල ව දික් වූ මාගේ නෙත්‍රයෝ පෙර නිල්මිණි මෙන් ප්‍රභාස්වර වූවාහු ඉතා සිත්කලු වූහ, දැන් ඔහු ජරායෙන් මඩනාලද්දාහු නො හොබිත්, සත්‍යවාදී වූ බුදුන්ගේ වදන් අනන්‍යථා වේ.

258 සොඳුරු නවයොවුනෙහි මාගේ නැහැය සිලුටු ව උස් ව (සෙසු මුඛාවයවයනට) අනුරූප ව හොබනී විය, ඕ දැන් ජරාහේතුයෙන් හැකුළුණාක් මෙනි, සත්‍යවාදීවචනය අනන්‍යථා වේ.

259. පිරියම් කළ මොනොවට නිමවනලද රන්වළල්ලක් මෙන් මාගේ කන්පෙති පෙර ශොභමාන වී දැන් ඔහු ජරාහෙතුයෙන් හටගත් රැලි ඇති ව එලෙන්නාහු වෙති, සත්‍යවාදී බුදුන්ගේ වදන් අනන්‍යථා වේ.

260 පෙර මා ගේ මනා දන්තයෝ කදලමුහුලු බඳු පැහැසටහන් ඇති ව සොභමාන වූහ. දැන් ඔහු ජරාහෙතුයෙන් කැඩුණාහු ද කසාවන් වූවාහු ද වෙති, සත්‍යවාදීන් ගේ වදන් අනන්‍යථා වේ.

261. වෙනෙහි වනලැහැබ්හි හැසිරෙන කොවුලියක මෙන් පෙර මම මිහිරි කොට බිණිමි, දැන් ඒ ආලාපය ජරාහෙතුයෙන් තන්හි තන්හි පැකිලෙනු වෙයි, සත්‍යවාදී බුදුවදන් අනන්‍යථා වේ.

262. සණ්හකම්බුරිව සුප්පමජ්ජිතා
සොභතෙව සුගීවා පුරෙ මම
සා ජරාය භග්ගා විනාමිතා
සච්චවාදිවචනං අනඤ්ඤථා.

263. වට්ටපලිඝසදිසොපමා උභො
සුසොභරෙ සුබාහා පුරෙ මම
තා ජරාය යථා පාටලිප්පලිතා
සච්චවාදිවචනං අනඤ්ඤථා.

264. සණ්හමුද්දිකසුවණ්ණමණ්ඩිතා
සොභරෙ සුහත්ථා පුරෙ මම
තෙ ජරාය යථා මූලමූලිකා
සච්චවාදිවචනං අනඤ්ඤථා.

265. පීනවට්ටසහිතුග්ගතා උභො
සොභරෙ සුථනකා පුරෙ මම
ථෙවිකීව ලම්බන්ති නොදකා
සච්චවාදිවචනං අනඤ්ඤථා.

266. කඤ්චනස්ස ඵලකංව සුමට්ටං
සොභතෙ සුකායො පුරෙ මම
සො වලීහි සුඛුමාහි ඔතතො
සච්චවාදිවචනං අනඤ්ඤථා.

267. නාගභොගසදිසොපමා උභො
සොභරෙ සුඌරු පුරෙ මම
තෙ ජරාය යථා වෙළුනාළියො
සච්චවාදිවචනං අනඤ්ඤථා.

268. සණ්හනූපුරසුවණ්ණමණ්ඩිතා
සොභරෙ සුජඞ්ඝා පුරෙ මම
තා ජරාය තිලදණ්ඩකාරිව
සච්චවාදිවචනං අනඤ්ඤථා.

269. තූලපුණ්ණසදිසොපමා උභො
සොභරෙ සුපාදා පුරෙ මම
තෙ ජරාය ඵුටිතා වලීමතා
සච්චවාදිවචනං අනඤ්ඤථා.

270. එදිසො අහු අයං සමුස්සයො
ජජ්ජරො බහු දුක්ඛානමාලයො
සොපලෙපපතිතො ජරාඝරො
සච්චවාදිවචනං අනඤ්ඤථා’ති.

ඉත්ථං සුදං අම්බපාලී ථෙරී ගාථායො අභාසීති.

අම්බපාලිථෙරීගාථා.

262. පෙර මාගේ මනා ගෙල මොනොවට පිරිසිදු කළ සිලිටි රන්-සකක් සෙයින් සෝභමාන විය. දැන් එය ජරාහේතුයෙන් භග්න ව නැමුණේ වෙයි, සත්‍යවාදීන් ගේ වචනය අනන්‍යථා වේ.

263. පෙර මාගේ දෙබාහුව වට වූ කණයමක් බඳු ව සොභමාන විය, දැන් ඒ දෙබාහුව ජරාහේතුයෙන් පැළුණු පළොල් පත්තක් බඳු වී, සත්‍යවාදීන්ගේ වදන් අනන්‍යථා වේ.

264. පෙර මාගේ සොඳුරු අත් හුවල රන්මුවා සිලුටු මුදුවලින් විභූෂිත ව සොභමාන වී, දැන් ජරාහේතුයෙන් ඒ අත් මූලාලකඳ බඳු වී, සත්‍යවාදීන්ගේ වදන් අනන්‍යථා වේ.

265. පෙර මාගේ සොඳුරු පියොයුරු හුවල හැසි වට ව (උනුන්) එක් ව උඩුමුව ව සොභමාන වී, දැන් දියහිලිහුණු පෙරහන්කඩ සෙයින් එල්බෙයි, සත්‍යවාදී වූ බුදුරදුන්ගේ වදන් අනන්‍යථා වේ.

266. පෙර මා ගේ සොඳුරු වූ කය (දැහිගුල් තවරා) මොනොවට පිරිමදනාලද රන්පුවරුවක් සෙයින් හොබනේ විය, දැන් ඒ කය සියුම් රැලියෙන් (තැන තැන) පැතුරුණේ විය, සත්‍යවාදී බුදුන්ගේ වදන් අනන්‍යථා වේ.

267. පෙර මාගේ සොඳුරු දෙකලවේ ඇත්සොඬ බඳු ව සෝභමාන වී, දැන් ඒ දෙකලවේ ජරාහේතුයෙන් හුණදඬු බඳු වෙයි, සත්‍යවාදී බුදුන්ගේ වදන් අනන්‍යථා වේ.

268. පෙර මාගේ සොඳුරු වූ දෙදඟ රන්මුවා සිලුටු නුපුරුවලායෙන් විභූෂිත ව සොභමාන වී, දැන් ජරාහේතුයෙන් ඒ දෙදඟ තලදඬු මෙන් වෙයි, සත්‍යවාදී වූ බුදුන් ගේ වදන් අනන්‍යථා වේ.

269. පෙර මා ගේ සොඳුරු දෙපාදයෝ හිඹුල්පුළුන් පුරවන ලද්දවුන් මෙන් සොභමාන වූහ, දැන් ඒ පාදයෝ ජරාහේතුයෙන් පැළුණාහු හවිගත් රැලි ඇත්තාහු වෙති, සත්‍යවාදී බුදුන්ගේ වදන් අනන්‍යථා වේ.

270. මාගේ මේ සිරුර මෙබඳු (යථොක්තප්‍රකාර) විය, දුදුරු වූයේ (ජරාදිහෙතුක වූ) බොහෝ දුකට වාසස්ථාන විය, ඒ කය ආලෙප රහිත වැ වැටීමට ලංවූ දිරූ ගෙයක් බඳු වෙයි, නොහොත් ජරාවට ගෘහ වෙයි, අවිතථවාදී වූ සම්මාසම්බුදුන් ගේ වචනය අන්-පරිද්දෙකින් නො වේ.

මෙසේ අම්බපාලි තෙරණී ...

අම්බපාලිථේරීගාථා යි.

## 20. 2

271. සමණාති භොති ත්වං සයසි[1] සමණාති පටිබුජ්ඣසි[2]
සමණානමෙව[3] කිත්තෙසි සමණී නූන භවිස්සසි.

272. විපුලං අන්නඤ්ච පානඤ්ච සමණානං පයච්ඡසි[4]
රොහිණී'දානි පුච්ඡාමි කෙන තෙ සමණා පියා?

273. අකම්මකාමා අලසා පරදත්තූපජීවිනො
ආසංසුකා සාදුකාමා කෙන තෙ සමණා පියා?

274. චිරස්සං වත මං තාත සමණානං පරිපුච්ඡසි
තෙසං තෙ කිත්තයිස්සාමි පඤ්ඤාසීලපරක්කමං.

275. කම්මකාමා අනලසා කම්මසෙට්ඨස්ස කාරකා
රාගං දොසං පජහන්ති තෙන මෙ සමණා පියා.

276. තීණි පාපස්ස මූලානි ධුනන්ති සුචි කාරිනො
සබ්බපාපං පහීනෙසං තෙන මෙ සමණා පියා.

277. කායකම්මං සුචි නෙසං වචීකම්මං ච තාදිසං
මනොකම්මං සුචි නෙසං තෙන මෙ සමණා පියා.

278. විමලා සඞ්ඛමුත්තා'ව සුද්ධා සන්තරබාහිරා
පුණ්ණා සුක්කෙහි ධම්මෙහි තෙන මෙ සමණා පියා.

279. බහුස්සුතා ධම්මධරා අරියා ධම්මජීවිනො
අත්ථං ධම්මඤ්ච දෙසෙන්ති තෙන මෙ සමණා පියා.

280. බහුස්සුතා ධම්මධරා අරියා ධම්මජීවිනො.
එකග්ගචිත්තා සතිමන්තො තෙන මෙ සමණා පියා.

281. දූරඞ්ගමා සතිමන්තො මන්තභාණී අනුද්ධතා
දුක්ඛස්සන්තං පජානන්ති තෙන මෙ සමණා පියා.

282. යස්මා ගාමා පක්කමන්ති න විලොකෙන්ති කිඤ්චනං
අනපෙක්ඛාව ගච්ඡන්ති තෙන මෙ සමණා පියා.

1. භොති සුපි - මජසං. 2. පබුජ්ඣසි - මජසං. 3. සමණානෙව - මජසං.
4. පවෙච්ඡසි මජසං.

## 20 2

271. භවතිය, නුඹ 'සමණා' (ශ්‍රමණයන) යි කියමින් නිදව, 'සමණා' යි කියමින් පිබිදෙව, (හැම කල) මහණුන් මැ නොහොත් මහණුන්ගේ ගුණ මැ පසසව, (සිතින්) මෙහෙණක් මැ යයි සිතම.

272 බොහෝ ආහාර පාන ද මහණුනට දෙව, දරුව රෝහිණිය, දූත් නි පුළුවුස්මි, කුමක් හෙයින් නුඹට ශ්‍රමණයෝ ප්‍රිය වෙත් ද?

273. (ඔහු තමහට ද පරහට ද වැඩද) කිසිවක් නො කරනු රිසියහ, කුසිතයෝ යැ, පරා දුන් දූසිත් මැ දිවිපවනුසුල්ලහ, (එහෙයින් ම බත් වත් ආදිය) පතා සිටුනාහ, මිහිරි දෑ ම මැ රිසියහ, කුමක් හෙයින් නුඹට ශ්‍රමණයෝ ප්‍රිය වෙත් ද?

274. පියාණෙනි, බොහෝ කලෙකින් මහණුන්ගේ ගුණ මා පුළු-වුස්නහු යැ, තොපට ඒ මහණුන්ගේ ප්‍රඥව ශීලය හා වීයර්‍ය පවසමි.

275. (ඔහු වත් පිළිවත් ඈ) මහණකිස කරනු රිසියහ, අනලසයෝ යැ, (නිවන් එළවන) ශ්‍රෙෂ්ඨකර්මය කරනුවහ, එහෙයින් රාගය ද ද්වේෂය ද දුරු කෙරෙති, එකරුණෙන් මට ශ්‍රමණයෝ ප්‍රිය වෙත්.

276 අනවද්‍යකම් කරන්නාහු තුන් පව්මුල් දුරු කෙරෙති, රහත්-මගින් ඔවුන්ගේ සියලු පව් ප්‍රහීණ ය, එහෙයින් මට ශ්‍රමණයෝ ප්‍රිය වෙත්.

277. ඔවුන්ගේ කායකර්මය පවිත්‍ර වෙයි, වාක්කර්මය ද එබඳු ය, ඔවුන්ගේ මනඃකර්මය ද පවිත්‍ර වෙයි, එහෙයින් මට ශ්‍රමණයෝ ප්‍රිය වෙත්.

278. දෙවූ සක් හා මුතු මෙන් නිර්මලයහ, ශුද්ධ වූ ආශය ප්‍රයෝග ඇත්තාහ, ඒකාන්ත ශුක්ල වූ කුශලධර්මයෙන් පරිපූර්ණයහ, එහෙයින් මට ශ්‍රමණයෝ ප්‍රිය වෙත්.

279. (ඔහු) බහුශ්‍රුතයෝ ය, ධර්මධරයහ, ආර්‍යයෝ ය, දැහැමින් දිවිපවත්නාහ, භාෂිතාර්ථය ද දෙශනාධර්මය ද වදරති, එහෙයින් මට ශ්‍රමණයෝ ප්‍රිය වෙත්.

280. (ඔහු) බහුශ්‍රුතයෝ ය, ධර්මධරයෝ ය, ආර්‍යයෝ ය, ධර්මජීවිහු ය, එකඟවූ සිත් ඇතියහ, එළඹසිටි සිහි ඇත්තාහ, එහෙයින් මට ශ්‍රමණයෝ ප්‍රිය වෙත්.

281. වෙනෙහි දුරසෙනසුන් කරා යනුවහ, සිහි ඇතියෝ ය, නුවණින් බණනසුල්ලහ, සන්හුන් සිත් ඇතියහ, දුඃඛාන්ත වූ නිවන ප්‍රතිවේධ කෙරෙති, එහෙයින් මට ශ්‍රමණයෝ ප්‍රිය වෙත්.

282. යම් ගමෙකින් නික්ම යෙත් නම් එහි කිසිවක් අපෙක්ෂා විසින් නො බලති, නිරපෙක්‍ෂව මැ යෙති, එහෙයින් මට ශ්‍රමණයෝ ප්‍රිය වෙත්.

283. න තෙසං කොට්ඨෙ ඔපෙන්ති න කුම්භිං න ඛලොපියං
පරිනිට්ඨිතමෙසානා තෙන මෙ සමණා පියා.

284. න තෙ හිරඤ්ඤං ගණ්හන්ති න සුවණ්ණං න රූපියං
පච්චුප්පන්නෙන යාපෙන්ති තෙන මෙ සමණා පියා.

285. නානාකුලා පබ්බජිතා නානාජනපදෙහි ච
අඤ්ඤමඤ්ඤං පියායන්ති තෙන මෙ සමණා පියා

286. අත්ථාය වත නො හොති කුලෙ ජාතාසි රොහිණී
සද්ධා බුද්ධෙ ච ධම්මෙ ච සඞ්ඝෙ ච තිබ්බගාරවා.

287. තුවං හෙතං පජානාසි පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
අම්හම්පි ච තෙ සමණා පතිගණ්හන්ති දක්ඛිණං.
පතිට්ඨිතො හෙත්ථ යඤ්ඤො විපුලො නො භවිස්සති.

288 සචෙ භායසි දුක්ඛස්ස සචෙ තෙ දුක්ඛමප්පියං.
උපෙහි සරණං බුද්ධං ධම්මං සඞ්ඝඤ්ච තාදිනං,
සමාදියාහි සීලානි තං තෙ අත්ථාය හෙහිති.

289. උපෙමි සරණං බුද්ධං ධම්මං සඞ්ඝඤ්ච තාදිනං,
සමාදියාමි සීලානි තං මෙ අත්ථාය හෙහිති.

290 බ්‍රහ්මබන්ධු පුරෙ ආසිං සො ඉදානිම්හි බ්‍රාහ්මණො
තෙවිජ්ජො සොත්තියො චම්හි වෙදගූ චම්හි නහාතකොති.

ඉත්ථං සුදං රොහිණී ථෙරී ගාථායො අභාසිති.

රොහිණීථෙරීගාථා.

20. 3

291. ලට්ඨිහත්ථො පුරෙ ආසි සො දානි මිගලුද්දකො,
ආසාය පලිපා ඝොරා නාසක්ඛි පාරමෙතවෙ.

292. සුමුත්තං මං මඤ්ඤමානා චාපා පුත්තමතොසයි,
චාපාය බන්ධනං ඡෙත්වා පබ්බජිස්සං පුනොපහං.[1]

293. මා මෙ කුජ්ඣි මහාවීර මා මෙ කුජ්ඣි මහාමුනි,
න හි කොධපරෙතස්ස සුද්ධි අත්ථි කුතො තපො.

294. පක්කමිස්සං ච නාලාතො කොධ නාලාය වච්ඡති,
බන්ධන්ති[2] ඉත්ථිරූපෙන සමණෙ ධම්මජීවිනො

1. පුනොචහං - සිමු. 2. බන්ධති - මජසං, බන්ධන්ති - සිමු.

283. ඔහු තමා සතු සම්පත් කොටුයෙහි නො බහා තබති, හැළෙක නො තබති, පැසෙක නො බහති, පරකුලෙහි පිඩු අහර සොයනු වහ, එහෙයින් මට ශ්‍රමණයෝ ප්‍රිය වෙත්.

284. ඔහු කහවුණු නො ගනිති, රන් රිදී නො ගනිති, එකෙණෙහි උපන් පසයෙන් යැපෙති, එහෙයින් මට ශ්‍රමණයෝ ප්‍රිය වෙත්.

285. නන් කුලයෙන් ද නන් දනවුයෙන් ද නික්මැ පැවිදි වූවාහු උනුන් ප්‍රිය කෙරෙති (මෛත්‍රී කෙරෙති) එහෙයින් මට ශ්‍රමණයෝ ප්‍රිය වෙත්.

286. පින්වත් රෝහිණිය. තෙපි බුදුන් කෙරෙහි ද දහම්හි ද සඟුන් කෙරෙහි ද සැදැහැති ව දැඩි ගෞරව ඇති ව අපට වැඩ පිණිස (මේ) කුලයෙහි උපන්නාව.

287. තෙපි මැ තෙල අනුත්තර වූ පින්කෙත දන්නාව, ඒ ශ්‍රමණයෝ අපගේ ද දක්ෂිණාව පිළිගනිත් නම්, තෙල මහණුන් කෙරෙහි පිහිටුවනලද අපගේ දනධර්මය විපුලඵල වන්නේ ය.

288. ඉදින් (තෙපි) දුකට බිය වවු නම්, ඉදින් තොපට දුක අප්‍රිය වී නම්, තාදී වූ බුදුන් ද දහම් ද සඟුන් ද සරණ කොට යවු, සිල් සමාදන් වවු, එය තොපට වැඩ පිණිස වන්නේ ය.

289. මම තාදී වූ බුදුන් ද දහම් ද සඟුන් ද සරණ කොට යමි, සිල් සමාදන් වෙමි, ඒ මට වැඩ පිණිස වන්නේය.

290. (මම පෙර බමුණු කුලෙහි උපනින්) බ්‍රහ්මබන්ධු නම් වීමි, දැන් (බාහිත පාප බැවින්) බ්‍රාහ්මණ වෙමි, අධිගම් කළ ත්‍රිවිද්‍යා ඇත්තෙමි සොත්‍රිය ද වෙමි, මාර්ගඥානවේදයට පැමිණියෙම් ද නහාතක ද වෙමි'යි.

මෙසේ රෝහිණී තෙරණී ...

රෝහිණීථේරී ගාථා යි.

## 20. 3.

291. පෙර දඬුගත් අත් ඇති (පිරිවැජියෙක්) විය, හේ දැන් මුව වැද්දෙකි, ආශාව හේතු කොට ගෙන දරුණු වූ (කාමසඞ්ඛ්‍යාත දෘෂ්ටිසඞ්ඛ්‍යාත) පඞ්කයෙන් නිර්වාණපාරයට යන්නට නො හැකි විය. (මෙසේ උපක තමා සඳහා කී ය.)

292. (තමා කෙරෙහි) කාමයෙන් මෝහනාවට ඇලුණකු කොට මා සිතමින් චාපා තොමෝ පුතු නැළැවූ, චාපා කෙරෙහි වූ කෙලෙස් බැඳුම් සිඳ නැවත ද මම පැවිදි වන්නෙමි.

293. මහාවීරය, මට නහමක් කිපෙව, මහාමුනිවරය, මට නහමක් කිපෙව, කෝපයෙන් මඩනාලද්දහුට ශුද්ධියක් නැත, තපසෙක් කොයින් වේ ද?

294. 'නාලා'ගම්තුදු නික්ම යන්නෙමි, මේ නාලායෙහි කවරෙක් වසන්නේ ද (චාපාවෙනි, තෙපි) දැහැමින් දිවි වටන මහණුන් තමාගේ ස්ත්‍රීරූපයෙන් බඳිමින් සිටියාව.

295. එහි කාළ නිවත්තස්සු භුඤ්ජකාමෙ යථා පුරෙ
අහඤ්ච තෙ වසී කතා, යෙ ච මෙ සන්ති ඤාතකා.

296. එත්තො චාපි චතුබ්භාගං යථා භාසසි ත්වං ච මෙ
තයි රත්තස්ස පොසස්ස උළාරං වත තං සියා.

297. කාළඞ්ගිනිං ච තක්කාරිං පුප්ඵිතං ගිරිමුද්ධනි
ඵුල්ලං දාලිමයට්ඨිංව අන්තො දීපෙව පාටලිං.

298. හරිචන්දනලිත්තඞ්ගිං කාසිකුත්තමධාරිණිං
තං මං රූපවතිං සන්තිං කස්ස ඔහාය ගච්ඡසි.

299. සාකුන්තිකොව සකුණිං යථා බන්ධිතුමිච්ඡති,
ආහරිමෙන රූපෙන න මං ත්වං බාධයිස්සසි.

300. ඉමං ච මෙ පුත්තඵලං කාළ උප්පාදිතං තයා,
තං මං පුත්තවතිං සන්තිං කස්ස ඔහාය ගච්ඡසි.

301 ජහන්ති පුත්තෙ සප්පඤ්ඤා තතො ඤාතී තතො ධනං,
පබ්බජන්ති මහාවීරා නාගො ඡෙත්වාව බන්ධනං.

302. ඉදානි තෙ ඉමං පුත්තං දණ්ඩෙන ඡුරිකාය වා,
භූමියං වා නිසුම්භිස්සං පුත්තසොකා න ගච්ඡසි.

303. සචෙ පුත්තං සිගාලානං කුක්කුරානං පදාහිසි,
න මං පුත්තකතෙ[1] ජම්මි, පුනරාවත්තයිස්සසි.

304. හන්ද ඛො දානි භද්දන්තෙ කුහිං කාළ ගමිස්සසි,
කතමං ගාමං නිගමං නගරං රාජධානියො.

305. අහුම්හ පුබ්බෙ ගණිනො අස්සමණා සමණමානිනො,
ගාමෙන ගාමං විචරිම්හ නගරෙ රාජධානියො.

306. එසො හි භගවා බුද්ධො නදිං නෙරඤ්ජරං පති,
සබ්බදුක්ඛප්පහානාය ධම්මං දෙසෙති පාණිනං.
තස්සාහං සන්තිකෙ ගච්ඡං සො මෙ සත්ථා භවිස්සති.

307. වන්දනං දානි වජ්ජාසි ලොකනාථං අනුත්තරං
පදක්ඛිණං ච කත්වාන ආදිසෙය්‍යාසි දක්ඛිණං.

308. එතං ඛො ලබ්භමම්හෙහි යථා භාසසි ත්වං ච මෙ
වන්දනං දානි තෙ වජ්ජං ලොකනාථං අනුත්තරං,
පදක්ඛිණං ච කත්වාන ආදිසිස්සාමි දක්ඛිණං.

1. පුත්තකත්තෙ - මජසං, සිමු.

295. කළුව උපකය, එව නවතුව, පෙර මෙන් කාමයන් වළඳව මම ද මාගේ යම් නෑ කෙනෙක් වෙත් නම් ඔහු ද තොප විසින් වසඟ කරනලදුම්හ.

296. චාපාවෙනි, තෙපි මට යම්සේ කියවූ නම්, තිලින් සතරෙන් කොටසක් කියව, තොප කෙරෙහි රාගයෙන් ඇලුණු පුරුෂයක් හට එය ඒකාන්තයෙන් මහත් වන්නේ ය.

297. කාලය, පවුමුදුනෙක පිපුණු තරුණ කිණිහිරි ගසක් මෙන් ද පිපුණු දෙළුම් ගසක් මෙන් ද දූපතක් මැද පිපුණු පළොල් රුකක් මෙන් ද හොබනා සිරුරු ඇති.

298. රත්සඳුන් අලෙව්දුන් අවයව ඇති උතුම් කසීසළු දරන රූපවත් වූ මා කවරක් හට හැරපියා යෙහි ද?

299. යම් පරිදි ලිහිණි වැද්දෙක් ලිහිණියක බඳින්නට කැමැති වේ ද, එහෙයින් කෘත්‍රිම රූපයෙන් තෝ මා නො පෙලව,

300. කාලය මාගේ මේ පුත්‍රඵලය ද තොප විසින් උපදවන ලද, පුතකු ඇති ඒ මා කවරක්හට හැරපියා යවු ද?

301. නුවණැති පුරුෂයෝ පුත්‍රයන් හැරපියති, යළි නෑයන් ද යළි ධනය ද හැරපියති, ඇතෙක් (යදම්) බැඳුම් මෙන් මහාවීරයෝ ගිහිබැඳුම් සිඳපියා පැවිදි වෙත්.

302. දැන් තොපගේ මේ පුතු දඬුයෙකින් හෝ පැහැර සිරියෙකින් හෝ විද (නසම්,) බිමැ හෝ හෙළාපියම්, පුතු කෙරෙහි කළ ශෝකයෙන් නො යන්නෙහි.

303. ළමු තෙනැත්තිය, ඉදින් පුතු සිවලුන්ට හෝ ශුනකයන්ට හෝ දෙන්නෙහි නමුදු පුතු නිමිති කොට මා පෙරළා නො නවත්ව.

304. සොඳය! හිමි කාලයෙහි, දැන් කවර ගමකට නිගමයකට නුවරකට රජදහනකට හෝ කවර තැනෙක්හි යන්නහු ද?

305. (ඇපි) පෙර ගණප්‍රධාන ව අශ්‍රමණ ව ශ්‍රමණයම්හ යන මාන ඇති වූම්හ, ගමින් ගමැ නගරයන්හි රජදහන්හි හැසිරුණම්හ.

306. තෙල භගවත් වූ බුදුහු නේරඤ්ජරා නදිය සමීපයෙහි සියලු දුක් නැසීම පිණිස සත්නට දහම් දෙසති. මම ඔබ කරා යෙමි, ඔබ මට ශාස්තෘ වන්නාහ.

307. මෙ විට අනුත්තර වූ ලෝකනාථයන් වහන්සේට (මාගේ) වැඳුම කියව, (මාගේ වැඳමෙන් වඳව'යි සේයි.) යළි පැදකුණු කොට මට පුණ්‍යදක්ෂිණාව දක්වා දුන මැනැව.

308. තෙපි මට යම්සේ කියවූ නම්, එපරිදි තෙල ප්‍රදක්ෂිණාහෙතුක කුශලය වැලිත් අපගෙන් ලැබිය හැකි වෙයි, මේ විට අනුත්තර වූ ලොකනාථයන් වහන්සේට තීගේ වැඳුම කියන්නෙමි, යළි පැදකුණු කොට පුණ්‍යදක්ෂිණාව දක්වාලන්නෙමි.

309. තතොව කාලො පක්කාමි නදිං නෙරඤ්ජරං පති,
සො අද්දසාසි සම්බුද්ධං දෙසෙන්තං අමතං පදං.

310. දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං,
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං.

311. තස්ස පාදානි වන්දිත්වා කත්වාන තං පදක්ඛිණං,
චාපාය ආදිසිත්වාන පබ්බජී අනගාරියං.
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනන්ති.

ඉත්ථං සුදං චාපා ථෙරී ගාථායො අභාසීති.

**චාපාථෙරීගාථා.**

## 20. 4

312. පෙතානි භොති පුත්තානි ඛාදමානා තුවං පුරෙ
තුවං දිවා ච රත්තො ච අතීව පරිතප්පසි.

313. සාජ්ජ සබ්බානි ඛාදිත්වා සතපුත්තානි බ්‍රාහ්මණි,
වාසෙට්ඨි කෙන වණ්ණෙන න බාළ්හං පරිතප්පසි.

314. බහූනි පුත්තසතානි ඤාතිසඞ්ඝසතානි ච
ඛාදිතානි අතීතංසෙ මම තුය්හං ච බ්‍රාහ්මණ.

315. සාහං නිස්සරණං ඤත්වා ජාතියා මරණස්ස ච
න සොචාමි න රොදමි න චාපි පරිතප්පයිං.

316. අබ්භුතං වත වාසෙට්ඨි වාචං භාසසි එදිසිං,
කස්ස ත්වං ධම්මමඤ්ඤාය ගිරං භාසසි එදිසං.

317. එස බ්‍රාහ්මණ සම්බුද්ධො නගරං මිථිලං පති,
සබ්බදුක්ඛප්පහානාය ධම්මං දෙසෙසි පාණිනං.

318. තස්ස බ්‍රාහ්මණ[1] අරහතො' ධම්මං සුත්වා නිරූපධිං'
තත්ථ විඤ්ඤාතසද්ධම්මා පුත්තසොකං ව්‍යපානුදිං.

319. සො අහම්පි ගමිස්සාමි නගරං මිථිලං පති,
අප්පෙව මං සො භගවා සබ්බදුක්ඛා පමොචයෙ,
අද්දස බ්‍රාහ්මණො බුද්ධං විප්පමුත්තං නිරූපධිං.

320. සොස්ස ධම්මමදෙසෙසි මුනි දුක්ඛස්ස පාරගූ,
දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං,
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං.

321. තත්ථ විඤ්ඤාතසද්ධම්මො පබ්බජ්ජං සමරොචයිං,
සුජාතො තීහි රත්තීහි තිස්සො විජ්ජා අඵස්සයී.

---

1. බ්‍රහ්මෙ - මජසං

309-310. ඉක්බිති කාල (උපක) තෙමේ තෙරඤ්ජරානදිය කරා නික්ම ගියේ ය, හේ දුක යෑ, දුක් ඉපැදීම යෑ, දුක් නැසීම යෑ, දුක් නැසීමට පමුණුවන අරිඅටඟි මඟ යෑ යන අමෘතපදය දෙසන සම්මාසම්බුදුන් දිටි.

311. හේ ඒ බුදුන්ගේ පාසඟුළු වැඳ පැදකුණු කොට චාපාවට (පුණ්‍යදක්ෂිණාව) දක්වාදී ශාසනයෙහි පැවිදි වී, (ඔහු විසින්) ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ, බුදුන්ගේ අනුසසුන් කරන ලදැයි.

මෙසේ චාපා තෙරණී ...

චාපාථේරීගාථා යි.

## 20. 4

312. භවතිය, තෙපි පෙර මැරී ගිය පුතුන් කමින් (හැසුරුණාව) තෙපි රැයිදු දහවල්හි දු ඉතා ම තැවුණාව.

313. වාසෙට්ඨි බැමිණිය, ඒ තෙපි සියලු සිය ගණන් පුතුන් කා දූත් කවර කරුණෙකින් දැඩි ව නො තැවෙව් දැ?

314. බමුණ, අතීත භවයෙහි මයිදු තොප දු විසින් බොහෝ සිය-ගණන් පුත්‍රයෝ ද සිය ගණන් ඥාතිසමූහයෝ ද කනලදහ.

315. ඒ මේ ජාති (ජරා) මරණයන්ගේ නිස්සරණය වූ නිවන මඟ-නැණින් පිළිවිද දැන ශෝක නො කරමි, නො හඬමි, උපායාසයට නො පැමිණියම් වෙමි.

316 වාසෙට්ඨිය, ඒකාන්තයෙන් අද්භූත යෑ, මෙබඳු (න සොචාමි' යනාදි) බස් කියව. තෙපි කවර ශාස්තෘ කෙනකුන්ගේ දහම් දැන තිර කොට මෙබඳු බස් කියව් ද.

317 බමුණ, තෙල සම්මාසම්බුදුහු මිථිලා නගරයෙහි සියලු දුක් නැසීම පිණිස සත්නට දහම් දෙසනසේක.

318 බමුණ, අර්හත් වූ ඒ බුදුන්ගේ නිදුක් වූ දහම් අසා එහි ප්‍රතිවේධ කල ආයසීධම් ඇති මම පුත්‍රශෝකය හැරපීමි.

319. මම ද මිථිලා නගරයට යන්නෙමි, ඒ භාග්‍යවත්හු මා සියලු දුකින් මුදලනසේක් නම් ඉතා මැනැවැ'යි බමුණු (කෙලෙසුන් කෙරෙන් හා භවයෙන්) වෙසෙසින් මිදුණු උපධි රහිත වූ බුදුන් දිටි.

320. වට්ටදුක්ඛයාගේ පරතෙරට පැමිණී ඒ මුනිහු ඔහුට දුක යෑ, දුක් ඉපදීම යෑ දුක් නැසීම යෑ දුක් නැසීමට පමුණුවන අරිඅටඟි-මඟ යෑ යන සියුසස් දහම් දෙසූසේක.

321. එහි දී අවබෝධ කල සිව්සස් දහම් ඇති සුජාත තෙම පැවිද්ද රුචි කෙළේ ය. තුන්රැයෙකින් ත්‍රිවිද්‍යාවන් ප්‍රත්‍යක්ෂ කෙළේ ය.

322. එහි සාරථි ගච්ඡාහි රථං නීයාදියාහි'මං,
ආරොග්‍යං බ්‍රාහ්මණිං වජ්ජා පබ්බජිතොදානි බ්‍රාහ්මණො,
සුජාතො තීහි රත්තීහි තිස්සො විජ්ජා අඵස්සයි.

323. තතො ච රථමාදාය සහස්සං චාපි සාරථි,
ආරොග්‍යං බ්‍රාහ්මණිංවොච පබ්බජිතොදානි බ්‍රාහ්මණො,
සුජාතො තීහි රත්තීහි තිස්සො විජ්ජා අඵස්සයි.

324. එතං චාහං අස්සරථං සහස්සං චාපි සාරථි,
තෙවිජ්ජං බ්‍රාහ්මණං ඤත්වා[1] පුණ්ණපත්තං දදාමි තෙ.

325. තුය්හෙව හොත්වස්සරථො[2] සහස්සං චාපි බ්‍රාහ්මණි,
අහම්පි පබ්බජිස්සාමි වරපඤ්ඤස්ස සන්තිකෙ.

326. හත්ථී ගවස්සං මණිකුණ්ඩලඤ්ච
ඵීතඤ්චිමං ගහවිභවං පහාය,
පිතා පබ්බජිතො තුය්හං.
භුඤ්ජ භොගානි සුන්දරී තුවං දායාදිකා කුලෙ.

327. හත්ථී ගවස්සං මණිකුණ්ඩලඤ්ච
රම්මං චිමං ගහවිභවං පහාය,
පිතා පබ්බජිතො මය්හං පුත්තසොකෙන අට්ටිතො
අහම්පි පබ්බජිස්සාමි භාතුසොකෙන අට්ටිතා.

328 සො තෙ ඉජ්ඣතු සඞ්කප්පො යං ත්වං පත්ථෙසි සුන්දරී,
උත්තිට්ඨපිණ්ඩො උඤ්ඡො ච පංසුකූලං ච චීවරං,
එතානි අභිසම්භොන්ති පරලොකෙ අනාසවා.

329. සික්ඛමානාය මෙ අය්‍යෙ දිබ්බචක්ඛුං[3] විසොධිතං,
පුබ්බෙනිවාසං ජානාමි යත්ථ මෙ වුසිතං පුරෙ.

330. තුවං නිස්සාය කල්‍යාණී ථෙරී සඞ්ඝස්ස සොභනෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

331. අනුජානාහි මෙ අය්‍යෙ ඉච්ඡෙ සාවත්ථිං ගන්තවෙ,
සීහනාදං නදිස්සාමි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ.

332. පස්ස සුන්දරී සත්ථාරං හෙමවණ්ණං හරිත්තචං,
අදන්තානං දමෙතාරං සම්බුද්ධමකුතොභයං

333. පස්ස සුන්දරිමායන්තිං විප්පමුත්තං නිරූපධිං,
වීතරාගං විසංයුත්තං කතකිච්චං අනාසවං.

334. බාරාණසීතො නික්ඛම්ම තව සන්තිකමාගතා,
සාවිකා තෙ මහාවීර පාදෙ වන්දති සුන්දරී.

---

1 සුත්වා - මජසං. 2 තුය්හෙව හොතුස්සරථො - සීමු
3 දිබ්බචක්ඛු - මජසං.

322. එව රියසැරිය, යා, මේ රිය (බැමිණියට) පාවාදෙව, බැමිණියට (මාගේ) නිරෝගි බව කියව, දූත් සුජාත බමුණු පැවිදිවූයේ තුන්-රැයෙකින් ත්‍රිවිද්‍යාවන් පසක්කළැ'යි කියව.

323. ඉක්බිති රියසැරි තෙම රිය ද (මඟ වියදමට ගෙනෙනලද) කහවණු දහස ද ගෙන ගොස් බැමිණියට (ඔහු) නිරෝග බව කී, දූත් සුජාත බමුණු පැවිදි වූයේ තුන්රැයකින් ත්‍රිවිද්‍යාවන් පසක් කළේ යයි ද කී.

324. රිය සැරිය බමුණු ත්‍රිවිද්‍යා ඇතියහු දූන තෙල අසුත් සෙදූ රිය ද කහවණු දහස ද තොපට තුටුපඬුරු කොට දෙමි.

325. බැමිණියනි, අස්රිය ද කහවණු දහස ද තොපට මැ වේවා. මම ද උත්තමප්‍රාඥ වූ බුදුන් වෙත පැවිදිවන්නෙමි.

326. සුන්‍දරිය, තොපගේ පිය තෙම ඇත්හු ද ගව අස්හු ද මිණි-කොඬොල් ද යනාදි බොහෝ වූ ගෘහොපකරණ ද හැරදමා පැවිදි විය, තෙපි මේ භෝගයන් පරිභොග කරව, තෙපි ම මේ කුලයෙහි දායාද්‍යයට සුදුස්සව.

327. මාගේ පිය තෙම පුත්‍රශෝකයෙන් දුකට පැමිණියේ ඇත්හු ද ගව අස්හු ද මිණි - කොඬොල් ද යනාදි වූ සිත්කලු ගෘහොප-කරණ ද හැරපියා පැවිදිවිය, භ්‍රාතෘශොකයෙන් දුකට පැමිණි මම ද පැවිදි වෙමි.

328. සුන්‍දරිය, තෙපි යම් පැවිද්දක් පතවූ නම්, තොපගේ ඒ පැවිදි සංකල්පය සමෘද්ධ වේවා, ගෙයක් පාසා සිට ලැබියයුතු පිණ්ඩය ද පිඬුසිඟා යෑම ද පාංශුකූල චීවරය ද යන මේ ලැබෙමින් පරලොවැ අනාස්‍රව වවු.

329. ආර්‍ය්‍යාවෙනි, ශික්‍ෂමාණාවක වූ මා විසින් දිවඇස පිරිසුදු කරන ලද, මා පෙර යම් තැනෙක වුසූ නම් ඒ පූර්‍වනිවාස දනිමි.

330. භික්‍ෂුණීසඞ්ඝයාට සඞ්ඝසථවිරා වූ ශොබනා ගුණ ඇති කල්‍යාණ මිත්‍ර වූ ආර්‍ය්‍යාවෙනි, තොප නිසා (මා විසින්) ත්‍රිවිද්‍යාවෝ ලබන ලදහ. බුදු සසුන් කරන ලද.

331. ආර්‍ය්‍යාවෙනි, මට අවසර දුන මැනැව, සැවතට යන්නට කැමැත්තමි, බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේ සමීපයෙහි සිංහනාද කරමි.

332. සුන්‍දරිය, සවණ්වණ් වූ රන්වන් සිවිපැහැ ඇති අදාන්තයන් දමනය කරන සම්බුද්ධ වූ කොයිනුදු බිය නැති ශාස්තෘන්වහන්සේ බලව.

333. කෙලෙසුන් කෙරෙන් මිදුණු උපධි රහිත වූ විගත රාග වූ සංයොජන රහිත වූ කළ කිච්චගකිස ඇති අනාස්‍රව වූ එන්නා වූ සුන්‍දරී නම් මා බලනු මැනැව.

334. මහාවීරයන් වහන්ස, බරණැසින් නික්ම නුඹවහන්සේ සමීපයට පැමිණි ශ්‍රාවිකා වූ සුන්‍දරී නුඹවහන්සේ ගේ පාදයන් වඳී.

335. තුවං බුද්ධො තුවං සත්ථා තුය්හං ධීතාම්හි බ්‍රාහ්මණ,
ඔරසා මුඛතො ජාතා කතකිච්චා අනාසවා.

336. තස්සා තෙ ස්වාගතං භද්දෙ තතො තෙ අදූරාගතං,
එවං හි දන්තා ආයන්ති සත්ථුපාදානි වන්දිතා,
වීතරාගා විසංයුත්තා කතකිච්චා අනාසවා’ති.

ඉත්ථං සුදං සුන්දරී ථෙරී ගාථායො අභාසීති

සුන්දරීථෙරීගාථා.

## 20. 5

337. දහරා අහං සුද්ධවසනා යං පුරෙ ධම්මමස්සුණිං,
තස්සා මෙ අප්පමත්තාය සච්චාභිසමයො අහු.

338. තතොහං සබ්බකාමෙසු භුසං අරතිමජ්ඣගං,
සක්කායස්මිං භයං දිස්වා නෙක්ඛම්මඤ්ඤෙව[1] පීහයෙ

339. හිත්වානහං ඤාතිගණං දාසකම්මකරානි ච,
ගාමඛෙත්තානි ඵීතානි රමණීයෙ පමොදිතෙ.

340. පහායහං පබ්බජිතා සාපතෙය්‍යමනප්පකං,
එවං සද්ධාය නික්ඛම්ම සද්ධම්මෙ සුප්පවෙදිතෙ
න මෙතං[2] අස්ස පතිරූපං ආකිඤ්චඤ්ඤං හි පත්ථයෙ.

341. යො ජාතරූපං රජතං ඡඩ්ඩෙත්වා පුනරාගමෙ
රජතං ජාතරූපං වා න බොධාය න සන්තියා
නෙතං සමණ සාරුප්පං න එතං අරියං ධනං.[3]

342. ලොභනං මදනං චෙතං මොහනං රජවඩ්ඪනං,
සාසඞ්කං බහු ආයාසං නත්ථි චෙත්ථ ධුවං ඨිති.

343. එත්ථ රත්තා පමත්තා ච සංකිලිට්ඨමනා නරා,
අඤ්ඤමඤ්ඤෙන ව්‍යාරුද්ධා පුථුකුබ්බන්ති මෙධගං.

344. වධො බන්ධො පරික්ලෙසො ජානි සොකපරිද්දවො,
කාමෙසු අධිපන්නානං දිස්සතෙ ව්‍යසනං බහුං.

345. තං මං ඤාතී අමිත්තාව කිං වො කාමෙසු යුඤ්ජථ,
ජානාථ මං පබ්බජිතං කාමෙසු භයදස්සිනිං.

1 නෙක්ඛම්මමෙව - මජසං. 2 නෙතං - මජසං. 3 අරියද්ධනං මජසං.

335. බාහිතපාපී බ්‍රාහ්මණයන් වහන්ස, තුඹවහන්සේ බුද්ධයහ, තුඹවහන්සේ ශාස්තෘහ, (මේ) තුඹවහන්සේගේ ඖරස වූ (ආර්‍යමාර්ග) මුඛයෙන් උපන් කළ කිස ඇති අනාස්‍රව වූ දුහිතෘ වෙමි.

336. භද්‍රා සුන්‍දරිය, (ආර්‍යමාර්ගදමථයෙන්) දැමුණු වීතරාග වූ විගත-සංයොජන වූ කෘතකෘත්‍ය වූ අනාස්‍රව වූවාහු ශාස්තෘන්ගේ පාසඟුළු වඳිමින් මෙසේ මැ පැමිණෙති, තොප (මෙහි මා වෙත) පැමිණීම ස්වාගතයෙකි, තොපගේ ඊම දුරාගතයෙක් නො වේ යයි.

මෙසේ සුන්‍දරී තෙරණී ...

සුන්‍දරී ථේරීගාථා යි.

20. 5

337. යම්හෙයෙකින් පෙර ශුද්ධවස්ත්‍රාභරණයෙන් සැරසුණු තරුණ වූ මම (බුදුන් වෙත) බණ ඇසීම් ද එහෙයින් එළඹ සිටි සිහිඇති මට සත්‍යාවබෝධය විය.

338. එහෙයින් මම සියලු (දිව්‍ය - මානුෂ) කාමයන්හි අරතියට පැමිණීමි, පඤ්චොපාදානස්කන්ධයෙහි භය තුවණැසින් දැක පැවිද්ද ම කැමැතිවෙමි.

339. මම ඥාතිසමූහයා ද දසුන් කම්කරුවන් ද සමෘද්ධ වූ ගම්කෙත් ද සිත්කලු වූ සතුටු එළවන භෝගයන් ද හැරපියා (පැවිදිවීමි)

340. ‘මම අනල්ප වූ සම්පත් හැරපියා මෙසේ සැදැහැයෙන් ගිහිගෙන් නික්ම (බුදුන් විසින්) මැනැවින් අවබොධ කළ ආර්‍යවිනයෙහි පැවිදිවීමි, එහෙයින් තෙල මට සුදුසු නොවන්නේය, අකිඤ්චනභාවය මැ පතමි.

341. යම් පුඟුලෙක් රන් රිදී ආදිය හැරපියා නැවත ගන්නේ නම් (හේ පඹුවන් අතර කෙසේ හිස ඔසොවන්නේ ද?) රිදී හෝ රන් හෝ සත්‍යාවබොධය පිණිස නොවේ, නිවන පිණිස නොවේ, තෙල ශ්‍රමණසාරුප්‍ය නො වෙයි, තෙල ආර්‍යධනය නො වේ.

342. තෙල ලොභ උපදවනු ද මද එළවනු ද මුළා කරනු ද කෙලෙස් රජස් වඩනු ද ආශඞ්කා සහිත ද බොහෝ ආයාස ඇත්තේ ද වෙයි, තෙල ධනයෙහි ධ්‍රැවබවක් ස්ථිතබවක් හෝ නැති.

343. තෙල ධනයෙහි ඇලුණා වූ ද ප්‍රමත්ත වූ ද සංක්ලිෂ්ට වූ සිත් ඇති සත්ත්වයෝ ඔවුනොවුන් ප්‍රතිවිරුද්ධ වූවාහු බොහෝ කලහ කෙරෙත්.

344. කාමයන්හි බැසගෙන සිටියානට මරණය (අන්දුබන්ධාදි,) බන්ධනය (හස්තච්ඡේදාදි) වෙහෙසය (ධනාදීන්ගේ) හානිය ශොක පරිදෙවය යන බොහෝ ව්‍යසන දක්නා ලැබේ.

345. එබඳු වූ මා ඥාති වූ යුෂ්මත්හු පසමිතුරන් සෙයින් කුමක් හෙයින් කාමයන්හි යොදවවු ද, කාමයන්හි බිය දක්නාසුලු වූ මා පැවිදි වූවක කොට දන්නහු ය.

346. න හිරඤ්ඤසුවණ්ණෙන පරික්ඛීයන්ති ආසවා
අමිත්තා වධකා කාමා සපත්තා සල්ලබන්ධනා.

347. තං මං ඤාතී අමිත්තාව කිං වො කාමෙසු යුඤ්ජථ,
ජානාථ මං පබ්බජිතං මුණ්ඩං සඞ්ඝාටිපාරුතං.

348. උත්තිට්ඨපිණ්ඩො උඤ්ඡො ච පංසුකූලං ච චීවරං,
එතං ඛො මම සාරුප්පං අනාගාරූපනිස්සයො.

349. වන්තා මහෙසීහි කාමා යෙ දිබ්බා යෙ ච මානුසා
ඛෙමට්ඨානෙ විමුත්තා තෙ පත්තා තෙ අචලං සුඛං.

350. නාහං කාමෙහි සඞ්ගච්ඡිං යෙසු තාණං න විජ්ජති,
අමිත්තා වධකා කාමා අග්ගික්ඛන්ධසමා[1] දුඛා

351. පරිපන්ථො එස භයො සවිඝාතො සකණ්ටකො,
ගෙධො සුවිසමො ලෙපො මහන්තො මොහනාමුඛො.

352. උපසග්ගො භීමරූපො කාමා සප්පසිරූපමා,
යෙ බාලා අභිනන්දන්ති අන්ධභූතා පුථුජ්ජනා.

353. කාමපඞ්කෙන සත්තා හි බහූ ලොකෙ අවිද්දසු,
පරියන්තං නාභිජානන්ති ජාතියා මරණස්ස ච.

354 දුග්ගතිගමනං මග්ගං මනුස්සා කාමහෙතුකං,
බහුං වෙ පටිපජ්ජන්ති අත්තනො රොගමාවහං.

355 එවං අමිත්තජනනා තාපනා සංකිලෙසිකා,
ලොකාමිසා බන්ධනීයා[2] කාමා මරණබන්ධනා.

356. උම්මාදනා උල්ලපනා කාමා චිත්තප්පමාථිනො[3]
සත්තානං සංකිලෙසාය ඛිපං[4] මාරෙන ඔඩ්ඩිතං.

357. අනන්තාදීනවා කාමා බහුදුක්ඛා මහාවිසා,
අප්පස්සාදා රණකරා සුක්කපක්ඛවිසොසනා.

358. සාහං එතාදිසං කත්වා ව්‍යසනං කාමහෙතුකං,
න තං පච්චාගමිස්සාමි නිබ්බානාභිරතා සදා.

1. අග්ගික්ඛන්ධූපමා- මජසං  2. බන්ධනීයා
3. චිත්තප්පමද්දිනො - මජසං පු.  4. ඛිප්පං - මජසං,

346. හිරණ්‍ය සුවර්ණයෙන් (කාමාදි) ආස්‍රවයෝ ක්‍ෂය වීමට නොයෙති, කාමයෝ අමිත්‍රයෝ යැ වධකයෝ යැ සතුරෝ යැ සල්‍යබන්ධනයෝ යි.

347. එබඳු මා ඥාති වූ ශුභමත්හු පසමිතුරන් සෙයින් කුමක් හෙයින් කාමයන්හි යොදවවූ ද, මුඬුකළ කෙස් ඇති සඟළ සිවුරු පෙරෑ වූ මා පැවිදි වූවක කොට දත්නහු ය.

348. ගෙයක් පාසා සිට ලද පිණ්ඩාහාරය ද (ඒ සඳහා) පිඬු සිඟා-යෑම ද පාංශුකූල චීවරය ද පැවිද්දනට තිසි ජීවිතපරිෂ්කාරය ද යන මේ මට සුදුසු වේ.

349. දිව්‍ය වූ ද මානුෂික වූ ද යම් කාමයෝ වෙත් ද ඔහු බුද්ධාදි මහර්ෂීන් විසින් හැරදමනලද්දහ, ඒ මහර්ෂිහු ක්ෂේමස්ථාන වූ නිවන අරමුණුකොට විමුක්තයහ, ඔහු අචල වූ නිවන්සුවයට පැමිණියාහ.

350. යම් කාමකෙනකුන් කෙරෙහි අනර්ථපරිත්‍රාණයෙක් නැද්ද (එහෙයින්) මම කාමයන් හා සමාගමයට නොයමි. කාමයෝ අමිත්‍රයෝ යැ වධකයෝ යැ ගිනිකඳු සම ව දුක් ඇත්තාහු යි.

351. තෙල උවදුරෙක භයෙක විහනපීඩාෙයක කටුසහිතයෙක ගෙධයෙක අතිවිෂමයෙක ලෙපයෙක මහත් වූ මෝහනයට දොරටුයෙකි.

352. බිහිසුණු සැහැවි ඇති උවදුරෙකි, මෝහයෙන් අන්ධ වූ පුහුදුන් බාලයෝ යම්බඳු කාමයන් පතා සිටිත් ද ඒ කාමයෝ (සප්‍රති-භයාර්ථයෙන්) සර්පශිර්ෂෝපම වූහ.

353. ලොවැ කාමපඞ්කයෙන් ඇලුණාවූ බොහෝ අඥනයෝ ජාති-මරණයන්ගේ කෙළවර නොදනිත්.

354. මනුෂ්‍යයෝ ඒකාන්තයෙන් තමහට රෝග එලවන කාම හෙතුක වූ දුගතියට යන මඟට බොහෝ කොට පිවිසෙත්.

355. මෙසේ පසමිතුරන් උපදවන තැවුලි කරන සාංකෙලශික වූ ලොකාමිෂ වූ සංයොජනයන් විසින් බැන්දයුතු වූ කාමයෝ (භවා-දියෙහි ඉපදීමට කරුණු හෙයින්) පාදබන්ධනයෝ යි.

356. උමතුබව ඇතිකරන 'අහො සුව යැ'යි කියවන කාමයෝ සිත් කලඹන සුලු වූහ, සත්ත්වයන්ගේ කෙලෙසීම පිණිස මරහු විසින් ඔබනලද කෙමිනෙකි.

357. කාමයෝ අනන්ත ආදීනව (දෙෂ) ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, මහත් විෂබඳු වූහ, අල්ප වූ ආස්වාද ඇත්තාහ, මහත් රාගාදිය වඩනාහු ය, (සත්ත්වයන්ගේ) කුශලපක්ෂය වනසන්නාහ.

358. මම් කාම හේතුක වූ ව්‍යසනය මෙබඳු යැයි කොට (සලකා) ඒ කාමයට පෙරලා නො එමි, හැම කල්හි නිවනෙහි අභිරත වීමි ද එහෙයිනි.

359. රණං තරිත්වා[1] කාමානං සීතිභාවාභිකඞ්ඛිනී,
අප්පමත්තා විහස්සාමි තෙසං සංයොජනක්ඛයෙ.

360. අසොකං විරජං ඛෙමං අරියට්ඨඞ්ගිකං උජුං,
තං මග්ගං අනුගච්ඡාමි යෙන තිණ්ණා මහෙසිනො.

361. ඉමං පස්සථ ධම්මට්ඨං සුභං කම්මාරධීතරං,
අනෙජං උපසම්පජ්ජ රුක්ඛමූලම්හි ඣායති.

362. අජ්ජට්ඨමී පබ්බජිතා සද්ධා සද්ධම්මසොභනා,
විනීතුප්පලවණ්ණාය තෙවිජ්ජා මච්චුහායිනී.

363. සායං භුජිස්සා අනණා භික්ඛුනී භාවිතින්ද්‍රියා,
සබ්බයොගවිසංයුත්තා කතකිච්චා අනාසවා.

364. තං සක්කො දෙවසඞ්ඝෙන උපසඞ්කම්ම ඉද්ධියා,
නමස්සති භූතපති සුභං කම්මාරධීතරන්ති.

ඉත්ථං සුදං සුභා කම්මාරධීතා ථෙරී ගාථායො අභාසිත්ථ.

සුභාකම්මාරධීතුථෙරීගාථා.

## වීසතිනිපාතො නිට්ඨිතො.

1. කරිත්වා - මජසං.

359. සිතිභාව සඞ්ඛ්‍යාත අභීප්සිතය කැමැති වූ මම කාමයන් පිළිබඳ ක්ලේශය තරණය කොට සර්වසංයෝජනක්ෂය සංඛ්‍යාත නිවනෙහි අප්‍රමත්ත ව වෙසෙමි.

360 බුද්ධාදි මහර්ෂිහු යම් මඟෙකින් සසර තරණය කළාහු ද ශෝක රහිත වූ විරජ වූ නිර්භය වූ ආර්‍යඅෂ්ටාඞ්ගික වූ ඒ ඍජු මාර්ගය අනුගමනය කරමි.

361. ආර්‍යඵලධර්මයෙහි සිටි මේ සුභා නම් කඹුරුදියණියන් බලව. ඕ අනේජ සංඛ්‍යාත රහත්ඵලයට පැමිණ රුක්මුල්හි හිඳ ඒ ඵල සමවතින් ධ්‍යාන කෙරෙයි.

362. අද පැවිදි වූ අටවැනි දිනය ඇති ශ්‍රද්ධාසම්පන්න වූ මඟපල දහම් අධිගමයෙන් ශෝභන වූ උප්පලවණ්ණා විසින් හික්මවන ලද ත්‍රිවිද්‍යා ඇති මරුන් දුරුකළාවූ.

363 ක්ලේශදශවස්තුයෙන් නිදසි වූ කාමච්ඡන්දාදිය දුරලීමෙන් අණන වූ වැඩූ ශ්‍රද්ධාදි ඉඳුරන් ඇති මේ සුභා මෙහෙණ සියලු යෝගයෙන් විසංයුක්ත වූවා කළ කිස ඇත්තී අනාස්‍රව වූ.

364. භූතපති වූ ශක්‍ර තෙමේ දේවසමූහයා සමග ඉදුහයෙන් ඈය කරා එළඹ සුභා නම් කඹුරුදියණියන් වඳී ය යි.

මෙසේ කම්මාරදුහිතා වූ සුභා තෙරණී ...

සුභාථේරීගාථා යි.

## වීසතිනිපාතය නිමි.

# තිංසතිනිපාතො.

## 30. 1.

365. ජීවකම්බවනං රම්මං ගච්ඡන්තිං භික්ඛුනිං සුභං,
ධුත්තකො සන්නිවාරෙසි තමෙනං අබ්‍රවී සුභා.

366. කිං තෙ අපරාධිතං මයා යං මං ඔවරියාන තිට්ඨසි
න හි පබ්බජිතාය ආවුසො පුරිසො සම්ඵුසනාය කප්පති.

367. ගරුකෙ මම සත්ථුසාසනෙ යා සික්ඛා සුගතෙන දෙසිතා,
පරිසුද්ධපදං අනඞ්ගණං කිං මං ඔවරියාන තිට්ඨසි.

368. ආවිලචිත්තො අනාවිලං සරජො වීතරජං අනඞ්ගණං.
සබ්බත්ථ විමුත්තමානසං කිං මං ඔවරියාන තිට්ඨසි.

369. දහරා ච අපාපිකා චසි කිං තෙ පබ්බජ්ජා කරිස්සති,
නික්ඛිප කාසාය චීවරං එහි රමාමසෙ පුප්ඵිතෙ[1] වනෙ.

370. මධුරඤ්ච පවන්ති සබ්බසො කුසුමරජෙන සමුට්ඨිතා දුමා,
පඨමවසන්තො සුඛො උතු එහි රමාමසෙ පුප්ඵිතෙ[1] වනෙ

371. කුසුමිතසිඛරා ච පාදපා අභිගජ්ජන්තිව මාලුතෙරිතා
කා තුය්හං රති භවිස්සති යදි එකා වනමොතරිස්සසි.

372. වාලමිගසඞ්ඝසෙවිතං කුඤ්ජරමත්තකරෙණුලොළිතං,
අසහායිකා ගන්තුමිච්ඡසි රහිතං භිංසනකං මහාවනං.

373. තපනීයකතාව ධීතිකා විචරසි චිත්තරථෙව[2] අච්ඡරා,
කාසිකසුඛුමෙහි වග්ගුහි සොභසි වසනෙහි නූපමෙ.

374. අහං තව වසානුගො සියං යදි විහරෙමසෙ කානනන්තරෙ,
න හි මත්ථි තයා පියතරො පාණො කින්නරිමන්දලොචනෙ.

375 යදි මෙ වචනං කරිස්සසි සුඛිතා එහි අගාරමාවස,
පාසාදනිවාතවාසිනී පරිකම්මං තෙ කරොන්තු නාරියො,

1. සුපුප්ඵිතෙ - මජසං. 2. චිත්තලතෙව - මජසං.

# 30. තිංසනිපාතය.

## 30. 1

365. රමණීය වූ කොමාරභච්ච ජීවකයන්ගේ අඹවනයට (දිවාවිහාර සඳහා) යන සුභා භික්ෂුණිය ස්ත්‍රීධූර්තයෙක් වැළැකී, සුභා මෙහෙණ ඔහුට මෙසේ කීවු ය.

366. යම්හෙයෙකින් (තෙපි) මා අවුරා සිටියහු ද, මා විසින් තොපට කවර අපරාධයෙක් කරනලද ද? ඇවැත්නි, පැවිද්දක විසින් පුරුෂයෙක් ස්පර්ශ කරන්නට නො මැ කැපවෙයි.

367. මට ශාස්තෘශාසනය (පහණසතක් සෙයින්) ගුරු වෙයි, සුගතයන් විසින් (මෙහෙණන් සඳහා) යම් ශික්ෂාවක් දේශිත ද එයින් පරිශුද්ධ කුසලකොට්ඨාස ඇති නිකෙලෙස් වූ මා කුමක්හෙයින් අවුරාගෙන සිටියහු ද?

368. විතර්කයෙන් කැළැඹුණු සිත් ඇති (තෙපි) නො කැළැඹුණා වූ කෙලෙස්රජස් ඇතියහු විගතරජස් වූ නිකෙලෙස් වූ සියලු තැන්හි (සමුච්ඡෙදවිමුක්තියෙන්) මිදුණු සිත් ඇති මා කුමක්හෙයින් අවුරා ගෙන සිටියහු ද?

369. තෙපි තරුණ ද (රුවින්) අලාමක ද වවූ. පැවිද්ද තොපට කුමක් කරන්නේ ද? කහසිවුර බැහැර පියව, එව සුපුල් වෙනෙහි අභිරමණය කරම්හ.

370. හාත්පසින් මිහිරි සුවඳ පවත් හමා, රුක්හු කුසුම්රෙදෙන් හටගත්තවුන් වැන්නාහ, පළමු වසත් මස සුවපහස් ඍතු වෙයි, එව සුපුල් වෙනෙහි අභිරමණය කරම්හ.

371. මලින් ගැවැසුණු අග්ඇති වෘක්ෂයෝ පවනින් කම්පා වූවාහු තුතිගයන්නවුන් මෙන් සිටිති, ඉදින් එකලා වැ වනයට වදනාහු නම් තොපට කවර නම් රතියෙක් වේ ද?

372. ව්‍යාලමෘග සමූහයා විසින් සෙවුනාලද මතැතුන් හා ඇතින්නන් විසින් අලලනලද මිනිසුන් රහිත වූ බිහිසුණු මහවනයට එකලා වැ යන්නට කැමැත්තහු යෑ.

373. උපමා රහිත තැනැත්තිය, තෙපි කසීසළු මෙන් සියුම් වූ සින්ඳු මට වූ වස්ත්‍රයෙන් යුක්ත ව රතින් කළ පොතළුදුරුවක් මෙන් චිත්‍රරථ නම් වනයෙහි දෙවඟනක මෙන් හොබනාව.

374. කිඳුරියක මෙන් මඳක් පුබුදු නෙත් ඇත්තිය, ඉදින් (අපි දෙදෙන) වනතුරෙහි එක්වැ වසමෝ නම්, මම තොපගේ වසයට පැමිණියෙම් වෙමි, තොපට වඩා ප්‍රියතර වූ ප්‍රාණියෙක් හෝ ප්‍රාණයක් (මට) නො ද ඇත් මැ යි.

375. ඉදින් (තෙපි) මාගේ වචනය කරන්නහු නම්, එව සුඛිත ව ගිහිගෙයි වාසය කරව වාතය වැළකූ ප්‍රාසාදයන්හි වාසය කරන ස්ත්‍රීහු තොපට වතාවත් කරන්නාහ.

376. කාසිකසුඛුමානි ධාරය අභිරොහෙහි[1] ච මාලවණ්ණකං,
කඤ්චනමණිමුත්තකං බහුං විවිධං ආභරණං කරොමි තෙ.

377. සුධොතරජපච්ඡදං සුභං ගොණකතූලික සන්ථතං නවං,
අභිරුහ සයනං මහාරහං චන්දනමණ්ඩිත සාරගන්ධිකං.

378. උප්පලඤ්ච උදකතො උග්ගතං[2] යථා තං අමනුස්ස සෙවිතං,
එවං තුවං බ්‍රහ්මචාරිනී සකෙසු අඞ්ගෙසු ජරං ගමිස්සසි.

379. කිං තෙ ඉධ සාරසම්මතං කුණපපූරම්හි සුසානවඩ්ඪනෙ
භෙදනධම්මෙ කළෙබරෙ යං දිස්වා විමනො උදික්ඛසි.

380. අක්ඛීනි ච තුරියාරිව කින්නරියාරිව පබ්බතන්තරෙ
තව මෙ නයනානුදික්ඛිය භිය්‍යො කාමරතී පවඩ්ඪති.

381. උප්පලසිඛරොපමානි තෙ විමලෙ හාටකසන්නිභෙ මුඛෙ
තව මෙ නයනානුදික්ඛිය භිය්‍යො කාමගුණො පවඩ්ඪති.

382. අපි දූරගතා සරම්හසෙ ආයතපම්හෙ විසුද්ධදස්සනෙ
න හි චත්ථි තයා පියතරො නයනා කින්නරිමන්දලොචනෙ

383 අපථෙන පයාතුමිච්ඡසි චන්දං කීළනකං ගවෙස්සසි
මෙරුං ලඞ්ඝෙතුමිච්ඡසි යො ත්වං බුද්ධසුතං මග්ගයසෙ.

384. නත්ථි ලොකෙ සදෙවකෙ රාගො යත්ථ'පි'දානි මෙ සියා
නපි නං ජානාමි කීරිසො අථ මග්ගෙන හතො සමූලකො.

385. ඉඞ්ගාලකුයාව උජ්ඣිතො විසපත්තොරිව අග්ගතො කතො
නපි නං පස්සාමි කීරිසො අථ මග්ගෙන හතො සමූලකො,

386. යස්සා සියා අපච්චවෙක්ඛිතං සත්ථා වා අනුපාසිතො සියා,
ත්වං තාදිසිකං පලොභය ජානන්තිං සො ඉමං විහඤ්ඤසි.

387. මය්හං හි අක්කුට්ඨවන්දිතෙ සුඛදුක්ඛෙ ච සතී උපට්ඨිතා,
සඞ්ඛතමසුභන්ති ජානිය සබ්බත්ථෙව මනො න ලිප්පති.[3]

1. අභිරොපෙහි - මජසං. 2. උප්පලං චුදකා සමුග්ගතං - මජසං.
3. ලිම්පති - PTS.

376. සියුම් කසීසළු හරවා, මල්ගඳවිලෙවුන් (සිරුරට) ආරොපණය කරවා, (එයින් සැරසෙව'යි සේ යි) තොපට රත්මිණිමුතුවලින් යුත් බොහෝ විචිත්‍රාභරණ කරමි.

377. මොනොවට දෙව්මෙත් රජස් හල උඩුවියනින් ඇති හොබනා දික් ලොම් ඇති කළු කොඳු පලස් හා හස්ලොම් ආදිය පිරූ මෙට්ට අතුරන ලද අලුත් වූ මහැඟි සඳුන්හරින් සැරසූ සුවඳැති යහනට නැගෙව.

378. රකුසන් විසින් අරග්ගත් විලෙක දියෙන් උඩට නැගීසිටි උපුලක් යම්සේ ද එපරිදි බඹසරවසන්නක වූ තෙපි සිය සිරුර-අවයව (කිසිවකු) පරිභෝග නොකල කල්හි මැ ජරාවට යන්නාව.

379. කුණපයෙන් පිරුණු සොහොන්කිම වඩන බිඳෙනසුලු මේ සිරුරෙහි යම් අවයවයක් දුක සොම්නස් ව බලවූ නම් (කෙසාදීන් අතුරෙහි) තොප විසින් කුමක් සාර යයි ගන්නා ල ද ද?

380. තොපගේ ඇස් මුවගනක ගේ ඇස් මැන්න, ගිරි අතුරෙහි හැසිරෙන කිඳුරඟනකගේ ඇස් මැන්න, තොපගේ දෙනුවන් දුක මා ගේ කාමරතිය බෙහෙවින් වැඩෙයි.

381. කපුන්රුවක බඳු වූ තොප ගේ මුහුණෙහි රතුපුල්පෙති බඳු වූ තොප ගේ දෙනුවන් දුක මාගේ කාමගුණය බෙහෙවින් වැඩෙයි.

382. දිගු ඇසිපිය ඇත්තිය, පිරිසුදු ඇස් ඇත්තිය, කිඳුරඟනකගේ මෙන් මඳක් පුබුදු ඇස් ඇත්තිය, තෙපි දුරට ගිය නමුදු (තොපගේ ඇස් මැ) සිහිකරමි, තොපගේ දෙනතට වඩා මට ප්‍රියතරයෙක් නැති.

383. තෙපි බුද්ධපුත්‍රී වූ මා පතව, (එබඳු තෙපි) නොමඟින් යන්නට කැමැත්තාව, සඳමඩල කෙලිපන්දුවක් කරනු රිස්සව, මෙරගල් පැනයන්නට රිස්සව.

384. දුන් යම් තැනෙක මාගේ රාගයෙක් වන්නේ ද, සදේවක ලෝකයෙහි ඒ අරමුණ නැත් මැ යැ, ඒ රාගය කෙබඳු වූයෙකැයි ද නො දනිමි, මුල් සහිත රාගය ආර්‍යමාර්ගයෙන් නසන ලද්දේය.

385. අඟුරුවළකට (වාතයෙන්) නගාදමනලද්දක් සෙයින් වනසන ලද විසබඳුනක් සෙයින් ඒ රාගය කෙබඳු දැයි නො දක්මි, සමූල රාගය ආර්‍යමාර්ගයෙන් නසන ලදි.

386. යම් ස්ත්‍රියක විසින් (පස්සඳ) නුවණින් ප්‍රත්‍යවේක්‍ෂා නො කරන ලද ද ශාස්තෘන් වහන්සේ හෝ (දහම්කය දක්මෙන්) උපාසනය නොකරන ලද්දහු ද, ඇවැත්නි, තෙපි එබඳු ස්ත්‍රියක පොළොඹවු, ඒ තෙපි සිවුසස් පිළිවිද දන්නා මේ සුභාමේ ගෙණ වෙහෙසන්නහු ය.

387. යම් හෙයෙකින් ආක්‍රොශ වන්දනා දෙක්හි ද සුවදුක් දෙක්හි ද මාගේ සිහි එලඹ සිටියා ද (එහෙයින්) ත්‍රෛභූමක සංස්කාරගතය අශුභ යයි දුන සියලු භවත්‍රයෙහි මැ මාගේ සිත නො ඇලෙයි.

388. සාහං සුගතස්ස සාවිකා මග්ගට්ඨඞ්ගිකයානයායිනී,
උද්ධටසල්ලා අනාසවා සුඤ්ඤාගාරගතා රමාමහං.

389. දිට්ඨා හි මයා සුචිත්තිතා සොම්භා දාරුකපිල්ලකානි වා
තන්තීහි ච ඛීලකෙහි ච විනිබද්ධා විවිධං පනච්චකා.

390. තම්හුද්ධටෙ තන්තිඛීලකෙ විස්සට්ඨෙ විකලෙ පරිපක්ඛිතෙ
අවින්දෙ ඛණ්ඩසො කතෙ කිම්හි තත්ථ මනං නිවෙසයෙ.

391. තථූපමා දෙහකානි මං තෙහි ධම්මෙහි විනා න වත්තන්ති,
ධම්මෙහි විනා න වත්තති කිම්හි තත්ථ මනං නිවෙසයෙ

392. යථා හරිතාලෙන මක්ඛිතං අද්දස චිත්තිකං භිත්තියා කතං’
තම්හි තෙ විපරීත දස්සනං සඤ්ඤා මානුසිකා නිරත්ථිකා.

393. මායං විය අග්ගතො කතං සුපිනන්තෙව සුවණ්ණපාදපං,
උපගච්ඡසි අන්ධරිත්තකං ජනමජ්ඣෙරිව රුප්පරූපකං,

394. වට්ටනිරිව කොටරොහිතා මජ්ඣෙ බුබ්බුලකා සඅස්සුකා
පීළකොළිකා චෙත්ථ ජායති විවිධා චක්ඛුවිධා ච පිණ්ඩිතා.

395. උප්පාටිය චාරුදස්සනා න ච පජ්ජිත්ථ අසඞ්ගමානසා,
හන්ද තෙ චක්ඛුං හරස්සු තං තස්ස නරස්ස අදාසි තාවදෙ.

396. තස්ස ච විරමාසි තාවදෙ රාගො තත්ථ ඛමාපයී ච නං,
සොත්ථි සියා බ්‍රහ්මචාරිණී න පුනො එදිසකං භවිස්සති,

397 ආසාදිය එදිසං ජනං අග්ගිං පජ්ජලිතං ව ලිඞ්ගිය,
ගණ්හිය ආසීවිසං විය අපි නු සොත්ථි සියා ඛමෙහි නො.

398. මුත්තා ච තතො සා භික්ඛුණී අගමී බුද්ධවරස්ස සන්තිකං,
පස්සිය වරපුඤ්ඤලක්ඛණා චක්ඛු ආසි යථා පුරාණකන්ති.

ඉත්ථං සුදං සුභා ජීවකම්බවනිකා ථෙරී ගාථායො අභාසීති.

ජීවකම්බවනිකාසුභාථෙරීගාථා.

## තිංසති නිපාතො නිට්ඨිතො.

388. මම ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයානයෙන් යනසුලු උපුටාහල රාගාදි හුල්ඇති අනාශ්‍රව වූ සුගතයන්ගේ ශ්‍රාවිකාවක් වෙමි. ශූන්‍යාගාරයෙහි ඇලුණු මම එහි සිත් අලවා වෙසෙමි.

389. (හස්තපාදාදි ආකාරයෙන්) මොනොවට සිතුවම් කරන ලද පොතලුරූ ද දුවදඬු ආදියෙන් කළ රූකඩ ද නහරහුයින් හා (අත් ආදිය සඳහා තැබූ) දඬුයෙන් හා බඳනාලද්දාහු විවිධාකාරයෙන් නටන්නවුන් මෙන් මා විසින් දක්නාලද්දාහු මැ ය.

390. ඒ හුල් හා දඬුකඩ හා උපුල කල්හි විසුල කල්හි තැන තැන දැමූ කල්හි විසුරුවා හල කල්හි කඩ කඩ කළ කල්හි පොතලුරුවක් නො ලැබෙන්නේ ය, එහි කවර කොටසෙක සිත පිහිටුවා ද.

391. මා පිළිබඳ ශරීරාවයවයෝ ද එබඳු උපමා ඇත්තාහු ඒ පඨවි ආදි ධර්මයන්ගෙන් වෙන්ව නො පවත්නාහ, දේහය ද අවයවයෙන් වෙන්ව නො පවතී, එහි පඨවිආදි කවරෙක් සිත පිහිටු වන්නේ ද,

392. යම්සේ සිත්තරකු විසින් බිතෙක සිරියලින් සිතුවම් කරන ලද ස්ත්‍රීරූපයක් දක්නේ ද, එහි තොපගේ මනුෂ්‍ය ස්ත්‍රියක යන නිරර්ථක සංඥාව විපරීත දර්ශනයෙකි.

393. අන්ධබාලය, තෙපි (මායාකාරයකු විසින්) හමුයෙහි දක්වන ලද මායාවක් මෙන් සිහිනයෙහි දුටු රන්මුවා රුකක් මෙන් (ඉඳුරු දැලියකු විසින් මහාජනයා මැද දක්වනලද රිදී රුවක් මෙන් සිස් වූ කය (තෙල මාගේ යයි) අභිනිවෙස කරව.

394. රුක්බිලයෙක තුබූ ලාවටක් බඳුද ඇස්දලය මැද සිටි දිය බුබුලක් බඳු ද කඳුළු සහිත ද වෙයි, මෙහි අක්ෂිගූථ (කබ) ද උපදී (ශ්වේතපටලාදි) විවිධ අක්ෂිභාගයෝ ද පිඬුවූවාහු වෙත්.

395. ප්‍රියදර්ශිනී වූ ඕතොමෝ (ඇසෙහි) ඇලීමට නො පැමිණියාය, නො ඇලුණු සිත් ඇත්තී එකෙණෙහි ඇස උපුටා ඉඳ තොපගේ ඇස ගෙන යව’යි එය ඒ මිනිසාට දුන.

396. එකෙණෙහි ඔහුගේ ද ඒ ඇසෙහි රාගය දුරුවිය, බඹසර ඇත්තිය, තොපට සුව වන්නේ ය, යළි මෙබන්දක් නොවන්නේ යයි ඇය ක්ෂමා කරවී.

397. දිලියෙන ගිනි වැලඳගෙන මෙන් ආශීර්විෂයකු (අතින්) ගෙන මෙන් මෙබඳු නිකෙලශී ජනයකු සටා කිමැ සුවයෙක් වන්නේ ද අපට ක්ෂමා කළ මැනැවැ’යි.

398. ඒ ධූර්ත පුරුෂයා කෙරෙන් මිදුණු ඒ මෙහෙණ බුද්ධශ්‍රේෂ්ඨයන් කරා පැමිණියා යැ, උත්තම පුණ්‍යලක්ෂණ ඇති බුදුන් දැක ඇය පෙර මෙන් ප්‍රකෘති වී යයි.

මෙසේ සුභා ජීවකම්බවනිකා තෙරණිය ...

## තිංසතිනිපාතය නිමි.

# 40. චත්තාලීසතිනිපාතො

## 40. 1

399. නගරම්හි කුසුමනාමෙ පාටලිපුත්තම්හි පුථුවියා[1] මණ්ඩෙ
සක්‍යකුලකුලීනායො ද්වෙ භික්ඛුනියො හි ගුණවතියො.

400. ඉසිදාසී තත්‍ථ එකා
දුතියා බොධිතෙරී[2] සීලසම්පන්නා ච,
ඣානජ්ඣායනරතායො
බහුස්සුතායො ධුතකිලෙසායො.

401. තා පිණ්ඩාය චරිත්වා
භත්තත්‍ථං කරිය ධොතපත්තායො,
රහිතම්හි සුඛනිසින්නා
ඉමා ගිරා අබ්භුදීරෙසුං.

402. පාසාදිකාසි අය්‍යෙ
ඉසිදාසී වයොපි තෙ අපරිහීනො,
කිං දිස්වාන ව්‍යාකුලිකං[3]
අථාසි නෙක්ඛම්මමනුයුත්තා.

403. එවං අනුයුඤ්ජියමානා සා
රහිතෙ ධම්මදෙසනා කුසලා,
ඉසිදාසී වචනමබ්‍රවී
සුණ බොධි යථම්හි පබ්බජිතා.

404. උජ්ජෙනියා පුරවරෙ
මය්හං පිතා සීලසංවුතො සෙට්ඨී,
තස්සම්හි එකධීතා
පියා මනාපා ච දයිතා ච.

405. අථ මෙ සාකෙතතො වරකා[4]
ආගච්ඡුමුත්තමකුලීනා[5]
සෙට්ඨීපහූතරතනො
තස්ස මං සුණ්හමදාසි තාතො.

406. සස්සුයා සසුරස්ස ච
සායං පාතං පණාමමුපගම්ම,
සිරසා කරොමි පාදෙ
වන්දාමි යථම්හි අනුසිට්ඨා.

407. යා මය්හං සාමිකස්ස
භගිනියො භාතුනො පරිජනො,
තමෙකවරකම්පි දිස්වා
උබ්බිග්ගා ආසනං දදාමි.[6]

---

1. පථවියා - මජ්ඣෙ PTS. පුථවියා අ. 2. බොධීති - PTS. 3. වාලිකං -
4. වරකො - PTS. 5. කුලීනො - PTS. 6. දෙමි - PTS

# 40. චත්තාලීසනිපාතය

## 40. 1

399. සකල පෘථිවි තලයට ආභරණ වූ කුසුම් පුරාභිධාන පැලලුප්හි ශාක්‍ය කුලයෙහි කුලදුහිතෘ වූ (සැසි මුනි සසුන්හි පැවිදි වූ හෙයින් කී) ගුණවත් භික්ෂුණීහු දෙදෙනෙක් වූහ.

400. ඒ භික්ෂුණීන් දෙදෙනා කෙරෙහි එක් මෙහෙණක් ඉසිදාසීනම් දෙවැන්නී සිල්සපත් බොධිථෙරී නම්. ඔහු (ලොව් ලොවුතුරා) දහැන් සමවැදීමෙහි ඇලුණාහු බහුශ්‍රැත වූවාහු (අගමගින්) නැසූ කෙලෙස් ඇත්තාහු වෙති.

401. ඔහු පිඬු සිගා හැසිර බත්කිස නිමවා දෙවූ පාත්‍ර ඇත්තාහු විවේකස්ථානයෙක සුවසේ හුන්නාහු මේ වදන් පැවසූහ.

402. ආයසීාවෙනි ඉසිදාසියෙනි, තෙපි පැහැපත් වූව. තොපගේ වයස් ද නො පිරිහුනෑ, ගිහිගෙයි කවර දෙසක් දක පැවිද්දට පැමිණියහු ද?

403. මෙසේ ජනශූන්‍යස්ථානයෙහි පුළුවුස්නා ලැබූ ඒ ධම්දෙශනායෙහි නිපුණ වූ ඉසිදාසී මෙහෙණ "බොධි තෙරණියෙනි, මම් යම්සේ පැවිදි වූම ද ඒ අසව"යි මේ වදන් කිවුයෑ.

404. (අවන්ති රට) උදෙනී පුරවෙරෙහි ශීලසංවෘත වූ සිටු තෙම මාගේ පියා විය. මම ඔහුගේ ප්‍රිය මනාප වූ අනුකම්පා කටයුතු එක් මැදුව වීමි.

405. ඉක්බිති මා වියපත් කල්හි සාකේත නගරයෙන් මා පිළිබඳ උතුම් කුලයෙහි උපන් විවා මගුල් රැස්වන්නාහු පැමිණියාහ. බොහෝ රත් රුවන් ඇති මහ සිටෙක් වී. මෙ පියේ මා ඔහුට ලෙහෙලි කොට දින.

406. නැන්දණියන් හා මයිලණුවන්ගේ සම්පයට එලඹ උදය සවස පා පිණිපා කරමි. උන් විසින් අනුසස්නා ලදුම් ද එසෙයින් කරමි.

407. මා සැමියාගේ යම් හගිනීහු ඇද්ද භ්‍රාතෘහු ඇද්ද පරිජනයා වේ ද එක් වල්ලභයකුදු දක උද්විග්නව අසුන් දෙමි.

408. අන්නෙන ච පානෙන ච
ඛජ්ජෙන ච යං ච තත්ථ සන්නිහිතං,
ඡාදෙමි උපනයාමි
දෙමි ච යං යස්ස පතිරූපං.

409. කාලෙන උට්ඨහිත්වා
ඝරං සමුපගමාමි උම්මාරෙ,
ධොවන්ති හත්ථපාදෙ
පඤ්ජලිකා සාමිකං උපෙමි ච

410. කොච්ඡං පසාදමඤ්ජනිඤ්ච[1]
ආදාසකඤ්ච ගණ්හිත්වා
පරිකම්මකාරිකා විය
සයමෙව පතිං විභූසෙමි.

411. සයමෙව ඔදනං සාධයාමි
සයමෙව භාජනං ධොවන්තී,
මාතාව එකපුත්තකං
තදා[2] භත්තාරං පරිචරාමි.

412. එවං මං භත්තිකතං[3] අනුරත්තං
කාරිකං නිහතමානං
උට්ඨායිකං අනලසං
සීලවතිං දුස්සතෙ භත්තා.

413. සො මාතරඤ්ච පිතරඤ්ච
භණති ආපුච්ඡාහං ගමිස්සාමි,
ඉසිදාසියා න වච්ඡං
එකාගාරෙහං සහවත්ථුං.

414. මා එවං පුත්ත අවච
ඉසිදාසී පණ්ඩිතා පරිව්‍යත්තා,
උට්ඨායිකා අනලසා
කිං තුය්හං න රොචතෙ පුත්ත.

415. න ච මෙ හිංසති කිඤ්චි
න චාහං ඉසිදාසියා සහ වච්ඡං
දෙස්සාව මෙ අලං මෙ
අපුච්ඡාහං ගමිස්සාමි.

416. තස්ස වචනං සුණිත්වා
සස්සු සසුරො ච මං අපුච්ඡිංසු,
කිස්ස තයා අපරද්ධං
භණ විස්සත්ථා යථාභූතං.

417. නපිහං අපරජ්ඣං[4] කිඤ්චි
නපි හිංසෙමි න භණාමි දුබ්බචනං,
කිං සක්කා කාතුයෙ
යං මං විද්දෙස්සතෙ[5] භත්තා.

1. පසාදමඤ්ජනඤ්ච - සිමු. පසාදං අඤ්ජනා - PTS.
2. තථා - මජසං, PTS 3. භත්තිකතං - මජසං, PTS,
. අපරජ්ඣිං - සිමු, මු. 5. විදෙස්සතෙ - PTS

408. අහරින් වේවයි පානයෙන් වේවයි ඛාද්‍යයෙන් වේවයි යමක් ඒ පරිවේසනස්ථානයෙහි සඳහබන ලද ද එයින් යමක් යමකුට නිසි වේ ද එය ඔහුට රැස්වමි, එලවමි, දෙමි.

409 නිසි කල්හි උවටන් කොට එළිපත සිට හසන පාදයන් දෝනෙමි, දෙව ගෙට එලඹෙමි, බදූඇඳිලි ව හිමියා වෙත එලඹෙමි.

510. එ මම මැ (කෙස්මස් පිහිරන) පණාව ද විලෙවුන් ද අඳුන් නල ද කැඩපත ද ගෙන දස්සක සෙයින් හිමියා සරසමි.

411. ඒ මම මැ බත පිසමි, මම මැ බඳුනුදු දෝනෙමි මම එක් ම පුතු සෙයින් එකල සැමියාට මෙහෙ කරමි.

412. මෙසෙයින් සැමියා මෙහෙ කල අනුරක්ත වූ පිළිවිස කරන සුලු නටමන් ඇති උත්ථාන වීර්‍ය ඇති එහෙයින් මැ අකුසීත වූ සිල්වත් වූ මා ඒ සැමි කිපි බැණ වදී.

413. ඒ මා සැමි (පිළිවිසැ) 'මම ගෙන් නික්මැ යෙමි'යි මැණියන් හා පියාණන්ට මෙසේ කියයි. 'ඉසිදාසිය සමග මම එක් ගෙහි සහවාසය නොකරමි'යි.

414. පුත්‍රය, නහමක් එසේ කියා, ඉසිදාසිය පණ්ඩිත වෙයි, අතිශය ව්‍යක්ත වෙයි, උත්ථාන වීර්‍ය ඇති වෙයි, එයින් මැ අනලස වෙයි. දරුව කිම තොපට නුරුස්නේ ද?

415. ඕ මට කිසිදු පීඩාවක් නොකරයි, වැලින් මම ඉසිදාසිය හා නොවසමි, මට අප්‍රිය ද වෙයි, මට කම් නැත. මම තොප නො විචාරා මැ යෙමි.

416. ඔහුගේ බස් අසා නැදිමයිල්හු 'තොප විසින් ඔහුට කවර විරොධයෙක් කරන ලදද නිසැක ව තතුසේ කියව'යි මා පුළුවුත්හ

417. මම ඔහුට කිසි විරෝධයක් නොකෙරෙමි, නො ද වෙහෙසමි, දුර්වචනයකුදු නොබණමි. ආර්‍යාවෙනි, යම් හෙයෙකින් හිමි මට ද්වෙෂ කෙරේ ද මා විසින් (එබඳු) කුමක් කල හැකි ද.

418. තෙ මං පිතු ඝරං පති
නයිංසු විමනා දුක්ඛෙන අධිභූතා,[1]
පුත්තං අනුරක්ඛමානා
ජිතම්හසෙ රූපිනිං ලක්ඛිං.

419. අථ මං අදාසි තාතො
අඩ්ඪස්ස ඝරම්හි දුතියකුලිකස්ස,
තතො උපඩ්ඪසුඞ්කෙන
යෙන මං වින්දථ සෙට්ඨි

420. තස්සපි ඝරම්හි මාසං
අවසී අථ සොපි මං පටිච්ඡසි,
දාසීව උපට්ඨහන්ති
අදූසිකං සීලසම්පන්නං.

421. භික්ඛාය ච විචරන්තං
දමකං දන්තං මෙ පිතා භණති.
හොහිසි මෙ ජාමාතා
නික්ඛිප පොන්තිඤ්ච[2] ඝටිකඤ්ච.

422. සොපි වසිත්වා පක්ඛමථ[3]
තාතං භණති දෙහි මෙ පොන්තිං[2]
ඝටිකඤ්ච මල්ලකඤ්ච
පුනපි භික්ඛං චරිස්සාමි.

423. අථ නං භණති තාතො
අම්මා සබ්බො ච මෙ ඤාතිගණවග්ගො,
කිං තෙ න කීරති ඉධ
භණ ඛිප්පං තං තෙ කරිහිති.

424. එවං භණිතො භණති
යදි මෙ අත්තා සක්කොති අලං මය්හං,
ඉසිදාසියා න සහ වච්ඡං
එකඝරෙහං සහ වත්ථුං.

425. විස්සජ්ජිතො ගතො සො
අහම්පි එකාකිනී විචින්තෙමි,
අපුච්ඡිතූන ගච්ඡං
මරිතායෙ[4] වා පබ්බජිස්සං වා.

426. අථ අය්‍යා ජිනදත්තා
ආගච්ඡී ගොචරාය චරමානා,
තාතකුලං විනයධරී
බහුස්සුතා සීලසම්පන්නා.

427. තං දිස්වානම්හාකං
උට්ඨායාසනං තස්සා පඤ්ඤාපයිං,
නිසින්නාය ච පාදෙ
වන්දිත්වා භොජනං අදාසිං

1. අභිභූතා - සීමු 12, ප. PTS 2. පොංසිං - මජසං. 3. පක්ඛං අථ - මජසං. පක්කමුථ - සීමු, PTS. 4. මරිතුයෙ - මජසං

418 ඔහු පුතු රක්නාහු 'රූපවත් වූ ලක්ෂ්මියගෙන් පැරදුණ මහ'යි දුකින් මැඩුණාහු දොම්නස් වූවාහු මා පියාගේ ගෙට යැවූහ.

419. ඉක්බිති පියතෙමේ පළමු සිටු මා යම් සුංවතෙකින් ලැබී ද එයින් අඩක් සුංවතින් ආඪ්‍ය වූ දෙවැනි කුලීනයක්හුගේ ගෙයි ලා මා දුන්නේය.

420. ඔහුගේ ගෙහි ද මසක් විසීමි. එකල්හි හොඳ දූස්සක මෙන් උවටන් කරන ද්‍රෝහ නො කරන සිල්සපන් වූ මා ගෙන් බැහැර කෙළේ යැ.

421. මපියේ භික්ෂා පිණිස ඇවිදුනා දැමුණු ඉඳුල් කන යාචකයකුට කියයි: 'මා දුවගේ සැමි වුව' හත් කඩරෙදි ද භික්ෂාකපාලය ද බහාලවයි.

422. ඒ ඉඳුල් කත්නා ද කලක් වැසැ බැසැ ගියේ ය. (යන්නේ) පියාට මෙසේ කියයි: 'මාගේ මහලු පිළී ද භික්ෂාකපාලය ද සරාවය ද දෙව. යළිත් පිඬු සිඟා ඇවිදිම්'යි.

423. එසඳ මපියේ ද මවු ද හැම ඥාතිගණවර්ගයා ද ඔහුට (වෙන වෙන) මෙසේ කියයි: 'මෙගෙහි තට කුමක් නම් නො සැපයේ ද? කියා තට එය වහා සැපයෙයි.

424. මෙසේ කියන ලදුයේ (තෙල) කියයි: 'ඉදින් මාගේ ආත්මය ශක්ත වේ නම් ඉසිදාසියගෙන් මට කම් නැත. මම එක් මැ ගෙයි ඇය හා සහවාස නො කරමි.

425. ඒ දමකයා හැරපියනලදු වැ ගියේ යැ. මම ද එකලා වැ මෙසේ සිතීමි. 'නො පිළිවිස මැ මැරෙන්නට හෝ යෙමි. පැවිදි වන්නෙම් හෝ වෙමි.

426. එකලැ විනයධර වූ බහුශ්‍රැත වූ ශීලසම්පන්න වූ ආර්‍ය්‍යා ජිනදත්තා මෙහෙණ පිඬු පිණිස ඇවිදුමින් පියකුලය කරා පැමිණියා.

427. ඇය දැක නැගිට අප හුන් අස්න ඇයට පනවාලීමි. හිඳගත් ඒ මෙහෙණගේ පා වැඳ බොජුන් දින්මි.

428. අන්නෙන ච පානෙන ච
ඛජ්ජෙන ච යං ච තත්‍ථ සන්නිහිතං,
සන්තප්පයිත්වාවොචං
අය්‍යෙ ඉච්ඡාමි පබ්බජිතුන්ති.

429. අථ මං භණති තාතො
ඉධෙව පුත්තක චරාහි ත්වං ධම්මං
අන්නෙන ච පානෙන ච
සන්තප්පය සමණෙ ද්විජාති ච.

430. අථාහං භණාමි තාතං
රොදන්ති අඤ්ජලිං පණාමෙත්වා,
පාපං හි මයා පකතං
කම්මං තං නිජ්ජරිස්සාමි.

430. අථ මං භණති තාතො
පාපුණ බොධිං ච අග්ගධම්මං ච,
නිබ්බානං ච ලභස්සු
යං සච්ඡිකරි ද්විපදසෙට්ඨො.

432. මාතාපිතූ අභිවාදයිත්වා
සබ්බං ච ඤාතිගණවග්ගං,
සත්තාහං පබ්බජිතා
තිස්සො විජ්ජා අඵස්සයිං.

433. ජානාමි අත්තනො සත්ත
ජාතියො යස්සායං ඵලං විපාකො,
තං තව ආචික්ඛිස්සං
තං එකමනා නිසාමෙහි.

434. නගරම්හි එරකච්ඡෙ
සුවණ්ණකාරො අහං පහූතධනො,
යොබ්බනමදෙන මත්තො
සො පරදාරමසෙවිහං.

435. සොහං තතො චවිත්වා
නිරයම්හි අපච්චිසං චිරං,
පක්කො තතො ච උට්ඨහිත්වා
මක්කටියා කුච්ඡිම්හි ඔක්කමිං.

436. සත්තාහජාතකං මං
මහාකපියූථපො නිල්ලච්ඡෙසි,
තස්සෙතං කම්මඵලං
යථාපි ගන්ත්වාන පරදාරං.

437. සොහං තතො චවිත්වා
කාලං කරිත්වා සින්ධවාරඤ්ඤෙ,
කාණාය ච ඛඤ්ජාය ච
එළකියා කුච්ඡිමොක්කමිං.

428. ආහාරයෙනුදු පානයෙනුදු ඛාද්‍යයෙනුදු එහි එලවා තැබූ යමක් ඇත් නම් එයිනුදු සතපා මෙසේ කීමි: ‘ආයුෂ්මවෙනි, පැවිදි වන්නට කැමැත්තෙමි’යි.

429. එසඳ පියා මට මෙසේ කියයි: ‘දියණියනි, මෙගෙහි මැ තෝ බඹසරාදි දහම් හැසිරෙව. ආහාරයෙනුදු පානයෙනුදු මහණුන් හා බමුණන් සතපව’.

430. ඉක්බිති මම අඬමින් ඇඳිලි බැඳ පියාට කියමි: ‘මා විසින් පව්කමෙක් කරන ලදි. ඒ පව දිරවාලමි’යි.

431. එසඳ පියේ මට මෙසේ කියයි: දෙපද ශ්‍රේෂ්ඨ වූ බුදුහු යම් දහමක් පසක් කළසේක් ද ඒ බෝධිය හා අග්‍ර ධර්මයට පැමිණෙව, නිවන් ද ලබව’යි.

432. දෙමාපියන් හා හැම ඥාතිගණවර්ගයා සකසා වැඳ පැවිදි වැ සත් දිනෙකින් ත්‍රිවිද්‍යාවන් පසක් කෙළෙමි.

433. තමා පිළිබඳ ජාති සතක් දනිමි. යම් පාපකර්මයක්හුගේ මේ ඵලවිපාකයෙක් වේ ද එය තොපට කියමි. එකාග්‍රචිත්ත වැ ඒ අසව.

434. මම එරකච්ඡ නම් නුවර ප්‍රභූතධන ඇති ස්වර්ණකාරයෙක් වීමි. යෞවනමදයෙන් මත්ත වැ මම පරදාරසේවනය කෙළෙමි.

435. මම එයින් සැවැ දීර්ඝකාලයක් නිරයෙහි පැසිණිමි. එහි පැසුණෙම් එයින් නැගී වැඳිරියක කුස පිළිසිඳ ගතිමි.

436. උපන් සත්දවසැති මා කපියූථයෙහි නායක මහ වඳුරු (ඵලෝද්ධ-රණයෙන්) පුරිස් ලකුණු නැසී යැ. පරදාරයන් කරා ගොස් යම් පරිදි කම් ඇද්ද. ඒ පරදාරසේවනයාගේ තෙල කර්මඵල යි.

437. මම එයින් සැවැ කලුරිය කොට සින්ධවාරණ්‍යයෙහි කණ වූ කුදු වූ එළියක කුස පිළිසිඳ ගත්මි.

438. ද්වාදසවස්සානි අහං
නිල්ලච්ඡිතො දාරකො පරිවහිත්වා,
කිමිනාවට්ටො අකල්ලො
යථාපි ගන්ත්වාන පරදාරං.

439. සොහං තතො චවිත්වා
ගොවාණිජකස්ස ගාවියා ජාතො,
වච්ඡො ලාඛො තම්බො
නිල්ලච්ඡිතො ද්වාදසෙ මාසෙ.

440. වොඪූන නඞ්ගලමහං
සකටඤ්ච ධාරයාමි,
අන්ධො වට්ටො අකල්ලො
යථාපි ගන්ත්වාන පරදාරං.

441. සොහං තතො චවිත්වා
විථියා දාසියා ඝරෙ ජාතො,
නෙව මහිලා න පුරිසො
යථාපි ගන්ත්වාන පරදාරං.

442. තිංසති වස්සම්හි මතො
සාකටිකකුලම්හි දාරිකා ජාතා,
කපණම්හි අප්පභොගෙ
ධනිකපුරිසපාතබහුලම්හි.

443. තං මං තතො සත්ථවාහො
උස්සන්නාය විපුලාය වඩ්ඪියා,
විකඩ්ඪති විලපන්තිං
අච්ඡින්දිත්වා කුලඝරස්ස.

444. අථ සොළසමෙ වස්සෙ
දිස්වාන මං පත්තයොබ්බනං,
කඤ්ඤමොරුන්ධතස්ස පුත්තො
ගිරිදාසො නාම නාමෙන.

445. තස්සපි අඤ්ඤා භරියා
සීලවතී ගුණවතී යසවතී ච,
අනුරත්තං භත්තාරං
තස්සාහං විද්දෙසනමකාසිං.

446. තස්සෙතං කම්මඵලං
යං මං අපකිරිතූන ගච්ඡන්ති,
දාසීව උපට්ඨහන්තිං
තස්සපි අන්තො කතො මයාති.

ඉත්ථං සුදං ඉසිදාසී ථෙරී ගාථායො අභාසීති.

ඉසිදාසීථෙරීගාථා.

## චත්තාලීසතිනිපාතො සමත්තො.

438. (එහිදී) බීජෝද්ධරණය කරනු ලැබූ මම දෙළොස් හවුරුද්දක් මුළුල්ලෙහි (පිටැ හිඳගත්) දරුවන් උසුලා පරදාරයන් කරාගොස් යම්සේ ද එපරිද්දි (අඟජාතස්ථානයෙහි) පණුවන් ගැවැසීමෙන් පීඩිත වූයෙම් ගිලන් වීමි.

439 මම එයින් සැවැ ගවවෙළඳකුගේ දෙනක කුස උපන්නෙමි ලතුරස මෙන් තඹවන් වස්සකු වැ උපන් දෙළොස්වැනි මස බීජෝද්ධරණය කරනලදුයෙමි.

440. මම නඟුල උසුලා ගැල් ද ඇදීමි, පරදාරයන් කරා ගොස් යම්සේ ද එපරිද්දි අන්ධ වැ පීඩිත වූයෙම් ගිලන් වීමි.

441. මම එයින් සැවැ නගරවීථියෙහි ගෘහදාසියක කුස උපන්නෙමි, පරදාරයන් කරා ගොස් යම්සේ ද එපරිද්දි නො ඉතිරි නො පිරිමි වීමි. (ජාතිනපුංසක වීමි'යි සේයි.)

442, තිස්වැනි හවුරුද්දෙහි මියැගියෙමි. දිළිඳුවූ අල්පභොග වූ ණය හිමි පුරුෂයන්ගේ පැමිණීම බහුල කොට ඇති ගැල්කරුකුලයකැ දැරියක් වැ උපන්මි.

443. ඉක්බිති සාත්ථනායක තෙම පොලීමිල උත්සන්න වැ මහත් වැ ගියකල්හි වැලැපෙන මා (මාගේ) කුලගෙයින් පැහැරගෙන ආකර්ෂණ කෙරෙයි.

444. එකල්හි සොළොස්වැනි හවුරුද්දෙහි පැමිණි යොවුන් බව ඇති කන්‍යාවක වූ මා දැක නමින් ගිරිදාස නම් වූ ඒ සාර්ථවාහකයාගේ පුත්‍ර තෙම (පිළිබඳසිත් ඇතිව) තමා අයත් කොට ගෙණි ලී යැ.

445. ඔහුට ද සිල්වත් වූ ගුණවත් යශස් ඇති හිමියා කෙරෙහි අනුරක්ත වූ අන් භාර්යාවක් වූ යැ, මම ඔහුට (ඒ බිරිය කෙරෙහි) විද්වේෂණකර්මය කෙළෙමි. (සේ ඇට කිපෙනසේ පිළිපන්මි.)

446. යම් හෙයෙකින් දාසක මෙන් උවටන් කරන මා (ස්වාමීහු) හැරපියා යෙත්ද, ඒ අකුශලයාගේ තෙල, කම්ඵල යි, මා විසින් ඒ පාපකර්මය ද කෙළවර කරන ලද්දේ යයි.

මෙසේ ඉසිදාසී තෙරණී ...

ඉසිදාසීථේරීගාථා යි.

## චත්තාලීසනිපාතය නිමි.

# මහානිපාතො.

## 1

447. මන්තාවතියා නගරෙ
රඤ්ඤො කොඤ්චස්ස අග්ගමහෙසියා,
ධීතා ආසි[1] සුමෙධා
පසාදිතා[2] සාසනකරෙහි.

448. සීලවතී චිත්තකථා
බහුස්සුතා බුද්ධසාසනෙ විනීතා,
මාතාපිතරො උපගම්ම
භණති උභයො නිසාමෙථ.

449. නිබ්බානාභිරතාහං
අසස්සතං භවගතං යදිපි දිබ්බං,
කිමඞ්ග පන තුච්ඡා කාමා
අප්පස්සාදා බහුවිඝාතා.

450. කාමා කටුකා ආසී-
විසූපමා යෙසු මුච්ඡිතා බාලා,
තෙ දීඝරත්තං නිරයෙ
සමප්පිතා හඤ්ඤන්තෙ දුක්ඛිතා.

451. සොචන්ති පාපකම්මා
විනිපාතෙ පාපබුද්ධිනො,
සදා කායෙන වාචාය
මනසා ච අසංවුතා.

452. බාලා තෙ දුප්පඤ්ඤා
අචෙතනා දුක්ඛසමුදයො රුද්ධා
දෙසෙන්තෙ අජානන්තා
න බුජ්ඣන්තෙ අරියසච්චානි.

453. සච්චානි අම්ම බුද්ධවර-
දෙසිතානි තෙ බහුතරා අජානන්තා,
යෙ අභිනන්දන්ති භවගතං
පිහෙන්ති[4] දෙවෙසු උපපත්තිං.

454. දෙවෙසුපි උපපත්ති
අසස්සතා භවගතෙ අනිච්චම්හි,
න ච සන්තසන්ති බාලා
පුනප්පුනං ජායිතබ්බස්ස.

455. චත්තාරො විනිපාතා
ද්වෙ ච ගතියො කථඤ්චි ලබ්භන්ති
න ච විනිපාතගතානං
පබ්බජ්ජා අත්ථි නිරයෙසු.

---

1. ංසි - සිමු. 1, 2 අ. 2. පසාදිකා - සිමු, 1 අ. 3. පාපවුද්ධිනො - සිමු 1 2, අ
4. පිහයන්ති - PTS.

# මහානිපාතය

## 1

447. මන්තාවතී නගරයෙහි කොඤ්ච නම් රජුගේ අගමෙහෙසිය කුස උපන් සුමේධා නම් දියණියක් වූ යැ, ඕ ශාස්තෲශාසනකර වූ (ආර්‍යයන් විසින්) සසුන්හි පහදවන ලද්දී යැ.

448. සිල්වත් වූ විසිතුරු ධර්මකථා ඇති බහුශ්‍රැත වූ බුදුසසුන්හි හික්මුණු සුමේධා මවුපියන් කරා එළැඹ ‘(ඔබ) දෙදෙන අසත්වා’යි මෙසේ කියා:

449. මම නිවනෙහි ඇලුම් ඇති වෙමි, දෙව්ලොවැ වූ ද භවගතය අශාශ්වත යැ, මානුසික කාම කියනු කිමැ, (ඔහු) තුච්ඡයෝ යැ අල්පාස්වාදයෝ යැ බොහෝ උවදුරු ඇත්තාහ.

450. බාලයෝ යම් කාමයෙක්හි මූසපත් වූවාහු ද ඒ කාමයෝ කටුකයෝ යැ ආශිර්විෂ සදෘශයහ, ඒ බාලයෝ නිරයෙහි පිහිටියාහු බොහෝ කලක් දුඃඛිත වැ (තුමූ මැ) පෙළෙත්.

451. පව්කම් ඇති පාපබුද්ධි ඇති ඔහු හැම කල්හි කයින් වචසින් මනසින් ද අසංවෘත වූවාහු නිරයෙහි ඉපද ශෝක කෙරෙත්.

452. දුෂ්ප්‍රාඥ වූ (ආත්මහිතයෙහි) චේතනා රහිත වූ ඒ බාලයෝ දුඃඛසමුදයෙහි (-තෘෂ්ණානිමිත්ත) සංසාරයෙහි ඇවුරුණාහු (සිව්සස්දහම්) දෙසන කල්හි අරුත් නො දත්නාහු ආර්‍ය-සත්‍යයන් අවබෝධ නො කෙරෙත්.

453. මෑණියනි, යම් කෙනෙක් භවය පතත් ද දෙවියන් කෙරෙහි උපත රිසියෙත් ද බුද්ධශ්‍රේෂ්ඨයන් විසින් දෙසන ලද සිවුසස් නො දත්තා වූ ඔහු මැ ඉතා බොහෝ වෙත්.

454. සියලු භවය අනිත්‍ය කල්හි දෙවියන් කෙරෙහි උපත ද අශාශ්වත යැ, (එසේ කල්හිදු) බාලයෝ පුනපුනා ඉපදීම පිළිබඳ වැ නො ද තැතිගනිත්. (සංවෙගයට නො පැමිණෙත්)

455. (නිරය තිරිසන් ප්‍රෙත අසුර යන මොහු) සතර විනිපාතයෝ යැ, (දෙව් මිනිස් යන) දෙ ගතිහු ද දුකසේ ලැබෙත්. විනිපාතගතයනට නිරයෙහි පැවිද්ද නො ද ඇති.

456. අනුජානාථ මං උභයො
පබ්බජිතුං දසබලස්ස පාවචනෙ
අප්පොස්සුක්කා ඝටිස්සං
ජාතිමරණප්පහානාය

457. කිං භවගතෙන[1] අභිනන්දිතෙන
කායකලිනා අසාරෙන,
භවතණ්හාය නිරොධා
අනුජානාථ පබ්බජිස්සාමි.

458. බුද්ධානං උප්පාදෙ
විවජ්ජිතො අක්ඛණො ඛණො ලද්ධො,
සීලානි බ්‍රහ්මචරියං
යාවජීවං න දූසෙය්‍යං.

459. එවං භණති සුමෙධා
මාතාපිතරො න තාව ආහාරං,
ආහරියාමි[2] ගහට්ඨා
මරණවසං ගතාව හෙස්සාමි.

460. මාතා දුක්ඛිතා රොදති
පිතා ච අස්සා සබ්බසො සමභිහතො,[3]
ඝටෙන්ති සඤ්ඤාපෙතුං[4]
පාසාදතලෙ ඡමාපතිතං.

461. උට්ඨෙහි පුත්තක කිං සොචිතෙන
දින්නාසි වාරණවතිම්හි
රාජා අණීකදත්තො[5]
අභිරූපො තස්ස ත්වං දින්නා.

462. අග්ගමහෙසී භවිස්සසි
අණීකදත්තස්ස රාජිනො භරියා,
සීලානි බ්‍රහ්මචරියං
පබ්බජ්ජා දුක්කරා පුත්තක.

463. රජ්ජෙ ආණා ධනමිස්සරියං
භොගා සුඛා දහරිකාසි,[6]
භුඤ්ජාහි කාමභොගෙ
වාරෙය්‍යං හොතු තෙ පුත්ත.

464. අථ නෙ භණති සුමෙධා
මා ඊදිසිකානි භවගතං අසාරං,
පබ්බජ්ජා වා හෙහිති,
මරණං වා මෙ න චෙව වාරෙය්‍යං.

465. කිමිව පූතිකායමසුචිං
සවනගන්ධං භයානකං කුණපං
අභිසංවිසෙය්‍යං භස්තං
අසකිං පග්ඝරණං[7] අසුචිපුණ්ණං.

1. භවගතෙන - සිමු 1, 2  2. ආහරියා - PTS.  3. සමභිසාතො -
4 වායමන්ති - පු  5. අණීකරත්ත - මජසං
6. දහරිකාපි - PTS.  7. පග්ඝරිතං - මජසං.

456. දසබලයන් වහන්සේගේ ශාසනයෙහි පැවිදිවන්නට තොප දෙ දෙන මට අවසර දුන මැනැව, ජාතිමරණයන්ගේ ප්‍රහාණය පිණිස (අත්කිසයෙකැ) අල්පෝත්සුක වැ වැයම් කරමි.

457. කායකලි වූ අසාර වූ භවය අභිනන්දනා කිරීමෙන් කවර ප්‍රයොජන ද, භවතෘෂ්ණාවගේ නිරෝධහේතුයෙන් (නිරෝධය පිණිස) පැවිදි වෙමි, මට අවසර දුන මැනැව.

458. (නිරයොපපත්ති ආදි අටවැදෑරුම්) අක්ෂණය දුරලනලද, බුද්ධොත්පාද සඞ්ඛ්‍යාත නවවැනි ක්ෂණය ලබනලද, සිවුපිරිසුදු සිල් ද සසුන්බඹසර ද යාවජ්ජීවයෙන් නො කෙලෙසමි.

459. සුමේධා මවුපියනට මෙසේ කියා: (ඉදින් පැවිදි නො ලබම් නම්) ගිහි වැසිව සිට අහර නො මැ ගනිමි, මරණවශයට පැමිණියෙම් ම වෙමි'යි.

